# BUTHSARANA

By
Sahithya Chakrawarthi
Walivitiye **SORATHA NAYAKA THERO**
Chancellor, Vidyodaya University of Sri Lanka

විද්‍යාචක්‍රවර්තීන් විසින් විරචිත

## අමෘතාවහ

නම් වූ

# බුත්සරණ

ශ්‍රී ලඞ්කා විද්‍යොදය විශව විද්‍යාලයාධිපති
වැලිවිටියේ පණ්ඩිතාචාර්ය (සම්මාන)
සාහිත්‍යචක්‍රවර්තී (විද්‍යාලඞ්කාර)

**සොරත නායක ස්වාමිපාදයන්වහන්සේ**

විසින්

සංශොධිත යි.

# ප්‍රස්තාවනාව

**සංඥා**

මේ ග්‍රන්ථයට තැබූ විශේෂසංඥාව 'අමෘතාවහ' යන්න යි. "අමෘත සඞ්ඛ්‍යාත නිර්වාණය ආවහනය කරන්නේ ය. ගෙණ දෙන්නේ ය" යනු එහි අර්ථ යි. "අමෘතාවහ නම් වූ බුද්ධචරිතය නිමි" යි ග්‍රන්ථාවසානයෙහි පෙණෙන හෙයින් "බුද්ධචරිතය" යනු සාමාන්‍යසංඥාව යි. මෙහි වර්ණනා කරණ ලද්දේ බුදුරජාණන් වහන්සේගේ චරිතය යි. එහෙත් ග්‍රන්ථයෙහි නොයෙක් තැන "බුත්සරණ" යනු පෙණෙන හෙයින් හා මෙයින් බුත්සරණ පැවසෙන බැවින් ද "බුත්සරණ" යනු ම විශේෂසංඥාව වශයෙන් ප්‍රචලිත වී ය. අප විසින් එය මෙහි සාමාන්‍යසංඥා වශයෙන් යොදන ලදී.

**නිමිත්ත**

මේ පොත කිරීමට අභ්‍යන්තරනිමිත්ත වශයෙන් තැකිය හැක්කේ සිංහලමනුෂ්‍යයන් විෂය කොට පැවැති කරුණාව ය. අනුන්ගේ ආරාධනාවක් නැති බැවින් කරුණාවට අරමුණු වූ සිංහලබෞද්ධ මහාජනයා ම බාහ්‍ය නිමිත්ත වශයෙන් සැළකිය හැකි ය.

**කර්තෘ**

මේ ග්‍රන්ථයෙහි කර්තෘ වනාහි විද්‍යාචක්‍රවර්ති නම් මහ පඬිවරයෙකි. සිංහලස්තූපවංශය ද සකලවිද්‍යාචක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත නම් කෙනෙකුන් විසින් කරණ ලද්දකි. බුත්සරණ කළ විද්‍යාචක්‍රවර්ති හා ස්තූපවංශය කළ සකලවිද්‍යාචක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිතයනුත් එක්කෙනෙකු ලෙස ම අපි මුල දී සිතීමු. එහෙත් පොත් දෙකෙහි භාෂාව සසඳබලන විට පෙනෙන්නේ ස්තූපවංශය බුත්සරණට වඩා ශතවර්ෂ දෙකක් තුනක් ලාබාල බව ය. ස්තූපවංශය කුරුණෑගල රාජධානිකාලයට හෝ ඊට ඉතාමත් ආසන්නකාලයක කළ පොතකි. බුත්සරණ පොළොන්නරුකාලයට අයත් වූවකි. එහෙයින් ඒ පොත් දෙකෙහි කර්තෘවරු දෙදෙනෙකි. එක්කෙනෙක් නොවෙති.

**කර්තෘතත්ත්වය**

මේ පොතෙහි කර්තෘ වූ විද්‍යාචක්‍රවර්ති සැබවින් ම විද්‍යාචක්‍රවර්තියෙකි. සම්බුද්ධධර්මයෙහි හා නොයෙක් ශාස්ත්‍රාන්තරයන්හිත් අප්‍රතිහත බුද්ධිප්‍රභාවයකින් යුක්තයෙකි. පැරැණි සිංහල ග්‍රන්ථ කර්තෘවරයන් අතරෙහි ප්‍රතිභාඥානයෙන් විද්‍යාචක්‍රවර්තීන්ට සම වන්නේ කව්සිළුමිණ රචනා කළ කලිකාලසර්වඥ කවීශ්වරපණ්ඩිත දෙවෙනි විජයබාහු රජතුමා පමණකි. සුප්‍රසිද්ධ සිංහල ග්‍රන්ථ කර්තෘවරයෙක් වූ ගුරුළුගෝමී කවිත්වයෙන්

විද්‍යාචක්‍රවර්තීන් අසලකට වත් නො පැමිණේ. අතිශයෝචිත චමත්කාර ජනක උපමා කීමෙහි මහාකවි කාලිදාසයන් ලැබූ කීර්තිය විද්‍යාචක්‍රවර්තිමහාකවි තෙමේ මේ එක ම පොතෙන් පරදව යි. කාලිදාසයන්ගේ සියලු ම කාව්‍යවල ඇති උපමාවන් මේ එක ම බුත්සරණයෙහි ඇති උපමාවන්ට අඩු බව ඒ පිළිබඳ පරීක්ෂා කළොත් ඔප්පු වෙයි.

ප්‍රයෝජන

මේ ග්‍රන්ථය සම්බුද්ධධර්මග්‍රන්ථයක් වශයෙන් පමණක් නොව ගද්‍යකාව්‍යග්‍රන්ථයක් වශයෙන් ද ඉතා ප්‍රයෝජනවත් ය. සම්බුද්ධධර්මය ඉගෙන ගන්නා අතර ම මනෝහරවර්ණනාක්‍රමත් පිරිසිදු වාක්‍යරචනාරීතිත් මේ ග්‍රන්ථයෙන් ඉගෙණිය හැකි ය.

ග්‍රන්ථතත්ත්වය

කාව්‍යප්‍රභේදයන් අතුරෙන් මේ ග්‍රන්ථය කෝෂකාව්‍යභේදයෙහි ඇතුළත් වේ. සම්බුද්ධධර්මය අලළා සිංහලභාෂාවෙන් කළ මෙතරම් ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයක් ගුරුළුගෝමීගේ ධර්මප්‍රදීපිකාව විනා තවත් නො මැති යි. ගුරුළුගෝමීන්ගේ අමාවතුර හුදු පරිවර්තනයකි. එහි භාෂාව අළුත් විලාසයක් ගන්නා නමුත් ග්‍රන්ථකර්තෘහුගේ ප්‍රතිභානයෙන් එකතු වූ කිසිවක් එහි නැත්තේ ය. සද්ධර්මරත්නාවලිය ද පරිවර්තනයකි. බුත්සරණ වූ කලි ඒ සියලු ග්‍රන්ථ ම පරදවා චක්‍රවර්තිශ්‍රියක් දරයි. මේ ග්‍රන්ථයෙහි වනාහි නොයෙක් චරිතකථාවන් පමණක් නො ව උසස් ධර්මකොට්ඨාස ද සැකෙවින් දක්වන ලදී. මෙහි පෙණෙන නෛසර්ගික වූ පදලාලිත්‍යය අතිශයවෛචිත්‍ර්‍යාවහ ය. කියන්නන් කටට අසන්නන් කණට සුව එළවන ලිහිල් වචනයන් තෝරාගැණීමෙහි විද්‍යාචක්‍රවර්තීන් තුළවූ ශක්තිය අතික් එක ද සිංහලගද්‍යග්‍රන්ථකාරයකු වෙත නො වී ය. ග්‍රන්ථකර්තෘහුගේ ප්‍රතිභානයෙන් උපදවන ලද විවිධමනෝහර වර්ණනාක්‍රමත් රචනාවිලාසත් මෙහි නොයෙක් තැන ඇතුළත්වේ. මෙහි ඇතුළත් සමහර චරිතකථා අමාවතුරෙහි ද ඇතුළත් වන නමුත් ඒ කථා පාළිපොත්වලින් කියවූවෙකුට එහි අළුත් භාෂාවිලාසයෙන් ලැබෙන රසයට වැඩි අමුතු රසයක් එයින් වින්ද නො හැකි ය. විද්‍යාචක්‍රවර්තීන්ගේ පන්හිඳතුඩින් ලියවුනු ඒ කථා ම මුල් කථාවලට වඩා සියදහස් ගුණයෙන් රසවත් ය. අමාවතුරෙහි එන ආලවකදමනය මෙහි එන එම කථාව හා සසඳ බැලූවිට විද්‍යාචක්‍රවර්තීන්ගේ හා ගුරුළුගෝමීන්ගේත් තත්ත්වය ඉඳුරා ප්‍රකට වෙයි. මෙහි 155 වන පිටුවෙහි පටන් පෙණෙන විශාලාපුර වර්ණනාව හා ලිච්ඡවිරාජවර්ණනාවත් කියවනවිට විද්‍යාචක්‍රවර්තීන්ගේ ප්‍රතිභාශක්තිය හා වර්ණනා ශක්තියත් නොගෙවෙනසුලුබව කියවන්නාගේ සිතෙහි තහවුරු

වන්නේ විස්මයත් සමග ය. එම ලිච්ඡවිරාජවර්ණනාව සමහරවිට විද්‍යාචක්‍රවර්ති කාලයෙහි වූ රජෙකුගේ අධර්මිෂ්ඨරාෂ්ට්‍රපාලනයට එල්ලකරණලද්දක් ද විය හැකි ය. මෙහි හැමතන්හි ම වාගේ තැනට සුදුසු උපමා ය. එය පැවසීමට සුදුසු වචන ය. ඉතාමත් කොටින් කියතොත් මෙතරම් සාරවත් මෙතරම් රසවත් මෙතරම් ව්‍යක්ත අනික් සිංහලගද්‍යග්‍රන්ථයක් නැතැයි කිය යුතු ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

මේ ග්‍රන්ථය කිරීමෙහි දී දීඝනිකායාදිය හා ධම්මපදට්ඨකථා, ජාතකාට්ඨකථා, විමානවස්තු, ප්‍රේතවස්තු ආදි ග්‍රන්ථයන් ඇසුරු කළ බව පෙණේ. මෙහි නව වන අංශය විමානවස්තු ප්‍රකරණයේ සාරයකි. 39 වන අංශය දික්සඟියෙහි දසුත්තරසංගීති සූත්‍රයන්හි හා තවත් නොයෙක් තැන ආ ද්විකත්‍රිකාදිධර්ම එක්තැන් කිරීමෙන් විරචිත ය. 75 වන අංශයෙහි පටන් පෙණෙන ලොකවිවරණකථා බුද්ධදෙශනා නො වේ.

**පොෂිත ග්‍රන්ථ**

මේ බුත්සරණ බොහෝ සිංහලග්‍රන්ථකර්තෘවරයන්ට පිහිට වූවකි. බොහෝ ගත්කරුවෝ මෙයින් නොයෙක් දෙය ගත්හ. මෙහි 31, 94, 95 වන අංශාදියෙහි ඇතුළත් ඇතැම් වර්ණනා සිංහලශබ්දලක්ෂණකාර වෙදෙහ ස්වාමිපාදයෝ පාලිභාෂාවට පෙරළා සමන්තකූටවණ්ණනාවෙහි යොද ගත්හ. වීදගම මෛත්‍රීමහනෙත්පාමුළ මහතෙරිඳුන්ගේ බුදුගුණාලංකාරයෙහි පෙණෙන විශාලානගරවර්ණනාදිය මෙයින් ම උපුටා ගන්නා ලදී. වෙනස නම් මෙහි වූ ගද්‍යවාක්‍ය එහි පද්‍යවාක්‍යයන් වීමයි. සිංහල ස්තූපවංශයෙහි බොහෝ තන්හි බුත්සරණවැකි අකුරකිනුදු නො වෙනස් සේ තිබේ. කාව්‍යශෙඛරයෙහි ද බුත්සරණින් ලබාගත් අබරණ පෙණේ. නොයෙක් පොත්වලින් වාක්‍යාදිය ගෙණ ලියන ලද සර්වඥගුණාලංකාරය ගැන කියයුත්තක් ම නැත. ගුත්තිලකාව්‍යකාර වූ වැත්තෑවේ හිමියෝ ද විද්‍යාචක්‍රවර්තීන්ගේ ප්‍රතිභානයෙන් උපකාර ලැබූහ. මෙසේ බොහෝ ග්‍රන්ථ විද්‍යාචක්‍රවර්තීන්ගේ කවිත්වයෙන් හා වචනයන්ගෙන් ද පොෂණය ලද බව කිය හැකි ය. සද්ධර්ම රත්නාවලියට හා පූජාවලියටත් බුත්සරණින් වැඩි දෙයක් ගත් බවක් නො පෙණේ. සද්ධර්මරත්නාවලියෙහි දෙතුන් පළක පෙණෙන "මකුළුහුයක යටිපිට ද උඩුපිට කළුවන් නො වන තුරු" යන උපමාව බුත්සරණින් ගත්තකැ යි හැඟේ. පූජාවලියෙහි දීඝී වශයෙන් විස්තර කළ මාරදුහිතෘ කථාවෙහි දී බුත්සරණෙහි 31 වන අංශය ද පූජාවලි කර්තෘපාදයන්ගේ සිහියට නැඟුනු බව හැඟේ.

දහම්සරණ හා සඟසරණ

දහම්සරණ හා සඟසරණ ද විද්‍යාචක්‍රවර්තීන්ගේ ම කෘති ය යි සමහරු කියති. හේතුව ලෙස දක්වන්නේ දහම්සරණෙහි එන 'සත්රුවන් පුරාගිය බව මැ රත්නත්‍රය සරණ ගියවුන්ට සියලු දුක් දුරු වෙයි කියා මා කියන්නා වූ තෙසරණ ගුණයට ම දෙස" යන පාඨය යි. මේ පාඨයෙන් බුත්සරණ ආදී පොත් ද දහම්සරණ කතුවරයා විසින් ම කළබවක් නො හැඟේ. දහම්සරණගුණ කියනවිට බුත්සරණසඟසරණගුණද ඉබේ ම කියවේ. එහෙයින් දහම්සරණකතුවරයා "මා කියන්නා වූ තෙසරණ ගුණ" යි යෙදීම යුතු ම ය. එයින් ඔහු විසින් බුත්සරණ සඟසරණ යන පොත් ද ලියූ සේ නිශ්චය කිරීම යුතු නො වේ.

අප කියන්නේ මේ පොත් තුණ කාල තුණකට අයත් තුන් දෙනෙකුන්ගේ කෘති ය යන බව යි. ඒ පොත් තුණෙන් ප්‍රකාශ වන ප්‍රතිභානය හා වර්ණනාවිලාසයත් වාක්‍යරචනාරීතිය හා ශබ්ද ප්‍රයෝගයත් හාත්පසින් ම එකිනෙකට වෙනස් ය.

බුත්සරණින් ප්‍රකාශ වන අන්දමේ ශ්‍රෙෂ්ඨප්‍රතිභානයක් දහම් සරණින් ප්‍රකාශ නො වේ. සඟසරණින් ප්‍රකාශ වන විශෙෂ ප්‍රතිභානයක් නැත්තේ ය. බුත්සරණෙහි පෙණෙන වර්ණනාවන් තරම් දහම් සරණෙහි වර්ණනා ස්වභාවික ද නිරුත්සාහකෘත ද චමත්කාරජනක ද නො වේ. දහම්සරණකාරයන් නොයෙක් විට බුත්සරණ අනුගමනය කරන්ට උත්සාහ කළ බව පෙණෙන නමුත් ඒ උත්සාහ එතරම් සාර්ථක වූ බවක් නො පෙණේ. දහම් සරණෙහි මුල කොටස කාදම්බරී ආදි සංස්කෘත-ගද්‍යකාව්‍යයන්හි පෙණෙන දීර්ඝසමාසපදයන් වැනි සංස්කෘතසමාසපදයන් බහුල භාෂාවෙන් රචිත ය. විද්‍යාචක්‍රවර්තීහු එබඳු භාෂාවට කිසි විටෙක රුචි නො කළහ. දහම්සරණෙහි අග කොටස සාමාන්‍ය සිංහල භාෂාවෙන් රචිත නමුත් ඒ භාෂාව බුත්සරණෙහි භාෂාව මෙන් ලලිත ද මනොහර ද නො වේ. සඟසරණ මේ හැම කරුණකින් ම දිළිඳු ය.

බුත්සරණ කරණ ලද්දේ පොළොන්නරුකාලයේ දී නොහොත් ඊට පෙර ය යි මුල දී කීමු. දහම්සරණ කරණ ලද්දේ දඹදෙණිකාලයෙන් පසු ව ය යි කීමට කරුණු තිබේ.

සද්ධර්මරත්නාවලිය දඹදෙණිකාලයේ කරණ ලද ග්‍රන්ථයකි. පුරාණ ග්‍රන්ථකර්තෘවරයන්ගේ නම් දක්වන නිකාය සංග්‍රහය සද්ධර්මරත්නාවලීනාමය දක්වන්නේ පූජාවලිකර්තෘ නාමයටත් පසු ව ය. සද්ධර්මරත්නාවලිය ධම්මපදට්ඨකථාවේ විස්තෘත පරිවර්තනයෙකි. ධම්මපදට්ඨකථාවේ එන කථාවස්තු සිංහලයට පෙරළන්නෙකු එය බලනු නිසැක ය. දහම්සරණ කර්තෘ ද ධම්මපදට්ඨකථාවෙහි එන කථාවස්තු ලියද්දී සද්ධර්ම රත්නාවලිය බැලූබව ඔප්පුවන තැන් කීපයක් තිබේ. ඒ දෙපොතෙහි ම පෙණෙන

සොෂකකථාවෙහි භාෂාව සමාන ය. "එසේ හෙයින් සත්පුරුෂයන් විසින් අනික් කරණ කුශලයක් නැත ද තුණුරුවන් කෙරෙහි ස්නේහමාත්‍රයක් උපදවා අසාධාරණ වූ අනුපම වූ දිව්‍යසම්පත් අනුභවකරන්ට උත්සාහ කට යුත්තේ ය." යන වාක්‍යය සද්ධර්මරත්නාවලී කාරයන්ට නොයෙක් තැන පුරුදු ලෙසින් ම සොෂකකථාවෙහි ද ලියූවකි. ඊට සමාන පාලිපාඨයක් ධම්මපදට්ඨකථාවෙහි නොමැතියි. දහම්සරණෙහි 229 වන පිටුවෙහි මේ වාක්‍යය-

"එහෙයින් සත්පුරුෂයන් විසින් ඉතිරි කරණ ලද කුසල් නැත් ද, තුණුරුවන්හි ස්නෙහමාත්‍රයක් කොට ද අසාධාරණ වූ අනුපම වූ දිව්‍යසම්පත් අනුභව කරන්නට උත්සාහ කළ මැනව" යන ලෙසින් පෙණේ. දෙකෙහි වෙනස ඉතා ස්වල්පයකි. මෙබඳු තවත් තැන් එහි තිබේ. සද්ධර්මරත්නාවලී කර්තෘපාදයන් තමන්ගේ ප්‍රතිභානයෙන් උපදවා අමුතු දෙය එකතු කරමින් ධම්මපදට්ඨකථාව පරිවර්තනය කරද්දී සොෂකකථාව ලිවීමට දහම් සරණ පෙරළා බැලුවයි සිතීම යුතු නො වේ. සොෂක කථාව අනික් පොතකට ඇතුළත් කරන්නා එය තිබෙන මුල්පොත නොහොත් එහි පරිවර්තනය බැලීම ස්වාභාවික ය. එහෙයින් දහම්සරණකාරයන් සද්ධර්මරත්නාවලිය බලමින් ම සොෂකකථාව ලියූවයි සිතීම යුතු ය.

මේ කරුණු වලින් තීරණය කට හැක්කේ දහම්සරණ විද්‍යාචක්‍රවර්තීන්ගේ කෘතියක් නො ව සද්ධර්මරත්නාවලියට ද පසු ව ලියූ පොතක් බව ය.

බුත්සරණ දහම්සරණ දෙක පමණක් තිබෙනු දුටු පසු ව සිටියෙකු විසින් සඟසරණක් ද අවශ්‍යය යි සිතා එය ලියා අර දෙ පොතට ම එකතු කළ සේ සිතිය හැකි ය.

## ශොධනය

මීට අවුරුදු 50 කට පමණ ඉහත දී මේ ග්‍රන්ථයෙන් කොටසක් මුල්ලේරියාවේ විපුලසාර මහාස්ථවිර පාදයන් වහන්සේ විසින් සකස් කර මුද්‍රණය කරවන ලදි. 1929 දී පමණ අප විසින් ද කළුකොඳයාවේ පඤ්ඤාසෙඛර නායක ස්ථවිරපාදයන් වහන්සේගේ සහායත්වය ඇති ව එක් කොටසක් ශුද්ධ කර ප්‍රකාශයට පමුණුවන ලදී. ඊට පසු "අප මුත් අන් කෙනෙක් නැතැ"යි දනුමැතිකම් උගත්කම් වියත්කම්හි බැහැවුනු එක්තරා කෙනෙකුන් විසින් මුළු පොත ම ගැටපද විවරණයකැයි නම් තැබූ කොටසකුත් සමග මුද්‍රණය කරවන ලදී. 1931 දී අප සම්පූර්ණ ග්‍රන්ථය ම ශුද්ධකර මුද්‍රණය කරවීමු. එහි සංඥාපනයෙහි යථොක්ත දනුමැතියන්ගේ කෘතිය සම්බන්ධ ව වචන ස්වල්පයක් දක්වීමු.

අපේ සංස්කරණය ඊට පසු ද කීපවරක් මුද්‍රණය කරවන ලද නමුත් පසුගිය මහායුද්ධය නිසා මුද්‍රණොපකරණ මහාර්‍ඝ වීම නිසා මේ මහර්‍ඝග්‍රන්ථය දුර්ලභ වී ය. අපේ ශිෂ්‍යයකු වූ වෛද්‍යකලානිධි පෙමසිරි අභයවික්‍රම වෙදමහත්මයාගේ ඉල්ලීම නිසා මේ වර සංස්කරණය ආරම්භ කොට හඟුරන්කෙත පොත්ගුල්විහාරයෙන් ලැබුනු පැරණි පිටපත් දෙකක් හා සසඳමින් පිටු 80 ක් පමණ සකස් කෙළෙමු. ඒ අතර මේ මුද්‍රණය යුහුසුලු ව කළ යුතු ය යි ප්‍රකාශකයන් කියා සිටි හෙයින් අමුතු පොත් හා සැසඳීම නැවැත්වීමු. මේ සංස්කරණය 1931 වන අවුරුද්දේ දී ප්‍රකාශයට පැමිණි සංස්කරණයට බෙහෙවින් සමාන ය. ඊට වඩා වෙනස් තැන් ස්වල්පයක් ද මෙහි නැත්තේ නො වේ. 22 වන පිටුවෙහි "තොප යොවුන් තොප රූහි" යන්න "තොප යොවුන්තුරුහි" යි ද, 262 වන පිටුවෙහි "ලියත් ලියත් රූ හලෙකැ හෙත" යන්න "ලියත් ලියත් රූහළුවෙහි හෙත" යි ද සියලු ම පුස්කොළ පිටපත්වලට ද විරුද්ධ ව සකස් කෙළෙමු. "රූහළෙක හෙත" යන්න ද පුස්කොළපොත්හි පෙණෙන්නේ "රූලක එත" යන ලෙසිනි. "හළුවෙහි" යි වෙනස් කෙළේ 240 වන පිටුවෙහි තිබෙන "හළුයේ වැටීහිනැ" යි යන පාඨය හා ඇත්දළවඩුවන් අතර පවත්නා "දිය අළුව, රූඅළුව, ගිනිඅළුව" යන වචන ද සමග සැසඳීමෙනි. මෙසේ වෙනස් වූ තවත් පාඨකීපයක් ඇත්තේ ය.

මුද්‍රණය

අපේ මේ සංස්කරණය මුද්‍රණය කරවා ගැණීමට යථොක්ත අභයවික්‍රම වෙදමහත්මයාට අවසර දුන්නෙමු. එහෙයින් ඔහුගේ කැමැත්ත නැති ව මෙහි අපේ සංස්කරණයන් පැහැර ගැණීම නීතිවිරුද්ධ ය යන බව අනුන්ගේ ග්‍රන්ථසංස්කරණයන් පැහැර ගන්නන්ට අනුකම්පාපූර්‍වකව මතක් කරමු.

ප්‍රාමාදිකපාඨ

මේ වර මෙය මුද්‍රණයන්ත්‍රාලය කීපයක මුද්‍රණය කරවන ලදී. එහෙයින් මෙහි පිටු 40 ක හෝ 48 ක ශුද්ධිපත්‍ර එක්දවසක දී කියවන්ට අපට සිදු වී ය. ඉගැන්වීම් ආදි තවත් කටයුතුවල යෙදී සිටින්නෙකු එක දවසක් තුළ එතරම් ශුද්ධිපත්‍ර රාශියක් කියවන විට නොයෙක් ප්‍රමාද දෙෂ ඇති විය හැකි බව කිව යුතු නො වේ. එබඳු දෙෂයන් සකස් කරගැණීම බුද්ධිමත් පාඨකයන්ට අපහසු නොවන හෙයින් ශුද්ධිපත්‍රයක් යෙදීමට අදහස් නො කෙළෙමු.

## උපකාර

මේ වර මුද්‍රණයේ දී ශුද්ධිපත්‍ර කියවීම සඳහා විද්‍යොදය පිරිවෙණේ ආචාර්‍ය්‍යවරයන් වන වැලිවිටියේ පෙමරතන, වේරගොඩ පණ්ඩිත අමරමොලි, පණාම්ගල පණ්ඩිත ජිනරතන යන නායක ස්ථවිරයන්ගෙන් හා ගලගම පණ්ඩිත සරණඞ්කර ස්ථවිර නමගෙන් ද උපකාර ලැබුනු බව ප්‍රීති පූර්‍වක ව සඳහන් කරමු.

මෙහි අග යෙදුනු සංඥානාමානුක්‍රමණිකාව සම්පාදනය කරණ ලද්දේ පී. අභයවික්‍රම වෙදමහත්මයා විසිනි.

## ඇයන්ත හා විකල්ප විධි

පුරාතනභාෂාවෙහි වර්‍තමානභාෂාවට වඩා අධික ව ඇයන්ත ව්‍යවහාර කළ බව කවුරුත් පිළිගණිති. පුරාණ ආදර්‍ශග්‍රන්‍ථයන්හි අධික ව 'ඇ' කාරප්‍රයෝගය පෙණෙතත්, මෑත දී ලියන ලද පිටපත්හි වර්‍තමානභාෂාවෙහි මෙන් ම ඇයන්ත ලුප්තප්‍රාය ය. පුරාණපිටපත් අනු ව අපි මේ ග්‍රන්‍ථය සකස් කෙළෙමු. එහෙත් ප්‍රථමාවිභක්ත්‍යන්තපදයන්හි පවා 'ය' යන්න දුටු පමණින් "අසෙවනීයැ" "කර්‍මීයැ" යනාදි වසයෙන් 'යැ' යන්න යොදන "දනුමැති" යන් සේ සැහැසි නුවූමු. "කළහ, වදළහ" යනාදි වශයෙන් යෙදුනු වචන මෙහි "කළහැ, වදළහැ" යනාදි වශයෙන් යෙදූබව විශෙෂයෙන් කිය යුත්තකි. පැරණිපිටපත්හි පෙණෙනුයේ ද මේ ක්‍රමය මැ යි. මුල දී මෙය ලෙඛකප්‍රමාද ජාතයෙකැයි සිතූ නමුත්, බොහෝතන්හි පෙණෙනහෙයින් මෙයින් අන්‍ය අමාවතුරු, ධර්‍මප්‍රදීපිකාදි පැරණිපුස්කොළ පොත් ද පරීක්‍ෂා කෙළෙමු. එහි දු මෙසේ ම යෙදුනු බව පෙණිනා. මුද්‍රිත පූජාවලී ආදියෙහි ද ඇතැම්තැන මේ දක්නා ලදී. මෙය ලෙඛක ප්‍රමාද ජාතයෙක් නම්, බැලූ බැලූ පොත්හි තිබිය හැකි නො වේ. ග්‍රන්‍ථශොධකයන්ගේ භ්‍රමය මිස ලෙඛකයන්ගේ භ්‍රමයෙක් මෙතැන්හි නැත. මේ 'හැ' යන්න 'හු+යැ' (=කළාහු+යැ) යන දෙක සන්‍ධිවීමෙන් ලැබෙන රූපය යි. වර්‍තමානභාෂාවෙහි 'යැ' නිපාතය 'ය' බවට නැමුනාක් මෙන් 'හැ' යන්න ද 'හ' බවට නැමුනේ ය. එහෙයින් එහි වූ සන්‍ධිය වාර්‍තමානිකයෝ නො සලකති. වාක්‍ය පරිසමාප්ත්‍යර්‍ථයෙහි යෙදෙන 'ය' නිපාතය 'හු' යන්නෙන් පර ව මිස මේ 'හ' යන්නෙන් පර ව නො යෙදේ. 'හ' යන්නෙහි සන්‍ධියෙන් ප්‍රච්ඡන්න ව යකාරය තිබෙන හෙයිනි. එසේ ම "කළාහු ය. වදළාහු ම ය" යි යොදනු මිස "කළාහ ය කළාහ ම ය" යන වසයෙන් නො යොදති. මෙ කී නිදර්‍ශනයෙන් යට කී සන්‍ධිවිධිය ස්ඵුට වන හෙයින් 'කළහැ' යනාදිය මෙහි දී අඞ්ගීකෘත ය. හෙ ද විකල්පයෙනි. "සෙයෙකැ=සේකැ (=සෙයෙක්+යැ) සෙයෙක=සේක. රසින්=රැසින්, ගැත්තහු=ගැත්තවූ, අන්හු=අන්නු, අතළ=අතළ,

පවා=පොවා, හැරැදක්වා=ඇරැදක්වා" යනාදිය ද විකල්පවශයෙන් පැරැණි පිටපත්හි පෙණුනු හෙයින් එසේ යොදන ලදී.

විද්‍යාචක්‍රවර්තීන් විසින් යම් භාෂාවකින් මේ පොත ලියන ලද නම්, ඒ භාෂාව ම මෙහි යොද ලන්නට හැමවිට ම උත්සාහ ගතුම්හ. මින් අවුරුදු හත්සිය ගණනකට ඉහත පැවතුනු භාෂාව හා වර්තමානභාෂාවත් සමාන සේ නො සිතිය යුතු යි.

වැලිවිටියේ සොරත ස්ථවිර

ශ්‍රී බු: ව: 2496 මාර්තු මස 10 වන දින
ක්‍රි: ව: 1953
විද්‍යොදය පිරිවෙණේ දී ය

මේ වර මුද්‍රණයෙහි දී ද සමහර කොටස්වල ශුද්ධිපත්‍ර අප විසින් නො ව වේරගොඩ පණ්ඩිත අමරමොලි නායක ස්ථවිරයන් විසින් කියවූ බව ස්තුති පූර්වක ව සඳහන් කරමි.

වැලිවිටියේ සොරත ස්ථවිර

2503 / 1959 අගෝස්තු 24 වන දින දී ය

# අමෘතාවහ

නම් වූ

# බුත්සරණ

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

---

සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං - එතං බුද්ධානසාසනං.

## 1.

### "බුද්ධං සරණං ගච්ඡාමි" - "බුදුන් සරණ යෙමි."

සුවයෙහි මිහිරි දන්නා, දුක්හි දඩිකම් දන්නා, සදෙව්ලොව්හි[a] සැපත් අයත්නයෙන් විඳුනා කැමැති, බුදු-පසේබුදු-මහරහතුන්[b] විදි නිවන්පුර වැද සැනහෙනු කැමැති, නිරැහි නම් නො අසනු කැමැති, තිරිසන්යෝනියෙහි හකුල් හෙළනු කැමැති, ප්‍රෙත වැ වින්ද යුතු වසම්[1] පිටු දක්නා කැමැති, අසුරකායයෙහි මහවියවුල් මුල් සිඳුනා කැමැති, තමහට සෙනෙහැති, අබුද්ධොත්පාදයෙහි නො ලබන මහඇඟි අමාරසයකින් ලය සනහනු[2] කැමැති, මිනිස් වැ සිට දෙව්බඹුන් නො ලබන සිත්සැනහුම්රස විඳුනා කැමැති, රාජභය-චොරභය ආදි භයින් රොමකූපමාත්‍රයකට ද උපද්‍රව නො වැද්ද දෙනු කැමැති, සසරදුකට සිසී යෙහෙන් සිත් සනහනු[2] කැමැති සිත් වන් වැඩක් යෙහෙන් සාධනු කැමැති, නො වනු කැමැතියක්හු දුරින් දුර ලනු කැමැති, මහමුහුදු ගල් සේ ගොඩ කරණු කැමැති, මහපොළොව විරුවා[3] දියකරණු කැමැති, අහස්හි ද පිහිට ලබනු කැමැති, මතැතුන් සිතියම ඇත්ද සේ නිසල කරණු කැමැති, කිපී බැලූ බැලුම් පමණකින් මහමෙර දවා හළු කරත් පොහොසත් නාරදුනුදු ගෙදෙරෙහි ගැඩවුලන් සේ විස නැති කරණු කැමැති, ගින්නෙන් සිහිල් විඳුනා කැමැති, සතුරන් මිතුරු කරණු කැමැති, බැලුබැලූවන්ට නවබඟ[4] සඳක් මෙන් මිහිරි වන්නා කැමැති, තමන් වැද පිදූවන් අමාමහ නිවන්හි ඇර සිටුවනු කැමැති සත්පුරුෂයන් විසින් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. II වනසම්, වන්සම්.
2. මු. I. V & VI සැනහෙනු
3. මු VII විසුරුවා (විරිවා?)
4. නවගබ-හැම.

a. ලෙව්හි
b. රහතන්

## 2.

සසරමහමුහුදට මහනැවක් බඳු සසරදුක්ගිනි නිවන මහ මේකුළක් බඳු; සසරදුක් මහගඩ නසන දිවබෙහෙදක් බඳු; සසර මතැත්හු දළදප් හළ කෙසරසිංහයකු බඳු; සසරමහගිම් නිවූ සිහිල් සුවඳමඳපවනක් බඳු; සසරයක්හු දිවගුළෙහි හෙළු මහ ඇදුරක්හු බඳු; සසරදුක්මහඅඳුරු බුන් ලහිරුමඬලක් බඳු; මහත්නට වැඩි මහත්; වියත්නට වැඩි වියත්; කරුණාඇතියනට වැඩි කරුණා ඇති; රූ ඇතියනට වැඩි රූ ඇති; පිණැතියනට වැඩි පිණැති; බලැතියනට වැඩි බලැති; දූවූ සොහොන්හි විසිරැ ගිය ඇට ගෙණැ වැඳපිදූවන්, බත් වැළඳූ පාත්‍රයෙහි නම සිහි කළවුන්, පිට දී උන් රුක්හි මළපරඬලා මෙනෙහි කළවුන්, පෙරෙව්සිවුරෙහි නම් කීවවුන්, විදූ වෙහෙර සලකා මුදුනෙහි ඇඳිලි බැන්දවුන්, සිහිනෙනුදු තමන් නම මුවෙහි වැකුවවුන්, තමන් නම කියා කළ මැටි රුවට පුද කළවුන්; පිඩක්[1] පමණ බතින්, මිටක් පමණ මලින්, වියතක් පමණ කඩින්, අතලොස්සෙක්හි ගත් පැනින්, රියනක් පමණ තණපැලින්, තල්පතින් කළ කුඩ පමණකින්, අස්කඩින් නැඟූ කොඩි පමණකින් පුද කළානට තමන් වන් අමාමහතිවන් ගෙණැ දෙන බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 3.

'දෙපා ගෙණ පරසක්වළ ගසමි'යි කිපී දිවූ ආලවකයා 'කඩුවෙන් පැහැරැ දෙකඩ කොට ඇහිලි කපා ගන්මි'යි දිවූ අඟුල්මල් සොරහු, 'සැරපහරින්විද කසලු[2] කරම්හ'යි දුනුවායන්, 'රජ මහවත්මැද ඇද හෙළවා දළින් පයින් ඇනැ මඩවා සුණුවිසුණු කරම්හ'යි මෙහෙයූ නාලාගිරි මතැත්හු, 'සිපගෙණැ ඇඟ රොම යෙන් විද්‍ද අවුණන්ට දිවූ සූචිරොම නම් යකා, ඇඟ ඩහ සොල්වා වාද කෙරෙමි'යි දිවූ සච්චකවාදීහු, 'මට වැඩි මහත්හු නැතැ'යි මන් ගත් සාරදස්අටසියක් යොදුන් අසුරිඳුහු, මට වැඩි මහත්හු නැතැ'යි මන් ගත් බක නම් මහබඹහු, 'මා සේ[4] ලොව්හි[a] බුදුහු නැතැ'යි වියත්කම්හි බැහැවුනු උරුවෙල කාශ්‍යපයා, ඉසට ගල් පෙරළු දෙව්දත්හු, හැම දමා හැම හික්මවා හැම කුලගැති කොට හැම සරණ ගන්වා තමන් සිරිපා වැඳවූ[4] බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 4.

මිහිවැද පිළිගැන්වූ වඳුරා, පාසිවුරු ඇඳි මතැත්හු, මුහුණ බලා හුන් බකමුහුණා, 'මිහිරැ'යි හඬ අසා හොත් මඬුවා, එ හිමියා වසන තැනැ'යි වෙහෙරට වන් ප්‍රෙතයන්, කුඩුකැවුම් පිළිගැන්වූ කළඳසුන්[a],

1. මු I. II. III. මිටක්, 2. මු II & III කසළු IV සකලු.
3. මෙසේ-බොහෝ. 4. වැන්දවූ. a. ලෙව්හි.

වැඳලා සිටි සැඩොල්දූන්, පිට දුන් අසුන්, තමන් දගබට විටියල[1] ඇදි මිහිවුන්, තමන් බුදුරස් වන් වන් තන්හි පහන් වූ හැමසතුන්, එක පැහැර අමාමහනිවන්හි පුරා සනහා තිදුක් සුවපත් කළ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 5.

කිඹුල්වත්පුර නුවරක් වැනි රාජධානියක්; යශොධරා බිසොවුන් වැනි පුරුදු ඇඹනිකෙනකුන්, රාහුල කුමාරයන් සේ වූ එක්වැනි පුත්රුවනක්; ගවු දෙගවු තුන්ගවු යොදුන් පමණ මුවවිටි ඇති, දෙලක්‍ෂ හතළිස්දහස් යොදුන් පමණ ගැඹුර ඇති, මුළු ලොවිහි[b] සතුන් එක පැහැර ගණුත් අඩු නො පැ ගත් ගත් තැන් පිරෙණ සතරමහනිධානයන්; සත්රුවනින් හෙබි, සතරමහා ඍද්ධියක් ඇති, සතිස්ම යොදනෙක්හි පැතිර සිටිනා මහපිරිසක් ඇති, මුළුසක්වළෙහි එක පැහැර කරණ සක්විතිරජය; දිවහනන් රූ පැරයූ සතළිස්දහසක් නාටකස්ත්‍රීන්; සුදෙවුන් මහරජානන් වැනි පියාණකෙනෙකුන්; හිමත්[c] ගිමන් වසන් යන තුන්සෘතුවට කැරුවූ තුන් පහයක්; ඇසට සැරහුමට සැරහී සිටි මනහර රූ; කණට සැරහුමට සැරහි සිටි මනහර ශබ්ද; නාසයට සැරහුමට සැරහී සිටි මනහර දිවසුවඳ; දිව පිණවන මියුරුඅහර;[2] කය සනහන යහපහස්;[3] කෙළනා උයන්කෙළි; කලට සුදුසු දියකෙළි; උකටලියට සතුරු ව සිටි නන්විසිතුරු නැටුම්; සිත් සැනහුමට මුල් වැ සිටි නො වෙනස් යහළුවන් එළවූ මියුරුකෙළිලළු[4] හැම අමුසොහොන්හි දමූ කුණු මෙන්, මඩොරෙහි පිරූ මළමූත්‍ර මෙන්, ගවරවළෙක්හි හුනු පණුකැලන් සෙයින් අපිස් වැ හැර, අප හැමදෙනාහට සුව දෙනු පිණිස මිනී වසා දමූ කඩින් ගෙතු පවුලක් පෙරෙවැ, පාත්‍රයක් අතින් ගෙණැ, 'රජගෙය'යි සතුටු නො වැ, 'සැඩොල්ගෙය'යි නො ගරහා, ශක්‍රයා දුන් දිව්‍ය භොජනයෙහි දූ, බමුණා දුන් ඉඳුල්බත්හි දූ, සම වූ පිළිගැන්මෙන් ලොවට වැඩ සැධූ, උපමා නැති කරුණාවෙන් පිරිපුන්[5] බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 6.

බලන්නන් ඇසට, අසන්නන් කණට, සිතන්නන් සිතට, බණන්නන් බසට, වඳින්නන් වැඳමට, පුදන්නන් පිදුමට තමන් මුත් අතික් සුදුසු කෙනකුන් නැතියා වැ මහඇහි වැ සිටි බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1 මු II. IV & V පිටියල. 2. I. IV & V අගරස. 3. මු. I. II & V යහනපහස්. IV. යාපහස්. 4. කළු. 5 පිරුණාවූ a. දසුන්. b ලෙවිහි. c හිමන්.

## 7.

දෙර දෙර නැඟි සඳක් සේ, හැම සතුන් තමතමා ජීවිතයක් සේ, නො හැකිළැ පිපිවණින් සිටිනා රන්පියුමක් සේ, කර රස නැති වැ අමාරස ගත් මහමුහුදක් සේ, හැම කල්හි මැ අඩු නො වැ සිටිනා පුන්සඳක් සේ, පණුපිලවුන් නො වන් මිහිවද යක් සේ, සෙනහය නැති මහමේකුළක් සේ නො නැසී සිටිනා විදුලියක් සේ. නො මිරිකී තිබෙන යෞවනයක් සේ, මරින් නො මැකෙන[1] ජීවිතයක් සේ, දුගීන් අත්පත් මහානිධානයක් සේ, මහසායෙහි ලද අනඟ රසභොජනයක් සේ, මහසයුරෙහි නැව් බුන් තන්හි දුටු මහදිවයිනක් සේ, ආදිකප්හි මහඅඳුරෙහි දුටු ලහිරුමඬලක් සේ, සසරබියෙහි දුටු නිවන්මහක් සේ, මහ ලෙඩෙක්හි ලද දිව්‍යබෙහෙදක් සේ, දුකෙහි ලත් පිටිවහලක් සේ, මරුකතරෙහි දුටු මහවිලක් සේ, මුළුලොවට අමුතු වැ දුටු මිහිරි බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 8.

‘ආයු බොහෝ වෙව’’යි වදළ බස් පමණකින් වැඳගෙණැ හෙවැ මළ සක්දෙව්රජහට තුන්කෙළසැටලක්ෂයක් හවුරුද්දට ආයු දුන්; “දිගා ව’’යි[2] යන තෙපුලෙන් යක්හට ගොදුරු වැ මියන්නට සිටි කුමරහට එක්සියවිසි අවුරුද්දකට ආයු දුන්; ආලවකයා කොල්[3] දත්හස්සෙහි හි මෙළෙක්පිටි කැවුමක් සේ මිරිකී ගොදුරු වන්නට සිටි ආලවකකුමරහට කළ කරුණාවෙන් ඔහු කා මරණයක්හු දු තමන්ගේ දහමින් අනුන්ගේ දිවි නො නසන සේ සෝවාන් කොට, කුමරහට දිවි දී, දිවි දුන් පසු අමාමහනිවන් දී දිගා කළ; තුන් පියවරකින් තව්තිසැදෙව්ලොවට වැඩි; අටලොස් රියන් මහතින් සිටැ හබබිජුවට ඇතුළෙහි ගඳකිළියෙක්හි වසන්නා සේ වැඩහොවුත් වැඩහිඳුත් වැඩසිටුත් සක්මන් කරත් පොහොසත් වූ; ශ්‍රීශරීරයෙහි තලඇටක් පමණ තැනින් නැඟි රශ්මියෙන් අනන්තාපරිමාණ සක්වළැ හිරුදහස් සඳුදහස් නැංගා සේ ආලොක කරත් පොහොසත් වූ; මුළුසක්වළෙහි අකනිටා බඹලොව දක්වා හිවී ගැවැසී සිටි බණපිරිස ඇසිපියක් හෙළා ලන පමණ ඇසිල්ලෙන් හැමදෙනා සිත් වූ පරිදි පරීක්ෂා කොට, හැම සත්ත්වයා සිත් ගෙණ, එක මගධබසින් වදරණ බණ, දෙමළුන් දෙමළබසින්, යොනුන් යොන්බසින් බඹුරන් බඹුරුබසින්, අරමණයන් අරමණබසින්, කාම්බෝජයන් කාම්බෝජබසින්, ජීනයන් ජීනබසින්, මලයූරයන් මලයූරබසින්, කාකයන් කාක බසින්,

---

1. I. & මු. මරණින් නොමිරිකෙන. 2. II. III. & V. දිගාවවයි.
3. බොල්.

නක්කවාරයන් නක්කවාරබසින්, සහවාසීන් සහවාසි බසින්, පෙටි-කිහිරැටි-කොරල-මහරලආදි දියෙහි මසුන් තමන් තමන් ගේ බසින්, ඇත්-අස්-වලස් තරස්-ගවර-සෙමර ආදි සිවුපාසතුන් තමන් තමන් ගේ බසින්, කොවුල්[a]-බොකල-ගිරා-මොනර- ගුරුළු-කැහැරොළ[b]-කුකුළු-සැදිකුළු-විලිකුළු ආදි පියා ගත් සතුන් තමන් තමන් ගේ බසින්, පණු-පැණි-කිහිඹි-කුහුඹු සිනි-සකසිනි-හිනිකුණු-උකුණු-මකුණු ආදි කුඩාසතුන් තමන් තමන් ගේ බසින්, නා-පොළොං-කරවැල්-පිඹුරු-නෙලිසප්-කළසපු ආදි දීඝීජාතීන් තමන් තමන් ගේ බසින්, වෙන වෙන මැ අකුරෙන් අකුර පදයෙන් පදය පිල්ලෙන් පිල්ල තෝරා දන වදරණ බණෙහි රස විඳුනා පරිද්දෙන්, දසදහසක් සක්වළ මුළුල්ලෙහි හිදිකටුඅගක් ඔබා ලන තන්හි අසූවක් අනුවක් දෙනා බැගින් අතුරු සිදුරු නැති වැ සිටි බණපිරිසැ සතුන් ඉදිරියෙහි සිටිය පස්සෙහි සිටිය දළයෙහි සිටිය හැමදෙනා මැ "අද මා මුහුණ බලා යැ බණ වදරන්නේ; අද මා මුහුණ බලා යැ බණ වදරන්නේ"යි කියන පරිද්දෙන් හැම දෙනා සිත් ගෙණ, එක්කහු හුන ඕහට ඇසෙන පරිද්දෙන්, මුළුලොවක්හු හුන ඔවුනට ඇසෙන පරිද්දෙන්, මෙලෝපරලෝ දක්වා කුසල් අකුසල් හඟවා, සතරඅපායට හකුල් හෙළා, නිවන්මහවත් රජමහවත් කොට, කන්හි මිහි ඕමින්, සිත්හි අමා ගල්වමින්, තුඩින් තුඩ සාධුකාර දෙවමින්; ඇසින් ඇස සතුටුකඳුළු ගන්වමින් සියලහැ ලොමුදහ ගන්වමින්, වැඳ පෙරළෙන මහබඹුන් විසින් ශ්‍රීපාදය පිසැ ඉසැ අත ගානට ඔවුනොවුන් පරයා දිවෙන දෙවියන් විසින්, ඒ ඒ තන්හි මැ සිටැ බඳ වොටුනු[c] ගලවා මහුල් කඩුවෙන් හිසකේ කපා රජපෙරහර හැරැ මහණ වනා රජ දරුවන් විසින්, පෙණ දහස්ගණන් බිමැ ඔබා නො සැලී මැ වැඳගෙණ හෝනා නයින් විසින්, පියා විදහා මුදුන්හි තබා අහස්හි කන් දී හොත් යෙළසියක් යොදුන් ගුරුළුරජුන් විසින්, ඒ මිහිරි හඬ කණැ හෙත් හෙත් දියපිටට පැනැ නැඟී කන්පත් වරල්පත් නො සොල්වා මුහුදුපිටැ අසා හෝනා පන්සීයක් යොදුන් දහසක් යොදුන් පමණ ඇති මහමසුන් විසින්, සොඬ නගා මුදුනේ තබා කන්තල නො සොල්වා අසා සිටිනා දසකුලෙහි ඇතුන් විසින්, දහම්රසයෙන් ඇස් මරා කන් මරා මිහිරි විඳ විඳ අසා සිටිනා කෙසරසිංහයන් විසින්, වියරු හුනු කලක් සේ සිතියමැ ඇඳි රුවක් සේ නො සෙල්වී කොළගෙහි අසා හිදිනා වඳුරන් විසින්, තමන් තමන් ගේ ධ්වනියට[d] වඩා සියදහස් ගුණෙන් මිහිරි එ මනහර කටහඬ කණැ හෙත් හෙත් සතුටින් පියා නො සොල්වා ඉස් නමා වැඳ වැඳ

---

a. කෙවිලි. b. කෙහෙරළ. c. සිට වොටුනු. d. කටහඬට.

හෙවැ අසන පුරවී[1] කෙවිල්ලන් විසින්, රත්පියුම් තුඩින් කඩා පුදයට ගෙණැ අහස්හි පියා විදහා හෝනා රත්වන්හංසයන් දහස්ගණන් විසින්, මිහිරි කටහඬ කණැ හෙත් හෙත් සතුටින් පිල්සත් විදහා නැටුම් ගත් මත් මොනරුන් විසින්, සිත් නැති වැද වැඩහුන් දිගට වැඳුම් ගෙණැ නැමී සිටිනා ගස්-කොළ-සත්කුලපව්-මහමෙර-සක්වළගල් ආදීන් විසින්, දෙවියන් දමන පරසතුමලින්, බසින් බස මිහිරට නයින් දමන කඩුපුල්මලින්, මිනිසුන් ගලවා දමන හන්පලන් වස්ත්‍රාභරණයෙන්, සතුටින් හුන් හුන් තැනැ හිඳපිය නො හී පැනැ නැඟි නැඟී අත් නහනහා නටමින් "යාපත, අමඬ!; සාධු! සාධු!! බුදුරජානෙනි!; තවද වදරන්නැ, හිමියානෙනි!; අද මේ බණ සමහර නො කරන්නැ, ස්වාමීනි!" යි ආරාධනා කෙරෙමින් නටා බස්නා, අපොළන, පිළී හිස සිසාරණ, තැති ගෙණ සිටිනා, දල්වූ කට නො පියා සිටිනා දහම්සොඬුන් විසින් මුළු ලෝ ඔකඳකෙළි කෙළවමින්, ජයකෙළි කෙළවමින්, ජාතිජාතියෙහි දිවි ගැලවී යතුදු අසත්‍යයක් නො කී කුසලින් ශ්‍රීමුඛය දල්වූවිටැ නික්මෙන්නා වූ සුවඳින් සියලු ධම්සභාමඩල[2] සිවුදගදින් පිරුණු රත්කරඬුවක්[a] සේ එක පැහැර සුවඳ කෙරෙමින් බණ වදරණ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 9.

තමන්ගේ ශාසනයෙහි මහණ වූ සඞ්ඝයාවහන්සේ කෙනකුන් දැට පුටුවක් පමණ දන් දී ලූ ගැහැණියකට, එසේ මැ තමන් වහන්සේගේ සස්නෙහි මහණ වූ වහන්සේකෙනකුන්දැට යවයෙන් කළ කුම්මාසයක් පිළිගන්වා ලූ ගැහැණියකට[b], තමන් වහන්සේට එක වේලෙකැ පමණ අහරක් දී ලූ තෙනැත්තියකට: තමන්වහන්සේගේ සස්නෙහි මහණ වූ වහන්සේවරුන්දැට එකවේලෙකැ පැනිත්තක් පමණ වළඳවාලූ ගැහැණිකට, තමන්වහන්සේගේ සස්නෙහි මහණ වැ රහත් වූ වහන්සේ කෙනකුන්දැට එකදවසක් අහරක් දී ලූ තැනැත්තියකට, තමන්වහන්සේට දරු වූ මුගලන් නම් මහතෙරුන්වහන්සේට එකදවසක් අවුළුපතක් පිළිගන්වා ලූ තෙනැත්තියකට, මුන්වහන්සේට මැ එක් දවසක් උක්දඬක් දී ලූ තෙනැත්තියකට, තමන් වහන්සේ වදාළ අවවාද මුදුනෙන් පිළිගෙණැ පොහොදවස් පෙහෙවැ නිකම්දවස් පන්සිල් රැකි ගැහැණියකට, මෙසේ ම තමන්වහන්සේ වදාළ අවවාද නො පනිමි යි තමාගේ සැමියාට පතිව්‍රතා වූ ගැහැණියකට, මෙසේ මැ තමන්වහන්සේගේ සස්නෙහි රහතුන්වහන්සේ කෙනකුන්දැට තමා ලද කැවුම් පමණක් එක් වේලෙක්හි පිළිගන්වා ලූ තෙනැත්තියකට, තමන්වහන්සේට දරුවූ රේවත

1. කුරවි. 2. මඩපය. a. ගඳකරඬුවක්. b. තැනැත්තියකට.

තෙරුන්වහන්සේ ඇතුළු අටදෙනෙකුන් වහන්සේට එක්දවසක් කැඳඅවුළුපත් මාත්‍රයක් පමණ දී ලූ ගැහැණියකට, තමන්වහන්සේගේ දරු වූ සැරියුත් මහතෙරුන්වහන්සේගේ ධාතු පිහිටි දාගබට එක් දවසක් 'මල් පුදමි'යි යෙමින් සිට ඇතු අතැ මළ ගැහැණියකට, මෙසේ ම තමන්වහන්සේගේ ධාතු පිහිටි දාගබට එක වේලෙකැ සුවඳ මල් මාත්‍රයක් පුදා ලූ මිඩියකට, තමන්වහන්සේට වලින් දර ගෙණෙමින් සිට තමා ගෙණෙන හෝපලුමලක් පුදා ලූ ගැහැණියකට; මෙසේ මැ තමන්වහන්සේට වලින් දර ගෙණෙමින් සිටැ එක දවසක් සතුටු සිතින් සල්මල් මාත්‍රයක් පුදා ලූ මිඩියකට, මෙසේ ම තමන්වහන්සේට දරු වූ මුගලන් මහතෙරුන් වහන්සේගේ පාත්‍රයෙහි එකදවසක් සතුටුසිතින් සකුරුපැණි පමණක් පිළිගන්වා ලූ ගැහැණියකට, මෙසේ මැ තමන්වහන්සේට සතුටුසිතින් පිළියක් පමණ පිළිගන්වා ලූ ගැහැණියකට, තමන් වහන්සේට සතුටුසිතින් පැහැ නපුරු ලුණු නැති මුං අඹරා ඉදි කළ කුම්මාසයක් පමණ දන් දුන් ගැහැණියකට, මෙසේ මැ තමන් වහන්සේට සතුටුසිතින් එකදවසක් බෙහෙත්හුළුකැඳක් පමණ දන් දුන් ගැහැණියකට, මෙසේ මැ තමන්වහන්සේගේ සස්නෙහි මහසුප් මහතෙරුන්වහන්සේට තමා ලද අහරක් සතුටු සිතින් පිළිගන්වා ලූ ගැහැණියකට, තමන්වහන්සේගේ ධාතු පිහිටි දාගබට එක්දවසක් සතුටුසිතින් පුදන්නට වැටකොළුමල් සතරක් ගෙණ යමින් සිටැ අළුතැ වැදූ දෙනක අතැ මළ ගැහැණියකට, මෙසේ මැ තමන්වහන්සේට පුත් වූ මුගලන්මහතෙරුන්වහන්සේට සතුටුසිතින් වැඳැ ගෙණ ගොස් වැදූදෙනක[1] අතැ මළ සැඩොල්දුවකට, මෙසේ මැ තමන්වහන්සේගේ සස්නෙහි මහණ වූ වහන්සේ වරුන්දෑට කිසිවකුත් දන් නො දී සතුටුසිතින් දෙඇස දල්වා බලා ලූ ගැහැණියකට, ස්වාමිදුව කරණ ගහටයට කළකිරි කරැ වැල් ලා ගෙණ මියන්නට වලට වැදැ තමන්වහන්සේ වදාළ බණ එකදවසක් ඇසූ මිඩියකට, මෙසේ මැ තිරිසන් වැ සිට තමන් වහන්සේ වදාළ බණ අසා හොත් මඬුවාට, මහතැ වැඩැහුත් තමන් වහන්සේ එකවිටෙකැ සරණ ගිය ඡත්ත නම් මාණවකයාට, තමන්වහන්සේ සස්නෙහි මහණ වූ වහන්සේකෙනකුන්දෑට එකදවසක් කකුළුපත්තෙකින්[2] බත් දී ලූ ගැහැණියකට; තමන්වහන්සේ සතුටු සිතින් ගෙහි වඩා හිඳුවා එකදවසක් වළඳවා ලූ උපාසකයකුට, තමන්වහන්සේට දරු වූ සැරියුත් මහතෙරුන්වහන්සේට සිවුරු ගෙත්තම් කරන්නට සතුටු සිතින් හිදිකටුදෙකක් දී ලූ උපාසකයකුට, බුදු වන්නට

---

1. I. IV. & V වඳදෙනක.　2. I. I & IV ඡත්තපාණ.
3. මු. කකුළුවත්ගේ මසකින්.

වඩනා මහල්හි පිට දුන් අසූට, මියන්නට ලෙඩ වැ හෙවැ දොරට වැඩි තමන් වහන්සේ දැකැ 'යහපත් ස්වාමිදරු කෙනෙකැ'යි සිත පහදවා ගත් බමුණකුට, තමන්වහන්සේට දරු වූ මුගලන් මහතෙරුන්වහන්සේට එක්දවසක් සතුටුසිතින් අඹපක්-සතරක් දීලූ උයන් ගොව්වකුට, මෙපණ මද පිණෙකිනුදු[a] සදෙව්ලොව ගෙමිදුල්[1] කොට, අමාමහනිවන්පුර ඉක්බිති ගෙය කොට, දිවසැපත් නිවන් සැපත් ගෙණ දුන්, කෙළෙහි ගුණ දන්නා, සත්හට ළයැති මාගේ බුදුන් සරණ යෙමියි බුත්සරණ යායුතු.

## 10.

තමන් සරණ ගිය සඳ හිරු දෙදෙනා පස්වාදහසක් මුළුල්ලෙහි රාහුමුඛයට නො වැද්ද දී අරගෙ ගත්, 'කම්' යි කියා යකු පය අල්වා ගත් කල්හි' දරගැළ යට හොත් කුමරුවා "බුදුන් සරණ යෙමි"යි තමන් නම කී සඳැ, රත්යකබලෙක්හි අත ඔබාලූ එකක්හු අත ඇද ගන්නා සේ, යකු පය ගත් අත වහා ඇදගත් පරිද්දෙන් සියලු දුක් නසා ලොවට පිහිට වැ සිටි බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 11.

එක ගාථාවෙක්හි සතරපදයක් සාරමසකින් උගත නුහුනු චුල්ලපන්ථක නම් වහන්සේ වළඳනවේලා ඇතුළත්හි සිවුපිළිසිඹියාපත් රහත් කැරැ නිවන්මහ පානා සේ දන්නා; බොධිසත්ව භූමියෙහි සිටැ පැනට බට තමන්වහන්සේගේ මලුන් දෙදෙනා කන්නට ගත් උදකරාක්‍ෂසයාහට දෙවධම්ය කියා, ඔහු පන්සිල් ගන්වා ජාතිය මුළුල්ලෙහි සිල් රකින්නන් කෙරෙහි ඇතුළත් කළ; තවද දඩගිය රජ් පුරුවන් නිසා දර ගෙණෙන මිඩිය කුස පිළිසිඳ ගෙණැ මුවෙන් කිරි නො හළ කල්හි පියරජ්පුරුවන් "මේ මපිත් නො වෙ" යි කී කල්හි, මැණියන් "තොප පුතනුකෙනෙක් වුව අහසැ හිඳිත්වයි; නැත, බිමැ හී මියෙත්ව" යි දෙකකුල අල්වා ගෙණැ අහසට දැමූ සඳැ, ධම්ාසනයෙක්හි හිඳිනා ධම්කථික කෙනකුන් සෙයින් අහස්හි පලග් බැඳැ වැඩහිඳැ, තමන් පුත්බව හඟවා බණ කියා පියාණන් සතු රජය ලත්; මඛාදෙවරජ වැ අසූදහසක් හවුරුද්දට ඉතිරි ආයු ඇති වැ හිසැ එක නරකෙත්දක්[b] දුටු දා මැ 'ජරාව හිසකේ අල්වා ගෙණැ ඇදැ ඇදැ සිටිය දී තවද තෘෂ්ණාවට ගැති වැ රජය කෙරෙම් දැ?"යි එදවස් මැ අසූචි පිරුණු ඔවස්කිළියක් සේ සියලු රජය හැරැ මහණ වැ බඹලොව ගිය; රත්වන්මුව වැ සරණ වන් මුවදෙනට දිවි පුදා

---

1. II & III ගෙදර මුදල. a. කුසලෙකිනුදු. b. නරයක්.

දම්ගෙඩියෙහි හිස තබා "මා දිවි හැර දමා සරණ ගියවුන් රක්‍ෂා කරවමි"යි[a] සතුටු වැ, අභිෂෙකයට පෙහෙ වැ හොත් රාජකුමාරයකුහු සේ නිවී සැනහී, රජහට බණ කියා මුළුලොවට අභය දෙවූ: වඳුරු වැ උදකරාක්‍ෂසයාගේ විලට නො බැසැ පැන් බොන්නට පිඹී හුණ නළෙහි කපක් දවස් ගැට නැති වන පරිද්දෙන් මහත් වූ ආනුභාව ඇති; බලු වැ බරණැස්රජුගේ සිංහාසනයෙහි හිඳ රක්ගල්තෙලෙහි හිඳැ සිංහනාද කරණ කෙසරසිංහපොතකයකු සේ බණ වදරා සියලු සතුන්ට අභය දෙවූ: අස් වැ තණ පැන් ලා ලූ රජ්ජුරුවන් කෙරෙහි කෙළෙහි ගුණ දැනැ, සැරපහර ලදිනුදු "මාගේ ශරීරය මාගේ රජ්ජුරුවන් සතුබව මුත් මා සතු නො වෙයි; එහෙයින් විත් කැවෙර් කවුරු දැ?"යි වැටී හුනු බඩවැල් වසා පට බඳවා සතුරුරජ්ජුරුවන් අල්වා දී, එතැන්හි මැ සිටැ බණ වදාරා, ඒ රජ්ජුරුවන්ට අභය දෙවා, වණයෙහි බඳපට උනාලූ[b] සඳෙහි මැ තණ දුන් රජ්ජුරුවන්ට දිවි දුන්, එ මහත් එ වියත් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**12.**

ගොන් වැ පන්සියයක් ගැල් නරාවළින් ඇද කුඩු දී වැඩූ මැහැල්ලට දහසින් බැඳි පියැල්ලක් දී කෙළෙහි ගුණ දත්; ශක්‍ර වැ අසුරයනට පැරැදැ දිවෙමිනුදු තමාගේ රථයෙහි හඬ අසා මුහුදු බත් වන ගුරුළුපැටවුන් දැක, "සා වැ ඉපැදැ මා ඇඟ මස් අනුන්ට දන් දී, දැන් ශක්‍ර වැ ඉපැදැ මේ පැටවුන් මරා මා දිවි රකිම් දැ?"යි සතුරන් කරා රථය නමා, එ මැ කුසල්බෙලෙන් ජය ගත්; වටු වැ වැදැ හොත් කසල්ල[1] තුබූතෙන[c] කපක් මුළුල්ලෙහි සිසාරා සොළොස්කිරියක් පමණ තැනට ගිනි වැද්ද නො දෙන මහානුභාව[2] ඇති සබා කියන සේ දන්නා; කිහිරඟුරුදායෙහි තමන් දෙන දනට බාධා කරණු පිණිස මරහු මැවූ ගිනිවළ දැක "මේ ගින්නෙන් දත් මුළුලොව නරකගින්නෙන් නඟනබව වේ ද, මට කට යුතු යැ?" යි අඟුරුවළට නො බා පය පෙවූ සඳෙහි එගිනි කඳ මැඩැ ගෙණැ තමන් ගුණබෙලෙන් නැඟි මහපියුම් මැඩැ ගෙණැ, ආකාශගඞ්ගාවෙහි රත්පියුම්වනයක් මත්තෙහි දුවන රාජහංසයකු සේ ගොස් මහ දන් දී තමන්ගේ මනදොළ මුදුන්පත් කළ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. I & II කදල්ල 2. මහ අනුසස්.
a කරණවනිමි යි, b මුදලූ.
c තැනට

## 13.

කවුඩු වැ උපන්කලැ පොවා තමන්ගේ අසූදහසක් කවුඩුවන් අතුරෙන් එක කවුඩුවක්හු ලවා බරණැස්නුවර පහරවා[1] ගන්නට පොහොසත්; වැදෑරජ වැ ඉපැද තමන්ගේ ඇමැත්තන් සිටැ "මෙ රජුත්, මෙ රජුගේ සිවුරඟසෙනඟත් ක්‍ෂණයකින් ධූලි කරම්හ"යි කී කල්හි දු, "රජයක් පිණිස අනුන් ඇගින්[2] මැස්සකු බොන ලේ විවර[3] සෙල්වීම් නම්, තෙලියත්හි[4] පෙළී අනුන්ට ලේ දෙන්නේ මා ඇඟ කඩුව් හරණට ද? එහෙයින් මා මැ සිටැ අනුන්ට දන් දෙනු කැමැති රාජ්‍යය, අනුන් අවුත් තුමූ පැහැරැ ගණිත් නමුත්, ඒ මාගේ මැ මනදොළ පිරූ නියා ය"යි ඇමැත්තන් වළකා කට පමණ වළෙහි ලා පස් ගසා පියන තුරු, සිර ගෙයි ලා යදම් පොරොවා මසන තුරු, වාසල්හි සහල්ලෙහි ලා හිස බිම් බල්වා එල්වන තුරු ක්‍ෂමා කොට, තමන්ගේ පරාක්‍රමයෙන් වළින් නැඟී, මෛත්‍රීන් බැඳැ ලූ යදම් සුණු කොට, අහස්හි පලක් බැඳැගෙණ හිඳැ මෙත්සිත්හි කුළු ගත් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 14.

කුද්දාලපණ්ඩිත කල්හි දු හුදැලූ කෙටියෙකැ ගත් ලොභයෙන් සත්හිඩෙකැ[5] මහණධම් නො කට හී අවුත් අන්තයෙහි හුදැල්ල හිස සිසාරා ගඟට දමාපියා "දිනිමි"යි හඬ ගහා, එහඬ අසා ආ බරණැස්රජහට බණ කියකියා මැ සිටැ, ධ්‍යාන උපදවා ආකාශයෙහි පලක් බැඳ වැඩැහිඳැ බණ කියා, රජහු ඇතුළු වූ සියලු සෙනඟෙහි කෙලෙස් දුරු කොට, දොළොස්යොදනෙකැ පැතිරැ සිටි පිරිස් හැරැ ගෙණැ මහණ වැ, සත් රජයක් තමන් අනු වැ මහණ කරවා, දිග තිස්යොදුන් පුළුල පසළොස්යොදුන් ආශ්‍රම පදය තපස්වීන් විසින් පුරා, භාවනා කොට අන්තයෙහි සහපිරි වරින් බඹලොව වැඩි; මස් වැ 'ලොව්හි පතළ මහගිම් නිවා වැසි වස්වමි'යි අහස් බලා සත්‍යක්‍රියා කොට, ගැත්තක්හු ලවා පැන්කළයක් ගෙන්වා ගෙණැ සල්වන ස්වාමිදරුවක්හු සේ, සක්දෙව්රජහු ලවා වැසි වස්වා මුළුලෝ සැනහූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. II & VI පැහැරවා. 2. IV & ඇඟ. 3. VI පමණ.
4. මාගේ ඇඟ තෙලියත්හි-සමහර. 5. මු. විටෙක. IV & VII ඉඩෙක.

## 15.

ධනුර්ධර වැ සුවාසූදහසක් යොදුන් දෙවන දිව්‍යලොකයට යන හීය, සතරරියනක් පමණ තැනට විදිනා බලවත් ධනුර්ධරයක්හු සේ විදැ, තමන් විදිසැරය ගෙණ තව්තිසැ වැසි දෙවියන් පූජා කරණ පමණ මහබල ඇති; බමුණු වැ මියැ, දෙවන ජාතියෙහි රන්වන් හංස වැ ඉපිදැ, පෙරජාතියෙහි වූ පුරුදුකමට තමන් වහන්සේගේ ශරීරයෙහි පත් උදුරා දී නෑයන් රැකි, පුරුදු කම්හි ගුණ දන්නා; ගිරා වැ පවා පෙරැ පුරුදු දිඹුල්ගස මියැ කණු වැ යන තුරු අත් නො හැර නුදුරුතන්හි ඇළයෙහි පැණෙන සහමල්පලු වැ සෑදී සිටි, බමරපියරැව් ගත්, මත්කෙවිල්ලන් සතුටු වැ කුල්නා, තමන් කුලෙහි ගිරවුන් කෙළිමඬුලු කළ මහරුක් බලබලා ද 'මා පුරුදු මේ ගස මාලු ය'යි හැරැ අතික් රුකකට ගියෙම් නම්, කෙළෙහි ගුණ දැන්මුදු අත් හැරැපියා ගියා නම් වෙම් යි එ මැ කණාටුවෙහි සුණු කා හිඳැ තමන් ගුණෙහි පහන් ශක්‍රයාහට කෙළෙහි ගුණ දැන්මෙහි බණ දෙසා, එ ගුණෙහි පහන් ශක්‍රයා සූජාතාව ලවා ගෙන්වූ අමාපැන් ඉස්වීමෙන් එ මැ ගස කප්රුකක් සේ සෑදූ; කෙළෙහි ගුණ දන්නා බුදුන් සරණ යෙම් යි බුත්සරණ යා යුතු.

## 16.

කවුඩු වැ තමන් නෑයන්ට ඇති වූ විපත්ති දුරු කරණු පිණිස බරණැස් නුවරට වැදැ, සැටයොදුන් පමණ රක්ගල්තෙලෙහි හුන් යෙළසියක් යොදුන් ගරුඩරාජයාගේ තෙජසට අපහාස කෙරෙමින් බණ කියා, මුළුලොවට අභය දෙවා සුව එළවූ; ගිජුලිහිණි වැ සිටැ තුඩින් ගොදුරු ගෙණවුත් මාපියන්[a] රක්‍ෂා කොට ඇල් සමයෙහි ගින්නක් දල්වා ඇල් දුරු කළ සිටානන්ගේ ගෙහි දුටු දුටු තැනින් වස්ත්‍රාභරණ තුඩින් ගෙණවුත් ලා කෙළෙහි ගුණ දැන්මෙහි මුදුන් පත් වැ, රජ් පුරුවන් බදා[1] ගෙන්වූවිටැ එපවත් කියා බණ දෙසා මලින් ගැලවී ගොස් මාපියන්[a] රැකැ දිවි කෙළවරැ දෙව්ලෝ ගිය මහතානන් සරණ යෙම් යි බුත්සරණ යා යුතු.

## 17.

මණිචොරජාතකයෙහි තමන් ඇඹෙනියන් කෙරෙහි පිළිබඳ රජහු තමන් වඩනා රථයෙහි තමා පලඳනා මැණික ලවාපියා 'මැණික්සොරාය' යි තමන් අල්වා ගෙණ මරන්නට ගෙණ ගොස් දම්ගෙඩියෙහි හිස තබා හොවා ලූ කෙණෙහි තමන්ගේ ඇඹෙනියන්ගේ සත්‍යවචන[a] බලයෙන් ආවා වූ ශක්‍රයා ඇතුපිට හුන් සතුරුරජහු ගෙණ ගොසින්, තමන්

---

1. මු. & III බලා. a මවුපියන්.

හොත් දම් ගෙඩියෙහි හොවා, තමන් ගෙණ ගොස් රජහු හුන් ඇතුපිටැ හිඳවූ සඳෙහි හිස් කපන තෙනැත්තහු[1] හෙළන්නට නහාගත් පොරොව රඳවා[2]ගත නො හී රජු හිස කපාපු කල්හි, එතැන්හි මැ සිට ඇඹෙනියන් හා තමන්ට අභිෂෙක කොට රජ කරණ තරම්[3] මහපිණැති එ හිමියානන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 18.

වඳුරු වැ පොවා මිනිසුන් "අප සතු අඹුවෝ යැ. අප සතු දරුවෝ ය. අප සතු රත්රන් අමුරණැ"යි[4] කියන බස් අසා "මේ මිනිසුන්ගේ අඥනකම් ඉතා දැඩි[5] නියා යැ. මොහු 'අපගේ රත්රන් අමුරණැ. අපගේ අඹුදරුවෝ යැ' යනාදීන් කියති. තමාගේ ආත්මය පවා තමා සතු නො වත්, බැහැර තුබූ රත්රන් ආදිය කෙසේ නම් තමා සතු වේදැ?"යි මිනිසුන්ගේ නුනුවණට නින්දා බැණැ, ඒ ඇසූ තමන්ගේ[6] වඳුරු පිරිස් "නො ඇසියැ යුතු දෙයක් ඇසූම්හ. නො වදාළ මැනැව. නො වදාළ මැනැවැ"යි දෙඅතින් කන් පියා ගෙණැ, එබස් ඇසූ පහණට "ගර්හිතපාෂාණය "යි නම් තබා, ජාතිය මුළුල්ලෙහි එතැනට නො වදනා පරිද්දෙන් තුමූ නුවණැති ව, නුවණැති පිරිස් ලදහ. එබඳු වූ මහනුවණැති වඳුරුකල්හි ද, සිංහකල්හි ද, සැඩොල් කල්හි ද, මහබඹකල්හි ද, සිඟනකල්හි ද, සක්දෙව්රජකල්හි ද, කවුඩුකල්හි ද, ගුරුළුකල්හි ද, සඳත්කල්හි ද, වටුකල්හි ද, පුරව්කෙව්ලිකල්හි ද, හැම අත්බව්හි දහම් මෙනෙහි කොට, කරුණා තොර[7] නො කොට නුවණ වියෝ නොකොට "බුදු වැ මුළුලෝ ගලවම්හ" යි යන අදහස් ලෙහි තබා තන්හි තන්හි සමතිස්පැරුම් මතුපත් කොට, තමන් වන් අමාමහනිවණට මුළුලෝ ගෙණැ යනු කැමැති වැ දහමට බැහැවී විසූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 19.

කුරුරට රජ වැ පන්සිල් රැකැ උත්සව දවස් උත්සව පිණිස මලින් සැදූ හීසතරක් සතරදිගට විදැ; තුන්දසාවකට විදි හීදඬු තුණ දැක, දියෙහි හුනු හීයක් නො දැකැ තමන් 'සතකු මරම්'යි යන සිතක් නැත ද, 'මසකු[8] ඒ හීයෙන් විත් කැව[9] යන හිමක් නැත ද, 'මා විදි හීය

1. තෙනැත්තවු-සමහර.
2. IV V & VII නවතා.
3. V රජකම් කළ
4. IV & V රත්‍රන්මසුරණැයි.
5. II. IV & V වැඩි
6. තමන්ගේ පරාක්‍රමයෙන්-සමහර
7. අනතුරු-සමහර.
8. මු & II යමකු
9. මු. II & IV කැහ

a සත්‍යක්‍රියා.

මසකු ඇඟ ගත් නම්, මා ගත් සිල් බිඳේ'යි පශ්චාත්තාප කොට, සිල් රැක්මෙහි තත්පර වූ, පිරිසුදු සිතැති මහතානන් කයින් බසින් සිතින් ලොවට වැඩක් මැ සාධන පිණිස සාරාසඞ්ඛ්‍යකල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි මහා කරුණායෙන් සසර ඇවිදැ, කෙළඅත්බැවැ බුදු වැ, සූවිසි අසඞ්ඛ්‍යයක් සතුන් හා කැටි වැ අමාමහනිවන් වැදැ නිවී සැනහී, තමන් මන දොළ මුදුන් පත් කළ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 20.

ධම්පාලකුමාර වැ මහප්‍රතාපරජහට පුත් වැ සත්මැසි වැ කිරිසුවඳ වහන ස්වභාවයෙන් මැ මහනෙල් මලකට බඳු වූ සුවඳ ඇති යහපත් ශ්‍රීමුඛයක් ඇති වැ, මහනෙල්පෙති දෙකක් සේ දික් වූ නිල්පෙත්වැටි හෙන්නා සේ ඉතා නිල් වූ ඇස් දෙකක් ඇති වැ, රත්පියුම්පෙත්තකට බඳු වූ සිවුමැලි රත්වන් පැහැ ඇති යහපත් රුවක් ලදහ. අන්තඃපුරයෙහි ඇත්තවුන් "බලත් ඇසට රසාඤ්ජනයක් බඳු වූ පුතුන් වැදූවෝ නම් චන්ද්‍රාදේවීහ. පුතුන් ලද්දෝ නම් මහාප්‍රතාප රජ්ජුරුවෝ ය"යි එකපැහැර තුඩ තුඩ කියවූහ. ඔවුන් වඩා ගෙණ හුන්නා වූ ඒ දේවි[1] රජ්ජුරුවන් දැකැ නැඟී නො සිටියෝ යැ. එරජ "මෝතොමෝ 'පුතුන් ලදිමි'යි මතින් මා දැකැ නැඟී නො සිටියා යැ"යි කිපී තමා ගේ මතුමාලට ගොසින් වධ්‍යයන්ට වධ කරණ පුරුෂයාට එන්නට කී ය.

හෙතෙමේ කෂායවස්ත්‍රයක් හැඳැ රත්මල් පැලැඳ පොරොවක් කැර[a] ලා යමයකු සේ අවුත් සිටැ "කවර වරදක් කළ සතුරකු හට කවර වධයක් කෙරෙම් ද? වදාළ මැනැවැ"යි කීය. රජතෙම "මෙතැන්හි මට ධම්පාලයා මුත් අනික් සතුරෙක් නැත. 'පුතුන් වැදීමි'යි මත් වැ, මා සේ වූ, රජක්හු නො හැඳිනැ හුන්තෙනින් නැඟී නො සිටි ඌ මව හඬවහඬවා, ඔහු සල්වසල්වා මොබ ගෙණෙව"යි කී ය. එකෙණෙහි ඒ "එසේ කෙරෙමි"යි නික්මිනි ල. බෝසතානන් මෑණියෝ ද "රජහු කිපියා වැන්නැ. කුමකින් කුමක් වේ දෝ හො!" යි සිතා පුතනුවන් සනහසනහා හොත්තු යැ. ඒ ගොස් දෙවීන් පිට අතින් පැහැරපියා බෝසතානන් දෙකකුල අල්වා ඇදැ ගෙණැ මතැතක්හු ගෙණැ යන මල්දමක් සේ සිගාව බිමැ ගසගසා සල්වසල්වා ගෙණ යේ ල.

මෑණියෝ ද ලෙහි පහළ අතින් පිටැ හෙළු හිසකෙහෙයෙන් වැනෙමින් හඬමින් පසුපස්සෙහි යෙත් ල. "අනේ පුතනුවෙනි! රන්වන් කුමාරයෙනි! සිවුමැලි සත්මැසි කුඩෙනි! අන්තඃපුරයට ඇසක් වැනි රජගෙට ජීවිතයක් වැනි ස්වාමිදරුවා නෙනි! මා වැනි කම්කිළියක බඩට කුමකට අවු ද? මා එකළා කොට කොයි යවු ද? තොප කෙළේ කවර වරදෙක්

---

a රත්, 1. දෙවීහු.

ද? මා කළ වරදට තොප වධ විඳුනා පරිද්දෙන් කවර අකුසලක් කළා දැ?" යි යනාදීන් හඬහඬා යෙත් ල. ඉක්බිති වධ කරණ තැනැත්තේ වල්යක්හු ඇතැ හුනු කුකුළක්හු සේ පය අල්වා හිස බිම් බල්වා[1] එල්වා ගෙණැ "මේ ද්‍රෝහියා ගෙණාමි යි, කුමක් කෙරෙමි දැ?" යි කී ල.[2] රජ "වධ කරණ කොළොඹුව ඇදැලා එහි හොවා ල"යි කී ල. වධ කරණ එතෙමේ එසේ උඩුතැල්ලා කොට හොවා "කුමක් කෙරෙමි දැ?"යි කී ල. රජ "තෙල සොරා පොරොවින් දෙඅත දෙපය ඇනපිය"යි නියොග කෙළේ ල. එබස් ඇසූ මැණියෝ සිටියැ නො හී හඬා ගෙණැ බිමැ හී "මා කළ වරදට මා අත්පා කපව. මපුතනුවන් හැරපියව"යි බිමැ පෙරළිපෙරළී හඬත් ල.

බෝසතානෝ ඒ දම්ගෙඩියෙහි හිස තබා ගෙණ හෙවැ සත්මැසි වැ සිට මෙසේ සිතත් ල:- "අද මා මෙත්සිත් මුදුන්පත් කරණ දවසෙක් වන. මාගේ ක්‍ෂාන්තිපාරමිතා අද කුළු ගන්නා දවසෙක් මැ වන. මම ඉදින් 'අත්පා කපව"යි යන මේ රජු කෙරෙහි ද, ඔහු කළ නියොගයෙන් කපන මේ පුරුෂයා කෙරෙහි ද, මා කෙරෙහි කළ සනායෙන් හඬන මැණියන් කෙරෙහි ද, මේ වධ විඳිනා මා කෙරෙහි ද සමසිත් නො වීම් නම්, බෝමඩෙහි වජ්‍රාසනයෙහි වැඩහිඳැ මාරපරාජය කොට සවාසන[a] කෙලෙසුන් නසා බුදු වියැ නො හෙමි. එසේ කල්හි මෙ සසර මහදුක් විඳිනා සත්ත්වයෝ කා මුහුණ බලා ගැලවෙද් ද? ඔවුනට පිටි වහල් වන්නෝ කවුරු ද? එහෙයින් මේ ඇස මෛත්‍රීන් තෙමා මේ රජහු මුහුණත්, මේ වධ කරණ තෙනැත්තවු මුහුණත්, මා මැණියන් මුහුණත් සමසිත් වැ මා විසින් බැලිය යුතු ය. අත පය නො කැපුවත් මා ලෙහි මෙත්සිතට ඛණ්ඩයෙක් වී නම්, එවිට මැ මා දිවි ගියා හා සම යැ. අත්පා කැපුව ද, සියලඟ සුණුවිසුණු කොට තලඇට සා කපා දැමුව ද, මාගේ මෙත්සිතට හානියෙක් නො වී නම්, බුද්ධරාජ්‍යය[b] යෙහෙන් ගෙණ මා සරණ කොට ගියා වූ මුළුලොව යෙහෙන් ගලවා අමාමහනිවන්හි ලමි. මට සනායෙන් හඬන මැණියන්ට ද වඩා, මා අත් පා කප්වන මපියාණෝ මා ලවා තමන් කෙරෙහි මෛත්‍රී පතුරුවා බුදුරජය ගෙණ දෙන හෙයින් මට සෙනෙහැති නම් වෙති"යි අත්පා කපන්නට නහා ගත් පොරොව හිසැ අභිෂෙක පැන් වක්කරන්නට නහා ගත් සත් රුවන්කෙඩියක් සේ සතුටු වැ බලබලා නිවී සැනහී හොවිත් ල.

ඒ වධ කරණ පුරුෂයා මහනෙල්මල්පෙති සේ අත්පා කපා හරී ල. කැපුකැපූඅත්පා ලෙහි ලා ගෙණැ මැණියෝ හඬා "අත්පා කපාපුබැවින්

1. බල්ලා-සමහර, 2. මු. කීකල, a. සවාසන, b. බුදුරජය.

මේ කොටපුතනුවනුදු මට දුන මැනැවැ. වැදූ[1] ලය නිවා රැකැ ගණිමි''යි රජ්ජුරුවන් වැඳැගෙණැ හෙවැ ඉල්ලත් ල. රජ "සැබව, තොප 'දරුවන් ලදුම්හ'යි අප දැකැ නැගී නො සිටියන්ට පුතුන් පාවා දෙම්හ!'' යි කිපී "පොරොවින් තෙල සොරු හිස කපව''යි කී ල.

එබස් ඇසූ බෝසතානෝ කපාදූ අත්පායෙන් වැහෙන ලෙහෙයෙන් රැඳීපියා හෙවැ "හිස කපව''යි යන බස් අසා "මා කළ අකුසලින් මට මීනියා[a] දෙයක් වූ බව මුත්, මපියාණන්ගේ වරදෙක් නැත. එහෙයින් මට වධ කරවන මේ මාගේ පියාණෝත්, වධ කරණ පුරුෂයාත්, මාගේ අත්පා තුරුල්ලෙහි ලා ගෙණැ හඬන මේ මාගේ මැණියෝත්, මෙයින් පිටත් හැම සත්හුත් නිදුක් වෙත්වයි, නිරෝගී වෙත්වයි, සුවපත් වෙත්වයි, මම ද මේ කළ මෛත්‍රියෙහි අනුසසින් මට වධ කරවන පියාණන් අතුළු වූ සියලු සතුන් අමාමහනිවන්හි ලිය හෙම්වයි; මෙසේ වූ දුකෙක් සියලු සතුන්ට නොවේවයි; මේ කළ අකුසලින් මපියාණන්ට කිසිදුකෙක් නො වේව''යි සිතා හොවිත් ල. ඔවුත් හොත්තවුන් මැ හිස පොරොවින් පැහැරැ එතැන මැ කපා හැරැපී ල. කපන හිස දුටු මැණියෝ ද ලය පැළී හුනහු. ඒ අධර්මිෂ්ඨරජහු ද මහපොළොව සල්වසල්වා ගැලපී ල. එහෙයින් සත්මැසි වැ සල්වසල්වා ගෙණවුත් දම්ගෙඩියෙහි හොවා වධ කරවන රජු කෙරෙහි ද, වධ කරණ පුරුෂයා කෙරෙහි ද, සනායෙන් අඬන මැණියන් කෙරෙහි ද, වධ විඳිනා තමන් කෙරෙහි ද සමසිත් වූ මහාපුරුෂයාණන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 21.

මොනර වැ බැඳූ වැද්දා පසේබුදු කළ; වටු වැ මහාබ්‍රහ්මයා සේ සියලු වේද ගෙවා දත්; ලෙහෙන වැ මහමුහුදුදිය වල ගින් ඉස්නට පටන් ගත්; මහාජනකකුමාර වැ ශඞ්ඛබ්‍රාහ්මණ වැ පස්පියුම් පිපි විලෙක්හි කෙළනාක්හු සේ නො බා සත් දවසක් මහමුහුදු පිහිනූ; සම්භවකුමාර වැ වීථියෙහි වැලි කෙළිමින් සිටැ මිටින් ගත් වැලි දමා පියා දසදහසක් යොදුන් දඹදිවැ සියලුපඬිවරුන් කියා ගත නුහුනු ප්‍රශ්නයෙහි අථි බුද්ධ විලාසයෙන් විසැඳූ; හුරු වැ කී බණින් සැටදහසක් හවුරුදු සියලු දඹදිව බුද්ධොත්පාදයක් සේ කළ; අස්රජ වැ නැව් බිඳී නොරට[2] යන්නවුන් පිටින් ඇදැ තමන්ගේ රටෙහි ලා සුවපත් කළ; තෙසකුණජාතකයෙහි පක්ෂි වැ සිටැ බුද්ධවිලාසයෙන් දශරාජධර්මය කියා සියලුසතුන් පවින් දුරු කොට රජ්ජුරුවන් හා සමහ සියලු

1. වැලිදූ-සමහර. 2. නොරටට, නොකොට-සමහර. a. මේනියා.

පරිවාර එක පැහැර දෙව්ලොව්හි ඇර[1] සිටුවූ; සුතසොම වැ සබවසට දිවි පුදා පොරිසාදයා ඇතැ හී දෙවතාවාට බිලියමට කපන පිණිස අත් විදැ නුගගස්හි බැඳැ එල්වූ මුළු දඹදිව්වැ රජදරුවන්ට ප්‍රාණදානය දෙවා, තුමූ ද දිවි ලදින්, මිනිස්මස් කන ඒ දරුණා ද පන්සිල්හි පිහිටුවා මුළුලොවට ශාන්ති කළ; ගිරා වැ කී බණට දහසක් කිරිය හැල්කෙතින් පූජා ලැබූ; බලු වැ කී බණට, කවුඩු වැ කී බණට, මුව වැ කී බණට, හංස වැ කී බණට කසීරට බරණැස්නුවර ආදි වූ රජයෙන් නුවරින් සේසතින් පූජා ලැබූ; ශඞ්ඛපාලනාගරාජකාලයෙහි භූරිදත්තනාගරාජකාලයෙහි, චම්පෙය්‍යනාගරාජකාලයෙහි කිපී බැලූ බැලුම්මාත්‍රයකින් මහමෙර-මඳුරු-මුළුපොළොව-මහසයුරු එක පැහැර දවා හළු කරත් පොහොසත් වැ තමන් ගත් අටසිලට කැලලෙක් වේ දෝ හොයි මුයෙහි කෙළ එවැ බෙහෙත් ගෙණ මතුටැ දළ සිඳුත්, පොළොවෙහි අපුළා ඇට තුතු කරත්, පාවිළුඹින් තලා සියලඟ විලිල් කරත්, සියලඟ වේරැහැනින් හැඳැ තඩෙහි[2] බඳුත්, නාසා විදැ රැහැන ලා තඩෙහි අවුණත් විස නැති දියබරණකු සේ ගරබොයකු සේ ඉවසඉවසා 'මේ රැකි සිලින් මේ කළ ක්‍ෂමාවෙන් බුදු වැ මුළුලොව ගලවම්හ'යි යන අදහසින් මහදුක් විඳැ නො කළකිරුණු; මහාමන්ධාතු සක්විති රජ වැ මිනිස්ශරීරයෙන් ශක්‍රයන් සතිස්දෙනකු හා කැටි වැ දෙදෙව්ලෝ සරියේ බෙදා දිව්‍යරාජ්‍යය වැළඳූ; සුප්පාරක කලැ වඩබාමුඛයට වන් මහනැව තමන්ගේ සත්‍යබලයෙන් පෙරළා පටුන්ගම් දක්වා, දිය ඇති තන්හි මැ නො රඳා දියෙහි දිවුවා සේ ගොඩෙහිත් දිවවා, නැවියාගේ දොරෙහි එළිපත් කඩෙහි ගෙණැ ගොස් සිටුවූ; සිවිරජ වැ කණබමුණාට ඇස උදුරා දෙන සඳ කැපූනහරින් වැහෙන ලොහෙවතුරෙන් තමන්ගේ පාරමිතාගඞ්ගායෙහි තඹවතුර ගැන්වූ, සා වැ 'සාමි' යි ආ බමුණාට 'මස් දෙමි'යි දුම්කඳ ගත් ගිනිකඳට පැනැ, මුවරඳ ලොල් වැ හඬා බස්නා බමරකැලයෙන් ගැවසීගත් පියුම්විලකට වන් රාජ හංසයකු සේ එගින්නෙන් තමන්ගේ රෝමකූපයකුදු නො දවා, එ ගුණ දැකැ පහන් ශක්‍රයා ලවා තමන් රූ සඳමඬලෙහි කපක් දවස් මුළුල්ලෙහි සිටිනා පරිද්දෙන් අඳවා දන්පැරුම් පිරූ, ගුණයට බැහැවුනු, දහමට සෙනෙහැති, මුළුලොවට රකවරණ වූ, සියලු දුක් දුරු කරණ, සියලුසුව එළවන බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. හැරැ-බොහෝ 2. මු. දඬෙහි

## 22.

සඳත් වැ අටදහසක් මතැත්කැල පිරිවරා තන්හි තන්හි තමා මැ තමහට ඇති වූ රත්සුවඳහැල් කමින්, පිරිවර ඇතුන් බිඳැ ගෙණෙන මහහුණකඳ සා උක්දඬු කමින්, ඇත්දළ සා සුහුඹුල් කෙහෙල් පොකුරුමීයෙහි ගලගලා කැමැති සේ කමින්, සඳුන් වෙළෙප්හි දළ ඇනැ වැගිරෙණ සඳුන්රස සොඬින් උරා ඉසැ ඉසැ සියලඟ සුවඳ කෙරෙමින්, පිපී සිටි සල්-සපු-නා-සිහිත් ගෙන්ද[a] ආදි සුවඳරුක්හි අතු ගෙණැ සලා වැහිරෙණ සුවඳමල් රොණින් සියලඟ තවරමින්, සරත්වලාකැල සේ දෙඇළයෙහි තිකුත් ඇතින්නන් සොඬින් සිඹැ සිත් සේ මනහරකෙළි කෙළිමින්, තරුවැළයෙන් ගැවැසී ගත් අහසට වන් සුන්සඳක් සේ නන්මලින් ගැවැසී ගත් සඳත්විලට බැසැ නොයෙක් තැනින් ඇතිනිඅඹුවන් කඩා ගෙණවුත් කුඹට සැලූ රත්පියුම්හි රෙහෙණු කුඹයෙහි වැගිරෙත් වැගිරෙත් සඳවලා හුනු රිදීගල්කුළක් සේ සැදී වනදෙවතාවන්ගේ ඇස් තමන් කරා හයමින්[b], ලවැදූ[1], සඳත් පොව්වන් සොඩසුහින් දිය ඉස්මින් මවුන්[c] ඇඟ වහලින් කෙළිනා සිත්කලු දියකෙළි බලමින්, දියට වන් විට කුඹින්[d] ගෙණැ යැතී[2] ගිය දියෙන් වූ රළවැළ මැදෙහි මැඩිලි ලූ සඳමඬලක් සේ සිටිමින්, වැසිදවස් රන්ගුහායෙහි වෙසෙමින්, ගිම්දවස් සඳත්විල්හි රළින් නැඟි මුවරඳ සිහිල්සුවඳ දියබිඳු ගෙණැ හමන මඳමඳපවන් ඇඟ ගස්වමින්, නුගගසැ මුලා සිටැ සඳපහන්හි සන වැ ගිය සඳපහන්පිඩක් සේ ඇතිනිකැල හා සමඟ සුදුවැලිතෙලෙහි සිටැ තන්හි තන්හි ගී කියන ලියකින්නරාවන්ගේ මියුරු ගී හා හස්තිකාන්තවීණාවෙහි මධුරස්වර හා කණැ ඕමින්, ගමන් ගත් සවීරජතමයකෛලාසකූටය සේ තමන් රුවින් සියලු හිමාලය හොබවමින්, කල්හි කල්හි පසේබුදුන්ට පාසිවුරු කුඹැ තබා අදිමින්, මිහිරි මිහිරි පලාපල අදිමින්, ලකෙහෙල්ගොප් සොඬින් ගෙණැ සලසලා ඔවුන්ගේ ගිම් නිවමින්, සොඬින් පය පිරිමැදැ එ අත ගෙණැ හිසැ තබා ආදර දක්වමින්, දෙදළ බිමැ ඇනැ වදිමින්, නොඑක් සුවයෙන් නොඑක් පින්කමින් දවස් යවමින් එක් දවසක් තමන් නහන්නට ගියසඳැ සිටිනාතන්හි වළ බිඳැ හියට සිදුරක් තබා වළ වසා ඇතුළෙහි හෙවැ ගත් වැද්දා තමන් නහා අවුත් සිටිසඳ පෙකෙණියෙන් වැටී හුනු දියබිඳු අනුසාරයෙන් විස පෙවූ හීයෙන් පෙකෙණියෙහි විදැ ආසැ හීසිස්[3] දක්වාපු කල්හි වේදනායෙන් මහහඬින් හඬා, එ හඬ ඇසූ

---

1. I & IV ලවැදූ    2. යෙති-බොහෙ

3. II. V. VI & VII ආස්සිස්. මු. අහස්සිස්

a සිහිත්කෙන්ද. b හයවමින් c. මොවුන්. මෙවුන්. d. කුඹට.

අටදහසක් මතැතුන් සතුරා සොයා විසිරැ ගිය කල්හි 'මෙ හීය බිමින් නැඟී අවුත් මා නාභියෙහි ගත.[1] ඉදින් මම විදි තෙනැත්තවු මෙතැනින් සොයා දිටිම් නම්, මා ඇළයෙහි සිටි මෙ අගමෙහෙසුන් ඇතිනි ඔහු දැක මැරූ නම්, මාගේ මෙත්සිතට කලඞ්ක වේ'යි සිතා තමන් ඇඟ ඔල්බවා ගෙණැ සිටි ඇඹනියන්ට "ඉතිරි ඇතුන් මාගේ සතුරා සොයා යා දී තොප සිටියා නො යෙදෙයි.[2] තෙපිත් ගොස් සොයව"යි පසාර කියා දුරු කොට, සොඬින් පෝරුව සොයා ඇළ කොට බලා විදි වැද්දා වළ සිටියහු දැකැ, කෝපයෙන් 'මරා පියම්'යි සොඬ දික් කොට, තමන් පසේබුදුන්ට උපස්ථාන කරණබව දන්නා එ වැද්දා ආදි මැ ගෙණැ ගිය කසාවත් නහා පාතා මැ 'මාගේ ස්වාමිදරු වූ පසේබුදුන්ගේ සිවුරක් වැනි කඩෙකැ'යි සිතා, එ වැනි වේදනාව ඉවසා, ගින්නට දික් කළ අතක් හයා ගන්නා සේ සොඬ හයා ගෙණැ ගෞරවයෙන් පසු බැස 'කුමට මා විද්දෙහි දැ?'යි විචාරා 'දළ පිණිස යැ'යි කී කලැ "මාගේ මනදොළ මුදුන්පත් වී වනැ. මෙ වල්හි මා අතින් යමක් ඉල්වන්නෝ නැතැයි සිතන්නාවූ මාගේ ලය අද සැනහී ගියේ යැ. තොප සේ වූ මට ඉෂ්ටමිත්‍රයෝ නැත. තොප සේ වූ මවුපියෝ නැත. තොප සේ වූ මට නිවන් ගෙණැ දෙන්නෝ නැත. නැඟී එව, ස්වාමීනි, ඇත්හු අවුත් තොප සුණු විසුණු කොටපූ නම් නපුර වහා අවුත් දළ කපා ගණුව"යි වළෙක්හි හුනු පුතක්හු නහා ගන්නා සේ සෙමෙන් සෙමෙන් ගොඩ නහා, සිටිය හොත් උස් හෙයින් නැඹුරු වැ[a] රිදීදමක් බඳු සොඬ පිටින් උඩට නහා සිටුවා ගෙණැ, ඔහු කියත්පත දළමුලැ මස්හි ඔබා දළ කපත්, වැහෙන ලේ කටින දමදමා "මම ගැලවී බුදු වැ මුළුලොව ගලවම්"යි[3] සිතසිතා 'දළ කපා දන් දෙම්'යි යන හඹියෙන්[4] හුනු මදයෙන් කපොලය ආර්ද්‍ර[b] කොට, 'දළ කපම්'යි විඩා වැ ගිය වැද්දාට කන්තල නැමැති තල්වැට මදපොදින් තෙමා සලසලා විඩා හැරැ හැරැ, එසේ ද ඔහු දළ මහත්හෙයින් කපාගත නො හෙත්, සොඬ හා දළ හා දෙක මදධ්‍යයෙහි කියත තබා සොඬ කෙළවකෙළවා දළ කපා හෙළා වැද්දා අතැ තබා සවණක් රස් විහිදුවා එදළ දෙක බලබලා "මී නියා වේදනාවක් ඉවසා, විදි වැද්දා කෙරෙහි මෙත්සිත් පතුරුවා, සොඬින් මෙ දළ කපා දෙන්නෙම්, මට කිසි සැපතක් තකා[c] නො දෙමි. මෙහි පෙලෙන්[5] බෝමඬ අරා බුදු වැ ජාතිජරාව්‍යාධි ආදි දුඃඛයෙන් පෙළෙන සියලුසතුන්

---

1. මු. II පිළිගත. 3. ගලවම්හයි-බොහෝ
2. II IV & V. තෙපි සිටියාහ. I & IV සිටියාන. 4. මු. V අදහසින්.
5. II බෙලෙන්.

a ගැඹුරු වැ හෙව b. අද්ද c. පතa

අමාමහනිවන්හි ලා සුව පත් කට හෙම්ව යි; මෙ මා කටින් වැගුරුණු[1] ලෙහෙයෙන් මෙ බිම තෙත් වැ ගියා සේ, මෙ මා මුයෙන් නික්මුනු දහම්රසයෙන් සියලු සතුන් ලය තෙත් කට හෙම්ව යි; තෝ මෙ දළ මාගේ ආනුභාවයෙන් සත්දවසකින් ඇරැගෙණැ තාගේ රටට මැ යා"යි නහා යවා, මමීයෙහි තුබූ සල්ලයක් ඇහැ තුබූ කලට වඩා නහා හැරැපු කලැ බලබලා සතුටු වන්නා සේ, එ දෙදළ තමන් ඇහැ තුබූ කලට වඩා වැද්ද අතැ තුබූ කල්හි බලාබලා සතුටු වැ, එකෙණෙහි මැ මියැ හී, මා ඇතුළු වූ සියලු සතුන් ගලවන පිණිස මෙ වැනි දුෂ්කරක්‍රියා කළා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**23**.

විධුරපණ්ඩිත වැ සැටයොදුන් පමණ කාලපර්වතයෙහි තමන් හිසැ පැහැරැ පළවා ලය පළා හදවත් ගන්නට සිටි පූර්ණභද්‍ර නම් යක්‍ෂයාහට දහම් දෙසා ඔහු ලවා තමන්ට ලය දෙවා ගත් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**24**.

තේමියකුමාර වැ අතැ පත්, පව් පුරා කරණ, රාජ්‍යයෙහි කළකිරී සොළොස්හවුරුද්දක් මුළුල්ලෙහි සිතියමැ ඇඳි රුවක් සේ නිශ්චල වැ හෙවැ, වළ ලා පියන්නට ගෙණ ගිය තන්හි තමන් නොගොළු - නොපිළු - නොබිහිරිබව හඟවා මහබිනික්මන් කොට සියලු ලොවට වැඩ සැදූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**25**.

වඳුරු වැ අසූදහසක් වඳුරන් තමන් පිටින් ඇද දුකින් ගලවා අන්තයෙහි කෙළෙහි ගුණ නො දන්නා වඳුරා තමන් පිට පළාපු වේලෙහි පැණෙන්නා වූ පරාලඇටපතරින් තමන්ගේ කරුණා නැමැති ගඞ්ගාවෙහි රළවිලස් දක්වූ; වළින් නැඟුවහු තමන් හිස පහණින් පහළකල්හි මුහුණ වසා හුනු සම[a] අතින් වහවා ගෙණැ, වනදෙවතාවන් "තෙල සේ වූ අසත්පුරුෂයකුට මඟ නො පා; නො පා"යි වළක්ව වළක්වා සිටිය දී 'ඌ පහණින් පහළහ'යි මම රැහැණි වැ මඟ නො පැම් නම්, ඌ සිතත් මා සිතත් කරුණා නැති කල්හි, ඌ හා මා හා වෙනස්කම් කිම් ද? යි, අද මා මොහට පානා මඟ බුදු වැ සියලු සත්වලොකයාහට මැ පානා නිවන්මඟට කාරණ වේව"යි පතපතා මඟ පැ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. & III. වැගිරෙණ.

a. මස්. b. මඟ නො පානෙයි.

## 26.

ක්‍ෂාන්තිවාදී වැ සැමිටියෙන් පහර ඔත් අත් පා කන් නාසා කැප්පූ, රජහු කෙරෙහි ක්‍ෂමා කළ; වල්මී වැ සිටැ වර්වස් කොට හිසැ වටත් කොට අහැ[1] එලී ඕවිලි කෙළි දුෂ්ටවානරයා හා තපස්වී වැ කර පිටැ හිස පිටැ සිඳ මුඛච්ඡිද්‍ර-නාසාච්ඡිද්‍ර-කර්ණච්ඡිද්‍ර යෙහි නොයෙක් විකාර කළ වඳුරා හා කරණ විකාර තමන් ප්‍රිය පුත්‍ර ජාලියකුමාරයන් කරණ ලඳබොලඳ සුරතලක් සේ ඉවසා හුන් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 27.

සාමපණ්ඩිත වැ පිලියක් රජ විදි විෂපීතශරයෙන් පහර කා හෙන[2] කෙණෙහි දු, මවුපියන් දිසාව සලකා හිස ලා, ශර ප්‍රහාරයේ වේදනාවෙන් නො හඬා, "තමන්ගේ අන්ධ වූ මවුපියන් බලත්නත්[3] නැතැ"යි හැඬූ; මුව වැ තුඩින් තණ ගෙණැ අවුත් මවුපියන් රැකි; ගිරා වැ තුඩින් කරල්මිටි ගෙණැ ඇරැ මාපියන් රැකි; ඇත් වැ කුඹින් පලවැල හුණකොළමිටි කේල්කොළමිටි ඇදැ මාපියන් රක්‍ෂා කළ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 28.

කෙවිලි වැ බුදුතුඩෙකින් කියන්නා සේ ගැහැණුන්ගේ ආදීනව දක්වූ, මහෞෂධපණ්ඩිත වැ රාහු ගත් සඳක් ගලවන්නා සේ බ්‍රහ්මදත්තයා අත්පත් වූ වෙදෙහ රජු ගලවා සව්සත්නට සුව දුන් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 29.

වෙස්සන්තරකුමාර වැ මවුකුසින් බිහි වූ කෙණෙහි මැ "දන් දෙන්නට වස්තුවක් දුන මැනැවැ"යි දෙහොත දික් කොට දහසක් ඉල්වා ගෙණැ දන් දී නවවරෙකැ ලක්‍ෂ ලක්‍ෂ වටනා පලඳනා කිරිමවුනට දන් දී, අටහැවිරිදි වයසැ යහන්හි පලග් බැඳැ හිඳ "මා ඉල්වන යාචකකෙනකුත් නැතිහෙයින් මුත්, මාගේ හදවත උදුරා[a] දෙමියි ඇඟ මස් ලියා දෙමි යි, ඇස් උදුරා දෙමි යි තෙලියත්හි පෙළී ලෙහෙ දන් දෙමි යි, ගැති වුව මැනැවැ යි කිව, ගැති වෙමි"යි සිතත් සිතත් මැ, ඉවසා ගත නො හී සාධුකාර දෙන්නියක සේ වූ මහපොළොව ලවා හඬවා මෙරු මන්‍දරාදි වූ පර්‍වතයන් අතින් වැඳුම් ගත්; නැහෙන ඇතු දන් දී මහ පොළොව හැඬ වූ; සියලු වස්තුයෙන් සත් සත් සියක් බැගින් සත සතුමහදන් දී මහපොළොව හැඬවූ; 'ඇතු දන්

---

1. ගත-බොහෝ. 2. II & V එන. 3. II බලන්නෝ. a ඉදුරා.

දුන්හ'යි කිපී නුවර වැස්සන් නෙරපූකල්හි අඹුදරුවන් හා කැටි වැ රථයට නැඟී වල් යෙමින් හඹා ආ යාචකයන්ට අසුන් දන් දී රථය දී දරුවන්[a] දෙදෙනා උකුළෙහි ලා මද්‍රීදේවීන් හා කැටි වැ වංකගිරිපර්වතයට ගොස් ගැත්තන් සොයා ආ පූජකයාහට එදරුවන් දන් දී "මුළුසත්ලොව ගලවමි"යි ලය වහවා ගෙණැ සිටි; ශක්‍රබ්‍රාහ්මණයාහට මද්‍රීදේවීන් වැනි අඹුවන් දන් දී ලය වහවා ගෙණැ සිටි; ඇහැ සඳුන් ගල්වන්නන් කෙරෙහි ද බොල්කෙළ ඕනන් කෙරෙහි දු සමසිත් වූ; එමහත් එවියත් එදැර බුදුරජය සැධූ අප මහාගෞතමසම්මාසම්බුදුන් වහන්සේගේ සරණයෙමි යි බුත්සරණ යා යුතු.

## 30.

සසරආදීනවයෙන් සොරකමට උයනට වැද ගස උඩෙහි හැලී හිඳ, රජහු උස හිඳුවා මිටිතැන්හි හිඳ බණ කියන පුරෝහිතයා දැක "සොරා යැ යි ගෙණැ කරණ චිත්‍රවධ අද විඳිමි යි, දහමට කරණ නිසරු නො ලබමි"යි දහමට දිවි පියා ගසින් පැනැ හී "තෝ කවරෙක්හි ද?" යි කී කල්හි "මම සොරෙකිමි"යි කියා, "තා දිවියෙහි[b] ආසාවක් නැති වැ මෙසේ වූ සාහසයක් කුමට කෙළෙහි දැ"යි කී කල්හි, "මහරජ, ගස්හි හැලී හුන් මා දක්නෝ නැත් මැ යැ. එතෙකුදු වුවත් මේ දහමට නිඳ කොට උස හිඳ බණ අසා නිරැ යන තොප හා, බිමැ හිඳ බණ කියා නිරැ වදනා පූරෝහිතයා හා දෙදෙනා බලබලා අවවාද නො කියා, තොප දෙදෙනා නරකයෙන් නො නහා මම මා දිවි රක්නට සිතීම් නම්, දහමට කවර පූජාවක් කළ නම් වෙම් ද? සත්නට කවර කරුණාවක් කළා නම් වෙම් ද? යි දිවි පියා ගසින් හිනිමි"යි බණ කියා, තමන් කී බණට රාජ්‍යයෙන් පූජා ලද් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 31.

තමන් පිය වූ වසවත්මරහු බෝමඩෙහි පැරැද පැලැ[c] කල්හි 'එපියාණන් මුහුනැ ගැවුනු දැලි පිසුම්හ"යි සැරහී තමන් සිල් බිඳිනට ආ, මල්බරින් නැමුනු වරලසින් බැලුබැලූවන් සිත් තමන් කරා අදිමින්, කණතට දිවන දිහුපුල්නෙතුපුලෙන් රසවතුන් සිත් තමන් කරා හයවමින්, ගැන්වූ ගනනිල්වරල්මහමේකුළු නැහෙත් කෙණෙහි බඳ දෙව්දුනු සෙයින් මනහර වූ බැමසහළින්, හෙළාලන ඇසින් බැලුබැලූවන් දිරිය හෙළවමින්[d], දැල්වූදැල්වූ ඇසින් ලීලාවට දෙර හරවමින්, තඹුරු තඹලවනත්හි වතළ දසනගරසින් සඳවලා, වගල නවබග්ලසඳකැලුම්හි මන් බිඳිමින්, ගෙලෙහි ලූ දළමුත්හරින් තිවන් යනුවන් ගෙලෙහි මල ලා තමන් පාමුලට අදිමින්, අත්හි ලූ මිණිවළලු හඬින් "පිණැති කෙනෙක් මෙහි පහස් විඳ

a. දෙදරුවන් b. ජීවිතයෙහි c පලා. d වියලමින්. e නවගබ.

සිත් සනහත්ව"යි රසවත්නට හඬෝනාක් බඳු, සුවට සිලුටු පිරි හිව් දෙතනයෙහි මහතින් බැලුබැලූවන්ට මෙලෝ පරලෝ දෙක සඟවමින්, මිටැ හැකිළෙන සිඟුවළහින්, පිරිමින් මනදෙළපමණින් මහත් වූවාක් බඳු වූ පුළුලුකුළෙන්, රන්කෙහෙල්කඳට නිගා දුන් වට සිලුටු කලවාසහළින්, මඳමඳසිනාලසඳරස් ගත් මුවසඳමඬල උද කරත් සුදුරස්කඳ නැමැති ජල වහන තියපෙළ නැමැති සඳකත්මිණිපෙළින් හොබනා, ඇසට ලූ මල බඳු, සිතට ලූ උන්මාදඖෂධයක් බඳු, ධෛර්‍ය්‍යයට සතුරු වූ, නිවණට හකුල් වූ, සසරටවහල් වූ, සුවයට නිධාන වූ, දෙම්නසට විෂවූ, රතියට ආකාර වූ, ලීලාවට කුලගේ වූ, ලජ්ජාවට දලවළ වූ,[1] යෞවනයට මඟුල්ගෙය වූ, තෘෂ්ණා යැ, අරති යැ, රගා යැ යන මාරස්ත්‍රීන් තුන්දෙනා අවුත් සිටැ, විලියෙන් හනා මිහිරෙහි ගලා බොලඳීන් මුසු කොට රසයෙන් ආර්ද්‍ර[a] කොට සෙනෙහෙන් සිනිඳු කොට බෙණෙමින්,

"මේ එකළා වැ මහවල්හි මෙවැනි රුවක් ගෙණැ මෙවැනි යෞවනයක් ගෙණැ අප ඇසට පැණුනු සේ ඉතා මැනැව. හිමිසඳ, තොප රූ දකැ වෙවුලුම් මෙ හදවත් මඳක් සනහත් යෙදේ. තොප යොවුන්තුරුහි[b] මහණ ධැමින් ගිනි නො ලත් යෙදේ. මෙ වැනි බඳක් වසා පෙරෙව් සිවුරෙන් බලනුවන් ඇස්හි වස නො ලත් යෙදේ. රුවට මිඩි වූ තොප කරා ගිය ඇස් ඔස්සේ[c] පසුපස්සෙහි ගිය මෙසිත් නිවා සනහන රසවත් බැලීමක් කෙණෙක්හි දූ මෙදෙස්හි හෙළත් යෙදේ. ගල්හි නො කෙටුව, මැටියෙන් නො හැඹුව, පිදුරෙන්[2] නො බැන්ද, දඬෙන් නො නෙළුව, මේ දුක් බලබලා නො දත්වන් වනු නො යෙදේ. මෙවැනි වසත්කලෙකැ සුපි පිලිය මඩුයෙකැ තොප වැනි[d] කෙළියහළුකෙනකුන් නොලද් ගැහැණියක සේ පව් කොළෝ නැත. තන්හි තන්හි හඬන පියුම්මී බී මත් රජහසුන් පියරුවු අසවු. සල්මල්හි හී ගුමන[e] බමරුන්ගේ අඳලගුම් අසවු. සුපුලඹැහි කුල්නා කෙවිල්ලන්ගේ පිය තෙපුල් අසවු. මොනරකිළියන් මැදැ පිල්සත් විදහා බැහැවුම් නැටුම් ගත් කෙකාළ මත් මොනරුන් බලවු. අංඅගින් යතයතා මුවමුළින් මුවපෙල්ලන්[f] තෝරා ලැහැබට ගෙණැ වදනා වසත් මත්මුවපොල්ලන් බලවු. සැදී සිටි ලියමඬුලු බලවු. සුදෙසුදු වැලිතලා බලවු. ගලහින් හෙන මනා ගඟුල්හැලි බලවු. මල් මුවරඳබර ඇදැ හමන මඳමඳපවන්හි මිහිරක් බලවු. මෙ හැම තොප වැනියන් හිඟි නොලද්දනට තැවුලියට මුල් වූ සේ බලවු. වරෝ,

---

1. පලවැල වූ-ඇතැම් 2. විදුරෙන්-හැම.

a. අදද b තොප යොවුන් තොප රුහි - හැම c හොස්සේ

d. සරි e ගුගුමනා f. පොල්ලන් - හැම,

හිමි, මෙ දුක්පත් තොප මිඩියන් තොප තෙලෙ පුළුල් උරමඬලෙහි ලා සනහව''යි.

බණන බස් අසා, තමන් කන් එදෙසට නො නමා, ඔවුන් කරණ ලීලාවිලාසය ජරපත්වැදිරියන් පානා උසුළුවිසුළු සේ සලකා රාගයෙන් දුරු වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**32.**

කොහොටු[1]මිටියක් බඩැ බැඳ ගෙණ බඩ මහත් කොට සිවු වණක් පම්ද් මැද, යුගඳුරුමුදුනෙහි දිලිසෙන ලහිරු මඩලක් සේ, ධර්මාසනයෙහි දිලියෙමින් බණ වදරණ තන්හි සිටැ "තොපට දරි ඇත්තෙමි"යි කියන චිඤ්චමාණවිකාව බිණූ බස් තමන් දූ වූ කෘෂ්ණජිනාවන්ගේ මියුරුතෙපුල් සේ අසා වැඩැ හිඳ "මා සේ වූ තිලෝගුරු දෙවාතිදෙව ශක්‍රාතිශක්‍ර බ්‍රහ්මාතිබ්‍රහ්ම භගවත් අභීත් සම්මාසම්බුදු මහතක්හට මෙ වැනි වියරු බණන්නේ ය''යි රැහැණි නො වැ, ඒ බොරු කී අකුසලින් තිරැ වැද ඈ විඳිනා මහදුකට කම්පා වැ වැඩහුන්, ද්වේෂයෙන් දුරු වූ, බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**33.**

තමන් හිසට ගල් පෙරළූ දෙව්දත්හූ අන්තයෙහි නිවන්හි හෙළූ ද්වේෂයෙන් දුරු වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**34.**

ප්‍රතීත්‍යසමුත්පාදයෙහි පොවා, හෙතුප්‍රත්‍යයාදී සූවිසි ප්‍රත්‍යයයන් කෙරෙහි පොවා, රූපස්කන්ධාදිපඤ්චස්කන්ධයන් කෙරෙහි පොවා, දුඃඛසත්‍යාදි සතර සත්‍යයන් කෙරෙහි පොවා, චක්ඛායතනාදි දෙළොස් ආයතනයන් කෙරෙහි පොවා, චක්ඛුධාතු ආදි අටළොස් ධාතූන් කෙරෙහි පොවා, සති සම්බොජ්ඣඞ්ගාදි සත්තවිධබොජ්ඣඞ්ගයන් කෙරෙහි පොවා, ශ්‍රද්ධාබලාදිසප්තවිධ බලයන් කෙරෙහි පොවා ශීලවිශුද්ධි ආදී සප්තවිශුද්ධින් කෙරෙහි පොවා, විතර්කාදිධ්‍යානාඞ්ගයන් කෙරෙහි පොවා, සම්‍යග්දෘෂ්ටි ආදී අෂ්ටමාර්ගාඞ්ගයන් කෙරෙහි පොවා, අණ්ඩජාදී සතර යෝනි යෙහි පොවා, නරකාදිපඤ්චගතියෙහි පොවා, එකත්තකාය එකත්ත-සඤ්ඤාදි සප්තවිඥනස්ථිතියෙහි පොවා, නවවිධසත්තාවාසයෙහි පොවා, සත්තිස් බොධිපාක්ෂිකධර්මයන් කෙරෙහි පොවා, දෙසැට දෘෂ්ටියෙහි පොවා නො මුළා වැ, දහමින් දහම් තෝර තෝරා ශ්‍රීහස්තයෙහි රෙඛා සේ පිරිසිඳ දැන, මොහයෙන් දුරු වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. වියඝ්-සැම. a. කෝටු

Non-Commercial Distribution

35.

"ශාක්‍යකුලයෙහි උපන්මි. තිලෝගුරු බුදු වීමි. දෙව්බඹුන් හිසට මා පාපියුම් මුදුන්මල් කෙළෙමි. දෙදෙව්ලොවට අධිපති වූ සක්දෙව්රජ මඟුල්හි සක් පිඹිනා මෙහෙකරු යැ. සහම්පති මහබඹ කුඩ ගන්නා වසී[1]යැ. සුයාමසන්තුසිතාදිදිව්‍යපුත්‍රයෝ මඟුල්හි තල්වැට චාමර අදනා මෙහෙතන්හ. මා පය පාළ වෙහෙරෙහි රජස් පමණක් දෙව්බඹහු තමන් මුදුනට ධාතු කොට සිතති. මා කපා හළ හිසකෙහෙ තව්තිසැ දෙව්ලොව්හි සිළුමිණිසැදගබ්හි තබා දෙවියෝ පූජා කෙරෙති. මා ඇඳ හළ සළුසහළ බඹලොව ගෙණ ගොස් සිළුමිණිසැයෙහි තබා මහබඹහු පූජා කෙරෙති. මා පියවර එබූ තැන් වැඳ පිදූ දෙව්බඹනට අමාමහ නිවන් සැදෙයි. මම මහත්මි. මම වියත්මි. මම පූජ්‍යයෙමි යි. එහෙයින් ගොස් සක්දෙව්රජහු මිදුල්හි සිහා දිව්‍යරසභොජන වළඳමි"යි නො සිතා, දුගීන්ට කරුණා කොට දෙරදෙරෙහි සිහා සිටැ, කුඩු සුන්සහලහර සිහා වළඳ, ඒ දුන්නනට අමාමහ නිවන් දෙන බැවින් මනින් දුරු වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

36.

"සුවිසිඅසංඛ්‍යයක් සතුන් මා පසුපස්සෙහි ලා ගෙණැ මම පළමු කොට නිවන් දුටු නුවණැත්තෙමි. රජදරුවන් පැහැරැ ගත නො හැකි, දියෙන් නො ගෙණ යා හැකි, ගින්නෙන් නො දැවිය හැකි ශ්‍රද්ධාධනශීලධනආදි වූ මහාධන ඇත්තෙමි. හුන්සිටි තන්හි මා මුදුන් ඉද්දෙන් අකනිටාබඹලෝ දක්වා පක්ෂීන් කෙරෙහි පටන් මහබඹුන් දක්වා අහස්හි පොවා හසර කරන්නෝ නො වෙති. කුසල් නම් මා කීයේ මැ යැ. අකුසල් නම් මා බිණුදෙයෙකැ. දෙව්ලෝ යනුවෝ මා ගැතියහ. නිරැ යනුවෝ මා කෙරෙහි සඳහන් නැතියහ. නිවන් දක්නෝ මාගේ ශාසනයෙහි සත්හැවිරිදි හෙරණපැවිද්දහ. දෙවියන් මරුන් බඹුන් සහිත මුළුලොව්හි මා කී බසට 'මෙ කී සේ නපුරැ'යි උත්තරයක් දෙන එක ද සතෙක් නැත. හැමසත්හු මාගේ පාමුලට වැද සැනහෙන්නට සිතති. සසර භය ඇති හැම නුවණැතියෝ මා වසන විහාරයට වැද පැල් වැදැ එදුකින් මිදෙන්නට සිතති. මුළුසත්ලොවැ මාගේ නුවණට නො ඇතුළත් දත යුත්තෙක් නැත. කිහිඹිකුහුඹුවන් කෙරෙහි සිටැ සහම්පති මහබඹහු දක්වා, මපුතනුවන් රාහුලකුමාරයන් කෙරෙහි සිටැ මා මරන්නට ප්‍රයොග කළ දෙව්දත්මහතෙරුන් දක්වා මාගේ කරුණාවට නො ඇතුළත් එක ද සතෙක් නැත. මාගේ සස්නෙහි

1. මහාසී.

Non-Commercial Distribution

මහණ වූ හෙරණපැවිද්දන් පා යට තමන් හිස් සහවා පියන්නට නො සිතන මහබඹහු නැත. මා නම කීවන් කෙරෙන්, මා කෙරෙහි පහනුන් කෙරෙන්, එක මලකුදු මට පිදූවන් කෙරෙන් එක් වේලෙක්හි දූ මා කීවා කළවුන් කෙරෙන්, මියන වේලෙහි සදෙව්ලොවින් ගෙණා රථ බලබලා 'වෙළෙහි නැඟී එ. මැටි පිඩු වැනි තෙල සිරුරු හැර දිවඅත්බව් ලදින් නඳුන්උයන්හි කෙළනට එව'යි කැඳවන දිව්‍යස්ත්‍රීන්ගේ රූ බලබලා මරණ පොවා මිහිරි කොට නො මියන්නෝ නැත. මා වැනි දෙදෙනක්හු මුළුපොළොව උසුලා ගත නො හී, සමහරකලෙක්හි කප්ලක්‍ෂයක් කලුදු කප්කෙළක් පමණ කලුදු කප් අසංඛ්‍යයක් පමණ කලුදු මා වැනියන් මුහුණු නො හැදිනැ මුළුසත්ලොව සතර අපාහි හී දුක් ගණිති. මෙ මුළුලොව්හි සුවපත්හු නම් මා කරුණා ඇසින් බැලූකෙනෙකැ"යි සිතා මානයක් නො කොට කසළ ගොඩට කළාල්[1] කඩින් වසා දමාපූ දරුවන් කෙරෙහි කරුණා කොට "උන් හොත්[2] තැනට යෙමි"යි මියන්නට සිටි සැඩොල් දුව දෙව්ලොවට ගෙණැ ගොස් සිටුවාපියනු පිණිස සැඩොල්ගමට දිවෙමින්, තමන් නිසා මහණ වූ පැවිද්දක්හු එන පෙරමඟැ කුඹල්හලකට දිවෙමින්, එක්සිය-විසියොදනෙකැ සත්සියක් යොදනෙකැ දෙව්ලෝබඹලෝ යනාදී යම් දුරුකතරෙක්හි සිටි නිවන් දක්නට සුදුසු කෙනකුන් ඇත ද, එතැන්හි කැටපත්හි හෙන සේයක් සේ දිවැ[3] ගොස් පෙණී තදින් මොළොකින් බණ කියා ඔවුන් සිත්හි කෙලෙසුන් නසා අමාමහනිවන්හි ලා නිවූ සැනහූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 37.

රූ ඇති එකක්හු "අන්නු මා සේ රූ ඇති නොවෙත්ව"යි සිතන, ධනැතියන් "මා සේ අන්නු ධන ඇති නො වෙත්ව"යි සිතන, කුලැතියන් "අන්නු මා සේ කුලැති නො වෙත්ව"යි සිතන තේජස් ඇතියවුන් "මා සේ අන්හු තේජස් ඇති නො වෙත්ව"යි සිතන මෙලොව්හි, තුමූ දෙවාතිදෙව වැ ශක්‍රාතිශක්‍ර වැ බ්‍රහ්මාති බ්‍රහ්ම වැ සිටැ, ගෝකුණෙහි හොත් පණුවන් කෙරෙහි පටන් බඹලොව්හි මහබඹුන් දක්වා හැම සත්හු "සවාසන[4] කෙලෙසුන් නසා මා සේ මැ බුදු වෙත්වයි, මා සේ මැ දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණ අසූ අනුබ්‍යඤ්ජන කෙතුමාලාබ්‍යාම-ප්‍රභායෙන් හොබනා රූ ලබත්වයි, මා සේ දෙව්බඹනට අගතැන් පත් වෙත්වයි, මා වන් අමාමහනිවන් දකැ නිවී සැනහෙත්ව"යි සිතන; ගුණයෙහි මසුරක් නැති; "මම ධර්මස්වාමීමි"යි නො සිතා තමන් සස්නෙහි

1. කළහල්. 2 ඔත්. 3. වැද 4. සවාසනා

Non-Commercial Distribution

මහණ වූ පැවිදිකෙනෙකුන් කියන බණ පවා මුළු රෑ සිටිපියෙහි සිටැ අසා, පහන් වූ සඳ සාධුකාර දෙන්නවුන් හා සමග සාධුකාර දී "එක්රැයක් තබා කපක් දවසුදු මෙ සේ බණ කියත් මහාත්, සිටිපියෙහි සිටැ අසත්, "අපට මිහිරැ"යි වදරණ අනුන්ගේ යහපතෙහි සතුටු වන බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 38.

උදයපර්වතයට අස්ත[1]පර්වතය සේ, මහමුහුදෙහි එතෙරට මෙ තෙර සේ, මහමෙරෙහි පත්ලට එහි මැ කුළුඅග සේ, යට අජටාකාශයට උඩ අජටාකාශය සේ, සියලු කෙලෙසුන්ට තුමූ දුරු වැ තමන් සිතට සියලු කෙලෙසුන් දුරු කළ හෙයින් රහත් නම් ලද බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 39.

යහපත් කොට තමන්ගේ නුවණින් පිරිසිඳ "කුසල් නම් මෙතැකැ. අකුසල් නම් මෙතැකැ. විපාක නම් මෙතැකැ. ක්‍රියා නම් මෙතැකැ. සිත් නම් මෙතැකැ. සිත්හි උපදනා චෛතසිකයෝ නම් මෙතෙකැ; මහාභූතයෝ නම් මෙතෙකැ. ඔවුන් නිසා පවත්නා උපාදයරූපයෝ නම් මෙතැකැ. චිත්තයට ලක්‍ෂණ-රස-ප්‍රත්‍යුපස්ථාන-පදස්ථාන නම් මේ යැ. ස්පර්ශවේදනා සංඥාචෛතසිකධර්මයන්ගේ වෙන වෙන ලක්‍ෂණරස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන නම් මේ යැ. භූතොපාදයරූපයන්ගේ වෙන වෙන ලක්‍ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන නම් මේ යැ. ශීල නම් මේ යැ. සමාධි නම් මේ යැ. ප්‍රඥා නම් මේ යැ. විමුක්ති නම් මේ යැ. විමුක්තිඥානදර්ශන නම් මේ යැ. සතර ආර්‍ය්‍යමාර්ග මේ යැ. සතර මාර්ග ඵල නම් මේ යැ. සතරමහසිවටන් නම් මේ යැ. සතර ඍද්ධි පාදයෝ නම් මූ යැ. සතරවෛශාරද්‍යයෝ නම් මූ යැ. මේ ධර්මයෝ මෙනෙහි කට යුත්තාහ. මේ ධර්මයෝ දුරු කට යුත්තාහ. මේ ධර්මයෝ සතර අපායෙහි හෙළතී මේ ධර්මයෝ දිව්‍යබ්‍රහ්මලොකයෙහි උපදවති. මේ ධර්මයෝ නිවන්හි සිටුවා මුත් නො හරති අතීතයෙහිදු මේ ධර්මයෝ මෙසේ මැ යැ. අනාගතයෙහි දු මේ ධර්මයෝ මෙසේ මෙසේ මැ යැ. මෙ වැනි ගුණයක් ඇති සත්ව තෙමේ නිර්වී සැනහී මුත් නො නවත්වති. මෙබඳු ගුණයක් ඇති සත්වතෙමේ මෙලොවින් පරලොවින් දුක් විඳ මුත් නො නවත්ති. මෙවෙනි ගුණ ඇති සතක්හු හා එක් වූයේ අමාමහනිවන් දැකැ සුව[2] විඳ මුත් නො නවත්ති. මෙවෙනි සතක්හු

1. හස්ත. 2. I,III නිවන්හි පහරවා සුව

Non-Commercial Distribution

හා එක් වූයේ අවීචිමහානරකයෙහි දුක් විඳ මුත් නො නවත්ති. මේ කට යුතු යැ. මේ නො කට යුතු යැ. මේ බිණියැ යුතු යැ. මේ නො බිණියැ යුතු යැ. මේ සිතිය යුතු යැ. මේ නො සිතියැ යුතු යැ. මේ කරණ සමයෙහි මිහිරි යැ, පසුවට නො මිහිරි යැ. මේ කරණ සමයෙහි නො මිහිරි යැ, පසුවට මිහිරි යැ. මෙවෙනි දෙයක් කරණ සමයෙහිත් පසුවත් දෙ තැන්හි මැ මිහිරැ. මෙසේ මෙසේවූ කටයුත්තෙහි මෙලොවින් මෙතෙක් ප්‍රයොජන යැ. පරලොවින් මෙතෙක් ප්‍රයෝජන යැ. මේ සත්හට ඇති වූ මේ ගුණය මෙතෙක් කල්හි මුත් ඔබ්බෙහි නො පවත්ති. මේ ධර්‍මය මෙතෙක් විපාක දෙන බව මුත් අඩු කොට හෝ වැඩි කොට හෝ විපාක නො දෙයි. මේ ධර්‍මය මේ ධර්‍මයට මෙතෙක් ලෙසින් ප්‍රත්‍යය වෙයි. මේ සිතට අනතුරු වැ මෙතෙක් සිත් උපද්දි. මේ සිත තෙමේ මෙතෙක් සිතට අනතුරු වැ උපද්දී. මේ සිත්හි චෛතසිකධර්‍මයෝ මෙතෙක් ඇත. මේ සිත සොම්නස් සහගත වන්නේ මෙ සේ යැ. උපෙක්‍ෂාසහගත වන්නේ මෙ සේ යැ. මේ සිත ඤනසම්ප්‍රයුක්ත වන්නේ මෙ සේ යැ. ඤනවිප්‍රයුක්ත වන්නේ මෙ සේ යැ.

සීලයට විසුද්ධි නම් මෙතෙකැ. කලංක[1] නම් මෙතැකැ. සමාධියට විසුද්ධි නම්[2] මෙතෙකැ. කලංක නම් මෙතෙකැ. ප්‍රඥවට විසුද්ධි නම් මේතෙකැ. කලංක නම් මෙතෙකැ. විමුක්තියට උපාය මේ යැ. විමුක්තිඤනදර්‍ශනයට උපාය මේ යැ.

සතර සතිපට්ඨාන ධර්‍මයන් වැඩෙන්නේ මෙසේ යැ. අඩු වන්නේ මෙසේ යැ. සතර සම්‍යක්ප්‍රධානධර්‍මයන් වැඩෙන්නේ[3] මෙසේ යැ. පිරිහෙන්නේ මේසේ යැ. සතරඍද්ධිපාදයන් වැඩෙන්නේ[3] මෙසේ යැ. අඩු වන්නේ මෙසේ යැ. සතර මාර්‍ගයන් සතර ඵලයන් උපදනා ක්‍රම මේ යැ. සතරපටිසම්භිදධර්‍මයන් ලබන ක්‍රම මේ යැ. සතර යොනිය පිරිසිඳිනා නුවණ නම් මේ යැ. සතර ආයර්‍යවංශයෝ නම් මූ යැ. ප්‍රධානාඞ්ගයෝ පස්දෙන නම් මූ යැ. (සතර) පස් අඟක් ඇති සම්‍යක්සමාධි නම් මේ යැ. පඤ්චෙන්ද්‍රියයෝ නම් මොහු යැ. පඤ්චබලයෝ නම් මොහු යැ. පස් නිස්සරණීයධාතු නම් මොහු යැ. විමුක්ත්‍යායතනයෝ පස්දෙන නම් මොහු යැ. විමුක්තිය මුහුකුරුවන ඤනයෝ පස්දෙන නම් මොහු යැ.

සාරාණීය[4] ධර්‍මයෝ සදෙන නම් මොහු යැ. අනුස්මෘතිස්ථානයෝ සදෙන නම් මොහු යැ. ගෞරවයෝ සදෙන නම් මොහු යැ. නිස්සාරණීය ධාතු සදෙන නම් මොහු යැ; ෂඩ්විධ සත්තවිහාරයෝ නම් මොහු යැ.

---

1. කළකම් 2. වන්නේ. 3. වඩන්නේ. 4. නිස්සාරණීය

Non-Commercial Distribution

අනුත්තරියෝ සදෙන නම් මොහු යැ. නිර්වේධභාගීය වූ නුවණ සය නම් මේ යැ. ෂඩ්විධඅභිඥා නම් මේ යැ. අසාධාරණ ඥාන සය නම් මේ යැ.

ආයර්‍යධනයෝ සත්දෙන නම් මොහු යැ. නො පිරිහීමට කාරණ වූ ධර්‍මයෝ සත්දෙන නම් මොහු යැ. ආයර්‍යධර්‍මයෝ සත් දෙන නම් මොහු යැ. බොද්ධ්‍යඞ්ගයෝ සත්දෙන නම් මොහු යැ. සත්පුරුෂ ධර්‍මයෝ සත්දෙන නම් මොහු යැ. නිද්දිශ[1]වස්තු සත නම් මේ යැ. සංඥාවෝ සත්දෙන නම් මොහු යැ. දක්ෂිණාර්හ පුද්ගලයෝ සත්දෙන නම් මොහු යැ. ක්ෂීණාශ්‍රවබල සත නම් මේ යැ.

නුවණ ලැබීමට හෙතු අට නම් මේ යැ. සම්මත්තධම්ම අට නම් මේ යැ. ලෝක ධර්මයෝ අටදෙන නම් මොහු යැ. ආරම්භවස්තු අට නම් මේ යැ. අක්ෂනදෙශනා අට නම් මේ යැ. මහාපුරුෂවිතර්ක අට නම් මේ යැ. අභිභායතන අට නම් මේ යැ. අෂ්ටවිමොක්ෂ නම් මේ යැ.

යොනිසොමනසිකාරමූලධර්‍මයෝ නවදෙන නම් මොහු යැ පාරිශුද්ධිප්‍රධානාඞ්ග නවය නම් මේ යැ. නවසත්තාවාස නම් මේ යැ. නව ආඝාතවස්තු මේ යැ. සංඥා නම් මේ යැ. නානාත්ව නවය නම් මේ යැ. අනුපූර්විහාර නවය නම් මේ යැ.

නාථකරණධර්‍මයෝ දසදෙන නම් මොහු යැ. කසිණායතනයෝ දසදෙන නම් මොහු යැ. දශ අකුශලකර්‍මපථයෝ නම් මොහු යැ. දශකුසලකර්‍මපථයෝ නම් මොහු යැ. බුද්ධබලදශය නම් මේ යැ. දසසම්මත්තයෝ නම් මොහු යැ. දශආයර්‍යවාසයෝ නම් මොහු යැ. දශඅශෛක්ෂ ධර්‍මයෝ නම් මොහු යැ.

මෛත්‍රී අනුසස් එකොළොස නම් මේ යැ. ධර්‍මචක්‍රාකාර දෙළොස නම් මේ යැ. තෙළෙස් ධූතගුණ නම් මේ යැ. තුදුස් බුද්ධඥාන නම් මේ යැ. පසළොස් චරණ[2] ධර්‍මයෝ නම් මොහු යැ. ෂොඩශවිධ ආනාපානාසති නම් මේ යැ. අටළොස් බුද්ධධර්‍මයෝ නම් මොහු යැ. එකුන්විසි ප්‍රත්‍යවෙක්ෂාඥානයෝ නම් මොහු යැ. සූසාළිස් ඥානවස්තුහු නම් මොහු යැ. පරෝපණස් කුශලධර්‍මයෝ නම් මොහු යැ. සත්සැත්තෑ ඥානවස්තුහු නම් මොහු යැ. සූවිසිකෙළලක්ෂයක් සමාපත්තිහු නම් මොහු යැ"යි සියලු දත යුතු ධර්‍මයන් ගුරුකෙනකුන් නැති වැ තමන්ගේ මැ නුවණින් පිරිසිඳ, මුළුසක්වළ ගඳකිළියෙහි ඇතුළුගබ සේ මා තමන් නුවණින් පිරිසිඳ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

1. නිර්ජර. 2. විමුක්තිපරිපාචනිය.

Non-Commercial Distribution

**40.**

තමන්ට තුඩු දුන්නවුන්ට නිවන් දෙන හෙයින් පූජාවට සුදුසු වූ **බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු.**

**41.**

තවද, දහමට බැහැවෙන, සබවසට මැ නියැලෙන, කරුණා බවට හිමි, ප්‍රඥවට අත්වැල්, මෛත්‍රියට කුලදෙවි, ක්‍ෂමාවට කුල ගෙය වූ. ධෛර්‍ය්‍යයට නිධාන වූ, ස්මෘතියට පරායණ වූ, සුභාෂිතයට ප්‍රසවභූමි වූ, ප්‍රශමයට ආකර වූ, තෙජසට නිවාස වූ, කීර්තියට ජන්මාලය වූ, මිහිරට පිහිට වූ, අධර්‍මයට පිටි පෑ සත්‍වයන් හික්ම වීමට තත්පර වූ, මුළුලොවට එක පිහිට වූ, සියලු සතුන් කෙරෙහි දනුම් පවත්වන; සියලු කට යුත්තට උපදෙශ කරණ, සියලු අපායට පිහිදෙර වූ, සියලු සුගතියට හළදෙර වූ, නිවණට පිළිවෙත් කියන, අනාත්මයට උපදෙශ කරවන, සප්තවිශුද්ධියට විශුද්ධි දන්නා, දශබලයට පරමාධාර වූ, අනාවරණඥනයට තමන් මැ පිහිට කළ, චතුවෛශාරද්‍යයට නො පිටත් කළ, ආශ්චර්‍ය්‍ය රුවින් අද්භූත වූ, පුරුදු කළ අපිස්බැවින් උත්තම කොට වැඩූ සතොස්ගුණෙන් අසමාන වූ, විවේකයෙන් අසාධාරණ වූ, ශීලයෙන් අනුපම වූ, සමාධීන් අතුල්‍ය වූ, ප්‍රඥවෙන් අප්‍රතිරථ වූ, විමුක්තීන් අසදෘශ වූ; විමුක්තිඥනදර්‍ශනයෙන් අප්‍රතිසම වූ, මුළුලොවට එක ඇසක් වැනි වූ, මුළුලොවට ඒකඅන්‍ධයෂ්ටියක් බඳු වූ, මුළුලොවට එකපිහිට වූ, මුළුලොවට එකත්‍රාණ වූ, මුළුලොවට එක ලෙන වූ, මුළුලොවට එකපරායණ වූ, මුළුලොවට ඒකදිව්‍යෞෂධ වූ, මුළුලොවට ඒකවර්‍ෂාකර වූ, මුළුලොවට ඒකහෘදයාර්ද්‍රකර වූ, මුළුලොවට ඒකසන්තොෂාවාර්‍ය්‍ය වූ, මුළුලොවට ඒකවිමොක්‍ෂ දෙශක වූ, මුළු ලොවට ඒකචින්තාමාණික්‍යය වූ, මුළුලොවට ඒකභද්‍රසට වූ, මුළු ලොවට ඒකමහොත්සව වූ, මුළුලොවට එක ශිශිරොපචාර වූ, මුළු ලොවට ඒකමඞ්ගලගෘහමය වූ, මුළු ලොවට ඒකවත්සල වූ, දකැ පරණ නො වන්නා වූ, අසා පරණ නො වන්නා වූ, විඳ පරණ නො වන්නා වූ, කියා පරණ නො වන්නා වූ, අඥනයන්ට ප්‍රඥෞෂධ වූ, දුඃඛිතයන්ට පරමාන්න වූ, සංසාරගතයන්ට නිස්සරණ වූ, දුර්දන්තයන්ට විනයමූර්ති වූ, ශොකීන්ට හෘදයාශ්වාසකමන්ත්‍ර[1] වූ, දුඃඛවාෂ්පයට අවග්‍රහනිදස වූ, සන්තොෂවාෂ්පයට සනාගම වූ, තමන් නො පහළ තෙනැ නිවන් නො පහළ වන, තමන් පහළ තැන අදහම නො පහළ වන, තමන් මුසු තෙනෙකැ සසරවැසන් නුමුසු කරවන; බුදු පරපුරෙන් ආ නුවණින්, බුදුපරපුරෙන් ආ කුළුණින්, බුදුපරපුරෙන් ආ වැරසරින්, බුදුපරපුරෙන් ආ මැදහතින්, බුදුපරපුරෙන් ආ නොපමාවෙන්, බුදුපරපුරෙන් ආ

1. හෘදයසස්‍යාසමන්ත්‍ර - බොහෝ. 2. අබොධ්‍යංගයො - සමහර

Non-Commercial Distribution

බොධ්‍යඞ්ගයෙන්,[2] බුදුපරපුරෙන් ආ පරාක්‍රමයෙන් සම්පූර්ණ වූ; කීවක් මැ බස් වන, කළාක් මැ කට යුතු වන, හෘදයානන්‍දකර වූ, නයනානන්‍දකර වූ, පරමාචාර්‍ය්‍ය වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 42.

තවද "මේ ශරීරය නම් මුත්තෙකින් මැණිකෙකින් මරාවකින් පබළුවෙකින් රණෙකින් රිදීයෙකින් නිමියේ නො වෙයි. ඇටින් සමින් නහරින් මසින් ලෙහෙයෙන් කෙළින් සෙමින් පිටින් වටතින් අසුචියෙන් හිසකෙහෙයෙන් ලෝමයෙන් නියෙන් දතින් වකුගඩුවෙන් හදවතින් අක්මායෙන් බඩදිවින් දලබුයෙන් අතුණෙන් අතුණුබහනින් නොපැසැනු-අහරින් පුයායෙන් ඩහයෙන් තෙලින් කඳුළෙන් සොටුයෙන් සදමිඳුලෙන් හිස්මුලින් නිමියේ යැ. බැලුබැලු සේ අසාර යැ. සිතුසිතු සේ පිළිකුලැ. නුවණ නැති නැති වූ සේ යහපත් වැ වැටහෙන්නේ යැ. බුදුඇසිනුදු බලා සාරයක් දක්නට නැතියා වැ හැම ලෙසින් ම අසාර වැ සිටියේ යැ පෙණපිඩක් සේ දියබුබුළක් සේ විදුලියක් සේ ඉන්‍ද්‍ර ජාලයක් සේ සිහිනෙන් දුටු රූපයක් සේ අස්ථිර යැ. නො යාපත. නො සබා යැ. දුර්ගන්‍ධයට ආකර යැ. අශුචියට පාත්‍ර යැ. මුත්‍රයට භාජන යැ. ගඩක් වැන්නැ. පොළක් වැන්නැ. රොගයක් වැන්නැ. ඇවිදිනා අසුචිපිඩක් වැන්නැ. තෙමේ මැ තමහට සතුරු යැ. තෙමේ මැ තමහට විෂ යැ. තෙමේ මැ තමහට ගිනි යැ. ඇතුළෙහි අසුචි පුරා පිටතැ සිතියම් කළ කළයක් වැන්නැ. එකදවසක් නො නැව, එක දවසක් නො ඉළුව, එකදවසක් දත් නො මැන්ද, පැයක් බුලත් නො කැව තෙමේ මැ තමහට අසුචිවළක් සේ වැටහෙයි. කන්හි කාරදුලෙසින් සිටි අසුචි යැ, ඇස්හි මඩලෙසින් සිටි අසුචි යැ, නාසායෙහි සොටුලෙසින් සිටි අසුචි යැ, දත්හි මැලිලෙසින් සිටි අසුචි යැ, වටන්ලෙසින් වැහෙන අසුචි යැ, ස්වභාවයෙන් අධොමාර්ගයෙන් වැහෙන්නා වූ අසුචි යැ යන මෙතෙක් අසුචියෙන් අතුරක් නැත්තේ යැ. රොගයට ආකර යැ. ශොකයට ආකර යැ. භයට ආකර යැ. උපද්‍රවයට ආකර යැ. "අද නස්සි, සෙට නස්සි" යන හිමක් නැත්තේ යැ. ආදි මවු-කුස් මහනරකයෙහි වැසැ විඳුනා දුකට කාරණ වැ සිටියේ යැ. සොර වූ ජරාදුකට පිහිට වැ සිටියේ යැ. මරහු මුවෙහි හී විඳුනා මරණදුකට පිහිට වැ සිටියේ යැ. තමාගේ පිළිකුල් තමාට මැ ඉවසා ගත නො හැකි දුර්ගන්‍ධ ඇත්තේ යැ. මළ එකදවසකුදු ගෙයි ලැග්ග, ලැගි ගෙය අමුසොහොනක් සේ කරණ පිළිකුලට නිදන වැ සිටියේ ය. නො ගත හැක්කැ. නො දිය හැක්කැ. නො සිතිය හැක්කැ. එසේ වූ කුණු ශරීරය හා ඒ ශරීරය නිසා පවත්නා සිත මුත් අනික් ආත්මයෙක් නැත. මේ චිත්තයත් මේ

Non-Commercial Distribution

ශරීරයත් ඇති වැ නැති වන හෙයින් අනිත්‍ය යැ. නොයෙක් දුකට පිහිට හෙයින් දුඃඛ යැ. තමා කැමැති සේ නො පවත්නා හෙයින් අනාත්ම යැ"යි තමන් නුවණින් පිරිසිඳ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 43.

තවද, කොපුයෙකින් කඩුවක් හයා ගන්නා සේ, රත්පලස් පයයෙකින් මුත්හරක් හයා ගන්නා සේ, තමන්ගේ ශ්‍රීශරීරයෙන් අනික් ශ්‍රීශරීරයක් මවා, ඒ ශ්‍රීශරීරයෙහි දෙතිස්මහාපුරුෂලක්‍ෂණ අශීත්‍යනුබ්‍යඤ්ජන-කෙතුමාලාබ්‍යාමප්‍රභා දක්වා, තමන් හා තමන් මැවූ බුදුරුව හා මේ දෙරුවින් බැලුබැලූවන්ට විස්මය එළවා ඒ විස්මයට පහන් වූ සියලු සතුන් අමාමහනිවන්හි ලන්නා වූ සෘද්ධි ඇති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 44.

තුමූ හුදකළා වැ සිටැ තමන් සේ බුදුරු දහස්ගණන් මවා මුළුලෝ සද පහද බොහෝ කොට පැණී යන්නා වූ, නැවත ඒ රූ හැම අන්තර්ධාන කොට හුදකළා බුදුරුව පෑ ලොවට විස්මය එළවන්නා වූ, එක් විටෙකැ ක්‍ෂණයෙහි වඩාපු[1] පහනක් සේ අන්තර්ධාන වැ යන්නා වූ, නැවැත එක්විටෙකැ වලායටින් නික්මෙන පූර්ණචන්‍ද්‍රමණ්ඩලය සේ පැණී යන්නා වූ; 'එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් මහමෙරින් ඈතට යෙමි'යි සිතුවේලෙහි මකුළුහුයෙක්හි නො පැකිලැ යන මතැතක්හු සේ ඈත පැණී යන, සිස්අහස්හි දු පොළොවෙහි සක්මන් කරන්නා සේ සක්මන් කට හෙන, මහපොළොවෙහි දු පොකුණෙක්හි කිමිදිනා සේ කිමිදැ යා හෙන, මහමුහුදුදියෙහි දු ඉදුනිල්මිණිඅතලෙක්හි සක්මන් කරන්නා සේ සක්මන් කට හෙන, මකුළුහුයෙකැ යටිපිටි ද උඩුපිට කළුවන් නො වන තෙක් බඹලොව්හි පැණී යන, අහසින් යන සඳහිරු දෙදෙනා ගෙන්වා තමන්නේ ශ්‍රීපාදයට බිසි[2] කරණ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 45.

තවද, එක්තැනෙක්හි වැඩැ හිඳ මුළුසක්වළෙහි කිහිඹි-කුහුඹු-මැඩි-මඩු-ගිරා-මොනර-නා-ගුරුළු-දෙවි-බඹ-යක්-රකුසු ආදීන් බණන නොයෙක් බස්, පරසක්වළැ හිඳ කියතුත්, තමන් වහන්සේගේ ශ්‍රීකර්ණයට දන්වන දෙයක් සේ අසා, වෙන වෙන බස්හි අර්ථ දන්නා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. මු. I & II වඩාපු. 2. කිබිසි-සමහර.

Non-Commercial Distribution

## 46.

තවද, "බලමි"යි සිතුවිටැ අනන්තාපරිමාණ සක්වළ අනන්ත සත්ත්වයන් අතුරෙන් "මේ සත්වතෙමෙ රාගචිත්තයක් ඇති වැ හුන්නේ යැ. මෙතෙමෙ ද්වේෂ චිත්තයක් ඇති වැ හුන්නේ යැ. මෙතෙමෙ මොහචිත්තයක් ඇති වැ හුන්නේ ය. මේ සත්ත්ව තෙමෙ රාග නැති චිත්තයක් ඇත්තේ යැ. මේ සත්ත්වතෙමෙ ද්වෙෂචිත්තයක් නැති වැ හුන්නේ යැ. මේ සත්ත්වතෙමෙ මොහ නැති චිත්තයක් ඇති වැ හුන්නේ යැ. මේ සත්ත්වයාට කාමාවචර චිත්තයෙක් උපන. මොහුට රූපාවචර චිත්තයෙක් උපන. මොහුට අරූපාවචර චිත්තයෙක් උපන. මොහුට ලොකොත්තර චිත්තයෙක් උපන. මේ බුදුසස්නෙහි පහන් වැ හුන්නේ ය. මේ සැදැහැති වැ හුන්නේ යැ. මේ කිහිඹිය සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ කඩිසින්න සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ සකසින්න සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ පණුවා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ කුඩමස්සා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ පක්‍ෂීහු සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ නයි සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ ගුරුළු සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ යක්‍ෂයා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ රාක්‍ෂසයා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ ප්‍රෙතයා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ සිද්ධයා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ විද්‍යාධරයා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ ගාන්ධර්‍වයා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ දෙවතාවා සිතුයේ මෙවෙනි සිතෙකැ. මේ බඹහු සිතුයේ මෙවෙනි සිතෙකැ" යනාදීන් අනන්තාපරිමාණ සත්වයන්ගේ සිත් තමන්ගේ එක සිතින් දන්නා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 47.

"මම මෙයට දෙවනජාතියෙහි මෙනම් වැ උපන්මි. ඒ ජාතියෙහි මෙසේ වූ ස්වභාවයක් ඇත්තෙමි. මෙයට දසවන ජාතියෙහි මෙනම් වැ උපන්මි. ඒ ජාතියෙහි උස් වීමි. මිටි වීමි. කළු වීමි. හෙලලූ වීමි. රජ වීමි. බමුණු වීමි. තිරිසන් වීමි. මෙයට සියක් වන ජාතියෙහි, දහසක් වන ජාතියෙහි, ලක්‍ෂයක් වන ජාතියෙහි, කෝටියක් වන ජාතියෙහි ප්‍රකෝටියක් වන ජාතියෙහි, අසංඛ්‍යයක්[1] වන ජාතියෙහි, මෙයට එක්වැනි කප, දසවන කප, සියක් වන කප, දහසක් වන කප, ලක්‍ෂයක් වන කප, කෝටියක් ප්‍රකෝටියක් වන කප, අසංඛ්‍යයක් වන කප, මෙසේ වූ ජාතියෙක්හි මෙනම් වැ උපන්මි. එහි උස් වීමි. මිටි වීමි. කළු වීමි. හෙලලූ වීමි. රජ වීමි. බමුණු වීමි" යනාදීන් පෙර තමන්ගේ අතීතජාති තාක් මුළුල්ල ඊයේ කළ දෙයක් සේ සිහි කරණ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

1. කොටියක් ප්‍රකොටියක් අසංඛ්‍යයක්

Non-Commercial Distribution

## 48.

විශුද්ධ වූ දිව්‍යචක්‍ෂු සිත් අනන්තාපරිමාණ සක්වළෙහි පවත්නා සතුන් අතුරෙන් "අද මේ ක්‍ෂණයෙහි මෙතෙක් සත්හු උපන්හ. මෙතෙක් සත්හු මළහ.[1] එයින් දෙව්ලොවෙහි උපන්නෝ මෙතෙකැ. දෙවෙනි තුන්වැනි සතරවැනි පස්වැනි සවැනි දෙව්ලොවැ උපන්නෝ මෙතෙකැ. බ්‍රහ්මපාරිෂද්‍යාදි බ්‍රහ්මලෝකයෙහි උපන්නෝ මෙතෙකැ. මිනිස්ලොවැ උපන්නෝ මෙතෙකැ. නරකයෙහි උපන්නෝ මෙතෙකැ. එහි දු සංජීවනරකයෙහි උපන්නෝ මෙතෙකැ. කාලසූත්‍රනරකයෙහි උපන්නෝ මෙතෙකැ. සඞ්ඝාත නරකයෙහි උපන්නෝ මෙතෙකැ. රෞරවනරකයෙහි උපන්නෝ මෙතෙකැ. මහාරෞරවුවනරකයෙහි උපන්නෝ මෙතෙකැ. තාපනරකයෙහි උපන්නෝ මෙතෙකැ. ප්‍රතාපනරකයෙහි උපන්නෝ මෙතෙකැ. අවිචිමහානරකයෙහි උපන්නෝ මෙතෙකැ. අසුචි නරකයෙහි උපන්නෝ මෙතෙකැ. ලොහොකුඹුනරකයෙහි උපන්නෝ මෙතෙකැ. හළුනරකයෙහි උපන්නෝ මෙතෙකැ. ඔසුපත්නරකයෙහි උපන්නෝ මෙතෙකැ. කිහිඹි වැ උපන්නෝ මෙතෙකැ. බලු වැ උපන්නෝ මෙතෙකැ. කවුඩු වැ පැණි වැ නා වැ ගුරුළු වැ ගැඩවුල් වැ උපන්නෝ මෙතෙකැ. උස් වැ උපන්නෝ මෙතෙකැ. මිටි වැ උපන්නෝ මෙතෙකැ. යාපත් වැ උපන්නෝ මෙතෙකැ. නපුරු වැ උපන්නෝ මෙතෙකැ"යි යනාදීන් සියලු සතුන්ගේ චුති හා ඉපදීම් හා දන්නා වූ මහ නුවණැති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 49.

"දුක් නම් මේ පඤ්චස්කන්ධය යැ. එදුකට කාරණ වූයේ පඤ්ච කාමයෙහි කරන්නා වූ තෘෂ්ණාව යැ. එදුකුත් තෘෂ්ණාවත් නැති වන්නේ නිවන් දුටු කල යැ. ඒ නිවණට යන්නේ මේ පිළිවෙති නැ"යි දත සියලු දෙෂයන් කෙරෙන් තමන්ගේ සිත දුරු කොට පිරිසිදු කළා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 50.

සවාසන කෙලෙසුන් නැසූ කල් තබා, බොධිසත්ව අවස්ථාවෙහි අත්පත් සක්විතිරජය හැර අනොමානදීතීරයෙහි මහණ වැ මහබෝමඩෙහි වැඩැ හිඳ බුදු වන දවස් දක්වා මෙ දෙ අතුරෙහි සාවුරුද්දක් මුළුල්ලෙහි කයින් සීලවිපත්තියක් කරන්නා තබා, තුඩින් නොසරුපයක්[2] බණන්නා තබා නො වළකා ගත හැකි සිතින් පොවා "රාහුලකුමාරයන් හැර පියා ආමි'යි 'යසොධරා බිසොවුන් හැර පියා ආමි'යි, 'මට සිනෙහැති, මාගේ චක්‍රවර්ති සම්පත්තිය

---

1. උපන්හ මළහ. 2. නොසරුවක්.

Non-Commercial Distribution

බලන්නට දෙළදෙළා හුත් මපියාණන් සුදෙවුන්මහරජාණන් හැර. පියා ආම්'යි එකවටෙකුදු සිතිනුත් නො සිතා "සිල් රැකැ බුදු වැ මුළුලෝ ගලවම්හ" යන සිතින් දෙවැනි සිතක් නො සිතු බුදුන් සරණ යෙම් යි බුත්සරණ යා යුතු.

## 51.

තව ද, ඇසින් රුවක් දුට, කණින් බසක් ඇසුව, නාසයට සුවඳක් හැමුව, දිවට රසයක් හමු වුව, කයට පහසක් ලදුව,[1] සිතට ධර්මාලම්බනයක් හමු වුව, රජගෙදෙරට නො වැද්ද දෙනු මනා වුන්[2] වළකන්නට සිටුවූ දෙරටුගොව්වක්හු සේ සදෙර සිහිනුවණ එළවා "මේ පඤ්චකාමගුණයෝ අනිත්‍යයහ. දුඃඛයහ. අනාත්මයහ. අසාරයහ. අස්ථිරයහ. ජාතිධර්මයහ. ජරාධර්මයහ. ව්‍යාධිදුකින් මරණදුකින් නො පිටත්හ. මේ පඤ්චකාමගුණයෙහි හී සැබැවින් තබා සිහිනෙනුදු නිවන් දුටු කෙනෙක් නැතැ"යි සිහිනුවණින් යෙදී පඤ්චකාමයෙහි ලොභය හැර බුදු වූ මහතාණන් සරණ යෙම් යී බුත්සරණ යා යුතු.

## 52.

"ශක්‍රයා දුන් දිව්‍යභොජනය"යි වඩා නො වළඳ, "කළ මිඩිය පිළිගැන්වූ කුඩුකැවුමැ"යි අඩු කොට නො වළඳ අහරෙහි පමණ දන අනුභව කරන්නා වූ බුදුන් සරණ යෙම් යි බුත්සරණ යා යුතු.

## 53.

"දැන් අමුතු වැ සාධන නිවණෙක් නැත. අළුතැ සාධා ගත මනා ගුණයෙක් නැත. අළුතැ යටත් කොට ගත මනා දෙවියෙක් බඹෙක් නැත. හැමසත්හු ම අප නම් ඇසූ ඇසූ තෙනැ වැඳ පෙරළෙති. ඇහින් රස් ගියගියතෙනැ සාධුකාර දෙති. මුළු ලොව කුලගැති කොට වැඩ සිටියෙමි. මෙවිට දෙවියන් දුන් දිවඅහර වළඳ යෙහෙන් නිඳ හිඳ දවස් යවමි"යි නො සිතා රෑ දවහල් "කවරක්හු දෙව්ලොවැ ලා නම් දේ හෝ? කවරක්හු බඹ ලොවැ ලා ලම් දේ හෝ? කවරක්හු අමාමහනිවන්හි ලා ලම් දේ හෝ? කවරක්හු නිරුදුකින් ගලවම් දේ හෝ? කවරක්හු තිරිසන්දුකින් ගලවම් දේ හෝ? කවරක්හු ප්‍රෙතදුකින් ගලවම් දේ හෝ? කවරක්හු අසුරකායෙන් ගලවම් දේ හෝ?"යි මිනිස් ලොවින් දෙව්ලොවට, දෙව්ලොවින් බඹලොවට, බඹලොවින් නාලොවට, නාලොවින් ගුරුළුවිමනට, ගුරුළුවිමනින් දඹදිවට, දඹදිවින් ලක්දිවට, ලක්දිවින් දඹදිවට දිවෙමින් සතුන් පිණිස ඇවිද නො විඩා වැ දුක් ගත් බුදුන් සරණ යෙම් යි බුත්සරණ යා යුතු.

---

1. හමුවුව. 2. නො වැද්ද මනවුන්

Non-Commercial Distribution

## 54.

තව ද, සවනේ ගෙවා දත් බුදු වූ කල් තබා, මොනර වැ උපන්[1] කල්හි පොවා "ලොකයෙහි බුදුහු ඇත. දහම් ඇත. කම් ඇත. කම්පල ඇතැයි, සියලු දුක් හා නුමුසු අමාමහ නිවණෙක් ඇතැ"යි දැන, හැදැහිලි කළ මනා තන්හි හැදැහිලි කළ; "මාගේ ජාත්‍යාදියට, මාගේ ආචාරයට, මා 'මුළුලොව ගලවම්'යි සිතන මහත් වූ අදහසට, මා 'පුරම්'යි පටන් ගත් සමතිස් පැරුමට, මා කරන්නට පටන් ගත් පඤ්චමහාපරිත්‍යාගයට ත්‍රිවිධ වූ අපීචයිෂීාවට පවක් කරණබව නුසුදුසු යයි" තමන් තකා ජාතිජාතියෙහි පව් නො කළ; "ඉදින් මම් පවක් කෙළෙම් නම්, පවක් සිතීම් නම්, මා කරණ පව් දිව්‍යැස් ඇත්තෝ බලා සිටිති. මා සිතූ පව්ටුසිත් පරසිත් දන්නෝ දැන ගණිත්. එසේ දැකැ එසේ දැනැ 'මුළුලෝ ගලවා බුදු වම්හ යි පතන තැනැත්තන් කරණ ද බලව'යි මට ගර්හා කෙරෙති" අනුන් තකා ජාති ජාතියෙහි පව් නො කළ; බොධිසත්වභූමියෙහි සිටැ එක්දවසක් එක්සියවිසි-යොදනක් ගොස් සත්හැවිරිදිවයසැ එකරැයින් මැ දෙළොස්දහසක් මන්ත්‍ර ඉගෙණැ ගුරුන් පොවා නො දත් අඩුවැඩිය තුමූ දැනැ ඔවුනුදු උගන්වා නැවත අවුත්, තමන් හා විවාදයට සිටි බමුණන් පරදවන බහුශ්‍රැත වූ; බෝමඩෙහි හුන් තැනට සියලු දෙවියන් බිඳැ ගෙණැ දිවැ ආ මහාවශවර්තිමාරයා නැඟි යෙළසියක් යොදුන් උස ගිරිමෙඛලා නම් මහඇත්හු තමන් මුහුණ දුටුසඳෙහි කෙශරසිංහයකු දුටු කැණහිල්මහල්ලකු සේ ලුහුබඳවාපියන පරාක්‍රම ඇති; කළ කළ දෙයක් සිහි නැති නොවන; එකඅකුරක් බණත්, කපක් දවසුදු මියෙන්[2] නො බැණ හිඳුත්; එකපියවරක් ඔබත්; එකතැනක් බලත්, එකසිතක් සිතත්, හැමතන්හි ලෝවැඩ සලකා කරන්නා වූ නුවණින් සලකා හෙබි කට යුතු කරණ; පළමුවන දෙවන තුන්වන සතරවන ධ්‍යානයන් තමන් වසඟ බවට පැමිණවූ බුදුන් සරණ යෙම් යි බුත්සරණ යා යුතු.

## 55.

තව ද, සුමෙධතාපසකාලයෙහි "ලොකයෙහි හුණක් ඇති කලැ එයට විපරීත වූ සිහිලසයකුදු[3] ඇතිවන්නා සේ,[4] සසරදුකක් ඇතිකල එයට විපරීත වූ නිවණකුදු ඇත මැනැවැ"යි අනුමානයෙන් නිවන් ඇතිබව දැන, සියලු වස්තුව දනමුඛයෙහි හැර හිමාලයට වැද මහණ වැ පඤ්චාභිඥඅෂ්ටසමාපත්ති උපදවා ආකාශයෙන් වඩිමින් දීපඞ්කර

---

1. මු I. II. vI මොනර තිරිසන්. 2. මුයෙන්-ඇතැම්

3. II. IV. & V. ශීතලයකුදු 4. මු. II. II. & ඇතිවුව

Non-Commercial Distribution

සම්‍යක්සම්බුද්ධයන්ට ශුද්ධ කරන්නා වූ මාර්‍ගීය විචාරා දැනැ, මම ද එබඳු වූ ගුණ ඇති මහත්නට 'මා සිය අතින් මෙහෙ කෙරෙමි'යි අහසින් බැස, කඳුරෙහි මෙහෙ කරමින් සිටැ බුදුන් වැඩි කල්හි "සාරලක්‍ෂයක් රහතුන් හා මේ බුදුන්වහන්සේ මා පිටින් වඩනාදැ ව"යි[1] සිතා එබුදුරුවනට දිවි පුද හෙවැ, "අද මම් මා සිතැ කෙලෙසුන් නසා රහත්ව අමාමහනිවන් දක්නට පොහොසත්මි. එතෙකුදු වුව, වැදූදරුවන් ඇඟ මස් ලියා පලහා කා, ඔවුන් ඒ දුකින් හැඩිය දී තමැ සාදුක් නිවුවා සේ, ජාතිජරා ආදි වූ සියලු දුකින් පෙළෙන්නාවූ ලොව එදුකින් හැඩිය දී, සතර අපායෙහි හී මහාවිනාසයට පැමිණිය දී මම හුදකළා වැ නිවන් දිටීම් නම්, මාගේ කරුණාවට සුදුස්සෙක් නො වේ"යි සිතා, "බුදු වැ මුළුලොව ගලවා නිවන් දකිමි"යි සිතූදවස් පටන් ගෙණැ කුසිනාරායමහල්හි වැඩැ හෙවැ පිරිනිවන් පානා දවස් දක්වා මෙදෙඅතුරෙහි සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි සහ ඔටුනුහිස්[2] කපා දන් නො දී, පස්පැ දිස්නා ඇස් උදුරා දන් නො දී, තෙලියත්හි පෙළී ලේ දන් නො දී, සියලඟ ඇට දක්වා ලියා පියා එක්තැනෙකැ මස් ලියා අනික්තැනැ සතුටින් රොමහර්‍ෂ ගන්වමින් මස් දන් නො දී, උරෙයිද දූන් පුතුන් මස් කන රාක්‍ෂසයන්ට නො දී, ගැතිකම් ගන්නා යාචකයන්ට නො දී, දිවි පියා සිල් නො රැක, සහඔටුනුරජය හැරැ මහණ නො වැ, මුයෙන් කිර නො හළ කල්හි මුළුලොව ගැති කරණ නුවණ නැති වැ, ලෙහෙණ වැ 'මුහුද දිය වාලධියෙන් ගත්තා වූ පිනිබිඳක් ඉස්නා සේ ඉස පියමි' යන වීර්‍ය්‍ය නැති වැ, තියුණු වූ පොරොවින් කිළිල්කඩ කපා හරණා සේ අත්පා කපා දමන්නා වූ කලාබුරජහුගේ[3] මුහුණ කිරිසුවඳ වහන අළුතැ නැඟි සුදේසුදුදත්කැකුළු ඇති ළදබොලඳසිනාවෙන් පිරී තුබූ ප්‍රිය පුත්‍රයක්හුගේ මුහුණක් බලන්නා සේ මෛත්‍රියෙන් හා ස්නේහයෙන් බලන්නට සුදුසු වූ ක්‍ෂමා නැති වැ, දිවි පියා ද සබා නො කියා, සියලඟ සුණුවිසුණු වැ යතුදු සෙණ දහස්සුවහස් හිසැ හෙතුදු 'මේ කෙරෙමී' කියා කළ අධිෂ්ඨානයට විරොධයක් කොට[4], තමා ජීවිතය හා සියලු සතුන් ජීවිතය සම කොට බලන මෛත්‍රියක් නැති වැ, සර්‍වාඞ්ගයෙහි ගිනි ගසන්නන් කෙරෙහි දු අමාරස මැඩැ ඕනන් කෙරෙහි දු සමසිත් නො වැ එකපැයකුදු එක විනාඩිකාවකුදු නො යවා, හැමකල්හි මැ සමතිස්පැරුම් පුරමින් පඤ්චමහාපරිත්‍යාග කෙරෙමින් ත්‍රිවිධ අර්‍ථචර්‍ය්‍යා කෙරෙමින් නුවණින් යෙදී පැවැත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. මු. දැනමැයි I & V. දැවනැයි 2. සහ ඔටුනුපලන්හිස්-ඇතැම්
3. පියරජහුගේ-සමහර. 4. නො කොට.

Non-Commercial Distribution

## 56 & 57

යහපත් වූ ගමන් ඇති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

ඔවුන්ගේ ගමන් යහපත් නියා ව කෙසේ ද? යත්:- ඉරුගේ තේජස්, සඳුගේ සෞම්‍යගුණ, මහමුහුදෙහි ගැඹුරුගුණ, අහසින් විසල්ගුණ, පොළොවින් පළල්ගුණ මහමෙරින් උස්ගුණ, විදුලියෙන් දෙව්දුන්නෙන් වෙසතුරු[1] නකත්තරුගණයෙන් නානා ජාතියෙහි සත්රුවනින් නානාජාතියෙහි මලින් විසිතුරු පෑ හැම එකතැන්හි මැඩැ එවැ හනා මිහිරි කොට ලොවට දක්වාලූ රුවක් සේ තමන් සවණක් ඝන බුදුරස් මුළුසක්වළ ඉස්මින් එ රුව දුටු මුළුලෝ සනහමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 58.

මල් පිපුනු පරසතුරුකැ මුලැ එක පැහැර[2] සතුටින් වැගිර ගිය දෙවියන් සේ තමන්ගේ මනහර රූ දුටු සියලු ඇස් ඇතියන් තමන් පාමුල්හි එක පැහැර[2] වගුරුවමින් යුගාන්තවාතයෙන් ඉපිලැ නැඟී සුණුවිසුණු වැ වැගිර ගිය එක්ලක්‍ෂඅට සැටදහසක් යොදුන් රුවන්මෙරෙහි සත්රුවන්සුණුකදක් සේ තමන්ගේ ශරීරයෙහි තලඇටක් පමණ තැනින් නැගි රස්කඳින් අහස්පොළෝ දෙක තවරමින් වඩනා යහපත් ගමන් ඇති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 59.

තව ද, බඳුවදමල් සේ රත් වූ සඳවලා*, දවහත්තරු සේ සුදු වූ සරත්වලා, නිම්ල වූ අහස්හි නිල්පැහැ, රන්වන් වූ උතුරු සයුරෙහි රළවැල එක්තන්හි අඹරා වැළ කවා අහසට නැඟූ තැනක් සේ තමන්ගේ ශ්‍රීශරීරයෙන් නැගි සවනක් ඝන බුදුරසින් සියලුලෝකුස පුරමින් හැසවමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 60.

තව ද, මහමේ වස්නා සැරහුම් හභවා දිවන විදුලිය සෙයින් තමන් වඩනා විලස් හභවා පළමු දිවගත් බුදුරසින් 'දූන් වැඩි දෑ යැ. දූන් වැඩි දෑ යැ'යි සියලු ගම්නියම්ගම්රාජධානි එක හෙළා පෙරමහට දිවවමින් වඩනා විස්මයසහිත ගමන් ඇති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. විසිතුරු-සමහම.
2 . එකපැතිර-ඇතැම්.
* සැන්දවලා.

Non-Commercial Distribution

### 61.

තව ද, නකතින් නකතට නො වරදවා එළඹෙන චන්‍ද්‍රයා සේ නිවන් දක්ක යුත්තවුන් ඇති ඇති තැනට කරුණායෙන් නො වරදවා එළඹෙමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

### 62.

තව ද, හැරපියා නැඟී ගිය තැනැ සතුන් සිතැ ඇති දොම්නස් හා, ගොස් වන්තැනැ සතුන් සිතැ ඇති සොම්නස් හා සම පමණ කෙරෙමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

### 63.

තව ද, "අප පෙර ඇසූ ගුණයට, වැඩිකලැ දුටු මනහර රුවට, සිද්ධ කළ සර්‍වඥතාඥනයට, බොහෝකලක් පුරුදු කළ කරුණාවට, උපන් ශාක්‍යකුලයට, ලද බුද්ධරාජ්‍යයට, පුරුදු කළ අපිස්කමට මැ සුදුසු යැ කොට වදළේ"යි වන්වන් තන්හි සතුන් ලවා සාධුකාර දෙවමින්, ගුණ කියවමින්, සතුටුකඳුළු බහවමින්[1], වැඩිමඟ්හි[2] වැලිපිට පෙරළවමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

### 64.

තව ද, හිරු ලඟ වූ තැන මලායන තරු සේ වැඩි වැඩි තන්හි තමන්ගේ ආනුභාවයෙන් සියලු දෙව්බඹුන් යටත් කෙරෙමින් නිෂ්ප්‍රභ කෙරෙමින් සුළං අනු වැ යන මෙඝයක් සේ කරුණාව අනු වැ යන බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

### 65.

"පෙර වඩනා දුටු† විරුම්හ. එ මැ ආශ්වර්‍ය්‍යයට වැඩියෙක් නැතැ"යි පෙර දුටුවිරුන් ලවා නො සිතවා, අළුතැ දුටුවන්ට මා සන්තොෂ නො උපදවා, පිපාසා ඇති ඇති වූ විට ලද පැනක් සේ හැදිනි නො හැදිනි සියලු සත්ත්වලොකයා එක පැහැර තමන්ට ලොභ කරවමින් වඩනා යහපත් ගමන් ඇති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

### 66.

තමන් ගෙහි වළකා ඈත්ගමන්[3] යන්නට පටන් ගත් මවුන් පසුපස්සෙහි හඬහඬා හුනු බාලදරුවන් සේ "සිටුව"යි වැළකුව ද, හැර පියා සිටියැ නො හී "නැවැත කවර දවසෙකැ දක්මෝ ද? ස්වාමීනි!, නැවැත කවර දවසෙකැ වඩනේ ද? ස්වාමීනි!, නැවැත කවර දවසෙකැ

---

1. බාවමින්-සමහර. 2. මු. වැඩිමහෙහි.
3. ඇග්ගම් ඇගම්. ඇග්ගමන් ඈත්ගම්. ඇග්ගම්. † පෙර දුටු.

Non-Commercial Distribution

මීනියා සිත්සැනහුමක් ලබමෝ ද? ස්වාමීනි!,"යි පසුපස්සෙහි හඬා වගුළ සියලු සත්ත්වලොකයා කලට සුදුසු බසින් එතෙනට සුදුසු අවවාදයෙන් සන්හිඳුවසන්හිඳුවා[1] වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**67.**

දියෙන් නස්නා කපැ වැසි වට වට සේ වඩවඩා පිරෙණ සක්වළකුසක් සෙයින්, වැඩි වැඩි තන්හි සියලු සත්වයන් වඩ වඩා කරණ පූජා ලැබෙමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**68.**

"නුඹගේ මනහර රූ දුටු හෙයින් ඇස් ලද්දමෝ නම් අපි මැ යැ. නුඹගේ කන්කලු බස් ඇසූ හෙයින් කන් ලද්දමෝ නම් අපි මැ යැ. නුඹගේ ගුණයෙහි මිහිරි විඳිනා හෙයින් සිත් ලද්දමෝ නම් අපි මැ ය. දිවි පමණින් ගැත්තම්හ. මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා නුඹ සරණ යම්හ" යන බස මුත් "කුමකට ආදෑ ද? කුමකට වැඩිදෑ ද?" යන නො දත්වණක් නැති වැ දුටුදුටුවන් ඇසූඇසූවන් බිණුබිණුවන් ගැති කෙරෙමින් සිනෙහැති කෙරෙමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**69.**

සඳ නැඟි අහසක් සේ වන්වන්තැන හොබවමින්, ඇස් උදුරාපු මුහුණක් සේ හැරැපියා ගියතැන් අශ්‍රීක කෙරෙමින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**70.**

මතැතක්හු පස්සෙහි හුනු කෙළිලොලුන් සෙයින් තමන් පස්සෙහි හුනු සිත්සැනහුම් කැමැතියන් සිත් නිවමින් සනහමින්; වෘෂභරාජයා පස්සෙහි ගමන් ගත් ගෝකුලයක් සෙයින් තමන්ගේ ශ්‍රීපාදය බලබලා තමන් පස්සෙහි ගමන් ගත් මහණ බමුණුපිරිවරින් වඩනා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**71.**

තව ද, කොදිව් - මහදිව් - මේරු - යුගන්ධර - සක්වළගල් - මහ පොළෝ මුලිනිපිරී කෙළසුවහසක් සක්වළ එක පැහැර බමන කප් කෙළවරක් සෙයින් පසුපස්සෙහි හුනු දිව්‍ය බ්‍රහ්ම-නාග සුපර්ණ

1. සත් හිඳුව හිඳුවා.

Non-Commercial Distribution

ශ්‍රමණ - බ්‍රාහ්මණ - භික්ෂු - භික්ෂුණී - උපාසක - උපාසිකාදීන් විසින් හා 'අවසරයක් ලද තන්හි දන් දෙම්හ'යි බඩු පුරා ගෙණැ යන සියදහස් ගණන් ගැල්සක්හඬින් හා, පිඬිනා සක්හඬින් හා, ශරණා ගතවජ්‍රපඤ්ජර - පරදුඃඛදුඃඛිත - කරුණානිධාන - ත්‍රිභුවනචූඩාමණි - ධර්මගඞ්ගාප්‍රවාහ - ධර්මාභරණාලංකෘත - සර්වඥ - ශාක්‍ය ශිරෝමාණික්‍ය - යනාදි විරිදූ පිඹැ යන කාහලශබ්දයෙන් හා, දෙවිමිනිසුන් ගසන මහිඟුබෙරහඬින් හා, වැඳ වැඳ පසු බැසැ බැසැ දෙඅත් මුදුනෙහි තබතබා තමන් රුව බලබලා සැනහි සැනහී යන මහබඹපිරිවරින් හා, පරසතුමල් දමමින් මදරා මල් ඉසිමින් තල්වැටවාමර සලමින් සතුටු වැ දිවසළු හිස සිසාරමින් පුද පිණිස නෘත්‍යගීතවාද්‍ය පවත්වමින් එක්පසෙක්හි නික්මැ ගත් අනන්තාපර්‍යන්තදිව්‍යපරිවාරයෙන් හා, පෙණ දහස් සුවහස් මවා කර බැදි කණ්ඨමාණික්‍යයෙහි ආලොකයෙන් මුළු ලොව එකාලොක කෙරෙමින් පෙරමහෙහි කඩුපුල්මල් වන වනා පෙණපතර බිමැ ඔබඔබා වදිමින් පසුබස්නා අනේසුවහස් ගණන් දිව්‍යනාගපරිවාරයෙන් හා, පඤ්චවර්ණ පියා විදහා ඒ රුවෙහි කළ ලොභයෙන් හැර පියා යා නො හී ඇසි පිය නො සොල්වා බලබලා පසුපස්සෙහි ගමන් ගත් යෙළසියයක් යොදුන් ගරුඩරාජයන් සියදහස්ගණනින් අහස්කුස වසමින්, එබූ එබූ පය පිළිගන්නා පිණිස මහපොළොව බිඳ නැඟි මහගැල් සක් සා පියුම් මඩුත් මැ පැනැ නැඟි රෙහෙණුකදින් අකනිටාබඹලොව දක්වා සියලු සක්වළ සුවඳ ගන්වම්; ශ්‍රී පාදය දික් කළවිටැ මැ මහමෙර සේ වූ උස්තැන් එබී වළතැන් පිරී බිම සම කෙරෙමින්; එබූඑබූ පයට පූජා පිණිස මහපොළොව පළා පැන නැඟි සත්රුවනින් වඩනා මහ කළුවර තරුකැල පිපි අහස්කුසයක් සේ විසිතුරු කෙරෙමින්; ඩැහැ ගත් තණ මුයෙන් වැගිරෙණබව නො දනැ කර බිඳ ගෙණැ ඇඟ නමා ගෙණැ ඇස් මරා ගෙණැ මිනිසුන් බව නො දනැ පසුපස්සෙහි යන වල්මුවකැල සියදහස්ගණන් විසින්; රන්වන්බුදුරස් දැකැ සතුටින් මිහිරිහඬ හඬා ආදරයෙන් ගල්උඩින් ගස්උඩින් බිමට බැසැ පසුපස්සෙහි යන ගිරා-මොනර-සැළලිහිණි-සක්වා-රජ හස් ආදි පක්ෂීන් සියදහස්ගණන් විසින්; වැඩිවැඩිතන්හි මුලැ සිටැ අග දක්වා පිපී ගිය ගසින් මල් ගෙනැ අවුත් අහස්හි වියන් කොට බඳනා සැදැ ඇති උපාසකයන් බඳු ඇඟට සුව දෙන පවනින්; "අද සෙමෙන් වඩිති. අද වෙළෙයි වඩිති" යන වෙනසක් නැති වැ ධර්මිෂ්ඨ රජදරුවන් දවසැ සම වැ පවත්නා සඳමඩලක් සේ බුදු වූ දවස් පටන් ගෙණැ පිරිනිවන් පානා දවස් දක්වා අතුරෙහි පන්සාළිස් හවුරුද්දෙහි එපයින් එපය දෙඅතුරෙහි

Non-Commercial Distribution

කේලොමක්[1] සා ද වැඩිඅඩුවක් නො කොට වඩනා මනහර ගමන් ඇති; වැඩැ හිඳ වේව යි, වැඩැ සිටැ වේව යි, වැඩැ හෙවැ වේව යි, "යෙමි"යි සිතා නඟනවිටැ කවරදවසකුත් නො වරදවා දකුණු ශ්‍රීපාදය මැ දික් කෙරෙමින්, දණින් දණ නො ගටා, කලවා පසු නො බස්වා, නො දඩි කොට, ඇතින් ඇතට නො කෙළවා, නැවෙක්හි තබාලූ රන්පිළිමයක් සේ පෙකෙණියෙන් මත්තෙහි ශ්‍රීශරීරය නො සොල්වා, දෙඅත නො දමා, ශ්‍රීශරීරයෙහි ඩහ නො සොල්වා, උඩ නො බලා, ඉතා කර බහා බිම නො බලා ශ්‍රීමුඛය නමා ඇත් මැත් නො බලා, බුදු වැ වජ්‍රාසනයෙන් බැසැ පොළොව බැලූ දවස් පටන් ගෙණැ කුසිනාරායමහලැ පිරිනිවන් පානට වැඩැ හෝනා සල්ගස් දෙක බලන තැන් දක්වා දෙඅතුරෙහි නවවියතක් පමණින් අඩුයෙකැ වැඩියෙකැ ඇස නො හෙළා, මුළුලොව සනහමින්; සැදැහැතියන් වියරු හෙළවමින්; තීර්ථිකයන් මන් බිඳිමින්; වඩනා රූ දක වොටුනු හා එක් කොට හිසකේ කපා රජය හැර මහණ වැ පසුපස්සෙහි එන රාජකුමාර පරිවාරයෙන් හා; අසූකෙළක් පමණ ධන හැරපියා මහණ වන බමුණුපිරිවරින් හා, මහානිධාන හැර මහණ වන වෙළෙඳපිරිවරින් හා, නොයෙක්සුව හැර මහණ වන ශුද්‍රපිරිවරින් හා; අනූ දහසක් හංසයන් පිරිවරා චිත්‍රකූටපර්වතයෙන් නික්මුනු රන්වන් ධෘතරාෂ්ට්‍රහංසරජයාගේ විලාසය තමන් නියකන්නක් නො වටනා කොට, අටදහසක් මතැත්පොවුමැද නිකුත් සර්වාඞගයෙන් සුදු වූ සදත්මතැත්හු බැලුබැලූවන් ඇසට නො මිහිරි කෙරෙමින්; තරුගණමැද දිලියෙන පූර්ණචන්ද්‍රයා තමන්ගේ ශ්‍රීපාදය පිස්නා බිස්සක් ද නො වටනා කෙරෙමින්; සුවාසූ දහසක් මැණික් මැද තුබූ චක්‍රවර්තිමාණික්‍යරත්නය, නොයෙක් දහස් සක් පිරිවර මැද ගමන් ගත් දකුණුසකය යනාදි සියලු මධුරවස්තූන්ගේ මිහිරි තාක් තමන් ශ්‍රීයෙන් පරදවමින්, බැලුබැලූවන් ඇසැ අමා ඕමින්; සිතුසිතුවන් සිතැ අමාමහනිවන් ඕමින් වඩනා මිහිරි ගමන් ඇති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 72.

තව ද, බුදු වැ ධම්සක්පවතුන්සුතන් දෙසමින් "ද්වෙමෙ, භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා" යනාදීන් නඟා ගත් බසෙහි පටන් ගෙණැ පිරිනිවන් පානට හෙවැ "අප්පමාදෙන සම්පාදෙථ" යන්නෙන් නිමවා වදළ බස් දක්වා මෙදතුරෙහි එක අකුරකුදු ව්‍යර්ථ කොට නො වදරා, හැම ආදිකල්‍යාණ කොට, හැම මධ්‍යකල්‍යාණ කොට, හැම පර්‍ය්‍යවසානකල්‍යාණ කොට, හැම නිවන්රසයෙන් මිහිරි කොට, හැම

1. කෙහෙළුමක්.

Non-Commercial Distribution

සත්ත්වයන්ට වැඩ සාධන පරිද්දෙන්, කී කීවා කළකළවුන් සියලු දුකින් මිදී අමා මහනිවන් වදනා පරිද්දෙන්, ප්‍රෙතයන් කණැ හුන, උන් දෙවතා වන පරිද්දෙන්, මඩුවන් කණැ හුන, ඔවුන් ඒ ශරීරයන් හැර දිව්‍ය ශරීරයෙන් සිටැ ඒ මැ මුල් කොට තිවන් දක්නා පරිද්දෙන් මතැතුන් කණැ හුන, ඔවුන් සිටි සේ සිටැ පිය නො හී දළ බිමැ ඇනැ, ශ්‍රීපාදයෙහි රත්පැහැයෙන් තමන්ගේ මුහුණ සින්දූර ගල්වාලූවා සේ රත් කෙරෙමින් වැඳ නැඟී යන පරිද්දෙන්, මිහිරිබස් බණන සේ දන්නා; සියලූ බුදුන් වන්, සියලු දුක් නො වන්, අමාමහනිවන් පසක් කළ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 73.

තව ද, "එකො ලොකොඃ සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා. ද්වෙලොකාඃ නාමං ච රූපං ච. තයො ලොකාඃ තිස්සො වෙදනා. චත්තාරො ලොකා චත්තාරො ආහාරා. පඤ්ච ලොකාඃ පඤ්චූ පාදනක්ඛන්ධා. ඡලොකාඃ ඡ අජ්ඣත්තිකානි ආයතනානි. සත්ත ලොකාඃ සත්ත විඤ්ඤාණට්ඨිතියො. අට්ඨ ලොකාඃ අට්ඨ ලොක ධම්මා. නව ලොකාඃ නව සත්තාවාසා. දස ලොකාඃ දසායතනානි. ද්වාදස ලොකාඃ ද්වාදසායතනානි. අට්ඨාරස ලොකාඃ අට්ඨාරස ධාතුයො" යි තමන් සේ වූ බුදුකෙනෙකුන් මුත් අනික් කෙනකුන්ට නො හැහෙන සංස්කාරලොකය දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 74.

තව ද, සියලු සතුන්ගේ ආශය - අනුශය - චරිතා'ධිමුක්ති ආදි වූ ගුණ තමන් සිත්හි ස්වරූපයක් සේ දන්නා හෙයින් සත්ත්වලොකය දන්නා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 75.

තව ද, "එක්සක්වළෙක් අයමින් විතරින් දෙළොස්ලක්‍ෂ තුන් දහස් සාර[1] සියපණස් යොදනෙක. ඒ මැ සක්වළ වටින් සතිස් ලක්‍ෂ දසදහස් තුන්සියපණස් යොදනෙකැ"යි කියා තමන්ගේ නුවණ නැමැති තරාදියෙහි ලා කිරා දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 76.

තව ද, "එක් සක්වළෙකැ මහපස්පොළොව දෙලක්‍ෂසතළිස් දහසක් යොදුන් පමණ බොල ඇත්තේ යැ. ඒ පස්පොළොව රැඳවූ දියපොළොව සතරලක්‍ෂඅසූදහසක් යොදුන් පමණ බොල ඇත්තේ යැ. ඒ දියපොළොව

1. තුන්.

Non-Commercial Distribution

දැරූ වාපොළොව නවලක්‍ෂසැට දහසක් යොදුන් පමණ බොල ඇත්තේ යැ"යි තමන්ගේ නුවණින් යටුවම් කොට පිරිසිඳ දත් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 77.

තව ද, "මෙසේ සිටි මේ ලොවැ මහමෙර සුවාසූදහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලී සිටියේ යැ. සුවාසූදහසක් පමණ යොදුන් නැඟී සිටියේ යැ. අයම්තිදු සුවාසූදහසක් යොදුන් පමණ යැ. විතරිනුදු සුවාසූදහසක් යොදුන් පමණ යැ. ඒ මහ මෙර පූර්වදිග්භාගය රිදීමය යැ. එසේ හෙයින් ඒ මුහුණෙහි පෑ පතළ ඒ දිගැ මුහුදු දිය විරිවාපි රිදී සේ සුදු යැ. එ මැ මේරුව දකුණු මුහුණ ඉන්‍ද්‍රනීලමණිමය ය. එහෙයින් ඒ දිගැ මුහුදු දිය නිල්පැහැ වෙයි. එ මැ මහමෙර පශ්චිමදිශාව පබළුමය යැ. එහෙයින් ඒ දිගැ මුහුදු දිය පබළුයෙහි පෑ සේ රතැ. එම මෙරගල උතුරුදිගැ මුහුණ රන්මය යැ. එහෙයින් එදිගැ මුහුදු දිය රන්වන් පැහැ යැ"යි කියා මෙසේ අනුන්ගේ උපදෙශයක් නැති වැ තමන්ගේ බුද්ධීන් මැ පිරිසිඳ දත් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 78.

තව ද, "යුගන්‍ධරපර්වතය තෙමේ සුවාසූදහසක් යොදුන් පමණ උස ඇත්තේ යැ. ඉන් දෙසාළිස් දහසක් යොදුන් පමණ ගැලී සිටියේ ය. දෙසාළිස්දහසක් යොදුන් නැඟී සිටියේ යැ. ඊශධර පර්වතය තෙමේ දෙසාළිස්දහසක් යොදුන් පමණ උස ඇත්තේ යැ. ඉන් එක්විසිදහසක් යොදුන් පමණ ගැලී සිටියේ යැ. එක්විසි දහසක් යොදුන් පමණ නැඟී සිටියේ යැ. කරවීකපර්වතය එක්විසිදහසක් යොදුන් පමණ උස ඇත්තේ යැ. ඉන් දසදහස් පන්සියක් යොදුන් පමණ ගැලී සිටියේ යැ. දසදහස් පන්සියයක් යොදුන් පමණ නැඟී සිටියේ යැ. සුදර්‍ශනපර්වතය දසදහස් පන්සියක් යොදුන් පමණ උස ඇත්තේ යැ. ඉන් පන්දහස්දෙසිය පණස් යොදුන් පමණ ගැලී සිටියේ යැ. පන්දහස්දෙසියපණස් යොදුන් පමණ නැඟී සිටියේ යැ. නෙමින්‍ධරපර්වතය පන්දහස් දෙසියපණස් යොදුන් පමණ උස ඇත්තේ යැ. ඉන් දෙදහස් සසිය පස්විසි යොදුන් පමණ ගැලී සිටියේ යැ. දෙදහස්සසිය පස්විසි යොදුන් පමණ නැඟී සිටියේ යැ. විනතකපර්වතය දෙදහස් සසිය පස්විසි යොදුනක් පමණ උස ඇත්තේ යැ. ඉන් එක්දහස් තුන්සියදෙළොස් යොදුන් දෙගවු පමණ ගැලී සිටියේ යැ. එක්දහස් තුන්සියදෙළොස් යොදුන් දෙගවු පමණ නැඟී සිටියේ යැ. අශ්වකර්ණපර්වතය එක්දහස්තුන්සියදෙළොස් යොදුන් දෙගවු පමණ උස ඇත්තේ යැ. ඉන් සසියපණස් යොදුන් ගව්වක් පමණ ගැලී

Non-Commercial Distribution

සිටියේ යැ. සසියපණස් යොදුන් ගව්වක් පමණ නැඟී සිටියේ යැ" යි කියා තමන්ගේ ඥනයෙන් පිරිසිඳ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 79.

තව ද, සුමෙරු යැ, යුගන්ධර යැ යනාදි වූ පර්වතයන් අතුරෙහි මුහුද සිදන්නසාගර නම් වෙයි. එහි පැන් මොනරපිලක් පවා ලුව හොත් ගැලී යන පමණ සියුම්බව ඇත්තේ යැ. එහි සුනෙරුපර්වතයෙහි සිටැ යුගන්ධරපර්වතය අතුරෙහි සිදන්න සාගරය සුවාසූදහසක් යොදුන් පමණ පළල ඇත්තේ යැ, යුගන්ධරපර්වතයෙහි සිටැ ඊශධරපර්වතය අතුරෙහි මුහුද දෙසාළිස්දහසක් යොදුන් පමණ පළල ඇත්තේ යැ. ඊශධරපර්වතයෙහි සිටැ කරවීකපර්වතය අතුරෙහි මුහුද එක්විසිදහසක් යොදුන් පමණ පළල ඇත්තේ යැ. කරවීකපර්වතයෙහි සිටැ සුදශීනපර්වතය අතුරෙහි මුහුද දස දහස්පන්සියක් යොදුන් පමණ පළල ඇත්තේ යැ. සුදශීන-පර්වතයෙහි සිට නෙමින්ධරපර්වතය අතුරෙහි මුහුද පන්දහස්දෙසියපණස්-යොදුන් පමණ පළල ඇත්තේ යැ. නෙමින්ධරපර්වතයෙහි සිටැ විනතක-පර්වතය අතුරෙහි මුහුද දෙදහස්සියපස්විසියොදුන් පමණ පළල ඇත්තේ යැ. විනතකපර්වතයෙහි සිට අශ්වකර්ණපර්වතය අතුරෙහි මුහුද එක්දහස්තුන්සියදෙළොස්යොදුන් දෙගව්වක් පමණ පළල ඇත්තේ යැ. මෙහි සුනෙරුව පිරිවරා සුගන්ධරපර්වතය සිටියේ ය. සුගන්ධරපර්වතය පිරිවරා ඊශධරපර්වතය සිටියේ යැ. ඊශධරපර්වතය පිරිවරා කරවීකපර්වතය සිටියේ යැ. කරවීකපර්වතය පිරිවරා සුදශීනපර්වතය සිටියේ යැ. සුදශීනපර්වතය පිරිවරා නෙමින්ධරපර්වතය සිටියේ යැ. නෙමින්ධරපර්වතය පිරිවරා විනතකපර්වතය සිටියේ යැ. විනතක පර්වතය පිරිවරා අශ්වකර්ණපර්වතය සිටියේ යැ"යි ගුරුකෙනකුන් අතින් අසා නො දැනැ, ශාස්ත්‍රයක් බලා නො දැනැ, තමන්ගේ ස්වයම්භූඥනයෙන් දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 80.

තව ද, "හිමාලයපර්වතය පන්සියක් යොදුන් පමණ උස ඇත්තේ යැ. අයමින් විතරින් තුන්දහසක් යොදුන් පමණ ඇත්තේ යැ. වට නවදහසක් යොදුන් පමණ ඇත්තේ යැ. මේ හිමාලයපර්වතය නම් සිසාරා වැහෙන්නා වූ පන්සියක් ගඞ්ගාවෙන් හෙබවී සිටියේ යැ. මෙහි අනවතප්තවිල දිගින් ද පළලින් ද ගැඹුරින් ද පණස්පණස්යොදුන් පමණ ඇත්තේ යැ. මෙසේ මැ කර්ණමුණ්ඩ නම් විල ද, රථකාර නම් විල ද, ෂද්දන්ත නම් විල ද, කුණාල නම් විල ද, මන්‍දකිනී නම් විල ද, සිංහප්‍රපාත නම් විලදැයි යන මේ විල් සය ද පණස්පණස්යොදුන් දිග පළල යැ. එපමණ ගැඹුර

Non-Commercial Distribution

ඇත්තේ යැ. මොවුන් අතුරෙහි අනවතප්ත නම් විල තෙම සුදර්ශනකූටය, චිත්‍රකූටය, කාලකූටය, ගන්ධමාදනකූටය, කෛලාසකූටය යන මේ පර්වත පසින් පිරිවරණ ලද්දේ යැ. එහි සුදර්ශනකූටය, ස්වර්ණමය යැ. දෙසියක් යොදුන් පමණ උස ඇත්තේ යැ. ඇතුළට නැමී සිටියේ කවුඩුතුඩක් වැනි සටහන් ඇත්තේ යැ. ඒ විල වසා සිටියේ යැ. චිත්‍රකූටපර්වතය සර්වරත්නම යැ. කාලකූටපර්වතය තෙමෙ අඳුන්වන්පැහැ ඇත්තේ යැ. ගන්ධමාදනපර්වතය තෙමෙ පස් ආදියෙන් මිශ්‍ර වැ තිබෙන්නේ යැ. ඇතුළතින් මුංවන්පැහැ ඇත්තේ ය, කළුවැල් ආදි මූලගන්ධය, සඳුන් ආදී සාරගන්ධය, සරල ගස්[†] ආදි හරනැතිතෙනැ සුවඳ ය, ලමහආදි සුඹුළුසුවඳ ය, ගිවුළු ආදි වූ පොත්තෙහි සුවඳ ය, සදෙලමලආදි සුවඳ ය, තමලුආදි පත්‍රගන්ධ ය, නාමල්කෙසුරු ආදි මල්සුවඳ ය, ජාතිඵලආදි වූ ඵලගන්ධ ය, හැමපරිද්දෙන් සුවඳ ඇතිහෙයින් ගන්ධගන්ධය යි යන දශවිධගන්ධයෙන් බොහෝ කොට ගැවසී ගත්තේ යැ. නොයෙක් විහාගඖෂධයෙන් ගැවසී ගත්තේ ය. ගුණුපොහෝ දවස්හි දිලියෙන අඟුරුරැසක් සේ සිටින්නේ යැ.

එහි මැ නන්‍දමූලක නම් පර්වතයෙහි පසේබුදුන්වහන්සේ වරුන්දැ වසන තැන රන්ගුහායැ, මැණික්ගුහා යැ, රිදීගුහා යැ යි තුන්ගුහායෙක් ඇත. ඔවුන් අතුරෙහි මැණික්ලෙන දෙර යොදනක් උස යොදනක් පළල මඤ්ජුසක නම් ගසෙක් ඇත. ඒ වෘක්ෂයෙහි[1] දියෙහි ගොඩෙහි පුප්නා හැමමල් මැ පිපෙන්නේ යැ. එහි විශෙෂයෙන් හැම පසේබුදුන්වහන්සේ වඩනා දවස් මැ, සිසාරා සර්වරත්නමය වූ මළුවෙක් වෙයි, එහි හමදනා වාතයෙක් කසළ හැමද දමයි. එක්වාතයෙක් සත්රුවන්වැලි තනයි. දිය ඉස්නා එක්පවනෙක් අනවතප්ත විලින් දිය ගෙණවුත් ඉස්නේ ය. සුවඳ කරණ එක්පවනෙක් සියලු සුවඳරුකින් සුවඳ ගෙනෙන්නේය. මල් බිඳිනා එක්පවනෙක් මල් කඩා වගුරුවයි. අතුරන්නා වූ එක් පවනෙක් හැමතන්හි මැ මල් අතුරයි.[2] එහි හැමවේලෙහි මැ ආසන පණවා තිබේ මැ යැ. එහි පසේබුදු වූ දවස් ද පොහෝ කරණ දවස් ද පසේබුදුන් වහන්සේ එයට වැඩැ පණවනලද ආසනයෙහි වැඩැ හිදිනාසේකැ. උන්වහන්සේ වැඩැහුන් ඉක්බිති සෙසු පසේබුදුන්වහන්සේවරුන්ද ද අවුත් පණවන ලද ආසනයෙහි වැඩැ හිඳ එක්තරා සමාපත්තියකට සමවැද සමාපත්තීන් නැඟෙන සෙයෙකැ. ඉක්බිති හැමදෙනාවහන්සේට පළමු පසේබුදු වූ වහන්සේ, අළුතැ පසේබුදු වැ වැඩි වහන්සේහැමදෙනාවහන්සේට අනුමොදනා පිණිස "තෙපි කෙසේ පසේබුදු වූ ද?"යි කමටහන් විචාරණ සේකැ. එවේලෙහි පසේබුදුන් වහන්සේ තමන්වහන්සේගේ උදනබ්‍යාකරණගාථා වදරණ

---

† ගන්ධ. 1. වෘක්ෂයතෙම-හැම 2. අතුරෙහි-බොහෝ

Non-Commercial Distribution

සෙයෙකැ. මෙසේ මේ ගන්ධමාදනකූටය තෙම පසේබුදුන් වහන්සේවරුන්දට වසන තැන වෙයි.

කෛලාසකූටය රජතම යැ. චිත්‍රකූටාදි සියලු පර්වතයෝ මැ සුදර්ශනපර්වතය හා සම වූ උස හා සටහන් හා ඇත්තාහ. චිත්‍ර කූටාදිපර්වතයෝ හැමදෙන මැ අනවතප්තවිල සිසාරා වසා සිටි යාහ. මේ හැම පර්වතයෝ මැ පළලින් පණස් පණස් යොදුන් ඇත්තාහ. උසින් දෙසියක් යොදුන් පමණ ඇත්තාහ. ඒ පර්වතයෝ දේවතාවන්ගේ හා නාගයන්ගේ ආනුභාවයෙන් වැසි වස්වති. ගඞ්ගාවෝ එයට මැ වදිති. ඒ සියලු ජලය අනවතප්තවිලට වදනේ යැ. හිරසඳ දෙදෙන දකුණුදිගින් උතුරුදිගින් යන්නාහු පර්වත අතුරෙන් ඒ විලට ආලෝක කෙරෙති. ඉඳුරා මුදුනෙන් යන සමයෙහි ආලෝක නො පතුරුවති. එහෙයින් "අනවතප්තය" යි නම් වී. එහි රත්නමය වූ මනොඥ වූ පියගැට පඞ්ක්ති ඇති මස්කැස්බන් නැති දවාණා සේ නිර්මල වූ ජල ඇති නහනතොට ඇති. ඕහු ද ඒ අනුභව කරන්නා වූ ජනයාගේ සාධාරණ වූ කුශලකර්මයෙන් මනා කොට මවනලදහ. එහි පසේ බුදුන්වහන්සේ ද රහතුන්වහන්සේ ද නහනසේකැ. ඍද්ධිමත් වූ ඍෂිවරයෝ ද නහති. එහි දේවතාවෝ ද යක්ෂාදීහු ද උයන් කෙළි කෙළනාහ.

ඒ අනවතප්තවිලෙහි සතරදිගැ සිංහමුඛය, හස්තිමුඛය, අශ්වමුඛය, වෘෂභමුඛය යි සතරමුඛයෙක් වෙයි. ඒ සතර මුඛයෙන් සතර මහාගඞ්ගාවෝ පවත්නාහ. සිංහමුඛයෙන් හුනුවා වූ ගංතෙර සිංහයෝ බොහෝ වන්නාහ. හස්තිමුඛයෙන් හුනු ගං තෙර ඇත්තු බොහෝ වෙති. අශ්වමුඛයෙන් හුනු ගංතෙර අශ්වයෝ බොහෝ වෙති. වෘෂභමුඛයෙන් හුනු ගංතෙර වෘෂභයෝ බොහෝ වෙති. තව ද, පූර්වදිගින් නික්මුනු ගඟ අනෝතත්තවිල තුන්විටෙකැ පැදකුණු කොට අනික් තුන්මුඛයෙන් නික්මුනා වූ ගඟට නො වැද නැඟෙනහිරිදිගින් සමුද්‍රයට වන. බස්නාහිරින් හා උතුරුදිගින් හා නික්මුනු ගඞ්ගාවෝද විල තුන් තුන් විට පැදකුණු කොට සෙසු ගඟට නො වැද බස්නාහිරින් ද උතුරු දිගින් ද මුහුදට මැ වදිති.

දකුණුදිගින් නික්මුනු ගඟ විල තුන්විටෙකැ පැදකුණු කොට සෙසු ගඟට නො වැද දකුණුදිගින් ඉඳුරා† ගලතල පිටින් සැටයොදුනක් ගොස් සරස සිටි පර්වතය පැහැර නැඟී වටින් තුන්ගව්වක් පමණ ජලධාරාවක් වැ ආකාශයෙන් සැටයොදනක් පමණ තැන් ගොස් තියග්ගල නම් අතලගල හින. ඒ අතලගල ජලධාරාවෙහි වෙගයෙන්

† ඉදිවුරා.

Non-Commercial Distribution

බිඳුනේ පණස්යොදුන් පමණ තියග්ගලා නම් පොකුණෙක් වි යැ. ඒ පොකුණ් මියර බිඳ ගෙණැ අතලගලට වැද සැටයොදනක් ගොස් නැවැත ඝනපොළොව බිඳ ගෙනැ උමඟින් සැටයොදනක් ගොස් අවුරා සිටි විඣ්‍ය නම් පර්වතයෙහි ගැසී හස්තතලයෙහි ඇඟිලිපස මෙන් ධාරා පසක් වැ පවත්ති. ඒ ගඞ්ගා තුන්වටක් විල පැදකුණු කොට ගිය තැන් ආවට්ට ගඞ්ගා නම් වී යැ. ඉඳුරා[1] සැටයොදනක් අතලගලපිටින් ගිය තැන කාලගඞ්ගා නම් වෙයි. සැටයොදනක් ආකාශයෙන් ගිය තැන ආකාශගඞ්ගා නම් වෙයි. තියග්ගල නම් අතලගල පණස් යොදුනක් පමණ දිය සිටි තැන තියග්ගල නම් පොකුණෙක් වී යැ. ඒ පොකුණ මියර බිඳ ගෙණැ අතලගලට වැද සැටයොදනක් ගිය තැනැ බහලගඞ්ගා නම් වෙයි. උමගින් සැටයොදනක් ගියතැන උම්මග්ගගඞ්ගා නම් වෙයි. විඣ්‍ය නම් සරස සිටි පර්වතය පැහැරැ ධාරා පසක් වැ පැවැති තැනැ ගඞ්ගා යැ යමුනා ය, අචිරවති යැ, සරබූ යැ, මහී යැ යන පස්නමක් ලදු. මෙසේ මේ ගඞ්ගාවෝ පස්දෙන හිමාලයපර්වතයෙන් පවත්නාහ.

ඡද්දන්ත නම් විල මැද දෙළොස්යොදුනක් පමණ තැන සෙවෙල් ආදි යමක් මැ නැති හෙයින් ඉඳුනිල්මිණිරැසක් බඳු ජලය මැ සිටිනේ යැ. එයට ඉක්බිති යොදනක් පළල ඇති හෙල්මැලිවනය ඒ ජලය සිසාරා සිටියේ යැ. එයට ඉක්බිති යොදනක් පමණ පළල ඇති රත්මහනෙල් වනය සිසාරා සිටියේ යැ. ඊට ඉක්බිති වැ යොදුනක් පමණ පළල ඇති සුදුමහනෙල් වනය සිසාරා සිටියේ යැ. ඊට ඉක්බිති වැ යොදනක් පමණ පළල රත්පියුම්වනය සිසාරා සිටියේ යැ. ඊට ඉක්බිති වැ යොදනක් පළල ඇති ඇඹුලවනය සිසාරා සිටියේ යැ. මේ සත්වනයට ඉක්බිති වැ හෙල්මැලිආදියෙන් මිශ්‍ර වූ වනය යොදුනක් පළල වැ සිසාරා සිටියේ යැ. ඊට ඉක්බිති වැ ඇතුන් පොහොනා පමණ දියෙහි යොදනක් පළල ඇති රත්හැල් වනය යැ. ඊට ඉක්බිති වැ දිය කෙළවර පස්වණක් පැහැ ඇති මලින් ගැවැසී ගත් කුඩා කුඩා ගසින් යුක්තවූ වන යැ. මෙසේ මෙ කී දසවනය යොදුන් යොදුන් පළල පැතිරැ සිටිනේ යැ. ඊට ඉක්බිති වැ සිහින්මෑවනය යැ. ඊට ඉක්බිති වැ මහ මෑ වනය යැ. ඊට ඉක්බිතිවැ උඳු වනයයැ. ඊට ඉක්බිති වැ තියඹරාවනය යැ. ඊට ඉක්බිති වැ ලබුවනය යැ. ඊට ඉක්බිති වැ කොමඬුවනය යැ. ඊට ඉක්බිති වැ පුවක්ගස් පමණ දඬුඇති උග්වනය යැ. ඊට ඉක්බිති වැ ඇත්දළ පමණ පක් ඇති කෙහෙල්වනය යැ. ඊට ඉක්බිති වැ සැළ පමණ පක් ඇති කොස්වනය

1. ඉදිවුරා ඇතැම්.

Non-Commercial Distribution

යැ. ඊට ඉක්බිති වැ පැණියෙන මහදකැති පමණ පලු[1] ඇති සිනිඹලාවනය යැ. ඊට ඉක්බිති ගිවුළුවනය යැ. ඊට ඉක්බිති වැ නොඑක් නොඑක් එල ඇති ගසින් යුක්ත වූ මහාමිශ්‍රකවනය යැ. ඊට ඉක්බිති වැ හුණවනය යැ. හුණවනය සිසාරා පර්වතයෝ සත්දෙනෙක් සිටියහැ.

ඒ පර්වතයන්ගේ පිට දිශාවෙහි ආදි වූ පර්වතය චුල්ලකාල නමැ. දෙවන පර්වතය මහාකාල නමැ. ඊට ඉක්බිති පර්වතය චන්ද්‍රපාර්ශ්ව [1] නමැ. ඊට ඉක්බිති පර්වතය සූර්‍යපාර්ශ්ව [2] නමැ. ඊට ඉක්බිති පර්වතය මණිපාර්ශ්ව නමැ. ඊට ඉක්බිති පර්වතය රජතපාර්ශ්ව නමැ. සත්වන වූ සත් යොදුන් උස ඇති ස්වර්ණපාර්ශ්ව පර්වතය ෂද්දන්තවිල සිසාරා පාත්‍රමුවවිටක් මෙන් සිටි යේ යැ. ඒ පර්වතයාගේ ඇතුළත ස්වර්ණවර්ණ යැ. එයින් නික්මෙන රන්වන්පැහැයෙන් ෂද්දන්තවිල නැංගා වූ ලහිරුමඩලක් මෙන් හොබනේ යැ. පර්වතයන් අතුරෙන් එක්පර්වතයක් සයොදනක් උස ඇත්තේ යැ එක් පර්වතයෙක් පස්යොදනක් උස ඇත්තේ යැ. එක් පර්වතයෙක් සතරයොදනක් උස ඇත්තේ යැ. එක් පර්වතයෙක් තුන්යොදනක් උස ඇත්තේ යැ. එක් පර්වතයෙක් දෙයොදනක් උස ඇත්තේ යැ. එක් පර්වතයෙක් යොදනක් උස ඇත්තේ යැ.

මෙසේ සත් පර්වතයෙන් පිරිවරණ ලද්ද වූ මේ ෂද්දන්තවිලට ඊශානකොණයෙහි ජලකණිකාසහිත පවන් හමනා තන්හි මහත් වූ නුගයෙක් ඇත. එ ගස කඳ වට පස්යොදනක් පමණ ඇත්තේ යැ. මුල සිටැ වෙළෙපට සත්යොදනක් පමණ උස ඇත්තේ යැ. සතරදිගට ගිය මහාශාඛා සයොදුන් සයොදුන් පමණ යැ. උඩු බලා නැඟි මහාශාඛාව සයොදනක් උස ඇත්තේ යැ. එ නුගගස මූලැ සිටැ අගට තෙළෙස්යොදනක් උස ඇත්තේ යැ. උතුරුදිග අතුකෙළවර සිටැ දකුණුදිග අතුකෙළවරට දෙළොස් යොදනක් පමණ ඇත්තේ යැ. නැගෙනහිර අතුකෙළවර සිට බස්නාහිර අතුකෙළවරට දෙළොස් යොදනක් පමණ ඇත්තේ යැ. අටදහසක් අරළුයෙන් හොබනේ යැ. එ වෘක්ෂය මුඩු වූ ඉඳුනිල් පර්වතයෙක් සේ හොබනේ යැ. ෂද්දන්තවිලට බස්නාහිර රන්පර්වතයෙහි දෙළොස්යොදුන් පමණ රන්ලෙනැ ෂඩ්දන්ත නම් හස්ති රාජතෙම වර්ෂාසමයෙහි අටදහසක් ඇතුන් පිරිවරා සිටිනේ යැ. ගිම්සමයෙහි ජලකණිකායෙන් යුක්ත පවන් පිළිගණිමින් මහ නුගරුකමුලැ අරළු අතුරෙහි සිටිනේ යැ.

ඉක්බිති මන්‍දකිනී නම් විල මැද පස්යොදනක් පමණ තැන සෙවෙල් ආදි නැති වැ ප්‍රසන්න වූ ජලය සිටිනේ යැ. එයට ඉක්බිති වැ

1. පැණියෙන පලු. 2. පාර්ශ්වපර්වත

Non-Commercial Distribution

පා ගන්නා දියෙහි දෙගව්වක් පමණ පළල ඇති හෙලපියුම්වනය විල සිසාරා සිටියේ යැ. එහි නෙලුම්බුදළි නඟු ලිස් පමණ වෙයි. නෙලුඹල මහබෙර පමණ වෙයි. එහි එකිඑකී පුරුකැ ලාසු ලාසු පමණ කිරි ඇත. මල් පිපෙන සමයෙහි වාතය රේණුසළා නහා නෙලුම්පතෙහි පිහිටුවන්නේ යැ. එහි ජලබින්දු හෙන්නේ යැ. ඉක්බිති අව්වෙන් පැසී යවට මෙන් දැඩි වැ පොකුරුම්හිකැටි තිබෙන්නේ යැ. එයට ඉක්බිත දෙගව්වක් පමණ රත්පියුම්වනයෙකැ. එයට ඉක්බිති රතැඹුලවනය යැ. එයට ඉක්බිති එපමණ හෙලනෙලුඹුවනය යැ. එයට ඉක්බිති වැ එපමණ නිල්මහනෙල්වනය යැ. එයට ඉක්බිති වැ රත්මහනෙල්වනය යැ. එයට ඉක්බිති වැ සුවඳහැල්වනය යැ. එයට ඉක්බිති වැ කැකිරිවනය යැ. එයට ඉස්බිති වැ ලබුවනය යැ. එයට ඉක්බිති වැ දෙගව්වක් පමණ තැනැ පුවක්කඳ පමණ දඬු ඇති උග්වනය යැ. එයට ඉක්බිති වැ එකකු විසින් පක් දෙකක් කා නිමා කොට ගත නො හැකි මහත්පක් ඇති කෙහෙල්වනය යැ. එයට ඉක්බිති වැ සැළපමණ පක් ඇති කොස්වනය යැ. එයට ඉක්බිති වැ අඹවනය යැ. එයට ඉක්බිති වැ දඹවනය යැ. එය ඉක්බිති වැ ගිවුළුවනය යැ. එහි සංක්‍ෂෙපයෙන් ඒ විල්හි අනුභව කටයුතු ඵලයෙන් මෙ නම් ඵලයෙක් නැතැයි නො කියැ යුත්තේ යැ. එහි දඹදිවට සලකුණු වූ දඹගසෙකුදු ඇති එහි පමණ මෙසේ දත යුතු:-

කඳ වට පසළොස්යොදනක් පමණ පළල ඇත්තේ යැ. මුල සිටැ වෙළෙපට පණස් යොදුන් පමණ ඇත්තේ යැ. සතර දිශාවට ගිය සතර මහාශාඛාවෝ ද උඩු බලා ගිය මහා ශාඛාව ද පණස් පණස් යොදුන් පමණ ඇත්තාහැ.[1] මුලැ සිටැ උඩු බලා ගිය ශාඛාග්‍රයට සියක්යොදුන් පමණ යැ. උතුරුදිග ශාඛාග්‍රයෙහි සිටැ දකුණුදිග ශාඛාග්‍රයට සියක් යොදුනැ. බස්නාහිරි ශාඛාග්‍රයෙහි සිටැ නැගෙනහිරි ශාඛාග්‍රයට සියක්යොදුනැ. සිසාරා තුන්සියක් යොදුන් පමණ ඇත්තේ යැ. ඒ මහාශාඛායෙහි මහත් මහත් ගඞ්ගාවෝ වැහෙති. එ ගඞ්ගාවන්ගේ දෙ හිත්තියෙහි මහදියකළ සා දඹපක් හුනු හුනු තැනැ රන්පැළ හට ගන්නි.[2] එ ස්වර්‍ණාංකුරයෝ ගඞ්ගාජලයෙන් ගෙණැ යනු ලබන්නාහු අනුක්‍රමයෙන් සාගරයට වදනාහ. එහෙයින් මැ ජම්බුනදියෙහි උපන් හෙයින් ස්වර්‍ණතෙම 'ජාම්බොනදය''යි කියනු ලැබේ. මෙහි සත්වන ස්වර්‍ණපර්‍වතය අතුරෙහි වෙසමුණුමහරජහු විසින් අනුභවනීය වූ දිව්‍යඵලයෙන් යුක්ත වූ මුලැ පටන් ලොහොදල් සතකින් පිරිවරණා ලද්දු වූ කෙළලක්‍ෂයක් කුම්භාණ්ඩයන් විසින් පිරිවරණලද අබ්භන්තර

1. ඇත්තේ ය. 2. නඟුලිස්සා පමණ ඇතැම්.

Non-Commercial Distribution

නම් අඹගසෙකුදු ඇත. දඹ ගසට කී යම් පමණෙක් ඇති නම්, අසුරයන්ගේ පලුගසට ද, ගුරුළුන්ගේ හිඹුල්ගසට ද, අපරගොයානයෙහි[1] කොළොම් ගසට ද, උතුරුකුරුදිවිහි කප්රුකට ද, පූර්වවිදෙහයෙහි මහරි ගසට ද, තව්තිසැහි පරසතුරුකට ද එපමණ යැයි දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 81.

තව ද, "සක්වළගල දෙයාසූදහසක් යොදුන් දියෙහි ගැලී සිටියේ ය. දෙයාසූදහසක් යොදුන් නැඟී සිටියේ යැ. සඳමඬල අයමින් විතරින් උසින් එකුන්පණස් යොදුනැ. වටින් එක්සිය සත්සාළිස්යොදනෙකැ. හිරුමඬල අයමින් විතරින් උසින් පණස් යොදුනැ. වටින් එක්සියපණස්යොදුනැ. සඳමඬල යන තැනට හිරුමඬල යොදනකට උස් වැ යන්නේ යැ. සඳමඬල ඇතුළෙන් මාණික්‍ය[2]මය යැ. පිටතින් රිදීමය යැ. එයින් ඇතුළෙන් පිටතින් සිහිලැ. හිරුවිමන ඇතුළෙන් ස්වර්ණමය යැ. පිටතින් දවාණමය යැ. එයින් ඇතුළෙනුත් පිටතිනුත් උෂ්ණ යැ. මේ චන්ද්‍ර සූය්‍යී දෙදෙන එක පැහැර තුන් දීපයෙක්හි ආලොක කරන්නාහු එකී එකී දිගින් නවලක්‍ෂයක් නවලක්‍ෂයක් යොදුන්හි අන්‍ධකාර නසන්නාහ.

ජම්බුද්වීපයෙහි උදයකාලය පූර්වවිදෙහයෙහි මධ්‍යාහ්නය යැ. උතුරුකුරුදිවෙහි හිරු ගලහෙන කාලය යැ. අපරගොයානයෙහි[1] මද්ධ්‍යමයාමය ය. පූර්වවිදෙහයෙහි හිරු නැහෙන කල් උතුරුකුරු දිවැ මද්ධ්‍යාහ්නය යැ. අපරගොයානයෙහි[1] හිරු ගලහෙන කල යැ. ජම්බුද්වීපයෙහි මද්ධ්‍යමයාමය යැ. උතුරුකුරුදිවෙහි උදකල් ගොයානයෙහි මද්ධ්‍යාහ්නය යැ. ජම්බුද්වීපයෙහි ගලහෙන කල යැ. පූර්වවිදෙහයෙහි මද්ධ්‍යමයාමය යැ. අපරගොයානයෙහි හිරු නැහෙන කල් මෙහි මද්ධ්‍යාහ්නය යැ. පූර්වවිදෙහයෙහි ගලහෙන කාලය යැ. අතුරුකුරුදිවෙහි මද්ධ්‍යමයාමය යැ"යි මෙසේ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 82.

තව ද, සක්දෙව්රජහට නිවාස වූ තව්තිසැදෙව්ලොව මෙර ගල මත්තෙහි දසදහසක් යොදුන් පමණ තැන පිහිටියේ යැ. එහි නැහෙනහිරිදෙරටුව හා බස්නාහිරිදෙරටුව හා දෙඅතුර දසදහසක් යොදුන් පමණ යැ. දකුණුදිගැ දෙරටුව හා උතුරුදිගැ දෙරටුව හා දෙඅතුර දසදහසක් යොදුන් පමණ යැ. ඒ සක්දෙව්රජහු වසන නුවර දෙරදහසකින් යුක්ත යැ. උයන් හා පොකුණෙන් හොබනේ ය. ඒ නුවර තුන්සියක්

---

1. ගොධානයෙහි 2. තිල්මාණික්‍ය.

Non-Commercial Distribution

යොදුන් උස ඇති දදයෙන් හොබනා සත්සියයක් යොදුන් උස ඇති විජයොත්[1] නම් මහපහය පිහිටියේ යැ. එහි රන්මයයටෙහි මැණික්මය දද වන්නේ ය. මැණික්මයයටෙහි රත්රන්මය දද වන්නේ යැ. පබළුමයයටෙහි මුතුමයදද වන්නේ යැ. මුතුමයයටෙහි පබළුමය දද වන්නේ යැ. සත්රුවන්මයයටෙහි සත්රුවන්මයදද වන්නේ යැ.

ඔහුගේ විජයත් නම් රථය යෙළසියක් යොදුන් දිග ඇත්තේ යැ. එහි පසු කෙළවර පණස්යොදුන් පමණ යැ. මැද රථමැදිරිය පණස්යොදුන් පමණ යැ. රථසන්ධියෙහි පටන් රථහිස දක්වා පණස්යොදුන් පමණ ඇත්තේ යැ. ඒ රථයෙහි යොදනක් පමණ හෙලකුඩයෙක් සිටිනේ ය. එකවියෙහි උතුම් අස්සු දහසෙක් යොදනු ලැබෙති. තෙසු අලඞ්කාර මෙතෙකැයි පමණ නැති. ඔහුගේ දදය දෙසියපණස්යොදුනක් පමණ උස ඇත්තේ යැ. ඒ දදය පවනින් පහළකල්හි පඤ්චාඞ්ගිකතූර්‍යයෙහි ශබ්ද සේ මිහිරි හඬ ඇසෙන්නේ ය.

එ සක්දෙව්රජහුගේ ඓරාවණ නම් ඇත් යෙළසියක් යොදුන් පමණ උස ඇත්තේ යැ. දෙව්ලොවැ තිරිසනුන් නැති හෙයින් එක්දිව්‍යපුත්‍රයෙක් සක්දෙව්රජ උයන්කෙළියට නික්මෙන කල්හි තමාගේ ආත්මභාවය හැර ඓරාවණ නම් ඇත් වෙයි. එතෙම තෙතිස් කුඹක් මවාගන්නේ යැ. එකිඑකීකුඹෙක් වටින් ගව්වක් පමණ ද දෙගව්වක් පමණ ද වන්නේ යැ. ඔවුන් මද්‍යයෙහි සක් දෙව්රජහට සුදර්‍ශන නම් තිස්යොදුන් පමණ කුඹෙක් වන්නේ යැ. ඒ කුඹ මත්තෙහි දෙළොස්යොදුන් පමණ රුවන්මඩුවෙක් වන්නේ යැ. එහි අතරතුරෙහි සත්රුවන්මය වූ යොදුන් පමණ උස ඇති දද නැහෙන්නේ යැ. කෙළවරෙහි රසුදැල් එලෙන්නේ යැ. ඒ රසුදැල් පවනින් සලනලද කල්හි පඤ්චාඞ්ගිකතූර්‍යයෙහි හඬ සේ මිහිරිහඬ ඇසෙන්නේ යැ. ඒ රුවන්මඩුව මැදෙහි සක්දෙව්රජහට යොදනක් පමණ පළහෙක් පණවණු ලබන්නේය යැ. එහි සක්දෙව්රජ හිඳිනේ යැ. ඒ තෙතිස්කුඹුන් අතුරෙන් එකි එකී කුඹෙක්හි සත් සත් දළ වන්නේ යැ. එකිඑකී දළ පණස් පණස්යොදුන් දිග වන්නේ යැ. එහි එකිඑකී දළෙක්හි සත්සත් පොකුණු වන්නේ යැ. එකිඑකී පොකුණෙක්හි සත්සත්පියුම් ගස් වන්නේ යැ. එකිඑකී ගසෙක්හි සත්සත්මලෙක් වන්නේ යැ. එකිඑකී මලෙක්හි සත්සත් පෙති වන්නේ යැ. එකිඑකී පෙත්තෙහි සිටැ දෙව්දුන් සත්සත්දෙනෙක් නටන්නාහු යැ. මෙසේ හාත්පසින් පණස් පණස්යොදුන් පමණ තන්හි ඇත්දළෙහි මැ සිටැ නටන රඟමඩල වන්නේ යැ.

නන්‍ද නම් පොකුණ පණස්යොදුන් පමණ ඇත්තේ යැ. චිත්‍රලතා නම් වනය සැටයොදනක් පමණ ඇත්තේ යැ. ඒ වනාහි දිවරුක්දහස්ගණනින්

1. විජයත්.

Non-Commercial Distribution

හෙබියේ යැ. නන්‍දනවනය ද ඵාරුසකවනය ද එසේ මැ යැ. එහි සක්දෙව්රජ දෙව්දූ[1] සමූහයා විසින් පිරිවරණලද්දේ සැටයොදුන් පමණ ඇති රත්රන්මය වීථියට බැසැ කෙළිදෙළෙන්[2] නන්‍දනවනය ආදියෙහි ඇවිදිනේ යැ. පරසතුරුක වනාහි හාත්පසින් යොදුන්සියක් පමණ වට ඇත්තේ යැ. පසළොස්යොදුන් පමණ කඳවට ඇත්තේ යැ. සියක් යොදුන් පමණ උස ඇති ඒ රුක්මුල්හි සැටයොදුන් පමණ දිග ඇති පණසයොදුන් පමණ පළල ඇති පසළොස්යොදුන් උස ඇති බඳුවදමල් වැනි පැහැ ඇති පාණ්ඩුකම්බල නම් ගල් ආසනයෙක් වි යැ. එ මොළොක්බැවින් සක්දෙව්රජහු හුන් කල්හි කයින් සමහරෙක් ගැලී තිබෙන්නේ යැ. නැඟී සිටි කල්හි එතැන පිරී යන්නේ යැ. සුධර්මා නම් දෙව්සභය[3] දිගින් ද පළලින් ද තුන්සියක් යොදුන් පමණ ඇත්තේ යැ. වටින් නවසියක් යොදුන් පමණ යැ. උසින් පන්සියක් යොදුන් පමණ යැ. එහි බිම දවාණමය යැ. ටැම්තලාඳ දවවළලු ආදියෙහි[4] සිංහරූප ආදීන් ගැසූ ඇණ[5] මැණික්මය වී යැ. රත්රන්මයටැම් ඇති වී යැ. රිදීමයපේකඩ වී යැ. සිංහාදිරූ මැණික්මය වී යැ. ගොනැස් සත්රුවන්මය වී යැ. සිවිනිපිටිපෝරු හා මුත්වත්[6] ද සත්රුවන්, මය වී යැ. සෙවින්නෙහි උළු ඉඳුනිල්මැණික්මය වී යැ. සෙවින්නෙහි පිට රත්රන්මය වී යැ. කොත රිදීමය යැ. මේ හැම ගුරුපදෙශයක් නැති වැ තමන්ගේ මැ නුවණින් දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 83.

ආසාවතී නම් එක්ලියකුදු ඇත. එහි මල් පිපෙන්නේ යැ යි දෙවියෝ දහසක් හවුරුදු උපස්ථානයට යෙති. පරසතුරුක මල් පිපෙන කල්හි ඒ දෙවියෝ එහි පත් පඬුවන් වූ තැන් පටන් සතුටු වෙති. පරසතුරුක හැමපරිද්දෙන් පිපි මල් ඇතිකල්හි හාත්පසින් පන්සියක් යොදුනෙහි රස් පැතිරෙයි. යටිසුළඟ සියක් යොදනෙහි සුවඳ පවත්නේ යැ. ඒ පරසතුරුක මල් පිපෙන කල්හි නැඟී වත් දෙහෙතිල්ලෙන් කැඩුව මැනැ වැ යනු නැත. කැඩූ මල් කරඬුවෙහි ලා ගෙණව මැනැව යනු නැත. මල් කඩන සුළහෙක් නැඟී මල් නටුයෙන් කඩන්නේ යැ. පිළිගන්නා එක් සුළහෙක් මල් බිමැ හියැ නො දී පිළිගන්නේ යැ ප්‍රවෙශ කරණ එක් පවනෙක් සුධම්දෙව්සභය ඇතුළෙහි ලන්නේ යැ. හමදනා පවනෙක් පරමල් අමදනේ යැ. අතුරණ පවනෙක් පෙතිකෙම් කෙසුරු හොබනා පරිද්දෙන් අතුරන්නේ යැ. සුධම්දෙව්සභය මධ්‍යයෙහි යොදනක් පමණ රුවන්පලහෙක් බණආසනයෙක් වන්නේ යැ. ඒ මත්තෙහි තුන්යොදුනක් පමණ

1. දේව, 2. කෙළි කෙළනේ ය, 3. සභාව, 4. ආදිය ද,
5. ඇණ ද, 6. හොත්වස්-අමාවතුර 158

Non-Commercial Distribution

හෙලකුඩයෙක් නහන ලැබෙයි. ඊට ඉක්බිති වැ සක්දෙව් රජහට ආසනයෙක් අතුරණු ලැබෙයි. ඊට ඉක්බිති වැ දෙතිස්දිව්‍යපුත්‍රයන්ට ආසන අතුරණු ලැබෙයි. ඊට ඉක්බිති වැ සෙසු ප්‍රධාන දෙවතාවන්ට ආසන වන්නේ යැ. සෙසු අප්‍රධාන දෙවතාවන්ට මල්කෙමි මැ අසුන් වන්නේ යැ.

ඉක්බිති වැ දේවතාවෝ සුධම්දෙව්සභයට වැද පිළිවෙළින් හිඳිනාහැ. ඉක්බිත්තෙන් මල්රෙහෙණු උඩට නැඟී කැණිමඩලෙහි ගැසී වැගිරෙන්නේ දෙවතාවන්ගේ තුන්ගවු පමණ ශරීර ලාරසයෙන් තවරණලද්දක් මෙන් කෙරෙයි. ඔවුන්ගේ ඒ කෙලි සාරමසෙකින් නිමවන්නේ යැ යි ස්වයම්භූඥානයෙන් පරොප දෙශයක් නැති වැ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 84.

තව ද, "සිනේරුපාමුල්හි දසදහසක් යොදුන් අසුරපුරය වී යැ. ශක්‍ර තමාගේ පුරයට අසුරයන් නොඑන පිණිස මෙර පළමුවන සීමායෙහි නයින් සිටිවී යැ. දෙවන සීමායෙහි ගරුඩයන් සිටිවී යැ. තුන්වන සීමායෙහි දනවරාක්‍ෂසයන් සිටිවී යැ. සතර වන සීමායෙහි යකුන් සිටිවී යැ. පස්වන සීමායෙහි සතරවරමුන් සිටිවී යැ. මේ අසුරයන් වසන භවනය ද දසදහසක් යොදුනැ. අවීචිය ද දඹදිව ද මෙසේ මැ දසදහසක් යොදුනැ. අවීචියැ ඇතුළ දිගින් පළලින් සියක් යොදුනැ. යට ලොහොපොළොව යැ. ලොහොමයසෙවිනි යැ. එකි එකී බිතත්[1] නවයොදුන් පමණ යැ. මෙසේ මැ නැහෙනහිර හිත්තියෙන් නැඟි රස් බස්නාහිරිබිතත් පැහැර එයින් විද ගෙණැ පිටතින් සියක් යොදුන් පමණ තැන පැතිර සිටිනේ යැ. බස්නාහිරින් නැඟි රස් නැහෙන හිරිබිතත් විද ගෙණැ පිටත යොදුන් සියයක් තැන පැතිර සිටිනේ යැ. මෙසේ මැ උතුරු දිග හිත්තියෙන් නැඟි රස් දකුණු දිග හිත්තිය විද ගෙණැ පිටත සියක් යොදුන් තැන පැතිර සිටිනේ යැ. මෙසේ මැ දකුණුදිග හිත්තියෙන් නැඟි රස් උතුරුදිග බිතත් විද ගෙණැ පිටත සියක්යොදුන් පමණ තැන පැතිර සිටිනේ යැ. ඒවාලා පැතිරෙණ තැන් ඇතුළු වැ අයමින් විතරින් තුන්සියඅටළොස්යොදුන් පමණ යැ. ඒ අවීචිය වටින් නවසිය සූපණස්යොදුන් පමණ ඇත්තේ යැ. ඒ ඇතුළෙහි සියක් යොදුන් පමණ තන්හි කොටා නළෙකැ පිරූ මල්තුඹ[2]සුණු සේ සත්වයෝ අතුරු නැති වැ සිටැ එහි පැසෙති. දඹදිව දිගින් පළලින් දසදහසක් යොදුන් පමණ ඇත්තේ යැ. එහි සාරදහසක් යොදුන් පමණ තැන් මුහුදු වි යැ. තුන්දහසක් යොදුන් පමණ තැන් මිනිසුන්ට නිවාස වි යැ. නැවත තුන්දහසක් යොදුන් පමණ තැන් හිමාලයපර්වතයට අවකාශ වි යැ" යි දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. හිත්තිය.　　2. පිරූ තුඹ.

Non-Commercial Distribution

## 85.

තව ද, අපරගෝයානය[1] සත්දහසක් යොදුනැ. පූර්විදෙහය සත්දහසක් යොදුනැ. උතුරුකුරුදිව අටදහසක් යොදුනැ. මෙහි දඹදිව ගැලැත්තක් වැන්නැ. සයානූකෙළ ලක්‍ෂයක් පමණ පටුන්ගම් ඇත්තේ යැ. පණසක් රුවන් ආකර ඇත්තේ යැ. නවානූලක්‍ෂයක් පමණ ද්‍රොණමුඛ ඇත්තේ යැ. එක්ලක්‍ෂ නවානූදහසක් පමණ නුවර ඇත්තේ යැ. තව ද, අපරගෝයානය කැටපතෙකැ සටහන් ඇත්තේ යැ. උතුරුකුරුදිවයින පීඨයෙකැ සටහන් ඇත්තේ යැ. පූර්විදෙහය අඩසඳෙකැ සටහන් ඇත්තේ යැ. ඒ ඒ ද්වීපයෙහි මිනිසුන්ගේ[2] මුහුණු දු ඒ ඒ ද්වීපයෙහි සටහන් මැ ඇත්තේ යැ. ඒ ඒ ද්වීපයෙහි සත්ත්වයන්ගේ ස්වභාව මෙසේ යැ" යනාදීන් සියල්ල ඇතැඹුලු සේ දත් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 86.

තව ද, "මේ සතරද්වීපයෙන් එකි එකී ද්වීපය පිරිවරා ක්‍ෂුද්‍රද්වීප පන්සියෙක් පන්සියෙක් වන්නේ යැ. මෙසේ මහදිවි හා කොදිවි හා ඇතුළු වූ එක්සක්වළෙක් එක් ලොකධාතුවෙක් නම් වෙයි. මෙසේ වූ සක්වළ තුණක් අතුරෙහි ලොකාන්තරික නම් නරකයෙක් වන්නේ යැ. ඒ නරකය අටදහසක් යොදුන් පමණ මහත ඇත්තේ යැ. ඒ නරකයෙහි යටින් පොළොවක් නැත. මත්තෙන් දෙව්ලොවක් නැත. ඇසට පැණෙන ආලොකයෙක් නැත. එහි ආලොකයෙක් ඇති වන්නේ බුදුන්ගේ උත්පත්ති ආදි වූ මඟුල්දවසෙකැ මැ යැ. ඒ ආලෝකය ද විදුලිය ආලෝකයක් සේ ඒ නරකයෙහි පැතිරැ ගොස් එහි සත්ත්වයන් 'මේ කිම් ද?'යි බණන්නට වන්කල්හි මැ අන්තර්ධාන වෙයි. එහි උපදනෝ මවුපියන් ආදීන්ට වැරැද්දේ යැ. අනවරතයෙන් සතුන් මැරීම් ආදී වූ පව් කළෝ යැ. ඔවුන්ගේ ශරීරය තුන් ගවු පමණ යැ. ඉතා දික් වූ නිය ඇති වෙති. වවුලන් මෙන් සක්වළගලැ නියෙන් එලී ගෙණැ හොවිති. එහි බමමින් ඔවුනොවුන් ඇඟ අත් ගැටී[3] ගිය කල්හි 'ගොදුරු ලදුම්හ'යි කියා ඔවුනොවුන් කන්නට වදිමින් ගිලී ගොස් ලොව ධරා සිටි දියෙහි හෙති. හී විරෙති. ඔවුන්ගේ පාපකර්මබලයෙන් එකෙණෙහි ඒ දිය කර වෙයි යනාදී මෙ සියල්ල උපදෙශයක් නැති වැ තමන් ගේ නුවණින් පිරිසිඳ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. III. V. ගොධාන
2. සත්වයන්ගේ-සමහර
3. 1. ගැවි.

Non-Commercial Distribution

## 87.

තව ද, "මෙසේ වූ සක්වළ අනන්ත යැ. එහි සත්ත්වයෝ අනන්තයෝ යැ"යි කියා එසේ මැ අනන්ත වූ තමන්ගේ නුවණින් පිරිසිඳ දත්තා වූ බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු.

## 88.

තව ද, "සංවතී යැ, සංවතිස්ථායී යැ, විවතී යැ. විවතිස්ථායී යැයි කප් සතරෙක් වෙයි. එහි නස්නා කප් සංවතී යැ. නැසී සිටිනා කප් සංවතිස්ථායි යැ. උපදනා කප් විවතී යැ. ඉපැදැ සිටිනා කප් විවතිස්ථායී යැ. එහි කප නස්නාකලැ ගින්නෙන් හෝ දියෙන් හෝ පවනින් හෝ මේ තුණින් නස්නේ යැ. එහි ගින්නෙන් නස්නා කලැ තෙජසින් ආභස්සර නම් බඹලොව පහරවා එක හෙළා නස්සි. දියෙන් නස්නා කල සුභකිණ්හක නම් බඹලොව පහරවා නස්සි. පවනින් නස්නා කල වෙහප්ඵල නම් බඹලොව පහරවා නස්සි. විතරින් තුන්සංවතියෙහි මැ එක් බුදුකෙතෙක් නස්සි. බුදුන්ගේ කෙත් තුණෙක් වෙයි: 'බුදුන්ගේ ඉපැද්මට ක්‍ෂෙත්‍රය, ආඥවට ක්‍ෂෙත්‍රය, විෂයට ක්‍ෂෙත්‍රය"යි.[1] එහි දසදහසක් සක්වළ උත්පත්තියට ක්‍ෂෙත්‍රය යැ. කෙළලක්‍ෂයක් සක්වළ ආඥවට ක්‍ෂෙත්‍රය යැ. අනන්තාපරිමාණ සක්වළ විෂයයට ක්‍ෂෙත්‍රය යැ" යනාදීන් තමන්වහන්සේගේ ඥාණබලයෙන් උපදෙශයක් නැති වැ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 89.

තව ද, 'නැවැත පළමු කප නස්නා කලැ මහවැස්සෙක් නභා ගෙණැ කෙළලක්‍ෂයක් සක්වළ එක පැතිරැ වස්නේ යැ. මිනිස්සු ඒ වැසි දකිමින් සතුටු වැ ගොස් ගොවිතැන් කෙරෙති. ගොයම් ගෙරින් කන අවස්ථාවෙහි එක බින්දුවකුත් නො හෙයි. එද සිඳුනු වැසි සිඳිනි මැ යැ. වැස්සෙන් ජීවත් වන සත්ත්වයෝ පරිත්තාභාදිබඹලොවැ උපදිති. පුෂ්පයෙන් ඵලයෙන් ජීවත් වන දෙවියෝ ද මේ පරිත්තාභාදිබඹලොවැ උපදිති. මෙසේ කල් යන්නා හා ඒ ඒ තන්හි පැන සිඳෙන්නේ යැ. ක්‍රමයෙන් මස්කැසුබුන් ආදි සත්ත්වයෝ ද දිව්‍යලෝකයට ගොස් එහි ලද් ධ්‍යානයෙන් බඹලොව මැ උපදිති. හේ කෙසේ ද? යත්:-

කප නස්නට ලක්‍ෂයක් අවුරුද්දෙන් මත්තෙහි අවමඩිගල වෙශ ගත් කාමාවචරදෙවතාවෝ මිනිස්ලොවට බැසැ 'නිදුක්නි, මෙයින් හවුරුදු ලක්‍ෂයකින් මත්තෙහි කප නස්නේ යැ මවුපියන්ට කරණ උපස්ථානාදි වූ සියලු දෙය නො පමා වැ කරව'යි කියති. එබස් අසා මිනිසුන් හා

1. "බුදුන්ට ක්‍ෂෙත්‍ර තුණෙක් යැ"- අධිකයෙකි

Non-Commercial Distribution

බූමාටුදෙවතාවන් ආදි වූ සත්ත්වයෝ පින් කොට දෙව්ලොවැ ඉපැද එහි දී ලබන ධ්‍යානයෙන් බඹලෝ යෙති. අපායෙහි සත්ත්වයෝ ද අපරාපය්‍යී වෙද්‍යකර්‍මයෙන් දෙව්ලොවැ ගොස් එසේ මැ ධ්‍යාන ලදින් බඹලෝ යෙති. අපායෙහි කිසි සත්ත්වකෙනෙක් නස්නා ලොවැ නරකයෙන් නොනස්නා ලොවැ නරකයට යෙති. එකාන්තයෙන් මිථ්‍යාදෘෂ්ටි ගත්තෝ ඉන් මියැ පිට සක්වළැ උපදිති. වැසි නොවට පස්සෙහි බොහෝකලෙකින් දෙවෙනි හිර පහළ වෙයි. එතැන් පටන් රෑ දවසත් හිරෙක් පහළ වෙයි. හිරෙක් බස්සි. ඒ හිරුවිමානයෙහි දෙවතාවා නැති. ඒ හිරු නැඟි අහසැ වලා නැති වෙයි. පඤ්චමහා ගඞ්ගාවන් තබා සෙසු ගඞ්ගාවෝ වියලෙන්නාහැ. පසු වැ කලාතුරෙකින් තුන්වැනි හිරෙක් නැඟෙයි. ඒ නැඟිකලැ මහාගඞ්ගාවෝ ද වියලෙන්නාහැ. නැවැත සතරවන හිරෙක් නැඟෙයි. එයින් අනවතප්තවිල ආදි සත්මහවිල් වියලෙන්නේ යැ. පසු වැ පස්වන හිර නැඟෙයි. එයින් මහමුහුදත් වියැලී යෙයි. පසු වැ සවන හිර නැඟෙයි. එයින් මහපොළොව දුමා යන්නේ යැ. සත්වන හිර නැඟිකැලැ සියල්ල මැ ද යන්නේ යැ. පොළොවින් යට අහස හා පොළොවින් මත්තෙහි අහස හා දෙක එකඅහස් වැ යන්නේ යැ. ලොව පසු වැ මහඅඳිරි වැ යන්නේ යැ. මෙසේ එක් අසංඛ්‍යයක් ලොව මුළුල්ල කිසිවක් නැති වැ එකහෙළි වැ සිටිනේ යැ. පසු වැ ලෝසටහන්වැස්ස වස්නේ යැ. 'පළමු හිම බාන්නා සේ වස්සි. පසු වැ සුන්සාල් පමණැ, පසු වැ දළසාල් පමණ යැ'යි මෙසේ මැ ක්‍රමයෙන් වැඩී දහසක් යොදුන් පමණ ධාරා වස්නේ යැ. නොනට බඹලොව පහරවා එක හෙළා දිය පිරී සිටිනේ යැ. ඒ පැන් යටින් මත්තෙන් වාතයෙක් නැඟී ඝන කොට සිටී. ඒ පවනින් පිඩු වැ ගොස් ක්‍රමයෙන් සිඳිසිඳි බස්සි. බට බට සෙයින් ක්‍රමයෙන් දෙව්ලෝ බඹලෝ පහළ වෙයි. සවුමහරජය හා තව්තිසැදෙව්ලොව හා දෙක පොළොව හා සම්බන්‍ධ වැ සිටිනා හෙයින් පොළොව නොතුබූ ඉද්දට දිය ආකල්හි මිහිරිපැන් සිඳී ගෙණැ යන්නේ යැ. මත්තෙහි රසපොළොව උපදවා ශ්‍රීමහාබොධීන්වහන්සේගේ ස්ථානය පළමු කොට පහළ වේ.

ආභස්සර බ්‍රහ්මලොකයෙහි පළමු උපන් සත්ත්වයෝ ආයු හා පින් හා නැති වැ ගොස් එයින් සැවැ මෙහි තුමූ මැ අවුත් පෙණී යෙති. තෘෂ්ණා ඇති වැ රසපොළොව රස කන්නට පටන් ගණිති. එයින් ශරීරයෙහි උපන් පැහැයත් නැති වැ යෙයි. පසු වැ ඒ සත්ත්වයන්ට හිරසඳ පහළ වේ. නකත්තරු ආදිය ද පහළ වේ. යම්සේ තණසාලේ බත් පැසෙනකලැ සමහර තැන බිබුළු නැඟේ ද, සමහර තැනෙක් ගොඩ ගොඩ වේ ද, සමහර තැනෙක් වළ වළ වේ ද, සමහර තැනෙක් සම සම වේ ද, එසේ මැ පොළොව ගොඩ ගොඩ තැන් ගල් වෙයි. වළ වළ තැන් මුහුදු

Non-Commercial Distribution

වෙයි. සමසම තැන් ද්වීප වෙයි. සත්ත්වයන් එසේ පොළොව කනකලැ සමහර කෙනකුන් ශරීරවර්‍ණය යහපත් වෙයි. වර්‍ණය යහපත් සත්ත්වයෝ වර්‍ණ නපුරු වූවන්ට නින්ද කෙරෙති. එසේ සත්ත්වයන්ගේ නපුරු ඇති වත් වත් රසපොළොව අන්තර්ධාන වෙයි. පසු වැ නො සෑ[1] නො වපුටැ තමා මැ තමහට උපදනා හැල් ඇති වෙයි. ඊ බත් කන්නට වදනා මැ මලමූත්‍ර ඇති වැ ගන්නි. ඒ මලමූත්‍ර යන්නට මුඛ ද ඇති වෙයි. පසු වැ රාග බලවත් වෙයි. එසේ වූ කලැ ස්ත්‍රීලිඟු පුරුෂලිඟු පහළ වෙයි. පසු වැ ස්ත්‍රී පුරුෂ යන මොවුන්ගේ ඔවුනොවුන් හා සමාගම ඇති වෙයි. පසු වැ මුවාව පිණිස ගෙවල් කෙරෙති. ඒ දෙෂයෙන් පසු වැ හැලුත් නැති වැ යෙයි. පසු වැ බෙදුම් ඇති වෙයි. පසු වැ අදත්තා දනය ඇති වෙයි. පසු වැ ඔවුනොවුන් අතින් දඬෙන් පහරිති[2]. පසු වැ සත්ත්වයෝ තමන්ට නිග්‍රහ අනුග්‍රහ කරන්නට එකක්හු රජ කොට ගණිති. රජහු ඇති වූ කල්හි බමුණුකුලයෙහි යැ, ගොවිකුලයෙහි යැ කියා ඇති වෙයි.

මෙහි කප නස්නා මහවැස්සෙහි පටන් ගෙණැ ගින්නෙන් නට තැන් දක්වා මේ සංවර්‍තඅසඞ්ඛ්‍යය යැ. ඒ ගින්නෙන් නට තැන් පටන් ගෙණැ **සම්පත්තිකර** මහාමෙඝය දක්වා මේ **සංවර්‍තස්ථායි** අසංඛ්‍යය යැ. ඒ මහමෙඝය නිමිතැන් පටන් හිරසඳ පහළ වූ තැන් දක්වා මේ **විවර්‍තඅසංඛ්‍යය** යැ. එතැන පටන් නැවැත කප නස්නා **විපත්තිකර**-මහාමෙඝය දක්වා **විවර්‍තස්ථායි** අසංඛ්‍යය යැ. ඒ විවර්‍තස්ථායි-අසංඛ්‍ය ඇතුළෙහි සූසැට අන්තඃ කල්පයෙක් වන්නේ යැ. සෙසු අසංඛ්‍යයෙහිත් මෙසේ මැ සූසැට සූසැට අන්තඃකල්පයෙක් වන්නේ යැ"යි යනාදීන් දත්තා වූ **බුදුන් සරණ යෙම් යි බුත්සරණ** යා යුතු.

## 90.

"යම් කපෙක් දියෙන් නසී ද, එයිත් යට කී ලෙස මැ යැ. ඊ වෙනසෙක් නම්: දෙවන හිර පහළ වූ කලැ කරදිය ඇති මහ වැස්සෙක් වස්සි. ක්‍රමයෙන් සියුම් වැ වැසැ පසු වැ මහාධාරායෙන් කෙළලක්‍ෂයක් සක්වළ පුරා වස්සි එහි පහළ පහළ තැන් මැ විරෙයි. වාතයෙන් පැන් ධරා සිටිකලැ **සුභකිණ්ණක** නම් බඹලොව පහරවා මහපොළෝ පර්‍වත ඇතුළු වූ හැම මැ විරෙන්නේ යැ. පොළොව ධරා සිටි දිය හා එදිය එක් වැ යෙයි. මෙසේ කප නස්නා මහවැස්සෙහි පටන් එදිය සිඳෙන තැන් දක්වා මේ **සංවර්‍තඅසංඛ්‍යය** යැ. එතැන් පටන් **සම්පත්තිකර** මහාමෙඝය අන්ත වන තුරු මේ දෙඅතුර **සංවර්‍තස්ථායිඅසංඛ්‍යය** යැ. එතැන් පටන් හිරසඳ පහළ වූ තැන් දක්වා මේ දෙඅතුර **විවර්‍ත** අසංඛ්‍යය

---

1. නො සා 2 පහරති.

Non-Commercial Distribution

යැ. එතැන් පටන් කප නස්නා විපත්තිකරමහවැස්ස දක්වා විවර්තස්ථායිඅසංඛ්‍යය යැ''යි කියා මෙසේ තත් වූ පරිද්දෙන් උපදෙශයක් නැති වැ දත්තා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**91.**

තවද, "නැවැත පවනින් ලොව නස්නා සමයෙහි දෙවන හිරු පහළ වූ කල්හි කප නස්නා වාතය නැඟී සියුම්වැලි යැ, මහවැලි යැ, හකුරු යැ, පහණ යැ යන මේ ආදිය අහසට නහා ක්‍රමයෙන් මහාපර්‍වතගල් උදුරා නහා ක්‍රමයෙන් මහපොළෝ සක්වළගල් මෙරුපර්‍වත හිමාලය යුගන්‍ධරාදි පර්‍වතයන් හා සදිව්‍යලොව හා බ්‍රහ්මලොක නවයක් දක්වා මේ සියල්ල සුණු විසුණු කොට වෙහප්ඵල නම් බ්‍රහ්මලොකය පහරවා එක හෙළා නසා පියා තෙමේත් නස්සි. මෙහි දු කප නස්නා මහවැස්සෙහි පටන් කප නස්නා වාතය අන්ත වන තුරු මේ දෙඅතුර සංවර්ත අසංඛ්‍යය යැ. එතැන් පටන් සම්පත්තිකර මහවැස්සෙහි අන්ත දක්වා සංවර්තස්ථායීඅසංඛ්‍යය යැ. එතැන් පටන් කොට හිරසඳ පහළ වීම් දක්වා මේ දෙඅතුර විවර්ත අසංඛ්‍යය යැ. එතැන් පටන් නැවැත කප නස්නා විපත්තිකරමෙඝය දක්වා විවර්තස්ථායී අසංඛ්‍යය යැ. මෙසේ මේ ලොකවිනාශයට මුල් වූයේ සත්ත්වයන්ගේ අකුශලය යැ. ලොකය නැවැත උපදනට මුල් වූයේ එ මැ සත්ත්වයන්ගේ කුශලය යැ" යනාදින් මේ හැම සියල්ල බලා, පීවා සේ, කිරා පීවා සේ. මැනැ පීවා සේ, තත්වූ පරිද්දෙන් තමන්වහන්සේගේ නුවණින් පිරිසිඳ දත්තා වූ ලොකාචාර්‍ය්‍ය වූ නිර්වාර්‍ය්‍ය වූ ජගදනනන්‍දලොචන වූ ත්‍රෛලොකාධිපති වූ ත්‍රෛලොක්‍යචූඩාමාණික්‍ය වූ ත්‍රෛලොක්‍යස්වාමි වූ මගේ ස්වාමිදරුවානන් වහන්සේගේ සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

**92.**

තව ද, මෙරට වැඩි උස් පර්‍වතයක් නැත්තා සේ, මහපොළොවට වැඩි පළල් අනික් වස්තුවක් නැත්තා සේ, දියපොළොවට වැඩි ගැඹුරු අනික් ජලාධාරයක්[1] නැත්තා සේ, වාපොළොවට වඩා මහත් අනික් පවනක් නැත්තා සේ, ආකාශයට වඩා අනික් සිස්තැනක් නැත්තා සේ, ජීවිතයට වඩා අනික් ප්‍රියවස්තුවක් නැත්තා සේ, නිවණට වඩාම්හිරි අනික් මධුරද්‍රව්‍යයක් නැත්තා සේ, කුශලයට වැඩි අනික් සුව දෙන දෙයක් නැත්තා සේ, සිතට වැඩි වහා පෙරළෙන දෙයක් නැත්තා සේ, කර්‍මයට වැඩි මැදහත් දෙයක් නැත්තා සේ,

1. ජලධාරාවක්.

Non-Commercial Distribution

ප්‍රඥාවට වැඩි පිට්වහලක් නැත්තා සේ, සබවසට[1] වැඩි සිතට සුවයක් නැත්තා සේ, හිරුමඬලට වැඩි ආලෝකයක් නැත්තා සේ, ගින්නට වැඩි දවන දෙයක් නැත්තා සේ, පැනට වැඩි පිපාසා නිවන දෙයක් නැත්තා සේ, ධ්‍යානයට වැඩි ධනයක් නැත්තා සේ, මව්පියන්ට වැඩි උපකාර කළවුන් නැත්තා සේ, මෛත්‍රියට වැඩි අනුන්ට තමා ප්‍රිය කරණ දෙයක් නැත්තා සේ. 'අනිත්‍යය, දුඃඛය, අනාත්මය' යන භාවනාවට වැඩි නිවන්හි සිටුවා ලන දෙයක් නැත්තා සේ, ශීලයට වැඩි සිත සකස් කොට ලන දෑයක් නැත්තා සේ, සුවයට වැඩි සිත් සැනහුමක් නැත්තා සේ, සත්ත්වයන්ගේ ආයුශ්ශක්තියට වැඩි යුහු වැ දිවන දෙයක් නැත්තා සේ, රාහුඅසුරිඳුට වැඩි මහා ශරීර ඇති ප්‍රාණියකු නැත්තා සේ, දහසක් යොදුන් ආනන්‍ද නම් මත්ස්‍යයාට වැඩි මහත් මත්ස්‍යජාතියක්හු නැත්තා සේ, කල්පාන්තයෙහි වස්නා වැස්සට වැඩි මහාවෂීාවක් නැත්තා සේ, යුගාන්තයෙහි ආභස්සර බ්‍රහ්මලොකය දක්වා එක පැහැරැ කෙළලක්‍ෂයක් සක්වළැ ඇවිලි ගිනිකඳට වැඩි අනික් ගින්නක් නැත්තා සේ කෙළලක්‍ෂයක් සක්වළෙහි මහපොළෝ මෙරු මන්‍දරාදි පර්‍වතයන් එක පැහැරැ උපුරා මකුළුහුයක් සේ නැඟු මහපවනට වැඩි අනික් පවනක් නැත්තා සේ, පරමාණුවට වැඩි සියුම් වස්තුවක් නැත්තා සේ, අප්‍රමාදයට වැඩි අභිමතාර්ථ සාධන දෙයක් නැත්තා සේ, හිරිඔතප්දෙකට වැඩි පව් නො වැද්ද දෙන දෙයක් නැත්තා සේ, තමා සිතට වැඩි තමාට පසක් දෑයක් නැත්තා සේ, මරණයට වැඩි නොමිහිරි දෙයක් නැත්තා සේ, අවීචියට වැඩි දුක් තැනක් නැත්තා සේ, තෘෂ්ණාවට වැඩි දුක් උපදවන දෙයක් නැත්තා සේ, ප්‍රතීත්‍යසමුත්පාදයට වැඩි නො දැනැ ගත හැකි දෙයක් නැත්තා සේ, අඹුදරුවන් කෙරෙහි ස්නෙහයට වැඩි බන්‍ධනයක් නැත්තා සේ, සාදුකට වැඩි රෝගයක් නැත්තා සේ, ජරාවට වැඩි දුර්වල කරණ දෙයක් නැත්තා සේ, ශරීරයට වැඩි පිළිකුල් කරණ දෙයක් නැත්තා සේ, අමාවට වැඩි අනුභව කටයුතු දෙයක් නැත්තා සේ, පරනිර්මිතවශවර්ති දිව්‍යලොකයට වැඩි කාමභූමියක් නැත්තා සේ, නෙවසඤ්ඤ-නාසඤ්ඤායතනයෙහි සිතට වැඩි සියුම් සිතක් නැත්තා සේ, ලොකවිෂයයට වැඩි අචින්ත්‍ය වූ විෂයයක් නැත්තා සේ, දහමට වැඩි කටයුත්තක් නැත්තා සේ, නිවණට වැඩි රක්‍ෂාස්ථානයක් නැත්තා සේ, තමන්ට වැඩි කිසි සත්ත්වයකු නැති, අපාද-ද්විපාද-චතුප්පාද බහුප්පාද සියලු සත්ත්වයන්ට වැඩී සිටි **බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.**

---

1. සබාවට

Non-Commercial Distribution

## 93.

තව ද, "දහසක් ඇඟිලි කපා ගුරු පූජා කෙරෙමි"යි මහතට[1] බැස යමයාගේ දළ සේ භයඞ්කර වූ කඩුවක් ගෙණැ වාතවෙගයෙන් දිවැ මිනිසුන් මරා ඇඟිලි කපා, ගෙතූ ඇඟිලි කරලීමෙන් "අංගුලිමාල" යැයි ප්‍රසිද්ධ වැ "මම යැ අංගුලිමාලයා"යි කී හඬ ඇසූවිට මැ මහසෙනහඬ ඇසූ මුවපොල්ලන් සේ, කෙසරසිංහ නාද ඇසූ ඇත්පැටවුන් සේ මනුෂ්‍යයන් තතුණුවමින්, මනුෂ්‍ය රූප ගත් කල්පාන්තවහ්නියක් සේ ඉතා චණ්ඩ වැ හිස සිසාළ කඩුවෙන් යුක්තවැ දිවෙන භයඞ්කරවෙශය බලා ඉවසියැ නො හී දෙ අතින් ඇස් පියා මුහුණින් හුනු මිනිසුන් මරා ඇඟිලි කපමින්, ඇතුන් හඹා දිවැ වාලධියෙහි ගෙණැ ඇද රඳවා කඩුපහරින් දෙකඩ කොට, අසුන් ලුහුබැඳ විරිතියෙහි[2] ගෙණැ හිස සිසාරා පොළොව අපුළා තු තු කෙරෙමින්, ඇත්පයට හසු වූ මළපරඬලා සේ රථ මැඬැ සුණුවිසුණු කෙරෙමින්; ලෙහෙයෙන් රත් වූ අතැති වැ ගම් නොගම් කොට, නියම්ගම් නොනියම්ගම් කොට, නුවර අනුවර කොට ඇවිදිනා කල්හි, මේ පවත් ඇසූ කොසලයන් තමන්ගේ සිවුරඟසෙනඟ ගෙණැ "මම සෙට ගොස් ගන්මි"යි නිශ්චය කළ දවස්, එපවත් ඇසූ ඒ සොරහුගේ මවු බැමිණිය "මම ගොස් මපුත්හු මරින් ගලවා ගෙණෙමි"යි සිටි කල්හි, බුදුහු එදවස අලුයම්වේලෙහි මහාකරුණාසමාපත්තියෙන් නැඟී "අද මාගේ සද්ධර්මය අසා අමාමහනිවන් දක්නට සුදුස්සෝ කවුරු දේ හො?"යි සියලු ලොව නුවණැසින් බලා අංගුලිමාලයා දැකැ, අද මම ඒ සොරු කරා නො ගියෙම් නම්, හෙතෙම තමා රක්නට ගිය මෑනියනුදු මරා ඇඟිලි කපා ගෙණැ, බුදුදහසකුදු ගලවා ගත නො හැකි පරිද්දෙන් අවීචියෙ හී නස්නේ යැ. මා සේ වූ මහාකරුණා ඇති ලොවට සිනෙහැති සව්නේ ගෙවා දත් සත්පුරුෂයක්හු සිටියැ දී මොහු මෙසේ නස්නාබව නො සුදුසු යැ. මම ඔබ ගියෙම් නම්; මාගේ ආනුභාවය නො දැනැ 'මයිදු මරා ඇඟිලි කපා ගන්මි'යි තෙමේ මැ දිවැ විඩා වැ අභිමානශූන්‍ය වැ මබස් අසා, මා බුදුබව් දැනැ කඩුව දමා මා පාපිටැ හී කළකම් ගෙවා වැද මාගේ ශාසනයෙහි මහණ වැ කෙලෙසුන් නසා[3] රහත් වැ, තමා බිණූ පිරිත්හි අනුහසින් කෙළලක්‍ෂයක් සක්වළැ සතුන්ට උපද්‍රව දුරු කොට පස්වාදහසක් මුලුල්ලෙහි හිරුසඳු මෙන් ලොකප්‍රසිද්ධ වෙ"යි සිතා වදරා කලට සුදුසු වූ කළ මනා බුද්ධකෘත්‍යය කොට අනඳමහතෙරුන් වහන්සේ සේ සිනෙහැති සව්වන් නො කැඳවා. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ නුවණැති සව්වන් නො කැඳවා, මුගලන් මහතෙරුන්වහන්සේ සේ ඍද්ධි ඇති සව්වන් නො කැඳවා, අනුරුද්ධ මහතෙරුන්වහන්සේ සේ

1. මු. I. & V. මහවනයට. 2. විරිත්තියෙහි. 3. කඩා

Non-Commercial Distribution

දිවැස් ඇති සච්චන් නො කැඳවා, රාහුලකුමාරයන් වැනි පුත්රුවන් නො කැඳවා, නන්ද කුමාරයන් වැනි දෙබිහින්නන් දරුවන් නො කැඳවා, සෙසු, නොඑක් ගුණෙන් වැඩී සිටි ඒ ඒ ශ්‍රාවකයන් නො කැඳවා, තුමූ මැ තමන්ගේ පරාක්‍රම තකා පාත්‍රචීවර ඇර ගෙණ බුදුරුවට සලකුණු වූ දෙතිස් මහාපුරුෂලක්‍ෂණ අශීත්‍යනුබ්‍යඤ්ජන කෙතු මාලා බ්‍යාමප්‍රභා සහවා ගෙණැ සඳස්පිල් හකුළුවා ගොදුරුබිම්හි යන ස්වර්ණමයූරරාජයා සේ තුන්යොදුන් මහට බැසැ ඒ සොරහු වසන වල්කඩට නුදුරුතන්හි හෝතෙරකට පැමිණියෝ ලු.

මහතැහි[1] දුටුදුටු දර ගෙණෙනුවෝ තණ ගෙණෙනුවෝ ඔවුන් දක, "වහන්ස, ඒ මග නො වැඩියැ මැනැව. ඒ නුඹ ඉදිරියේ වල්කඩැ මවුන් නො හඳුනන පියන් නො හඳුනන ශ්‍රමණබ්‍රාහ්මණයන් නො[2] හඳුනන මෙලෝපරලෝ නො දන්නා දුටුදුටුවන් මරා ඇඟිලි කපා එයින් මාල ගොතා කර ලන කප්ගින්නක් සේ රළු වූ අංගුලිමාල නම් සොරෙක් ඇත. ඒ වාතවෙගයෙන් දිවන අසුනුදු ලුහුබඳවා ගන්නේ ය. මෙසේ සංසිඳී වඩනා නුඹ අයත්නයෙන් අවුත් මරා ඇඟිලි කපා ගත නපුර. නැවැත්ත මැනැවැ"යි කියත් ලු.

බුදුහු තමන් නො හැඳිනැ කියන ඔවුන් බස් අසා "වටු වැ ගිනි නිවුම්හැ. සහ වැ ගිනි හෙල්මැලිකලප් කළම්හැ. සිටු වැ ගින්නෙහි පියුම් පිප්පූම්හැ. මුව වැ ගිරා වැ හංස වැ මොනර වැ බැඳූවන් ලවා මැ අප ඇතුළු වූ ලොවට අභය දෙවූම් හැ. කැහැ රොළ වැ පවා ව්‍යාඝ්‍රයන් උගුරට වැදූ යෙහෙන් ගැලවෙන උපාදතුම්හැ. උස්ගලින් හුනු තන්හි තිරිසන්ගොයින් තමන් පිටින් පිළිගෙණැ සුවපත් කළම්හ. මැදමුහුදැ හී මණිමෙඛලා නම් දෙව්දුව තනමඩලෙහි සැතැපුනුම්හැ මහෞෂධ වැ එක්සතක්හු ඇඟින් මැස්සක බොන ලෙහෙ නො සොල්වා අටළොස් අක්ෂෞහිණියක් පමණ සෙනඟ මන්ත්‍රණයෙන් බුනුම්හැ.[3] කුසරජ වැ මතැත්පිටට පැනැ නැඟී "මම යැ සිංහස්වර කුසරජ" යි හඬ ගහා අප අත් පෙළුැ හඬ දසදහසක් යොදුන් දඹදිවැ පතුරුවා සතුරුරජදරුවන් සත්දෙනෙකුන්ගේ සිවුරහසෙනඟ බිම්හැපිළියා[4] කළම්හැ. වඳුරු වැ අප කන්නට ආ උදකරාක්‍ෂසයා ඇස් ගොළු[5] ගොළු කොට සිටියැ දී ඔහුගේ විලට නො බැසැ හුණනළින් පැන් බී ගැලවුනුම්හ. විදුරපණ්ඩිත වැ සැටයොදුන් පමණ කාලපර්වතයෙහි අප හිස් පැහැර කඩා ලය පළා හදවත් ගන්නට සිතූ පූර්ණභද්‍ර නම් යක්‍ෂසෙනාධිපතිහු

1. මහවතෙහි. 2. පෙර ම නො. 3. තන්ත්‍රබුනුම්හ-සමහර
4. මු. බිඳලූම්ම. 5. ගොළිය ගොළියා-සමහර

Non-Commercial Distribution

මුදුනට අප පා මුදුන් මල් කළම්හ. පඤ්චායුධකුමාර වැ සිලෙසලොම නම් යක්‍ෂයා මත් බිඳ අප කුලගැති කළම්හ. සුතසොමරජ වැ සියලු දඹදිව් රජදරුවන් අත් විද නුගගසැහි අවුණා අප හා ඇතුළත් වූ ඒ සියලු රජදරුවන් මරා යක්හට බිලියම් කරන්නට සිටි පොරිසාදයාට බණ කියා ඔවුන් ඒ ජාතිය මුළුල්ලට හුදී කොට කන මිනීමස් හැර වූම්හ. මේ අප කෙළේ නො මුහුකළ නුවණින්. මුදුන්පත් නො වූ පරාක්‍රමයෙන්. දැන් වනාහි දෙවාතිදෙව වැ ශක්‍රාතිශක්‍ර වැ බ්‍රහ්මාතිබ්‍රහ්ම වැ සිටියමු. ගොස් ආවක් මැ දකුම්හ''යි සිතා හොය පැනැ වල්කඩට නැඟී වැඩියෝ ලු.

එවේලෙහි කඩුව බිමැ ඔබා එකක් අඩු දහසක් ඇඟිල්ලෙන් මාලාවක් කර ලා සිටි අංගුලිමාලයා "මම ඉතා මිනිසුන් ලුහු බඳවා දිවැ විඩා වැ ගියෙමි. බොහෝකලක් නො නෑමෙන් කිලුටු වැ ගිය ශරීර ඇත්තෙමි. අදට මා පිරුව මනා දහසක් ඇඟිල්ලට අඩු එක ඇඟිල්ලෙකැ. එහෙයින් මා වැදූ මවුපියනුදු දිටිම් නම්, මේ කඩුයෙන් දෙකඩ කොට ඇඟිලි කපා දහස පුරා ගුරුපූජා කෙරෙමි''යි සිතසිතා සිටියේ, දුර වඩනා මහණරුව දැකැ සතුටු වැ "මා විඩා වැ ගිය අතට දිවියැ නො හෙන මහණකු සම්භව වූ සේ ඉතා මැ යහපතැ. මාගේ ස්වරූප නො අසා දේ මරහු කටට වදනා එකක්හු සේ මේ මහණ තෙමේ මැ හමු වී යැ. ගොස් මරා ඇඟිලි කපා ගන්මි''යි ලුහුබැඳ ගත.

එසදෙහි බුදුහු රාහුඅසුරිඳු දිවැ ගත ද තමන්ගේ ගමනින් යන සඳ සේ තමන් වඩනා සත්පුන් ගමනින් මැ වඩිති. "කඩු ගත් සොරෙකැ. හෙ ද මහබලවතැ. අප මරම්හ යන අදහසින් මැ දිවේ''යි යන සැකයක් නො කට පස්සෙහි තමන්වහන්සේගේ පාත්‍රය අල්වා ගෙණැ වඩනා අනඳමහතෙරුන් වහන්සේ කෙරෙහි යම් සේ සැකයක් නැද්ද, එසේ මැ සැක නැති වැ සෙමෙන් වඩිති.

සොර වාතවේගයෙන් දිවන්නේ ද හඹා ගත නො හේ ලු. ඔහු දිවැ ගෙණැ ගොස් එක්පියවරක් දෙපියවරක් තබා ගියසඳ මහපොළොව හෝ කඩා ගෙණැ ගොස් අසූ අනූ රියනක් පසු බහවා පියයි. නැත, බුදුන්වහන්සේ හා ඔහු හා දෙමැද අවීචිමහ නරකය සේ වූ වළෙක් හෝ පැණී යෙයි. මහමෙර සේ උස් ගලෙක් හෝ පැණී යෙයි. දිවැ විඩා වැ කට වියළී ගොස් නහවා ගෙණැ වැගිරෙණ ඩහදියකඳින් තෙමී ගොස් විස්මය පත් වැ "මේ මට පෙර වූවිරු දෙයෙක් නො වෙයි. පෙර මම වාතවෙගයෙන් දිවන සෛන්ධවයන් සිසාරා අවුරා

Non-Commercial Distribution

තුන්සතරවටෙකැ දිවැ පියා අල්වා ගෙණැ පොළොව අප්‍රලාපියමි. අද මා පෙරැ දිවන ජවයට ශතසහස්‍රගුණයෙන් වඩාත් දිවන්නේ[1] නමුදු, මෙ විය දඬක් පමණ තැනින් වඩා නො බලා පියවරින් පියවරට මිහිකත සනහසනහා මෙසේ සෙමෙන් යන මහණහු හඹා ගත නො හෙමි. මේ කිමෙක් දෝ හො"යි විස්මයෙන් සිටැ,[2] නැවැත ගොස් "මහණ, නො යා, සිට "යි කී යැ.

එවේලෙහි බුදුහු "මේ වේලෙහි මොහුගේ ජවය ද දපීය ද සිඳී ගියේ යැ. මෙවිටැ මා මොහු හා බණන්නට සුදුසුකලැ"යි සිතා වදරා "ඇපි සිටියම්හ. තෝ සිට"යි වදළාහැ. එබස් ඇසූ සොරතෙම 'මහණ, තපස්විහු නම් බොරු නො කියන්නාහැ. තෝ යෙමින් සිටැ මා සිටි තැනැත්තවුට කුමක් පිණිස 'ඇපි සිටි යම්හ තෝ සිට'යි කියයි ද?" යි බිණී යැ. එබස් ඇසූ ස්වාමිදරුවානෝ "මෙවිටැ මා වූ නියාව හඳුන්වා බණ කියම්හ[3]" සිතා වදරා මතැතක්හු පෙරළී සිටිනා සේ පෙරළී සිටැ "බණ කියමි" සිතු සිත හා එක් ව මැ නොයෙක් වර්ණයෙන් යුක්ත වූ සිතියමින් ගැවැසී ගත් පෙත්තක් විදහා පා ලන්නා[4] සේ සර්වාඞ්ගයෙහි සහවා ගෙණැ වැඩි දෙතිස් මහාපුරුෂලක්‍ෂණ අශීත්‍යනුව්‍යඤ්ජනකෙතු මාලාව්‍යාමප්‍රභා, එක පැහැරැ සඳස්පිල් විදහන ස්වර්ණමයූර රාජයා සේ, එක පැහැරැ විදහා බුදුරුව දක්වා ඔහු ඇස් නිවා, දල්වූ ශ්‍රීමුඛයෙන් නික්මුනු සුගන්‍ධයෙන් සියලු වනලැහැබ එක සඳුන්කරඬුවක් සේ එකකපුරුවිතක් සේ සුවඳ කෙරෙමින්, වන දෙවතාවන් කරණ සාධුකාරයෙන් සියලු වනය එකකොලාහල කෙරෙමින් බණට පටන් ගත්හැ.

ඒ මිහිරිරුව ඇසැ හෙත්[5] මැ, ඒ මිහිරි හඬ කණැ හෙත් මැ දකුණතින් ගත් කඩුව බිමැ වැටී හෙනබව් නො දනැ, වමතින් ගත් පලහය වැටී හෙනබව් නො දනැ, දෙක දෙඅතින් හෙළා ශ්‍රීපාදයෙහි වැඳ වැතිරැ ගොස් "දතිමි ස්වාමීනි, හැඳින්නෙමි ස්වාමීනි, මහාමායාදෙවීන්වහන්සේගේ පුතනුවන්වහන්සේ නුඹ ද? සුද්ධොදන රජ්ජුරුවන්වහන්සේගේ පුතනුවන්වහන්සේ නුඹ ද? ගැත්තවූ කරණ පව් ස්වාමීන් ඇසට පැණිනි ද? මෙතෙක් තැන් වැඩියේ හුදකලා ගැත්තවූ කෙරෙහි කළ කරුණායෙන් ද? දිවිපමණින් සරණ වන්මි. ඇස නිවී ගියේ[6]. සිත සැනහී[7] ගියේ. කළ පව් ගෙවී ගියේ. ගැත්තවුට කරුණා කොට වදළ මැනැවැ"යි යත්[8], ස්වාමිදරුවානෝ සන්‍ධ්‍යාවලාපටලයෙකින්

1. දුවන්නේ. 2. සිටී. 3. කියමි. 4. විදහා ලන්නා 5. මු 11 වැකෙත්
6. ගියේය 7. සැහවී 8. කියැ එවේලෙහි-ඇතැම්

Non-Commercial Distribution

විදුලියක් ඇද ගන්නා සේ, තමන් පෙරෙව් රත්සිවුර යටින් රත්වන් ශ්‍රීහස්තය ඇද ගෙණ දික් කොට "මහණෙනි, මෙසේ එ"යි යෙත් ල. වදළ බස හා සමහ මැ ඉන්ද්‍රජාලයෙක්හි රුවක් පෙණී ගියා සේ අංගුලිමාලයන් ඇහැ මහණරුව පෙණී ගියේ.[1] කෙසේ වූ සත්හුත්කමෙක් ද? කෙසේ වූ විනීතකමෙක් ද? ස්වාමිදරුවෝ තමන්වහන්සේගේ පාත්‍රචීවර උන් අතට දීලා තුමූ පළමු වැ ගෙණ උන් පසු කොට ලා, අළුතැ පියාසර උගන්නා ගරුඩපෝතකයා පස්සෙහි ලාගෙණ අහස්හි නික්මුනු යෙළසියක් යොදුන් ගරුඬරාජයා සේ, සිංහපොතකයක්හු පස්සෙහි ලාගෙණ නික්මුනු කෙසරසිංහරාජයක්හු සේ ඇත්පොව්වකු පස්සෙහි ලාගෙණ නික්මුනු මදයෙන් මනොඥ වූ ගමන් ඇති ෂඩ්දන්ත හස්තිරාජයා සේ, පස්සෙහි ගල්වතට පළමු වැ නික්මුනු සත්රුවන් මහනැවක් සේ සිතූ සිත මස්තකප්‍රාප්ත කොට ගෙණ ජෙතවන විහාරයට වැඩැ ක්‍රමයෙන් ඔවුන් රහත් කොට ඔවුන් බිණූ පිරිතින් පස්වාදහසක් මුළුල්ලෙහි කෙළලක්‍ෂයක් සක්වළට ආඥ පවත්වා සත්ත්‍වයන් දුකින් ගලවති. මෙසේ බණ කියා ගැලවියැ යුතු සත්ත්‍වයන් නිරුදුකින් ගලවා අමාමහනිවන්හි ලන සේ දන්නා බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 94.

තව ද, තමන්වහන්සේ කෙරෙහි නිෂ්කාරණයෙහි වෛර බැන්ද වූ දෙව්දත්හු තමාගේ නුනුවණින් "බුදුන් මරා බුදු වෙමි" යි සිතා අජාතශත්‍රු රජ්ජුරුවන් පහදවා ගෙණ 'තමන්වහන්සේ විදිනට යැ"යි කියා දුනුවායන් මෙහෙයූ කල්හි, ඔවුන් තමන් වහන්සේගේ බණ අසා අමාමහනිවන් දුටු කල්හි, එසේ ද සිතැ ඇත්ත සාධා ගත නො හී, තව ද, ගිජ්ඣකූටපර්‍වතයෙහි සක්මන් කරන්නා වූ තමන්වහන්සේගේ සිගාවට මහත් ගලක් පෙරළා, එ ගල සිගාවට ආසන්න වූ කල්හි මහපොළොව පළාගෙණ දෙගලක් නැඟී, හෙන ගල නො හියැ දී ආකාශයෙහි මැ රඳවා උපද්‍රව නො වියැ දුන්කල්හි, හැම පරිද්දෙන් මැ තමා සිතැ ඇත්ත සාධා ගත නො හී "බුදුගුණ නො දන්නා බුදුරුවෙහි[2] රස නො දන්නා යහපත නො දන්නා මදයෙන් තමා නො හඳුනන තිරිසනක්හු ලවා ඔවුන් මරවමි" යි සිතා අජාතශත්‍රු රජ්ජුරුවන් කරා ගොසින් "මහරජ, තෙපි තොප සිතැ ඇත්ත සාධා තොප පිණැති හෙයින් පියාණන් මරා රජ වූහැ. අප පින් මඳහෙයින් බුදුන් මරා බුදු වියැ නො හෙන්නමු ඇපි වමෝ ද"යි මැසවිලි[3]

---

1. ගියේ යැ. 2. බුදුරුවනෝ-ඇතැම්. 3. මැසිවිලි

Non-Commercial Distribution

කියා, රජ්ජුරුවන් විසින් "වහන්ස, එයට කට හැකි කිම් ද? නුඹ[1] මැ හිසට පෙරළා ලූ ගල් පොළොවින් දෙගලක් නැඟී පිළිගත. අප යවු දුනුවාවෝ[2] භයාගත් හීදඩු හැරපියැ නො හී සිතියමැ ඇන්දු සේ සිටැ ඔවුන්ගේ බණ අසා අමාමහනිවන් දුටහැ. අපත් නුඹත් කළ යත්නයෙන්[3] තුබූයෙක් කිම් ද? ඉනිබ්බ කීවක් කරම්හ"යි කී කලැ "මහරජ, එසේ නො වෙයි. ඒ ශ්‍රමණ ගෞතමයෝ දුටුදුටුවන් ඇස් නිවාපියැ හෙන, විදිවිදියන් සිත් පිණවාපියැ හෙන රූපයක් ඇත්තාහැ. එහෙයින් ඇස් ඇති මිනිසෙක් ඔවුන්ගේ රුව බලබලා උන්ට ද්‍රොහයක් කට නොහෙයි. තොපගේ නාලාගිරි නම් මතැත් බුදුගුණ නො දන්නි. බුදුරුවෙහි රස නො දන්නි. දූන් මද හී සිටියේ. ඔහු උන් සිහා වඩනා මහැ මෙහෙයා මරවා ගණුම්හැ"යි රජ් ජුරුවන් ගිවිස්වා ඇත්ගොව්වන්ට සම්මත[4] කරවා ඔවුන් අත අල්වා ගෙණැ රජගෙන් පිටත් වැ "අප සිතැ ඇත්ත සාධා දුන් කලැ, තොප සිතැ ඇත්තක් සාධා දෙන්නට අප පොහොසත් බව දන්නවූ[5] ද? සෙට ශ්‍රමණගෞතමයන් මැරුව හොත්, රජ්ජුරුවන්ගේ සේසත තබා ඉතිරි කැමැතියක් ඉල්වා දෙම්හැ. පෙර ඇතු බොන රා අට කළයට දන් දියුණු සොළොස්කළයක් පොවා මත් කොට කොහොලින් ඇනැ කුප්පා බුදුන් සිහා වඩනා මහැ මෙහෙයා උන් මරවා අපගේ මනෝරථය සිද්ධ කරව"යි ගිවිස්වූහැ. ඒ අසා ඇත්ගොව්වෝ සෙට අප කරණ දක්කම් බලා සිටියැ මැනැවැ"යි සැහැසී ගෙණැ ඇත්හලට ගියහැ.

එබස් ඇසූ උපාසකවරහු වෙළුවනමහාවිහාරයට ගොස් සිවුවණක් මහපිරිස්මද්‍යයෙහි අසාධාරණ වූ බුද්ධවිලාසයෙන් සියලුලොව සනහමින්, අසන කණට සුව කොට, විඳුනා සිතට මිහිරි කොට, ඉහලොක දක්වමින්, පරලොක දක්වමින් නිවන් මඟ හෙළි කරමින්, මහාකරුණායෙන් යොද, මහාප්‍රඥයෙන් සියුම් කොට, වදරණ බණ අසා නිවී සැනහී, ශ්‍රීපාදනබරශ්මි නමැති අමාහැල්ලෙහි ගැලී වැඳ ගෙණැ හෙවැ එකත්පස් වැ සිටැ "ස්වාමීනි, දන්වන්නෙක් ඇතැ"යි කියා "කියව"යි කීකලැ "දෙව්දත්හු අජාසත් රජ්ජුරුවන් පහදවා ගෙණැ සෙටැ නුඹ වහන්සේ සිහා වඩනා මහට නාලාගිරි නම් ඇත්හු මෙහෙයෙති. ඒ ඇත් මද හී සිටියේ චණ්ඩ යැ. පරුෂ යැ. බුද්ධරත්නය, ධර්මරත්නය, සංඝරත්නය යන ත්‍රිරත්නය නො හඳුනයි. ස්වාමීන්ගේ ආනුභාව දන්නා

1. ඔහු-ඇතැම්. 2. දුනුවායන්-හැම.
3. කරණ යත්නයෙන්-සමහර
4. සම්මාන. 5. දන්නවා

Non-Commercial Distribution

කෙනෙකුන් වුව හොත් හික්මවා ගැන්ම ස්වාමීන්ට පිළිවන්බව දනුම්හ. මේ වූ කලි මදයෙන් අන්‍ධ යැ. මෙ තිරිසනැ. ගැත්තවුන් සෙනහයෙන් පක්‍ෂපාත කමින්[1] දන්වන බස්බැවින් සෙට සිහා නො වැඩැ විහාරයෙහි මැ වැඩැ හිඳ ගැත්තවුන් ගෙණා දන් මොබැ දී මැ වළඳනබව යහපතැ"යි දන්වූහැ.

එබස් අසා ස්වාමිදරුවානන්වහන්සේ "සෙට මුළුලොවට අපූර්‍ව වූ බුද්ධශ්‍රීයක් පහළ වන වනැ.[2] බොහෝදෙනා මා කරණ පෙළ හැර දකැ අමාමහනිවන් දක්නාහ"යි නියත කොට, නො බැණැ මැ ඉවසා උපාසකවරුන්ට සමු දී වදරා, රාත්‍රියෙහි දිව්‍යබ්‍රහ්ම නාගසුපර්‍ණයන්ට බණ වදරණවේලෙහි බණ වදරා, සක්මන් කරණ වේලෙහි ශ්‍රීපාදයෙහි නියරස්ධාරා නැමැති අමායෙන් මහ පොළොව සනහසනහා සක්මන් කොට, සිංහශය්‍යාවෙන් යහනැ වැඩැ[3] හෝනා වේලෙහි යහනෙක්හි තබා ලූ රන්පිළිමයක් සේ නො සෙල්වී වැඩැ හෙවැ සැතපී. සුවිසිකෙළලක්‍ෂයක් මහා කරුණාසමාපත්තියට සමවැද නැඟී, "මාගේ ධර්‍මදෙශනා අසා නිවන් දක්නෝ කවුරු දෝ හෝ!"යි එදවස් වන ලොකාත්‍ර්‍ථිය නිශ්චය කොට වදරා, අනඳමහතෙරුන්වහන්සේ කැඳවා "ආනන්‍දය, අද මම මහාසඞ්ඝයා පිරිවරා සිහා යෙමි. මේ වෙළුවනවිහාරය සිසාරා සිටි අටළොස් මහාවිහාරයෙහි මහණුන් මා හා කැටි වැ එන්ට කියව"යි වදළසේකැ.

එබස් ඇසූ අනඳමහතෙරුන්වහන්සේ විහාරයෙන් විහාරයට ගොස් "ස්වාමිදරුවෝ 'අද මහාසඞ්ඝයා පිරිවරා සිහා වඩුම්හ'යි වදළසේක. එබැවින් හැමදෙනා වහන්සේ මැ වෙළුවනවිහාරයට රැස් වුව මැනැවැ"යි වදළසේක. එබස් අසා සන්නාහ ලූ මත්තහස්තීන් සේ මහාශ්‍රාවකයෝ වෙන වෙන මැ කැටි වන්නට වන්හ.

1. සහම්පතිමහාබ්‍රහ්මයාගේ ආරාධනා පිළිගෙණැ මහාබොධියෙන් නික්මැ බාරාණසියට වැඩැ ඉසිපතනවිහාරයෙහි අග්‍රධර්‍මාසනයෙහි වැඩැ හිඳ වදළ බණ අසා පළමු වැ අමාමහ නිවන් දුටු පැවිද්දෙහි මහල්ලන් කෙරෙහි අග්‍ර වූ, තමන් ගුණ සිතුවන්ට අමාමහනිවන් දෙන්නට පොහොසත් අඤ්ඤකොණ්ඩඤ්ඤ මහතෙරුන්වහන්සේ. "අප පියාණන්ට මෙහෙයෙන මතැත්හට ඇපි මැ සිංහවිලාස දක්වම්හ"යි සැරහී විහාරයට වැඩිදැ ය.

---

1. පක්‍ෂපාතයෙන් 2. පහළ වනැ.
3. වැද.

Non-Commercial Distribution

2. බුදුන් හැර සෙසු නුවණැත්තන්ට අග්‍රභෙයින් අගතැනැ සිටුවනලද, තමන් වසන දිශාව වැන්දවුන්ට අමාමහනිවන් දෙත්. පොහොසත් වූ ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ "ඒ ඇත්හුගේ මදජලය වියලත්, අපගේ තෙජස මැ කප්කෙළවර හිරු කොට තකම්හැ"යි සැරහී වැඩිසේක.

3. ඎද්ධිමතුන්ට අගතැනැ තබනලද, තමන් නම කීවන් සතර අපායෙන් ගලවන්නට පොහොසත් ද්විතීයශ්‍රාවක මුගලන් මහතෙරුන්වහන්සේ "එ ඇත්හුගේ තෙජස් නැමැති කදේපැණියාගේ ප්‍රභාව නැති කරත්, අපගේ මහත් වූ ආනුභාව නැමැති ශරත්සූය්‍ර්‍යමණ්ඩලය තකම්හැ"යි සැරහී වැඩි සේක.

4. ධුතාඞ්ගධරයන් කෙරෙහි අගතැන් ලද කුඩුමුසු කැඳිත්තක් එළවූ මැහැල්ලට දිවසැපත් නිවන්සැපත් දී සැනහූ මහසුප් මහතෙරුන්වහන්සේ "ඒ ඇත් නැමැති පළහහු දවන්නට අපගේ තෙජස් නැමැති මහගිනිකඳ තකම්හැ"යි සැරහී වැඩිසේක.

5. දිවැස් ඇත්තවුන් කෙරෙහි අගතැන් ලද්, ශක්‍රයාගේ මුදුනෙන් අදනාලද ශරීරමලභාජන ඇති, තමන් නම සතර අකුරෙන් සතරඅපාය පසු බස්සන අනුරුද්ධමහතෙරුන්වහන්සේ ඒ ඇත්හුගේ දප් නැමැති මහගිම් නිවන්නට තමන්ගේ මෛත්‍රී නැමැති මහාමෙඝය තකමින් සැරහී විහාරයට වැඩි සේක.

6. කුලෙන් වැඩියන් කෙරෙහි අගතැන් ලද්[1], තමන් නම තුන්අකුරෙන් තුන්ලෝසැපත් අත්පත් කරන්නට පොහොසත් භද්දිය නම් මහතෙරුන්වහන්සේ "ඒ ඇත් නැමැති මහඅඳුරුකඳ බිඳිනට අපගේ මෙත්සිත් නැමැති සඳපහන මැ පමණැ"යි සැරහී විහාරයට වන්සෙයෙක.

7. මිහිරි කටහඬින් බණ කියන්නවුන් කෙරෙහි අග්‍ර වූ, කුල සංසඟී[2] විෂ හරණ ඖෂධසටිකාවක් බඳු ලකුණ්ටකභද්දිය නම් මහතෙරුන්වහන්සේ "එ ඇත්නැමැති ඉඳුනිල්මැණික විදිනට ඇපි මැ විදුරක් වැන්නම්හැ" යි කියා සැරහී වැඩිසෙයෙක.

8. සිංහනාද කරන්නවුන් කෙරෙහි අග්‍ර වූ, සිහි කළවුන් සිතැ අමා ලන පිණ්ඩොලභාරද්වාජ නම් මහතෙරුන්වහන්සේ "එ ඇත්හුගේ දළදප් ඔබා ඇපි මැ ධම් සිංහනාද කරම්හ"යි බැහැවී වැඩිසෙයෙක.

---

1. අගතැන්පත්ලත් සමහර.
2. කුලසංසාර බොහෝ.

Non-Commercial Distribution

9. ධම්කථිකයන් කෙරෙහි අගතැන්පත්, සිතුවන්සිත් සනහන පූණිචන්ද්‍රයක්හු වැනි මන්ත්‍රාණීපුත්‍රපූණී නම් මහ තෙරුන්වහන්සේ "එ ඇත් නැමැති පුළුන්පෙද ගසා දමත් අපගේ මහානුභාව නැමැති වාතය මැ තකම්හැ" යි සැරහී වැඩිසෙයෙක.

10. සංක්‍ෂෙපයෙන් කී දැයෙහි අර්ථ විස්තරයෙන් දන්නවුන් කෙරෙහි අග්‍ර වූ, සරණ ගියවුන් මනදෙළ පුරණ කප්රුකක් වැනි මහකසයින්-මහතෙරුන්වහන්සේ "එ ඇත්හු පසු බස්වත්, අපගේ ආනුභාව මැ විදුරු අකුසු කොට තකම්හැ"යි සැරහී වැඩිසෙයෙක.

11. එක ශරීරයෙන් බොහෝ මනොමයශරීර නිමවා සියදහස් ගණන් සේ පැණී යන්නවුන් කෙරෙහි අගතැන් පත් වූ, තමන් ගේ ශ්‍රීපාදයෙහි රජස් දෙව්බඹුන් මුදුනෙහි ධාතුනිධාන කළ චූල්ලපන්ථක නම් මහතෙරුන්වහන්සේ 'එ ඇත්හුගේ සාහස නැමැති පරඬලාපත්හි අපගේ මහිමය මැ ගිනි ගෙණෑ දිලියෙන යනාරාව කරම්හැ"යි සැරහී වැඩි සේකැ.

12. සංඥා පෙරළීමෙහි දක්‍ෂයන් කෙරෙහි අගතැන් පැමිණි බුදුසසුන් නැමැති මහවිල්හි රාජහංසයක්හු බඳු මහාපන්ථක නම් මහතෙරුන්වහන්සේ එ මතැත්හුගේ වික්‍රම නැමැති තණපත සුණුවිසුණු කරත්, තමන්-වහන්සේගේ ශීලතෙජස මැ ගිනිසෙණ කොට තකා සැරහී වැඩිසෙයෙක.

13. දක්ෂිණාවට සුදුස්සවුන් කෙරෙහි අගතැන් පත් වූ, තමන්ට ලූ එකබත්සරළුවක් විවරකින් අමාමහනිවණට අභි[1] කරණ සුභූති නම් මහතෙරුන්වහන්සේ එ මතැත්හු සර්වඥයන්ගේ ශ්‍රීපාදය වැදවීම්හි ශික්‍ෂා කරණ ශික්‍ෂාකාරිධුරයට තමන් වහන්සේ මැ තකා වැඩි සේකැ.

14. වල්වාසයෙහි වසන්නවුන් කෙරෙහි අගතැන්පත් වූ, බුදු සසුන් නැමැති මහරුක්හි හටගත් සුහුඹුල් සුවඳ මල්කැනක් බඳු ඛදිරවනියරෙවත මහතෙරුන්වහන්සේ ක්‍රොධයෙන් දිවූ එ මතැත්හු මුහුණ වසා හෙළන්නට තමන්වහන්සේගේ ඍද්ධිය මැ මුඛපටට කොට තකා සැරහී වැඩිසේක.

15. ඣායීන්[2] කෙරෙහි අගතැන් පත් වූ, බුදුසසුන් නැමැති කෙවුන්නෙහි බඳ පද්මරාගමාණික්‍යයක් බඳු කංඛාරෙවත නම් මහතෙරුන්වහන්සේ එ මතැත්හු බුදුන්වහන්සේට ළඟ නො වන්නට තමන්වහන්සේගේ වික්‍රමය මැ මහකණයමක් කොට තකා සැරහී වැඩි සේකැ.

---

1. මු II අග්‍ර. 2. මු II ඣානලාභීන්. කවීන්-සමහර

Non-Commercial Distribution

16. අධික වූ වීර්‍යය ඇත්තවුන් කෙරෙහි අගතැන්පත් වූ, බුදුසසුන් නැමැති ඔටුන්නෙහි බඳ අග්‍රමාණික්‍යයක් බඳු ශොණභද්‍ර මහතෙරුන්වහන්සේ එ මතැත්හුගේ ද්වෙෂ නැමැති විෂය නසන්නට තමන්වහන්සේගේ ආනුභාවය මැ දිව්‍යඖෂධ කොට තකා සැරහී වැඩිසෙයෙකැ.

17. මධුර වූ බස් බණන්නවුන් කෙරෙහි අගතැන් පත් වූ, බුදුසසුන් නැමැති ආකාශයට පූර්ණචන්ද්‍රමණ්ඩලය බඳු වූ කුටි කණ්ණසොණ-මහතෙරුන්වහන්සේ "එ ඇත්හුගේ දප් නැමැති සර්‍පයා ඔබන්නට තමන්වහන්සේගේ ප්‍රතාපය මැ ගරුඩරාජයා කොට තකම්හැ"යි සැරහී වැඩිසෙයෙකැ.

18. ලාභ ලබන්නවුන් කෙරෙහි අග්‍ර වූ, බුදුසසුන් නමැති රන්පියුම්හි කර්ණිකාවක් වැනි වූ, සීවලි නම් මහතෙරුන් වහන්සේ "ඒ ඇත් නැමැති පද්මය හකුළුවන්නට තමන් වහන්සේගේ ආනුභාවය මැ පූර්ණචන්ද්‍රමණ්ඩලය කොට තකම්හැ"යි සැරහී වැඩිසේකැ.

19. සර්වඥයන් කෙරෙහි සැද ඇත්තවුන් කෙරෙහි අග්‍ර වූ බුදුසසුන් නැමැති මහාසාගරයට රත්නමෙරුවක් වැනි වූ වක්කලි නම් මහතෙරුන්වහන්සේ එ ඇත්හුගේ දප් නැමැති මහවනය දවාපියන්නට තමන්වහන්සේගේ තෙජස මැ ලැව්ගිනි කොට තකා සැරහී වැඩිසේක.

20. අවවාද පිළිගන්නවුන් කෙරෙහි අග්‍ර වූ, බුදුරුවෙන් ඔබා ගත් හසක් වැනි, එ සර්වඥයන්ගේ ප්‍රියපුත්‍ර වූ රාහුල මහතෙරුන්වහන්සේ එ ඇතුගේ දප් නැමැති මහවිල අලළාපියන්නට තමන්වහන්සේගේ ශෞර්‍යය මැ මතැතක්හු කොට තකා සැරහී වැඩිසෙයෙකැ.

21. සැදැහැයෙන් මහණ වූවන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධශාසන නැමැති උදයපර්වතයට තරුණසූර්‍යමණ්ඩලයක් වැනි වූ රට්ටපාල නම් මහතෙරුන්වහන්සේ එ හස්තිහු දුර්වල කරන්නට තමන්වහන්සේගේ ශීලතෙජස මැ පාකල නම් හුණ කොට තකා සැරහී වැඩිසෙයෙකැ.

22. පළමු ලාබත් ගන්නවුන් කෙරෙහි අගතැන්පත් වූ, බුදුසසුන් නමැති රතනාකරයෙහි මහඇගිරුවනක් බඳු වූ කුණ්ඩධාන නම් මහතෙරුන්වහන්සේ එ මතැත් නැමැති හොමුවගුළුව[1] අනු[2] කරත් තමන්වහන්සේ මැ මහවතුරක් කොට තකා සැරහී වැඩිසේක.

---

1. මු & II. හෝහගුළුවා. 2. පහ.

Non-Commercial Distribution

23. ක්‍ෂණයෙහි යමක් සිතා ගන්නවුන් කෙරෙහි අගතැන් පත් වූ, ශාසන නමැති රුවන් ඇගෑයෙහි අග්‍රමාණික්‍යයක් වැනි වූ වංගීස නම් මහතෙරුන්වහන්සේ එ මතැත් නමැති මහමෙර සොල්වාපියන්නට තමන්වහන්සේ ප්‍රතාපය මැ යුගාන්ත වාතයක් කොට තකා සැරහී වැඩිසෙයෙකැ.

24. හැමපරිද්දෙන් ප්‍රසාද එළවන්නන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධශාසන නැමැති ක්‍ෂීරසාගරයට පූර්ණචන්‍ද්‍රමණ්ඩලය බඳු වූ, උපසෙන නම් මහතෙරුන්වහන්සේ එ මතැත් නමැති සූර්‍ය්‍යමණ්ඩලය වසාපියන්නට තමන්වහන්සේගේ තෙජස මැ රාහුඅසුරිඳු කොට තකා සැරහී වැඩිසේකැ.

25. සෙනසුන් පණවන්නන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධශාසන නැමැති වැටෙහි දිලියෙන්නා වූ මහාප්‍රදීපයක් වැනි වූ, දබ්බ නම් මහතෙරුන්වහන්සේගේ ඒ හස්ති නැමැති කිමි මත්ස්‍යයා ගලන්නට තමන්වහන්සේගේ ප්‍රතාපය මැ තිමිඞ්ගල නම් මත්ස්‍යරාජයා කොට තකා සැරහී වැඩිසේකැ.

26. දෙවතාවන්ට ප්‍රියයන් අතුරෙහි අගතැන්පත් වූ, බුද්ධ ශාසන නමැති මහාප්‍රාසාදයෙහි කැණිමඩලක් වැනි වූ, පිලින්දිවච්ඡ නම් මහතෙරුන්වහන්සේ එ මත්තහස්තිහුගේ කොප නමැති යක්‍ෂයාට තමන්වහන්සේගේ ප්‍රතාපය මැ දිව්‍යමන්ත්‍රයක් කොට තකා සැරහී වැඩිසේක.

27. වහා අභිඥා ලබන්නන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධ ශාසන නමැති මහාසාගරයෙහි දකුණුසකක් බඳු, බාහිය නම් මහ තෙරුන්වහන්සේ එ මතැත්හුගේ රොෂ නැමැති මහාව්‍යාධියට තමන්වහන්සේ මැ මහවෙදකු කොට තකා සැරහී වැඩිසේක.†

28. විසිතුරු කොට බණ කියන්නවුන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධශාසන නමැති වෘක්‍ෂශාඛාවෙහි බැඳි මධුපටලයක් වැනි වූ, කුමාරකාශ්‍යප නම් මහතෙරුන්වහන්සේ එ මතැත්හුගේ දපී නමැති පියුම්විල නසන්නට තමන්වහන්සේගේ මෛත්‍රිය මැ හිමකාලයක් කොට තකා සැරහී වැඩිසෙයෙක.

29. සිවුපිළිසිඹියාපතුන් කෙරෙහි අගතැන්පත්වූ, බුද්ධශාසන නමැති කාඤ්චනගුහායෙහි කෙසරසිංහයක්හු බඳු වූ, මහා කොට්ඨිත නම්

---

†'බාහිය' තෙරහු රහත් වූ නොබෝ වේලාවකින් පිරිනිවන් පෑහ . එහෙයින් මේ අවස්ථාවෙහි උන්වහන්සේ නො සිටියෝ ය. මේ විද්‍යාචක්‍රවර්තීන්ගේ ප්‍රමාදයෙකි.

Non-Commercial Distribution

මහතෙරුන්වහන්සේ එ මතැත්හුගේ තේජස් නමැති පහන වඩා[1] පියන්නට තමන්වහන්සේගේ ප්‍රතාපය මැ සැඩපවනක් කොට සිතා සැරහී වැඩිසේකැ.

30. බහුශ්‍රුතයන් කෙරෙහි, සිහිනුවණ ඇත්තවුන් කෙරෙහි, ප්‍රඥ ඇත්තවුන් කෙරෙහි, ධෛර්‍ය්‍ය ඇත්තවුන් කෙරෙහි, බුදුන් වහන්සේට උපස්ථාන කරන්නවුන් කෙරෙහි, අගතැන් පත් වූ බුද්ධශාසනයට ජීවිතයක් බඳු වූ, අනඳමහතෙරුන් වහන්සේ "බුදුන්වහන්සේට වන උපද්‍රව දුරු කොට තමන්වහන්සේගේ මැ ජීවිතය ඒ ඇතුට දෙමි"යි සැරහි වැඩිසේකැ.

31. මහාපරිවාර ඇත්තවුන් කෙරහි අගතැන්පත් වූ, බුද්ධ ශාසනයෙහි තබාලූ ඇසක් වැනි වූ, උරුවෙලකාශ්‍යප නම් මහ තෙරුන්වහන්සේ එ මතැත් නමැති මෙඝකූටය තමන්වහන්සේ අනු කොට ගෙණැ යන්නට තමන්වහන්සේගේ මහිමය මැ මහාවාතයක් කොට තකා සැරහී වැඩිසේකැ.

32. කුල පහදවන්නන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධ ශාසනයට තිලකයක් බඳු වූ. කාලුදායී නම් මහතෙරුන්වහන්සේ එ හස්තිමශකයාට තමන්වහන්සේගේ ප්‍රතාපය මැ දුම්කඳක් කොට තකා සැරහී වැඩිසේකැ.

33. නිරොගීන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධශාසන නමැති මලයපර්‍වතයෙහි සඳුන්රුකක් බඳු වූ, බක්කුල නම් මහතෙරුන් වහන්සේ එ මතැත් නමැති හිටිකඩ විරුවා[2] පියන්නට තමන් වහන්සේගේ තෙජස මැ ගිනිරාශියක් කොට තකා සැරහී වැඩිසෙයෙකැ.

34. පෙරැ විසූ කඳපිළිවෙළ බලන්නවුන් කෙරෙහි අගතැන් පත් වූ, බුදුසස්නට මුදුන්මල්කඩක් වැනි වූ, සොභිත නම් මහ තේරුන්වහන්සේ එ මතැත්හුගේ දප් නමැති හැල්කෙතට තමන්වහන්සේගේ තෙජස මැ මහානිදසයක් කොට තකා සැරහී වැඩිසෙයෙකැ.

35. විනයධරයන් කෙරෙහි අගතැන්පත් වූ, බුද්ධශාසන නැමැති මහාපර්‍වතයෙන් හුනු මාහැල්ලක් බඳු වූ, උපාලි නම් මහතෙරුන් වහන්සේ එ මතැත් නමැති අයශ්ශලාකාව තමන් වහන්සේ කරා හයාගන්නට තමන්වහන්සේගේ මෛත්‍රිය මැ චුම්බකපාෂාණයක් කොට තකා සැරහී වැඩිසෙයෙකැ.

---

1. වසා-ඇතැම්. 2. විසුරුවා

Non-Commercial Distribution

36. මෙහෙණින්නන් වහන්සේවරුන්දැට අවවාද කරන්න වුන් අතුරෙන් අගතැන් පත් වූ, බුද්ධශාසනයෙහි හදවතක් බඳු වූ, නන්‍දක නම් මහතෙරුන්වහන්සේ එ මතැත්හුගේ ශෞර්‍ය්‍ය නමැති සිතියමැ පැහැ නැති කරන්නට තමන්වහන්සේගේ මෙත්සිත් නමැති පොදපතර මැ තකා සැරහී වැඩිසේකැ.

37. ඉඳුරන් රක්‍ෂා කරන්නවුන් කෙරෙහි අගතැන් පත් වූ, බුදුසසුන් නමැති මහහිඹුල්රුක්හි ගරුඩරාජයක්හු බඳු වූ, නන්‍ද නම් මහතෙරුන්-වහන්සේ එ ඇත් නමැති යකඩ මොළොක් කරන්නට තමන්වහන්සේගේ තපස්තෙජස මැ මහගිනිඋදුනක් කොට තකා සැරහී වැඩිසේකැ.

38. වහන්සේවරුන්දට අවවාද කරන්නවුන් කෙරෙහි අග තැන් පත් වූ, බුදුසස්නෙහි කුළු ගැන්මක් බඳු, මහාකප්පින නම් මහතෙරුන්වහන්සේ එ මතැත්හුගේ දපී නමැති දියබුබුළු බිඳිනට තමන්වහන්සේගේ ප්‍රභාව නමැති මහාවජ්‍රය නො තරම් සේ සිතසිතා සැරහී වැඩිසේක.

39. තෙජොධාතුවෙහි දක්‍ෂයන් කෙරෙහි අගතැන් පත් වූ, බුදුසසුන් නමැති මහපියුමෙහි බඳ මුවරඳකඳක් බඳු වූ, සාගත නම් මහතෙරුන්වහන්සේ "එ ඇත්හුගේ දපී නමැති කෙහෙල්කඳට තමන්වහන්සේගේ ආනුභාව නමැති චක්‍රායුධය මැ ප්‍රමාණ යැ"යි තකා සැරහී වැඩිසේකැ.

40. පටිභාන ඇත්තවුන් කෙරෙහි අගතැන් පත් වූ, බුද්ධ ශාසන නමැති මෙසයෙහි ඉන්‍ද්‍රචාපයක් බඳු වූ, රාධ නම් මහ තෙරුන්වහන්සේ එ ඇත් නමැති බකමූණාට තමන්වහන්සේගේ තෙජස හිරුඋදයක් කොට තකා සැරහී වැඩිසේකැ.

41. රූක්‍ෂ වූ සිවුරු දරන්නන් කෙරෙහි අගතැන් පත් වූ, බුදුසසුන් නැමති ගිරිකුළෙහි මත්මොනරරජක්හු බඳු, මොඝරාජ නම් මහතෙරුන්වහන්සේ එ ඇත්හුගේ දපී නැමැති හෙල්මැලි කලඹ කපන්නට තමන්වහන්සේගේ මෛත්‍රීදෘෂ්ටිය මැ ඛඩ්ග යෂ්ටියක් කොට තකා සැරහී වැඩිසේකැ.

42. මෙයින් පිටත් වූ (බුදුන්වහන්සේ කෙරෙහි භක්තියෙන් යුක්ත වූ භද්දිය නම් මහතෙරුන්වහන්සේ යැ), මිහිරි වූ ආකප්ප ඇති වප්ප[1] නම් මහතෙරුන්වහන්සේ යැ, මහානුභාව ඇති මහානාම නම්

---

1. කප්ප හැම

Non-Commercial Distribution

තෙරුන්වහන්සේ යැ, පළමු ධම්සක්පවත්නෙහි සර්ඥයන්ගේ දෙශනාවිලාසයෙහි වැඩි රස දත් අස්සජිමහතෙරුන්වහන්සේ යැ, සංසාරව්‍යසනය වළකන ඵලකයක් බඳු වූ, නාලක නම් මහතෙරුන්වහන්සේ යැ, තුන්ලොව්හි පැතිර පවත්නා යශස් ඇති යස නම් මහතෙරුන්වහන්සේ යැ, නිමල වූ ගුණ ඇති විමල නම් මහතෙරුන්වහන්සේ යැ, සර්ඥයන්ගේ දක්ෂිණබාහුවක් වැනි සුබාහු නම් මහතෙරුන්වහන්සේ යැ, සම්පූර්ණ වූ ශාසනකෘත්‍ය ඇති පූර්ණජ නම් මහතෙරුන්වහන්සේ යැ, ලොකාධිපති වූ ගවම්පති නම් මහතෙරුන්වහන්සේ යැ, බුදුන්ගේ මහාප්‍රාතිහාර්‍ය්‍ය දැකැ තමන්ගේ අභිමාන හැර මහණ වූ ගයා කාශ්‍යප, නදීකාශ්‍යප දෙදෙනා වහන්සේ යැ, සුන්දර වූ ගුණ ඇති මහාචුන්ද තෙරුන්වහන්සේ යැ, සුභග වූ ගුණ ඇති භගු නම් මහතෙරුන්වහන්සේ යැ, සසරට බා නිවන් නැමැති බිලයට වන් කිම්බිල නම් මහතෙරුන්වහන්සේ යැ, සම්පූර්ණ වූ මනොරථ ඇති සුනාපරන්ත නම් ජනපදයෙහි වසන පූර්ණ නම් මහතෙරුන්වහන්සේ යැ,[1] ගුණයෙන් විශාල වූ අංගුලිමාල මහතෙරුන් වහන්සේ යැ, බුදුසස්නෙහි සූයෝර්‍ය්‍යාදයයක් වැනි වූ මහාඋදයි නම් මහතෙරුන්වහන්සේ යැ, මුළුලොවට අභය දුන් සභිය නම් මහතෙරුන්වහන්සේ යැ, සංසාරදෙෂ නැමැති මහාවාතයෙන් අකම්පිතශෛලයක් වැනි සෙල නම් මහතෙරුන්වහන්සේ යැ, පිරිසුදු වූ ගුණ ඇති උපවාණ නම් මහතෙරුන්වහන්සේ යැ, සියලු සත්ත්වයන්ගේ සිත් නමැති මහාමයූරයන්ට මෙඝයක් බඳු වූ මෙඝිය නම් මහතෙරුන්වහන්සේ යැ, සරණාගතයන්ට හිතවූ නාගිත නම් මහතෙරුන්වහන්සේ යැ, සංසාරයෙහි ඕජස් හළ යසොජ නම් මහතෙරුන්වහන්සේ යැ, ක්ලෙශයන් විසින් අජිත වූ අජිත නම් මහතෙරුන්වහන්සේ යැ, මෛත්‍රියට නිධාන වූ තිෂ්‍යමෛත්‍රෙය නම් මහතෙරුන්වහන්සේ යැ, නිරුපම වූ වර්ණ ඇති පූර්ණක නම් මහතෙරුන්වහන්සේ යැ, වසඟ කරණලද චිත්ත ඇති මෙත්තගු නම් මහතෙරුන්වහන්සේ යැ, දෙවියා වූ ක්ලෙශයන් ඇති ධොතක නම් මහතෙරුන්වහන්සේය, උපශාන්ත ඉන්ද්‍රියයන් ඇති උපසීව නම් මහතෙරුන් වහන්සේ යැ, ගුණයෙන් අලාමක වූ හෙමක නම් මහතෙරුන්වහන්සේ යැ, අවගුණයෙන් චොදනා නො ලද් තොදෙය්‍ය නම් මහතෙරුන්වහන්සේ යැ, සුන්දර වූ ගුණ ඇති නන්ද නම් මහ තෙරුන්වහන්සේ යැ, (පරිපූර්ණ වූ මනොසඞ්කප්ප ඇති කප්ප නම්) මහතෙරුන්වහන්සේ යැ, තමන්ගේ චරිතයෙන් කර්ණය සරහන ජතුකර්ණ නම් මහතෙරුන්වහන්සේ යැ, සියලු ක්ලෙශයන් නසන ආයුධයක් බඳු

1. සුනාපරන්ත නම් මහතෙරුන්වහන්සේ යැ ඇතැම්.

Non-Commercial Distribution

වූ භද්‍රායුධ නම් මහතෙරුන්වහන්සේ යැ, නිර්මල වූ ගුණොදය ඇති උදය නම් මහතෙරුන්වහන්සේ යැ, ජිනවචනයෙහි කුසල වූ පොසාල නම් මහතෙරුන්වහන්සේ යැ, (80) මධුර වූ ශ්‍රමණභඞ්ගි ඇති පිංගීය නම් මහ තෙරුන්වහන්සේ යැ යන අසූමහසව්වන්වහන්සේ හා සෙසු නිත්‍යපරිවාර පන්සියයක් භික්‍ෂූන්වහන්සේ සැරසී විහාරයට වැඩිසෙයෙකැ.

ඉක්බිති ඊයේ දවස් එපවත් ඇසූඇසූ නුවරවැස්සෝ දෙ කඩක් වැ බෙදී ගොසින්, අබෞද්ධපක්‍ෂය 'ශ්‍රමණගෞතමයෝ'' මෙතෙක් දවස් තමන්ගේ රූපයෙහි රසදන්නා තමන්ගේ ගුණයෙහි මිහිරි දන්නා මිනිස්සු යැ, දෙවිබඹහු යැ යනාදීන් අතින් යෙහෙන් ගැලැවී ආහැ. අද කලි මෙ මතැත්හු උන්ගේ ගුණ ද උන්ගේ රුව ද තමා තිරිසන් හෙයින් නො දන්නි. අද කලි මෙ ඇත් වනාහි ඒ බුදුන්ගේ රූපාග්‍රප්‍රාප්ත වූ ආත්මභාවය මහනෙල් මල්දමක් ගහටගහටා සුණුවිසුණු කරන්නා සේ සතර පාහස්සෙහි ලා මැඩැ සුණුවිසුණු කොට අත්පා වෙනවෙන තෝරා මැස්සක ගහටන්නා සේ ගහටා දමයි. අද අප සතුරානන් පිටු දකුම්හ''යි සැරහුනහැ. බුදුබල දන්නා ශ්‍රද්ධාසම්පන්නයෝ ''අද අපගේ ස්වාමි වූ තිලෝගුරු සම්‍යක්සම්බුද්ධයන්ට ඇතෙක් නම් කුමක් කෙරේ ද? ඥණබලයෙන් මුළුලොව දිනූහැ. කායබලයෙන් කෙළදහසක් ඇත්නට බල ඇත්තාහැ. දූන් සවාසනසර්වක්ලෙශයන් නසා බුදු වූ කල්හි තබා තමන් බුදුවන්ට බෝමැඩ වැඩැ හුන් දවස් පොවා තමන්ගේ ආනුභාවයෙන්, වසවර්තිමාරයා නැඟි යෙළසියයක් යොදුන් ගිරිමෙඛලා නම් මතැත්හු මද සිඳුවාපියා තමන් ශ්‍රීපාදයට නුදුරුතන්හි කෙසරසිංහයක්හු දුටු ජරායෙන් රොම වැම්මැ හී ගිය[1] මාලු කැණහිලක්හු සේ වෙවුලුම් ගන්වා දළ බිමැ අන්වා පිටැ හුන් මරහු මුහුණින් වැටී හෙන පරිද්දෙන් නැමී වඳනා වැඳුම් ගත්හැ. පාරිලීයක[2] නම් මතැත් අනඳමහ තෙරුන් වහන්සේ සේ ඔවුන්ට මෙහෙ කෙළේ ය. මෙ ඇත්හු අද තමන්ගේ ශ්‍රීපාදපද්මයට බට බමරක්හු පුඹුනා[3] පරිද්දෙන් ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පෑ, එහි පහන් බොහෝදෙනා අමාමහනිවන්හි ලති. අද එ පෙළහර බලම්හ''යි සැරහී ගත්හැ. සියලු මනුෂ්‍යයෝ සේමසේමතැනැ මැසිමත්තෙහි මැසි බඳිමින්, සඳලු සියදහස් පුරා නැඟෙමින්, පිටිසේනන්හි අතුරු සිදුරු නැති වැ හිඳිමින් මහරුක්උඩට නැඟෙමින්, පවුරුපදනම්පිටට නැඟෙමින්, මහාප්‍රසාද බිඳී නැමී යන පරිද්දෙන්' සමහරමැසි බිඳී යන පරිද්දෙන් පිරී ගොස්, දූන් පුතුන් කරැ හිඳුවා, නොයෙක් කුහුලින් සිට ගත්හැ. මැසි බඳනට ශක්ති නැත්තෝ මැසි ඇත්තවුන්ට මිල දෙමින් ඇහිලි

---

1. වැගිර ගිය-ආම්. 2. පාරිලී. 3. පුඹුනා.

Non-Commercial Distribution

කටැ ලාගෙණැ වදිමින් පිරිවුළුමැස්සෙහි සිටැ ගත්හැ. "එ මතැත්හු හරිතී" යන බසින් සියලු විපිය සෝධා පීවා සේ හැම මිනිස්සු මැ නැති වැ ගියාහැ. නොයෙක්පායිතින් සැරහී නත්වෙසතුරු තිර බන්ද ආප්තගැණු තත්හි තත්හි උඩුමල්හි සිටැ ගත්හැ. රජගහනුවර උඩුඅහස්හි සිතියම් කළ බිතක් සේ අනන්තාපයඝීන්ත දෙවතාවෝ සිටැ ගත්හැ සියලු නුවර යුගාන්තවාතයෙන් ඇලළී ගිය සුවාසුදහසක් යොදුන් මහා සාගරය සේ ඇලළී ගියේ, සප්තකුලපර්වතයන් මුලින් ඉපිරැ නැහෙන කෝලාහලයක් සේ එකකොලාහල වැ ගියේ යැ. "තවද කල් යේ නු"යි නො සිතු කෙනෙක් නැත. "අද නො වඩනා ද වනැ"යි නො සිතු කෙනෙක් නැත. ගැහැණුන් පිරිමින් හත්පලන් ආභරණයෙන් රන්රිදීකැටපත්හි හිරුරැස් ගැසීලා හුනු ආලොකයට "වඩනාහට පළමු කොට දිවන බුදුරස්කඳ දේ හො"යි නො ඉපිලැ හුනු එක ද කෙනෙක් නැත. එක් වටෙකැ වඩනා විහාරය දිශාව බලමින්, එක්වටෙකැ ඇතු එන ඇත්හල දිශාව බලමින්, "අද මෙයට බාධාවෙක් වේ දේ හො"යි මියුඩුහුරු[1] ලමින් නො සිටි එක ද කෙනෙක් නැත.

මෙසේ නුවර අසුරසෙනඟ ලුහුබඳවා පියා ජය ගෙණ දෙවතාවන් වන් ශක්‍රභවනයක් සේ ඇලළැ ගිය සඳෙහි සැදී පැහැදී ගිය සඳෙහි, කෙසුරුබර පොළාපියා නියෙහි මුවහත් බලා පියා සැක නැති වැ මතැතක්හු පිටට පනින පිණිස රුවන් ලෙනකින් නික්මැ ගත් කෙසරසිංහයක්හු සේ ද, දහසක් රස් අහසැ හිසැපියා සමුද්‍රජලස්කන්ධය බිඳ ගෙණැ පැනැ නැඟී එන වටින් යෙළසියක් යොදුන් ලහිරුවිමනක් සේ ද, ස්වාමිදරුවානෝ ගඳකිළියෙන් නික්මැ ගත්හැ. නික්මැ ගත්සඳ මැ සඟ මහලු පිළිවෙළින් බුදුරුවන පළමු කොට ලා සඟරුවන්පෙළක් වඩනට වන්සෙයෙකැ නායකමාණික්‍යරත්නය අනු කොට ගොතා හෙලා ලූ රුවන්වැළයක් වැන්නැයි නො කියමි. සොළොස් කලාවෙන් පිරුණු සඳමඩල ඉදිරියෙහි තබා පස්සෙහි පෙළ හෙළා පිහිටුවා ලූ තරුවැළයක් වැන්නැයි නො කියමි. පඞ්ක්තියෙහි සිටුවා ලූ දස දහසක් සක්වළ දසදහසක් සඳමඩුලු වැන්නැයි නො කියමි. දසදහසක් හිරුමඬලු වැන්නැයි නො කියමි. ශක්‍රදෙවේන්‍ද්‍රයා පස්සෙහි හුනු දෙවතාවෝ මා සිතට නො වදිති. දසඇඟිල්ලක් නඟා දසදහසක් සක්වළැ ආලොක පතුරුවන හාරිත නම් මහාබ්‍රහ්මයා පළමු කොට ලා නික්මුනු බ්‍රහ්මසෙනාව එ වඩනා බුදුරජානන් හා එ මහණපිරිසට උපමාවට මා තුඩ නො වකමි. මෙ උපමා කියා එ බුද්ධවිලාසයට නිඳ නො කෙරෙමි. මාගේ ස්වාමිදරුවානෝ තුමූ මැ තමන් වැන්නාහැ. මෙබඳු මහණපිරිසක්

1. මියෙඩුහුරු-ඇතැම්

Non-Commercial Distribution

පස්සෙහි ලා ගෙණ අවකිත වැ නුවරසීමාවට අභිමුඛ වැ තමන්ගේ ශරීරයෙහි සවණක් රස් එකවිට මැ විහිදුවා ලූහැ.

සක්වළගල මැඩැ ගෙණැ අකනිටාබඹලෝ පැනැ ගෙණැ මහපොළොව ඉක්මවා ගෙණැ දිවන සවණක් ඝනබුදුරසින් මුළු ලොව හැලළෙන්නට වන. මුළුලොව කසමල්කැනින් වසන්නාසේ, දියමෙරලියමලින් නවහම් කරන්නා සේ, මොනරපිලින් සදන්නා සේ, ඉඳුනිල්මැණිකින් අතුරන්නා සේ, නිල්රස්කදෙක් එක්ලක්‍ෂසූසැටදහසක් යොදුන් සක්වළගල හිස පැනැ ගෙණැ ඉතිරැ දිවන්නට වන. මුළුලොවැ කිණිහිරිමල් ඉස්නා සේ, පිරිසිදු යහපත් වැ පිපි සපුපෙත්තෙන් අහස වසන්නා සේ, දෙවියන් අනුභව කරණ මහදඹගසැ මුලැ නැඟි රන්දළුයෙන් මුළුලොව වසන්නා සේ දිවැ ගත් රන්වන්රස්පතරෙක් මහපොළොව රන්පිඩල්ලක්[1] සේ රඳමින්, මහාසාගරය විරුවාපු රන්රසයක් සේ රන්වන් කෙරෙමින්, සක්වළගල ගැසී හිස් පැනැ ගෙණැ, හැලි සිය දහස් සුවහස් ගල්මුදුනෙන් හෙළා පරසක්වළ දිවන්නට වන. බඳුවද කැල බඳු වූ, සන්ධ්‍යාවලාපටල බඳු වූ, සිඳුරකල්කයට අපහාස කරන්නා වූ, පද්මරාගමාණික්‍යයෙහි පැහැයට නින්ද කරන්නා වූ, රත්මහරස්කදෙක් නැඟී බුදුපුදයට බැඳ ලූ රත් වියනක් සේ මුළුලෝ අහස වසා සිටැ ගත. දවහත්තරු සේ, රිදී රසධාරා සියදහසක් සේ, සරත්වලාකැළ සියදහස් සේ සුදු වූ බුදුරස්කඳ දිවෙමින් ඇඹරෙමින් සළාවැටුම්[2] දෙමින් කපක් දවස් මුළුල්ලෙහි අඳුරු නුබූන් ලොකාන්තරිකනරකය ලක්‍ෂ ගණන් පහන් ඇවිළු වූ පහන්රුකක් සේ එකාලොක කෙරෙමින් දිවන්නට පටන් ගත. මඳටවන්පැ රස්කදෙක් මහමෙර රතිඳු ගොව්වකු සේ රත් කෙරෙමින් සප්තකුලපර්වතයන් බුදුන්ට පුද ලූ මඳටවළල්ලක් සේ එක පැහැරැ රත් කෙරෙමින්, බුදුගුණ පතුරා ගෙණැ, දසදිග් මැඩැ ගෙණැ, මුළුලෝකුස පුරමින් පැතිරෙන්නට වන. සියලු ලොව ඇති තාක් වස්තූන්ගේ නොඑක් පැ තාක් එක් කොට හනා අලළාපුවාක් වැනි වූ පබසරරස්කඳ තල්කඳ පමණ වැ, කුටාගාරප්‍රමාණ වැ, හුණකුලලින් පිඹැ නහාපූ සපා[3] කැටි සේ සියලු නුවර වසමින් පැතිරෙන්නට වන.

මෙසේ පැතිරි සවණක් ඝන බුදුරැසින් මුළුලොව සදමින් වඩුත් වඩුත්, සියලු නුවර රැසින් සැදෙත් සැදෙත්, ගෙයි ගෙයි පිල්සක් විදහා මොනරුන් නටත් නටත්, මැදිරියෙහි හුන් ගිරා සැළලිහිණි ආදි පක්‍ෂීන් පියා පැහැරැ හඬත් හඬත්, වීණා වේණු මිහිඟුබෙර ආදී ගැසූවන් නැති වැ මැ තමා මැ හඬත් හඬත්, හත්පලන් ආභරණ තමා මැ කිංකිණිජාලා

1. පිඩවල්ලක්. 2. වැටුප්. 3. සත්රුවන්-ථූපවංස. සැපැ-ඇතැම්

Non-Commercial Distribution

සේ මධුරනාද පවත්වත් පවත්වත්, "මෙ සලකුණෙන් වැඩි ද වනැ"යි දික් කළ ඇසට යුගාන්තවාතයෙන් ඉපිළැ ආකාශයට පැනැ නැඟි සත්රුවන්මෙර සේ ස්වාමිදරුවානෝ එකවිටැ මැ පැණී ගියාහැ. ඇස් දැල්වී ගියේ. කට දැල්වී ගියේ. අක්පයින් සිටිනට වන්හ. "සාධු! සාධු!!යි කියන්නට වන්හැ. සතුටුකඳුළු පරහන්නට* වන්හැ. හිසැ සිටැ සර්‍වාඞ්ගයෙහි සියලු රෝම තාක් හැප්සෙන්නට[1] වන. සන්‍ධ්‍යාවලා සේ රත් වූ පලසින් වසා දිව්‍යවීථියට යතා ලූ ඓරාවණ නම් මතැත්හු සේ වඩනට වන්හැ. හෙන මහ තරුවක් පස්සෙහි අනු වැ තුබූ රස්කඳක්[2] සේ එ මහණපිරිස මුළුලෝ ඇස් හයන්නට වන්හැ. අග සිටැ මුලට දෙව්දුනු හා විදුලියෙන් වෙළී ගිය, මුදුන්හි සිටැගත් හිරුමඬලෙන් සඳමඬලෙන් හොබනා, සුවාසූදහසක් යොදුන් උස ඇති යුගන්‍ධරපර්‍වතය සේ අවුත් වීථිකෙළවරට වැද ගියහැ. එබුඑබූ පයට පිපි පියුමෙන් සියලු වීථිය රත්පියුම් පිපී වැනී ගිය ආකාශගඞ්ගාව සේ අතුරු සිදුරු නැති වන්නට වනැ. දෙව්බඹහු උඩ අහසැ අත් පොළන්නට වන්හැ. මෙසේ සියලුලොව විස්මයට හක[3] කෙරෙමින්, ඇසක් ඇතින් ඇතට නො යවා, කරක් ඇතින් ඇතට නො නමා, නීරාජනා මඞ්ගලයට[4] සඳ ගෙණැ යන ගන්‍ධහස්තියක්හු සේ පිළිවෙළින් වඩනට වන්හැ.

වැඩි පවත් අසා ඇත්ගොව්වෝ කල්පාන්තයෙහි ගින්නෙන් නැඟි දුම්කඳක් සේ, මහාඅඤ්ජනපර්‍වතයක් සේ, කප නස්නට නභා ලූ මහමේකුළක් සේ සිටි ඇත්හු, දිලියෙන ගින්නෙහි තෙල් ඕනා සේ සොළොස්කළයක් රා පොවා මත් කොට, කිපෙන්නට සුදුසු බස් බැණැ, ධවුරසින්නම් ආදිය එක පැහැරැ එකවිට මැ සෙල්වූහ.

එකෙණෙහි මුහුදුදියකඳ දවා ගෙණැ වඩබාමුඛයෙන් පිටත් වැ ගිය අවීචියෙහි ගිනිකඳක් සේ රළු මතැත්තෙම සොඬ හකුළුවා මහපොළොව යදඬෙකින් ගැසූ සණ්ටාවක් සේ අනුරාව දෙවමින්, ගිගුරුහඬින් මුළුනුවර අසනිපාතයක් සේ තතුණුවමින්, කොපයෙන් පය බැඳලූ යදම් ඇද ලූ කෙණෙහි මැ මකුළුහුයක් කඩන්නා සේ යදම බිඳැ සුණුවිසුණු කෙරෙමින්, නෙළුම්දළියක් උපුරන්නා සේ බැඳ ලූ තඹය පෙරළී සිට ඇනැ තුතු කෙරෙමින්, සිටි ඇත්හල පැහැරැ ධූලි කෙරෙමින්, බිඳපු තඹය කඩා හකුළුවා දළහස්සෙහි තබා ගෙණැ, තමාගේ සේයට ඇනැලූ ඇන්මෙන් මහපොළොව දදුරු කොට, දළැ ඇවිළැ ගත් පසින්

1. හැප්පෙන්නට-හැම. 2. රසදෙකක්-සමහර
3. විස්මය වසහබොහෝ විස්මයවෙකවශක-ඇතැම්.
4. රාජමංගල්‍යයට-සමහර. * පහරන්නට.

Non-Commercial Distribution

භයඞ්කර වැ, නියඅක්පහරින් මහපොළොව කැණැ, ඒ පස් ගෙණැ පිටට ඉස්මින්, දිවැ ලුහුබඳවා අල්වා පළාපූ මිනී දළගැ අවුණා නහමින්, ලෙහෙයෙන් රැඳී ගිය මුහුණින් ලෙහෙයෙන් රැඳී ගිය දළින් ගොන් මීවුන් ලුහුබඳවා ගෙණැ ඇනැ පළමින්, ඔවුන්ගේ අතුණුබහනින් වෙළී ගිය දළින් බැලුබැලූවන් ඇස් පියවමින්, කොපයෙන් සොඩ කටැ ලා ගෙණැ හිස සලසලා ගුගුරමින්, දෙරටු අටලු පවුරු පදනම් ඇනැ හෙළා සුණුවිසුණු කෙරෙමින් අවුත් වීථිය වැද ගියේ යැ.

පෙරළා බැලූ මිනිස්සු ඇතින් එන ඇතු දුටිහැ. අබෞද්ධයෝ සතුටු වැ ගියහැ. බෞද්ධයෝ "කුමකින් කුමක් වේ දෝ හො"යි හැකිළෙන්නට වන්හැ. ඉක්බිති සඟුන්වහන්සේවරුන්ද "ස්වාමීනි, ස්වාමීන් වඩනා ඉද්දෙහි නාලාගිරි අවුත් වැද ගියේ. බුදුගුණ නො දන්නි. බුදුරුවන් නො හඳුනයි. ඈල වැ වැඩැ සිටුත් යහපතැ"යි දැන්වූහ.

ස්වාමිදරුවානෝ ඔවුන් දන්වූ බසට සිනා පහළ කළ කෙණෙහි සතරදළදයෙන් නැඟි නහඹතල්කඳ සා සුදුරස්කඳින් සියලු අහස ක්‍ෂීරසාගරයෙහි ගලන්නා සේ සුදු කෙරෙමින්, වඩනා ගමනින් මඳකුදු අඩු නො කොට, වඩනා පිළිවෙළින් මඳකුදු ඈල නො වැ, වඩනා මැ සෙයෙකැ. අසූමහසව්වන් වහන්සේ "ඇපි හික්මවම්හ ඇපි හික්මවම්හැ"යි දැන්වූ කල්හි නො ගිවිසැ වදළසේක.

ඉක්බිති ජාතිජාතියෙහි ස්වාමිදරුවානන්ට දිවි දී ආ, මාගේ කුලදෙවතා වූ, අප අනඳමහතෙරුන්වහන්සේ බුදුන් කෙරෙහි ගත් බලවත් ස්නෙහයෙන්, තමන් කකුළු කල්හි සජීයා අත මළ බොධිසත්ත්වයන්ට දිවි දුන් සනායෙන්, හංසජාතියෙහි සුමුඛ නම් හංසසෙනාධිපති වැ මලෙහි බැඳි ස්වාමීන්ට ඉදිරි වැ සිටැ තමන්ගේ දිවි පිදූ සනායෙන් ගලින් හුනු ස්වාමිදරුවානන්ට ගෝ වැ පිට දුන් සනායෙන්, ගිරා වූ ස්වාමීන්ට දහසක් කිරිය හැල්කෙත් පිදූ සනායෙන්, "මෙ ඇත් පළමු කොට මා මරාව"යි කියා තමන් දිවි පුද අභිමුඛයෙහි සිටියහැ. සර්‍වඥයන්වහන්සේ තුන්වටෙක්හි "අනඳය! ඈල වැ යා"යි වදළසේක. එසේ වදරතුදු ස්නෙහයෙන් ඈල නො වැ සිටි හිමියානන් මහපොළොව තෙමේ මැ කුඹල්සකක් සේ පෙරළා පස්සෙහි ලා පී යැ.

ඇත ධූලීන් වැසී ගිය ඇත්රජ යැ. මැත සවණක්සන බුදුරැසින් සැදී ගිය බුදුරජානෝ ය. ඇත කොපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත්රජ යැ. මැත කරුණායෙන් තෙත් වැ ගිය නිල්මහනෙල්පෙති

Non-Commercial Distribution

පරයන[1] ඇස් ඇති බුදුරජානෝ යැ. ඇත එබුඑබූ පයින් මහපොළොව පළාපියන්නාක් සේ දිවන ඇත්රජ යැ. මෑත එබූ එබූ පයින් මිහිකත සනහසනහා වඩනා බුදුරජානෝ යැ. ඇත බැලුබැලූවන් "අනේ! අනේ!"යි කියවන ඇත් රජ යැ. මෑත බැලුබැලූවන් "සාධු! සාධු!"යි කියවන බුදු රජානෝ යැ. එවේලෙහි එ ඇතු ලං වත් ලං වත්[2] සැදැහැත්තෝ ලෙහි අත් ගසන්නට වන්හැ. මුහුණු අත් දෙන්නට වන්හැ. 'බලා සිටි යැ නො හෙම්හ'යි මුහුණින් හෙන්නට වන්හැ.

එකෙණෙහි පුතකු වඩා ගත් ගැහැණියක් ඇත්හු කෙරෙහි කළ හයින් වඩා ගත් පුතු ස්වාමිදරුවන් හා ඇතු හා දෙමැදට[3] දමා පියා පලා ගියා යැ. ඒ ඇත්තෙම කුමාරයා කරා නික්මීන. කුමාරතෙම ඇත්හු කෙරෙහි කළ හයින් මහහඬින් හඬන්නට වනැ එකෙණෙහි බුදුන්වහන්සේ "අද මේ ඇත්තෙමේ මා සිටි වීථියෙහි කිහිඹියකට ද අන්තරායයක් කෙළේ වී නම්,[4] මාගේ බුද්ධානුභාවයට නුසුදුසු යැ" යි සිතා වදරා, අනන්තාපරිමාණ සක්වළැ සත්ත්වයන් කෙරෙහි කරන්නාවූ මෛත්‍රිය, හබබිජුවකට මහමෙර පෙරළන්නා සේ එක ඇත්හු කෙරෙහි පතුරුවා,[5] ඇසූ ඇසූ සත්ත්වයන් මී බී මත් වූ බමරුන්[6] සේ තමන් දිශාවට නමා ගන්නා වූ මධුරස්වර විහිදුවා[7] "තා මේ වීථියට හළුයේ අප නිසාමුත්, තෙල කුමාරයා නිසා නො වන්නේ වේ ද? මෙසේ එව"යි වදළසෙයෙකැ. එ මිහිරි හඬ කණැ හෙත් මැ, බැලූ ඇතු ඇසැ ඒ මනහර බුදුරු නැමැති අමා පිරී ගියේ. "දැන් දැන් ගියේ යැ. ගියේ ය"යි සියලු නුවර වැසියන් කියමින් සිටියැ දී, කණැ හුනු එ මිහිරිහඬින්, ඇසැ හුනු එ බුදුරුවින්, කෙසරසිංහයක්හු දුටු ඇත්පොව්වක්හු සේ, අනිකක් සිතියැ නො හී, කණ හොවා ගෙණ, බුදුරුවට දල්වා ලූ ඇස පියා ලියැ නො හී, එ රූ අමා ඇසින් උකා බොමින්, සිටැපියා නො හී, නැමෙමින් හැකිළෙමින් ශ්‍රීපාදය ඇළයට ගොසින් සිටියේ සිටැ පියැ නො හී යුගාන්තවාතයෙන් නැමීගිය අඳුන්කුළක් සේ බුදුපාමුල්හි වැඳ වැතිරැ ගියේ. වැඳ වැතිරැ ගොස් ශ්‍රීපාදයෙහි නියදසයෙන් නික්මැ ගත් පැහැ නැමැති අමාගඟුල්හැල්ලෙහි ගැලී සැනහෙන්නට වනැ. එතැන්හි ඔවුන් වහන්සේගේ සුදුනියරැසින් රැඳී බුදුන් වැදි පිණින් එතැන්හි මැ කාලාවකකුලය හැරැ සදත්කුලයෙහි උපන්නා සේ සුදු වි යැ. වැඳ ගෙණැ හොත් ඇතු බලමින්, සිවුරුපටයටින්[8] ශ්‍රීහස්තය අද ගෙණැ, රන්වන් ශ්‍රීහස්තය මෙඝකුටයෙක්හි විදුලියක් සේ ඇතු ගේ කුඹ පිටැ

1. පෙති දෙකක් වැනි. 2. වෙත්, 3. දෙ මධ්‍යයට, 4. නම් ද, 5 පවත්වා, 6. මත් වූවන්, 7. විහිද. 8. සිවුර යටින්

Non-Commercial Distribution

තබාලා, රන්වන් අතින් ඔහුගේ මුහුණෙහි සින්දූර ගල්වන්නා සේ කුඹ පිරිමැද වීථිමධ්‍යයෙහි සිටැ මිහිරිකට හඬින්-

"මා කුඤ්ජර, නාගමාසදෙ
දුක්ඛං හි කුඤ්ජර, නාගමාසදෙ,
න හි නාගහතස්ස කුඤ්ජර,
සුගති හොති ඉතො පරං යතො"

යනාදීන් බණට පටන් ගත්හැ. සාධුකාරයෙන් මුළුනුවර එක කොලාහල කෙරෙමින්, පලන් ආභරණ ගලවා පූජාවට දමා ඇතු වසමින්, සතුටු වැ තුඩැ වැඩී බිණූ තීර්ථිකයන්ගේ ඔළුයෙහි ටොකු ඔවමින්, හිස් පාවිළුමින් අනිමින්, සිටි පවුරු පැනැ ගෙණැ පදනම් පිටින් හී ගෙණැ, කණයම්හස්සෙකැ හසු වැ ගිය ඇතකු බලන්නට සැක නැති වැ එන්නා සේ, වැද ඇවිත් සියලු මිනිස්සු බුදුන් පාමුල්හි වැඳ පෙරළෙන්නට වන්හැ. අහසැ දෙවියෝ පරසතුමල් වස්වන්නට වන්හැ. උඩුමහල්හි සිටි ගැහැණු දෙහොත් පුරා සත්රුවන් උකා ඉසිනට වන්හැ.

වැඳ හොත් ඇත්හු කුඹැ අතක් ඔබා ගෙණැ මිහිරි කට හඬින් ඇත්හට පන්සිල් දෙති. ඒ වදළ පන්සිල් තෙවළාබුදු වදන් පුහුණු කළ සැදැහැති උපාසකයක්හු පිළිගන්නා සේ ඒ ඇත් පිළිගෙණැ, මදක් පසු බැසැ සෙමෙන් අත දික් කොට ශ්‍රීපාදය අල්වා, ඒ අත ගෙණැ ගොස් හිස තබමින්, මුහුණැ තබමින්, ශ්‍රීපාදය පහළ තැනැ පස් ගෙණ තමා හිසැ ඕමින්, වල්ගය හකුළුවා දෙපාහස්සෙහි ගන්වමින්, බුදුරුව බලබලා නැමෙමින් සර්වාඞ්ගයෙහි රොම තාක් සතුටින් කෙළින් සිටුවමින් ගෞරවයෙන් සිටියේ යැ. ස්වාමිදරුවානෝ ඒ ඇත්හු පන්සිල් ගන්වා තමන්ගේ ශාසනයෙහි පන්සිල් රක්නවුන් කෙරෙහි ඇතුළත් කොට, එද පටන් පිනිබිඳක් සා රා පොදකුදු[1] නොබොනපරිද්දෙන්, කීඹියක සා සතකුත් නොමරණ පරිද්දෙන් හුදීදහම් ගන්වා, එතැන්හි සිටැ බණ වදරා සුවාසූදහසක් සතුන් සසර දුකින් මුද අමාමහනිවන්හි ලා විහාරයට වැඩිසෙයෙක.

මෙසේ හික්මැවිය යුත්තවුන් හික්මවා අමාමහනිවන්හි ලන සේ දන්නා මාගේ ස්වාමිදරුවානන් සරණයෙම් යි බුත්සරණ යා යුතු.

**95.**

තව ද, සවනේ ගෙවා දත්, වියත්කම්හි මතුපත්, සියලු සත්ත්වයන් කෙරෙහි පතළ[2] කරුණායෙන්, අසන්නවුන්ගේ සිත් හැදිනැ වදරණ

---

1. රා පෙතකුදු· 2. පවත්නා,

Non-Commercial Distribution

ධර්මදේශනායෙන්, බලන්නවුන්ගේ ඇස් නිවා බබලන රූපයෙන්, හිරු පැරයූ තෙජසින්, සඳහු මත් බුන් සොමිගුණෙන්, කෙළලක්‍ෂයක් සක්වළෙහි පැතිරැ පවත්නා[1] ආඥයෙන්, දෙව්බඹුන් මුදුනෙහි කෙළෙනා ශ්‍රීපාදයෙන්, සිත හා සමග කැමැති තැනෙක්හි පැණී යන ශ්‍රී ශරීරයෙන්, කරුණාව හා සමහ නො පසු බැසැ පවත්නා සිතින්, "මා දුටු නිවන් සියලු සතුන් දක්වමි" යන මහත් අදහසින්, එ අදහසට සුදුසුවූ උත්සාහයෙන්, එ උත්සාහයට සුදුසු පරාක්‍රමයෙන්, එ පරාක්‍රමයට සුදුසු අප්‍රමාදයෙන්, එ අප්‍රමාදයට සුදුසු උපායයෙන්, මුළුසත්ලොව් සනහමින්, ජාතිදුඃඛය මුලිනුපුරමින්, ජරාදුඃඛය ඔත්පතින් සිදිමින්. ව්‍යාධිදුඃඛය නම් නැති කරමින්, මරණදුඃඛය සිඳ පසිදිමින්, ශොකදුඃඛය පරසක්වළැ ලමින්, පරිදෙවදුඃඛය පිසැ හරිමින්, දුඃඛදුඃඛයෙහි පිටි දක්වමින්, දෙම්නස්දුකට විස දෙමින් උපායාසදුකට දිවබෙහෙත් දෙමින්, අප්‍රියසම්ප්‍රයොගදුකට වැට කෙරෙමින්, ප්‍රියවිප්‍රයොගදුකට ගිනි දෙමින්, කැමති දෙයක් නො ලැබීමෙන් වන දුකට නැවැත නූපදනා පිළියම් කෙරෙමින් පස්කඳබර බහාතබමින්, නිවන්සුව සිත්හි පුරමින්, තිලෝගුරු ගෞතමගොත්‍රයෙහි උපන් බුදුරජානන්වහන්සේ එක්සමයෙක්හි සැවැත්නුවර නිසා ජේතවනමහාවිහාරයෙහි වැඩැ වසනසේක.

එසමයෙහි එක්දවසක් අනාථපිණ්ඩික නම් මහසිටානෝ ජේතවන-මහාවිහාරයට ගොස් බුදුන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ, ඒ ශ්‍රීපාදය පිසැ හැරැ ගත් අත තමන් මුදුනෙහි පිස්මින්, තමන්ගේ ජාතිය සඵල කොට වදරණ මිහිරිබණ[2] අසා, මීවදයෙක්හි හුනු බමරක්හු සේ, පියුම්විලකට වන් රාජහංසයක්හු සේ, මහගිම්හි මහගහෙක්හි ගැලුනු මතැතක්හු සේ, මහවැස්සෙන් සැනැහුනු වැසිලිහිනියක් සේ, සත්රුවන්මහානිධානයක් දුටු මහදුගියක්හු සේ, තමාගේ රටදනවු දුටු නැවියක්හු සේ, සුවාසූදහසක් යොදුන් ගැඹුරු මහමුහුදට වැද සැනැහී කෙළෙනා තිමිඞ්ගල නම් මහාමත්ස්‍යයා[3] සේ, උපන්කෙණෙහි මැ මල් පිපී වැනී ගිය පරසතුරුකක් දුටු තරුණදිව්‍යපුත්‍රයක්හු සේ, භාවනාක්‍රමයෙන් විශුද්ධිපරම්පරායෙන් ගොස් පළමු මගින් නිවන් දකැ සැනැහුනු යොගාවචරයක්හු සේ, නිවී සැනැහී "ස්වාමීනි, සෙට නිත්‍යපරිවාර පන්සියක් වහන්සේ වරුන්ද ඇරැ ගෙණැ ගැත්තවුගේ ගෙට වැඩියැ මැනැවැ"යි ආරාධනා කොට, මුයෙන් නො බැණැ වදළ සලකුණෙන් ඉවසා වදළබව දනැ, වැඳ පැදකුණු කොටැ තමන්ගේ ගෙට ගියහැ.

---

1. සක්වළෙහි පැවති, 2. බස, 3. මහමස්හු.

Non-Commercial Distribution

ස්වාමිදරුවානෝ කලට සුදුසු බුද්‍ධකෘත්‍යයෙන් එදවස් යවා අලුයම්වේලෙහි මහාකරුණාසමාපත්තීන් නැඟී 'අද මාගේ ධර්‍මදෙශනා අසා අමාමහනිවන් දක්නාහු කවුරු දෝ හො?"යි දස දහසක් සක්වළ තමන්වහන්සේගේ ශ්‍රීහස්තතලය සේ අයත්නයෙන් බලා වදරා "නන්‍දොපනන්‍ද නම් නාගරාජයාගේ මිථ්‍යා දෘෂ්ටිය බිඳ සරණසිල්හි පිහිටවුව හොත් යහපතැ"යි සිතාවදරා පාත් වූ කල්හි කළ මනා කටයුතු කොට "වේලා එනතුරු සුවාසූ දහසක් යොදුන් කතර ගෙවා තව්තිසැදෙව්ලොවට ගොස් එම්හ"යි අනඳමහතෙරුන්වහන්සේ කැඳවා "ආනන්‍දය, අද අප දෙව්ලොවට යනබව කියා පන්සියක් මහණුන් රැස් කරව"යි වදරා, ඔබගේ බස් අසා කැටි වූ පන්සියක් දෙනාවහන්සේ පිරිවරා අහසට පැනැ නැඟී පස්වණක් වලාකුල මඩිමින් සවණක් ඝන බුදුරසින් දිලියෙමින් "අපගේ දෙව්ලොවට දෝ හෝ? අපගේ දෙව්ලොවට දේ හෝ වඩනේ යැ?"යි එක පැහැරැ සදිව්‍යලොකයෙහි දෙවතාවන් පරසතුමල් බිඳිමින්, තන්හි තන්හි ආසන පණවමින්, පූජා ගෙණැ පෙරමහට දිවෙමින්, සඟපිරිස්පමණින් දිවඅහර සපයමින්, නොයෙක් කුහුලින් ඇලළෙමින් සිටිකල්හි, සම්මාසම්බුදුරජානන්වහන්සේ තමන්වහන්සේගේ පරිවාර වූ පන්සියක් මහණුන් වහන්සේගේ ශ්‍රීපාදයෙහි රජස් පරිවාර සහිත වූ නන්‍දොපනන්‍ද නම් නාගරාජයා හිසැ වම්වමින්[1] වඩනට වන්සෙයෙකැ.

එකල්හි සුරාපාණඋත්සවයට සැරහූ අවන්බිම්හි රුවන් පලඟෙක්හි හිඳ නොයෙක් සියදහස්ගණන් නාපිරිස් පිරිවරා දිව්‍ය භාජනයෙන් ගෙනැ අන්නපාන පරීක්‍ෂා කෙරෙමින් හුන් නන්‍දොපනන්ද නම් නාගරාජතෙම වඩනා බුදුන්වහන්සේ දැකැ තමාගේ අධික වූ දපියෙන් සිත පහදවා ගත නොහී "මේ මුඩු මහණහු අනවරතයෙන් මා හිසැ පස් ඔමින් දෙව්ලොවට යෙමින් එමින් සිටිනාහැ. මිනිස්කෙනකුන්ගේ පියපස් මා හිසැ වම්වන බව දැකැ, විෂවාත[2] මාත්‍රයකින් මුළුසක්වළ දවා හළුමිටක් කොට පියන්නට සමර්ථ වූ මාසේ වූ එකක්හට හිඳීම සුදුසුදෙයෙක් නො වෙයි. අද මේ උත්සව තබා මේ මුඩුමහණුන් මාගේ විමන ඉද්දෙන් දෙව්ලොවට නොයන පදිද්දෙන් හික්මවා, තමහට කරණ පරිභව පසිඳ ගෙණැ සිටැ පසු වැ කෙළි කෙළියැ. හැක්කේ වේ දැයි"යි සිතා පලඟින් නැඟී ඍද්ධිවෙගයෙන් අසුරක් ගසාලන ඇසිල්ලෙන් මහමෙර කරා ගොස්, මව ගත් දිව්‍යශරීරය හැර පියා මහනාවෙසක් මාව ගෙණැ, එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් මහමෙර සත්දරණ පටෙකින්

1. පස් වම්වමින්, පස්වමින් 2. විෂස්වාද-ඇතැම්

Non-Commercial Distribution

සිසාරා ගෙණැ, මෙරගල් මුදුනෙහි මහත් පෙණය[1] තබා සියලු තව්තිසැදෙව්ලොව කිබිසිනි කළ පෙණයෙන් වසා හෙවැ ගත.

එකල්හි සර්‍වඥයන්වහන්සේ හා කැටි වැ වඩිමින් සිටි රට්ඨපාල නම් මහතෙරුන්වහන්සේ මෙරගල හා සියලු දෙව්ලොව නො දකැ, ස්වාමිදරුවානන්වහන්සේ කරා එළැඹැ ශ්‍රීපාදය වැඳ "ස්වාමීනි, මම පෙර මෙතැන කරා ආකලැ සප්තකුලපර්‍වතයන් දක්මි. මහමෙර දක්මි. තව්තිසැදෙව්ලොව දක්මි. ශක්‍රයාගේ වෛජයන්තමහාප්‍රාසාදය දක්මි. ඒ ප්‍රාසාදය මුදුනෙහි කෙළෙනා දද දක්මි. අද මේ හැම නො පැණෙයි. මෙයට කරුණු කිම් ද?"යි දැන්වූසේක. ඒ අසා ස්වාමිදරුවානන්වහන්සේ "රට්ඨපාලය, නන්‍දෝපනන්‍ද නම් නාගරාජතෙම තොපට හා අපට කිපී මහා මෙරුපර්‍වතය සත්දරණපටෙකින් වෙළා පෙණයෙන්[2] සියලු දෙව්ලොව වසා හෙවැ ගත්තේ වේ ද"යි වදළසේක.

ඒ අසා රට්ඨපාල මහතෙරුන්වහන්සේ "ස්වාමීනි, මම ඔහු හික්මවා දියබරණක්හු අල්වා ගෙණ එන මහාමන්ත්‍රියක්හු සේ ශ්‍රීපාදය වඳවා හොවා ලම් ද"යි වදළසේක. ස්වාමිදරුවානෝ නො ඉවසා වදළසේක.

මෙසේ ක්‍රමයෙන් හැමදෙනා වහන්සේ දැන්වූ බස් නො ඉවසූ කල්හි අන්තයෙහි ස්වාමිදරුවානන්ගේ වමත්සවු වූ, ඍද්ධි ඇත්ත වුන් කෙරෙහි අගතැන්පත් වූ, අවීචිමහනරකකුසට වැද එහි ගිනිනිවා වැසි වස්වා, කපක් මුළුල්ලෙහි, මිනිස්ලොවැ ගිනි හෙල්මැලිකලඹක් සේ සිහිල් කළ[3] ගින්නෙන්, පැසෙන සතුන් අමායෙහි ගැලුනුවන් සේ සනහා ඔවුන්ට බණ වදරා වඩනට පොහොසත් වූ, එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් මහමෙර උඳුටක් සේ දත්හස්සෙහි තබා ගන්නට පොහොසත්, වූ දෙලක්‍ෂසතළිස් දහසක් යොදුන් බොල ඇති මහපොළොව පහන්කඩක් සේ අඹරා ඇඟිලිහස්සෙහි තබා ගණුත් පොහොසත් වූ, සියලු මහපොළොව පරඬලාපතක් සේ පෙරළා යටිපිට උඩු කොට තබා පොළොව පත්ලෙහි තුබූ අමාඕජස සියලු සතුන්ට බෙද දී කවාලන්නට පොහොසත් වූ, මහපොළොව මුළුල්ල පාන්කබලක් සේ වමතින් නහා ගෙණැ එක්මලායෙක්හි බත් අනික් මලායෙකැ ලා ලන්නා සේ එක්සක්වළෙක්හි සතුන් අනික් සක්වලෙක්හි ලා ලන්නට පොහොසත් වූ, එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් මහමෙර කුඩදඩක් සේ අල්වා ගෙණැ මහපොළොව පෙරළා එහි කුඩයක් සේ ගන්වා හිටිකුඩයක් අල්වා ගෙණැ සක්මන් කරන්නා සේ සක්මන් කරන්නට පොහොසත් වූ, එක් උග්දඩක් දුන්නවුන්ට, එක් වටෙකැ දෙහොත් මුදුනෙහි තබා වැන්දවුන්ට, පහන්සිතින් එක්වටෙකැ නම කීවවුන්ට අමාමහනිවන්

---

1. පණය 2. පණයෙන්. 3. ගින්නෙහි.

Non-Commercial Distribution

ගෙනැ දෙන්නට පොහොසත් වූ, ස්වාමිදරු වූ සම්මාසම්බුදු-රජානන්වහන්සේගේ දකුණු ශ්‍රීහස්තය දිශාවෙහි තමන්ගේ බෑ වූ සැරියුත්මහතෙරුන් වහන්සේ හිඳුවා වම්භාගයෙහි වැඩැ හිඳිනා වූ බුදුසස්නෙහි නහාලූ ධජයක් බඳු වූ, කරුණායෙන් තෙත් වූ ල ඇති, සිහිනුවණ නො හැර පවත්නා සිත් ඇති, අනේකෙළසුවහස් ධන හැර පියා සැදැහැයෙන් මහණ වූ, මෙයට සාරාසංඛ්‍යකප්ලක්‍ෂයකින් මත්තෙහි දීපඞ්කරසම්‍යක්සම්බුද්ධයන්වහන්සේ කෙරෙහි පටන් සියලු බුදුන්වහන්සේගේ ශ්‍රීමුඛයෙන් තමන්වහන්සේ මේ හිමියානන්ට අගසවු වනබව කියවා ආවා වූ, එකාසඞ්ඛ්‍යකප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති, කල්හි පිපි නිල්මහනෙල්මලින් ගෙතූ මල්දමක් සේ, ඉන්ද්‍රනීලමාණික්‍යයෙන් නෙළා ලූ නිමවූ රුවක් සේ නිල් වූ ශරීර ඇති, එයින් මැ සන්‍ධ්‍යාවලාපටලයකින් සිසාරණලද අඤ්ජන පර්වතයක් සේ රත්සිවුරෙන් වැසී හොබනා වූ, අනුමානසූත්‍රය, චූල්ලතණ්හාසඞ්ඛයසූත්‍රය, මාරතජ්ජනීයසූත්‍රය, මහාගොසිඞ්ග සූත්‍රය යනාදි වූ සූත්‍රයන්හි ප්‍රසිද්ධ වූ ගුණ ඇති, ශක්‍රයාගේ වෛජයන්ත ප්‍රාසාදය මාපටහිල්ලෙන් කැරලිඅක්හි ගෙණැ තණ පතක් සේ සොල්වා පියන්නට පොහොසත් වූ, එක්ලක්‍ෂඅටසැට දහසක් යොදුන් උස ඇති මහමෙර මුලැ සිටැ විද ගෙණැ පාණ්ඩු කම්බලශෛලාසනයෙහි වැඩැ හුන් බුදුන්වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි සිගාව නහන්නට පොහොසත් වූ මුගලන්මහතෙරුන් වහන්සේ අවුත් සර්ඥයන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ "ස්වාමීනි, මම මෙ නයි හික්මවම් දැ?"යි වදළසේක.

බුදුන්වහන්සේ තමන් පුතනුවන්වහන්සේගේ ශක්ති තමන් වහන්සේට හැහෙන හෙයින් ඉවසා වදළසෙයෙකැ. මහතෙරුන් වහන්සේ ස්වාමිදරුවානන්වහන්සේ අනුදත්බව දැනැ, තුන් වටෙකැ බුදුන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ පැදකුණු කොට දෙහොත් මුදුනෙහි තබා ගෙණැ සිටැ "ගැත්තවුට කොට වදළ කරුණායෙහි ශක්ති බලා වදළ මැනැවැ"යි දන්වා සමු ගෙණැ "මහනාවෙස් මවා ගන්නට පොහොසත් ඒ නාගරාජයා මතු නො වෙයි. බුදුන්වහන්සේගේ ගැත්තවුන්ටත් ඒ පිළිවනැ"යි මහණවෙස් හැර, මහානාගවෙශයක් මවා, නයිගේ සත්දරණ පිට තුදුස්දරණපටක් එවැ ගෙනැ, පෙණය[1] මත්තෙහි පෙණය[1] තබා, උක්යතෙක්හි ලා ලූ උක්දඬක් මඩනා සේ මඩනට වන්සෙයෙකැ.

නාරජ ඉවසා ගත නො හී "මේ නයි මාගේ ශරීරයෙන් නැඟි දුමින් දවා පියම්"යි සියලු ශරීරයෙන් දුම්කඳ හරණට වනැ. මහතෙරුන්වහන්සේ ද "ශරීරයෙන් දුම්කඳ හරණට ශක්ති ඇත්තෙහි

---

1. පණය.

Non-Commercial Distribution

තෝ මතු නො වෙයි. ගෞතමගොත්‍රයෙහි උපන් හිමියානන්වහන්සේගේ ගැත්තෝ ද පොහොසත්හැ''යි දුම්කඳ හරණට වන්සේක. නාගරාජයාගේ ධූමයෙන් තෙරුන්වහන්සේට පීඩාවෙක් නැත. තෙරුන්වහන්සේගේ ධූමයත් නාගයාගේ ධූමයත් දෙක එක් වැ නයි මැ පෙළන්නට වන. අකනිටාබඹලෝ දක්වා එක පැහැරැ දුම්කඳ නැගෙන්නට වන.

ඉක්බිති නාරජතෙම ''ගිනිකඳින් මොහු දවා පියමි''යි එක පැහැරැ ශරීරයෙන් ගිනිකඳ හරණට වන. තෙරුන්වහන්සේ ද ''මේ නයිගේ මතු නො වෙයි ගිනිකඳ ඇත්තේ. ශාක්‍යසිංහ වූ ලොකනාථ වූ දෙවාතිදෙව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ මාර පරාජය කළ සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීපාදධූලි මුඳුනෙන් පිළිගත් ගැත්තවුන්ගේ ද එපමණ ශක්තියෙක් ඇතැ''යි තමන්වහන්සේ ද ශරීරයෙන් ගිනිකඳ හරණට වන්සෙයෙකැ. නාගරාජයාගේ ගින්නෙන් තෙරුන්වහන්සේට වන දැ නැත. තෙරුන්වහන්සේගේ ගින්නෙන් හා නාගරාජයාගේ ගින්නෙන් නාරජ තෙමේ මැ පැලැහෙන්නට පටන් ගත. එ තෙමේ මැ එ දුක් ඉවසාගත නො හී ''මේ කවරෙක් දේ හො යි, මෙරගල සත්දරණපටෙකින් වෙළාගත් මා මේ තුදුස්දරණපටෙකින් වෙළා ගෙණැ දැඩි කොට පෙළයි. තමා හළ දුම්කඳින් ගිනිකඳික් දවයි. පලහයි. මොහු හා මා බිණුව මැනැවැ''යි සිතා ''භවත, මේ සා මහත් ඍද්ධියක් ඇති තෝ කවරෙක්හි දැ?''යි විචාළේ.

ඒ අසා තෙරුන්වහන්සේ ''නන්‍දය, මම අතිකෙකිම් නො වෙමි. තෙල පන්සියක් සහපිරිස් පිරිවරා දෙව්ලොවට වඩිමින් සිටි, මුළුලෝ තමන් කුලගැති කළ, තුන්ලොවට එක චූඩාමාණික්‍යයක් බඳු වූ, මුළුලොවට අභිමතාර්‍ත්‍ථය සාද දෙන කල්ප වෘක්‍ෂයක් බඳු වූ, චින්තාමාණික්‍යයක් බඳු වූ, භද්‍රඝටයක් බඳු වූ, පස්වාදහසක් මුළුල්ලෙහි අමාමහනිවණට දෙර හැර තුබූ, මුළු ලොව්හි පතළ තෙජස් ඇති ධර්‍මචක්‍රවර්තිස්වාමීන් වහන්සේගේ කුලගැති වූ සැරියුත්මහතෙරුන්-වහන්සේට දෙවෙනි වූ මුගලන් මහතෙර යැ යන්නේ මට යැ''යි වදළසෙයෙකැ.

ඒ අසා නාරජ ''වහන්සේ, තෙපි මහණකෙනෙක් නම්, මට දුක් නො දී මහණවෙසින් සිටුව''යි දන්වී යැ. ඒ අසා තෙරුන් වහන්සේ ''මේ නාරජතෙම මා මහණවෙසින් සිටියැ හොත් මට යමක් කොට ගන්මි''යි සිතන වනැ එසේත් මට කිසිවක් කොට ගත නො හැකි බව මොහට හඟවමි''යි සිතා ''යහපත, අපගේ මේ මහණරුව බල''යි වදරා නාවෙස හැරැ මහණවෙස් ගෙණැ අවුත් නයිගේ දකුණුකන්සිදුරෙන් වැද වම්කන්සිදුරෙන් නික්මෙනසෙයෙකැ. වම්කන්සිදුරෙන් වැද

Non-Commercial Distribution

දකුණුකන්සිදුරෙන් නික්මෙනසේක. වම්නාසාපුටයෙන් වැද දකුණුනාසා-පුටයෙන් නික්මෙනසේක. දකුණුනාසාපුටයෙන් වැද වම්නාසාපුටයෙන් නික්මෙනසේක.

ඉක්බිති නාරජ එසේ වදනාවිටත් නික්මෙනවිටත් හඳු කොට නො හී "වදනාවිටැ ඩැහැ ගන්මි" යන සිතින් මුවය විවර කෙළේ මහතෙරුන්වහන්සේ නයි තුඩ සොලවාපියැ නො දී මැ සිතූ සිත හා කැටි වැ ඇතුළු වැ කටින් කුසයට වැද රිදීනලෙක්හි සක්මන් කරන්නා සේ හිසැ සිටැ වල්පතට, වල්පතැ සිටැ හිසට සක්මන් කරණසෙයෙකැ. ඉක්බිති බුදුන්වහන්සේ "මේ නාගරාජතෙම මහතෙරුන් පිටතට නික්මුනු සඳ විෂවාතයක් හරණේ යැ. එවිටැ ප්‍රමාදයක් වුව හොත් මහතෙරහු ද හළුම්ටක් වැ යන්නාහ"යි සිතා වදරා ඇතුළෙහි සක්මන් කරණ තෙරුන්වහන්සේට ඇසෙන පරිද්දෙන් මධුර ස්වර විහිදුවා "මුගලන, තා කෙරෙහි සිහි ඇති වා[1]. සිහි ඇති වයි" වදළසේක. එබස් අසා මහතෙරුන් වහන්සේ "ස්වාමීනි, ගැත් තෙමේ ස්වාමිදරුවන් දී වදළ උපදෙශ වරදවන්නෙම් නො වෙමි. සතර ඍද්ධිපාදයෝ මා විසින් භාවනා කරණලදහැ. එහෙයින් ස්වාමීනුත් එකසස්නෙහි මහණ වූ සබ්‍රම්සරුවන් වහන්සේත් සිතට සතුටු වන පමණක් කෙරෙමි"යි වදළ සේක.

ඉක්බිති නාරජතෙම "වහන්ස, මා කුස සක්මන් කොට මට පීඩා නො කොට මැතට නැඟී අව මැනැවැ"යි කී යැ. මහතෙරුන්වහන්සේ ද නික්මැ පිටතැ වැඩ සිටිසේක. නාරජ ක්‍ෂණයෙහි විෂවාතයක් හැර පී යැ. මහතෙරුන්වහන්සේ ක්‍ෂණයෙහි මැ චතුර්ථධ්‍යානසමවත් සමවන්සේක. මෙසේ වහා සමවත් සමවදනට බුදුන්වහන්සේ හැරැ ඔබ මුත් සැරියුත්මහතෙරුන්වහන්සේ ඇතුළු වූ කිසිවහන්සේකෙනෙකුන්දටත් නොපිළිවනැ. එහෙයින් මැ බුදුන්වහන්සේ සෙස්සවුන්වහන්සේට මේ නයි දමනට නො අනුදත්[2] සේක. සහගල්වල් මුළු පොළොව මකුළුහුයක් සේ දවාපියන්නට සමර්ථ වූ ඒ විෂවාතය මහතෙරුන්වහන්සේගේ රෝමකූපයකුදු සොලවන්නට අසමර්ථ වී යැ.

ඉක්බිති මහතෙරුන්වහන්සේ "මෙවිට තට කියටි කියමී" මහණවෙස් හැරැ, යෙළසියක් යොදුන් මහගුරුළුවෙසක් මවා ගෙණැ, පියායෙහි ගත් පවනින් මහමුහුද දිය දෙබේ කෙරෙමින්, පියායෙහි ගත් සුළඟින් සප්තකුලපර්වතයෙහි වනයන් වෙළෙපින් වෙළෙප ගසා ගිනි නංවමින්, අසනිපාතය සේ ඝොර වූ දෙපියායෙහි ගත් සුළං ඊ ඊ ගසා ගිනි හෙළමින් නයි කරා දිවැගත්සේක.

1. වව-බොහෝ 2. අනු නො දත්

Non-Commercial Distribution

නාරජ අනන්තකාලයෙහි මුහුදුදිය පියායෙහි ගත් සුළඟින් දෙබේ කෙරෙමින්, දෙබේ කළ දිය එක් නොවන තුරු නයින් අල්වාගෙණැ පැනැ නැඟී, තියෙන් හිස පළා මේ දස් අනුභව කරන්නා වූ ගුරුළුරජුගේ රුව දකැ, ඉවසා ගත නො හී "අනේ! අනේ!! ස්වාමීනි, මා රැකැ ගත මැනැව. රැකගත මැනැව. ගැත්තවූ නොනුවණින් කළ වරද ක්‍ෂමා කළ මැනැව. ක්‍ෂමා කළ මැනැව"යි කියමින් මහතෙරුන්වහන්සේගේ ශ්‍රීපාදයෙහි වැඳ වැතිරැ ගියේ. මහතෙරුන්වහන්සේ "නන්දය, ස්වාමි-දරුවන් සිටියැ දී ගැත්තවුන් අනුන් අතින් වැඳුම් ගන්නාබව සුදුසු නො වෙයි. වරැ, යම්හ. අපේ ස්වාමිදරු වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වඳුම්හ"යි කියා මණෙව්වා[1] හිස අල්වා ගෙණැ අවුත් "ස්වාමීනි, නන්‍දොපනන්‍ද නාගරාජ තෙම තමා කළ වරද ක්‍ෂමා කරවා ස්වාමීන් ශ්‍රීපාදය වඳී"යි[2] ගෙණැ අවුත් වඳවා හොවා තිසරණ ගැන්වූ සෙයෙකැ. නාරජ බුදුන්වහන්සේ වැඳ ගෙණැ හෙව "ස්වාමීනි, මෙ වේලේ පටන් ගෙණැ තිවන් දක්නා ජාති දක්වා නුඹ හා නුඹ වදළ දහම් හා නුඹට පුත් වූ සඟුරුවන් හා සරණ යෙමි"යි තෙසරණ ගත.

එකෙණෙහි බුදුන්වහන්සේ සියලු දෙව්බඹුන් ලවා සාධුකාර දෙවමින් එතැන්හි සිටැ නයිට බණ වදරා පන්සිල් ගන්වා නැවැත සැවැත්නුවරෙහි අනේපිඩුමහසිටානන්ගේ ගෙට වැඩිසේක. මහසිටානෝ "ස්වාමීනි, මඳක් කල් ගියේ නු?" යි විචාළෝ.[3] "මහසිට නන්‍දොපනන්‍දයා හා මුගලන් මහතෙරුන් හා යුද්ධයෙක් වී. ඒ යුද්ධය බලා කල් යවුම්හ"යි වදළසේක. සිටානෝ බුදුන්වහන්සේගේ ගැත්තවුන් හා අනුන් හා යුද්ධයක් වූ තැනැ බුදුන් ගැත්තවුන්ට ජය වන බව දනැ දනැ ද විචාරණ පිණිස "ස්වාමීනි, දිනුවෝ කවුරු ද? පැරැද්දෝ කවුරුද"යි විචාළහැ. එබස් අසා ස්වාමිදරුවානෝ "මහසිටානෙනි, අප පුතනුවෝ අපගේ සස්නට පරාජයක් නො කළහ"යි වදළසේක. ඒ අසා මහසිටානෝ "එසේ වුව හොත්, ස්වාමීනි, මම මාගේ ස්වාමි දරුවන්ට සත්දවසක් ජයමගුල් කෙරෙමි"යි පවරා සත්දවසක් මහදන් දුන්හැ.

මෙසේ මහමෙර සත්දරණපටෙකින් සිසාරා ගෙණැ, පෙණ ගැබින් තව්තිසැදෙව්ලොව වසා හොත්තා වූ, මහත් ඍද්ධි ඇති නාගරාජයන් පොවා, තමන්ගේ සව්වන් ලවා හික්මවා, තෙසරණ ගන්වා පන්සිල් ගන්වා, තමන්ගේ හා තමන්ගේ සව්වන්ගේ ආනුභාව මුළුලොවට ප්‍රකාශ කොට, කරුණායෙන් සත්ත්වයන් හික්මවා සතර අපායෙන් නඟා අමාමහනිවන්හි සිටුවන බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

---

1. මු නාරදු 2. වන්දවමියි සමහර 3. හුඹ ඇතැම් විචාරා-හැම

Non-Commercial Distribution

**96.**

තව ද, එක්සමයෙක්හි රජගහනුවර සිටානෝ උපද්‍රව දුරු කරණ පිණිස හා ප්‍රමාදයෙන් වැටී හුනු ආභරණාදීය රක්‍ෂා කරණ පිණිස හා සිසාරා දැල් බැඳ ගඞ්ගායෙහි ජලක්‍රීඩා කෙළෙනාහ[1]. එසමයෙහි උඩුගඟ ගංහිත්තියෙහි සිටි රත්සඳුන් රුකෙක් මුල් දෙවී ගහැ වැටී ගොස් දියෙන් යන්නේ ඒ ඒ ගලැ ගැසිගැසී සිඳි බිඳී විසිරැ ගියේ. ඉන් එක් මහදියකළයක් සා රත්සඳුන්ගැටෙක් ගලින් ගැල ගැසී, රළින් රළ පැහැරැ, වැල්ලේ ගැටී මටසිලුටු වූයේ, ක්‍රමයෙන් සෙවෙල් හිඳී එන්නේ රජගහ නුවරැ සිටානන් බැඳවූ දැලෙහි වැදගත. සිටාණෝ "මේ කිමෙක් ද"යි විචාරා "එක්ගසෙක ගැටෙකැ" යනු අසා තමන් කරා ගෙන්වා ගෙණැ. "මේ කිමෙක් දේ හො"යි පරීක්‍ෂා කරණ පිණිස වෑයකින් සස්සා බලා "ලාරස සේ වූ පැහැ ඇති රත්සඳනෙක මේ යැ"යි නිශ්චය කළහැ.

එ සිටාණෝ ද සම්‍යග්දෘෂ්ටි ගත්තාහු ද නො වෙති. මිථ්‍යා දෘෂ්ටි ගත්තාහු ද නො වෙති දෙකට මැ මද්‍ය්‍යස්ථයහැ. එහෙයින් මෙසේ සිතූහැ: කෙසේ ද? යත්:- "මාගේ ගෙහි සඳුන් බෙහෙව. මට මින් වන ප්‍රයෝජනයක් නැත. මේ ලොකයෙහි "ඇපි රහතුම්හ. ඇපි රහතුම්හ"යි ඇවිදිනාහු බොහෝ යැ. මම, මොවුන් කෙරෙන් කවුරුන් රහත්බව කවුරුන් නො රහත් බව නො දන්මි. මම මාගේ ගෙහි දී මෙයින් පාත්‍රයක් ලියවා සහල්ලෙකැ තබා හුණදඬුපිළිවෙළින් ආසැ සැටරියනක් පමණ උසට නඟා 'ඉදින් රහත්කෙනෙක් මෙලොවැ ඇත් නම්, ඔහු ආකාශයෙන් අවුත් ගණිත්ව'යි කියමි. එසේ කල්හි යම්කෙනෙක් සෘද්ධීන් අවුත් ඒ පාත්‍රය ගත්හු නම්, මම මාගේ අඹුදරුවන් හා සමග ඔවුන්සරණ යෙමි"යි. මෙසේ සිතා, සිතූ පරිද්දෙන් මැ ඒ සඳුන් ගැටින් පාත්‍රයක් ලියවා, ඒ පාත්‍රය හුණදඬු පරම්පරායෙන් ආකාශයෙහි සැටරියනක් පමණ තැනැ සාල්ලෙකැ බැඳ එල්ලා "මෙලොවැ යම් කෙනෙක් රහතුම්හයි යෙද් ද, ඔහු ආකාශයෙන් අවුත් මේ පාත්‍රය ගණිත්ව"යි කීහැ.

ඉක්බිති ජම්බුද්වීපයෙහි 'ඇපි මැ ඇපි මැ සර්‍වඥයම්හ'යි ප්‍රතිඥ කොට වසන්නා වූ අචෙලකාශ්‍යපය, මක්ඛලිගොසාලය, අජිත කෙසකම්බලය, නිගණ්ඨනාථපුත්‍රය, කකුදකාත්‍යායනය, පූරණකාශ්‍යපය යන මොවුහු සදෙන "මේ පාත්‍රය අපට සුදුසු යැ අපට සුදුසු යැ"යි කියා අවුත් ඉල්ලූහ. ඉක්බිති සිටාණෝ "කැමැත හොත් ආකාශයෙන් මැ අවුත් ගත මැනැව. තිකම් දෙන පිණිස මේ මා කළ දෙයෙක් නොවෙ"යි කීහැ. මෙසේ පස්දවසක් ගිය කල්හි සවන දවස් නිගණ්ඨනාතපුත්‍රතෙම තමන්ගේ

1. කරන්නාහ සමහර

Non-Commercial Distribution

අතැවැස්සන් කැඳවාලා "යව රජගහනුවර සිටානන් කරා ගොස් 'මේ පාත්‍රය අපගේ ආචාරීන්ට මැ සුදුසු යැ. මෙසේ වූ ස්වල්ප දෙයක් පිණිස අපගේ ආචාරීහු ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යී පානාහු නො වෙති. මේ උන්ට මැ සුදුසු යැ'යි කියා උන් අතින් පාත්‍රය ඉල්වා ගෙණැ එව"යි කියා යැවී යැ. ඒ අතැවැස්සෝ ද ගොස් සිටාණන්ට මෙපවත් කීහැ. සිටාණෝ ද එපවත් අසා "පාත්‍රය කැමැති හොත්, තොපගේ ආචාරීන් ආකාශයෙන් අවුත් පාත්‍රය ගන්නට කියව. එසේ මුත් නිකම් නො දෙමි"යි කීහැ.

ඉක්බිති නිගණ්ඨනාථපුත්‍ර තෙමේ එ සඳුන් පාත්‍රය ගන්නට යනු කැමැති වැ තමාගේ අතැවැස්සන් කැඳවාලා මම එක් පයක් එක්අතක් නහා ගෙණැ පාත්‍රය ගන්නා පිණිස ආකාශයට නැඟෙන්නා සේ හඟවමි. 'ආචාර්‍ය්‍යයෙනි! දඬෙන් කළ පාත්‍රයක් පිණිස තොපගේ සැඟවී තුබූ රහත්ගුණ ලොවට පහළ කරාද?'යි කියා මා අතපය ගෙණ ඇද බිමැ හෙළවයි උගන්නා ගෙණැ සිටානන් කරා ගොස් 'මහසිටාණෙනි! මේ පාත්‍රය අපට මුත් අනුන්ට සුදුසු නොවෙයි. මෙපමණක් පිණිස ම ඍද්ධි කරණ බව සුදුසු නො වෙයි. මේ පාත්‍රය අපට මැ දෙව"යි ඉල්වී යැ. ඉක්බිති සිටාණෝ "වහන්ස, කැමැති සේක් නම් ආකාශයට නැඟීම ගත මැනැව. නිකම් මා දෙනදැ නැතැ'යි"යි කීහැ. ඉක්බිති නිගණ්ඨ-නාථපුත්‍රතෙම "එසේ වුව, මා ආකාශයට නැඟෙන පරිද්දෙන් හැමදෙන මැ ඇල වැ ගණුව"යි තමාගේ අතවැස්සන් පහ කොට "ආකාශයට නැඟෙමි"යි කියා එක්අතක් එක්පයක් මත්තට නහා ගෙණැ. තමා ආකාශයට නැඟෙන්නා සේ හැඟැ වී යැ. ඒ දැකැ ඔහුගේ අතවැස්සෝ ද "ආචාරීනි, මේ තොප කරන්නේ කිම් ද? දඬෙන් කළ පාත්‍රයක් පිණිස තොපගේ සැඟවී තුබූ රහත්ගුණය බොහෝදෙනාට ප්‍රකාශ කොට තොපට කවර ප්‍රයොජනයෙක් ද?"යි අත්පය අල්වා ගෙණැ ඇද බිමැ හෙළා පීහැ. ඉක්බිති නිගණ්ඨනාථපුත්‍රතෙම "මහසිටාණෙනි, මේ අතැවැස්සෝ මා පාත්‍රය ගන්නා පිණිස ආකාශයට නැංගැ නො දෙන්නාහැ. මෙබව තෙපි මැ දුටහැ. මේ පාත්‍රය අපට මැ දෙව"යි ඉල්වී. නැවැත සිටාණෝ "වහන්ස, ඉදින් කැමැති සෙයෙක් නම්, අකාශයට මැ නැඟී ගත මැනව"යි කීහැ. මෙසේ තීර්ථිකයෝ සදවසක් මුළුල්ලෙහි උත්සාහ කොට ද, ඒ පාත්‍රය ගන්නට නො පොහොසත් වූහැ.

සත්වනදවස් ආයුෂ්මත් වූ මුගලන්මහතෙරුන්වහන්සේ හා ආයුෂ්මත් වූ පිණ්ඩොලභාරද්වාජ නම් මහතෙරුන්වහන්සේ හා දෙදෙනාවහන්සේ "රජගහනුවරට පිඩු සිඟා යම්හ"යි වැඩැ එක් අතළගලෙක්හි වැඩැ සිටැ සිවුරු වළඳනාකල්හි, මහැයන්නාවූ ධූර්තයෝ "කොල, පෙරැ මේ

දඹදිවැ "අපි මැ සර්‍වඥයම්හ' ප්‍රතිඥ කොට සදෙනෙක් ඇවිදිති. රජගහනුවර සිටාණනුත් 'රහත් කෙනකුන් ආකාශයෙන් අවුත් ගත මැනැවැ'යි පාත්‍රයක් ආකාශයෙහිමැ බැඳ එල්වා තබන්නේ අදින් සත්දවස යැ. ඉදින් රහත් කෙනෙක් ඇත් නම්, ආකාශයෙන් අවුත් මේ පාත්‍රය ගණිත්ව'යි එ සිටාණන් කියතුත්, 'ඇපි රහතුම්හ'යි ආකාශයෙන් අවුත් ඒ පාත්‍රය ගන්නා එක ද කෙනෙක් නැත. අප මෙලොවැ රහතුන් නැති බව දත්තේ අද යැ"යි මෙසේ කථා කෙරෙමින් යන්නාහැ.

උන් කියන්නා වූ කථා අසා ආයුෂ්මත් වූ මුගලන්මහතෙරුන්වහන්සේ ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ නම් මහතෙරුන් වහන්සේට "ආයුෂ්මත්ති, මුන් කියන්නා වූ මෙබස් ඇසූ ද? මොහු බුදුසසුන් පරීක්‍ෂා කරන්නට ඇවිදිනවුන් මෙන් මෙසේ කියති. තොප ද මහත් වූ ඍද්ධි ඇති මහත් වූ අනුභාව ඇති යව. ආකාශයෙන් ගොස් ඒ පාත්‍රය ගෙණැ සර්‍වඥශාසනයෙහි මහිම ලොවට පහළ කරව"යි වදළසේක.

ඒ අසා පිණ්ඩොලභාරද්වාජ නම් මහතෙරුන්වහන්සේ මුගලන් මහතෙරුන්වහන්සේට, "ආයුෂ්මත්ති, තෙපි අපගේ ස්වාමි වූ සම්‍යක් - සම්බුද්ධයන් විසින් "එතදග්ගං භික්ඛවෙ, මම සාවකානං ඉද්ධිමන්තානං භික්ඛූනං යදිදං මහමොග්ගල්ලානො"යි වදරා ඍද්ධිමතුන් කෙරෙහි අගතැනැ තබන ලදු ව. එබැවින් තෙපි ඍද්ධියෙන් ගොසින් මේ පාත්‍රය ගණුව. ඉදින් තොප ගන්නා නො කැමැති වුව, අපි මැ ගණුම්හ"යි වදළසේක. එබස් අසා මුගලන්මහතෙරුන්වහන්සේ "අපගේ ඍද්ධිශක්ති නන්‍දොපනන්‍ද නම් නාගරාජයා දමනකල්හි දිව්‍යබ්‍රහ්මයන් සහිත වූ ලොවැ නොදත් කෙනෙක් නැත. එහෙයින් පාත්‍රයක් පිණිස අප කරණ ඍද්ධියෙන් අපට ප්‍රයොජන නැතැ" සිතා වදරා "ආයුෂ්මත්ති, තෙපි මැ ආකාශයෙන් ගොස් මේ පාත්‍රය ගණුව"යි වදළසේක.

ඒ ඇසූ ආයුෂ්මත් වූ පිණ්ඩොලභාරද්වාජ නම් මහතෙරුන් වහන්සේ අභිඥපාදකධ්‍යානයට සමවැද ධ්‍යානයෙන් නැඟී තුන් ගව්වක් පමණ ඒ අතළගල තමන්වහන්සේගේ ශ්‍රීපාදයෙහි ඇඟිලි හස්සෙන් ආකාශයට නඟා[1] ගෙණැ, රජගහනුවර සිසාරා ආකාශයෙන් සත්වටෙකැ ඇවිද තුන්ගව්වක් පමණ පහණ තුන්ගව්වක් පමණ රජගහනුවර පමණ දනැ කළ පියනක් මෙන් ආකාශ මත්තෙහි පිහිටුවා ශ්‍රීපාදයෙන් ධරා වැඩ සිටිසේකැ.

---

1. නැඟා.

Non-Commercial Distribution

ඉක්බිති නුවර වැස්සෝ "මේ පාෂාණය දැන් දැන් අප හැම මැඩ ගෙණැ හෙ"යි සිතා භය පත් වැ, සමහරු ඒ සා මහපහණ රඳවම්හයි භයින් කටයුතු නො කටයුතු සිහි කොට ගත නො හී, කුලු හිසැ තබා ගෙණැ ඇතින් ඇතට දිවෙන්නෝ සියදහස්ගණනැ. එසේ මැ තමන් තමන් අතුල් හිසට කොට ගෙණැ ඇතින් ඇතට දිවෙන්නෝ සිය දහස් ගණනැ. පිටු හඹහඹා උඩු බලමින් වදනා තැන් නො දැකැ කෝවේමාවේහි දිවෙන්නෝ සිහදහස්ගණනැ. කිරි බොන දරුවන් වඩා ගෙණැ වදනා තැන් නො දැකැ සේනන්කණුවලැ හිස් ගන්නා ගෙණැ සිටින්නෝ සියදහස් ගණනැ. තමන් තමන්ගේ ඉෂ්ටදෙවතාවන්ට යදිමින්, දෙහොත් මුදුනෙහි බැඳ, ඇතින් ඇතට දිවන්නෝ දහස් සුවහස්ගණනැ. භයින් තැති ගෙණැ නැඟු පියවර නහා ගෙණැ පෙරළා බිමැ ඔබා ගත නො හී, අහස් බලා කට දල්වා ගෙණැ, ඒ ගල බල බලා, සිතියමැ ඇඳි රූ සේ, නිශ්චල වැ සිටින්නෝ දහස්සුවහස්ගණනැ. තමන් ගෙන් නික්මෙන දෙරකඩ නො හැඳිනැ ඇතුළුගෙහි මැ දිවන්නෝ සියදහස්ගණනැ. භයින් තැති ගෙණැ, තමන් බැඳි දම් කඩා ගෙණැ, හඩා සසලා ගෙණැ, සොඩ හයා ගෙණැ දිවන්නා වූ ඇත්හු සියදහස්ගණනැ. එසේ මැ මහහඬින් හඬ හඩා, වාලධිය කලවාහස්සෙහි ගන්වා ගෙණැ, වසට නමනමා, හිස් ලූලූ දිගැ දිවන්නා වූ අස්හු සියදහස්ගණනැ. භයින් නිශ්චලැ වැ පියා, ගල යටැසින් බලබලා, සෙල්වී පිප්පී ගත නො හී හිඳිනා වඳුරෝ සිහදහස්ගණනැ. ඒ නුවර සත්ත්වයන් කෙරෙන් භය පත් නො වැ සිටිසේ සිටපු එක ද සතෙක් නැත.

මෙසේ භය පත් වූ සියලු නුවර එකවළහම්ගෙයක් සේ වෙවුලන්නට වන් කල්හි, තෙරුන්වහන්සේ ඝන නීල වැ සිටැ ගත්තාවූ වලාසමූහයක් අතුරෙන් පැණී ගිය පූර්ණචන්‍ද්‍රයා සේ ඒ අතළගල පළාගෙණැ ලෝවැස්සන් හැමදෙනාට එක පැහැරැ පැණීගිය සේක. ඉක්බිති මහාජනයා තෙරුන්වහන්සේ දැක "අනේ! අනේ! පිණ්ඩොලභාරද්වාජ ස්වාමීනි නුඹවහන්සේගේ තෙල ගළ තර වැ රඳවා වදළ මැනැව. මුළුලොවට අභය දුන් සර්ව්‍වඥයන් වහන්සේගේ පුතනුවන්වහන්ස, අප හැමදෙනාට අභය දෙවා වදළ මැනැව. ප්‍රාණදන දෙවා වදළ මැනැව"යි එක පැහැරැ දෙහොත් මුදුනෙහි තබා ගෙණැ ගුගුරන්නට පටන් ගත්හ.

ඉක්බිති තෙරුන්වහන්සේ ඒ භය පත් වූ මහාජනයා දැකැ, ඔවුන් කෙරෙහි කරුණායෙන්, තුති කෙළෙනා එකක්හු ඒ කෙළිනා කැබලිත්ත පතුල් අගින් දමා පියන්නා සේ තුන්ගව්වක් පමණ ඒ සා මහත් අතළගල පතුල්අගින් ගසා පහ කළ සෙයෙකැ. ඒ අතළගල ගොස් කේලුමක් සා තැනුත් අඩුවැඩියක් නැති වැ පෙර තමා තුබූ තැනැ මැ

Non-Commercial Distribution

පිහිටියේ යැ. ඉක්බිති ඒ තෙරුන්වහන්සේ රජගහනුවර සිටාණන්ගේ ගෙදෙර ආකාශයෙහි ශරත්සූය‍ර්‍යමණ්ඩලය සේ දිලිහි දිලිහී වැඩ සිටි සෙයෙකැ.

ඒ ආශ්වය‍ර්‍ය හා තෙරුන්වහන්සේ දුටු රජගහනුවර සිටාණෝ තමන්ගේ මිදුලට දිවැ අවුත් පසහ පිහිටුවා වැඳ "ස්වාමීනි, බැස වදළ මැනැව. මේ පාත්‍රය ද නුඹවහන්සේට මැ සුදුසු යැ. මම ද මාගේ අඹුදරුවන් හා එක් වැ නුඹවහන්සේගේ සරණ යෙමියි. නුඹවහන්සේ වැනි ආශ්වය‍ර්‍යපුරුෂයකු දුටු හෙයින් පාත්‍රය උඩ බැඳ එල්වීමෙහි ලාභ ලදිමි. ලොකයෙහි රහතුන් ඇති බව ද අද නුඹවහන්සේගේ ප්‍රසාදයෙන් මැ දත්මි. 'නුබුදු වැ බුදුම්හ'යි ඇවිදින්නා වූ සොරුන්ගේ වඤ්චා ද හසු කෙළෙමි. නුඹවහන්සේ වැනි කෙනෙකුන් තමන්ට ශිෂ්‍ය කොට ගෙණැ වසන ඒ සර්‍වඥයන් වහන්සේගේ ද මහිම දත්මි. ගැත්තවුගේ ගෙමිදුලත්, ගැත්තවුගේ මුදුනත්, ස්වාමීන්ගේ ශ්‍රීපාද ධූලීන් පවිත්‍ර කොට වදළ මැනැවැ"යි ආරාධනා කළහ.

ඉක්බිති තෙරුන්වහන්සේ ද සක්විතිරජුහුගේ ගෙදෙරට බස්නා සක්රුවනක් සේ සිටාණන්ගේ ගෙදෙරට බැස වදළ සෙයෙකැ. ඉක්බිති සිටාණෝ මහඇඟි කොට ආසන පණවා තෙරුන්වහන්සේ වඩා හිඳුවා "ස්වාමීනි, ඒ සා මහත් අතළගල ආකාශයෙහි රඳවා ගත්තේ මෙසේ වූ කොමලපත්ලෙන්[1]දැ"යි කියමින්, ඔවුන්වහන්සේගේ ශ්‍රීපාදය දෙහොතින් මුදුනෙහි තබා ගෙණැ සනහ සනහා, තමන් සිත ද නිවා සනහා ගෙණැ, වේලා ආසන්න වූ කලැ ඒ මැ පාත්‍රය ආකාශයෙන් බහවා ගෙණැ, එහි චතුමධුර පුරා තෙරුන්වහන්සේට පිළිගැන්වූහ. තෙරුන් වහන්සේ ද ඒ පාත්‍රය පිළිගෙණැ විහාරයට මැ වැඩිසේක.

එසමයෙහි වලට දර පලා ආදිය සොයා ගොස් ඒ ආශ්වය‍ර්‍ය නුදුටු ජනයෝ පසුපස්සෙහි ගොස් "ස්වාමීනි, ඇපි ඒ ආශ්වය‍ර්‍ය නුදුටුම්හ. අපට ද ඒ ආශ්වය‍ර්‍ය පෑ වදළ මැනැවැ"යි මහා කොලාහල කරන්නාහු යැ. ඒ තෙරුන්වහන්සේ ද ආආවන්ට සුදුසු සුදුසු පරිද්දෙන් ප්‍රාතිහාය‍ර්‍ය දක්වමින් විහාරයට මැ වැඩිසේක.

ඉක්බිති සර්‍වඥයන්වහන්සේ ඒ තෙරුන්වහන්සේ පසුපස්සෙහි අවුත් මහකොලාහල කරන්නා වූ මහාජනයාගේ ශබ්ද අසා "ආනන්දය, මේ කාගේ ශබ්දයෙක් දැ"යි විචාරා වදළසේක. ඉක්බිති අනඳමහ-තෙරුන්වහන්සේ "ස්වාමීනි, පිණ්ඩොලභාරද්වාජ නම් තෙරුන්වහන්සේ

1. මොළොක් පයින්

Non-Commercial Distribution

විසින් ආකාශයෙන් අවුදින් සඳුන් පාත්‍රයක් ගන්නාකලැ ඒ ආශ්චයර්‍ය්‍ය නුදුටු ජනයන් උන්වහන්සේ පසුපස්සෙහි අවුත් නැවැත ප්‍රාතිහාර්‍ය්‍ය දක්වන්නට ආරාධනා කොට, උන්වහන්සේ විසින් සුදුසු සුදුසු කොට ප්‍රාතිහාර්‍ය්‍ය දක්වූ කල්හි කරණ ලද සාධුකාර කොලාහල යැ''යි දන්වූ සෙයෙකැ. එපවත් අසා සර්‍වඥයන්වහන්සේ ඒ පිණ්ඩොලභාරද්වාජ නම් තෙරුන්වහන්සේ කැඳවා වදරා ''පිණ්ඩොලභාරද්වාජය, සැබැ ද තා මීනියා ඍද්ධිප්‍රතිහාර්‍ය්‍යයක් පෑ පාත්‍රයෙක් ගත්තේ? යැ''යි විචාරා ''සැබව, ස්වාමීනි''යි කී කල්හි ''භාරද්වාජය, කුමක් හෙයින් තා විසින් මෙසේ කරණලදදැ''යි උන්වහන්සේට නිඥ කොට, ඒ පාත්‍රය කැබලි කැබලි කොට බිඳුවා සෙසු වහන්සේවරුන් දට අඳුන් සටන පිණිස දෙවාවදරා ''මෙයින් මතු මෙපමණ ලාභයක් පිණිස ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නො පෑ හැක්කැ''යි ශික්‍ෂාපද පණවා වදළ සෙයෙකැ.

ඉක්බිති තීර්ථකයෝ ද ''සර්‍වඥයන්වහන්සේ පිණ්ඩොලභාරද්වාජ මහතෙරුන්වහන්සේ ගෙණැ ගිය පාත්‍රය බිඳුවා, වහන්සේ වරුන්දට අඳුන් සටන්නට දෙවා පියා ''ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නො පෑ හැක්කැ'යි ශික්‍ෂාපද පණවා වදළසේකැ යනු අසා ''ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ තමන් දිවි යේ නමුත් ශික්‍ෂාපද නො ඉක්මවති. ශ්‍රමණ ගෞතමයෝ ද ශ්‍රාවකයන්ට 'නො කළ මැනැවැ'' සම්මත කළ දැය තුමූ ද නො කරන්නාහු යැ. දන් අප විසින් ඔවුන් හා ස්පර්ධා කරන්නට අවකාශයක් ලබන ලදැ''යි සිතා නුවර වීථිආදියෙහි ඒ ඒ තැනැ සිටැ ''ඇපි අප සිතැ ඇති ගුණ අනුන්ට ප්‍රකාශ නො කළ මැනැවැයි සිතා දඬු පාත්‍රයක් පිණිස ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නො කළම්හැ. ශ්‍රමණගෞතමයන්ගේ ශ්‍රාවකයෝ මෙපමණක් පිණිස තමන්ගේ ගුණ ලෝවැස්සන්ට පහළ කළහැ. තපස්වීන් විසින් නම්, තමතමාගේ ඇති ගුණ නිධානයක් සේ රක්‍ෂා කරණබව මුත් අනුන්ට ප්‍රකාශ නො කට යුත්තේ යැ. ශ්‍රමණගෞතමයෝ තමන් නුවණැති හෙයින් පාත්‍රය බිඳුවා පියා 'මෙපමණ දෙයක් පිණිස ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නො කළ මැනැවැ'යි ශ්‍රාවකයන්ට ශික්‍ෂාපද පැණවූ ල. ඇපි මෙවිට ශ්‍රමණගෞතමයන් හා කැටි වැ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරම්හ''යි දෙඩා ඇවිදිනාහැ.

ඉක්බිති බිම්බිසාර රජ්ජුරුවෝ තීර්ථකයන් දෙඩනා මෙබස් අසා, සර්‍වඥයන් වහන්සේ කරා එළඹ ශ්‍රීපාදයට නැමී වැඳ එකත්පස් වැ හිඳ මධුරපටිසන්ථාරකථා කොට ''ස්වාමීනි, නුඹවහන්සේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නො කරණ පිණිස ශ්‍රාවකයන්ට ශික්‍ෂාපද පණවා වදළේ ඇද්දැ''යි විචාළාහැ. ඒ අසා ස්වාමිදරුවෝ ''මහරජ, එසේ ය, පැණවූද ඇතැ''යි

Non-Commercial Distribution

වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ "ස්වාමීනි! දැන් තීර්ථිකයෝ නුඹවහන්සේ හා මැ ස්පර්ධා කරම්හයි කියා ඇවිදින්නාහ. එයට කළ මනා කිම් දැ"යි විචාළාහ. ඒ අසා සර්වඥයන්වහන්සේ "මහරජ, තීර්ථිකයෝ ඍද්ධිප්‍රාතිහාර්ය්‍ය කෙරෙත් නම්, අපිත් අප ශක්තියක් කරන්නමෝ වේද, දෙරළ දෙරළ සිහා කන දුගීන් 'ධනසම්පන්නයම්හ"යි චක්‍රවර්තීන් හා ස්පර්ධා කරණකලැ, ඔවුන් හා ස්පර්ධා කරන්නට චක්වර්තීන්ට බැරි නො වෙයි. පාංශුපිසාචයන් 'ශක්‍රයා හා ස්පර්ධා කරම්හ'යි කීකලැ, ඔවුන් හා ස්පර්ධා කිරීම ශක්‍රයාට බැරි නො වෙයි. රාත්‍රියෙහි '(සූර්ය්‍යයා හා) ස්පර්ධා කරම්හ'යි සැරහුනු කද්‍යෝපැණියෝ දිවාභාගයෙහි තුමූ මැ නිෂ්ප්‍රභ වන්නාහ. මහත්වූ ගන්ධහස්තීහු හා ශරීරබලයෙන් ස්පර්ධා කරම්හ'යි ආ කැණහිල්බලු හස්තීහුගේ එකසොඬපහරකුදු ක්ෂමා කරන්නේ නො වෙයි. 'කෙශරසිංහයන් හා වාද කෙරෙමි'යි ආ ගම්හුරු සිංහයන්ගේ වික්‍රමයකුත් දක්කැ නො හෙයි. කුරවීකෙවිල්ලන් හා නාදයෙන් වාද කරන්නට ආ කවුඩු කවුඩුහඬ මැ හඬා පලයි. එහෙයින් තීර්ථිකයන් සිටැ 'ඍද්ධිප්‍රාතිහාර්ය්‍ය දක්වම්හ'යි කී තැනෙක්හි සර්වඥයෝ ද තමන්ගේ බුද්ධානුභාව දක්වන්නෝ වෙත් දැ"යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ "ස්වාමීනි, ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවා වදාළ කලැ නැවත ඒ ඍද්ධිප්‍රාතිහාර්ය්‍ය කරන්නේ කෙසේ දැ"යි විචාළහ. ඒ අසා ස්වාමිදරුවානන්වහන්සේ "මහරජ, මාගේ ශ්‍රාවකයන්ට ශික්ෂාපද පැණවූබව මුත්, මට ශික්ෂාපද නො පැණවීමි"යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ "ස්වාමීනි, තමා හැර අනුන්ට පණවන ශික්ෂාපදයෙක් නම් ඇද්දැ?"යි විචාළාහ. ඒ අසා සර්වඥයන්වහන්සේ "මහරජ, ඊට දෘෂ්ටාන්ත තා මැ විචාරමි. "මහරජ තාගේ උයනැ අඹ අනුන් නො කැ හැක්කැයි සම්මත කළ කල්හි, ඒ අඹ නැවැත තා කැ හැකි ද? නො කැ හැකි දැ?"යි විචාරා වදාළසේක. රජ්ජුරුවන් විසින් "ස්වාමීනි, අනුන් නො කැ හැකිබව මුත් මා කැ හැකි වේදැ"යි කීකල්හි "මහරජ, එසේ මැ කෙළලක්ෂයක් සක්වළැ එක හෙළා ආඥ පවත්නාවූ මාගේ ශික්ෂාපද මාගේ සව්වන් නො ඉක්මවනබව මුත්, මා විෂය ඒ ආඥව නැත. එහෙයින් තීර්ථිකයෝ ඍද්ධිප්‍රාතිහාර්ය්‍ය කෙරෙත් නම්, මම උන් හා ඍද්ධිප්‍රාතිහාර්ය්‍ය කෙරෙමි මැ යැ"යි වදාළසේක.

ඒ අසා තීර්ථිකයෝ "මෙවිටැ ඇපි නටුම්හ. ශ්‍රමණගෞතමයන් විසින් තමන්ගේ ශ්‍රාවකයන්ට මැ ශික්ෂාපද පණවන ලද බව මුත්, තමන්ට ශික්ෂාපද නො පණවනලද ල. එසේහෙයින් තුමූ මැ ඍද්ධිප්‍රාතිහාර්ය්‍ය කෙරෙත් ල. කුමක් කරමෝ දේ හෝ"යි ඔවුනොවුන් හා මන්ත්‍රණය කළහ.

Non-Commercial Distribution

ඉක්බිති රජ්ජුරුවෝ 'ස්වාමීනි, කවරද ද සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කොට වදරන්නේ? යැ''යි විචාළාහැ. ඉක්බිති ස්වාමිදරුවානන් වහන්සේ "මහරජ, මෙතනට සාරමසක් ගියකලැ ඇසළමස මැදිපොහෝද යැ''යි වදළසේකැ. ඒ අසා රජ්ජුරුවෝ "ස්වාමීනි, කොයි දී ද සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කොට වදරන්නේ? යැ''යි විචාළහැ. මහරජ, සැවැත්නුවර දී යැ'' යි වදළ සෙයෙකැ. සර්‍වඥයන් වහන්සේ මෙතෙක් දුරුතැන් වදළේ කුමක් පිණිස ද? යත්:- ඒ ස්ථානය සියලු බුදුන්වහන්සේවරුන්දගේ මහාප්‍රාතිහාර්‍ය්‍ය කරණ තැන් හෙයිනුත්, නැවැත සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය බලන්නට මහාජනයා රැස්වනු පිණිසත් දුරුතැන් දක්වා වදළසේකැ.

ඉක්බිති තීර්‍ත්‍ථකයෝ එපවත් අසා "ශ්‍රමණගෞතමයෝ මෙ තනට සාරමසක් ගියකලැ සැවැත්නුවරදී සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක්වත් ල. එහෙයින් දැන් ඔවුන් නො හැරැ මැ කැටි වැ ඇවිදුම්හයි. මහාජනයා ද ඔවුන් පසුපස්සෙහි යන්නාවූ අප දැකැ 'මේ කිමෙක් දැ'යි විචාරන්නාහ. එසේ විචාළාවූ ඔවුන්ට 'ඇපි ශ්‍රමණගෞතමයන් හා සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරම්හැ. ඒ අසා ශ්‍රමණගෞතමයෝ පලා යන්නාහැ. ඇපි ඔවුන් පාල යා නො දී කැටි වැ මැ යම්හ යි කියම් හැ''යි මන්ත්‍රණය කළාහු යැ.* ඉක්බිති බුදුන්වහන්සේ ද රජගහ නුවර පිඩු සිහා නික්මැ වදළසේකැ. තීර්‍ත්‍ථකයෝ ද සර්‍වඥයන් පසු පස්සෙහි නික්මැ බුදුන්වහන්සේ ඊයේ වැළඳූ තැනැ අද හිඳ ගන්නාහැ. අද වැළඳූ තැනැ තුමූ පෙරවරු බහා ගන්නාහැ. මහාජනයා මේ කිමෙක් දැ''යි විචාළකල්හි "ශ්‍රමණගෞතමයෝ මෙතනට සාරමසක් ගියකලැ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරම්හයි කීහැ. ඇපි ඔවුන් පසුපස්සෙහිලා පාල යා නො දී ඇවිදුම්හ''යි කියන්නාහු යැ. මහාජනයා ද 'ඒ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යද බලම්හ''යි පසු පස්සෙහි යන්නාහු යැ. ඉක්බිති සර්‍වඥයන්වහන්සේ ද ක්‍රමයෙන් සැවැත්නුවරට වැඩැ වදළසේකැ. තීර්‍ත්‍ථකයෝ ද එසේ මැ ගොස් තමන්ට උපස්ථාන කරන්නවුන් නළවා ගෙණැ, මසුලක්‍ෂයක් සොය ගෙණැ, තමන් සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරන්නට මණ්ඩපයක් කරවා, ඒ මණ්ඩපය නිලුපුලින් සොයවා "මී දී සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරම්හ'' හුන්හැ.

ඉක්බිති කොසලරජ්ජුරුවෝ සර්‍වඥයන්වහන්සේ කරා ගොස් "ස්වාමීනි, තීර්‍ත්‍ථකයෝ තමන් ප්‍රාතිහාර්‍ය්‍ය කරණ පිණිස මණ්ඩපයක් කරවූහැ. මමත් නුඹවහන්සේට මණ්ඩපයක් කරවමි''යි දැන්වූහැ. ඒ අසා ස්වාමිදරුවෝ "මහරජ, තෙපි මන්ඩපයක් නො කරව. අපට මණ්ඩපයක්

---

* ඇවිදුම්හයි මෙසේ කියන්නාහු යැ - බොහෝ

Non-Commercial Distribution

කරණ කෙණෙක් ඇතැ"යි වදළ සේකැ. ඒ අසා කොසලරජ්ජුරුවෝ "ස්වාමිදරුවානන්ට මා හැර අනික් කවුරු ද මණ්ඩපයක් කරන්නාහ?" යි විචාළාහැ. "මහරජ, මිනිස්කෙනෙකුන් කරණ මණ්ඩපයක් වී නම්, තොප මැ කරවන්නා වාද? ඒ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරණ දවස් අපට මණ්ඩපයක් කරන්නේ ශක්‍රදෙවෙන්ද්‍ර වේදැ"යි වදළසේකැ. ඉක්බිති කොසලරජ්ජුරුවෝ "ස්වාමීනි, ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නේ කොයි දී දැ"යි විචාළාහැ. "මහරජ, අඹගසක් මුලැ දී යැ, මා ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නේ"යි වදළසේකැ.

ඉක්බිති තීර්ථකයෝ "ශ්‍රමණගෞතමයන් ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නේ අඹගසක් මුලැ දී යැ" යනු අසා තමන්ගේ උපස්ථායකයන්ට කියා යොදනක් පමණ තැනැ දෙපෙති අඹපැළයකුත් තිබියැ නො දී අඹගස් උදුරුවා වලැ ගස්වාපීහැ. බුදුන්වහන්සේ ද ඇසළමස මැදිපොහෝදවස් අතුළුනුවරට වැඩැ වදළ සෙයෙකැ.

ඉක්බිති රජ්ජුරුවන්ගේ ගණ්ඩ නම් උයන්පල්ලා දිමිති කදල්ලේ බැඳ මුවා වැ තුබූ එක් විලිකුන් අඹපකක් දැකැ, ඒ ගෙණැ රජ්ජුරුවන් කරා යන්නේ, අතරමහැ බුදුන්වහන්සේ දැකැ "ඉදින් මේ අඹපක රජ්ජුරුවන්ට දුන්නෙම් වීම් නම්, ඔහු මේ අඹපක අනුභව කොට සතුටු වූවාහු මට අටකහවණුවක් හෝ සොළොස්කහවණුවක් හෝ දෙන්නාහැ. ඒ මට මේ ජාතියෙහි ජීවිකාවට ද නො සෑහෙන්නේ යැ. ඉදින් සර්‍වඥයන්වහන්සේට මේ අඹපක පිළිගැන්වූයෙම් වීම් නම්, මේ අඹපක මට අනන්තාපරිමාණජාතියෙහි සුව එළවන්නේ යැ"යි සිතා, ඒ සර්‍වඥයන් වහන්සේට එළවී යැ. ඉක්බිති සර්‍වඥයන්වහන්සේ අනඳමහතෙරුන් වහන්සේගේ මූණ බලා වදළසේකැ. උන්වහන්සේ ද ස්වාමිදරුවානන්-වහන්සේගේ අදහස් දන පාත්‍රධාතුන්වහන්සේ ශ්‍රීහස්තයට පිළිගැන්වූ සෙයෙකැ. ඉක්බිති සර්‍වඥයන්වහන්සේ ඒ අඹපක පිළිගෙණැ වදරා, එතැන්හි මැ වැඩැහිඳිනා ආකාර දක්වා වදළසේක. අනඳමහතෙරුන් වහන්සේ ද ඒ අදහස දැනැ එතැන්හි මැ බුද්ධාසන පණවා වදළසේකැ. ඉක්බිති සර්‍වඥයන් වහන්සේ පැණවූ බුද්ධාසනයෙහි වැඩැ හුන් කල්හි අනඳ මහතෙරුන්වහන්සේ පැන් පරහා ගෙණැ ඒ අඹපකින් පානු මැඩැ ගෙණැ පිළිගන්වා වදළසේකැ. සර්‍වඥයන්වහන්සේ ද ඒ අඹපැන් වළඳ වදරා ඒ ගණ්ඩම්බ නම් උද්‍යානපාලයාට "උද්‍යාන පාලය, මේ අඹඇටය මෙතැන්හි මැ පස් පීරාපියා හිඳුවා ල" යි වදළසේක.

ඉක්බිති ගණ්ඩම්බ නම් උද්‍යානපාලයා වදළබස් මුඳුනෙන් පිළිගෙණැ එතැන්හි මැ එක්තැනෙකැ පස් පීරාපියා අඹඇටය හිඳුවාලී

Non-Commercial Distribution

යැ. ඉක්බිති සර්වඥයන්වහන්සේ ඒ අඹඇටය මත්තෙහි ශ්‍රීහස්තය සෝධා පියා පැන් වත්කොට වදාළසෙයෙකැ. ඒ ඇස්ලෙහි මැ අඹඇට පළා ගෙණැ නඟුලිසක් පමණ දළුයෙක් නැඟී පණස්රියනක් පමණ උස ඇති මහඅරඹරුකෙක් වී යැ. එහි එවිටැ මැ 'බුදුන් ප්‍රාතිහාර්‍ය්‍ය පානා අඹගස් නැති කළම්හ'යි සිතා සතුටු වැ ඇවිදිනා තීර්‍ථිකයන්ගේ ලෙහි ඇවිළෙන ගිනිසිළු සේ මදපවනින් සැලෙන පලුපත් කෙතෙක් ද? සර්වඥයන්වහන්සේ කෙරෙහි ප්‍රසාද ඇත්තාවූ ජනයන්ගේ සිතැ පහළ වූ ප්‍රසාදඞ්කුර සේ සලෙල වැ[1] නැංගා වූ නවාඞ්කුර කෙකෙත් ද? බුද්ධශ්‍රීයට සලන චාමර සේ පවනින් වෙවුලන්නා වූ මල්කැන් කෙතෙක් ද? එසේ මැ තීර්‍ථිකයන්ට විෂඵල වැ, බෞද්ධයන්ට අමෘතඵල වැ, බුද්ධශ්‍රී පැලදි[2] මරකතකුණ්ඩලාභරණ වැ එලෙන්නා වූ අඹපක් කෙතෙක් ද? "පැවැති තීර්‍ථිකයෙනි, මෙවිට කොයි වදු ද? කොයි වදු ද"යි හඬ ගා කියන්නවුන් සේ උස් කොට හඬන්නා වූ කෙවිල්ලෝ කෙතෙක් ද? තීර්‍ථිකවිජයයට ඒ අඹගස බුදුන් හා මන්ත්‍රණය කරණ සේ මදයෙන් ලැසි ගෙණැ පවත්නා වූ බමරුන්ගේ හඬ කෙතෙක් ද? එහි බුදුන්ගේ අද්භූත වූ ගුණ දෙව්ලොවට කියන්නට පැනැ නැංගාක් මෙන් ඉඳුරා පැනැ නැඟි ශාඛා පණස් රියනැ. එසේ මැ ඒ ඒ දිගට කියන්නට නික්මැ ගත්තාක් මෙන් සතර දිගට නික්මැ ගත් මහාශාඛා සතර පණස්පණස්රියනැ. නාලොවට කියන්නට නික්මැ ගත්තාක් මෙන් ක්‍ෂණයෙහි මැ බට මහ මුල මෙතෙක් රියනැයි හිම් නැත. මේ ස්වාමිදරුවන් බොධිසත්ත්වභූමියෙහි චණ්ඩාල වැ උපන්කලැ පොවා අතින් පැන් ඉසැලූ කලැ ඒ ඇසිල්ලෙහි අඹගස් කල නොකල් නො විචාරා සහමල්පලු වැ පල ගෙණැ සිටිනේ යැ. දැන් මොවුන් සවාසන සකලක්ලෙශයන් නසා බුදු වැ ධර්‍මචක්‍රවර්‍ති වැ වැඩැ හිඳ ශ්‍රීහස්තය සෝධා පැන් වත්කළ කල්හි මෙසේ අඹගසක් සහමල් පල්ලෙන් සැදී සිටියි යනු කවර ආශ්චර්‍ය්‍යයෙක් ද? කවර විස්මයයෙක් ද?

නැවත සර්වඥයන්වහන්සේ හා කැටි වැ පසුපස්සෙහි වඩනා වහන්සේ වරුන්ද එ මැ විටැ මැ එයින් අඹ වළඳා වදාළසේකැ. ඉක්බිති රජ්ජුරුවෝ ද මෙපවත් අසා "මෙසේ ආශ්චර්‍ය්‍ය වූ අඹ ගසට කිසි උපද්‍රවයක් වී නම් නපුරැ"යි එවේලෙහි මැ තමන්ගෙන් රැකවල් ලැවූහැ.

ඉක්බිති ධූර්‍තයෝ තාක් ඒ අඹගසින් අඹ කා "කොල දුෂ්ට තීර්‍ථිකයෙනි, තෙපි හැම 'බුදුන්වහන්සේ ගණ්ඩම්බවෘක්‍ෂමූලයෙහි දී

---

1. සැලවලොව-සමහර. 2. වැලඳි-ඇතැම්.

Non-Commercial Distribution

ප්‍රාතිහාර්‍ය්‍ය කරම්හයි වදළසේකැ’ යනු අසා යොත්නක් පමණ තෙනැ එක්පෙති දෙපෙති අඹපැළ පවා උදුරා දම්මාපූව. අපගේ සර්‍වඥයන්වහන්සේට අඹගසක් ලැබගැන්ම උගහට යයි සිතූ ද? මේ අඹගස ගණ්ඩම්බ නම් උද්‍යානපාලයා හිඳවූ හෙයින් ගඬඹනමැයි නො සිතව. තොප ඇම ඇඟ ඇටින් පැහැර අප ගඬු නංවනහෙයින් ගඬඹනමැ”යි කියා තමතමන් කෑ කෑ අඹ ඇට බහාලා පැහැරැ ගඬු නංවමින් තීර්ථිකයන් මරා ලුහු බැඳ ගත්හ. එවේලෙහි එබී එබී අඹ ඇට වළහන තීර්ථිකයෝ කෙතෙක් දෙනා ද? ඔවුනොවුන් පිටිමුල් එලිඑලී අඹඇට වළහන්නෝ කෙතෙක් දෙනා ද? පහර කා හිසින් වැගිරෙණ ලෙහෙ පිසැ පිසැ දිවන තීර්ථිකයෝ කෙතෙක් දෙනා ද? ‘අප කරන්නාවූ ප්‍රාතිහාර්‍ය්‍යයෙහිත් නිමාවක් දකැ පියා කැමැත්තක් කරව’යි අත් ඔසවා ගෙණැ හඬ ගසන තීර්ථිකයෝ කෙතෙක් දෙනා ද?

මෙසේ තීර්ථිකයන් අඹඇටින් ගෙඩිබැට කකා, ඇතින් ඇතට දිවමින් සිටි සමයෙහි ශක්‍රදෙවේන්ද්‍රයා “සර්‍වඥයන්වහන්සේ හා වාද කරන්නට ආවා වූ තීර්ථිකයන් හොළ[1]වෙසින් සිටිනේ නො සරුපැයි, උනුත් මා සරහා සිටුවාලුව නො වේ ද”යි සිතා වාතවලාහකදිව්‍යපුත්‍රයා කැඳවාලා “තෝ මහත් වූ වාතමණ්ඩලයක් මවා තීර්ථිකයන්ගේ මණ්ඩපය උදුරා අශුචිබිමට ගසාපිය”යි නියොග කෙළේ. ඉක්බිති වාතවලාහකදිව්‍යපුත්‍ර ද මහත් වූ වාතමණ්ඩලයක් මවා බුදුපිරිස්ඇඟින් එකද රෝමයකුදු නො සොල්වා, සමහර තීර්ථිකකෙනෙකුන් පැහැරැ මුහුණින් හෙලා පියා, ඔවුන් ලක්‍ෂයක් වියදම් කොට කැරැවූ මඩුව පෙයායෙන්[2] නැඟූ මල් දමක් සේ ආකාශයට නඟා ගෙණැ, කන්කුළු කඩා වෙන වෙන දමමින්, ගෝනැස් කඩා දමමින්, සෙවූ තිලුපුල්මල් මකුළුහු සේ කඩා විසුරුවමින් ගෙණැ ගොස් අශුචිභූමියට දමා පී යැ. වාතමණ්ඩලයෙන් තමන්ගේ මඩුව අහසට නැහෙත් නැහෙත් “අප දුකින් කරවා ගත් මඩුව ගියේ යැ”යි හඬමින්, හිසැ අත තබ ගෙණැ ඇතින් ඇතට දිවන තීර්ථිකයෝ කෙතෙක් දෙනා ද? තමන් තමන් දෙවියන්ගේ නම්ගොත් කියා යදනා තීර්ථිකයෝ කෙතෙක් දෙනා ද?

මෙසේ නම්ගොත් කියා මේ තීර්ථිකයන් වළහම්ගෙයෙකැ හඬන්නවුන් සේ වියවුල් වැ හඬමින් සිටියැ දී, නැවත ශක්‍රයා සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයා කැඳවා “තෝ සූර්‍ය්‍යමණ්ඩලයෙන් අධික වූ රශ්මි පවත්වා මොවුන් පුටපාකයෙක්හි තැවුනුවන් සේ දැඩි වැ තව”යි කියා නියොග කෙළේ යැ. ඉක්බිති සූර්‍ය්‍යදිව්‍යපුත්‍ර ද ශක්‍රයාගේ නියොගයෙන් අධික වූ රශ්මි පවත්වා ඒ තීර්ථිකයන් හුණුහළුයෙහි ලූ මසුන් සේ එක පැහැරැ තවා

1. හෙලු-මුද්‍රිත. 2. මු වාතවේගයෙන්.

Non-Commercial Distribution

සර්වාඞ්ගයෙන් ස්වෙද සෙල්වී. මෙසේ චණ්ඩපරුෂ වූ සූර්‍ය්‍යතෙජස බුදුපිරිසට හෙල්මැලිකලප් සේ සිහිල්ගුණ මැ දක්වී.

නැවත ශක්‍රදෙවෙන්ද්‍රතෙම වාතවලාහකදිව්‍යපුත්‍රයා කැඳවා "තෝ වාතයෙන් රජස් ගෙණැ ගොස් තීර්ථිකයන්ගේ ස්වෙද ගත් ශරීරයෙහි රජස් වගුරුව"යි නියොග කෙළේ. ඉක්බිති වාතවලාහකදිව්‍යපුත්‍ර කී පරිද්දෙන් කොට සියලු තීර්ථිකයන් වෙනවෙන මැ තඹහුඹස් සේ කෙළේ යැ.

නැවත ශක්‍රදෙවෙන්ද්‍රතෙම වස්සවලාහකදිව්‍යපුත්‍රයා කැඳවාලා "තෝ ද තීර්ථිකයන්ගේ රජස් ගත් ඇඟ මහත් මහත් ජල බින්දු හෙළ"යි නියොග කෙළේ. ඉක්බිති ඒ වස්සවලාහකදිව්‍ය පුත්‍රයා එසේ කරත් මැ, ඒ තීර්ථිකයෝ සමහරු කබරගොන් සේ ද සමහරු මුවන් සේ ද, සමහරු දිවිබාවන් සේ ද මහාවිකාරයට පැමිණියාහැ. එසේ වස්නා ඒ වැසි ද බුදුපිරිසට පොකුරු වැසි මැ වී.

එතැන්හි කැටි වූ ධූර්තයන් තාක් "පෙළහර පානට බොහෝ වියදම් කොට කැරවූ මඬුව තුබූනියාත් දුටුම්හ. දන් පෙළහර පානට මෙසේ සැරහී සිටැ ගත් නියාත් දුටුම්හ. බුදුවෙස වූ නියාවට තොප ගත් වෙස මැ ඉතා රිසියෙයි. මෙයට වැඩි අනික් කවර පෙළහරක් පවූ ද? අපට තෙපි මැ දිනුව. අපගේ බුදුන්වහන්සේට වඩවඩා පරිභව නො කරව"යි මෙසේ අපහාස කරන්නට වන් කල්හි ලජ්ජාවෙන් සිටැ පියැ නො හී හිස් ලූලූ දිසාවෙහි දිවන්නට වන්හැ.

එසමයෙහි පූරණකාශ්‍යපයාගේ උපාසක වූ එක් ගොවියෙක් වේලාපසැ සී සා පියා "මාගේ පූරණකාශ්‍යප ස්වාමීන්ගේ පෙළහර බලන්නට වේලාපසැ එමී" කියා කල් තබා එන්නේ දිවිබාවකු සේ දිවන පූරණකාශ්‍යපයා දැක "හැයි, ස්වාමීනි; නුඹගේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය බලන්නට වද මා එන්නේ? නුඹ වහන්සේ යන්නේ බැහැරක් දැ"යි කී ය. ඒ අසා පූරණකාශ්‍යප තෙම "තාගේ වළහම්පෙළහර තබා, තා අතැ තුබූ කළය හා බාන මට දෙව"යි දෙක උදුරා පියා හැරගෙණැ පාල ගොස් කර කළය බැඳ ගෙණ ගඟ දියෙහි ගැලි කළකටින් වන් පැතින් බිබුළු නඟනහා ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කොට මියැ අවීචිමහානරකයෙහි උපන. මෙසේ තීර්ථිකයෝ ඇසින් වැගිරෙණ කඳුළුධාරායෙන් හා ලෙන් නැඟෙන ශොකාග්නියෙන් හා බුදුන්ට පළමු කොට යමා මහපෙළහර දක්වූහැ.

ඉක්බිති ලොකාචාර්‍ය්‍ය වූ අනාචාර්‍ය්‍ය වූ ධර්මචක්‍රවර්ති වූ ධර්මධ්වජ වූ ත්‍රිභුවනචූඩාමාණික්‍ය වූ දශබලධාරී වූ චතුවෛශාරද්‍ය විශාරද වූ අසමසම වූ අප්‍රතිපුද්ගල වූ ආශ්චර්‍ය්‍යනිධාන වූ සමන්ත භද්‍ර වූ අකුතොභය

Non-Commercial Distribution

වූ ලොකාලොකදිවාකර වූ මුළුලොවට පිහිට වූ ලොකස්වාමි වූ නෙත්‍රොත්සවයට නිධාන වූ ස්වාමිදරුවානන් වහන්සේ කල්හිම් බලා "මේ පෙළහර පානට සුදුසු වේලා යැ"යි නිශ්චය කොට, කිසි චකිතකමක් නැති වැ, කිසි ශඞ්කාවක් නැති වැ, දන් දන් සියලු අප්‍රමාණසර්‍වඥයන් කොට ආ යමකප්‍රාතිහාර්‍ය්‍ය කොට සියලු ලෝ විස්මයෙන් නටවමින්, ගී කියවමින්, අපොළවමින්, බිමැ පෙරළා වඳවමින් යමකප්‍රාතිහාර්‍ය්‍ය කෙරෙමි"යි සිතාවදරා සිංහශය්‍යායෙන් නැඟී සත්රුවන්මෙරපාමුල්හි ප්‍රවාලවේදිකාවක් ලා ලන්නා සේ අතිරක්ත වූ හඳනාව හැඳ, විශද වූ විද්‍යුල්ලතායෙකින් රන්ඇගෑයක් වලඳනාක්හු මෙන් ඒ මත්තෙහි කායබන්‍ධනය බැඳ, අසුරවිජයට නික්මැ ගත්තා වූ ඓරාවණ නම් දිව්‍යහස්තිහු වසා හෙළාලූ රත් වූ දිව්‍යකම්බලයක් සේ අතිරක්ත වූ සුගතචීවරය සුදුසු පරිද්දෙන් පෙරෙවැ, දික් කළා වූ ශ්‍රීපාදය පිළිගන්නට නැඟි පියුමෙහි ශ්‍රීපාදය ඔබත් ඔබත් මැ පැනැ නැංගා වූ රේණුස්කන්‍ධය සියලු ගඳකෙළියෙහි මැ සිසැරී කෙසිවිදින් නික්මැ අහස් වසැ දිවන්නට වන් කල්හි, ඒ සලකුණෙන් "ස්වාමිදරුවෝ වැඩැ වදළසේකැ"යි සතිස්යොදනක් පමණ තැනැ අතුරුසිදුරු නැති වැ පූරා ගෙණැ සිටි බුදු පිරිස දෙහොත් මුදුනෙහි තබා ගෙණැ ඒ දිශාව බලා සාධුකාර දෙන්නට වන් කල්හි, දසදහසක් සක්වළැ දෙවි බඹුන් සියලු ආකාශය පුරා බුද්ධශ්‍රී බලම්හයි සැරහි සිටැ ගත් කල්හි, දෙර ඇළයට වඩනා හා මැ ශ්‍රීහස්තය නො දික් කරවා මැ දෙර තමා මැ තමාට ඇරී ගිය සඳෙහි මැ මියරක් බිඳ ගෙණැ නික්මැ ගත් මහවතුරක් සේ එක පැහැර බුදුරස් එදෙරින් නික්මැ මුළුලොව වසන්නට වන් කල්හි, හුදුඅමායෙන් මවාලූ රුවක් සේ, හුදු විස්මයෙන් මවාලූ රුවක් සේ, හුදු සන්තොෂයෙන් මවාලූ රුවක් සේ, හුදු තෙජසින් මවාලූ රුවක් සේ, හුදු මෛත්‍රියෙන් මවාලූ රුවක් සේ, හුදු කරුණායෙන් මවාලූ රුවක් සේ, හුදු මුදිතායෙන් මවාලූ රුවක් සේ, හුදු උපෙක්‍ෂායෙන් මවාලූ රුවක් සේ, හුදු ශීලයෙන් මවාලූ රුවක් සේ, හුදු සමාධියෙන් මවාලූ රුවක් සේ, හුදු ප්‍රඥයෙන් මවාලූ රුවක් සේ, හුදු නිර්‍වාණය තපස්විවෙශය ගෙණැ තමා මැ අවුත් ඇසට පැණී ගියා සේ, අවුත් මුළුලොවට පැණී ගොස්, සියලු සතුන් ඇස් නිවමින්, සියලු සතුන් සිත් නිවමින්, ගඳකෙළිනිසවත්තෙහි වැඩැ සිටිසේක.

ඒ තාක් තැන් හිවී ගැවසී සිටි ඒ සා මහත් පිරිසින් අනික් දසාවක් බැලුවෝ කවුරු ද? අනිකක් සිතුවෝ කවුරු ද? අනික් බසක් ඇසුවෝ කවුරු ද? හැමදෙන මැ එක පැහැර "අහෝ! බුද්ධො, අහෝ! බුද්ධො"යි ස්වාමිදරුවන්ගේ නම මැ කියා විස්මය පත් වැ හඬ ගහමින්,

Non-Commercial Distribution

"නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස. නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස" යි එක පැහැර තුන් විටක් හඬ ගහා වදිමින්, "තවත් පෙළහරක් ද? ස්වාමීනි, මෙතෙක් ම ද ස්වාමීනි! යි කියමින්, ආභරණ ගලවා දමමින්, හන්සළු හිස සලමින්, සුරාපාණයෙන් මත් වූවන් සේ තමන් අවධි තුමූ මැ නො දන්නාහු බමන්නට වන්හැ. දෙවතාවෝ සියලුසක්වළ පුරා පරසතුමඳරාමල් වස්වන්නට වන්හැ.

මෙසේ අනන්ත වූ ආශ්වර්‍ය්‍ය පවත්වමින් සිටියැ දී සර්‍වඥයන් වහන්සේගේ ශාසනයෙහි අනාගාමි වූ මහත් සෘද්ධි ඇති සරණී නම් උපාසිකා කෙනෙක් අවුත් සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීපාදය භක්තීන් වැඳ නැඟී සිටැ "ස්වාමීනි, "මා සේ වූ මිඩියක සිටියැ දී, තීර්ත්‍ථිකයන් පමණකට ස්වාමිදරුවෝ පෙළහර පාවිති' යනු කවර සරුපයෙක් ද? මම ත්, ස්වාමිදරුවන්ගේ අනික් මා සේ මිඩියක මුත්, සියලු ලෝවැස්සන් කොට ගත නො හැකි පෙළහර පාමි"යි ආරාධනා කොට සිටියාහැ. ඒ අසා ස්වාමිදරුවෝ ඒ උපාසිකාවන් ලවා මැ සිංහනාද කරවනු කැමැති වැ "තෝ කවර පරිද්දකින් පෙළහර පාවි ද"යි විචාරා වදළසේකැ. ඒ අසා උපාසිකාවෝ තමන්ගේ ශක්ති දක්වන්නාහු "ස්වාමීනි, මම සතිස්ලක්‍ෂ දසදහස් තුන්සියපණස්යොදුන් පමණ මුළුසක්වළ මහපොළොව එක පැහැර දිය කොට පියා, දියකෙළි කෙළනා පරිද්දෙන්, පක්‍ෂියකගේ වෙස් ගෙණැ නැහෙනහිරි සක්වළ මුවවිටැ සිටැ ගෙණැ මුළුසක්වළ පුරා සිටි බුදුපිරිසට මා පැලා, එතැනැ දී ගැලී ගිය හිස බස්නාහිරිසක්වළ මුවවිටැ දී නහා ගන්මි. නැවත එතැනැදීත් සියලු බුදුපිරිසට පැණී ලා එතැනින් ගැලූ හිස පූර්‍වචක්‍රවාල භිත්තියෙන් නහාපියමි. මෙසේ සතරදිගින් කිබිසැ කිබිසැ නැඟි නැඟී සමහරවිටැ මැදින් හිස නහා පියමි. 'මෙසේ මහත් වූ සෘද්ධියක් ඇති මොහු කවරු ද'යි විචාළ දෙව්බඹුන් සහිත වූ ලොවට "මම අනිකෙකිමි නො වෙමි. ගෞතමගොත්‍රයෙහි උපන්නා වූ ධර්‍මචක්‍රවර්‍ත්ති වූ තිලෝගුරු සම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ ශ්‍රීපාදධූලි වගුළ විහාරභූමියෙහි මා මුදුන් පහළ පමණෙකින් මෙසේ වූ සෘද්ධියක් ලත්, ස්වාමිදරුවානන්ගේ ශාසනයෙහි මහණ වූවන් කෙරෙන් පිටත්, එක්තරා මිඩියකිමි'යි කියමි . මෙසේ කල්හි ස්වාමිදරුවන් හා ස්පර්ධා කරණු කැමැති ව ආ තීර්ත්‍ථිකයෝ ස්වාමිදරුවානන්ගේ ශ්‍රීමුඛය නො දැකැ මැ ඇත මැ වියැකි යන්නාහ"යි දන්වූවාහැ. ඒ අසා ස්වාමිදරුවෝ "තී මෙපමණ ශක්ති ඇති බව මමත් දනිමි. එතෙකුදු වුවත් මෙතැන්හි මේ පෙළහර මා මැ කරණබව මුත් තී සේ වූවන්ට සුදුසු නො වෙ"යි කියා වලකා වදළසේක.

Non-Commercial Distribution

ඉක්බිති සුලුඅනේපිඩුමහසිටාණෝ අවුත් සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ සිටැ "මා සේ වූ අනාගාමිගැත්තක්හු සිටියැ දී, ස්වාමිදරුවන් පෙළහර පාතේ කුමක් පිණිස ද? සියලු සේනාව බිඳී ගියකලැ වේද රජ් ජුරුවන් තමන් ඇතු නැඟෙන්නේ? මම මේ බොරුබුදුන් සදෙනාගේ මන් හැරැ පෙළහර පාමි"යි දන්වූ සෙයෙකැ. ඒ අසා සර්වඥයන්වහන්සේ ඔබගේ ශක්ති සියලු පිරිසට ප්‍රකාශ කරණු කැමැති වැ "අනාථපිණ්ඩිකය, තෝ කවර පරිද්දෙකින් පෙළහර කෙරෙහි ද"යි විචාරා වදළසේක. ඒ අසා සිටාණෝ "ස්වාමීනි, මම මිනිස්වෙසින් සිටැ සියලු පිරිස් බලබලා සිටියැ දී, මාගේ මිනිසත්බව පෙරළා, දෙළොස් යොදුන් බ්‍රහ්මාත්මභාවයක් මවා ගෙණැ, මේ සියලු පර්ෂදට ඇසෙන පරිද්දෙන් මහත් කොට අපොළා "මම ස්වාමීන්ගේ ආනුභාවයෙන් අනගැමි වූයෙමි. මේ තීර්ථිකයනුදු ස්වාමීන් කරා අභිමානයෙන් නො එන පරිද්දෙන් අනාගාමි[1] කෙරෙමි කියමි"යි දන්වූහැ. සර්වඥයන්වහන්සේ ඔබත් වළකා වදළසේක.

ඉක්බිති ස්වාමිදරුවන්ගේ සස්නෙහි පැවිදි වැ සිවුපිළිසිඹියා පත් රහත් වූ, වයසින් සත්හැවිරිදි වූ චිරා නම් සාමණෙරින් වහන්සේ "ස්වාමීනි, තීර්ථිකයන්ගේ මන් බිඳ මම ඍද්ධිප්‍රාතිහාර්ය්‍ය කෙරෙමී"යි දන්වා "තෝ කෙසේ ප්‍රාතිහාර්ය්‍ය කෙරෙහි ද"යි විචාරා වදළකල්හි "ස්වාමීනි, මම මහමෙර හා සක්වළගල් හා හිමාලයපර්වතය හා තුණ ලහලීවට තුණක් සේ උදුරා ගෙණැ මෙතැනැ තබාලා, හංසවෙශයක් ගෙණැ එක් පර්වතයක් පළා ගෙණැ, අනික් පර්වතයෙන් නැඟෙමි. 'තෝ කවරක්හි ද'යි විචාළ වූ සියලු පර්ෂදට 'මම සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාදපද්මයෙහි රාජහංසලීලා දක්වන්නා වූ සත්හැවිරිදි වූ මෙහෙණින් නකිමි'යි කියමි. එකල්හි තීර්ථිකයෝ ස්වාමීන්ගේ ශ්‍රීමුඛය නො දකැ මැ බිඳී යන්නාහ"යි දන්වා සිටිසෙයෙකැ.

ඉක්බිති සිවුපිළිඹියාපත් වූ චුන්ද නම් සාමණෙරයන් වහන්සේ අවුත් ශ්‍රීපාදය වැඳ "ස්වාමීනි, මම මේ සියලු ජම්බුද්වීපයට ධ්වජයක් සේ සිටියා වූ පන්සියක් යොදුන් උස ඇති මහදඹරුක මුල අල්වා ගෙණැ, පිලඅත්තක් අල්වා ගෙණැ කෙළනා මතැතක්හු සේ සලාපියා, ඉන් වැගිරැ ගිය මහදඹපක් මේ සියලු පිරිස වළදවමි"යි දන්වූ සෙයෙකැ.

ඉක්බිති බුදුසසුන් නමැති කනකපර්වතයෙහි හටගත් ශාඛා ලතාවක් වැනි, ඍද්ධිමත් වූ භික්ෂුණීන්වහන්සේවරුන්ද කෙරෙහි අගතන් ලද උප්පලවන්මහාථෙරීන්වහන්සේ අවුත්, ශ්‍රීපාදය වැඳ සිටැ "ස්වාමීනි, මම

1. පෙළහර-ඇතැම්.

Non-Commercial Distribution

මේ බුදුපිරිස සිටියා සේ මැ සිටියැ දී අනික් සතිස්යොදනෙකැ පැතිරැ සිටි මහපිරිසක් මවාලා, මම ද මාගේ මෙහෙණිවෙස හැරැ, මහානුභාව ඇති සක්විතිරජ වෙසක් මවා ගෙණැ, වෙන වෙන දිලියෙන්නා වූ සත්රුවනින් යුක්ත වැ අවුත්, ස්වාමිදරුවානන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ සිටිමි''යි දක්වූ සෙයෙකැ.

ඉක්බිති සෘද්ධියට මැ බැහැවි සිටි මුගලන්මහතෙරුන් වහන්සේ අවුත් වැඳ සිටැ "ස්වාමීනි, එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් මහමෙර සත්දරණපටෙකින් වැලැඳ හොත් නන්‍දොපනන්‍ද නම් නාගරාජයා දමන වේලෙහිත් ස්වාමීන් වදළ වූ උපදෙශයට විරොධියකුත් නො කෙළෙමි. ස්වාමීන්ට ආයාසයකුත් නො කෙළෙමි. බුදුසස්නට පරිභවයකුත් නො කෙළෙමි. එහෙයින් මෙතන්හිදු මම් මැ තීර්‍ත්‍ථකයන්ගේ මානමර්‍ද්දනය කොට ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නා කැමැත්තෙමි''යි දන්වා "තෝ කෙසේ වූ පෙළහරක් පාවී ද? විචාරා වදළ කල්හි "ස්වාමීනි, මම එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් මහමෙර උඳුටක් සේ දත්හස්සෙහි තබා ගණිමි''යි එකක් වදළසේක. "නැවැත කුමක් කෙරෙහි ද''යි විචාරා වදළ කල්හි "දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් පමණ බොල ඇති මේ මහපොළොව කළාලක් සේ හකුළුවා ඇඟිලිහස්සෙහි තබා ගන්මි''යි දන්වූ සෙයෙකැ. "නැවැත කුමක් කෙරෙහි ද''යි විචාරා වදළකල්හි "මේ මහපොළොව කබලක් සේ පෙරළා යටිපිටි ඔජස ඇරැ ගෙණැ. මේ මහපිරිසට බෙද දෙමි''යි දන්වූ සේක. "නැවැත කුමක් කෙරෙහි දැයි?''යි විචාරා වදළකල්හි "මේ මහපොළොව මා වමතට නහා ගෙණැ, මේ මහාද්වීපයෙහි සතුන් අනික් ද්වීපයෙකැ ලා ලමි''යි දන්වූ සේක. "තවත් කුමක් කෙරෙහි ද''යි වදළකල්හි "මහමෙර කුඩදඬක් සේ ගෙණැ මහපොළොව ඊමත්තෙහි කුඩයක් සේ තබාලා, පත්කුඩයක් අල්වා ගෙණැ සක්මන් කරණ මහණක්හු සේ සක්මන් කෙරෙමි''යි දන්වූ සේක.

මේ හැම අසා බුදුන්වහන්සේ "තොපි හැමදෙනා මේ කී කී පෙළහර පෑමෙහි ශක්ති ඇති බව දනිමි. එතෙකුදු වුවත් මුළු ලොවට විස්මය එළවා මා පානට සිතන්නා වූ පෙළහර තොපට නො පිළිවන. දැන් මා බුදු වූ කල් තබා, බොධිසත්‍වභූමියෙහි තිරිසන් වැ ඉපැද, මා කළ ආශ්වර්‍ය්‍ය මුළුලොවැ සත්‍ත්‍වයෝත් කරන්නට අසමර්‍ත්‍ථයෝ යැ''යි කණ්හැටසහජාතකය ගෙණැ ඇරැ[1] වදරා ගඳකිළිනිසවත්තෙන් නික්මැ මලුවට වැඩැ අහස බැලූ සේක. එක්කෙළවරක් නැහෙනහිරිසක්වළැ මුවවිටෙහි තුබූ අනික් කෙළවර බස්නාහිරිසක්වළැ මුවැවිටැ පිහිටි,

1. ගෙණවුත්-බොහෝ.

Non-Commercial Distribution

දසදහසක් සක්වළැ දසදහසක් රුවන්මෙර උසුලා සිටිනා මහටැම් වූ, රුවන් සක්මන ඉන්‍ද්‍රජාලයෙහි රූපයක් මෙන් අවුත් ආකාශයෙහි පැණී ගියේ. එවේළෙහි අවිචියෙහි පටන් භවාග්‍රය දක්වා ඒ ආශ්චර්‍ය්‍ය දුටුවන් කෙරෙන් එක පැහැරැ "ඔ හො"යි හඬ නහා නුපු කෙනෙක් නැත. ස්වාමිදරුවෝ ද ඒ දෙව්බඹපිරිස්මැද, කද්පැණියන් මැදට වන් සරාහිරුමඬලපරිද්දෙන්, සියලුලෝවැස්සන් මැඩ ගෙණැ රුවන්සක්මන මත්තට පැනැ නැඟි සේක.

'ඉදිරියෙහි දෙළොස්යොදුන් පිරිස යැ, පස්සෙහි දෙළොස් යොදුන් පිරිස යැ, දලයෙහි දෙළොස්යොදුන් දෙළොස්යොදුන් පිරිස යැ'යි මෙසේ සතරදිගින් සූවිසියොදනක් පමණතැන් පිරිස් මැද රුවන්සක්මනට සර්‍වඥයන්වහන්සේ පැනැ නැඟී සිටුත් මැ, ශ්‍රීශරීරයෙහි නාභියෙන් මත්තෙහි තුන්ලොව බබලන්නා වූ මහගිනිකදෙක් නැහෙන්නට වන. නැවැත නාභියෙන් පාතැ ශ්‍රීශරීරයෙන් ආකාශගඞ්ගාප්‍රවාහයක් සේ මහදියකදෙක් නැහෙන්නට වන. නැවැත ගිනිකඳ හුනු පූර්‍වකායයෙන් දියකදෙක් හෙන්නට වන. දියකඳ හුනු අධඃකායයෙන් දියකදෙක් හෙන්නට වන. ශරීරයෙහි ශ්‍රීමුඛය දිශාවෙන් ගිනිකදෙක් නැහෙන්නට වන. පිට දිශාවෙන් දියකදෙක් නැහෙන්නට වන. හෙ ද පෙරළී පිට දිශාවෙන් ගිනිකදෙක් නැහෙන්නට වන. අභිමුඛයෙන් ගිනිකදෙක් නැහෙන්නට වන. දකුණැසින් නාඹතල්කදක් සා ගිනිකදෙක් නැහෙන්නට වන. වමැසින් නාඹතල්කදක් සා දියකදෙක් නැහෙන්නට වන. දකුණුකන්සොරොව්වෙන්[1] නාඹතල්කදක් සා ගිනිකදක් නැහෙන්නට වන. වම්කන්සොරොව්වෙන් නාඹතල්කදක් සා ගිනිකදෙක් හෙන්නට වන. දකුණුකන් සොරොව්වෙන් නාඹතල්කදක් සා ගිනිකදෙක් නැහෙන්නට වන. වම්කන්සොරොව්වෙන් නාඹතල්කදක් සා ගිනිකදෙක් හෙන්නට වන. දකුණුනාසාසිදුරෙන් නාඹතල්කදක් සා දියකදෙක් හෙන්නට වන. වම්නාසාසිදුරෙන් නාඹතල්කදක් සා දියකදෙක් හෙන්නට වන. දකුණුනාසාසිදුරෙන් නාඹතල්කදක් සා දියකදෙක් හෙන්නට වන. වම්නාසාසිදුරෙන් නාඹතල්කදක් සා ගිනිකදෙක් හෙන්නට වන. දකුණුදසරුවෙන් නාඹතල්කදක් සා ගිනිකදෙක් නැහෙන්නට වන. වම්දසරුවෙන් නාඹතල්කදක් සා දියකදෙක් හෙන්නට වන. දකුණුදසරුවෙන් නාඹතල්කදක් සා දියකදෙක් හෙන්නට වන. වම්දසරුවෙන් නාඹතල්කදක් සා ගිනිකදෙක් හෙන්නට වන. දකුණු ශ්‍රීහස්තයෙන් නාඹතල්කදක් සා ගිනිකදෙක් නැහෙන්නට වන. වම් ශ්‍රීහස්තයෙන් නාඹතල්කදක් සා දියකදෙක් නැහෙන්නට වන. වම්

1. සිදුරෙන්-සොරලුවෙන්-සමහර

Non-Commercial Distribution

ශ්‍රීහස්තයෙන් නාඹතල්කඳක් සා ගිනිකඳෙක් හෙන්නට වන. දකුණු ශ්‍රීහස්තයෙන් නාඹතල්කඳක් සා දියකඳෙක් නැහෙන්නට වන දකුණු ශ්‍රීපාදයෙන් නාඹතල්කඳක් සා ගිනි කඳෙක් නැහෙන්නට වන. වම්ශ්‍රීපාදයෙන් නාඹතල්කඳක් සා දියකඳෙක් හෙන්නට වන. දකුණුශ්‍රීපාදයෙන් පෙරළී නාඹතල් කඳක් සා දියකඳෙක් නැහෙන්නට වන. වම්ශ්‍රීපාදයෙන් පෙරළී නාඹතල්කඳක් සා ගිනිකඳෙක් හෙන්නට වන. නැවැත එකිඑකී ඇඟිල්ලෙන් නාඹතල්කඳක් සා ගිනිකඳෙක් නැහෙන්නට වන. ඒ ඒ ඇඟිලි හසුහස්සෙන් නාඹතල්කඳක් සා දියකඳ හෙන්නට වන. පෙරළී ඇඟිලි හසුහස්සෙන් දියකඳ හුනු තැනින් ගිනිකඳ නැහෙන්නේ යැ. ගිනිකඳ නැඟි තැනින් දියකඳ හෙන්නේ යැ. සියලු ශරීරයෙහි එකිඑකී රොමයෙන් නාඹතල්කඳ සා ගිනිකඳ නැහෙන්නට වන. එකිඑකී රොමකූපයෙන් නාඹතල්කඳ සා දියකඳ හෙන්නට වන. පෙරළා දියකඳ හුනු තැනින් ගිනිකඳ නැහෙන්නට වන. ගිනිකඳ නැඟි තැනින් දියකඳ හෙන්නට වන.

මෙසේ නැහෙන්නාවූ වහ්නිස්කන්ධය හා ජලස්කන්ධය අතුරෙන් සවණක් ඝන බුදුරස් ඉන් ඊ වලඳිමින්, ඉන් ඊ පෙරළමින් ඉන් ඊ රැඳෙමින්, ඉන් ඊ කරකැවෙමින් මුළුසක්වල මැඩැ ගෙණැ දිවන්නේ යැ. අපිව, අග්නිස්කන්ධය හා ජලස්කන්ධය හා දෙක මැ බඹලොව දක්වා නැඟී, ආයේ පෙරළී අවුත්, දෙයාසූදහසක් යොදුන් සක්වළගල්මුවවිට ගැසී පරසක්වළ මැඩැ ගෙණැ දිවන්නේ යැ. ඒ අතරතුරෙන් දිවන්නාවූ සවණක් ඝන බුදුරස්විරුවා[1]පියා කළමුවවිටින් නමන රන්රස සේ, යන්ත්‍රනළින් මැඩැ නහනා දෙයක් සේ, එසේ ම භවාග්‍රය දක්වා නැඟී පෙරළී අවුත් සක්වළගලමුවවිට නැසී හෙන්නේ යැ. එකල්හි සියලු සක්වළගබ සත්රුවන්ගෝනැසින් සඳලූ මඩුවක් සේ එක පැහැර දිලියෙන්නට වන.

මෙසේ පෙළහර පානා වූ ස්වාමිදරුවානෝ එකි එකී වහ්නිස්කන්ධයට තෙජොකසිණසමවත් සමවදනාසේක. එකි එකී ජලස්කන්ධයට ආපොකසිණසමවත් සමවදනාසේක. සවණක් ඝන බුදුරස් පිණිස වෙන වෙන නීලකසිණ පීතකසිණාදියට සමවදනා සේක. තුඞ නො හැර මැ බණ වදරණසේක. තමන්වහන්සේගේ ධර්‍මයට ඒ පිරිස සාධුකාර දෙන සමයෙහි, සතිස්යොදනෙක්හි අතුරුසිඳුරු නැති වැ හිවී ගැවැසී සිටි පිරිසෙහි, සියලු සතුන් වෙන වෙන මැ තෝරා "මොහුගේ චිත්තය රාගසහිත යැ. මොහුගේ චිත්තය රාගසහිත නො වෙයි. මොහුගේ චිත්තය ද්වෙෂසහිත යැ. මොහුගේ චිත්තය ද්වෙෂසහිත නො වෙයි.

1. විසුරුවා හැම

Non-Commercial Distribution

මොහුගේ චිත්තය මොහසහිත යැ. මොහුගේ චිත්තය මොහසහිත නො වෙයි. මොහුගේ චිත්තය සංක්ෂිප්ත යැ. මොහුගේ චිත්තය වික්ෂිප්ත යැ. මොහුගේ චිත්තය මහග්ගත යැ. මොහුගේ චිත්තය අමහග්ගත යැ. මොහුගේ චිත්තය සොත්තර යැ. මොහුගේ චිත්තය අනුත්තර යැ. මොහුගේ චිත්තය සමාහිත යැ. මොහුගේ චිත්තය අසමාහිත යැ. මොහුගේ චිත්තය විමුක්ත යැ. මොහුගේ චිත්තය අවිමුක්ත යැ"යි පරීක්‍ෂා කොට "මොහට මෙසේ බණ කිව මැනැව. මොහට මෙසේ බණ කිව මැනැවැ"යි සිතා වෙන වෙන බණ වදරණසෙයෙකැ.

මෙසේ එක තමන්වහන්සේගේ මැ විස්මයට මුළුලොව හක කෙරෙමින්, මහත් වූ පෙළහර දක්වමින් වැඩැ සිටැ, එක ඇතක්හු සිටිනා පව්වට ඇතුන් දෙන්නකු තබා ලූවා සේ, තමන් වහන්සේගේ විස්මයට හක වූ ලොවට අනික් නිර්මිත බුදුකෙනකුන් මවා වදළසේක දෙදෙනාවහන්සේගේ මැ උස සම යැ. ශරීරවර්ණ සම යැ. කරණ පෙළහර සම යැ. එක් බුදුකෙනකුන් වහන්සේ සක්මන් කරණ කල්හි අනික් බුදුන්වහන්සේ වැඩැ හෝනා සේක් හෝ යැ. වැඩසිටිනා සේක් හෝ යැ. වැඩහිඳිනා සේක් හෝ යැ. ඔබ විචාළා වූ ප්‍රශ්න ඔබ කියනදැ යැ. ඔබ විචාළා වූ ප්‍රශ්න ඔබ කියනදැ යැ. මේ අද්භූත වූ බුද්ධානුභාව දුටුවා වූ සත්ත්වයන් කෙරෙන් විසිකෙළක් පමණ ප්‍රාණීහු අමාමහනිවන් දුටිහැ. මෙසේ ආශ්චර්‍ය්‍ය වූ යමාමහපෙළහර පානා වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 97.

මෙසේ යමකප්‍රාතිහාර්‍ය්‍ය කොට වැඩැ සිටි ස්වාමිදරුවෝ "පූර්වසර්වඥවරයෝ යමාමහපෙළහර කොට අන්තයෙහි කොයි ගියෝ ද්‍ෙ හො"යි බලනසේක් "තව්තිසාභවනයට ගොසින් මෑණියන් ප්‍රධාන වූ දෙවියන්ට අභිධර්මදෙශනා කළහ"යි දැන වදරා, "මම ද තව්තිසා-භවනයට යෙමි"යි එක් ශ්‍රීපාදයක් ඔසොවන්නා හා සුවාසූදහසක් යොදුන් පමණ යුගන්ධරපර්වතය හුයාපී වෙයගබඩක් සෙයින් නැමී ඒ ශ්‍රීපාදය පිළිගත. අනික් ශ්‍රීපාදය දික් කරන්නා හා මැ එක්ලක්‍ෂ-අටසැටදහසක් යොදුන් මහමෙර නැමී පිළිගත. මෙසේ සර්වඥයන්වහන්සේ දෙව්ලොවට වඩනා සඳ ශක්‍රදේවේන්ද්‍රයා "ස්වාමි දෙව්ලොවට වඩනාදැ වනැ. දෙවතාවන්ට වන්නේ මහාඉෂ්ටයෙකැ. බල එකෙක් මත්ත.[1] මාගේ මේ පාණ්ඩුකම්බලශෛලාසනය දිග සැටයොදුනැ. පළල පණස් යොදුනැ. බොලය පසළොස් යොදුනැ. මේ සා මහත් ආසනයෙහි අටළොස්රියන්

1. නම්-ඇතැම්

Non-Commercial Distribution

සර්‍වඥයෝ වැඩහුන් සේක් වී නම්, ඉතිරි තැන්මැ බොහෝ වන්නේ වේදැ''යි සිතී යැ. සර්‍වඥයෝ ඔහුගේ අභිප්‍රාය දනැ, තමන්වහන්සේගේ සඟළසිවුර සතරරියන් පුටුයෙකැ අතුරන්නා සේ අතුටැ ලා, ඒසා මහත් ආසනය අසරම්ණිය බැඳගත් දෙදණ ඉද්දෙන් ඉතිරි වැ නො තිබෙන පරිද්දෙන් වැඩැහුන්සේක. ආසනය පිණිස තමන්වහන්සේ මහත් වූ දැත් නැත. තමන් වහන්සේ පිණිස ආසනය තුඩා කළ දැත් නැත. මෙසේ මහත් සෘද්ධි ඇති බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 98.

ඉක්බිති එකවිට සර්‍වඥයන්වහන්සේ නුදුටුවා වූ සියලු මනුෂ්‍යයෝ "අපගේ ස්වාමි අප හැරපියා කොයි වැඩිදැ දැ''යි හඬමින්, ලොව මුළුල්ල ඒකාන්ධකාර වැ යන්නා හා, මුගලන් මහතෙරුන්වහන්සේ කරා ගොසින් "ස්වාමීනි, අපගේ සර්‍වඥයෝ කොයි දැ?''යි විචාළහැ. ඔබ තමන්වහන්සේ දනැදනැ ද, අනුරුද්ධ මහතෙරුන්වහන්සේගේ ගුණ ප්‍රකාශ කරණ පිණිස අනුරුද්ධ මහතෙරුන්වහන්සේ විචාරන්නට වදළ සේක. ඒ පිරිස් අනුරුද්ධ මහතෙරුන්වහන්සේ කරා ගොසින් විචාළකල්හි ඔබ වදරණ සේක් "උපාසකවරුනි, සම්‍යක්සම්බුද්ධයෝ තව්තිසාභවනයට විජම් දෙසන්නට වැඩිසේක්, තුන්මසක් මුළුල්ලෙහි විජම් දෙසා මහාපවාරණදවස් මනුෂ්‍යලොකයට වඩානාසේකැ''යි වදළසේකැ එබස් අසා මහපිරිස "බුදුන් දක මුත් නො යම්හ''යි එතැන්හි ම කඳවුරු බැඳ ගත්හැ. ඒ සා පිරිස හුන්තන්හි මලගන්ධයෙක් හෝ මූත්‍රගන්ධයෙක් හෝ නො වී යැ. සියලු මලමූත්‍ර මාහපෘථිවියෙහි මැ අන්තර්ධාන වෙයි. ඒ සා පිරිසට බත් පිළි සුවඳ ආභරණාදී වූ උපකරණ මුළුල්ල සුලුඅනේපිඬු-මහසිටාණෝ මැ සපයා දුන්හැ. බණ මුගලන්මහ-තෙරුන්වහන්සේ මැ වදළසේක.

ඉක්බිති පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩ හුන්නා වූ සම්‍යක්-සම්බුද්ධයන්වහන්සේ, මෑණියන්වහන්සේ ප්‍රධාන කොට ඇත්තා වූ සියලු දිව්‍යබ්‍රහ්මයෝ පිරිවරා ගත්හැ. බුදුහු කබල් මද්‍ධ්‍යයෙහි අවුළුවා ලූ පහන් මද්‍ධ්‍යයෙහි, එකපැහැර පහන් ඇවිලූ වූ සත්රුවන් මහඇගෑයක් සේ සියලු දිව්‍යබ්‍රහ්මයන්ගේ ශොභා මැඩැ, තමන්වහන්සේ මැ දිලියෙමින්[1] දසමසක් මුළුල්ලෙහි කුසින් ඉසිලූ මෑණියන්වහන්සේගේ ඇස නිවමින්, සිත නිවමින්, කන් නිවමින්, කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා'' යනාදීන් අභිධර්මපිටකය දෙසා වදරා, අසූකෙළ-

---

1. "මෙහි වැඩහුන් සේකැ, එයින් කීහැ'' යනු දක්වා "තාවතිංසෙ යද බුද්ධො'' යනාදී ගාථාතුනක් එක් පොතෙක්හි පමණක් පෙනේ. මුද්‍රිත පූජාවලියෙහි ද ඒ ශාඛා පැණේ.

Non-Commercial Distribution

දහසක් පමණ දෙවියන් අමාමහනිවන්හි ලා වදරා මැණියන්වහන්සේ සෝවාන් කොට වදළසේක.

ඉක්බිති මිනිස්ලොවැ හුන්නාවූ මහපිරිස "සත්වනදවස් මහාපවාරණ වෙ"යි කියා නිශ්චය කොට, මුගලන්මහතෙරුන් වහන්සේ කරා ගොසින් "ස්වාමීනි, සර්‍වඥයන්වහන්සේ වඩනා දවස්හිම් දත මනා වේ දැ"යි දැන්වූහැ. මුගලන්මහතෙරුන් වහන්සේ ද "යහපතැ"යි ගිවිසැ, එතැන්හි දී මැ පොළොව කිමිදැ, මහමෙරපත්ලට නැඟී ගොසින් "මා නැඟෙන්නා සියලු පිරිස දකිත්ව"යි අධිෂ්ඨාන කොට, මැණිකෙක්හි රත්පලස්හුයක් අවුණන්නා සේ, එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් මහමෙර පළා ගෙණැ නැඟෙන්නට වන්සෙයෙකැ. මිනිස්සු ද "යොදනක් නැඟිසෙයෙකැ. දෙයොදනක් නැඟිසෙයෙකැ"යි බලබලා සිටියහැ. එසේ බලබලා සිටියැ දී මැ, මහතෙරුන්වහන්සේ සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රීපාදය හිසින් ස්පර්‍ශ කෙරෙමින් මැ පැනැ නැඟි, සර්‍වඥයන්වහන්සේ වැඳ පැදකුණු කොට, මිනිසුන්ගේ පවත් දැන්වූසේක. ස්වාමිදරුවෝ "මුගලන, මම මෙයින් සත්වන දවස් සකස්පුර දෙරට බස්මි 'පිරිස ඔබ එන්නේ ය'යි කිය"යි වදළසෙයෙකැ. මුගලන්මහතෙරුන්වහන්සේ නැවත පෙරළා ගෙණැ[1] එසේ මැ අවුත් පොළොව කිමිදැ ගෙණැ පිරිස් මද්‍ධ්‍යයෙහි පහළ වැ එපවත් වදළසේක. එබස් ඇසූ පිරිස්, පෙහෙ වැ ලා බණ අසන්නට යන්නවුන් සේ, කෙළිමින් සෙමින්, කිසි මාර්‍ගෝපකරණයක් නැති වැ බුද්ධානුභාවයෙන් මැ සැවැත්නුවරැ සිටැ තිස්යොදුන් මහ ගෙවා සකස්පුරදෙරෙහි රැස් වූහැ.

ඉක්බිති සර්‍වඥයන්වහන්සේ වස් වසා පවරා, ශක්‍රදෙවෙන්‍ද්‍රයා කැඳවා "දෙවෙන්‍ද්‍රය, මනුෂ්‍යලොකයට අප ගිය මනා කල් වේදැ"යි වදළසෙයෙකැ. ඒ අසා ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම "යහපතැ, ස්වාමීනි"යි ගිවිසැ 'රුවන්හිණෙකැ, රිදීහිණෙකැ, රන්හිණෙකැ'යි තුන් හිණක් මැවී යැ. මේ හිණි තුණ මැ උසින් සුවාසූ දහසක් යොදුනැ හිණිහිස මෙර මුදුනෙහි යැ. හිණිපාමුල සකස්පුර දෙරැ යැ. එහි දකුණැළයෙහි රන්හිණැ දෙවතාවන්ට යැ. වාම පාර්‍ශ්වයෙහි රිදීහිණ මහාබ්‍රහ්මයන්ට යැ. මැද රුවන්හිණ ස්වාමි දරුවන්වඩනට යැ. එසමයෙහි ස්වාමිදරුවෝ පාණ්ඩුකම්බල ශෛලාසනයෙන් බැසැ පියා, ධර්‍මදෙශනාවසානයෙහි බද්ධාඤ්ජලී වැ සිටියාවූ සියලු දිව්‍යබ්‍රහ්මයන්ට පින් දී, අවුත් සත්රුවන් හිණිහිසැ සිටැගෙණ, වැටඅගෙක්හි අවුළුවා ලූ පහනක් සේ දිලියෙමින් එතැන්හි වැඩ සිටැ, යමකප්‍රාතිහාර්‍ය්‍ය කොට බලා වදළසේක.

---

2. මහමෙර පළා-ඇතැම්

Non-Commercial Distribution

උඩින් සියලු දිව්‍යලොක බ්‍රහ්මලොක තාක් එකාඞ්ගණ වැ ගියේ. යටට ඇස හෙළා ලන්නා හා, අවීචිය දක්වා සියලු පෘථිවි මණ්ඩලය එකාඞ්ගණ වැ ගියේ. සරස[1] බලා ලන්නා හා, එක් සක් වළෙක්හි අවීචියෙහි පටන් ගෙණ භවාග්‍රය දක්වා තල පුරාලා, එක් දිසායෙක්හි මැ එකිඑකී සක්වළැ එකිඑකී තල ඇටක් හෙළත් තල ගෙවෙල. සක්වළ නො ගෙවෙ"යි කියන පරිද්දෙන් සසර අනන්තාපරිමාණසක්වළ එකාඞ්ගණ වැ ගියේ. පහන් දහස් සුවහස් ඇවිළුවූ සතරරියන් ගබඩාවකට වන්නවුන් උඩිනුත් යටිනුත් හාත්පසිනුත් ඒ ගබඩාව සුව සේ මැ බලන්නා සේ, සියලු බුදුපිරිස අනන්තාපරිමාණසක්වළ කිහිඹිකුහුඹුවන් පටන් ගෙණැ මහාබ්‍රහ්මයන් දක්වා ඔවුනොවුන් සුවසේ දක්නට වන්හ. දෙවතාවෝ මිනිසුන් දක්ති. මිනිස්සු දෙවතාවන් දක්ති. දෙපක්‍ෂයෙහි ඇත්තෝ කැටි වැ බ්‍රහ්මයන් දක්ති. බ්‍රහ්මයෝ කැටිවැ දෙපක්‍ෂයෙහි ඇත්තවුන් දකිති.

එදවස් ඒ බුද්ධශ්‍රී දුටුවාවූ සත්ත්වයන් අතුරෙන්, ඒ මිහිරි දකැ අවස්ථා නො දනැ, පිරූ සමතිස් පැරුම් නැති වැ "මම බුදු වෙම්වයි, මම බුදු වෙම්ව"යි නො පැතූ කෙනෙක් නැත. දකුණු ශ්‍රීහස්තය දිශායෙහි රන්හිණින් බස්නා දෙවියන් හා, වම්ශ්‍රී හස්තය දිශායෙහි රිදීහිණින් බස්නා මහාබ්‍රහ්මයන් හා, මැද සත්රුවන්හිණින් බස්නා ස්වාමිදරුවානන් හා වඩනා ඒ ශ්‍රී නොබුදු වැ කවුරු සිතා නිමවා ගණිත් ද? බුදුවත් කවුරු කියා නිමවා ගණිත් ද? දෙවියන් ඇස් නිවී ගියේ. බඹුන් සිත් සැනහී ගියේ. මිනිස්සු බිමැ වැඳ පෙරළෙන්නට වන්හැ. ඒ බුද්ධශ්‍රී බලන සත්‍වයන් කෙරෙන් ඇසක් පියා ලූ එක ද සත්ත්වයෙක් නැත. හිණිපෙත්තෙන් හිණිපෙත්තට ඒ ශ්‍රීපාදය බුදධවිලාසයෙන් ඔබඔබා නහා ලූ ශ්‍රීපාදයෙහි අටතුරාසියක් මඟුල් ලක්‍ෂණ අනන්තාපරිමාණ-සක්වලැ සත්ත්වයන්ට පාමින් නික්මුනාහැ.

දකුණුදිශාවෙහි සිටැ ගත් පඤ්චසිඛතෙම තුන්ගව්වක් පමණ බෙලුවපන්ඩුවීණාව සත් තතක් නහා සරහාලා, බුදුගුණයෙන් යුක්ත වූ ගී කියකියා, මුළුලොවට කණ්ණාමෘත නමමින් බස්නට වන. දසදහසක් සෙනඩවයන් යෙදූ වෛජයන්තරථය නොයෙක් ධවජපතාකයෙන් ශ්වෙතච්ඡත්‍රයෙන් සරහාලා මාතලි දිව්‍යපුත්‍රතෙම වාමපාර්‍ශ්වයෙන් නික්මැ ගත. දෙතිස්දළෙහි පොකුණු හා, පොකුණෙහි පියුම් හා, පියුම්මත්තෙහි නටන දිව්‍යස්ත්‍රීන් විසින් යුක්ත වැ, සොඬින් සිගාව ඉද්දට ශ්වෙතච්ඡත්‍රයක් අල්වා ගෙණැ ඓරාවණයා නික්මැ ගත. මහාබ්‍රහ්මයා ශ්වෙතච්ඡත්‍රයක් අල්වා ගෙණැ වාමභාගයෙහි රිදීහිණින් බස්නට පටන් ගත. සෙසු

1. තරස-සමහර

Non-Commercial Distribution

සුයාම-සන්තුසිතාදි වූ දිව්‍යපුත්‍රයෝ තමන් තමන්ට සුදුසු සුදුසු වූ වල්විදුනා ආදි වූ නොයෙක් මඞ්ගලොප කරණු ගෙණැ නික්මුනාහැ. දසදහසක්සක්වළැ දසදහසක් ශක්‍රයෝ දසදහසක් විජයුත්තර පිඹිමින් නික්මුනාහැ. නටන්නාවූ දිව්‍යස්ත්‍රීන්ගේ ගණන් නැත. ගී කියන්නා වූ දිව්‍යස්ත්‍රීහු මෙතෙකැයි පමණ නැත. නොයෙක් පූජාවෙන් යුක්ත වැ ආකාශයෙහි වැනී ගියා වූ සත්රුවන්මඩු මෙතෙකැයි පමණ නැත. සමන්තභද්‍ර - ශාක්‍යසිංහ - පරදුඃඛදුඃඛිත - ධර්‍මගංගාප්‍රවාහ - කරුණාභිධාන - හෘදයානන්‍දකර - මාරහුඞ්කාරසංහාර - ශරණාගතවජ්‍රපඤ්ජර - ත්‍රිභුවනවන්‍ද්‍ය - අභිධර්‍මාමෘතප්‍රසව - දෙවාතිදෙව - ශක්‍රාතිශක්‍ර බ්‍රහ්මාතිබ්‍රහ්ම යනාදි වූ ජයකාහළ පිඹැ ගෙණැ බස්නා වූ දෙවතාවෝ කෙතෙක් ද? දහවල්හි දු ආකාශයෙහි තරු පිපී ගියේ. භූමියෙහි සත්රුවන් ඉපිලැ ගියේ. සාගරයෙහි මත්ස්‍යයෝ මුළුල්ල දියපිට ඉපිලැ ගොස් බුද්ධශ්‍රී බලන්නට වන්හැ. සියලු පර්‍වතයෙහි සියලු භූමියෙහි එක පැහැරැ මල් පිපී ගියේ. මෙසේ වූ ආශ්චර්‍ය්‍යයෙන් යුක්ත වැ ස්වාමිදරුවානෝ සකස්පුරදෙරට වැඩිසේක.

එසමයෙහි ඒ විස්මය දුටුවා වූ සැරියුත් මහතෙරුන්වහන්සේ ගොස්, සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳ ගෙණැ හෙවැ නැඟී සිටැ-

**"න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ - නස්සුතො උද කස්සචි,**
**වං වග්ගුවදෙ සත්‍ථා - තුසිතා ගණිමාගතො."**

යනාදීන් ස්තුති කොට "ස්වාමීනි, නුඹ සේ වූ මවුන් ලදිමි. නුඹ සේ වූ පියන් ලදිමි. නුඹ සේ වූ ගුරුන් ලදිමි. නුඹ සේ වූ කල්‍යාණමිත්‍රයන් ලදිමි. නුඹ සේ වූ ඇසක් ලදිමි. නුඹ සේ වූ ලයක් ලදිමි. නුඹ සේ වූ සරණක් ලදිමි. නුඹ සේ වූ චින්තාමාණික්‍යයක් ලදිමි. නුඹ සේ වූ භද්‍රඝටයක් ලදිමි. නුඹ සේ වූ කල්පවෘක්‍ෂයක් ලදිමි. නුඹ සේ වූ නෙත්‍රොත්සවයක් ලදිමි. නුඹ සේ වූ හෘදයානන්‍දයක් ලදිමි. එසේ හෙයින් මා සේ වූ භාග්‍ය ඇත්තෝ නැත. අද නුඹ වහන්සේගේ ශ්‍රී බලා බුදු වන්නට නො පැතූ එක ද දිව්‍ය මනුෂ්‍යයෙක් නැතැ"යි දන්වූ සෙයෙකැ.

ඉක්බිති සර්‍වඥයන්වහන්සේ, තමන්වහන්සේගේ පෙළහරෙහි කුළු ගන්වමින්, තමන්වහන්සේගේ මහුලෙහි අස් තබමින්, සම්ප්‍රාප්ත වූ පර්‍ෂදට ධර්‍මදෙශනා කොට වදරණසේක්:-

**"යෙ ඣානපසුතා ධීරා-නෙක්ඛම්මූපසමෙ රතා,**
**දෙවාපි තෙසං පිහයන්ති-සම්බුද්ධානං සතීමතං"**

යන ගාථාව වදළසේක. ඒ ගථාකෙළවරැ තිස්කෙළක් ප්‍රාණීහු අමාමහනිවන් දුටහ.

Non-Commercial Distribution

මෙසේ විස්මය වූ ගුණ ඇති, මෙසේ විස්මය වූ බස් ඇති, මෙසේ විස්මය වූ රූ ඇති, සිතුසිතුවන් වැදි වැදියන් පිදුපිදූවන් අමාමහනිවන්හි ලන සේ දන්නා වූ මාගේ අමාමෑණියන්වහන්සේගේ සරණ යෙමියි බුත්සරණ යා යුතු.

## 99.

තව ද, වජ්‍රාසනයෙහි වැඩැ හිඳ සවාසනසර්වක්ලෙශයන් නසා බුදු වැ, ක්‍රමයෙන් සත්සති යවා, අටවැනි සතියෙහි අජපාල නිග්‍රොධමූලයෙහි වැඩැ හිඳ, තමන්වහන්සේ විසින් දත්තා වූ ධර්මය සූක්‍ෂමබව හා ලෝවැස්සන්ගේ ක්ලෙශබහුලබව හා ප්‍රත්‍යවෙක්‍ෂා කොට වදරා "මෙසේ වූ ස්ථූලබුද්ධි ඇති මොවුන්ට සූක්‍ෂම ධර්මදෙශනා කෙළෙම් නම්, ඒ ධර්මය ඔවුන් සිතට නො නැගේ නම්, ඒ මට මැ ආයාසමාත්‍රයෙකැ"යි සිතා වදරා, ධර්මදෙශනායෙහි මන්‍දෝත්සාහ වැ වැඩැ හුන්කල්හි ඒ බව දැනැ සහම්පති මහාබ්‍රහ්මයා දසදහසක් සක්වළැ දිව්‍යබ්‍රහ්මයන් හා එක් වැ අවුත්, ශ්‍රීපාදය වැඳ ධර්මදෙශනාවට ආරාධනා කළ කල්හි, ඔවුන්ගේ ආරාධනාව ගිවිසැ වදරා, ධර්මය අසන්නට සුදුසු කුලපුත්‍රයන් පරීක්‍ෂා කොට වදරා, බරණැස ඉසිපතන විහාරයෙහි වැඩ හුන් පස්වගමහණුන් වහන්සේ දකැ, දෙළොස් යොදුන්මඟ ගෙවා ඔවුන්වහන්සේ කරා වැඩැ ඇසළ මසැ මැදි පොහෝදවස් උතුරුසළනැකැතින් ධර්මාසනාරූඪ වැ, දසදහසක් සක්වළැ දිව්‍යබ්‍රහ්මයන් මධ්‍යයෙහි වැඩැහිඳ, අඤ්ඤකොණ්ඩඤ්ඤ වහන්සේ ප්‍රධාන කොට ඇති ඒ පස්වගමහණුන් වහන්සේට ධම්සක්පවතුන්සූත්‍රය දෙසා වදරා, ඒ පළමු වන ධර්මදෙශනා මඞ්ගලයෙහි අඤ්ඤකොණ්ඩඤ්ඤ වහන්සේ හා අටළොස්කෙළක් බ්‍රහ්මයන් හා සෝවාන්පෙලෙහි පිහිටුවා, ඔවුන්ට අමාමහනිවන් දී, එතැනට වර්‍ෂාකාලය සම්ප්‍රාප්ත හෙයින් එහි මැ වස් වැසැ වදරා, දෙවනදවස් අඤ්ඤකොණ්ඩඤ්ඤ මහතෙරුන්වහන්සේ යැ, මහානාමමහතෙරුන්වහන්සේ යැ, භද්දිය මහතෙරුන්වහන්සේ යැ අස්සජි මහතෙරුන්වහන්සේ යැ යන සතරදෙනාවහන්සේ සිඟා යවා, තමන්වහන්සේ විහාරයෙහි වැඩැ හිඳ, වප්පමහතෙරුන් වහන්සේට ධර්මදෙශනා කොට වදරා, ඔබට ද අමාමහනිවන් දී, තුන්වනදවස් ඉතිරි සතරදෙනාවහන්සේ මැ සිඟා යවා, තමන් වහන්සේ විහාරයෙහි වැඩැ හිඳ, භද්දියමහතෙරුන්වහන්සේට ධර්මදෙශනා කොට, ඔවුන්වහන්සේට ද අමාමහනිවන් දී වදරා, සතරවන දවස් ඉතිරි සතරදෙනාවහන්සේ සිඟා යවා, තමන් වහන්සේ විහාරයෙහි වැඩැ හිඳ මහානාමමහතෙරුන්වහන්සේට ධර්මදෙශනා කොට වදරා ඔබටද, අමාමහනිවන් දී, පස්වනදවස් ඉතිරි සතරදෙනාවහන්සේ සිඟා

Non-Commercial Distribution

යවා, තමන්වහන්සේ විහාරයෙහි වැඩැ හිඳ, අස්සජි මහතෙරුන්වහන්සේට ධර්‍මදෙශනා කොට, ඔවුන්වහන්සේට ද අමාමහනිවන් දී වදරා; මෙසේ ධර්‍මසක් පැවැත්වූ පසළොස්වැනි වක යැ, එයට දෙවෙනි වූ අවපළමුවන වක යැ, එයට තුන්වැනි වූ අවදෙවැනි වක යැ, එයට සතරවනු වූ අවතුන්වැනි වක යැ, එයට පස්වනු වූ අවසතරවැනි වකයැ යන පස්දවසින් පස්වගමහණුන්වහන්සේ පස්දෙනා හට අමාමහ නිවන් දී වදරා; නැවැත අවපස්වැනිවක ඒ පස්දෙනා වහන්සේගේ සියලු ශාසනකෘත්‍ය මස්තකප්‍රාප්ත කොට, රහත් ඵලයෙන් ඔවුන්වහන්සේගේ ප්‍රව්‍රජ්‍යායෙහි කුළු ගන්නාකැමැති වැ, ඒ පස්දෙනාවහන්සේ එක්තැන් කොට, පස්තරුයෙකින් යුක්ත වූ හතනකත හා එක් වූ පූර්‍ණචන්ද්‍රයා මෙන් දිලිහිදිලිහී වැඩැ හිඳ, අනාත්මලක්‍ෂණසූත්‍රාන්තය දෙසා වදරා, එක පැහැර පස්දෙනාවහන්සේ මැ රහත් කොට, ඉක්බිති යසකුලපුත්‍රයන් ප්‍රධාන කොට ඇති පස්පණස්දෙනකුට අමාමහනිවන් දී වදරා; මෙසේ තමන්වහන්සේ ඇතුළු වැ එක්සැටක් රහතුන්වහන්සේ ලොකයෙහි පහළ වූ කල්හි; ක්‍රමයෙන් සර්‍වඥමහාමෙඝය ධර්‍මවර්‍ෂා වස්වන කල්හි, එහි කළ ඊර්‍ෂ්‍යායෙන් මෙන් මෙඝකාලය ඉක්මැ ගිය කල්හි; තදනන්තර වැ ශරත්කාලය අවුත් සම්ප්‍රාප්ත වූ කල්හි; දෙම්හයි කී වස්තුව නො දී බොරු කියන්නාවූ ස්වාමිහුගේ බස් ඇසූ ගැත්තවුන් සේ, වැසි නො වස්නා වූ මෙඝයාගේ ශුෂ්කගර්ජිතය ඇසූ වැසිලිහිණියන් නො සතුටු වැ හුන්කල්හි; වයස් මුහුකළවුන් යෞවනමදය හැර තමන් මැ අවනත වන්නා සේ, සියලු ශාලිවර්‍ගයන් පැසී කරල් ඇගින් නැමී සිටි කල්හි; ජඩයන්ගේ පැලඹීම නැති වීමෙන් පැලැඹෙන සජ්ජනයන් සේ, මෙඝකාලයාගේ ඉක්මීමෙන් ආකාශයෙහි තාරකාවන්ගේ පැලැඹීම බොහෝ වූ කල්හි; අය නැති වැ බොහෝ වියදම් කරන්නවුන්ගේ ධනය ක්‍රමයෙන් ක්‍ෂය වන්නා සේ, ආසින් වැසිඅයක් නැති වීමෙන් හා, පළමු ආවා වූ වතුරු මුහුදට වන් හෙයින් හා, ගංහෝ ආදියෙහි ජලය ක්‍රමයෙන් මඳ වන්නට වන් කල්හි; අබුද්ධොත්පාදයෙහි දුරු වැ ගිය කුශලධර්‍මයන්, නැවැත බුද්ධොත්පාදයෙහි අවුත් සජ්ජනයන්ගේ සිතට වදනා සේ, මෙඝකාලයෙහි මානසවිලට ගියා වූ හංසයන් ශරත්කාලයෙහි ඒ ඒ පියුම්විලැ පිරෙන්නට වන්කල්හි; මයූරයා විසින් තමා හිසැ වස්නා වැසි වළකන පිණිස විදහා ගත්තාක් බඳු වූ පිල්සක, නැවැත වැසි නැති වත් හකුලුවන්නට වන් කල්හි; ආත්ම ශත්‍රීන් මෙඝකාලයා ලුහුබැඳවූ ශරත්කාලයා විසින් ජයමදයෙන් වැලුක්මල් නැමැති ශ්වෙතචාමර එක පැහැර සල්වන්නට වන් කල්හි; "මෙ තෙක් කල් නවවතුරේ තඹදියෙහි ගැලී ද, මාගේ බඩ සුදුපැහැ නො නටුයේ යැ"යි දක්වන්නාක් මෙන් දියෙහි තමන්ගේ බඩ සුදුපැහැය දක්වා පෙටියන් පෙරළෙන්නට වන්

Non-Commercial Distribution

කල්හි; "තමන් කණෑ තුබූ නිලුපුල්මල් වැටි යේ ද්‍යේ හො?"යි යන හයින් අත් නො සොල්වා හඬ ගසන්නා වූ හැල්ගෙවියන්ගේ මධුරනාද අසඅසා, නො ඉගිලී බැසැ මයූරයන් අළුතැ පැසුනු හැල් කන්නට වන්කල්හි; අළුත වැදූ වස්සන් වල්පත් නහා ගෙණැ මවුන් සිසාරා හලු ගසා දිවන්නට වන්කල්හි; 'එක මෙඝකාල නැමැති සතුරා නැතිවීමෙන් තොපටත් අපටත් මෙතෙක් සුව වූයේ යැ'යි ඔවුනොවුන් බලා සතුටු වැ සෙන්නා සේ, ආකාශයෙහි තාරකාවන් හා විල්හි විල්හි ඇඹුලමල් හා එක පැහැර පිපෙන්නට වන්කල්හි; සාරමසක් මුළුල්ලෙහි මෙඝජලයෙහි ගැලීමෙන් හිඳීගිය සෙවලක් බඳු වූ නිල් වූ සසලප චන්ද්‍රමණ්ඩලය උසුලන්නට වන්කල්හි; තමා ශ්‍රී දුන්නා වූ මෙඝකාලය නැති වැ ගිය කල්හි, කෙළෙහි ගුණ දන්නා වූ ගැත්තක්හු මෙන්, මයූරයා ශොකයෙන් හැකිලැ ගත් කල්හි; ආකාශය මෙඝකාලයට සුදුසු කොට තමා ඉසිලූ විදුලි යැ, ඉන්‍ද්‍රචාප යැ යනාදි වූ ආභරණයන් හැර ශරත්කාලයට සුදුසු වූ චන්‍ද්‍ර යැ, තාරකාවෝ යැ යනාදිවූ උජ්ජ්වල වූ ආභරණයන් උසුලන්නට වන්කල්හි; හැල් පිණිස ඉදි කළාවූ ලියද්දෙහි පිපි මහනෙල්මල් හැල්ගෙවිලියන් සිත් සේ කඩා පලඳින කල්හි; ස්වාමිදරුවානෝ වස් වසා, වස් අන්තයෙහි පවරා, තුණුරුවන් ලොවැ පහළවූ බව හඟවන පිණිස අතික් සැටදෙනාවහන්සේ කැඳවා.

"ලොව දහම් නැමැති ඇස් ලදබව කියව. ලොව මිත්‍ථ්‍යාදෘෂ්ටි නැමැති විෂයට ප්‍රතිපක්‍ෂ වූ සදධර්‍ම නැමැති ඖෂධය පහළ වූ බව කියව. බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අප්‍රකාශ වැ සැඟවී තුබූ සද්ධර්‍මමහානිධානය ධර්‍මචක්‍රවර්‍ත්ති වූ මාගේ බුද්ධි බලයෙන් උදුරා නහා ගෙණැ ලොවැ ඉස්මින් සිටිබව කියව. තොප සැටදෙනා මා හා කැටි වැ නිවන්පුරයට මකුළුහු කපා වන් බව කියව. සසර බොහෝකලක් ඇවිද විඩා වූවත් නිවන්පුරයට වැද සැතැපෙනු කැමත හොත්, මේ තුණුරුවන් හට ගැති වන්නට මැ කියව."

යනාදි හසුන් දී ඒ සැටදෙනාවහන්සේ ඒ ඒ දිගට යවා වදරා, තමන්වහන්සේ උරුවෙලාවට වඩනාසෙයෙක්, අතර මගැ භද්‍රවර්‍ගීයෙහි රාජකුමාරයන් තිස්දෙනකුට බණ වදරා, ඔවුන් අමාමහ නිවන් දක්වා වදරා, ඔවුන් ද එහි භික්‍ෂු භාවයෙන් මහණ කොට,

"මහණෙනි! තෙපි ද ඒ ඒ දිගන්තරයෙහි අවිද, ලොව මවුන් ලද්බව කියව. පියන් ලද්බව කියව. ලොව කල්‍යාණ මිත්‍රයන් ලද්බව කියව. බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අගුළු ගෙණැ තිබූ නිවන් පුරයෙහි දෙර මා විසින් හරණලදබව කියව. අධර්‍ම පරදවා සද්ධර්‍මධ්වජය නැඟුබව

Non-Commercial Distribution

කියව. බොහෝ කලක් ලොව පෙළා සිටි පඤ්චමාරයන් මුහුණු දලි ගෑවුනුබව කියව. බුද්ධොත්පාදයෙක්හි මුත් පහළ නොවන්නා වූ ප්‍රතීත්‍යසමුත්පාද යුක්තිය සත්ත්වයා තුඩැ තුඩැ නටන්නට වන්බව කියව, නිවන්මහ රාජවීථි වැ ගියබව කියව. අපායමාර්ගයෙහි හසර නැති වැ තණ නැඟෙන්නට වන්බව කියව."

යනාදි හසුන් දී ඒ වහන්සේවරුන්ද ඒ ඒ දිගට යවා වදරා, තමන්වහන්සේ බිම්බිසාර රජ්ජුරුවන්ට දුන් ප්‍රතිඥවෙන් මිදෙනු පිණිස රජගහනුවරට වඩනාසේක් ක්‍රමයෙන් උරුවෙලාවට වැඩිසේකි.

එසමයෙහි උරුවෙලාවෙහි උරුවෙලකාශ්‍යප යැ, නදීකාශ්‍යප යැ, ගයාකාශ්‍යප යැ යන ජටිලයෝ තුන්බෑ කෙනෙක් වසනනාහු යැ. එහි උරුවෙලකාශ්‍යපයෝ පන්සියයක් ජටිලයන්ට ප්‍රධානයහැ. නදීකාශ්‍යපයෝ තුන්සියයක් ජටිලයන්ට ප්‍රධානයහැ. ගයාකාශ්‍යපෝ දෙසියයක් ජටිලයන්ට ප්‍රධානයහැ.

ඉක්බිති සර්වඥයන්වහන්සේ උරුවෙලකාශ්‍යපයන් සමීපයට වැඩැ "කාශ්‍යපය, තට ඉදින් බැරි නො වේ නම්, මේ තාගේ ගිනිහල්ගෙයි අද එක රැය වසමෝ දැ"යි වදළසේක. ඒ අසා උරුවෙලකාශ්‍යපතෙම "ශ්‍රමණයෙනි, මේ මට බැරියෙක් නො වෙයි. තොප සේ වූ ශ්‍රමණකෙනෙකුන්ට ආගන්තුකසත්කාර කරණබව තපස්වීන්ට සුදුසු මැ යැ. එතෙකුදු වුවත්, මේ ගිනි හල්ගෙයි ඝොරවිෂ වූ මහානාගරාජයෙක් වෙසෙයි. ඔහුගේ විෂශ්වාසයට මහමෙර මකුළුහු යැ. මහාසාගරය පිනිබිඳු යැ. මහපොළොව පරඬලා යැ. මොහු විසින් තොප වැනි යෞවනස්ථ ස්වස්ථ වූ රන්වන් මහණකෙනකුන්ට කිසි උපද්‍රවයෙක් වී නම්, නපුරැ"යි දන්වී යැ. ඒ අසා ස්වාමිදරුවෝ නයින්ගේ බලත් තමන් වහන්සේගේ බලත් තමන්වහන්සේට මැ හැඟෙන හෙයින් ඒ නයින්ගේ පවත් පිටිකණු එවැ දෙවනවටත් "කාශ්‍යපය, තට ඉදින් බැරි නො වේ නම්, අද මේ එකරැ මේ ගිනිහල්ගෙයි වසන්නා කැමැත්තම්හ"යි වදළසේකැ.

නැවැත උරුවෙලකාශ්‍යපතෙම "මහාශ්‍රමණයෙනි, නිකම් තිබෙන ගිනිහල්ගෙයි තොප වසන බව මට කවර බැරියෙක් ද? මෙහි විෂඝොර වූ එක් නාගරාජයෙක් ඇත. ඔහුගේ විෂවහ්නියට යුගාන්තවහ්නිය හෙල්මැලි යැ. ඔහුගේ නාසාවාතයට යුගාන්තවාතය මලයමාරුත යැ. ඔහුගේ විෂයට කාලකූට විෂය අමා යැ. එහෙයින් ඒ තොපට කිසි උපද්‍රවයක් කෙළේ නම්, නපුරැ"යි දන්වී ය. ඒ අසා ස්වාමිදරුවානෝ ඒ නාගරාජයාට වඩා ශතගුණයෙන් සහස්‍රගුණයෙන් අධික වූ

Non-Commercial Distribution

මහානුභාව ඇති මුචලින්ද නම් නාගරාජයාගේ දරණගබ සත්දවසක් මුළුල්ලෙහි තමන්වහන්සේට ගඳකිළි වූ බව තමන්වහන්සේගේ ශ්‍රීබුද්ධියෙහි ඇති බැවින් ද, තව ද, මුචලින්ද නම් නාගරාජයාටද වඩා ශතසහස්‍රගුණයෙන් අධික වූ මහිම ඇති මහාකාල නම් නාගරාජයා තමන් බුදු වූ මහුලෙහි ස්තුතිඝොෂා කරණ වන්දිභට්ට වූ බව තමන් වහන්සේගේ මැ ශ්‍රීබුද්ධියෙහි ඇති බැවින් ද, ඒ නයින්ගේ පවත් නො ඇසූකන් වැ, තුන්වනවිටත් "කාශ්‍යපය, තට නො බැරි වී නම්, අද එකරැය මේ ගිනිහල්ගෙයි වසන්නා කැමැත්තම්හ"යි වදළසේක. ඉක්බිති උරුවෙලකාශ්‍යප තෙම තුන්වන වාරයෙහි වදළ බසට අනිකක් නො කියැ හී, නයිගේ මැ දඩිකම් දැන්වී යැ.

ඉක්බිති සර්වඥයන්වහන්සේ "ඒ නාගරාජයා අපට කරණ උපද්‍රව තෝ නො විචාරා, මේ ගිනිහල්ගෙයි අප වසන්නට තෝ අනුදනැ"යි වදරා, ඔහු විසින් අනුදත් කල්හි නාවිමනට වදනා ගරුඩරාජයක්හු සේ, ඒ අග්නිශාලාව ඇතුළට සැක නැති වැ වැඩැ, බුද්ධාසන පණවා පලඟ බැඳ වැඩැහුන්සේක. ඉක්බිති නාගරාජ තෙම තමාගේ ගිනිහල්ගෙයි වැඩැහුන්නාවූ සර්වඥයන් වහන්සේ දැකැ මතැතක්හු දළ ගන්නා වූ උන්මත්තයකු සේ, මා වසන්නා වූ මෙතනට නො විචාරා වන්නේ කවරෙක් දැ"යි කිපී "තමාගේ විෂධූමයෙන් සර්වඥයන්වහන්සේ දවා පියම්"යි සිතා විෂධූම හරණට වන.

ඉක්බිති සර්වඥයන්වහන්සේ "ඇපි දු ඉදින් ධූමයක් හළමෝ නම්, මේ නාගරාජයා තබා, මුළුලොව මැ ඉවසා ගත නො හෙන්නේ යැ. බල එකෙක් මත්න: මෙ නයි 'දුමන්නට මම් මැ සුරුම්'යි සිතුකල්හි, තමාගේ ශක්ති පැව මනා වේ ද? එහෙයින් මාගේ ශරීරයෙන් නැංගා වූ මේ ධූමය මේ නාගරාජයාගේ ශරීරයෙහි ඡවිමාංසාදි වූ කිසි අවයවයකට උපද්‍රව නො කෙරේව"යි සිතා වදරා, ශ්‍රීශරීරයෙන් දුම් හරණට පටන් ගත් සේකැ. ඒ සර්වඥයන්වහන්සේගේ ශ්‍රීශරීරයෙන් නැංගා වූ ධූමය, නාගරාජයාගේ විෂධූමය ඔබා ගෙණැ, ඔහුගේ ශරීරයෙහි ඡවිමාංසාදි වූ කිසි අවයවයකට උපද්‍රව නො කොට, ඔහු පෙළන්නට වනැ. ඉක්බිති නාගරාජතෙම සර්වඥයන්වහන්සේගේ ප්‍රභාව දැකැ, ක්‍ෂමා කොට ගත නො හී, කෝපයෙන් එක පැහැරැ විෂාග්නි හරණට පටන් ගත. සර්වඥයන්වහන්සේ ද "ශරීරයෙන් ගිනි හරණා උපාය, තොපට මුත් අපට නැත්තේ නො වේ"යි සිතා වදරා, තමන්වහන්සේ ද තෙජොධාතුවට සමවැදැ, නැවැත තමන්වහන්සේගේ ශරීරයෙන් ගිනිකඳ හරණට පටන් ගත්සේක.

Non-Commercial Distribution

එවේලෙහි සියලු අග්නිශාලාව ගිනි ගෙණැ දිලිහී ගියාක් සේ වි යැ. ඒ දුටුවාවූ උරුවෙලකාශ්‍යපයන් ප්‍රධාන කොට ඇත්තාවූ ජටිලයෝ "මේ දිලිහී ගියේ නාගරාජයාගේ විෂාග්නි යැ"යි සිතා, "මෙසේ ඇසට රසායනයක් බඳු වූ රූපකාය ඇති ශ්‍රමණයෝ අනාථයෙහි නාගරාජයා අතැ නටහ"යි සිතුහැ. ඉක්බිති සර්‍වඥයන්වහන්සේ තමන්වහන්සේගේ තෙජසින් ඒ නාගරාජයාට කිසි උපද්‍රවයක් වියැ නො දී ඔහු හික්මවා, උදසනැ ඒ නයි ශ්‍රීහස්තයෙන් ගෙණැ, සිහිල් වූ දළමුත්හරක් සැක නැති වැ ගෙණැ ඉඳුනිල්මිණිකරඬුවෙක්හි බහාලන්නා සේ, ඒ නාගරාජයා පාත්‍රධාතුන්වහන්සේගේ ඇතුළත්හි බහාලා, තමන්වහන්සේගේ ශ්‍රී හස්තයෙන් ඒ පාත්‍රධාතුන්වහන්සේගේ ඇතුළත සෝධනකල්හි කෙළවාලු ශ්‍රීහස්තය හොස්සෙහි වළලු හී ගිය ජලධාරාවක් සේ, ඒ නාගරාජයා එහි දරණ ලා විෂ නැති කොට හොවාලා, උදසනැ මැ උරුවෙල-කාශ්‍යපයාට "කාශ්‍යපය, තා ඊයේ තාගේ නයිගේ ආනුභාව කී නියා කෙසේ ද? දන් මූ හොත් නියා කෙසේ ද? තෝ මැ බල"යි වදරා පාත්‍රයේ හොත්තා වූ නයි ඔහට දක්වා වදළසේකැ.

ඉක්බිති ඒ නාගරාජතෙම බුදුන්වහන්සේගේ ශ්‍රීමුඛය බලබලා, භක්තීන් හිස හකුලුවහකුලුවා, පාත්‍රධාතුන්වහන්සේ ඇතුළත්හි හොත්තේ යැ. ඒ ආශ්චර්‍ය්‍යය දුටුවාවූ උරුවෙලකාශ්‍යප තෙම "මේ මහාශ්‍රමණයෝ ඉතා ඍද්ධි ඇති කෙනෙක. මුන්ට අඩු නම් අප සේ රහත්නුවූබව මැ යැ"යි සර්‍වඥයන් වහන්සේ ඍද්ධි ඇති බව මුත්, රහත්කම් තමා කෙරෙහි තබා දිට.

එතැන්හි ද සර්‍වඥයන්වහන්සේ ඔහුගේ බුද්ධිය නුමුහුකළබව දැනැ වදරා, නැවැත ඔහුගේ ලය මොළොක් කරණ පිණිස ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය දක්වනු කැමැති සේක් ඔහුගේ ආශ්‍රමයෙහි අනික් නයකුදු එසේ මැ දමා වදරා, ඔවුනුදු පාත්‍රධාතුන්වහන්සේ ඇතුළෙහි බහාලා, උරුවෙල-කාශ්‍යපයාට පැලා "බල කාශ්‍යපය, තාගේ මහානුභාව ඇති මේ නාගරාජයා දමන්නෙමු, කිසි මන්ත්‍රයකුත් නො පිරිවූම්හ. කිසි ඖෂධයකුත් අප ගත් ද නැත. අප නයින්ට භය එළවන්නා වූ ගරුඩවෙශාදි වූ වෙශාන්තරයකුත් ගත් දැ නැත. එතෙකුදු වුවත් අපගේ එකී බුද්ධානුභාවබලයෙන් තාගේ නයි නිර්විෂ වැ හොත් පරිදි බලව"යි දක්වා වදළසේක. ඒ ආශ්චර්‍ය්‍ය දුටුවාවූ උරුවෙලකාශ්‍යපතෙම "අපසේ නොරහත් බව මුත්, ඍද්ධියට මොවුන්ට කිය හැකි දෙයෙක් නැතැ"යි කී යැ.

ඉක්බිති සර්‍වඥයන්වහන්සේ එ මැ උරුවෙලකාශ්‍යපයන්ගේ ආශ්‍රමයට නුදුරු එක් වනලැහැබෙක්හි රාත්‍රිභාගයෙහි වැඩැහුන් සෙයෙකැ. එසමයෙහි

Non-Commercial Distribution

මධ්‍යමරාත්‍රියෙහි වරම්රජදරුවෝ සතරදෙන වැඩැ හුන් තැනට අවුත්, පූර්වදික්හි ධෘතරාෂ්ට්‍ර නම් මහරජ සිටැ ගත. දකුණුදිගැ විරූළ්හක නම් මහරජ සිටැ ගත. පශ්චිමදිගැ විරූපාක්‍ෂ නම් මහරජ සිටැ ගත. උතුරුදිගැ වෛශ්‍රවණ නම් මහරජ සිටැ ගත. ඉක්බිති සර්ව්‍ඥයන් වහන්සේ පහන් ඇවිළ වූ ඇගෑ සතරක් මැද දිලියෙන සත්රුවන්දහගබක් සේ දිලියෙමින් වැඩැ හිඳ, ඔවුන් සතර දෙනා ආ ගමන් සඵල කොට, ඔවුන් කන්හි මිහි නමා, සිත්හි අමා නමා බණ වදළසේක. ඉක්බිති පහන් වූ කල්හි උරුවෙල කාශ්‍යපතෙම සර්ව්‍ඥයන්වහන්සේ කරා ගොස් "මහාශ්‍රමණයෙනි, වළඳන්නට අව මැනව. ඊයේ රෑ තමන්ගේ ශරීරප්‍රභායෙන් සියලු සක්වළගබ රන්රස පිරූ තුත්තක් සේ එක පැහැරෑ රන්වන් පැහැයෙන් පුරමින්, සතරදිග්භාගයෙන් අවුත් තොපගේ ශ්‍රීපාදයන් වැඳ නැඟී සිටැ සතරදිග්භාගයේ සිටියෝ කවුරු ද"යි විචාළේ යැ. ඒ අසා සර්ව්‍ඥයන්වහන්සේ "කාශ්‍යපය, වරම්රජ දරුවෝ බණ අසන්ට ආහ"යි වදළසෙයෙකැ. ඒ ආශ්චර්‍ය්‍ය දුටුවාවූ උරුවෙලකාශ්‍යපයෝ තොපගේ සතරවරම්රජදරුවෝ අප කරා නො එති. අපගේ රහත්බව තොප කරා නො ඒ"යි කීහැ.

තව ද, ශක්‍රයා හා මහාබ්‍රහ්මයා හා ආවා වූ දෙරාත්‍රියෙහි ද ඔවුන් දෙදෙනා ආපවත් ඇසුවා වූ උරුවෙලකාශ්‍යපතෙම "ශක්‍රබ්‍රහ්ම දෙදෙනා අතින් පොවා උපස්ථාන ලබන්නට සුදුසු[1] වූ මේ ශ්‍රමණයන්, අප සේ රහත් නො වනබව අලාහ යැ"යි සිතී යැ.

ඉක්බිති එක්දවසක් උරුවෙලකාශ්‍යපයන්ට මහාපූජාවෙක් එළැඹැ සිටියේ යැ. අඟුමගධවාසීහු බොහෝ පූජාසත්කාර ගෙණැ උරුවෙල-කාශ්‍යපයන්ගේ ආශ්‍රමයට යනු කැමැති වැ සිටියාහැ. ඉක්බිති උරුවෙලකාශ්‍යප නම් ජටිලතෙම "මෙතැනැ අපට මහපූජාවෙක් එළඹැ සිටියේ යැ. මහාශ්‍රමණයෝත් මෙතන්හි මැ යැ. ඉදින් මේ රැස් වූ මහජනයාගේ මද්ධ්‍යයෙහි ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වූ නම්, මේ කැටි වූ මහපිරිස අප තපස්විවෙශ ගත්තාවූ වඳුරන් කොටත් නො සිතා[2] මහශ්‍රමණයන් කෙරෙහි මැ ප්‍රසන්න වන්නාහැ. එහෙයින් මහාශ්‍රමණයන් මෙයට නාව හොත් යෙහෙකැ"යි සිතී යැ. ඉක්බිති සර්ව්‍ඥයන්වහන්සේ නිර්මල වූ ආකාශයෙහි පූර්ණචන්ද්‍රමණ්ඩලය දක්නා සේ, ඔහුගේ සිතැ ඇත්තා වූ අදහස් තමන්වහන්සේගේ සිතින් දැනැ "මොහුගේ මනොරථය පූරණබව මැ වේ ද යහපතැ"යි සිතා වදරා, දෙවන දවස් උරුවෙලකාශ්‍යපයන්ගේ ආශ්‍රමයට නො වැඩැ, උතුරුකුරුදිවට වැඩැ, පිඬු සිඟා ලද ආහාරය අනවතප්තවිලැ දී වළඳ, එහි ම දිවාවිහාර

1. තුදුසු - ඇතැම් 2 වඳුරන් කොටත් නො සිතතියි සිතා - සමහර.

Non-Commercial Distribution

කොට, උරුවෙලකාශ්‍යපයන්ගේ පූජාව නිමිකල්හි, නැවත උරුවෙල කාශ්‍යපයන්ගේ ආශ්‍රමයට වැඩැ වදළසේක. ඉක්බිති උරුවෙලකාශ්‍යපයෝ උදසනැ සර්‍වඥයන්වහන්සේ කරා එළඹැ "මහාශ්‍රමණයෙනි, වළඳන්නට අව මැනැව. ඊයේ දවස් අඟුමගධ වාසීහු අපට මහාපූජාවක් කළහ. ඒ පූජාවෙහි වළඳන්නට යැ යි සිහි කොට නො දුටුම්හ. එහෙයින් ඊයේ දවස් එළඹියේ කොයට ද"යි විචාළේ යැ. ඉක්බිති සර්‍වඥයන්වහන්සේ "කාශ්‍යපය, ඉතිරි තපස්වීන් හා බණන පරිද්දෙන් අප හා නො බණ. තා එක තැනැත්තවූ සිතුවා තබා, අනන්තාපරිමාණ සක්වළෙහි කිහිඹියන් කෙරෙහි පටන් මහාබ්‍රහ්මයන් දක්වා හැම සත්ත්වයන් සිතුසිතු සිත් වෙනවෙන මැ දනුම්හ. අප මෙයට නො ආයේ ශ්‍රමණගෞතමයෝ පූජාවට රැස් වූ මහාජනයා මද්‍ධ්‍යයෙහි සෘද්ධිප්‍රාතිහාය්‍ය්‍ය කොළෝ නම්, ඒ මහාජනයා අප කෙරේ සරු නැති වැ යන්නාහ'යි සිතූ සිත දනැ මැ වේ ද"යි වදළසේකැ. උරුවෙලකාශ්‍යපතෙමේ "මහාශ්‍රමණයෝ පරසිත් දත්නාබව මුත්, අප සේ රහත්බවට මහ නො දනිති"යි සිතී යැ.

එසමයෙහි සර්‍වඥයන්වහන්සේට පංසුකූලචීවරයෙක් උපන. සර්‍වඥයන්වහන්සේ "මේ සිවුර කොයි දී සෝධම් දෝ හො?"යි සිතා වදළසේකැ. එකෙණෙහි ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම සර්‍වඥයන් වහන්සේ සිතූ අදහස් දනැඅවුත්, එතැන්හි පොකුණක් මවා තමන්ගේ නන්‍දාපුෂ්කරණීය සේ මනොහර කොට සර්‍වඥයන් වහන්සේගේ අභිප්‍රාය වූ පරිද්දෙන්, ඒ සිවුර ගසා ගන්නා ගලකුත්, සිවුර අතුරන්නට අතළගලකුත් මැවී යැ. නැවැත ඒ පොකුණට බැසැ ගන්නා කැමැති සර්‍වඥයන්වහන්සේ එල්බැ ගන්නා පිණිස, ඒ විල්තෙර වෘක්‍ෂයෙහි දෙවතාවා එහි අත්තක් නමා ලී යැ. සර්‍වඥයෝ සිවුරු සෝධා වදළසේක.

මේ ස්වාමිදරුවානන් බොධිසත්ත්වභූමියෙහි සිටි කල්හි පොවා, මොවුන් මරණු කැමැති වැ, රජක්හු "සෙට මා දිය කෙළනට පොකුණක් නො මැවුව හොත්, තා දිවි නැතැ"යි කී කල්හි, ඒ බව දත් ශක්‍රදෙවෙන්‍ද්‍ර අවුත් සප්තරත්නමය වූ නොයෙක් වෙදිකා හා පියගැටපහණින් යුක්ත වූ පඤ්චවර්‍ණ පද්මයෙන් ගැවසී ගත් පොකුණක් මවා ගියේ. මෙ සේ බොධිසත්ත්වභූමියෙහි සිටියවුන්ගේ පවා අභිප්‍රාය දනැ පොකුණු මවා ගිය, දැන් සවාසනසර්‍වක්ලෙශයන් නසා බුදුවූ දෙවාතිදෙව වැ ශක්‍රාතිශක්‍ර වැ බ්‍රහ්මාතිබ්‍රහ්ම වැ සිටි මහාපුරුෂයානන් වහන්සේගේ අභිප්‍රාය දත්, ශක්‍රදෙවෙන්‍ද්‍රයා අවුත් පොකුණක් මවා ල යි යනු කවර නම් ආශ්චය්‍ය්‍යයෙක් ද?

Non-Commercial Distribution

නැවත ඒ ස්වාමීන්ගේ අභිධර්මදේශනායෙහි වැඩැ හිඳිනට තමාගේ උස පසළොස්යොදුන්, පළල පණස්යොදුන්, දිග සැට යොදුන් පාණ්ඩුකම්බලශෛලාසනය ධර්මාසන කොට පුද, "බුදුන් වැඩහුන් ආසන යැ"යි තුන්කෙළසැටලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි තමා හිඳිනා තබා, අත පවා නො ලන ශක්‍රයා, දන් මේ සිවුර ඉදි කරණ පහණ පමණක් දී ලීම කවර ආශ්චර්‍ය්‍යයෙක් ද?

තව ද මේ මහාපුරුෂයානන් වහන්සේ වදන මැණියන් වහන්සේ දික් කළ අතට පොවා ලුම්බිනීවනයෙහි සල් අත්ත නැමී ගිය කල්හි, මේ මහාපුරුෂයානන් වහන්සේ දික් කළ අතට මේ අත්ත නැමී යනු කවර ආශ්චර්‍ය්‍යයෙක් ද?

ඉක්බිති පහන් වූ කල්හි ඉන්ද්‍රජාලයෙක්හි මැවී ගියා සේ, තමාගේ ආශ්‍රමයෙහි මැවීගිය පොකුණ හා පහණ හා, නැමී ගිය අතු හා දක, එපවත්, සර්වඥයන්වහන්සේ විචාරා දනැ, "මේ මහාශ්‍රමණයන්ගේ නොඑක් සෘද්ධි දවසැ දවසැ දකුම්හ. උන් කෙරෙහි අප සොයා නො දක්කේ රහත්බවෙක් මැ යැ"යි කීයැ.

තව ද, අනික් දවසක් උරුවෙලකාශ්‍යපතෙම සර්වඥයන් වහන්සේ කරා ගොස් "වළඳන්නට අව මැනැවැ"යි ආරාධනා කෙළේ. සර්වඥයන්වහන්සේ "තෝ යා. අපි එම්හ"යි කියා ඔහු යවා, තමන්වහන්සේ පසු වැ ගෙණැ සරසනක් පමණ තැනැ තුබූ ගිනිහල්ගෙට ඔහු නො යනතුරු, තමන්වහන්සේ ජම්බුද්වීපයට සලකුණු වැ සිටි මහදඹරුකට වැඩැ, පාත්‍රය පුරා මහදඹපක් ගෙණැ, ඔහුට පළමු කොට, ගොස්, ගිනිහල්ගෙයි වැඩහුන් සේක. ඉක්බිති උරුවෙලකාශ්‍යපතෙම "ශ්‍රමණගෞතමයෝ මා පළමු කොට එවා ලා තුමූ පසු වූවෝ කවරවිටැ එද්දේ හෝ"යි සිතසිතා ගිනිහල්ගෙට ගොස්, එහි තමාට පළමු කොට ගොස් වැඩහුන් සර්වඥයන්වහන්සේ දකැ විස්මය පත් වැ, මට පසුව ආදැ කෙසේ පළමු වූදැ ද"යි විචාළේ යැ. සර්වඥයන්වහන්සේ "කාශ්‍යපය, තා එවාලා, ඇපි මහදඹරුකට ගොස් ඵල ගෙණ අවුත් හුන්නම්හ. මෙපමණක් අප කළ සේ ආශ්චර්‍ය්‍ය නො වෙයි. තා මෙතෙක් තැන් එනතුරු, ඇපි භවාග්‍රයට ගොස් වේවයි; පරසක්වළට ගොස් වේවයි, සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් සක්වළගල මුවවිට ලක්ෂයක් වර කෝටියක් වර සිසාරා පියා තට පළමු කොට එත්, පොහොසතුම්හ"යි වදළසේක.

ඒ ඇසූ උරුවෙලකාශ්‍යපතෙම "මහාශ්‍රමණයෝ අප සේ නිවණට නො යා හෙන බව මුත්, කැමැති යම් තෙනකට යා හෙ"යි සිතී යැ.

තව ද, මෙසේ මැ එ මැ මහදඹගස ඇළයේ අඹගසින් අඹ ද, ඇඹුලුගසින් ඇඹුලු ද, අරළුගසින් අරළු ද, තව්තිසැදෙව්ලෝ ගොසින්

Non-Commercial Distribution

පරසතුමල් ද ගෙණැ අවුත්, තමහට පළමුකොට ගොස් ගිනිහල්ගෙයි වැඩැහුන් සර්‍වඥයන්වහන්සේ දකැ එසේ මැ කී යැ.

තව ද, එසමයෙහි උරුවෙලකාශ්‍යපයන්ගේ වහ්නිපූජා කරන්නට පන්සියයක් ජටිලයෝ පන්සියයක් දඬු පළන්නට පටන් ගත්හැ. එ සමයෙහි සර්‍වඥයන්වහන්සේ "ඒ දඬු නො පැළේව"යි අධිෂ්ඨාන කොට වදළසේකැ. ස්වාමීන්ගේ අධිෂ්ඨාන බලයෙන් ඒ දඬෙහි ඇනැලූ පොරෝ සමහරෙක් මහනෙල්මල් පෙති සේ වක් වන්නට වනැ. සමහරෙක් හිටිකඩ සේ එහි මැ ඇලෙන්නට වනැ. සමහරෙක් ජලධාරා සේ විරී වැගිරෙන්නට වනැ. තපස්විහු "මේ මහාශ්‍රමණයන්ගේ අධිෂ්ඨානයෙකැ"යි සිතුහැ. ඉක්බිති ස්වාමිදරුවෝ උරුවෙලකාශ්‍යපයන්ට "කාශ්‍යපය, අවශ්‍යයෙන් දර පැළුව මනා දැ"යි විචාරා "මහාශ්‍රමණයෙනි, පැළුව මැනැවැ"යි කීකල්හි "මෙවිටැ පැළේව"යි අධිෂ්ඨාන කොට වදළසේකැ. එවිට පන්සියක් දෙනා නභාගත් පොරෝ නො හෙළන තුරු දඬුතෙමේ මැ පැළී ගියේ යැ. මේ ආශ්චර්‍ය්‍ය දුටුවාවූ උරුවෙලකාශ්‍යපතෙම "මේ මහාශ්‍රමණයෝ අප සේ ක්ලෙශයන් පැළියැ නො හෙනබව මුත්, දර පැළියැ හෙති"යි කී යැ.

නැවත එක්දවසක් උරුවෙලකාශ්‍යපයන්ගේ ජටිලයෝ පන්සියයක් දෙන යාගයට ගිනි දල්වෙන්නාහු නොඑක් යත්නයෙනුදු ගිනි දල්වා ගත නො හී "මේ ද මහා ශ්‍රමණයන්ගේ අධිෂ්ඨානයෙකැ"යි සිතුහැ. එසමයෙහි සර්‍වඥයන්වහන්සේ "උරුවෙල කාශ්‍යපය, තට ගිනි දැල්වුවමනා ද?"යි විචාරා වදරා "දැල්වුව මැනැවැ"යි කී කල්හි "මෙවිටැ ගිනි දැල්වේව"යි අධිෂ්ඨාන කොට වදළසෙයෙකැ. ස්වාමීන් සිතා වදළ සිතිවිල්ල හා සමග මැ, ජටිලයන්ගේ ප්‍රයොගයක් නැති වැ මැ පන්සියක් ගිනිකඳ තෙමේ මැ තමහට ඇවිළැ පැනැ නැංගේය. මේ ආශ්චර්‍ය්‍ය දකැ ද කාශ්‍යපතෙම "මේ මහාශ්‍රමණයෝ මෙසේ ගිනි දල්වන සේ දන්නාබව මුත් කෙලෙසුන් නසන තපස් තෙජස දැල්වියැ නො හෙති"යි කී යැ.

එසමයෙහි ජටිලයෝ වහ්නි පූජා කොටැ, අන්තයෙහි ගිනි නිවන්නට පටන් ගත්හැ. සර්‍වඥයන්වහන්සේ "ඒ ගිනි නො නිවේව"යි අධිෂ්ඨාන කොට වදළසේක. සර්‍වඥයන්වහන්සේගේ අධිෂ්ඨානබලයෙන් එතෙක් තාපසයන් කැටි වැ වෙන වෙන පෙනෙහෙලි බිමැ ගහතුත්, පැන් නමතුත්, ගිනි නො නිවී ඇවිළෙන්නට වන. ඉක්බිති සර්‍වඥයන්වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් ගිනි නො නිවුනුබව ජටිලයන් දත්කල්හි "කාශ්‍යපය, ගිනි නිවමෝ දැ"යි විචාරා "නිවුව මැනැව"යි කී කල්හි "ගිනි නිවේව"යි අධිෂ්ඨාන කොට වදළසේක. ස්වාමීන් සිතු කෙණෙහි මැ, පන්සියක්

Non-Commercial Distribution

ජටිලයන්ගේ ප්‍රයොගයක් නැති වැ මැ, ගිනි එකවිටැ නිවී ගියේ. ඒ ආශ්චර්‍ය්‍යී දුටුවා වූ උරුවෙල කාශ්‍යපතෙම "මේ මහාශ්‍රමණයෝ අප සේ ලෙහි කෙලෙස්ගිනි නිවා ගත නො හෙනබව මුත්, නිකම් ගිනි නිවා ගත හෙති"යි කී යැ.

තව ද, එක් දවසක් මහාශීතසමයෙහි තිල්තලාහොයැ ගැලී නහන්නා වූ පන්සියක් ජටිලයන් ශීතයෙන් පීඩිතසමයෙහි ඔවුන් තප්නා පිණිස ඉන්ද්‍රජාලයෙන් පානා සේ, ඔවුන් අභිමුඛයෙහි පන්සියක් ගිනිකබල් තබා වදළසෙයෙකැ. ඒ දුටුවා වූ උරුවෙලකාශ්‍යප ද "මහාශ්‍රමණයෝ අනුන්ගේ ශීත නසා, ගිනි කබල් දෙන සේ දන්නාබව මුත්, තෘෂ්ණාව නසා නිවන් දෙනසේ නො දනිති"යි කී යැ.

එසමයෙහි මහත් අකාලමෙඝයෙක් වැසැ ගඞ්ගාවෙහි මහ වතුර හෙළී යැ. සර්‍වඥයන්වහන්සේ වසන්නා වූ වනලැහැබ එක පැතිර ගලා ගෙණැ යන්නට පටන් ගත. එසමයෙහි ස්වාමි දරුවානෝ "මා සිටිතැන මේ වතුරෙන් නො ගලාව යි, සතර දිශාවෙහි සතරපවුරක් බැඳ ලූවා සේ, මේ ජලස්කන්ධය මා සිසාරා ගල්පවුරු සතරක් සේ සිටීව"යි අධිෂ්ඨාන කොට වදළ සේක. ජලය ස්ථිර වැ සිටැ ගත් කල්හි, අළුතැ ගුරු ගැල්වූ භිත්ති ඇති සක්මණෙක්හි සක්මන් කරන්නා සේ, මැඩැ ගෙණැ යන මහවතුර මද්‍ධ්‍යයෙහි සිස්බිමැ වැලි මත්තෙහි සක්මන් කොට කොට වැඩැ සිටිසේක. ඉක්බිති උරුවෙලකාශ්‍යපතෙම "මහා-ශ්‍රමණයෝ වතුරෙන් ගියෝ නම් අලාභ යැ"යි සිතා සර්‍වඥයන්වහන්සේ ගලවා ගෙණැ එන්නට හොරුවක් පැදැ ගෙණැ ගියේ ය. තමන් වහන්සේගේ ශරීරයෙහි රශ්මියෙන් සියලු වතුර රන්වතුරක් සේ රඳලා, එහි මැද සක්මන් කරණ සර්‍වඥයන්වහන්සේ දැකැ විස්මයපත් වැ, "මහාශ්‍රමණයෝ නිකම් වතුර රඳවාලන බව මුත්, මා සේ තෘෂ්ණාවතුර රඳවා ලියැ නො හෙති"යි කී යැ. ඒ වතුර ස්වාමිදරුවන්ගේ ශ්‍රීශරීරය තෙත් නො කළා සේ කාශ්‍යපයන්ගේ ලයත් අදද නො කෙළේ.

ඉක්බිති ස්වාමිදරුවෝ කාශ්‍යපයන් "මෙසේ වැඩියැ මැනැවැ"යි කියන බස හා සමඟ හොරුවෙහි පැණී ගොස්, ගොඩට වැඩැ ආසනයෙහි වැඩැ හිඳ "මේ තෙම මා මෙතෙක් ප්‍රාතිහාර්‍ය්‍යී කරණ තුරු තමා මැ රහත් කොට සිතනබව මුත්, මා කෙරෙහි ශ්‍රද්ධාවක් නැත්තේයැ. මෙතැන්හී මොහුගේ මිථ්‍යා දෘෂ්ටියට සද්ධර්‍මයෙන් මුත්, අනික්ලෙසකින් පිළියම් කොට ගත නො හැක්කේ වනැ"යි සිතා වදරා, එකෙණෙහි බණට පටන් ගෙණැ මධුරස්වර විහිදුවා "කාශ්‍යපය, තා විසින් නිර්‍වාණයට මාර්‍ග යැයි කල්පනා කළ මාර්‍ගය අමාර්‍ග යැ. නිර්‍වාණය උදයපර්‍වතය

Non-Commercial Distribution

දිශාවෙහි තිබියැ දී, තෝ අස්තපර්වතයට ගියෙහි යැ. තෝ ඒ මගින් නිර්වාණය සොයන්නෙහි ආසැ තුබූ සඳට පොළොවැ ලිං කනන්නවුන් වැනියෙහි යැ. වරකා කන්නටයැයි කොස්කිරි මත්තෙහි බැසැ හුන් මැස්සා 'වරකා තබා පය හයා ගත නො හෙන්නා සේ, නිවන් පිණිස මේ මිථ්‍යාදෘෂ්ටියෙහි අභ්‍යාස කරන්නා වූ තෝ නිවන් තබා සතර අපායෙන් පය හයා ගත නො හෙන්නෙහි යැ. උදයපර්වතයෙහි මුත් වින්ධ්‍යපර්වතයෙහි හිරුඋදයක් නැත්තා සේ, මාගේ මතයෙහි මුත් තාගේ මතයෙහි නිර්වාණයක් නැත. තා සේ වූ ජඩයන්ගේ දුර්බුද්ධිය හරණ පිණිස මා විසින් දුකින් සොයා ගත්තා වූ ශාන්ත වූ ප්‍රණීත වූ නිරවද්‍ය වූ ධර්මයට වැද, තාගේ ලය සංසිඳුවා ගණු. මම තට තපස්විවෙශයෙන් සිටියා වූ මවකිමි. සර්වඥමූර්තීන් සිටියා වූ පියෙකිමි. ධර්මයෙන් ලොව ගලවන්නට ආබව මුත්, වස්වාවෙන් බොරු කියා ලොව වළැහෙලන්නට ආ එකෙකිම් නො වෙමි. මා විසිනුත් විඳ'මෙසේ වූ මිහිරෙක් වනැ'යි දත්බව මුත්, කියා හඟවා ගත නො හැක්කා වූ නිර්වාණරසය මාගේ උපදෙශයෙන් අනුභව කර, තාගේ ගැලවී මෙන්, ලොව ගලවන්නට ආවා වූ මාගේ ද මනොරථය පිරේවයි. මේ අෂ්ටදුෂ්ටක්‍ෂණයෙන් විනිර්මුක්ත වූ නවවන බුද්ධොත්පාද ක්‍ෂණය තට සිස් නො වේවයි. සරාග යැ, සද්වෙෂ යැ, සමොහ යැ යන මේ වචනය මාගේ ශ්‍රීපාදච්ඡායාසෙවාවෙන් දුරු කොට ගණු. මාගේ ප්‍රතිපත්ති වූ පරිද්දෙන් පැවැතැ, නිර්වාණරසය අනුභව කරන්නවුන් හා එකබොජුන්හල්හි හිඳ එ මැ රසය අනුභව කර තාගේ මේ චිත්තශුද්ධිය හෙතු කොට ගෙණැ, තා වැඳපිදූවනුත් ඒ නිර්වාණය දක්නා පරිද්දෙන් පවතු. ශීල යැ, සමාධි යැ, ප්‍රඥ යැ යන මේ තුණ මා කෙරෙන් තා ලබනබව මුත්, බැහැරින් ලබන දෙයෙක් නැත. මා කී පිළිවෙළින් නිවන් දැකැ උදන් අනා ඇවිදින ශ්‍රාවකයන් හා සමඟ, තෝ ද සන්තොෂයෙන් උදන් අන අනා ඇවිදු. මාගේ සච්චන්ට මරහු හැකිලෙන බව මුත්, සෙස්සන්ට නො හැකිලෙන බව දනු. නුවණැත්තවුන් විසින් බුදුන් කී මාර්ගය නො හැරැපියැ හැකිබව දනු. මිථ්‍යාදෘෂ්ටි නැමැති සර්පධෙනුව විසින් දෂ්ට කරණලද තට සද්ධර්මයෙන් ප්‍රතිකාර කරන්නට අයිමි. තමහට තමා මැ සතුරු වූ මේ තා ගත් අධර්මය දුරු කට යුත්තේ ය. දුර්ලභ වූ මේ බුද්ධොත්පාදය ලදිහි. මා සේ වූ බුදුකෙනකුන් කෙරෙන් සද්ධර්මය ද අසන්නට ලබන්නෙහි යැ. එසේ හෙයින් මාගේ දරු වූ ශ්‍රාවකයන් හා සමඟ තෝ ද අමෘතමහානිර්වාණය දකැ"යි වදළසෙයැකැ.

ඉක්බිති ඒ ධර්මය ඇසූ උරුවෙලකාශ්‍යපතෙම "රහත්මි" යන අභිමාන නැති වැ, තමහට හිත කැමැති වැ, ස්වාමි දරුවන්ගේ ශ්‍රීපාදයෙහි

Non-Commercial Distribution

වැතිර ගොස් වැඳ නැඟී සිටැ, දෙහොත් මුදුනෙහි තබා භක්තියෙන් නැමී සිටැ "ස්වාමීනි, ස්වාමීන්ගේ ශ්‍රීපාදප්‍රසාදයෙන් ගැත්තෙම් කෘතකෘත්‍ය වැ සිටියෙමි. ඒ මාගේ මනොරථය මුදුන්පත් වි යැ. නුඹවහන්සේගේ වචනාමෘතය බී මාගේ කන් නිවී ගියේ. රාගද්වෙෂමොහ සහිත හෙයින් මා සිතැ ආදි යම් විකාරයෙක් ඇත් නම්, දන් ස්වාමීන්ගේ ශ්‍රීපාද වැඳීමෙන් මැ නැති වී ගියේ යැ. එසේ හෙයින් ඒ ක්‍ෂමා කොට වදළ මැනවැ. ස්වාමීනි, ස්වාමීන් බුදු වැ වදළේත් මා පිණිස මැ යැ යි සිතමි. එසේ හෙයින් භාග්‍ය ඇත්තේත් මම් මැ යැ. සත්පුරුෂයන් විසින් පූජා කට යුත්තේත් මම් මැ යැ. දිවි ලද්දෙහි එල ලද්දේත් මම් මැ යැ. සංසාරදුක් දිනුයේත් මම් මැ යැ ස්වාමීන් 'උරුවෙලකාශ්‍යපයා හික්මව'යි සිතා වදළ විටැ මම් මැ නිවන් දුටුවන් කෙරෙහි ඇතුළතිම් මැ යැ. නො රහත් වැ 'රහත්මි'යි ලොවට හඟවා මා පිරූ පව් (ගෙවා) වදළ මැනැවැ'යි වැඳ ගෙණැ හොත්තා වූ උරුවෙලකාශ්‍යපයන්ට "බල තාගේ අතවැස්සන්ගේත් අභිප්‍රාය දනැ එව"යි යවා වදළසේකැ.

හෙතෙම තමාගේ අතැවැස්සන් කරා යුහු ව ගොස් "පින්වත්නි, අප කරා වැඩියෝ සර්‍වඥයෝ යැ. ඇපි ඔවුන් නුනුවණින් නො හැඳින්නම්හැ. දන් මම් ඔවුන් වූ පරිද්දෙන් දත්මි. සසරට ගොදුරු මා ගලවන්නට මැ වැඩිසේකැ. ඔවුන්ගේ ශ්‍රීපාදරෙහෙණුයෙහි ලා මාගේ හිස බොහෝකලෙකින් පවිත්‍ර කෙළෙමි. නිවන් දක්නා ජාති දක්වා ඔහු මට කුලදෙවතා වෙත්වයි. ඔවුන් මා කරා වැඩි හෙයින් මැ මාගේ දෛවය එල ගතැයි සිතමි. මෛත්‍රිය දෙවෙනි කොට ඇති කරුණාත් එතැන්හි මැ යැ. සමෘතිය හෙලි කොට ඇත්තාවූ බුද්ධියත් එතැන්හිමැ යැ. නිවණට ඇදුරුකම් දන්නෝත් ඔහු මැ යැ. පුරුෂාජීසිද්ධිය පිණිස සෙවියැ යුත්තවුත් ඔහු මැ යැ. දිවි ලද්දෙහි එල ලබනු කැමැත්තවුන් විසින් ශක්ති වූ පරිද්දෙන් ස්තුති කට යුත්තාහුත් ඔහු මැ යැ. එසේ හෙයින් මම ඔවුන් කෙරෙහි මහණ වන්නා කැමැත්තෙමි. තෙපි තොපට හැඟුනක් කරව"යි කී යැ.

ඒ අසා තපස්වීහු "ඇපි දු තොපට හැඟුනක් කරම්හ"යි එතැන්හි මැ සිටැ ජටාමඩුලු කපා දියෙහි දමාපියා සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි වැඳ ගෙණැ හෙවැ එහිභික්‍ෂුභාවයෙන් මහණ වූහැ.

ඉක්බිති දියෙහි යන්නාවූ තවුස්පිරිකර දකැ, නදීකාශ්‍යප යැ ගයාකාශ්‍යප යැ යන දෙබෑයෝ ද සහපිරිවරින් අවුත්, එපවත් දනැ, තුමූ ද තමන්ගේ ජටාමඩුලු කපාපියා එහිභික්‍ෂුභාවයෙන් මහණ වූහැ. ඉක්බිති ස්වාමිදරුවානෝ මේ තුන්බෑජටිල දහසක් භික්‍ෂූන් ඇර ගෙණැ

ගයාශීර්ෂයෙහි මිණිපහණපිටැ වැඩැ හිඳ "චක්ඛුං භික්ඛවෙ, ආදිත්තං" යනාදීන් ආදිත්තපරියාය සූත්‍රය දෙසා වදරා, එක පැහැර හැම දෙන මැ තමන්වහන්සේ වන් අමාමහනිවන්හි ලා වදළසේක.

එසේ එහෙයින් ස්වාමිදරුවානන්වහන්සේට ඒ යට කී නයින් දෙන්නාගේ විෂ නැති වූවා සේ, අපටත් ඉහලොක පරලොක දෙකින් භය නැති වේව යි; ස්වාමිදරුවානන් හුන් තැනට දිව්‍ය බ්‍රහ්මයන් ආවා සේ මැ, ලොවීලොවුතුරාසුව අප හුන්තැන කැටි වේවයි; ඔවුන්වහන්සේ අනුන්ගේ ලාභයට අන්තරාය නො කළා සේ මැ, අපටත් ලාභාන්තරාය නො වේව යි; ඔවුන්වහන්සේට පොකුණු ආදී මැවුවා සේ, අපටත් අභිමතාර්ථය නිර්මිත වේවයි; ඔවුන්ට ඒ සා මහත් කතර ලුහුඬු වූවා සේ, අපටත් සසර කතර ලුහුඬු වේවයි; ඔවුන්ට අචෙතස්ක වූ ගසැ අත්ත නැමුනා සේ අපටත් සියලු සත්ත්වයෝ අවනතවෙත්ව යි; ඔවුන් සිතුවිටැ දරෙහි ගිනි නො ඇවිළුනා සේම, අප සිත ශොකාග්නි නො ඇවිළේවයි; උන් නො කැමැති විටැ ගිනි නිවුවා සේ මැ, අප සිතැ ඇති ශොකාග්නි නිවී යේව යි; ඔවුන් ඒ තපස්වීන්ගේ ශීතප්‍රතීකාරයට ගිනි දුන්නා සේ; අපටත් සම්භව වූ දුකකට ප්‍රතීකාර එතැන්හි ලා මැ පැණී යේව යි; ඒ සා මහත් වතුරෙහි ඔවුන් නො ගැලුනා සේ, මහාසංසාර-සාගරයෙහි අපිත් නො ගැලෙමෝව යි; ඔවුන් සරණ ගිය ඒ තුන්බෑජටිලයන් හා දහසක් ජටිලයන් නිවන් දකැ සැනහුනා සේ මැ අපි දු සැනහෙමෝව යි; මෙසේ ඒ ස්වාමි දරුවානන්ගේ ගුණ අනවරතයෙන් මෙනෙහි කොට සත් පුරුෂයන් විසින් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

තව ද, දහමට බැහැවී[1] ගත්, කරුණාවට තියැලීගත්, පර වැඩෙහි සැහැසී[2] ගත්, තමහට වැඩෙහි පසු බැසී ගත්, තමන් ලෙහි ද පුත් වූ රාහුලකුමාරයන් කෙරෙහි දු, හිසට ගල් පෙරළූ දෙව්දත්හු කෙරෙහි දු, 'තමන්ට දරී ඇත්තෙමි''යි සිවුවණක් පර්ෂද්මධ්‍යයෙහි[3] වැඩැ හිඳ බණ වදරණ තැනට කොහොටු මිටියක් බඩ බැඳ ගෙණැ ගොස් නොයෙක් පරිභව බිණූ සැති මණොවිදුව කෙරෙහි දු, තමන් සස්නෙහි මහණ වැ තමන් වහන්සේ වදළ පිළිවෙතින්[4] අමාමහනිවන් දුටු උපුල්වන් මහතෙරින් වහන්සේ කෙරෙහි දු, 'තමන්වහන්සේ විදිනට යැ'යි හී ගෙණැ සිටි දුනුවායන් කෙරෙහි දු, තමන් පූජාවට[5] කුඩ ගෙණැ සිටි මහබඹුන් කෙරෙහි දු, කොසොල් රජ්ජුරුවන් දුන්, එක් බුදුකෙනෙකුන්ට එක් ඉඩෙකැ මුත් දෙඉඩෙක නො ලැබෙන අසදෘශ මහදන්හි දු, බමුණා

1. බහැව 2. සැහී 3. පිරිස් මැද. 4. පිළිවෙළින් 5. තමන්ගේ.

Non-Commercial Distribution

තමා කන්නට ලා ලූ තෙනින් ගෙණැ අවුත් පාත්‍රයෙහි පිළිගන්වාලූ බත්හි දු, සූපණස්කෙළක් ධන වියදම් කොට අනේපිඬුමහසිටානන් කරවා පිළිගන්වා ලූ ජේතවන මහාවිහාරයෙහි දු, පුක්කුසාතිකුලපුත්‍රයන් පිණිස එක්සිය විසියොදුන්මග ගෙවා ගොස් වැඩහුන් කුඹල්හල්හි දු සමසිත් වූ, වියත් සේ කියා නිමවත්, මහත් සේ කියා නිමවත්, කරුණා ඇතිසේ කියා නිමවත්, නුවණ ඇති සේ කියා නිමවත්, බණ කියැ හෙන සේ කියා නිමවත්, සිත්කලු සේ කියා නිමවත්, පිණැති සේ කියා නිමවත්, යශස් ඇති සේ කියා නිමවත් තෙජස් ඇති සේ කියා නිමවත්, කෘතාධිකාර සේ කියා නිමවත්, කුලජ, සේ කියා නිමවත්, අපිස් සේ කියා නිමවත්, ප්‍රතිපක්‍ෂයන් මන් බුන් සේ කියා නිමවත්, පෙළහර පානට සූරු පරිදි කියා නිමවත්, සරණ වන්නන් ලය සනහන සේ කියා නිමවත්, සියලු ලොවට ශාන්ති කළ පරිදි කියා නිමවත්, රූ ඇති සේ කියා නිමවත්, ඉතිරි ධර්‍මකථිකයන් තබා සව්නෝ ගෙවා දත් තමන් වහන්සේ ද ආයුපමණින් එකෙකි. ගුණ අල්වාගෙණැ වදරා නිමවත් නො නිමවිය හැකි මහත් ගුණ ඇති බුදුරජානන් වහන්සේ එක් සමයෙක්හි ජේතවනමහාවිහරයෙහි වැඩැ වසන සේකැ.

එසමයෙහි අලව් නම් රට රාජ්‍ය කරන්නා වූ රජතෙමේ තමාගේ ඇමැත්තන් පිරිවරා මුවදඩ ගොස් "යමක්හු සිටි[1] තෙනින් මුවෙක් පලා නම්,[2] ඕහට මෙතෙක් දඩ යැ"යි[3] ප්‍රතිඥ කොට සහතික කළේ[4] එසමයෙහි මුවා ද අනිකක්හු සිටිතැනින් නොගොස් රජු සිටි තැනින් මැ[5] ගියේ යැ. රජ්ජුරුවෝද කළ ප්‍රතිඥව සඳහන් කොට මුවා පස්සෙහි හී තුන්ගවුපමණ තැන් ගොස්, දිවියැ නො හී සිටි මුවා කඩුවෙන් පැහැර[6] දෙකඩ කොට පියා "මුවා මරාපියා ආමීයි කිවහොත්, අමාත්‍යයෝ නො අදහති. එහෙයින් මැ කදෙක්හි ලා ගෙණැ බරෙහි ඇරගෙණැ[7] එන්නේ විඩා වැ ගොස් එක් නුගරුකක් මුලට වනැ.

ඒ නුගරුකද ආලවකයක්‍ෂයා සතු නුගගසෙකැ. ඒ යක්‍ෂයා ද "හිරුමදධ්‍යාහ්නයෙහි සිටි වේලේ සෙවන පතළ තෙනට වන් කෙනෙක් ඇත් නම්, ඕහු තට ගොදුරු වෙති"යි වෛශ්‍රවණයා අතින් වර ලද. ඒ යක්‍ෂ තෙමේ තමා සතු ගස සෙවන වන්නා වූ රජ්ජුරුවන් දකැ සතුටු වැ, එතැනට අවුත් සැතැපී නික්මැ ගන්නා වූ රජ්ජුරුවන් අත අල්ලාගෙණැ "කොයට යෙහි ද? මට ගොදුරු වූයෙහි වේ දැ"යි කීයැ.

1. සිටිනා.　2. පලාද.　3. ඕහටමැනැවැයි
4. ගස (හස) සිසාළේ.　5. රජ්ජුරුවන් හිස පැන ගෙණ
6. මරා.　7. ඇදගෙණ

Non-Commercial Distribution

ඒ අසා රජ්ජුරුවෝ ඔහු යක්‍ෂයා බවත්, වර ලත්බවත් විචාරා දැනැ "මේ මුවා කා මා හර"යි කී යැ. යක්‍ෂ තෙමේ "තෝ නුවණැති එකෙක්හි ද? තා කැකල්හි මුවා අතික් කොයි යේ ද? තොයිත් මුවාත් දෙදෙන මැ මා සතු වාද"යි කී යැ. ඒ අසා රජතෙමේ "මම අතිකෙකිම් නොවෙමි. මේ අලවිරට රජය කරන්නා වූ රජෙමි. දවස් පතා තට මිනිසකු හා බත්පයක්[1] හා බලිකම්ාන්ත කොට දෙමි. නුදුන්ද මා අල්ලා ගෙණැ කතත් තට ගොදුරු වෙමි'යි කියා යකුට ප්‍රතිඥා කොට ඔහු අතින් ගැලවී නුවරට ගොස් නුවර රක්‍ෂාවෙහි සිටි අමාත්‍යයා කැඳවා එපවත් කී යැ. ඒ අමාත්‍යතෙම "ස්වාමීනි, සැක[2] නො කළ මැනැවැ"යි කියා සිරගෙන් මිනිසකු ගෙණැ බත්පයක් අතැ තබා නුගගසමුලට යැවී.

එවේලෙහි ඒ යක්‍ෂතෙමේ තමාගේ භයඞ්කර වූ යක්‍ෂවේශයෙන් අවුත් මිනිසා අල්වා ගෙණැ සල්වසල්වා හඩවහඩවා කයි. දෙෂ කළ ජනයන් යකුට බිලි දෙන බව සියලු නුවර ප්‍රසිද්ධ වී යැ. යක්‍ෂයා කෙරෙහි කළ භයින් දුශ්චරිත[3] කරණ එක ද සත්ත්වයෙක් නැති වී යැ. "මිනිසුන් සොරවා ගණුම්හ"යි දසින් බඳ පියැලි වීථියෙහි හෙළුකලැ ගන්නා තබා පයින් පෙරළා බලන්නොත් නැත. මෙසේ සොරුන් නැති වැ යන්නා හා හැමදෙන සමග බැණ "මැහැලිගැහැණුන් පිරිමින් යවම්හ'යි කීහැ. රජ්ජුරුවෝ ඒ අසා "අපගේ මෑණියන් යකුහට බිලි දුන්හැ. අපගේ පියාණන් යකුහට බිලි දුන්හ'යි බොහෝදෙන කලකිරෙන්නාහ. "එසේ ලෝවැස්සන් කලකිරෙන්නා බලත් මම් මැ ආවක් දක්මි'යි නො ගිවිස්සාහැ. අමාත්‍යයෝ "එසේ වුවහොත් මවුන් පියන් ස්නෙහ හට[4] නො ගන්නා තුරු අළුතැ වැදූ දරුවන් ගෙණැ ගොස් දෙම්හ"යි කියා රජ්ජුරුවන් ගිවිස්වා බාලකුමාරයන් ගෙණැ ගොස් යකුට බිලි දෙති.

මෙසේ දෙළොස් අවුරුද්දක් ඉක්මැ ගියේ යැ. ගර්භිණී ගැහැණුහු වදනපොහොදන අවස්ථාවෙහි ඒ රට හැර පියා බැහැර නැඟී ගොස් දරුවන් වදති. එසේ හෙයින් සියලු ජනපදයෙහි කුමාරයෝ නැති වැ ගියාහැ. අමාත්‍යයෝ සියලු ජනපදයෙහි එක ද කුමාරයකුත් සොයා නො දැක 'ස්වාමීනි, සෙට දවසට මුළුනුවර සොයා එක ද කුමාරයක්හු නුදුටුම්හ'යි කීහැ. ඒ අසා රජ්ජුරුවෝ "මේ සා මාගේ විජිතයෙහි එක ද කුමාරයෙක් නැද්දැ'යි විචාළෝ. නුඹවහන්සේගේ අන්තඃපුරයෙහි නුඹ

---

1. පාත්‍රය. 2. සැල. 3. සොරකම්
4. අට.

Non-Commercial Distribution

පුත්‍ර වූ ආලවකකුමාරයන් හැර අනික් කුමාරයෙක් නැතැ'යි දන්වූහැ. ඒ අසා රජ "සෙට මා මළ හොත් මපිත් සුව සේ දිගා වැ රැකී රජය රක්කි. ඉදින් මම සෙට ඔහු බිලි දිනිම් නම්. මා රැකෙන්නේ සෙට එක දවස් සැටපැයට මැ යැ. අනික් දවස් වූ කලි බිලි දෙන්නට එක ද කුමාරයකු නැති වන්නා හා යක්‍ෂ තෙමේ මා කයි' සිතා, නැවැතැ සිතන්නේ "එක දවසකටත් මා රැකී මා පුතු බිලි දෙනබව යහපතැ'යි සිතා "ඔහු බිලි දීත් මා රැකැගන්ව'යි අමාත්‍යයන්හට කී. එබස් අසා අමාත්‍යයෝ කුමාරාහරණ පලඳවා දුහුල්සුඹුළු මත්තෙහි ඇකයෙහි හොවා ගෙණැ මෑණියන් සනහසනහා හුන් කුමාරයන් "සෙට යක්හට බිලියමට යැ'යි මෑණියන් හඬවහඬවා උදුරාගෙණ ගියහැ.

මෙතෙක් උපද්‍රව වන කල් හි "ලොවට උපද්‍රවයෙක් ඇත. දුරු-කරන්නට යැ'යි උපන්නාවූ බුදුරජානන් වහන්සේ එයට තිස්යොදනකින් ඔබ්බෙහි සැවැත්නුවර ජේතවනමහාවිහාරයෙහි වැඩැ වසන සෙයෙක්, අලුයම්වේලෙහි මහාකරුණාසමාපත්තියෙන් නැඟී "අද මාගේ දහම්[1] අසා අමාමහනිවන් දක්නෝ ඇද්දෝ හෝ? නැද්දෝ හෝ?යි පරීක්‍ෂා කොට වදරණසේක්, ඒ මස්ලේගඩුව මතු අනාගාමි වැ නිවන් දක්නා බව හා, ඒ යක්‍ෂයා තමා කන මිනීමස් හැර තමන්වහන්සේගේ සස්නෙහි අනදමහ තෙරුන් වහන්සේ හා නො වෙනස් වැ සෝවාන් වනබව හා, එතැන්හි තමන්වහන්සේ වදරණ බණින් සුවාසූදහසක් දෙනා අමාමහනිවන් දක්නාබව හා නුවණැසින් බලා වදරා පහන් වූ වේලෙහි පටන් වළඳනා වේලාව දක්වා පෙරවරු කළ මනා කටයුතු නිමවා වදරා, පස්වරුවේලෙහි කළුවරදෙපොහොද හිරු බටසඳ උදකළා වැ තමන්වහන්සේගේ පාත්‍රචීවර තමන් වහන්සේ මැ හැර ගෙණැ ක්‍ෂණයකින් තිස්යොදුන්මහ ගෙවා ඒ ආලවකයක්‍ෂයාගේ විමානයට වැඩැ වදළසේකැ.

එදවස් ඒ ආලවකයක්‍ෂයා හිමාලයෙහි දෙවසමාගමයට ගියේ යැ. බුදුරජානන්වහන්සේ ඒ ආලවක යක්‍ෂයාගේ විමානයෙහි දෙර වැඩැ සිටිසේකැ. එවේලෙහි ආලවකයක්‍ෂයාගේ ද්වාරරක්‍ෂාකාවලැ[2] සිටි ගද්‍රභ නම් යක්‍ෂයා අවුත් සර්‍වඥයන් වහන්සේ වැඳ "ස්වාමීනි, නොවේලෙහි මෙයට වැඩැ වදළේ කුමකට දේ හෝ?"යි විචාළේ යැ. ඒ අසා ස්වාමිදරුවානන් වහන්සේ "ගද්‍රභය, එසේ යැ. නො වේලෙහි තාගේ යක්‍ෂ විමානයට ආම්හැ. ඉදින් තට නො බැරි වී නම්, අද එකරැ මේ විමානයෙහි දවස් ගළවම්හ[3] තෝ එයට අනුදනැ'යි වදළ සේකැ.

1. දහම්අමා. 2. ද්වාරපාලවූ, ද්වාරරැකවල. 3. හළවම්හ-හැම.

Non-Commercial Distribution

ඒ අසා ගද්‍රභ නම් යක්ෂ "ස්වාමීනි, මා සතු තෙනෙකැ නුඹ වහන්සේ වසත් හොත්, ඒ මට බැරි නො වෙයි. මේ විමානය ඒකාන්තයෙන් මැ මාගේ විමානයෙක් නො වෙයි. ඉතා දැඩි වූ ආලවක යක්ෂයාගේ විමානය යැ. ස්වාමීනි, ඒ ආලවක යක්ෂයා ඉතා ක්‍රෑර යැ. නුඹවහන්සේ වැනියන්ගේ බස් නො අසයි. මවුන් පියන් නො ද වැඳිවිරී යැ. මා දන්නා තැනැ සිටැ මේ විමානය ඒකාන්තයෙන් පිණකට සැරහුවා නුදුටුවිරීම්. මේ විමානයෙහි ආසන්නබිමැ ඌ කොලින් වැගිරැ ගිය ලේ වතුර ගෙණැ පියා තිබෙන නියාව බලා වදළ මැනැවැ. ඒ යක්ෂයා කැ මිනී බලත් හොත් සියලු මහාරටක් රීල් කොට ලියැ හැකි මිනිස්සු යැ. ඉතා චණ්ඩ යැ, නුඹවහන්සේ වැනියන්ගේ ගුණ දන්නා එකෙක් නො වෙයි. ඒ දැන් තෙමේ බැහැර ය. ඔහුගේ අඹුවෝ ගෙහි යැ. නුඹවහන්සේ බ්‍රහ්මචාරිබව නො දන්නී. ඉතා මැ චණ්ඩ යැ. මේ විමානයෙහි වසනබව නො කැමැත්තෙම්; ස්වාමීනි"යි කී යැ.

ඒ අසා තිලෝගුරු වූ සම්මාසම්බුදුන්වහන්සේ "ගද්‍රභය, මේ සා තිස්යොදුන් මහ ගෙවා ආයේ මේ විමානයට මැ යැ. මා වසන ජේතවන විහාරයෙහි ගඳකිළියෙහි දී අලුයම්වේලෙහි මැ ආලවකයා දිටිමි. 'ඔහු නො රළුහ'යි අයෙම් නො වෙමි. 'ඔහුගේ රළුකම් හරණට යැ'යි අයිමි. දැඩියන් නො දමා පුරුදු එකෙකිම් නො වෙමි. වශවර්තිමාරයා සේ දැඩියන් පොවා මත් බිඳ පුරුද්දෙමි. තාගේ ආලවකයක්ෂයා සේ දැඩි යක්ෂයෝ මා දුටුකලැ යක්ෂයෝ නො වෙති. රාක්ෂසයෝ මට රාක්ෂසයෝ නො වෙති. දැඩියෝ මට දැඩියෝ නො වෙති. ගල් මට ගල් නො වෙයි. ගිනි මට ගිනි නො වෙයි. දිය මට දිය නො වෙයි. නයි මට නයි නො වෙති. ඇත්හු මට ඇත්හු නො වෙති. සිංහයෝ මට සිංහයෝ නො වෙති. ආයුධ මට ආයුධ නො වෙයි. ලොව ඇති තාක් උපද්‍රව මට උපද්‍රව නො වෙයි. ලොහො යැ තඹ යැ රිදී යැ යකඩ යැ කැටකැබැලිති යැ යනාදි සියල්ල රසයෙහි බලයෙන් තමාගේ ගුණ හැරැ පියා රන් වැ යන්නා සේ, මාගේ මෛත්‍රීරසයෙන් එකරස වැ ගොස් තමාගේ දැඩිගුණ හැරැ පියා පියකරු වන බව ගද්‍රභය, තෝ නො දත්හි ද? සත්ත්වයන් සිත් ගෙණැ රඳවා ගත නො හැක්කෙම් නො වෙමි. ස්වප්නයෙහි රුවක් සේ සිඳ බිඳ පියැ හැක්කෙම් නො වෙමි. ඡායාවෙහි රුවක් සේ ස්පර්ශ කොට ගත හැකි එකෙකිම් නො වෙමි. ගැලෙම් නම් බැහැරට නො ගොස් මැ බකබ්‍රහ්මයා වැනි එකකුටත් නො පෙණී ගැලෙන සේ දන්මි. මාගේ ශ්‍රාවකයෝ පවා නන්‍දෝපනන්‍ද නාගරාජයා වැනි එකක්හුගේ කුස තුළට වැදැ ද උපද්‍රව නො වැ සක්මන් කොට යෙහෙන් පිටතට යන සේ දනිති. මම මේ විමානයට වැද යෙහෙන් පිටත් වැ යන උපාය නො දන්නෙම්

Non-Commercial Distribution

නො වෙමි, සෙසු උපාය තබා, 'මෙ සේ බණ කියමි'යි මා තුඩ පොපියවා ලීම් නම්, මාගේ බසට ගැති නො වැ කවුරු වැළහෙද්ද? දැඩියන් හඳුනමි. දැඩියන් හා බිණූ[1]විරීමි. දැඩියන් කී ප්‍රශ්න කී විරීමි. දැඩියන් අතින් මෙහෙ ගත් විරීමි. ආලවකයාගේ දැඩිකම් තෝ මට නො කිය. ආවක් දක්ක හැක්කැ. තට නො බැරි වී නම්, මේ විමානයෙහි වසන්නා කැමැත්තම්හ"යි වදළසෙයෙකැ.

ඒ අසා ගද්‍රභ නම් යක්‍ෂ "ස්වාමීනි, ආලවකයා නම් ගිනි ගත් යකබලක් සේ සිහිල් නොවන ලයක් ඇති එකෙකැ. මෙයට පෙර ආ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ සිත් ඉතා වියවුල් කොට පියන්නාත් දුටුවිරීමි. තමාගේ නියපඳුරු හෙළා ලය පළා පියන්නාත් දුටුවිරීමි. දෙපය අල්ලා ගෙණැ මුහුදින් එපිට හෙළා පියන්නාත් දුටු විරීමි. එසේ දමාලූ කලැ සමහර කෙනෙක් පරසක්වළත් සුදුසු නො වෙයි. ස්වාමීන් අතික් තැනකට වඩනාබව සුදුසු යැ"යි කී යැ.

ඒ අසා සද්ධර්මචක්‍රවර්ත්ති වූ බුදුරජානන්වහන්සේ "ගද්‍රභය, ඒ ආලවකයාගේ ස්වරූප තට වඩා මම දන්මි. පවන් හැමූකලැ මකුළුහු බිඳෙයි. පලුපත් සැලෙයි. ඒ පවනට මෙරගල් කැඩී යන්නේ නො වෙයි. සැලී යන්නේ නො වෙයි. ගෝකුරයෙහි දියත්ත වියලාපියන හිර මහමුහුද දිය වියලා පියා නො හෙයි. තමහට මොළොක් පිළිවන් තපස්වීන්ට සූරු වන ආලවකයාගේ සූරුකම් මා මැදෙහි නැති වැ යන බව නො දන්හි ද? පබළු කන පණුවන් විදුරුගල් කැ නො හෙන බව නො දන්හි ද? ප්‍රයෝජනයක් නැත් නම් කෙසගක් තැන් නො යන පයින් තිස් යොදුන් මහ ගෙවා මේ විමානයට එන්නෙම් කිසිවක් නො තකා එන්නෙම් නො වෙමි. පොල්පක ඉතාදැඩි වුවත් සිහිල් වූ සඳ පහනට පැළී යන්නා සේ තාගේ ආලවකයා කෙසේ දැඩි වුවත් මාගේ ලෙහි සිහිල් වූ මෛත්‍රීරසය හෙතු කොට ගෙණැ ඔහුගේ දැඩි වූ මානය පැළී යනබව තෝ නො දන්හි ද? ඒ ආලවකයා බසක් අසන්නා කැමැති එකෙක් වී නම්, රුවක් බලන ඇසක් ඇති එකෙක් වී නම්, කීවක් සිතන සිතක් ඇති එකෙක් වී නම්, මා දමූ සත්‍වයන් අතුරෙහි ඌත් ගලවා ගන්නාබව නො දන්හි ද? ගද්‍රභය, මා ආයේ මේ විමානයට මැ යැ. අතික් තැනකට නො වෙයි. මා මී වසනපරිද්දෙන් අනුදනැ"යි වදළසේකැ.

ලොවුතුරාබුදුන්වහන්සේ එසේ වදරන්නා හා, වදළ බසක් තුන්වන-වට නො ගිවිස්සැ හොත්, යම් දෙවියකු බඹකු ගේ හිස සත් කඩක්

1. බිඳු.

Non-Commercial Distribution

වැ පැළී යන හෙයින්, බුදුන්වහන්සේ එසේ තුන්වන විට වදළ නො ගිවිසැ සිටැ පියන්නට නො පොහොසත් වැ "ස්වාමීනි, නුඹවහන්සේ මෙහි වැඩහුන් බව ගොසින් ආලවකයාට කියම් දෝ හෝ?"යි කී යැ. ඒ අසා තිලොගුරු සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ "ගද්‍රභය, තා කැමැතිපරිද්දෙන් ගොස් කිය. ඔහු දක්නා පිණිස වේ ද මා ආයේ යැ?" වදළසේකැ.

ඒ අසා ගද්‍රභතෙමේ විමානයෙහි දෙර නො හැර මැ හිමාලය වනයට ආලවකයා කරා ගියේ යැ. සර්‍වඥයන් වහන්සේ ඒ විමානයෙහි එලිපතට ශ්‍රීපාදය දික් කළසේකැ. සාරාසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි තමන්ගේ ගෙයි දෙර යාචකයන්ට නො පියා තැබූහෙයින් ඒ සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීපාදය එලිපතට නඟන්නා හා ඒ විමානයෙහි දෙර තෙමේ මැ හැරී ගියේ යැ. කන්ථක නම් අසු නැඟී ගෙණැ, බලසම්පන්න පිරිමින් දහසක් හැරලන්නට පියාලන්නට සුදුසු වූ දෙර ආසන්න වූ සඳ දෙවතා වන් හැරපි[1] කල්හි, ඒ දෙරින් නික්මැ ගෙණැ බුදු වන්නට ගියා සේ. ඒ විමානයෙහි හැරුණු දෙරින් ඇතුළට වන්සේකැ. බුදු වන්නට නික්මුනන්ට ඒ දෙර හැරෙණ කලැ, බුදු වැ සිටැ නික්මුනු කලැ දෙර හැරෙණු කවර විස්මයෙක් ද? එසේ හැරුණු දෙරින් ඇතුළට වැද ඒ ආලවකයා හිඳ ශ්‍රී අනුභව කරණ දිව්‍යරුවන්මය ආසනයෙහි රන්පියුම්කෙමියක් මත්තෙහි හිඳ ගත් කෙශරසිංහරාජයක්හු සේ උදයගිරිපර්‍වතය මුදුනෙහි සිටැ ගත් ලහිරුමඩල සේ බුද්ධවිලාසයෙන් වැඩැහුන් සේකැ.

එවේලෙහි ශ්‍රීශරීරයෙන් නැංගාවූ රන්වන්පැහැ ඒ විමානය ඇතුළෙහි විදුලිය දහස්සුවහස් පහරණා සේ හිරුදහස් සුවහස් නැංගා සේ දිලියෙන්නට වන. ඒ පැහැ අතුරෙන් ඒ ශ්‍රීශරීරයෙහි සුදුතැනින් නික්මුනු සුදුපැහැ සඳ දහස් සුවහස් නැංගා සේ බමන්නට වන. නිල්තැනින් නික්මුනු නිල්පැහැ නිල්මහනෙල් මල්දම් දහස් සුවහස් ගොතා දමන්නා සේ අතුරෙහි දිවන්නට වන. රත්තැනින් නික්මුනු රත්පැහැ බඳුවදමල්කැන් දහස් සුවහස් නඟා තබන්නා සේ අතුරෙහි කෙළනට වන. සමහර තැනින් නික්මුනු මුසුපැහැ දෙව්දුනු දහස්සුවහස් සේ සිසැරෙන්නට වන.

මෙසේ සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීශරීරයෙන් නික්මුනු සවණක් ඝන බුදුරස් දක්මින් ආලවකයාගේ අඹුවෝ මහවිස්මයට පැමිණ දිවෙමින්

1. දොර හැරපි.

Non-Commercial Distribution

ඒ සර්‍වඥයන්වහන්සේ වැඳ පිරිවරා හුන්හැ. බුදුරජානන්වහන්සේ ඒ ස්ත්‍රීන්ට මධුර කොට බණ වදළසේකැ. ඒ ස්ත්‍රීහු නුදුටුවිරූ විස්මය වූ බුදුරුව දක. නො ඇසූවිරූ මිහිරි සද්ධර්‍මය අසා, මුදුනෙහි බඳඇඳිලි හා[1] කියන බසැ සාධුකාර හා සිතු සිතු සිතැ[2] විස්මය හා මඳකුදු තොරර නො කොට දහම් නැමැති අමාමී බී මත් වන්නට වන්හැ. ගද්‍රභ නම් යක්‍ෂයා හිමාලයට ගොස් ආලවකයා දකැ දෙව්පිරිස් මැද හුන්නහු ලඟට ගොස් කට අතින් වසා ගෙණැ "මා නො කීවයි මට උදහස් නො වුව මැනැවැ. නුඹවහන්සේගේ විමානයෙහි අද සර්‍වඥයන්වහන්සේ වැඩැහුන් සේකැ"යි කී යැ. ඒ අසා ආලවකතෙම සිහිල් වූ පවනින් දඩි වැ දිලිහී ගිය ගින්නක් සේ ඊනියා මිහිරි බස් අසමින් කොපාග්නියෙන් දිලිහී පියා සිටැ පිටිතොල් කමින් බැම බඳිමින් ඇස් දල්වමින් එබස් කී ගද්‍රභයා කොපාග්නීන් දවා හස්ම කොට පියන්නාක්හු සේ රැහැණි වැ බලමින් "ගද්‍රභය, බොහෝ දෙවතාවන් හුන්තෙනැ 'තපස්විකෙනෙක් මාගේ විමානයෙහි හුන්හ'යි මහත් කොට කියා මට සරූප හානි[3] නො කර. මට පරිභව නො කර. සිංහයන් වසන ලෙනැ ඇත්තු නො හිදිති. නයින් වසන විමානයෙහි මැඩියෝ නො හිදිති. මාගේ විමානයට වදනා තපස්විකෙනෙක් නැත. තෝ උන්මත්ත වැ පියා දෙඩයි ද? 'මේ ආලවකයාගේ විමානය යැ'යි තෝ ඌහට නො කීයෙහි ද? මාගේ නම අසඅසා වදනා තැන් නො දන්නා මහණෙක් ඇත් නම්, මම මැ ගොස් මා වූ නියා ඌට පෑ ලමී"යි කියා, "මාගේ ගෙටවන් තපස්වීන් පෙර දෙපය අල්වා ගෙණැ පරසක්වළත් ගැසූ විරීමි. සමහර තපස්වී කෙනකුන් සිත් වියවුල් කොට වියරු හෙළවා පියා උන් නටවා උන්ගේ[4] නැටුමුත් බැලී විරීමි. නියපඳුරු[5] හෙළා ලය පළාපු සමහර තපස්වීන්ගේ ගණන් නැත. අද ගිය කලැ වන්නා කියැටියක් කියමී"යි කියා "ගද්‍රභය, 'ඌ මගේ විමානයෙහි හුන්හ'යි මහත් කොට කියා මට පරිබව නො කර"[6]යි කී යැ.

එසමයෙහි[7] සාතාගිරි හෙමවත යන යක්‍ෂසෙනාධිපතිවරුන් දෙදෙන 'ජේතවනවිහාරයෙහි වැඩැහුන් බුදුරජානන්වහන්සේ වැඳගෙණැ යක්‍ෂසමාගමයට යම්හ'යි කියා යන්නෝ ආලවකයා ගේ විමානය මත්තෙහි අහස[8] යෙමින් සිටියාහු ය. සීනයෙන් ඇතුන් දුටුවන් පය නො නැහෙන්නා[9] සේ ඒ විමානය මත්තේ අහස යන්නා වූ

---

1. ඇඳිලි ඇතිව 2. නුදුටුවිරූ. 3. ස්වරූප ආනි 4. උනනට
5. නියපසුරු. 6. කියව 7. ඒ යක්‍ෂසමාගමයට
8. ආකාශයෙන් 9. පය ඇද ගෙණ යා නොහෙන්නා

Non-Commercial Distribution

යක්‍ෂසේනාධිපතිවරුන් දෙදෙනාගේ රථය යන්නට නො පොහොසත් වී යැ. එහි වැඩැහුන් සර්‍වඥයන්වහන්සේගේ මුදුනෙන් මත්තෙහි අහසැ ඒ රථය නො යා හී පැකිලැ සිටියේ යැ. බුදු වන්නට වැඩැ හුන් ගස මුදුනෙහි අහස පවා භවාග්‍රයෙහි පහරවා දෙවතාවන්ගේ විමානයෙක් නො වෙයි. ඒ මත්තේ අහසින් දෙවියන් බඹුන් ගේ හසරෙක් නො වෙයි. සක්විත්තන් නැඟී යන ඇත්තු පවා අකුසුපහරින් මියතුත් ඒ බොධිය හටගන්නා තැනැ බිම ඉද්දෙහි අහසින් නො යා හී පය නහා නො ගෙණැ සිටැ මියෙති. බුදු වන්නවුන් පිට දී හිඳිනා ගස හටගන්නා තැනින් මත්තෙහි මෙසේ අනුන්ගේ හසරක් නැති කලැ බුදු වැ වැඩැ හුන් ස්වාමිදරුවානන් මුදුන ඉද්දෙන් මේ යක්‍ෂසේනාධිපතිවරුන් දෙදෙනා නො යා හුනු සේ කවර විස්මයෙක් ද? එහෙයින් ඔහු නො යා හී? "මේ කිමෙක් ද්‍රේ හො"යි පරීක්‍ෂා කොට බුදුරජානන් වහන්සේ දුටහැ. සොයා යන බෙහෙද පෙරමගැ දුටුවා සේ, තමන් දක්නට යන බුදුරජානන්වහන්සේ වැඳ පැදකුණු කොට බණ අසා සමු ගෙණැ යක්‍ෂසමාගමයට ගියහැ. ආලවක තෙමේ ඒ යක්‍ෂ සේනාධිපතිවරුන් දෙදෙනා දකැ අවකාශ දීලා හුන්නේ යැ. ඒ යක්‍ෂසේනාධිපතිවරු දෙදෙන ආලවකයාට "ආලවකය, තට වූයේ මහාලාභයෙකැ. ලොවුතුරා සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ තාගේ විමානයෙහි වැඩැ හුන්සේක. විමන් ලද්දන් කෙරෙන් තා සේ විමන් ලද්දෝ නැත. බුදුන්වහන්සේ එහි වැඩහුන්සේකැ. ඇපිත් අද ඇතුළෙන් තාගේ ගෙය හැඳිනැ ආම්හ. තාගේ විමානය මත්තේ අහසැ අප වැත්නන් නැඟී යන යාන පවා පැකිලැ නො යා හී සිටි හෙයින් තාගේ විමානය මත්තෙහි නො යා හුනුම්හැ. තාගේ විමන නොයෙක් ලෙසින් මැ ආදර කටයුතු වි යැ. එසේ වූ පෙළහරැ. එ මහත් උතුමානන්වහන්සේ තාගේ ගෙයි වැඩැහුන්නන් විඳ විඳ නො බලා මේ දෙවසමාගමයෙහි කිම් ද තා ලබන්නේ යැ? දෙඩන්නන් කට බලබලා හිඳී ද? ආලවකය, ස්වාමිදරුවන් තමාගේ ගෙට වන් කලැ ගැත්තන් කළ මනා ද නම් ගොස් උපස්ථාන කරණ බව වේ ද? එසේ බැවින් වහා ගොස් භගවත් වූ ස්වාමිදරුවානන්ට පූජා කර"යි කීහැ.

ඒ යක්‍ෂසේනාධිපතිවරුන් දෙදෙනාගේ බස් අසා, ආලවක තෙමේ ඇවිළෙන ගින්නට පිදුරු දමාලූ කලක් සේ, දියුණුවැ දිලිහීගිය කෝප ඇති වැ "තොප කියන භගවත්හු නම් කවුරු ද? මම භගවත් නම් කෙනකුන් නො හඳුනෙමි. මාගේ ගෙට නො බා වදනෝ කවුරු ද? කෙසේ වූ කෙනෙක් ද?'යි කී යැ. ඌ එසේ කියන්නා හට ඒ සාතාගිර හෙමවත නම් දෙදෙන "ආලවකය, සියලු ලොකයෙහි දත යුත්ත අතැඹුල සේ දත්තා වූ දෙවාති දෙව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ

Non-Commercial Distribution

තුන්ලොවට එකගුරු වූ ලොවුතුරාසම්මාසම්බුදුරජානන්වහන්සේ නො හඳුනෙහි ද? ඒ ස්වාමිදරුවානන්වහන්සේ තුසිතපුරයෙන් සැව, මත්තෙහි දිව්‍ය ලොකයට යන්නා, මිනිස්ලොවට වැඩැ බුදු වන පිණිස, දසදහසක් සක්වළැ දෙව්බඹුන් "කාලො'යං තෙ මහාවීර" යනාදීන් එක පැහැරැ හඬ ගහාලූ ගාථාපදය නො ඇසෙන පරිද්දෙන් තාගේ කණ බිහිරි වැ ගියේ ද? ආලවකය; නැවතැ උන්වහන්සේ මවු කුසැ පිළිසිඳ ගත් දවස් උන්වහන්සේගේ ගුණයෙන් මහ පොළොව එකහෙලා මැ සැලී ගිය කලැ[1] තාගේ විමානයෙහි බිම සැලී නො ගියේ ද? කෙළනා කුමාරයකු අත්ලෙහි නටන බමරයක් සේ ඉතා ලඝු වැ මහමෙර සැලී ගියා නො පෙණෙන පරිද්දෙන් තා ඇස කණ වැ ගියේ ද? නැවැතැ ඉපැදලා සත්පියවරක් ගොස් සියලු දිග් විමසන වේලෙහි දෙව්බඹුන් 'මේ දිසාවෙහි තොප හා සමකෙනෙක් නැතැ'යි වැඩියත් නැති නියාව හඟවන දවස් තා බලවත් නියා කියා නො සිටියෙහි ද? නැවත උපන් මඟුලෙහි ශ්‍රීශරීරයෙන් දිවැ ගත් රැසින් ලෝ ඇඳිරිමහනරකයෙහි පවා ඇතුළැ විදුලිය දහස්සුවහස් කෙළනා සේ එකාලොක වැ ගියැ කලැ තාගේ විමානය ඇතුළතට නො වන්නේ ද? ඝොර වූ භයානක වූ යක්‍ෂයන් රාක්‍ෂසයන් ගේ මුහුණු හිරු රැ සින් පිපී ගිය පියුම් සේ මනහර වැ ගිය කලැ තා මුහුණ මදකුත් සොම්නස් ඇති නො වී ද? මතැතක්හු සැලූ සල්අත්තකින් බොහෝ වැ වැගිරැ ගිය මල්කැළයක් සේ දසදහසක් සක්වළ එකහෙලා වස්නා පරසතුමඳරාමල් තාගේ විමන් දෙරැ නො වගුළේ ද? තාගෙත් අපගෙත් සාමිදරු වූ සක්දෙව්රජානන් අතින් ගෙණැ දෙව්ලෝ පුරා පිඹිනා විජයුත්තර නම් එක්සියවිසිරියන් සක තා නො අසන්නට එදවස් තෝ නිදපී ද? තට මෙසේ අප්‍රිය වූ බුදුගුණ වඳුම්හ. පුදම්හ. මෙනෙහි කරම්හ ආලවකය, සිංහවික්‍රම කෙරෙමි යි ඇතු හිසට පනන්නට කැණහිල්හඬ නො හඩා වැද හිඳු. විදුරුගලැ හිස අන්නේ වී නම් හිස මැ පැළෙයි. හිස මැ රෙදෙයි, විදුරුගල තුබූ සේ මැ තිබේ. එසේම අප බුදුරජානන්වහන්සේට රැහැණි වැ ගත් කෙනෙක් ඇත් නම්, තුමූ මැ සිඳී බිඳී බිමැ ගැසී යෙති. හිරු හමුයෙහි කද්‍යෝපැණියන් වැනි වෙති. ගුරුළුරජුන් හමුවෙහි වටුවන් සේ වෙති. කෙශරසිංහයන් හමුයෙහි මහලුකැණහිලුන් සේ වෙති. මහමෙරහමුයෙහි සිදුහත් සේ වෙති. මහපොළොව හමුයෙහි ගැඩවුල්තුඩ පස් සේ වෙති කප්රුක් හමුයෙහි වරාගස් සේ වෙති. මහමුහුද හමුයෙහි ගෝකුරෙහි දිය සේ වෙති. සක්විත්තන් හමුයෙහි චණ්ඩාලයන් සේ වෙති.

---

1. දවස්

Non-Commercial Distribution

චින්තාමණිහමුවෙහි කිරිවහණ[1] සේ වෙති. තා සේ වූවන් විසින් උන්වහන්සේට කැරෙණු නැත, නො තන්හි මෙසේ නො හඬ"යි කී හැ.

ඒ අසා ආලවක තෙමේ කිපී පියා නැඟී සිටැ "මදවිගසකින් තොපගේ බුදුන්ගේ සුරුකම් බලව"යි කියා මහරග්ගලකට පැන නැඟී දකුණු පයින් සැටයොදුන් කෙලෙස්ගල්කුළු පැහැරපියා බුදුන්ගේ යසස්[2] බිජුවට වපුරන්නකු සේ සියලු හිමාලයයෙහි ගඟුල් හැලි සියදහස් ඉසිමින් "මම යැ ආලවකයා'යි හඬ ගැසී යැ. ඒ හඬ දසදහසක් යොදුන් පමණ දඹදිව්හි පතළේ ය එක ලෙස මැ සියලු දඹදිවැ පතළ හඬ සතරෙක් ඇති. ඒ කවර හඬ සතරෙක් ද? යත්:- විධුර පණ්ඩිතයන් වහන්සේ ගන්නා පිණිස පූර්ණභද්‍ර නම් යක්‍ෂයා කුරුරට බැස ධනඤ්ජය නම් රජහු හා දූ කෙළැ දිනූ ක්‍ෂණයෙහි අත පොළා පියා "මම දිනිමි'යි ගහාලූ හඬ යැ; කසුබුසම්මාසම්බුදුන් වහන්සේගේ ශාසනය පසුබස්නා කල්හි ශක්‍රතෙමේ වැදිවෙසක් මවාගෙණැ විශ්වකර්මයා බලුවෙසක් ගන්වා "පවිටු වූ සත්‍වකෙනෙකුන් හැම මැ මේ බල්ලා ලවා කවමි'යි ගසාලූ හඬ යැ; කුසජාතකයෙහි, තමන්ට නිඳ කොට හැරැ පියා ගිය ප්‍රභාවතීන්ද[3] පසුපස්සෙහි තමන්ගේ රට හැරැපියා ගොස්, ක්‍රමයෙන් අනෙක දුක් ගෙණැ, තමනුත් ප්‍රභාවතීනුත් හුන් නුවර රජදරුවන් සත් දෙනකු තමන් තමන්ගේ මහසෙනඟ හා සමඟ අවුත් සිසාරා ගත් කල්හි, අනික් සරණක් නො දක, ප්‍රභාවතීනුත් ප්‍රභාවතීන්ගේ මවුපියනුත්, මුළුතැන්ගෙට ගොස් වැද ගෙනැ හොත්කල්හි "යහපත, යම්හ. ඒ සතුරන් පරදවම්හ"යි සැදූ ඇතුපිටට පැනැ නැඟී ප්‍රභාවතීනුත් තමන්ගේ වික්‍රම දක්නා සඳහා තමන් නැඟි ඇතු පිටට නංවා, නුවරින් නික්මැ සතුරුසෙනඟ මැදට වැද "මම යැ සිංහස්වර කුසරජ'යි හඬ ගසාලූ හඬ යැ; අද මේ "මම යැ ආලවකයා'යි හඬ ගැ, හඬ යැ, යන මේ සතරහඬ දසදහසක් යොදුන් දඹදිවැ දෙරැ දෙරැ හෙන සෙනදහස් සුවහස් සේ පැතිරැ ගියේ යැ.

ඒ වේලෙහි ඒ හඬ අසා අපගේ සර්වඥ වූ බුදුරජානන් වහන්සේ බණ කියන පණ්ඩිත කෙනෙකුන් ධර්මාසනයෙහි හුන් කල්හි "බොහෝදෙන බණ අසන්නට එව'යි හඬ ගහාලූ හඬක් සේ අසා සතුටු වූ සේකැ. විධුරපණ්ඩිත වැ, සැටයොදුන් කාලපර්වතයට නහා ගෙණැ පූර්ණභද්‍ර නම් යක්‍ෂයා තමාගේ භයඞ්කර වූ ස්වභාවවෙශය පෑ ගැසුනු ඒ සා හඬෙහි පවා තැති ගැන්මක් නො හෙනබව කවර විස්මයෙක් ද? ඒ ආලවකතෙමේ ඒ හඬ ගසා, "මෙවිටැ මේ මහණු පුලුන්පෙදක් සේ

1. තිරිවාහණ. 2. රජ්යසස්. 3. ප්‍රභාවතීන් වහන්සේ.

Non-Commercial Distribution

පරසක්වළැ ගසාපියමි'යි මහාවාතයක් මැවී යැ. ඒ වාතය හැමූ කලැ ලොකයෙහි ගලෙකින් ඊ ඊ නො ගැසුනු ගලෙක් නැත. දෙයොදුන් තුන්යොදුන් පමණ මහගල්කුළු කැඩී පැළී දෙකඩ වැ හෙන්නට වනැ අහසට නැඟී ඊ ඊ ගැසී දුම්කඳ නැඟෙන ගල්කුළු ගණන් නැත. මහවලැ ගස් මුලින් ඉදිරී ගොස් අහස නොනටු ගසෙක් නැත. නොඑක් ඇත්හල්හි පල තාක් කන්කුළු[1] පිටින් මැ අහසට නැඟී බමමින් සිටියේ යැ. නොඑක් ගැල්සක් තාක් පරඬලා සේ අහසට නැඟී සිසැරෙන්නට වනැ. පොළොවින් නැඟි දූලි අහස්හි මහපොළොව බඳනා[2] සේ ගැසී ගැවසී නැඟෙන්නට වනැ. සර්‍වඥයන්වහන්සේ වැන්නත් පරසක්වළැ ගසා පියමියි මැවූ පවනැ මහත කවරෙක් නම් කියා නිමවා ද? ඒ මහාවාතය එසේ භයානක වැ හමන්නට වන, සර්‍වඥයන්වහන්සේ "මේ වාතයෙන් පණුවකු පමණ සතකුටත් උපද්‍රවයෙක් නො වේව"යි අධිෂ්ඨාන කොට වදළ සෙයෙකැ. එසේ හෙයින් පණුවකුටත් උපද්‍රවයෙක් නො වී යැ. අනුන්ට මෙසේ උපද්‍රව නැති කරණ ඒ බුදුරජානන්ට උපද්‍රව නොවනබව කවර විස්මයෙක් ද? ඒ වාතය එසේ හැමූ සමයෙහි මඳපවනට මහමෙර නො සෙල්වෙන්නා සේ ඒ සර්‍වඥයන්වහන්සේ ගේ ශ්‍රීශරීරයෙහි ලොමකූපමාත්‍රයකුදු නො සෙල්විනැ.

ආලවකයා නැවැතැ "මේ මහණු වතුරෙන් යවාපියමි'යි මහවැස්සක් වැස්වී. අහස්හි සියදහස් වලාකුළු නභාගෙණැ වැසි නැඟී යැ. ඒ වැස්සෙහි මහාධාරා වූ නියා වට[3] තල්කඳ පමණැ ධාරා පමණ පොද වි යැ. ඒ වැස්සෙහි මහාධාරායෙහි මහත කවරෙක් නම් කියා නිමවා ද? ඒ වැසිඅතුරෙහි මහත් දගබ් සා බුබුලු වී යැ. සැටයොදුන් කෙලෙස්[4] කුළු සා පෙනපිඩු වි යැ. නික්මුනු වතුර යොදුන් ගණන් පමණ මහගල්කුළු නො පැකිලැ උදුරාගෙණැ යෙයි. අහසැ නොයෙක් තැනැ බොකු හී පියා තිබෙන දෙව්දුනු දහස්ගණනැ. නොයෙක් දිසාවෙහි පහරණ විදුලිය ද සියදහස්ගණනැ. ඒ වැසිපවනින් ඉදිරී නැඟි ගල්කුළු දහස්ගණන් අහසැ වැසිකුළු දියුණු කෙරෙමින් බමමින් සිටියේ. මෙ සේ දිවන මහවතුරු පොකුරුවැස්සක් සේ පෙරෙවැ වැඩැහුන් සිවුරෙහි හූඅගකුදු තෙමා ගත නො හින.

නැවැතැ අඟුරුවැස්සක් වැස්වී යැ. මහත් වූ රග්ගල් ඒ අඟුරු වැස්සෙහි පුපුරු සා ඇතැයි යන පරිද්දෙන් මහත් අඟුරු වැසැ බුදුන් කරා බස්සි. මාරයා මැවූ මහගින්නට පොවා ශ්‍රීපාදය දික් කළ විගස මැ ඒ ශ්‍රීපාදය පිළිගෙණැ මහපියුමෙක් නැංගැ. වටු වැ උපන්කලැ

1. නන්කළ.　2. වදනා　3. නියා　4. ගල්

Non-Commercial Distribution

පොවා ගාථාපදයෙක අනුසසින් මහත් වූ ලැවු ගිනි පවා පසුබස්සි. එතැනට කප්හිමින් ගින්නෙක් නො වද්දි. බොධිසත්‍වකලැ පවා උන්ට ගිනි ගිනි නො වෙයි. බුදු වූ කල්හි ගින්නෙන් උපද්‍රවයක් නො වන බව කවර විස්මයයෙක් ද? සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රාවකයෝ පවා නරකයට වැද ගිනි නිවාපියා ඇසිල්ලක් සත්ත්‍වයන් සතපා හිඳ සත්ත්‍වයන් කළ කම් විචාරා එති: උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට පවා නරකයෙහි ගිනි නිවී යන කලැ බුදුන්වහන්සේට මේ ගිනි නිවී යනබව කවර විස්මයයෙක් ද? ඒ මහඅඟුරවැස්ස ශ්‍රීපාදයෙහි පූජාවට දමාලූ[1] මල් කැළයක් සේ සෞම්‍ය වැ මල් වස්නට වන්කල්හි නැවැතැ පාෂාණ වැස්සක් වැස්වී යැ. ගලින් ගල් වැද ගන්නා හඬින් අහස් පොළෝ සිදුරු බිහිරි ව ගියේ යැ. ගල් ගැටුනු තැනින් හෙන ගින්නෙන් මුළුලොව පුළුටු ගත් ගිනිකඳක් සේ එකහෙලා කළු වැ ගෙණැ පැතිරැ ගියේ ය. බුදුන් වැඩහුන් තෙනට ඒ පහණවැසි වට. ඒ පහණවැස්ස ශ්‍රීපාදයෙහි පූජා පිණිස දමාලූ මල්වටක් සේ හෙත් හෙත් නැවැතැ ආයුධවැස්සක් වැස්වී යැ. එකමුවහත් දෙමුවහත් බොහෝ මුවහත් ඇති නොයෙක් ආයුධ අහසින් වැගිරැ බුදුන් ශ්‍රීපාදයෙහි නවහම්මල් පූජාවක් වැ වගුළේ. ආලවක තෙම එයිනු දු උපද්‍රවයක් කොට ගත නො හී නැවැතැ හළුවැස්සක් වැස්වී. හෙ ද සඳුන්සුණු සේ වි යැ. නැවැතැ වැලි වැස්සක් වැස්වී. හෙ ද වත්සුණු පූජාවක් සේ වී යැ. නැවැතැ කලල්වැස්සක් වැස්වී. හෙ ද හමුසරහවැසි සේ වී. මෙ සේ තමා වැස්වූ වැසි ඒ බුදුන්ගේ ශ්‍රීපාදයෙහි නොයෙක් පූජාවස්තු වැ පලන්නට වන් කල්හි, නැවැතැ චතුරඞ්ගසමන්විත වූ ඝන අඳුරක් මැවී. ඒ අඳුරු හිරුවිමන් අතුරෙහි සිටි අඳුරක් සේ වැඩැහුන් විමානය ඇතුළෙහි අඳුරක් කට නුහුනුයේ.

මෙසේ උපද්‍රව නවයක් කොට බුදුන්ගේ රෝමකූපමාත්‍රයකටත් උපද්‍රව කට නුහුනුයේ තමාගේ මහසෙනඟ හැරැගෙණැ තෙමේ මැ නික්මින. ඔහුගේ පරිවාරයෙහි භූතයන්ගෙන්[2] ඇස් දල්වා ගෙණැ දළ දල්වා ගෙණැ මහහඬින් හඬා ගෙණැ දිවන භූතයන්ගේ ගණන් නැත. කිසිල්ලෙහි පොලු අවුළුවා ගෙණැ රඟ පූ බබුරුනැටුම් නටමින් නොයෙක් විකාර පෑ ගෙණැ දිවන භූතයන්ගේ ගණන් නැත. මෙසේ නොයෙක් භයංකර වූ විසුළු වෙස් දක්වන්නා වූ නොයෙක් භූතයන් කෙරෙන් සිතියම් කඩෙකැ ඇඳි නොයෙක් විකාරරූප සේ ශ්‍රීපාදඇළයට වැද නිශ්චල වැ ගිය භූතයෝ සියදහස් ගණන. නයින් දැකැ කර බා ගෙණැ හුන් වඳුරුපැටවුන් සේ ඒ තෙජස දැකැ ඉවසා ගත නො හී කර නමා ගෙණැ නැති ගෙණැ සිටිනා භූතයෝ දහස් සුවහසැ. උඩුගඟට යන්ට සිතා සැඩවතුරෙන් යට බලා යනු වන් සේ බුදුන්ගේ ශ්‍රීපාදඇළයට වැද

1. මවාලූ. 2. භූතයොත්.

Non-Commercial Distribution

පියැ නො හී හැලිහැලී පසුබස්නා සමහර භූතයෝ කෙළදහස්සුවහසැ. මෙසේ නොයෙක් විකාරවෙස් ගෙණ නොයෙක් විසුළුවෙස් ගෙණැ නොයෙක් බිහිසුණු බස් බණනා ඒ භූතයන් කරණ නොයෙක් විකාරයෙන් රෑ දවස් මඳ වැ ගියේ. මෙසේ ආලවකයා නොයෙක් භූතසෙනඟ හැරැ ගෙණැ ආවවුට හුදකළා වැ වැඩැ හිඳ, ඌ නවවැස්සක් වස්වන කලැ තමන්වහන්සේ එක මෛත්‍රීවැස්ස මැ වස්වවස්වා, ආලවකයා කොපයෙන් දිලිහුනු සේ කරුණාවෙන් ඔහු ලය තෙත් කොට කොට සර්‍වඥයන්වහන්සේ වැඩහුන් සේකැ. එතෙකුදු වුවත් ඔබගේ ඌ කෙරෙහි දුර්‍වලකමෙක් වත් ඌ කෙරෙහි බලවත්කමෙක් වත් නැත්තේ මැ යැ,

ඒ භයඞ්කර වූ පිරිස් මැද ආලවකයා කොපයෙන් දිවන කල්හි තමන්වහන්සේ පිටට යොමු නො වැ බඩට නො නැමී දෙඇළයෙන් එක් ඇළයකට නො නැමී ඉඳුරා වැඩහුන් සේකැ. ඉඳුරා[1] නිශ්චල කොට මරා හෙළා ලූ ඇස්සහළෙකැ. සියලු ලොව මිල කරත් හොත් තෙමේ මැ වැඩියෙකැ. රන්වන් පළල් දෙබැමසහල මද[2] පෙණෙන ඌර්‍ණාරොමධාතුවෙක. ඒ රන්වන්පියුමෙකැ. බමරවැළ දෙකක් මැද හුන් රාජහංසයකු හා උපමා කරත් හොත් මා හා සුදුසු උපමා නොදන්නෝ නැත. උතුරු සයුරු මත්තෙන් නැහෙන්නට පටන් ගත් පිරුණු සඳමඬල උපමා කෙරෙම් නම්, ඒ බැමසහල වැනි දෙයෙක් එහි නැත. ඒ නිමිල වූ ඌර්‍ණාරොම ධාතුවට කවර උපමාවෙක් ඇද්ද? රග්ගල්අතලෙකැ තිල් වූ තමලුලියසහළක් මැද හටගත් සුදුලවලීලියක්[3] කියත් හොත්, මෙ මැ උපමා නො වෙයි. මුළාවන් කෙරෙහි අග්‍ර නියා යැ! 'එක් සබාබසක් කීවන් දෙතුඩු ලැබෙතී' කියා යැ? සසරපමණින් බොරුවක් තුඩැ නො පැහැරැ සබා මැ කී පිණින් සකසා ලත් ඒ මනහරතුඩ කාගේ බසින් සැරහී නිමා ද? සියලු තුන්ලොව මිල කළ බවට, තුන්පිටකය නිඃශෙෂයෙන් දත්බවට, ඇදි සලකුණු හිරි තුණක් වැනි වූ හිරි තුණෙකින් හොබනා සම වැ වට වූ කර අප සේ වුවන්ගේ බසට බිම් නො වෙයි. සියලු ලොකයට අභය අත් කරැ දෙන පිණිස සැරසී සිටි දෑතෙක. ඒ දෙඅත කවරෙක් නම් කියා නිමවන්නේ ද? පබළුමුහුදැ මහරළ සිසාළ රන්ගලක් සේ ඉතා රත් වූ සිවුරෙන් වසනලද ඒ රන්වන් ශරීරය වර්‍ණනා කොටත් සිතිනුත් සිතන්නෙම් ද, උපමා නො දක්මි. වෙන වෙන මැ සියලුලොව සද ලත් හොත් පොහොසත් වූ අනන්ත වූ පාරමිතාසම්භාරයෝ අටළොස් රියන් පමණ ශ්‍රීශරීරය "මම යැ! මම යැ! යි කියා සද ලූහැ. එසේ වූ රූපකායය කවරෙක් නම් කියා නිමවා ද?

---

1. ඉඳිවුරා 2. තළල් මැද 3. සුදු වූ ලපලුලීයක්

Non-Commercial Distribution

ඒ භූතයන්ගේ විකාර සිත්තමැ ඇඳි විකාර බලන්නා සේ නිසල වැ[1] බල බලා සර්‍වඥයන්වහන්සේ වැඩහුන් කල්හි එතැනට කැටි වූ දෙවතාවෝ* අතින් අත් පැහැරැ සිනා සී "ආලවකය,[2] පවනින් බුදුන් සොල්වාපී සේ ඉතා යහපතැ! වතුරෙන් උපුල්වාපී සේත් ඉතා මැ යහපතැ! පහණින් ගසා භය ගන්වාපී නියාත් ඉතා යහපතැ! ආයුධවැස්සෙන් සිඳැ බිඳපු නියාත් ඉතා මැ යහපතැ! මඩවැස්සෙන් එරවාපු නියාත් ඉතා මැ යහපතැ! අඳුරුයෙන් මූළු කොටපී නියාත් යහපතැ! හළුවැස්සෙන් පහයින් ගන්වාපී නියාත් ඉතා මැ යහපතැ! වැලිවැස්සෙන් සහවාපු නියාත් ඉතා මැ යහපතැ! අඟුරුවැස්සෙන් ගිනි මඩවාපී නියාත් යහපතැ! ආලවකය, මේ වික්‍රම කොයින් උගත්හි ද? තා නො හැඳිනැ බුදුහු තාගේ ගෙහි හුන්නායි සිතී ද? අහා! වැළැකැ යා. අහා! වැළැකැ යා. අපගේ බුදුරජානන්වහන්සේ හැරැපිය! හැරැපිය! අපගේ පැරත්තයට බුදුන් අදට හැරැපිය!"යි මතැත්හට හුසි ගන් වන කුකුරුබිළිඳක්හු සේ (වෙහෙසෙන්නට වන්හ.) අනවරතයෙන් මෙසේ වෙහෙසන දෙවතාවන් අතුරෙහි අනික් යමක් කොට ගත නො හී ලජ්ජාවට පැමිණ තමාගේ වික්‍රමයෙහි නිමාවට තැකූ වෙලායුධය ගත.

ඒ ආයුධයෙහි බලවත්කම් කියත් හොත්: අහසට දැමුව දෙළොස් අවුරුද්දක් වැසි නැති වැ යෙයි. බිමට ගැසුව හොත් එතෙක් මැ කල් බිමැ තණගැටෙක් නැති වැ යෙයි. මුහුදට දැමුව හොත් සියලුමුහුද පැළී වළල් ගැසී වියළී යෙයි: මහමෙර ගැසුව හොත් කිලිල්කඩක් සේ කපා ගෙණ යෙයි, මෙසේ ආඥානුභාව සම්පන්න වූ වෙලායුධය හැරැගෙණැ ආලවකයා සිටියේ යැ. මෙ මැ සැටියේ ලොකයෙහි අනික් ආයුධ තුණෙක් ඇති. ඒ කවරේ ද? යත්:- ශක්‍රයාගේ වජ්‍රායුධ යැ, වෛශ්‍රවණයාගේ ගදයුධ යැ, මාරයාගේ පාරාවළල් යැ, මේ වෙලායුධ යැ හා සතර යැ. දසදහසක් සක්වළැ දෙවිබඹහු හැම කැටි වූහ. සියලු ආකාශය දෙවිබඹුන් විසින් මල් පිරූ විසිතුරු මල්කරඬුවක් සේ හැසී ගැවසී සපුන් වැ[3] සිටියේ යැ. ආලවකයා බුදුන් ආසන්නයෙහි අහසැ සිටැ ගෙණැ කීපවිටෙකැ මහාඝොෂයෙන් මහාධ්වනි කොට පියා බමා ගොස් සිසැරී ඒ ආයුධය දැමී ය. සෙන දහස් සුවහස් ගසා පීවා සේ භවාග්‍රයෙහි පහරවා සියලුලොව එක හෙළා කොලාහල කෙරෙමින් සියලු අහස දුම්කැළයෙන් ගැවසී ගන්වමින් බුරා බස්නා ගිනිසිළු දශදිශාවෙහි ඉස්මින් ආයුධය හඬාබැසැ බුදුන් ශ්‍රීපාදය පිස්නට තබාලූ බිසිකඩක් සේ හැකිලීලා බුදුපාමුල්හි හින.[4]

1. නිසරු 2. ආලවකයා. 3. සපුන් නැති වැ. 4. වැටී හින
* දෙවතාවන්

Non-Commercial Distribution

ඒ දක්මින් දෙවතාවන් දුන් සාධුකාර දසදහසක් සක් වළා එක හෙළා පැතිරෙන්නට වන ඒ දෙවසමාගමයෙහි මානය බිඳී ගොස් ලජ්ජාවෙන් කර නමා ගෙණැ මහපට ඇඟිල්ලෙන් බිම කැනැ කැනැ සිටියා වූ ආලවකයා ආසන්නයෙහි වැඩැ හුන්නා වූ සර්‍වඥයන්වහන්සේගේ බුද්ධවිලාසය මා තුඬින් කියා පවුත් හොත්, හිදිකටුසිදුරෙන් ආකාශගඞ්ගාව සුව සේ නැඟී යන[1] තියා යැ. මදුරුවකුගේ දළඅගෙහි[2] මහමුහුද සැරහුනු තියා යැ. ගැඩවිල්තුඬැ මහපොළොව සැරහුනු තියා යැ. එබඳු වූ බුද්ධවිලාසය ඇති ඒ සර්‍වඥයන් වහන්සේගේ වික්‍රමයට ඒ ලීලාවට ඒ ශාන්තදන්තවෙශයට කවර උපමාවක් කෙරෙම් ද? එහෙයින් දෙහොත් මුදුනේ තබා ගෙණැ සාධුකාර දෙමින් සියලු දෙව්බඹ දහස් සුවහස් "ස්වාමීනි, නුඹවහන්සේ දැකැ ඇස් නිවී ගියේ. නුඹවහන්සේගේ බුද්ධශ්‍රී නැමැති අමා වළඳ අපගේ ලය සැනහී ගිය තියාව බලා වදාළ මැනව. මේ ආලවකයා පිණිස මෙතෙක් බුදධවිලාස අපට පහළ වී. මේ ආලවකයා සේ අපට උපකාර කළෝ නැත. අපගේ සර්‍වඥයන් වහන්සේගේ බුද්ධානුභාව තවත් අපට වඩවඩා දක්නාපරිද්දෙන්, ආලවකය; තව ද තාගේ වික්‍රමයක් ඇත් නම් දක්වව. කුමකට තිකම් සිටීහි ද? වෙලෙහි වා! වෙලෙහි ව!"යි මෙ බස් මැ කියකියා සිටියහ.

පසු වැ ආලවකයා සිතන්නේ "මුන්ගේ මෛත්‍රීබලයෙන් කිසි උපද්‍රවයෙක් නො වෙයි. ඒ මෛත්‍රී බිඳපුව මැනැවැ"යි අවුත් ස්වාමිදරුවානන් ආසන්න වැ සිටැ "මහණ, නික්මැ යා"යි කී යැ. සර්‍වඥයන්වහන්සේ එබස් අසා "මෙවිටැ මොළොක් වැ මොහු දමා ගන්මි"යි සිතා වදරා නැඟී සිටැ, "බලවත්කම් පානා කල්හි දුර්‍වලයන් කෙරෙහි මැ බැහැවී සිටැ යනබව නුසුදුසුබව මුත්, තා කරණ වික්‍රමයෙහි නිමාවක් කොට පියා දන් සිටැ 'මහණ, නික්මැ යා'යි මොළොකින් කීබැවින්, තා කීවා මෙවිටැ කරම්හ"යි නික්මුනු සේකැ. ඒ අසා ආලවකතෙම "මේ මහණ කිපී ගියේ දෝ හො?යි, නො කිපී ගියේ දෝ හො?"යි කියා විමසන්නේ "මහණ, එ"යි කියා කී යැ. නැවැතැ සර්‍වඥයන්වහන්සේ ද ඒ අසා "ආලවකය, තා 'යා'යි කීහෙයින් ගියම්හැ. 'එ'යි කී කලැ එන්නමෝ වේදැ"යි කියා ගිව්සැ නැවැතැ අවුත් වැඩහුන් සේක. ආලවකයා තුන්විටෙකැ මෙසේ කෙළේ යැ. සර්‍වඥයන්වහන්සේ ද තුන්විටැ මැ ඌ කීවා කොට වදාළ සේක. ආලවකතෙමේ ස්වාමීන් කිකරිබව දැනැ "සියලු රෑ මෙ මැ ලෙස ඇව්දුවා ශ්‍රාන්ත කොට පියා පසු වැ දෙපය අල්වා ගෙණැ පරසක්වළැ ගසාපියමි"යි සිතා සතර

1. ආකාශ හැඟවූ　　2. ඇතුළෙහි

Non-Commercial Distribution

වන විටත් "යා මහණ,"යි කී යැ. බුදුහු ඔහු සිතැ ඇත්ත දැනැ "සියලුලොව සුව සේ දත්තා වූ මට තා සිතු දෙය ඉතා මැ හැහෙයි. එසේ බැවින් මම තුන් විටෙකැ තට කීකරු වීමි. මෙවිට පටන් නො යමි. තා කට හැකි දෙයෙක් ඇත් නම්, නැවතත් කර"යි වදරා වැඩැහුන් සේකැ.

මේ ආලවකයාගේ විමානයෙහි මොහුගේ මවුපියන් කසුප් සම්මාසම්බුදුන්වහන්සේ විචාරා[1] උත්තරය හා එක් කොට තුබූ පැන සතරෙක් ඇත. කල් යාමෙන් සලකුණු නැති වැ ගිය කලැ පැනමාත්‍රයෙක් රන්පතැ දැහිඟුලෙන් ලියා තිබෙයි. පෙරැ තමාගේ විමානයෙහි ශ්‍රී බලත පිණිස වන්, තපස්වීවරුන් බුදුන්ට මුත් අනික් කෙනෙකුන්ට විෂය නො වන, පැන විචාරයි. ඒ කියා ගත නුහුනු කලැ පරසක්වළට හෝ සාගරයට හෝ ගසාපියයි. එසේ තෙමේ සෙසු තපස්වීවරුන්ට කොට ආ පරිචයයට බුදුන්ටත් එසේ මැ කට හැකි යැ යි සිතා "තොප අතින් පැනයක් විචාරමි. ඒ මා විචාළ පැනය කිවු නම්, තොපට රක්‍ෂා ඇත. නැත් නම්, තොප පය අල්වා ගෙණැ පරසක්වළට ගසා පියමි"යි කී යැ

එබස් අසා සර්‍වඥයන්වහන්සේ වදරණසේක් "ආලවකය, ඉදිරියෙහි තබාලූ පහන්කැටපතෙකැ තමාගේ ඡායාව ඉඳුරා පෙණෙන්නා සේ ලොකයෙහි සියලු සත්‍වයන් මා ඇසින් බැලිය හෙමි. එහෙයින් මට උපද්‍රවයක් කට හෙන සත්‍වයකු අනන්ත පරිමාණසක්වළ එක ද තැනෙකැ නො දක්මි. අනික් කුමක් කියම් ද? මාගේ ආනුභාව මා පාමුලැ හුනු වෙලායුධයෙන් මැ දැනැ, මට කරණ උපද්‍රව තබා තා විචාරණ පැන විචාර"යි වදළ සේකැ. බොධිසත්‍වකලැ විධුරපණ්ඩිත වැ මනුෂ්‍යරාජයකු හා දෙවරාජයකු හා නාගරාජයකු හා ගරුඩරාජයකු හා එකවිට මැ විචාළ පැන ක්‍ෂණයෙහි විසඳ, නාගරාජයාගේ කණ්ඨමාණික්‍යයෙන් හා, ගරුඩරාජයාගේ රන්මාලාවෙන් හා, ශක්‍රදිව්‍යරාජයාගේ දිවසළුයෙන් හා, මනුෂ්‍යරාජයාගේ ගෙරිදහස් ආදීන් හා පූජා ලැබත් පැන විසැඳූහ. බොධිසත්‍වකලැ පොවා ඒ ස්වාමීන්ට මෙසේ පිළිවනැ. දෙවධර්‍මජාතකයෙහි තමන්වහන්සේගේ මලුන් හැරැ ගෙණැ දියෙහි ලා පියා ආ රාක්‍ෂසයා "මා කී පැනයක් කිව හොත් තාගේ මලුන් හැරැ පියමි" කී කලැ "දෙවධර්‍මය කිම් ද?"යි කී කල්හි දෙවධර්‍ම වූ නියා සිටිපියෙහි ම සිට කීකල්හි ඒ රාක්‍ෂසතෙම මලුන් දෙන්නා පූජා කොට දිනැ. නැවැත මහෞෂධ වැ ශ්‍රීමන්‍දප්‍රශ්න ආදි වූ පෙළහර වූ පැන විසඳ තමන්ගේ නුවණ සියලු ලෝවැස්සන්ට මුදුන්පත්

1. විචාළ.

Non-Commercial Distribution

කළ නියා කවුරු නො දනිත් ද? සම්භවකුමාර කාලයෙහි සියලු දඹදිවැ නුවණ ඇත්තන්ගේ මුදුනෙහි පතුල් ඔබා පැන විසඳූ නියාව කොතැනෙකැ ප්‍රසිද්ධ නො වේද? මෙසේ වූ පැනයක් කියති යනු මෙහිමියානන්ට උකුළුපොර යැ. එහෙයින් "ආලවකය, තට හැඟුනු යම් පැනයක් කිය. ඒ අපට බැරි නො වෙයි. සුව සේ මැ විසඳම්හ"යි වදාළසේකැ. එසේ වදාළකල්හි ආලවක තෙම "ධනයෙන් කවර ධනය උතුම් ද?'යි විචාළේ යැ. එසේ විචාළ යක්හට ස්වාමිදරුවානෝ අවීචියෙහි සිටැ භවාග්‍රය දක්වා, මුළුලොව තමන්වහන්සේගේ සර්වඥතාඥනයෙන් බලාපියා "ආලවකය, මුළුලොවැ ධනයෙන් තුණුරුවන්හි කරණ සැදැයට[1] වැඩි අනික් කිසි ධනයෙක් නැත. ආලවකය, රත්රන් අමුරන් ආදි වූ ධනය බොහෝ සුව එළවයි. සාපිපාසා දුක් දුරු කරන්නේ යැ. දිළිඳුකම නසන්නේ ය. මුතුමැණික් ආදී රුවන් ලැබීමට කාරණ වන්නේ යැ. ආලවකය, මේ තුණුරුවන්හි කරණ ලද සැදැහැ නැමැති ධනය දිවසැපත් නිවන්සැපත් දීමෙන් සුව එළවන්නේ යැ. ඉතිරි ධනයෙන් සාපිපාසාදුක් නිවෙන්නේ යැ. තුණුරුවන්හි කරණ ලද සැදැහැ නැමැති ධනයෙන් සක් වළගල් උස් කොට සත්රුවන් ඉපවූවත් නැති නොවන, ජාති, ජරා, ව්‍යාධි ආදි වූ දුක් නිවෙන්නේ යැ. ආලවකය, තව ද රත්රන් අමුරන් ආදි වූ ධනය දිළිඳුබව නසන්නේ යැ. තුණුරුවන්හි සැදැහැ නැමැති ධන 'ගුණ නැත්තාහ'යි යන දිළිඳුබව නසන්නේ යැ. ගුණ නැමැති රුවන් ලැබීමට කාරණ වන්නේ යැ.

"සද්ධො සීලෙන සම්පන්නො - යසොභොගසමප්පිතො,
යං යං පදෙසං භජති - තත්‍ථ තත්‍ථෙව පූජිතො"යි

මා ඇතුළු වූ[2] අනන්තසර්වඥයන්ගේ බස් හෙයින් තුණුරුවන්හි කරණ සැදැහැ නැමැති ධනය ඇති තැනැත්තහු තුන්ලෝ වැසියා අතින් නොලබන සම්භාවනායෙක් නැත. ආලවකය, මේ මා කීයේ එක්තරා ගුණයෙකැ. එහි වැඩි ගුණ මා අතින් අස. සෙසු රත්රන් අමුරන් ආදි වූ ධන ඉපැදවූ තැනැත්තවු මෙලොවින් මිය පරලොව යන කල අහලකුදු කැටි වැ නො යන්නේ යැ. තුණුරුවන්හි කරණ සැදැහැ නැමැති ධනය සිත්හි හටගත් තැන් පටන් ගෙණැ අමාමහනිවන් දක්නා තුරු ජාතියෙන් ජාතිය අත් නො හැර පසුපස්සෙහි එන්නේ යැ. ආලවකය, තව ද සෙසු රත්රන් රමුරන් ආදි වූ ධන රැහැණි වූ කලැ රජදරුවන් විසිනුදු හැර ගත හැක්කැ. වස්වායෙන් සොරුන් විසිනුදු හැර ගත හැක්ක. ගින්නෙන් ද යන්නේ යැ. වතුරෙහි නැහී යන්නේ ය. තුණුරුවන්හි කරණ සැදැහැ නැමැති ධනය උදහස් වූ රජුන් විසිනුදු

1. සැදැහැධනයට. 2. ඇතුළු වූ.

Non-Commercial Distribution

හැරගත නො හැක්ක. වංචාවෙන් සොරුන් විසිනුදු හැරැ ගත නොහැක්ක. සෙසු උපද්‍රවයෙන් නසිති යි සිතතොත් කප්ගින්නෙනු දු නො දයි. මහමෙර පුළුන් පෙදක් සේ නහා ගන්නා වූ යුගාන්තවායුවෙන් පවා සොල්වා ගත නොහැක්කැ. කල්පාන්තයෙහි වට මහමේවැස්සෙහි සැඩ වතුරෙනු දු නො ගෙණ යා හැක්ක. ආලවකය, තව ද, අත් පොළාපී විටැ සතිස්යොද නෙකැ පැතිරැ සිටි සෙනඟට සත්රුවන් වැසි වස්වාපියන්නට පොහොසත් මහාමන්ධාතු ආදි සක්විත්තන් වැනි ධන ඇත්තෝ ද ඇසිපියක් හෙළාලන ඇසිල්ලකුදු තුණු රුවන්හි උපන් සැදැහැ නැමැති ධන ඇති එකක්හු හා හිමාලය පර්‍වතය හා සම නොවන හබබිජුවටක් සේ, සම නො වන්නාහ. ආලවකය, රත්රන් රමුරන් ආදි වූ සියලු ධන සියලු දුකට කාරණ වූ තෘෂ්ණාව වඩනා නියාව ද, තුණුරුවන්හි කරණ සැදැහැ නැමැති ධන සියලු දුක් වඩනා තෘෂ්ණාව නසනනියාව ද, බැලූ කලැ සියලු දුකට කාරණ වූ සෙසු ධන හා සියලු දුක් නසන්නා වූ තුණුරුවන්හි කරණලද සැදැහැ නැමැති ධනය හා සම නොවන්නේ යැ. ආලවකයැ, මෙසේ හෙයින් ශ්‍රද්ධාධනයට වැඩි අතික් කිසි ධනයකු දු ලොවැ නැත. මේ ප්‍රශ්නය අප විසඳු පරිදි තා සිත් වන්නේ වී නම්, අනික් ප්‍රශ්නයක් විචාර''යි වදළ සේක.

ඉක්බිති ආලවකතෙම "මෙහිමියානෝ සව්නෝ ගෙවා දත් කෙනෙකුන් වන්නහැ. මතුත් විචාළ දෙයක් මෙපරිද්දෙන් මැ විසඳු නම්, යෙහෙකැ''යි සිතා විචාරන්නේ "කුමක්හි හසළ කලැ සුව එළවන්නේ දැ''යි විචාළේ යැ. හෙ ද බුදුරජානන් වහන්සේ විසඳ වදරණසේක් "ආලවකය, "කුමක්හි හසළ කලැ සුව එළවන්නේ දැ?''යි කියා වේ ද තා විචාරන්නේ යැ? ආලවකය, දහම්හි හසළ කලැ සුව එළවන්නේ යැ. 'දහම් නම් කුමක් දැ?'යි සිතන්නෙහි වී නම්, දන් දීම්, සිල් රැකීම් ආදිවූ සුචරිත යැ. මේ සුචරිතය සොණ නම් සිටුපුත්‍ර ය, රට්ඨපාල නම් සිටුපුත්‍රය යන මේ ආදීන්ට මෙන් මිනිස්ලොවැ මිනිස් සම්පත් දෙන්නේ යැ. ශක්‍ර, සුයාම, සන්තුෂිත යන මේ ආදීන්ට මෙන් දෙව්ලොවැ දිව්‍ය සම්පත් දෙන්නේ යැ. මහාපද්මාදීන්ට මෙන් මෙ මැ දහම් අන්තයෙහි අමාමහනිවන්සැප දෙන්නේ යැ. ආලවකය,

"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
එසා'නිසංසො ධම්මෙ සුචිණ්ණො
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී''

Non-Commercial Distribution

යනු මා ඇතුළු සියලු බුදුන්ගේ මැ බස් හෙයින් නිරුදුක් පසු බසුත්, දහමට පසුබස්සි. තිරිසන් දුක් නසුත්, මෙ මැ දහමින්මැ නස්සි. ප්‍රෙතයන් කුසැ සාදුක් නිවෙත්, මෙමැ ධර්‍මය හෙතු කොට ගෙණැ නිවෙන්නේ යැ. අසුරකාහි දුකින් වැළහෙතත්, මෙ මැ දහම් හැර අනික් උපායෙක් නැත. ආලවකය, බුදුහු ලෝවැස්සන්ට දිවසැපත් නිවන්සැපත් සාධා දෙත් නම්, මෙ මැ දහමින් මැ සාධා දෙන්නාහැ. ධර්‍මය නම් මෙසේ සුව එළවන දෙයෙක. බුදුනුදු බුද්ධත්‍වය සාධන්නට වහල් වැ සිටියේ මෙ මැ දහම් මැ යැ. එහෙයින් බුදුබව මෙ මැ දහමින් මැ සැධෙත්, පසේ බුදුබව ද මෙ මැ දහමින් මැ සැධෙත්, රහත්බව ද මෙ මැ දහමින් මැ සැධෙත්, සියලු සැපතට මෙ මැ නිධාන වත්, සියලු ශ්‍රීයට මෙ මැ කුලගේ වත්, සියලු දුක් මෙ මැ දහමින් ම පහ වත්, සියලු බුදුනට මෙ මැ දහම් හස්තසාර වත්, සසරින් එතෙර වන්නට මෙ මැ දහම් හැර අනික් උපායෙක් නැත. එහෙයින්, ආලවකය, දහම්හි හසළ කලැ සුව එළව"යි වදරා, "මේ අප කී පරිදි නුවණින් පරීක්‍ෂා කොට පියා තා සිත් ගත්තේ වී නම්, තව ද අනික් ප්‍රශ්නයකුත් ඇත් නම්, විචාර"යි වදළ සේකැ.

ඒ අසා ආලවකතෙම "සවිනේ ඇතැඹුල සේ පිරිසිඳ දත් කෙනෙකුන්ගේ බස් වන්නැයි" සතුටු වැ "අනික් ප්‍රශ්නයකුදු කිවහොත් යහපතැ"යි සිතා විචාරන්නේ "රසයන් අතුරෙන් ඒකාන්තයෙන් මධුර වූ රසයෙක් නම් කිම් දැ?යි" විචාළේ. ඒ ද බුදුරජාණන්වහන්සේ සියලු ලොව අනුලොමප්‍රතිලොමයෙන් බලා පියා විසඳ වදරණසේක්, "ආලවකය, සියලුලොවැ රසයන් අතුරෙන් උතුම්රසය නම් සත්‍යරසය යැ"යි වදළසේක. හේ කෙසේ ද? යත්:- ආලවකය, සබා කියන්නාහට විපත්තියක් වූ කල්හි දෙවියෝ වහල් වෙති. මොබැ හිඳ කී සබවසෙහි බලයෙන් ශක්‍රයාගේ ආසනය හුණු වෙයි. එසේ හුණු වූ කල්හි ශක්‍රයා තමාගේ ආසනයෙහි හිඳිය නො හී මොබ මිනිස්ලොවට අවුත් ඒ වූ විපත්තියට වහල් වන්නේ යැ. ආලවකය, මේ සත්‍යය නම් සියලු බොධිසත්‍වවරයන්ගේ දශපාරමිතාවට නහා දුටු එක් පාරමිතා වෙකැ. ආලවකය, තව ද, මා මත්ස්‍ය වැ උපන් කලැ, මහගිමින් තැවෙන මාගේ නෑයන් බලා, ඔවුන්ගේ ඒ දුක් හරණ පිණිස වැසි වැස්වූයෙම් මෙ මැ සත්‍ය බලයෙනැ. ආලවකය, තව ද, මා වටු වැ උපන් කලැ ඒ සා මහවෙනෙහි එක පැහැර ඇවිළැ ගත් ලැව්ගින්න නිවූයෙම් මේ සබවස බලයෙනැ. ආලවකය, තව ද මා සුතසෝම වැ උපන් කලැ, මාගේ සත්‍යයට හානියෙක් වේදේ හො!' යි යන භයින් පොරිසාදයාට මා ජීවිතය පුදදී මෙ මැ සත්‍යයට පූජා කෙළෙමි. ආලවකය, තවද, ආදිකපැ බඹුන්

Non-Commercial Distribution

බඹලොවින් මෙලොවට පඬුරු කොට ගෙණායේ මෙ මැ සබවස මැ ය. ආලවකය, තව ද, මේ වරද මම කෙළෙමි'යි සබා කියා දෙෂ පිළිගෙණැ සිටිකලැ රජදරුවන්ගේ කෝප පොවා සන්සිඳෙයි. 'තාගේ සබවසට පූජා කෙරෙමිහ'යි ඔහු කළ වරදට කරණ නිග්‍රහය අඩුකරන්නාහු යැ. ආලවකය, තව ද, යම් ආප්ත ස්ථානයෙක්හි සිටි එකකුදු නොසබාවක් කී කල්හි ඒ නොසබා කීවා ඇසූ ඇසිල්ලෙහි මැ එතෙන මැ හෙතෙම නග්න වැ සිටියක්හු මෙන් අනාප්ත වැ පෙණෙන්නේ යැ. ආලවකය, තව ද සබා කියන තැනැත්තහු තමා කියන සබවසින් ලොවැ සිත් ගන්නා පරිද්දෙන් බොරු කියන තැනැත්තේ නොසබාබසින් තමා ජීවිතය හැරැ ද එසේ සිත් ගත නො හෙන්නේ යැ. ආලවකය, තව ද, සබවස සේ ලොවැ අනික් අවශ්‍යයෙක් නැත. ආලවකය, තව ද, සබා සේ තමාගේ සන්තානයෙහි උපන් අනික් ආභරණයෙක් නැතැ. ආලවකය, තව ද, සබවස සේ පස්පලවතින් කළ අනික් මුඛවාසයෙක් නැත. ආලවකය, මම සබවසින් මැ පොළො බැණවීමි. සැබැවින් ම මරහු දිනිමි. ආලවකය, තව ද,

"සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය - දජ්ජා අප්පම්පි[1] යාචිතො,
එතෙහි තීහි ඨානෙහි ගච්ඡෙ දෙවාන සන්තිකෙ"

යනු මා ඇතුළු වූ සියලු බුදුන්ගේ මැ බස් හෙයින් දෙව්ලොව නැහෙත්, සබවස වැනි හිණෙක් නැත. ආලවකය, තව ද විධුරපණ්ඩිත වැ රජු හා මා හා වෙනසෙක් නැතැයි කී කල්හි, පූර්ණභද්‍රයාහට, මා ඒ දූ කෙළැ දිනූ තැනට වඩ්ඩී නොවන බව දනැ දනැ ද එක්සියක් රජදරුවන් දවස දවස කරණ පූජා ද නො සලකා, ධම්පාල කුමාරයන් ප්‍රධාන කොට ඇති දහසක් දරුවන් නො සලකා, එසේ මැ දහසක් අඹුවන් ද නොසිතා තුන්ඍතුවට උචිත විචිත්‍රප්‍රාසාද තුණ නො සිතා, රජහු මුහුණද නො බලා, ඒ සබවස මැ රක්නා පිණිස 'මම ගැත්තෙමි'යි කියා, යකු අතැ හී ඒ සා මහත් දුකක් ගතිමි ආලවකය, මෙසේ හෙයින් මැ සියලු රසයන් අතුරෙන් සත්‍යරසය මැ උත්තම යැ යි කියමි. ආලවකය, මෙ ද තා සිත් වන්නේ වී නම්, නැවැතැ අනික් ප්‍රශ්නයකු දු විචාර"යි වදළසේකැ.

ඒ අසා ආලවකතෙමේ සිතින් පිණා ගොස් "මේ මාගේ හිමියානන්වහන්සේට මා කළ උපක්‍රමයෙන්[2] නරකයට නොගියෙම් නම්, යෙහෙකැ"යි ඉනිබ්බේ වදිනා වැඳුම් සම බැවින් ඔබ ද විචාරා පියා වදිම් යි සිතා විචාරන්නේ "කෙසේ කරණ ජීවිකාව උත්තම ජීවිකාව දැ?"යි විචාළේ එය ද අසා බුදුරජානන් වහන්සේ "ආලවකය,

1. දජ්ජාප්පස්මිම්පි 2. වික්‍රමයෙන්.

Non-Commercial Distribution

නුවණින් කරණ ජීවිකාව මැ උත්තම ජීවිකාව යැ. හේ කෙසේ ද? යත්:- මා කියන්නක් අස. ආලවකය, ශාසනයෙහි සිට ද ගිහිගෙයි සිට ද ජීවිකාව කරන්නට නුවණ වැනි අනික් උපායයෙක් නැත. ආලවකය, තව ද, නුවණ නැතිවැ, හේතු පිළිසිඳ නොලද්දේ ලොවුතුරා දහම් තබා පළමුවන ධ්‍යානමාත්‍රයකු දු නො ලබන්නේ යැ. ආලවකය, නුවණ නම් මෙසේ ලොවට උපකාර දෙයෙකැ. ආලවකය, තව ද නුවණැති තැනැත්තන්ගේ නුවණට නො ඇතුළත් වන්නෝ නැත. ආලවකය තව ද, නුවණැති තැනැත්තවුට පිරිවාර නොවන්නෝ නැත. ආලවකය, තව ද නුවණින් යෙදී කරණ කටයුත්තෙන් පශ්චාත්තාප මාත්‍රයකු දු නො වනහෙයින් සත්‍වයන්ට නුවණ සේ බලවත් හස්තසාරයෙක් නැත. ආලවකය, තව ද, මා පවා ලෝමුදුන්පත් වූයේ මෙ මැ නුවණබලයෙනැ. ආලවකය, තව ද, නුවණ නැති තැනැත්තවුට වන අභිවෘද්ධියට වඩා නුවණැති තැනැත්තහු සිඟන සිඟුම් මැ මිහිරැ. ආලවකය, කට යුතු නො කට යුතු දෙක අනුන්[1] නො විචාරා, තමා මැ තමන් අතුරෙහි 'මේ කට යුතු යැ, මේ නො කට යුතු යැ'යි සිතා ගන්නා[2] නුවණින් මැ වන පරිදි බැලූ කලැ එයට වඩා ලොවට සුව එළවන දෙයෙක් නැත. ආලවකය, තව ද කෙසේ බලවත් වුවත් නැහැයෙහි ලනු බඳ ගොනුන් සේ නුවණැත්තන් ම අනු වන්නාහු යැ. ආලවකය, තව ද, 'මෙතැනට මේ කට යුතු සුදුසු යැ'යි ස්ථානොචිත කට යුතු සොයන තැනැත්තවුට නුවණින් දුටු කට යුත්ත මැ මත්තෙහි විපාකය නො වරදවා දෙනහෙයින් නුවණ මැ ලොවට බලවත් මාහැඟි දෙයෙකැ. ආලවකය, තව ද, නුවණ නැමැති පහන සේ පහනෙක් නැත. ආලවකය, තව ද, ලොකයෙහි ආත්මදෘෂ්ට්‍යාදිය නුවණින් මැ බිඳෙත්, අනිත්‍යයැ, දුඃඛයැ, අනාත්ම යැ යන තිලකුණු නුවණට මැ හමුවත්, ආලවකය, තව ද, සසරගිනි නුවණින් මැ නිවෙත්, ආලවකය තව ද, සියලු සම්පත්ති තාක් නුවණ නැමැති බිම්හි මැ හටගණුත් ආලවකය, තව ද, නුවණින් මැ මරුට වැළහෙත්, ආලවකය, තව ද, නුවණින් මැ සියලුලොව දස් කරත්, මේ නුවණගුණ නැවැත කෙසේ කියා නිමවම් ද? ආලවකය, තව ද, මහෞෂධ අටවක්මැණික කුහුඹුවන් ලවා ඇව්ණවූයේත් නුවණින් මැ යැ. එ මැ අත්බැවැ තල්ගස උඩ තුබූ මැණික පොකුණේ දියෙහි යැයි පෙළෙන ලෝවැස්සන් දැකැ මැණික සේය පාත්‍රයෙහි හෙලා පැ ඒ මැණික තල්ගස උඩ තුබුවා පැයේ මෙ මැ නුවණින් මැ යැ. ආලවකය, තව ද, එ මැ අත්බැවැ අඩ්මාසකයක් පමණ රත්රන් ලදින් කටුසුබොහොඩා රජුට මන් කොට තොරණ අග හොත් පරිදි පිරිසිඳ

1. දන්නවුන්, 2. සිතැ තැබූවන්ට සිතා ගෙණ සිතාගන්නාහු

Non-Commercial Distribution

දත්තෙත් මෙ මැ නුවණින් මැ යැ. තව ද, බමුණකු ගේ පසුඹියට වන් සපියා ඇසට නො පැණෙතු දු, නුවණැසින් බලා දත්තේ මෙ මැ නුවණැසින් මැ ය. ආලවකය, තව ද, වෘක්‍ෂ දෙවතාවන් තමන් වසන ගස් කපන්නන් වළකා ගත නො හී හඬන කල්හි කටුසුබොහොඩවෙස් ගෙණැ ගස්සිදුරට වැදැ නැවැතැ වෙළෙප අග සිදුරකින් නික්මුනු සේ පැණී ඒ ගස් සිදුරු ඇත්තා සේ කපන්නට පෑ දෙවතාවන්ගේ විමන් රක්නෝත් නුවනැත්තෝ මැ යැ. ආලවකය, තවද, වඳුරු වැ ඉපැදැ මා බදන්නට ගොඩ හොත් කිඹුලා ලවා කිඹුල්බසින් බස් බණුවා ගත්තේ මෙ මැ නුවණින් මැ යැ. ආලවකය, තවද, නුවණ නැති තැනැත්තහු විදිනා සක්විතිසැපතටත් වඩා නුවණැති වැ ගන්නා වියරුවෙස් මැ හොබනේ ය. ආලවකය, තව ද, අවිද්‍යා නැමැති මහඅඳුරු පවා නුවණ නැමැති ආලොකයෙන් මැ බිඳෙන්නේ යැ. ආලවකය, තව ද, අප්‍රකාශ නිවන්මඟ නුවණැත්තවුට රජමහවතෙක් වන්නේ ය. ආලවකය, තව ද, ප්‍රතීත්‍යසමුත්පාද නැමැති ගැඹුරෙකැ පවා පිහිට ලබන්නේ නුවණැති තැනැත්තේ මැ යැ. ආලවකය, තව ද, නුවණැස් නැත්තාහට ඇස්දහසෙකිනුත් සැහෙනු නැත. ආලවකය, තව ද, නුවණැත්තේ ඇස් නැත්තේ වී නමුත්, කෙ සා ඇස් ඇත්තන් පොවා නො දක්නා අර්‍ථය දක්ක හෙයි. ආලවකය, මෙසේ හෙයින් මම ලෝවැස්සන් කරණ ජීවිකාවන් අතුරෙන් නුවණින් කරණ ජීවිකාව මැ උත්තම ජීවිකා යැ යි කියමි. ආලවකය, මෙ ද තා සිත් ගත්තේ වී නම්, මත්තෙහි තා විචාරන්නක් විචාර"යි වදළසේක.

ඒ අසා ආලවකයා විස්මය පත් වැ "මත්තෙහි අනික් කා විචාරන්නට තබමි ද? විචාරණ දෙයක් මොවුන් වහන්සේ මැ විචාරමි"යි සිතා විචාරන්නේ "කාම යැ, භව යැ, දෘෂ්ටියැ, අවිද්‍යා යැ යන මේ සතර වතුරෙන් සත්‍වතෙමේ කෙසේ එතෙර වන්නේ ද?"යි විචාළේ. ඉක්බිති සර්‍වඥයන්වහන්සේ "ආලවකය, සත්‍වතෙමේ මේ තා කී සතර වතුරෙන් එතෙර වන්නේ තුණුරුවන්හි කරණ සැදැහැයෙන් මැ යැ"යි වදළසේක.

නැවැතැ "සසර නැමැති සයුරෙන් සත්‍වතෙම කෙසේ එතෙර වන්නේ දැ?"යි විචාළ කල්හි "ආලවකය, නොපමා වැ කුසල් කරණ තැනැත්තේ එතෙර වේ යැ"යි වදළසේක.

නැවැත "සත්‍වතෙමේ සියලු දුකින් කෙ සේ ගැලවේ දැ?"යි විචාළ කල්හි "ආලවකය, කුසල් කිරීමෙහි වීර්‍ය්‍ය ඇති තැනැත්තේ ගැලවේ යැ"යි වදළසේකැ.

නැවැතැ "සත්ත්‍වතෙමේ කෙසේ පරිශුද්ධ වේ දැ"යි විචාළ යක්හට "ආලවකය, සත්ත්‍වතෙමේ නුවණින් පරිශුද්ධ වන්නේ යැ"යි වදළසේක.

Non-Commercial Distribution

නැවැත "නුවණ නම් කෙසේ ලැබේ දැ"යි විචාළ යක්හට 'ආලවකය, තුණුරුවන්හි හැදහිලි ඇති තමහට වැඩි නුවණැත්තන් කරා එළඹැ උපස්ථාන කරන්නේ ඇති වූ සැකයක් නො පමා වැ විචාරන්නේ නුවණ ලැබෙන්නේ යැ"යි වදළසේකැ.

"නැවැත "ධන කෙසේ ලැබේ දැ"යි විචාළ යක්හට "ආලවකය දිවසැපත් නිවන්සැපත් ලබන්නට සුදුසු කාලදෙශ නො වරදවා ඒ ඒ සුදුසු කටයුතු කරණ කායචිත්තවීර්‍ය්‍ය ඇති තැනැත්තේ දිවසැපත් නිවන්සැපත් යැයි කියනලද ධන ලබන්නේ යැ"යි වදළසේක.

නැවැත යසස් කුමකින් ලැබේ දැ"යි විචාළ යක්හට "ආලවකය, සබා කීමෙන් "යසස් ලැබෙ"යි වදළසේකැ.

නැවැතැ "මිත්‍රයන් කෙසේ ලැබේ ද?" විචාළ යක්හට "ආලවකය, තමාගේ ඇති දෙයක් නො වළහා කැමැති කැමැති දෙයක් දෙන තැනැත්තේ මිත්‍රයන් ලබ"යි වදළසේක.

නැවැතැ "සත්ත්වතෙමේ මෙලොවින් පරලොවට ගොස් කෙසේ ශොක නො කරන්නේ දැ"යි විචාළ යක්හට "ආලවකය, මා සියලු සසරදුකින් මුද ගලවන්නේ මෙ මැ යැ යි කියා තුණුරුවන්හි හැදහිලි ඇති සබා කියන නුවණැති ධෛර්‍ය්‍ය ඇති ත්‍යාගී ගිහිවැසි පුරුෂතෙම මෙලොවින් පරලොවට ගොස් ශොක නො කරන්නේ යැ"යි වදළසේකැ.

මෙසේ ආලවකයා විචාළ ප්‍රශ්න තාක් විසඳ වදරා, නැවැතැ වදරණසේක් "ආලවකය, අප මේ කීවා වූ ධර්‍මයෙන් තට සැක නො හැරේ නම්, "මේ සතර ධර්‍මයට වැඩි ශොක නො කරන්ට කාරණයක් ඇද්දේ හො?'යි සෙසු ශ්‍රමණබ්‍රාහ්මණයන් කරා ගොස් විචාළ කලැ ඉදින් වැඩියක් කියන කෙනෙක් ඇත් නම්, උනුන් පරීක්‍ෂා කොට පියා ගත යුතු දෙයක් ගනුව"යි වදළ සේකැ.

ආලවකතෙම ඒ අසා තමන් බුදුන් වදරණ බණ අසමින් සිට මැ අපායෙහි අකුල් හෙලා තබා අමාමහනිවන් දකැ සෝවාන් වූ හෙයින් පාපිටැ වැටී හී "අතික් කා විචාරම් ද? ස්වාමීනි, ඉඳුරා[1] මැ සැක මැකී ගියේ, සැකයක් තිබෙන තියායෙන් වදළ බණෙක් ද? මට වන මේ මහත් වැඩ පිණිස සැවැත්නුවරැ සිටැ, මෙ තෙක් කතර ගෙවා, මාගේ[2] විමානයට වැඩිනියාව මට දන් හැඟුනේ යැ. දන් දෙන්නට සුදුසු පුණ්‍ය ක්‍ෂෙත්‍ර ද මට හඟවා වදළසේකැ. ස්වාමීනි, මම පෙරැ ගමින් ගමට

1. ඉඳිවුරා. 2. මේ.

Non-Commercial Distribution

නුවරින් නුවරට මිනී මස් කා, ගොදුරු සොයා, වියරු විකාර ගෙණැ ඇවිද්දෙමි. අද මෙවක් පටන් මා වියරු හී ඇවිදිතැනැ නුඹවහන්සේගේ ධර්‍මය දැනැ, වැඳ වැඳ, පුද පුද, මෙනෙහි කොට කොට, ලෙහි ඒ අමාරසයෙන් තිව් සැනැහී තුණුරුවන් අරමුණු සොම්නසින් පිණපිණා අදිමි"යි මෙසේ කියමින් ආලවකයා සෝවාන් වැ ගත් සාධුකාර හඬ ද, හිරු නැඟුම් ද, අලව්කුමාරයා ගෙණැ යැම ද එකවිගස[1] මැ වී යැ.

ඒ රාජකුමාරයා ආලවකයා කරා ගෙණැ ගිය රාජපුරුෂයෝ ඒ විමානයෙහි සාධුකාරහඬ අසාලා "අනේ! නො ඇසූවිරූ[2] දෙයැකැ. ආලවකයාගේ විමානයෙහි සාධුකාරහඬ ඇසෙන්නේයැ. දියෙන් ගිනි නො නැඟෙයි. ගිනිකඳින් දියබිඳු නො ඉසෙයි[3]. යුගාන්තකාලයෙහි හිරුරැසින් අමා නො වැගිරෙයි. නරකයෙහි දිව්විමන් නො වෙයි. සර්‍පයන්ගේ දළැ ඖෂධ නො තිබෙයි. ආලවකයාගේ විමානයෙහි සාධුකාරහඬෙක් නම් නැත. අද මේ කුමන විස්මයෙක් දෝ හො!යි. අපගේ සුද්ධොදන රජ්ජුරුවන් වහන්සේගේ පුතනුවන්වහන්සේ යම් සේ මොබ වැඩිසේක් දෝ හො!"යි විමසා බලා, නුගගසැ අතු අතරෙහි නැඟෙන සවණක් ඝන බුදුරස් දැකැ, ඇතු වැළකීමෙහි මෙහෙයීමෙහි සමර්‍ථ[4] වූ ආරොහකයකු ඇතු පිට හුන් කලැ "මේ ආරොහකයා ඇතු වළකා ගන්නි"යි සිතා ඇතු ළඟට නො බා ඇතුළට වන්හ. වැඩහුන් සර්‍වඥයන් වහන්සේ දුටුහැ. ඇඳිලි බැඳ වැඳ සිටි ආලවකයා දුටුහැ. "තාගේ බිලිය තෝ ගණැ"යි කියා කුමාරයා ආලවකයාට දුන්හැ.

ආලවක තෙමේ ලජ්ජාවෙන් කුමාරයා දෙඅතින් පිළිගෙණැ බුදුන්වහන්සේට "ස්වාමීනි, මේ මට බිලියම ගෙණා කුමාරයෙකැ. මාගේ බිලිකැවුම් දැන් නැති කොට වදාළසේක් වේ ද? එසේ බැවින් මේ කුමාරයාට හිතසුව පිණිස පිළිගෙණැ වදාළ මැනැවැ"යි කියා, බුදුන්වහන්සේගේ ශ්‍රීහස්තයෙහි පිළිගැන්වී යැ. ඒ කුමාර ශ්‍රීහස්තයෙන් පිළිගෙණැ වදරා, "මේ කුමර දීගා වෙව"යි "යක්‍ෂය, තෝ ද සුවපත් වෙව"යි කියා වදාළසේක. යක්‍ෂ ද කුමාරයා තෙසරණ ගැන්වී යැ. සර්‍වඥයන්වහන්සේ "මූ වඩාලා අපට මැ දෙව"යි කියා කුමාරයා ගෙණා රාජපුරුෂයන්ට මැ දෙවා වදාළසේකැ.

ඒ කුමාරතෙම රාජපුරුෂයන් අතින් ආලවකයා අතට ගිය හෙයින් හා, ආලවකයා අතින් බුදුන්වහන්සේ අතට ගිය හෙයින් හා, බුදුන්වහන්සේ අතින් නැවැතැ රාජපුරුෂයන් අතට ගිය හෙයින් හා හත්‍ථාලවක නම් වී යැ. කුමාරයා පිළිගෙණැ, බුදුන් වහන්සේ කොට වදාළ ශාන්ති ඇසූ බොහෝ මිනිස්සු තාක් සතුටු වැ, අත් පොළමින් මහත් කොට හඬ

1. යාමදඑකවිට 2. නො වූ විරූ 3. සෙල්වෙයි 4. සාර්‍ථ

Non-Commercial Distribution

ගහමින් යක්‍ෂයාගේ විමානයට දිවැ ගත්හ. ආලවක ද සර්‍වඥයන්වහන්සේ සිහා වඩනා වේලෙහි පාත්‍රචීවර ගෙණැ, පසුපස්සෙහි නික්මිනැ. සර්‍වඥයන්වහන්සේ තමන්වහන්සේගේ පාත්‍රචීවර හැර ගෙණැ[1] ආලවකයාට සමු දී වදරා, ඒ අලව්නුවර පිඩු සිහා වළඳ වදරා, නුවර දෙර පණවන ලද බුද්ධාසනයෙහි වැඩැ හිඳ සම්ප්‍රාප්ත වූ පර්‍ෂදට ආලවකසූත්‍රය දෙශනා කොට වදළසේකැ. ඒ වදළ බණ අසා, සුවාසූදහසක් සත්ත්වයෝ අමාමහනිවන් දුටුහැ. මෙසේ තමන් "දෙපය අල්වා ගෙණැ, පරසක්වළැ ගසාපියම්හ"යි කොපයෙන් දිලීපියා ආ යක්‍ෂයන් පවා තමන්ගේ මිහිරි දහමින් අමාමහනිවන් දක්වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 101.

තව ද, එක්සමයෙක්හි විශාලාමහනුවර නානාප්‍රකාර වූ වෙශ වූ භූෂණයෙන් යුක්ත වූ, සම්පත්තියෙන් අනූන වූ, යෞවනයෙන් උද්දම වූ, රූපයෙන් මනොහර වූ, කුලයෙන් අනින්දිත වූ, විද්‍යායෙන් ප්‍රසිද්ධ වූ, සැරසුම්හි තන්වැසි වූ, කෙළියෙහි විදග්ධ වූ, සත්‍යයෙහි ස්ථිර වූ ප්‍රෙමයෙහි නිබොරු වූ, අන්තරඞ්ගබහිරඞ්ග කායර්‍යයෙහි ප්‍රමාදයෙක් නැත්තා වූ, ගැණුන් හා පිරිමින් විසින් ගැවැසී ගත්තේ යැ.

සියලු දෙශයෙහි සමෘද්ධිසාරය තාක් එක් තැන්හි කොට මවාලූවක් සේ[2] නානාදෙශයෙහි වූ අනෙකප්‍රකාරවස්තුයෙන් 'අසෝ[3] වස්තුව මෙහි නැතැ'යි නො කියන පරිද්දෙන් කපුරු, කස්තුරි, සඳුන්, කලුවැල්, ලමහ, තකුල්, පටපිළී, දේවාහ,[4] රත්රන්, රිදී, මුතු, මැණික් ආදි වූ නොයෙක් සාරවස්තුවෙන් සම්පූර්ණ යැ.

අඤ්ජනකූට පර්‍වතය සේ උස් වූ, මහත් වූ, ජාතියෙන් භද්‍ර වූ සත්ත්වයෙන් දෙවසත්ත්වාදිඋත්තම සත්ත්ව ඇති, දශාහෙයින් චතුර්ත්‍ථ[5] දශා ඇති, ශොභාවෙන් චතුර්ත්‍ථශොභාවෙහි පවත්නා වූ, විනීත කමින් තපස්වීන් වැනි වූ, කොපයෙන් අසනිපාතයක් සේ නො වළකා ගත හැක්කා වූ, ක්‍රියාවෙන් උත්තම වූ සන්නාහ්‍යකර්‍ම ඖපවාහ්‍යකර්‍මයෙහි දක්‍ෂ වූ වත්තිදක්‍ෂ වත්තිපරාඝාත පානිපරාඝාත වෙණුපරාඝාතාදි වූ නානාප්‍රකාර පරාඝාතයෙන් හික්මවන ලද්ද වූ, ශාස්ත්‍රොක්තවිධියෙන් ග්‍රාම්‍ය කරණලද, පමණ නැත්තාවූ, හස්තීන්ගේ කුඤ්චනාදයෙන් ගැවැසී ගත්තේ යැ.

තව ද, දෙශ හෙයින් සින්ධුදෙශාදි උත්තම දෙශයෙහි උපන්නා වූ, වර්‍ණ හෙයින් ජාති හෙයින් සත්ත්ව හෙයින් ප්‍රකෘති හෙයින් කිසි දෙෂයක්

---

1. ගෙණ ගෙණ.  2. මුළුවූවාත්  3. අසවල් & අහෝ.
4. දෙවාහ.  5. චතුත්‍ථ.

Non-Commercial Distribution

නැත්තා වූ, පඤ්චධාරායෙහි[1] ඉතා ශික්ෂිත වූ ඒ පුරසම්පත් නැමැති මහාසාගර මධ්‍යයෙහි බිඳෙන්නා වූ රළ සේ අනවරතයෙන් දිවන්නා වූ පනන්නා වූ අශ්වයන්ගේ හේෂාරවයෙන් එකකොලාහල යැ.

එසේ ම නානාප්‍රකාරවර්ණකම්බල අතුළා වූ නඟනලද ධ්වජ පතාකා ඇති, විනීත වූ අශ්වයන් යෙදූ, දෙව රථ යැ පුෂ්‍ය රථ යැ සංග්‍රාමික යැ පුරපරිසාතික යැ යනාදී නොයෙක් රථයෙහි චක්‍ර නාදයෙන් නිරන්තර යැ.

පිඹිනාවුන්ගේ තුඬින් නික්මුනු, එහි රජ කරණ රජ දරුවන්ගේ මූර්තිමත් කීර්ති බඳු වූ, අති ධවල දක්ෂිණාවෘත්ත සඬ්ඛයන්ගේ නාදයෙන් එකනාද යැ.

සන්තුෂ්ට වූ ස්ත්‍රීපුරුෂයන්ගේ නානාප්‍රකාරමඬ්ගලයෙහි හා නෘත්‍ය ගීත වාද්‍ය ප්‍රසඬ්ගයෙහි ගසනලද මිහිඟුබෙරෙහි ගම්භීර ධීරනාදයෙන් ශ්‍රවණරමණීය යැ. ප්‍රවීණ වූ වීණාකාරයන්ගේ සාඩම්බර ය. වීණාස්වරයෙන් දෙශීයමාර්ගී දෙක්හි සුශික්ෂිත වූ වංශකාරයන් විසින් පිඹිනා ලද වංශනාදයෙන් මනොහර යැ. ලයමානයෙහි දක්ෂ වූ තාලධරයන් විසින් ප්‍රයොග කරණ ලද තාලයෙහි ශබ්දයෙන් දුරු[2] කරණලද උත්කණ්ඨා ඇත්තේ යැ.

තන්හි තන්හි ගෙහි ගෙහි දෙරැ දෙරැ දෙවාලයෙන් දෙවාලයෙහි නටන්නා වූ ස්ත්‍රීන්ගේ නෘත්‍යයෙන් පුරුෂයන් සිත් ගන්නේ යැ. පුරුෂයන්ගේ නෘත්‍යයෙන් ස්ත්‍රීන් සිත් ගන්නේ යැ. කාමද්වෙෂයට මතුරණ මන්ත්‍ර බඳු වූ ස්ත්‍රීන්ගේ මධුරගීතයෙන් පුරුෂයන්ගේ කන්හි අමා නමන්නේ යැ. පුරුෂයන්ගේ ගීතයෙන් ස්ත්‍රීන්ගේ කන්හි අමා නමන්නේ යැ.

"මේ මධුරාහාර අනුභව කරව. මේ මධුර වූ පානීය බොව',යි මෙසේ හඬ ගහන වචනයෙන් සාපිපාසා ඇත්තවුන්ගේ කන්හි දරිද්‍රය හරණේ යැ.

සුවාසූදහසක් කුළින් ගැවසීගත් හිමාලයපර්වතය සේ උස්වූ ධවල වූ අනෙකප්‍රකාර වූ ප්‍රාසාදශතසහස්‍රයෙන් හොබනා ලද්දේ යැ. නො එක් හංසචක්‍රවාකාදි වූ ජලචරපක්ෂීන්ගේ මනොහරක්‍රීඩායෙන් යුක්ත වූ, පියුම්හි මී බී මත්බමරපියරැවින් මධුර වූ, අනවරතයෙන් පිපී සිටිනා පස්වණක් පියුම් ඇති, මඳ මාරුතයෙන් සොලොවනලද පද්මොත්පලයෙන් වගුළ අභිනව රෙණු නැමැති කුංකුමයෙන් අංගරාග ගත්, ගිමට සතුරු වූ, ක්‍රීඩාවට නිධාන වූ, දීයමැදින් අවුත් වෙළලැ ගැසෙන්නා වූ රළින් මැ

1. පඤ්චභාරයෙහි. 2. සුපුරුදු.

Non-Commercial Distribution

බලන්නවුන්ගේ සිත් දෙමිනස් තාක් තමා අතින් ගෙණැ ගොඩට ගසන්නාක් වැනි වූ වෙරලෙහි සුදුවැලිතලාවෙන් සංසාරමුඛය[1] නිරුපද්‍රව වන පිණිස පාත්වලි දුන්නාක් වැනි වූ, තෙරෙහි ලතාමණ්ඩපයෙහි හිඳ හඬන්නා වූ රාජහංස නැමැති වන්දීන් විසින් අනවරතයෙන් ස්තුති කරණ ලද්දා වූ නොඑක් පොකුණෙන් හා විලින් ගැවැසී ගත්තේ යැ.

වසන්තකාලයාගේ අවන්බිම් වැනි වූ, බමරුන්ට කුලපරපුර වූ, මොනරුන්ට නෘත්‍යශාලා වූ, කෙවිල්ලන්ට ගීතශාලා වූ, නොඑක් ජාතියෙහි මුවන්ට ක්‍රීඩාගොෂ්ඨීස්ථාන වූ, ලතායෙන් වෘක්ෂයට යන, වෘක්ෂයෙන් ලතාවට යන, බමරුන්ගේ මධුරවූ, නාදයෙන් අනවරතයෙන් සන්තොෂගායනා පවත්වන්නාක් බඳු වූ, මනුෂ්‍යලොකයෙහි ඇතිතාක් පුෂ්පජාති යැ, ඵලජාතියැ යන මේ එක් කොට සැමනුම් ගන්නා තැන් බඳු වූ, නොඑක් වැලිමළුයෙන් නොඑක් ලියමඩුයෙන් නොඑක් ධාරාගෘහයෙන් නොඑක් හැල්ලෙන් නොයෙක් පතසින් නොඑක් විලින් නොයෙක් ඇළින් හොබනා වූ සියදහස්ගණන් උයනින් ශක්‍රයාගේ නඥන වනයට ස්පර්ධා කරන්නේ යැ.

සියලු සත්ත්වයන් දරුවන් කොට සිතන්නා වූ රජදරුවන් විසින් යුක්ත යැ. "අපේ ස්වාමී මධ්‍යස්ථයහ. අපගේ ස්වාමී නෑයන්ට නිෂ්ඨුරයහ. අපගේ ස්වාමී කෙළෙහි ගුණ දනිති. අපගේ ස්වාමී දුෂ්ටනිග්‍රහ ශිෂ්ටපරිපාලන දෙකට මැ සැරැහී සිටියහ. අපගේ ස්වාමී සත්‍යවාදීහැ. අපගේ ස්වාමී ත්‍යාගීහැ. අපගේ ස්වාමී උදර වූ පරාක්‍රම ඇත්තාහ. අපගේ ස්වාමී ශස්ත්‍ර ශාස්ත්‍ර දෙක්හි සමර්ථයහ. අපගේ ස්වාමී ස්වමණ්ඩලපරමණ්ඩල කාර්‍ය්‍යාකාර්‍ය්‍යයෙහි විභාග දන්නාහ. අපගේ ස්වාමී ඇත්පිටැ අස්පිටැ රථපිටැ ඉතා ශික්ෂිතයහ. කෝපයෙහි යමයා වැන්නහ. ප්‍රසාදයෙහි කල්පවෘක්ෂයක් වැන්නහ. තේජසින් හිරු වැන්නහ. කීර්තියෙන් සඳු වැන්නහ. ලෝ වැස්සන්ට සුව දී තුමු සුව අනුභව කෙරෙති" මෙසේ අනවරතයෙන් තමන්ගේ ස්වාමීන්ගේ ගුණ කියකියා මත් වැ මත් වැ ඇවිදිනා වූ භය පක්ෂපාත දෙකින් යුක්ත වූ රාජසේවකයන් ඇත්තේ ය.

සියලු සත්වයන්ගේ අන්‍යාය නිවාරණය පිණිස ස්ථානස්ථානයෙහි පිහිටුවන ලද, ලොවට මවුපියන් සේ සිටියා වූ, සතර අගතියට නො ගිය සභ්‍යයන් විසින් පිහිටි ධර්මාධිකරණ ඇත්තේ යැ. සද්ගුරුන්ගේ උපදෙශයෙන් මනා වැ පවත්නා වූ ක්‍ෂුද්‍රවිද්‍යාවන් හා මහාවිද්‍යාවන්ගේ පැලඹුම් ඇති නොයෙක් විද්‍යාශාලා ඇත්තේ යැ.

---

1. සංසාරමුඛය.

Non-Commercial Distribution

එහි වාරයෙන් වාරයෙහි රජ කරණ රජදරුවෝ සත් දහස්සත්සිය සත්දෙනෙකැ. ඔවුන් වසන්නා වූ එතෙක් මැ ප්‍රාසාද ඇත්තේ යැ. එතෙක් මැ කූටාගාර ඇත්තේ යැ. එතෙක් මැ පුෂ්පාරාම ඵලාරාම ඇත්තේ යැ. එතෙක් මැ පොකුණු ඇත්තේ යැ.

මෙසේ සමෘද්ධ වූ දිව්‍යපුරය හා ස්පර්ධා කරන්නා වූ මේ විශාලා නම් මහනුවර කාලාන්තරයෙකින් දුර්භික්ෂයෙක් ඇති වීයැ. නටුවා වූ ශස්‍යවර්ගී ඇති වී යැ. මෙසේ දුර්භික්ෂ ඇති වූ කල්හි, සර්‍වකාලයෙහි පළමු කොට ගෝකුර වියැලී යන්නා සේ, පළමු කොට අනාථ වූ දිළිඳු වූ ජනයෝ මළහ. ඒ මළා වූ මනුෂ්‍යයන්ගේ කුණපගන්ධයෙන් යක්ෂයෝ අවුත්, ඒ නුවරට වන්හ. මෙසේ පළමු ඇති වූ දුර්භික්ෂභය මත්තෙහි යක්ෂභය ද ඇතිවන්නා හා, නැවැතැ බොහෝ සේ මිනිස්සු මියන්නට වන්හ. මෙසේ කුණපගන්ධයෙන් එනුවර පිරී ගිය කල්හි සත්ත්වයන්ට අභිවාතක නම් රොගයෙක් ඇතිවී යැ. මෙසේ දුර්භික්ෂභය යැ, අමනුෂ්‍යභය යැ, රොගභය යැ යන මේ තුණින් එනුවර සර්‍වාකාරයෙන් උපද්‍රැත වි යැ.

ඉක්බිති මෙ කී තුන් භයින් පීඩිත වූ සියලු නුවර වාසීහු රාජාඞ්ගණයෙහි රැස් වැ මහත් කොට හඬ ගැසූහ. ඒ අසා රජ්ජුරුවෝ "මේ කිමෙක් ද?" යි විචාළහ. නගරවාසීහු ද "ස්වාමීනි මේ නුවර දුර්භික්ෂභය යැ, අමනුෂ්‍යභය යැ, රොගභය යැ යන මේ මහත් වූ තුන්භයෙක් ඇති වි යැ. මෙයට පළමු සත්වන රාජපරම්පරාව දක්වා මෙසේ වූ තුන් භයෙක් නො උපන් විරීයැ. ක්ෂෙත්‍රයෙහි ශස්‍ය නැති වී යැ. වැව්අමුණුවලැ දිය නැති වි යැ. අහස්හි වැසි නැති වි යැ. කොටුගෙවලැ පිරූ ධාන්‍යසඤ්චය නැති වි යැ. බිමැ තණ නැති වි යැ. තලු තෙමන පමණක් පැන් නො ලබන්නා වූ, තොලු ගානා පමණක් තණ නො ලබන්නා වූ සියලු චතුෂ්පාදජාතීහු මියැ වැගිර ගියහ. දෙරැ දෙරැ මිනී යැ. ගෙයි ගෙයි වළාමැ. ඇසැ ඇසැ කඳුලු යැ. සිතැ සිතැ ශොක යැ. තන්හි තන්හි මිනීබෙර හා අවමඞ්ගල්‍යකාහල යැ. ගෙහි ගෙහි කණ්ඨගතප්‍රාණ වැ හොත්තා වූ අනාථසත්ත්වයන්ගේ බැගෑපත් හඬ යැ. පවුරෙන් පිටතැ සියලු භූමිය මිනී මත්තෙහි මිනියෙන් පවුර හා සම වැ උස් වී යැ. 'ප්‍රාණරක්ෂා කොට ගණුම්හ'යි සියලු ධනධාන්‍ය හා බන්ධුවර්ගීය හැරපියා බිත්ති බිඳ ගෙණැ නික්මෙන්නා වූ ජනයාගේ සංඛ්‍යා නැතැ. සියලු ජම්බුද්වීපයෙහි උපද්‍රව තාක් හැම හැකිලී මෙනුවරෙහි රැස් වූවාක් වැන්නැ. අපි හැමදෙන සතුටු කඳුළෙහි රස නො දනුම්හ. ශොකයෙන් තොරවූ ලයක් නො ලබම්හ. දිව්‍යස්ත්‍රීන් හා සමාන වූ ස්ත්‍රීන්ගේ ශරීරයෙහි ලේ මස් නැති වැ ඇටසම්මාත්‍රයක් තුබූ හෙයින්

Non-Commercial Distribution

ඔහු හැම ගෙයි ගෙයි යකින්නන් වැන්නහ. මේ වූ තුන් උපද්‍රවය අසා සියලු දෙශාන්තරවාසීන්ගේ උපසර්පණයක් නැති වැ ගිය හෙයින් දෙශාන්තරයෙන් එන්නා වූ අමුතු පඬුරෙකැ රස නො දනුම්හ. ‘අද මර යැ, සෙට මර යැ’ යන භයින් ආතුර වූ චිත්තයෙන්, කාමානුභව- තෘෂ්ණාවෙක් නම් දුරින් දුරු වී යැ. කාමාස්වාදවිගමනයෙන් අපගේ දරුමුණුබුරු පරම්පරාව පිරිහෙන්නට වනැ. එහෙයින් මැ මේ රජධානියෙහි එසේ ගහන වූ මිනිස්සු දන් ගැණැ ගත හැක්කා සේ ඉතා විරල වැ ගියහැ. මරතෙමේ ‘විශාලාමහනුවරැ මිනිසක්හු තබාලා, ඔබ්බෙහි මිනිසුන් අල්වම් ද?’’යි ප්‍රතිඥ කළාක්හු වැන්නැ. පෙරැ සම්පත්තීන් විශාල වූ මේ නුවර දන් විපත්තීන් විශාල ය. පෙරැ ධර්මිෂ්ඨ වූ රජදරුවන් දවසැ මෙසේ වූ භයක් මෙසේ වූ විපත්තියක් නුදුටුවිරුම්හ’’යි කියා තමන් ආ කටයුත්ත දැන්වූහැ.

එබස් ඇසූ රජ්ජුරුවෝ සියලු නුවර වැස්සන් සභාගාරයෙහි රැස් කරවා “ලොවට විපත්ති නම් රජදරුවන්ගේ අධර්මිෂ්ඨකමින් වන්නේ යැ. ඉදින් මෙලෙස විපත්තියට කාරණ වූ කිසි අධර්මිෂ්ඨ කමෙක් ඇත් නම්, තෙපි හැමදෙන මැ පරීක්‍ෂාකොට කියව’’ කීහැ.

ඉක්බිති නගරවාසීහු හැමදෙන මැ රැස් වැ ගෙණැ “ලොක සම්පත්ති ලොකවිපත්ති දෙක රජ්ජුරුවන්ගේ ධර්මාධර්ම දෙකින් වන්නේ ය. රජු ධර්මිෂ්ඨ කල්හි උන්ගේ රක්‍ෂාවෙහි සිටියා වූ, දෙවතාවන් ආදි සියල්ලෝ මැ ධර්මිෂ්ඨ වන්නාහැ. හිරසඳ දෙදෙන ද රජදරුවන් රාජධර්මමාර්ගයෙහි පවත්නා කල්හි තුමූ ද තමන්ගේ මාර්ග නොයික්ම පවත්නාහු යැ. සියලු කර්මරූපයන් රක්නා ජීවිතෙන්ද්‍රියය සේ, සියලු සත්‍වයන්ගේ රක්‍ෂාව රජදරුවන් පිළිබඳ යැ. ශුද්ධාෂ්ටකයෙහි සෙසු රූපයන් ඇත ද, ද්‍රවගුනය අපොධාතුවෙන් මැ පවත්නා සේ සත්‍වලොකයෙහි අනන්ත සත්‍වයන් ඇත ද, රජ්ජුරුවන්ගේ කරුණායෙන් මැ සියලු සත්‍වයන්ගේ ලය සැනැහී තිබෙන්නේ යැ. මෙසේ ලොවට බොහෝ උපකාර වූ ස්වාමිකුලයෙහි උපන් අපගේ ස්වාමී මේ සා විපත්තියක් වන පරිද්දෙන් කවර දෙෂයක් කළසේක් ද්‍රේ හො?යි පරීක්‍ෂා කරන්නෝ, අපගේ ස්වාමි මහා කුලීන හෙයින් හා, දෛවයැ බුද්ධි යැ සත්‍ය යැ යන මෙයින් සම්පන්න හෙයින් හා ඥනවෘද්ධයන් කී පරිද්දෙන් පවත්නා හෙයින් හා ධර්මිෂ්ඨ හෙයින් හා සත්‍යවාදි හෙයින් හා, අවිසංවාදක හෙයින් හා, කෙළෙහි ගුණ දන්නා හෙයින් හා බොහෝ අවගුණයන් අතුරෙහි ගුණමාත්‍රයක් මැ ගන්නා හෙයින් හා, උත්සාහසම්පන්න හෙයින් හා අභිමත වූ කාර්‍ය්‍ය සාද ගැන්මෙහි දක්‍ෂහෙයින් හා, කීවා කරණ අමාත්‍යයන් ඇති හෙයින්

Non-Commercial Distribution

හා, ඉන්ද්‍රියවිජයයෙන් යුක්ත හෙයින් හා, කිසි රජදරුවන්ට සුදුසු වූ ගුණයකින් හීන නො වෙති යි, පානව්‍යසන යැ, ස්ත්‍රීව්‍යසන යැ, මෘගයාව්‍යසන යැ, ද්‍යූතව්‍යසන යැ යනාදි වූ සප්තවිධව්‍යසනයෙන් දුරු වැ සිටියාහ. ත්‍යාග යැ සත්‍ය යැ ශෞය්‍ය්‍ය යැ යන මහාගුණ තුණට ජීවිතය සතරවනු කොට සේ රක්‍ෂා කරන්නාහ. හිරු නැංග ද ගුහාවට වන්නා වූ අන්ධකාරය නො නස්නා සේ, ලොවැ චණ්ඩ[1] වූ බලවතුන් බොහෝ වුව ද, මොවුන් ආශ්‍රය කළා වූ අනාථයෝ නො නැසී මැ සිටියහ. ශාලිරක්‍ෂාව පිණිස කෙත්වත්හි ලවන් නෙළන්නා සේ, ශිෂ්ටයන්ගේ රක්‍ෂාව පිණිස දුෂ්ටනිග්‍රහ කරන්නාහ. වරා අතුරෙහි නැඟි හැල්පත උදුරන්නා වූ මලය වැස්සන් සේ, අධර්‍මය රක්‍ෂා කොට ධර්‍මයට හිංසාවක් නො කරන්නාහ. වැව්පත්ලෙහි දිය පුරා උඩත් තව දිය ගන්නා සේ, සත්‍වයා සුවපත් කොට තුමූ ද සුවපත් වූහ. මල්පෙති නොබිඳ මී බොන බමරක්හු සේ, යෙහෙන් ලෝවැස්සන් නො මිරිකා අය ගන්නාහ. ඇසින් දක්නා රූප කණින් දක්නට නියොග නොකරන්නා සේ සත්‍වයා සුදුසු කට යුත්තෙකැ මුත් නුසුදුසු කට යුත්තෙකැ යොදන්නාහ. කරයෙන් තැබුව මනා අන්දම් වැයෙන් පොරොවින් නො තබන්නා සේ, ක්‍ෂුද්‍රයන් හා කළ මනා කට යුතු මහතුන් හා නො කරන්නාහ. ඡත්‍රයෙන් වැළකෙන්නා වූ වැස්සට අතුල් හිසැ තබන්නවුන් සේ, මහතුන් කළ මනා කට යුතු ක්‍ෂුද්‍රයන් ලවා නො කරවන්නාහ. දවසක් මුළුල්ලෙහි තැවූ යකබල්හි ලූ කිසිඹියන් සේ, අඹුවන් දරුවන් නැති යහන්හි මිනිසුන් නො හෙවූ විරූහ. ශරත් සමයෙහි දිලියෙන්නාවූ සූය්‍ය්‍යමණ්ඩලය ඇස හකුලුවහකුලුවා බලන්නා සේ, ලොකාපර්‍යක් තකා ද පරස්ත්‍රීන් බලත් නම්, ඇස හකුලුව හකුලුවා මැ බලන්නාහ. මවුන්ගේ[2] සෞභාග්‍යයෙහි රාගොත්පත්තියක් නො වන්නා සේ, පරස්ත්‍රීන්ගේ සෞභාග්‍යයෙහි රාගොත්පත්තියක් නො කරන්නාහ. දියෙහි ලූ නැව දිය නො උකා රැකෙන්නා සේ, ධනීන් කෙරෙහිත් උන්ගේ ධන නො ගෙණැ පැවැත්තාහ. දත් මැද අන්තයෙහි දවටුදඬ නිරපෙක්‍ෂ වැ දමන්නා සේ, පුරුෂයා ලවා ප්‍රයොජන කරවා ගෙණැ නිරපෙක්‍ෂ වැ අත් හැර නො පියන්නාහ. වෙන වෙන කරලෙහි තුබූ වී එක් කොට ගෙහි රැස් කොට බොහෝ කරන්නා සේ, හැම සත්‍වයන් සිතැ ඇති සන්තොෂ තමන් ලෙහි බහාලා බොහෝ කළහ. පුත්‍ර ප්‍රෙම ඇති මව ප්‍රසවවෙදනාව ඉවසන්නා සේ, සත්‍වයා කෙරෙහි කළ ස්නෙහයෙන් තමන් ගන්නා ආයාසය සරු නොකළහ. මහ නැව පස්සෙහි යන ගල්වනක් සේ, පූර්‍වරාජධර්‍මය පෙරදැරි කොට තුමූ ඒ අනු වැ පැවැත්තාහ.

1. වෙලාවට වැඩි  2. මොවුන්ගේ

Non-Commercial Distribution

කුස පිරෙණ පිණිස මුවෙහි ආහාර තබන්නා සේ, ලෝවැස්සන් සමෘද්ධි කරණ පිණිස තුමූ මැ ධන සඤ්චය කළහ. විල්හි පියුම්මී බොන රාජහංසයකු සේ, ධන ඇති ඇත්තවුන්ගේ ගෙහි මැ තබා තුමූ මැ එයින් ප්‍රයොජන වින්දහ. ඇත්හට ගොයම් පිණිස කුඹුරු ඇත්තවුන් හඬව හඬවා ගොයම් ද ගන්නා සේ, එකකුහට ඉෂ්ට පිණිස එකක්හුගේ ධනය හැරැ එකකුහට නො දෙන්නාහ. ආකාශයෙහි තරු වසා වලාකුළු ඉදුවන පවනක් සේ, අනුන්ගේ ගුණ වසා නො ගුණ නො ලූහ. පිරිමැසූ තැනැත්තවූ මැරුද යෙහෙන් නිදන මතැතක්හු සේ, තමන්ට දුක් ගත්තවුන් මරා සුව නො වින්දහැ. ‘මේ දස්කම කොටලා, අද මාගේ දරිද්‍රාය හැරැ ගණි’යි ආ තැනැත්තවූ හඬව හඬවා ගෙට නො යවන්නාහ. අතුකපා මොරකන්නාසේ ලොවැස්සා නසා ප්‍රයොජන නො ගන්නාහ. ශුද්ධ කරණ පිණිස මල සිඳෙන පමණක් රත්රන් දවන්නා සේ, සත්ත්වයාගේ දෙෂ පමණක් මැ සන්තාප කරන්නාහ. මුහුද වඩදිය නැති විට මැ කළපුයෙහි දිය නැති වන්නා සේ, සත්ත්වයාහට සුව නැති ද මැ තමන් සිතැ සුව නැති කළහ. ගැල යෙහෙන් තබා, තමා බිමැ පෙරැළී දුක් ගන්නා ගැල්සක සේ, සත්ත්වයා යෙහෙන් සිටුවා තුමූ දුක් ගත්හ. පඤ්වෙන්ද්‍රියයන් වෙන වෙන ගත්තා වූ ආලම්බනයෙහි රස විඳුනා වූ සිතක් සේ, සත්ත්වයන් වෙන වෙන ලද්ද වූ සම්පත්තියෙන් තුමූ සුව වුන්හැ. දුන්නෙහි දැඩිකමින් ශරය දුරැ හෙන්නා සේ, තමන්ගේ දැඩිකමින් සත්ත්වයන් දුරු නො කළහ. වෘක්‍ෂයෙහි මූලය ස්පිර වැ පිහිටි පිහිටි සේ ගස අග සලෙල[1] වන්නා සේ, සත්ත්වයා ස්පිර වැ පිහිටි පිහිටි සේ තුමූ සලෙල වූහ. නුවර රක්‍ෂාවට පවුර ස්පිර කරන්නා සේ, ලොවට රක්‍ෂා පිණිස තමන් ස්පිර කළහ. ඇතු සොඬින් ඉකැවූ පැන් මුඛය අනුභව කරන්නා සේ, තමන් සඤ්චය කළ ධනය ලෝවැස්සන් ලවා අනුභව කැරැවූහ. මල් නො ගෙණැ පල දෙන්නා වූ[2] දිඹුල් රුක් සේ, කාරණනිරපෙක්‍ෂ වැ මැ ලෝවැස්සන්ට සුව දෙන්නා හු යැ වෙහෙල්ල[3] තෙමාගෙණැ බස්නා ජලප්‍රවාහය සේ, අනාථයන් තෙමා කරුණාවතුර පැවැත්වූහැ. අශුචිභූමියත් පියුම් වනයත් නො හැරැ හමන්නා වූ පවන් සේ, රාජපුත්‍රයන් කෙරෙහි දූ චණ්ඩාලයන් කෙරෙහි දූ සම වැ සිත් පැවැත්වූහ. දවස් පතා උදයරෙඛාව නො හැරැ නැඟෙන හිරු සේ, තමන්ගේ ධර්මරෙඛාව නො හැරැ පැවැත්තාහ. හිරුරැසින් වන්නා වූ තැවුලියට වඩා ප්‍රයොජන මැ බොහෝ වන්නා සේ, තමන් ගේ ආඥයෙන් කරණ සන්තාපයට වඩා ප්‍රයෝජන මැ බොහෝ කළහ. විකාරයට ම වඳුරන් වඩන්නා සේ, චපලයන් චපලකමට මැ රක්‍ෂා කළහැ. පැන්පිරුණු

1. සලොල.　　2. ගන්නා.　　3. පිහිල්ල.

Non-Commercial Distribution

කළය නො සොල්වා තබන්නා සේ, ගුණෙන් පිරුණු ධීරයන් නො සොල්වා මැ රක්‍ෂා කළහ. මෙසේ හෙයින් අපගේ ස්වාමීන්ගේ කිසි දෙෂයෙක් නැතැ"යි කියා නිශ්වය කොට ගොස් "ස්වාමීනි, අපි හැම කැටි වැ පරීක්‍ෂා කරන්නමු, මේ සා මහත් විපත්තියට කාරණ වූ කිසි දෙෂයක් නුදුටුම්හ"යි කියා දැන්වූහැ.

ඉක්බිති රජ්ජුරුවෝ ඒ උපද්‍රවයන් සන්සිඳුවන පිණිස නොයෙක් බලිකර්ම යැ, දෙවතාරාධනා යැ යන විධි කොට ද, ඒ උපද්‍රවයන් සන්හිඳුවා ගත නුහුනහ. ඉක්බිති සමහර කෙනෙක් කිරි පිරුණු බුරුලු තිබිය දී හඟ ගෙණැ කිරි දේනා සේ, කරුණාවෙන් පිරුණු සර්‍වඥයන් වහන්සේ වැඩැ හින්ද දී, උන් වහන්සේගේ නම නො කියා "කකුදකාත්‍යායන" නම් එක් සර්‍වඥ කෙනෙක් ඇත. ඔවුන් අව හොත්, මේ උපද්‍රව සන්හිඳෙ"යි කිහ. සමහර කෙනෙක් ඔවුන් වළකා, අඳුරු නිසා[1] පහන් අවුළු වන්නට තෙල් ගන්නා පිණිස වැලිමලු තෙලියත්හිලූවා සේ, "මේ උපද්‍රව සන්හිඳුවන පිණිස අජිතකෙසකම්බලිහු මේට ගෙන්වුව හොත් යහපතැ"යි කීහ. එසේ කියන්නවුන් වළකා සමහර කෙනෙක් වසත්කෙළියට සාවුන් හං පෙරමඟ බලා හින්නා[2] සේ, "මක්ඛලිගොසාල නම් බුදුන් මෙයට වැඩිය හොත්, මේ උපද්‍රව සන්හිඳෙ"යි කීහ. එසේ කියන්නවුන් වළකා සමහර කෙනෙක් හැල්බත් පතා හකුරු වපුරන්නා සේ, "නිගන්ථනාතපුත්‍ර නම් සර්‍වඥකෙනෙක් ඇත. උන් මේට ගෙණාව හොත් මේ උපද්‍රව සන්හිඳෙ"යි කීහ. ඔවුනුදු වළකා සමහර කෙනෙක් ගිතෙල් පිණිස ඔටු[3] කිරි අලළන්නා සේ, "සඤ්ජයබෙල්ලට්ඨිපුත්‍ර නම් සර්‍වඥකෙනෙක් ඇත. ඒ බුදුන් මේට ගෙණාවොත්, මේ උපද්‍රව සන්හිඳෙ"යි කීහ. ඔවුනුදු වළකා "වියතුන්" හඳුනන සමහර කෙනෙක් මල් ගන්නා පිණිස අහසට පැන් දමාලූවා සේ "පූරණකාශ්‍යප නම් එක් සර්‍වඥකෙනෙක් ඇත. උන් මේට ගෙණාව හොත්, මේ උපද්‍රව සන්හිඳෙ"යි කීහැ.

මෙසේ අඥනයන් කැටි වැ තමන් තමන් ගේ මත කියකියා නිමවූ කල්හි, එවැනි භයක් සන්හුන මනා කල්හි, කෙළලක්‍ෂයක් සක්වළැ ආඥ පවත්නා වූ එකිඑකී ගාථායෙන් යුක්ත වූ, අද දක්වා නම සිහි කළ සියලු සත්ත්වයන්ගේ සියලු භය සන්හිඳුවන්නා වූ රත්නසූත්‍රයක් වැනි ධර්මරත්නයක් ලොවැ පහළ වුව මනා කල්හි, පස්වාදහසක් මුළුල්ලෙහි සියලු සත්ත්වයන්ට සියලු උපද්‍රව දුරු කරණ ධර් නැමැති ඖෂධමහාවෘක්‍ෂයක් ලොවැ මුල් බට මනා කල්හි, ශක්‍රබ්‍රහ්මාදි දෙවතාවන්ගේ පා බිම්හි දූ පහළ මනා කල්හි, සුවාසූදහසක් ප්‍රාණීන්

1. හැර. 2. හිඳින. 3. වටු.

Non-Commercial Distribution

එක හෙලා අමාමහ නිවන් දුට මනා කල්හි, එතන්හි හුන් පිරිසින් සමහර කෙනෙක් නැඟී සිටැ "මහරජ, මොවුන් හැම දන්වූයේ 'අපට මෙසේ වූ තුන් උපද්‍රවය මඳ යැ'යි කියා, නැවැතැ මෙ කී සදෙනා විසින් මේ මත්තෙහි උපද්‍රව ගණනක් වඩනා පිණිස යැ. ඉදින් ඉඳුරා මැ මේ උපද්‍රවයන් සන්හිඳුවනු කැමැත හොත්, අප කියන්නකුදු ඇසුව මැනැවැ"යි ගිම් නිවා බස්නා ආකාශගඞ්ගාප්‍රවාහයක් සේ, සියලු සත්ත්වයන්ගේ සන්තාප නිවන්නා වූ සදධම් නැමැති ගඞ්ගා ප්‍රවාහයට උඩුගං[1] වැ සිටියා වූ එක් වියතාන කෙනෙක් ඇත. මේ උපද්‍රවය සන්හිඳුවනු පිණිස ගෙන්වුව මැනැව" කීහ.

නැවැතැ කියන්නෝ, "මහරජ, මෙ කී සදෙනා බුදුබවට උසුළු ගන්වන්නා වූ නිවටුන් බව මුත්, තුමූ බුදු නො වෙති. අප දන්වන ස්වාමිදරුවානෝ වූ කලී වොටුන්නෙහි නිමාම් වැ සිටියා වූ අග්‍ර මාණික්‍යයක් සේ ශාක්‍යකුලයට මුදුන්පත් වැ සිටියාහ. තමන් පිළිසිඳගත් මහුලෙහි සියලු ප්‍රෙතලොකය ආලකමන්‍ද නම් දිව්‍යරාජධානිය සේ, සාපිපාසාදුක් නැති කොට ස්වස්ථ කළහ. දුකින් අතුරු නැත්තා වූ අටමහනරකය චිත්තසුඛය පුරා ලූ අටමහානිධානයක් සේ, සුවයෙන් නිරන්තර කළහ. නරකයෙහි සත්ත්වයන් මුවෙහි ලාලූ යවට අමාවට කළහ. ඝොර වූ අසිපත්‍ර වනය නන්‍දන වනය කළහ. සොළොසඟුල් කටු ඇති හිඹුල්රුක් නරක සත්ත්වයන්ට කප්රුක් කළහ. කපක් මුළුල්លෙහි තැවී ගියා වූ ලොහොදියෙන් පිරුණු වෙතරණී ගඞ්ගාව පස්වණක් පියුමෙන් ගැවැසී ගත්තා වූ ආකාශගඞ්ගා කළහ. ලොහොදියෙන් පිරුණු ලොහොකුඹුනරකය අභිමතාත්ථ සාධන්නා වූ භද්‍රකුම්භ කළහ. නවයොදුන් බොල යකබල පළා ගෙණැ, පිටතැ සියක් යොදුන් තන්හි පවත්නා වූ සුවාසුදහසක් යොදුන් තන්හි පවත්නා වූ, සුවාසුදහසක් යොදුන් ගැඹුරු මහාසමුද්‍රජලය එක පැහැර තමා කරා නමා ලූව හොත්, දුරැ දී මැ පිනිබිඳක් සේ වියලවාපියන්නට සමත්ථ වූ, මහගින්නෙහි ආදිකල්පයෙහි පටන් තැවීපියා තුබූ යකබල සියක් දවස් දියෙහි ලා නහා ගත්තා වූ යපල්ලක් සේ සිහිල් කළහ. අවීචිමහානරකයෙහි දණ පමණ වතුරු යන පරිද්දෙන් සත්ත්වයන් සනහා වැසි වැස්වූහ. සියක් යොදුන්හි සිටැ කර දික් කළවුන් අතුණුබහන් පිටත් වැ යන පරිද්දෙන් ඉතා පිළිකුල් වූ දුර්ගන්ධ ඇති අශුචිමහානරකය අඩක් පිපී මුවරදින් පිරී සිටි පරසතුමඳරාමල්ගබක් සේ එක සුගන්ධ කළහ. තුන්ගවු පමණ සත්ත්වයාගේ සම් හා මස් හා නහර හා ඇට හා විද ඇටමිඳුලු කන්නා

1. උඩුබ. ඉඩුගං.

Non-Commercial Distribution

වූ ගිජුලිහිණියන්ගේ භයඞ්කර වූ නාද කුරවිකෙවිල්ලන්ගේ හඬ සේ මිහිරි කළහ. යකබලින් පිටතැ සියක්යොදුනෙහි සිටැ බැලුවන් ඇස් පිපිටැ පළා යන තරම් රළු වූ අවීචිමහානරකයෙහි ගිනිසිළු මැදට වන්නා වූ සත්ත්වයන් රක්තොත්පලගර්භයට වන් මත්බමරුන් සේ සැනසූහ. සත්ත්වයන් සුණු කරණ පිණිස සංඝාතමහානරකයෙහි නැංගා වූ, නැඟී මුදුන්හි හෙන්නා වූ ලෝදියධාරා ඇති මහාපර්වත, හිසින් හෙන්නා වූ ගඟුල්හැලි ඇති ක්‍රීඩාපර්වත සේ සිත්කලු කළහ. කපක් මුළුල්ලෙහි ආලොකයෙක්හි රස නො දන්නා වූ ලෝඇදිරිමහනරකයෙහි අන්ධකාරවිජයයට දසදහසක් සක්වළැ හිරසඳ එකවිටැ වැද[1] ගියා සේ, එහි එක විටැ මැ මහාආලොක පැවැත්වූහ. එ මැ ලොකාන්තරනරකයෙහි චක්‍රවාටපර්වත පාර්ශ්වයෙන් ගිලිහී ලෝකසන්ධාරකඋදකයෙහි හී, පෙණකඳු සේ, විරී යන සත්ත්වයන් සත්රුවන්අතලෙහි සිටැ නන්දාපුෂ්කරණියට පැනැ සැනැහෙන තුසීපුරයෙහි දෙවියන් සේ කළහ. නවදෙරින් වැද සියලු ශරීරය පුටපාකයක් සේ තවන හළුවෙන් ගැවසී ගත්තා වූ කුක්කුලනරකයෙහි පැසෙන සතුන් ආකාශගඞ්ගාවෙහි ජලකණිකා ඇඟ ගස්වගස්වා, වෙරලැ වැලිතෙලෙහි හෙවා නිදන්නා වූ රාජහංසයන් සේ මිහිරි නිදි නිදවූහ. නයින් හා ගුරුළුන් යහළුකම් ගැන්වූහ. බළලුන් හා මීයන් එකකෙළි මඩුල්ලෙහි කෙලිරස දන්වූහ. ඇතුන්ගේ පොකුරගින් ඉස්නා ජලකණිකාවෙන් සිංහයන් ඇඟැ විඩා දුරු කළහ. සිංහ ධෙනුන්ගේ තනයෙහි කිරි ඇත් පොව්වන් පෙවූහ. ඇතින්නන්ගේ කිරි සිංහපොතකයන් පෙවූහ. නයින්ගේ පෙණගබ් නැමැති සේසත් යට මඬුවන් සතපා හිඳිවූහැ. ස්නෙහයෙන් අඳුන් හා මීවුන් හා ඔවුනොවුන් ඇඟ ලෙවැවූහ. මුවන්ගේ හඟින් දිවියන් ගේ කර කැස්වූහ. කවුඩන් හා බකමූණන් හා බොහෝ කලෙකින් ප්‍රෙමයෙන් ඔවුනොවුන් මුහුණ බැලවූහැ. සියලු සතුන්ගේ ශරීරයෙහි ඇති වූ අසාධ්‍ය වූ ව්‍යාධීන්ට තමන් උපන්මඟුලින් මැ පිළියම් කළහ. තමන් සියලු සංසාරයෙහි වක් හරණට පූර්වනිමිත්ත පානා සේ, කුදුන්ගේ වක්‍ර වූ ශරීරයෙහි හැද මරා ඉදි කළහ. සියලු සත්ත්වලොකයාට දිවඇස් දෙනබවට පූර්වනිමිත්ත පානා සේ, ජාත්‍යන්ධයන්ට ඇස් දුන්හැ. එසේ මැ සියලු සත්ත්වයන්ට දිවකන් දෙන්නට පූර්වනිමිත්ත පානා සේ, බිහිරන්ට කන් දුන්හැ. සියලු සත්ත්වයන්ට සතරඍද්ධිපාද දෙන්නට පූර්වනිමිත්ත පානා සේ, පිළුන්ට පා දුන්හ ධර්මයට ගොළු වූ සියලු සත්ත්වයන් ලවා සුවාසූ දහසක් ධර්මස්කන්ධය හදරවන්නට පූර්වනිමිත්ත පානා සේ, ගොළුවන්ට බස් දුන්හ. එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් මහමෙර තමන් පිළිසිඳ ගත් කිඹුල්වත්පුරය දිශාවට වැඳුම් ගන්වාපූහ. සප්තකුලපර්වතයන් ලවා සේරභා[2]

1. වැද. 2. සේලභා & සේනභා.

Non-Commercial Distribution

කෙළවාපූහ, වෙසතුරු අත්බව්හි සත්ඉඩක් හඩා විඩා වැ ගියා සේ මියෙන් නො බැණැ හොත්තා වූ මහපොළොව, මතතැක්හු මැඩැ ලූ හුණපඳුරක් සේ, දියපොළොවෙහි පටන් ගෙණැ එක පැහැරැ ගුගුරුවාපූහ. එක පැහැරැ ලුණුකර වූ මහාසාගරජලය ශකීරා බහා ලා කකාරා ගත් කිරි ඇතිලියක් සේ මිහිරි කළහ. පස්වණක් පියුම් පිපුනා වූ පවීත භිත්ති හා සඳත්දහතළා හා වාද කැරැවූහ. මල්හි රස නො දන්නා වූ දිඹුලෙහි පිපිමල් පරසතුමඳරාමල් හා එක් කොට දෙවියන් මුදුනෙහි පැලඳවූහ. වැසි නැති වැ මැ පොළොව බිඳ ගෙණැ වැගිරැ නැඟෙන නාඹතල්කඳ සා ජලධාරාවෙන් සියලු ලොවට ශාන්තිජලය දුන්හ. බඹලොව හා දෙව්ලොව හා මිනිස්ලොව හා යන තුන්තන්හි මැ සම්පත්තියෙන් වෙනසක් නො කළහ. තමන් ගබ් ගත් මහුලෙහි මැ සියලු සත්ත්වයන් නිවන්සුවයට ගබ් ගැන්වූහ. දසදහසක් සක්වළැ සඳමඬුලු හා හිරමඬුලු හා තමන්ගේ මහුලට නැඟු සේසත් සේ කිඹුල්වත් පුරයෙහි තමන් ගෙදෙරැ ආකාශයෙහි රැඳැවූහ. තමන් මතු වස් වන්නා වූ ධර්‍මාමෘතවර්‍ෂාවට පූර්‍වනිමිත්ත පානා සේ, මුළු සක්වළැ පොකුරුවැසි වැස්වූහ. ගුණෙන් සිස් වූ සසර තමන්ගේ කරුණාවෙන් පිහිට ලබන්නා සේ, නිරාලම්බ වූ ආකාශයෙහි මල්වියන් බැඳවූහ. කසුබුසම්මාසම්බුදුන්-වහන්සේ පිරිනිවිතැන් පටන් ගෙණැ, නො පිඹැ තුබූ විජයොත්තරශඞ්ඛය ශක්‍රයා ලවා තමන්ගේ ගෙදෙරැ පිඹැවූහ. හෙලකුඩ ගත් මහබඹු තමන්ගේ රාජාඞ්ගණයෙහි ඔකඳකෙළි කෙළැවූහ. දෙවියකු වැඳගෙණැ හොත, ඕහට තුන්කෙළසැටලක්‍ෂයක් හවුරුද්දට ආයු දී ලති. මිනිසකු වැඳ ගෙණැ හොත, එක්සිය විසිහවුරුද්දට ආයු දී ලති. මුහුණ බලා සතුටු වැ හුන් බකමුහුණන්ගේ ප්‍රසාදයට පසේබුදුතන් අග කෙරෙති. තමන්ගේ සව්වන් ලවා අවීචිමහානරකයෙහි ගිනි නිවා වැසි වස්වා වතුර හෙළවති. දීපඞ්කරපාදමූලයෙහි අත්පත් නිවන් හැරැ අපට ශාන්ති පිණිස සංසාරරාක්‍ෂසයා කට හුනහ. දන් බෝමැඩැ වැඩැ හිඳ සවාසන සර්‍වක්ලෙශයන් නසා බුදු වැ නිරුපධිශෙෂනිර්‍වාණධාතුයෙන් පිරිනිවන් නො පෑ, දෙතිස්කුණප කොටසින් යුක්ත වූ පඤ්චස්කන්‍ධභාරය දෙතිස්මහාපුරුෂලක්‍ෂණයෙන් සාධා, පිළිකුල් පැටි කොට ගෙණැ, එබර උසුලා, ගම්නියම්ගම්රාජධානියෙහි ඇවිද සත්ත්වයන්ට වැඩ කරන්නාහ. තමන් වසන විහාරය දිශාවට නැඟු පය නැවැතැ සතර අපාය දිශාවට නැඟී යා නො දෙන්නාහ. තමන් දිශාවට නැඟු අත නැවැතැ අනුන් දිශාවට නැගියැ නො දෙන්නාහ. තමන්ගේ විහාරයෙහි තණගැටක් නෙළාපියන්නට දික් කළ අත නැවැතැ අනුන් දිශාවට සිහන පිණිස දික් කට නො දෙන්නාහ. තමන්ගේ ශ්‍රීපාදයට නැමූ හිස නැවැතැ

Non-Commercial Distribution

අනිකක්හුගේ පාදමූලයට නැමියැ නො දෙන්නාහ. තමන් දිශාවට නැමූ සිත තිවන්රස පුරා දෙන්නාහ. තමන් බලා සතුටුකඳුළු ගත් ඇසට දුකින් වන කඳුළක් වැද්ද නො දෙන්නාහ. තමන්ගේ ගුණයට සාධුකාර ගත්තවුන්ගේ තුඩට කිසි ශොක විලාපයක් වැද්දැ නො දෙන්නාහැ. තමන්ගේ බස් ඇසූ කණට 'අනුව, බඳුව, ගණුව, මරව' යනාදි බස් වැද්ද නො දෙන්නට තුමූ මැ එහි රකවල් ගන්නාහ. තමන්ගේ ගුණ සිහි කිරීමෙන් ලොමුදහ ගත් ශරීරය සසර පමණින් හයින් ලොමුදහ ගත නො දෙන්නාහ. මරහට වඩා බලවත්හ. සසරට වඩා මහත්හ. පසේබුදුනු දූ නොවියත් කළ වියත්හ. මේ ආදී වූ අනන්ත ගුණයෙන් සම්පූර්ණ වූ ශාක්‍යසිංහ වූ දශබලධාරි වූ අනාවරණ ඥාන ඇති, චතුවෛශාරද්‍යාවිශාරද වූ, අවීචියෙහි පටන් ගෙණැ භවාග්‍රය දක්වා, භවාග්‍රයෙහි පටන් ගෙණැ අවීචිය දක්වා, සියලු ලෝ වැස්සන් ගත්තා වූ "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොති" යන කීර්ති ඝොෂායෙන් දශදිග්භාගය එකකොලාහල කැරැවූහ. කරුණායෙන් ලොකොත්තර වූ ප්‍රඥායෙන් අසාධාරණ වූ මෛත්‍රියට කුලදෙවතා වූ ස්වාමිදරුවාන කෙනෙක් ලොකයෙහි ඉපැදැ වදළසේක. ඒ ස්වාමිදරුවානන්ගේ ශ්‍රීපාදය මෙනුවරට දික් කළ හොත් ඒ ශ්‍රීපාදය පිළිගන්නට නැහෙන්නා වූ ආශ්චර්‍ය්‍යපද්මයෙහි සුගන්ධයෙන් මැ මේ කුණපගන්ධ තාක් පැටි වැ යන්නේ යැ. ඒ ස්වාමිදරුවානන්ගේ හිසට කුඩ ගෙණැ ආ මහාබ්‍රහ්මයෝ ය, සක් පිඹැ ගෙණැ ආ ශක්‍රයෝ යැ යන මහෙශාඛ්‍යදෙවතාවන්ගේ සන්නිපාතයෙන් මේ මනුෂ්‍යමාංසභක්‍ෂණය කරන්නා වූ හීන වූ භූතපිශාචකයෝ තුමූ මැ තමන්ට ප්‍රලය වන්නාහැ. උන් පිරිවරා ආ වැසිවලාදෙවියෝ මැ ශතපටලසහස්‍රපටලයෙන් මහවැසි වස්වා මේ මුළු නුවර සෝධා, ශුද්ධකරන්නාහු යැ. එසේ හෙයින් ඒ ධර්මචක්‍රවර්ති ස්වාමීන්වහන්සේ මැ අපගේ දුක් නිවන පිණිස මෙට වඩා එන්නා කැමැත්තම්හ"යි දැන්වූහ.

එසේ කියන්නවුන්ගේ බස් හැමදෙන මැ 'යහපතැ"යි ගිවිසැ "දැන් ඒ ස්වාමිදරුවානන්වහන්සේ කොයි වැඩැ වසන සේක් දැ"යි විචාළහ.

Non-Commercial Distribution

එසමයෙහි සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ වස් එළඹෙන කාලය ආසන්න වූ හෙයින් තමන්වහන්සේගේ ප්‍රථමදර්‍ශනයෙහි මැ ධර්‍මදෙශනා අසා එක්ලක්‍ෂදශදහසක් බ්‍රාහ්මණගෘහපතීන් හා සමඟ අමාමහනිවන් දුටු බිම්බිසාරරජ්ජුරුවන්ට ප්‍රතිඥා දී රජගහානුවර නිසා වෙළුවනමහා විහාරයෙහි වැඩවසනසේක. එපවත් ඇසූ විශාලාමහනුවර වසන්නා වූ ලිච්ඡවිරජදරුවෝ බිම්සරරජ්ජුරුවන් හා සමඟ බණ අසා සෝවාන් වූ මහාලි නම් ලිච්ඡවිකෙනකුන් හා පුරෝහිතයන්ගේ පුතනුවන් හා කැඳවා "තෙපි බොහෝ පඬුරු සරහා ගෙණැ, රජගහානුවරට ගොස්, පඬුරු පෑ දීලා, අපගේ රාජ්‍යයට වූ තුන්උපද්‍රවයන් කියාලා, සර්වඥයන් වහන්සේ වැඩියැ හොත් මුත්, ඒ නො සන්සිඳෙන බව කියා, රජ් ජුරුවන් ගිවිස්වා ගෙණැ, සර්‍වඥයන්වහන්සේ වඩා එව"යි යැවූහ. ඔහු ඒ පඬුරු ගෙණැ ක්‍රමයෙන් ගොස්, රජගහා නුවරට වැද, රජ්ජුරුවන් දකැ, ගෙණැ ගිය පඬුරු දී, එපවත් දන්වා 'සර්‍වඥයන්වහන්සේ අපගේ නුවරට වඩනා පිණිස ආරාධනා කළ මැනැවැ'යි දන්වූහැ.

පෙර මේ සර්‍වඥයන්වහන්සේ බොධිසත්වභූමියෙහි සිටි කලැ පොවා ජම්බුද්වීපයෙහි එක්සියක් රජදරුවෝ ඔවුන්ගේ ධර්‍මදෙශනාවෙහි පෙලෙඹී, පූර්ණක නම් යක්‍ෂසෙනාධිපතිහු ඔවුන් හැරගෙණැ ගිය කල්හි, ඔවුන්ගේ විරහය ක්‍ෂමා කොට ගත නො හී "සත් දවසක් ඇතුළතැ අපගේ පණ්ඩිතයන් නුදුටුමෝ නම්, ගිනි වැද මියම්හ"යි සැරසුනහ. බොධිසත්වභූමියෙහි විධුරපණ්ඩිත වැ සිටියා වූ ස්වාමිදරුවානන්ගේ ධර්‍මයෙහි රස දත් පෘථග්ජන රජදරුවන් පවා ඔවුන්ගේ විරහය ක්‍ෂමා කොට ගත නො හී "ගිනි වදුම්හ"යි කියන කලැ දන් සවාසන සකල ක්ලෙශයන් නසා බුදු වූ ස්වාමිදරුවානන්ගේ ධර්‍මදෙශනා අසා, අමාමහනිවන්හි රස දත්තා වූ මේ රජ්ජුරුවෝ තමන්ගේ නුවරින් සර්‍වඥයන් වහන්සේ වඩා යන්නට අනුදනිති යනු කවර නම් බසෙක් ද? එසේ හෙයින් 'තොපට නුගුණෙකැ'යි[1] කියා තුමූ එබස් නො අනුදත්හ.

ඉක්බිති එබස් ඇසූ මහාලීලිච්ඡවිරජ්ජුරුවෝ බිම්සර රජ්ජුරුවන් උපෙක්‍ෂක වූ බව දනැ "මේ රජ්ජුරුවන් නො අනුදත් හෙයින් කිම් ද? පරදුඃඛයෙහි කම්පා ඇත්තෝ සර්‍වඥයන්වහන්සේ මුත් නැත්තෝ වේ ද?"යි සිතා, වැඩැ හුන්නා වූ වෙළුවන විහාරයට ගොස්, ශ්‍රීපාදය වැඳ සිටි කල්හි, සර්‍වඥයන්වහන්සේ ආගන්තුකයන්ට සුදුසු මධුරකථා කොට වදරා, "ආ කම් කිම් ද?"යි විචාරා වදළ කල්හි, "ස්වාමීනි, විශාලාමහානුවර දුර්භික්‍ෂභය යැ, යක්‍ෂභය යැ, රොගභය යැ යි

1. අගුණෙකැයි.

Non-Commercial Distribution

තුන්භයෙක් ඇති වි යැ. ඒ භයින් පීඩිත වූ විශාලාමහනුවර ලිච්ඡවි රජදරුවන් ප්‍රධාන කොට ඇත්තා වූ සියලු පෂිද "මේ උපද්‍රව කෙසේ සන්හිඳුවමෝ ද?"යි මන්ත්‍රණය කොට, නොඑක් පරිද්දෙන් ප්‍රතිකාර කොට, නොසන්සිඳෙන හෙයින්, මෙ කී තුන් භයට ස්වාමීන් ඇතුළු වූ තුණුරුවන් සරණ කොට දුටිහැ. එහෙයින් පරාත්ථිය පිණිස සන්නද්ධ වූ ස්වාමිදරුවානන් කරුණායෙන් වැඩැ වදරත් කලැ"යි දැන්වූහ.

ඉක්බිති සර්වඥයන්වහන්සේ ඔවුන්ගේ බස් අසා "මා ඔබ ගිය කල්හි කෙසේ වූ අර්ථසිද්ධියෙක් වේ දෝ හෝ"යි පරීක්‍ෂා කොට වදරණසේක් "මා විශාලාමහනුවරට ගොස්, රත්නසූත්‍රය දෙසූ කල්හි, ඒ රත්නසූත්‍රයෙහි එකිඑකී ගාථාවෙන් වන්නා වූ ආරක්‍ෂාව කෙළලක්‍ෂයක් සක්වළැ පැතිර සිටිනේ යැ. ඒ සූත්‍රය දෙශනා කොට අන්තයෙහි සුවාසූදහසක් ප්‍රාණීන්ට අමෘතමහානිර්වාණය සිද්ධවන්නේ යැ. ඒ තුන් භය සන්සිඳෙන්නේ යැ"යි දැකැ වදරා, ඔවුන් ආරාධනා කළ ගමන අනුදැනැ වදළසේක. එක් සත්ත්වයකුටත් වන ඉෂ්ට තකා, දික් කළ අතක් වක් නො කරණ තුරු ගොස් බඹලොවැ පැණී යන්නා වූ මහාපුරුෂයානන් වහන්සේ දැන් මෙතෙක් සත්ත්වයන්ට වන ඉෂ්ට තකා ඒට වැඩම අනුදනිති යනු කවර ආශ්චර්‍ය්‍යයෙක් ද? ඉක්බිති බිම්සර රජ්පුරුවෝ සර්වඥයන්වහන්සේ ආරාධනාව ඉවසා වදළ බව අසා, සර්වඥයන් වහන්සේ කරා ගොස්, "ස්වාමීනි, විශාලාවට වැඩම අනුදැනැ වදළේ ඇද් දැ?"යි විචාරා "එසේ යැ, මහරජ"යි වදළ කල්හි, "ස්වාමීනි, එසේ වුව හොත්, මා වඩනා මහ සරහා ලන තුරු හැම්මී වදළ යහපතැ"යි දන්වා, රජගහා නුවර හා ගඞ්ගාව හා දෙමැද පස්යොදනක් පමණ මහ එක පැහැර සම කරවා, යොදනෙහි යොදනෙහි විහාර කරවා "ස්වාමීනි, ඉනිබ්බ වඩනා කලැ"යි දැන්වූහැ.

ඉක්බිති සර්වඥයන්වහන්සේ ස්වාර්ථයෙහි කළ නිරපෙක්‍ෂතායෙන්, පරාර්ථයෙහි කළ අභිලාෂයෙන්, පරදුඃඛයෙහි කළ අනුකම්පාවෙන්, පුරුදු වැ ආ ධාර්මිකත්වයෙන්, 'මෙතැන්හි සතරපස සුව සේ ලැබෙ'යි සිතා එක් තැනෙක්හි නො කළ ආශාවෙන්, හුදු සත්ත්වයන්ට මැ වැඩැ පිණිස මැ පවත්නා වූ කාය වාඞ් මනඃ ප්‍රයොගයෙන් 'විශාලාමහනුවර දුඃඛිත වූ සත්ත්වයන්ගේ සතුටු මුහුණක් බලාපුව' යන මනදෙළින් පන්සියක් භික්‍ෂූන් වහන්සේ පිරිවරා මහට පිළිපන්සේක.

ඉක්බිති රජ්පුරුවෝ ඒ ඒ විහාර අතුරෙහි සර්වඥයන් වහන්සේ වඩනා පස්යොදනක් පමණ මහෙහි පය ඔබාලූ කල දණ දක්වා එරී යන පමණින් පස්වණක් පියුමෙන් හෙබියා වූ නොයෙක් ජාතියෙහි

Non-Commercial Distribution

සුවදමල් ඉස්වා ධ්වජ, පතාකා, කෙහෙල්, තොරණ යැ, පූර්ණකලස යැ යනාදීන් මහ සද, බුදුන්වහන්සේට සේසත් මත්තෙහි සේසත් බැගින් දෙසේසතක් ධරා, එකිඑකී භික්‍ෂූන්වහන්සේට එකිඑකී ශ්වෙතච්ඡත්‍ර බැගින් ලවා, ගඳ දුම් මල් පහන් ආදීන් පූජා කරන්නාහු, දවසින් දවස එකිඑකී විහාරයෙහි වස්වා, පන්සියක් පරිවාරයෙන් යුක්ත වූ ස්වාමීන්ට දවස් පතා මහදන් දී, පස් දවසෙකින් ගංතෙරට වඩා ගොස් එතැන්හි සිටැ වඩනට සුදුසු වැ හොරුහඟුළු ඉදි කරන්නාහු, පූජාසත්කාර ගෙණැ අවුත් තමන්ගේ නුවරට ස්වාමිදරුවානන් වහන්සේ වඩා ගොස්, අභිමතාත්‍ර්ථය සැධූව මැනැවැයි හසුන් දුන්හ.

ඒ අසා විශාලාමහානුවරැ ඇත්තෝ "අපගේ උපද්‍රව දුරු කරන්නට වඩනා ස්වාමිදරුවාණන්ට කරණ පූජා අපට මැ අවශ්‍ය බව මුත්, තමන්ට කවර අවශ්‍යයෙක් ද? අප වුන් දුක් වූ නියාවට ද, එයට සුදුසු වූ වහලක් කවරද ලබමෝ දෝ හො!යි අප ගත් සිතිවිලි වූ නියාවට ද, 'සර්‍වඥයන්වහන්සේ වැඩිසේක' යන බස් අසා අපට වූ සතුටු නියාවට ද සුදුසු කොට, අප ශක්ති පමණින් පූජාකරම්හ"යි විශාලාමහානුවරැ හා ගඞ්ගාව හා දෙමැද තුන් යොදනක් පමණ බිම එක පැහැරැ සම කොට, සර්‍වඥයන්වහන්සේට කුඩමත්තෙහි කුඩ සතරක් හා, තෙසු පරිවාර භික්‍ෂූන්වහන්සේ කෙරෙන් එකිඑකී වහන්සේ කෙනෙකුන්දැට කුඩමත්තෙහි කුඩ දෙක බැගින් මෙසේ පූජා සරහා ගෙණැ, දවසක් මුළුල්ලෙහි සයින් සිටි වස්සා දුරැ එන මවුදෙන අභිමුඛයට යුහු[1] වැ දිවන්නා සේ ද, මීවදයෙක්හි ඉව ඇසූ බමරුන් එතනට වෙගයෙන් ඔවුනොවුන් පරයා දිවැගන්නා[2] සේ ද, ඝර්‍මයෙන් සන්තප්ත වූ හස්තීන් ප්‍රසන්න වූ මධුර වූ අතිශීතල වූ ජල ඇති වනවිලට මධ්‍යාහ්නසමයෙහි දිවැගන්නා[2] සේ ද, පිපාසිත වූ වැසිලිහිණියන් මෙඝනාදය අසා මෙඝ කූටයට උන්මුඛ වැ දිවැ ගන්නා[2] සේ ද, මස්[3] ගැසූ තෙනට එක හෙළා දිවැගත් මහමස්කැලයක් සේ ද, පද්මයෙහි සුගන්ධය අසා පියුම්විලට දිවැ ගත්තා වූ රාජහංසකැලයක් සේ ද, සත් රුවන් පිරුණු බිලයෙහි දෙර හැරී ගිය ශබ්දය අසා එදිගට උන් මුඛ වැ දිවැගත්තා වූ දරිද්‍ර වූ ධනාර්ථීන් සේ ද, චුම්බකපාෂාණ මුඛයට හැසි[4] යන්නා වූ ලොහධාතු සේ ද, වෙහෙල්ලට[5] දිවැ ගත්තා වූ ජලප්‍රවාහයක් සේ ද, කිරිබරතනයෙන් යුක්ත වැ එන්නා වූ මවුන් අභිමුඛයට දිවන්නා වූ කුමාරයන් සේ ද, නිධාන තුබූ තැනට බස්නා අරළුවක් සේ ද, මධුර වූ දිව්‍යරූපාදි-

1. නිසරු.　2. ගත්තා.　3. මත්මස්.
4. ගැවැසි.　5. බැහිල්ලට & පිහිල්ලට.

Non-Commercial Distribution

ආලම්බනයට දිවන්නා වූ චක්ෂුරාදිඉන්‍ද්‍රියයන් සේ ද, සගෞරව වැ සස්නෙහ වැ සාභිලාෂී වැ දිවෙමින්, බුදුන් වැඩිබව කියන්නට නික්මුනාක් මෙන් ගඟ පැනැ ගෙණැ මෙතෙරෙහි පැණීගියා වූ සවණක් ඝන බුදුරස් දක්මින් මැ, දුටුදුටුතන්හි මැ වැඳ පෙරළෙමින්, සොම්නස්හි ගැලෙමින්, 'අපගේ මනොරථය පිරිණැ'යි යන හෂීයෙන්[1] තුන් යොදනක් පමණ තැන් තුන්පියවරෙකින් නික්මෙන්නා සේ යුහු වැ අවුත් තමන්ගේ සීමායෙහි ගංගාතීරයෙහි රැස් වැ එතෙර වැඩැ හුන් ස්වාමිදරුවාණන් දිශාවට වැඳ ගෙණැ හොත්හැ.

ඉක්බිති බිම්සරරජ්ජුරුවෝ හොරු දෙකක් එක් කොට බැඳ, එහි මණ්ඩපයක් කරවා විචිත්‍ර වූ කුසුමයෙන් ඒ මඩුව සද, සත්රුවන්මය වූ බුද්ධාසනයක් පැණැවූහ. ඉක්බිති සර්‍වඥයන් වහන්සේ තමාගේ රශ්මීන් රැඳීගිය යුගන්ධරපර්‍වතමස්තකයට පැනැ නැඟී තරුණ සූය්‍ය්‍යීමණ්ඩලය සේ දිලියෙමින් පැණවූ ආසනයෙහි වැඩැ හුන්සේක. භික්‍ෂූන්වහන්සේ ද නැවට නැඟී සර්‍වඥයන්වහන්සේ පිරිවරා වැඩැ හුන්සේක. ඉක්බිති බිම්බිසාර රජ්ජුරුවෝ ද කරවටක් පමණ දියට බැසැ, දෙහොත් මුදුනෙහි තබා ගෙණැ "ස්වාමීනි, යම් තාක් වැඩැ වදරණ සේක් ද, ඒ තාක් මෙහි මැ වෙසෙමි"යි දන්වා නැව යවා, තුමූ නැවැත්තාහ. ඉක්බිති සර්‍වඥයන්වහන්සේ ද යොදනක් පමණ තැන් ගංගාවෙන් වැඩැ විශාලාමහනුවරවාසීන්ගේ හිමට පැමිණිසේකැ. ඉක්බිති විශාලා මහනුවර ලිච්ඡවිරජදරුවෝ ද "අපගේ දුක් නැති කරණ පිණිස කරුණායෙන් වැඩියා වූ ස්වාමිදරුවන්ට පෙරගමන් කරම්හ"යි කරවටක් පමණ දියට ගොස්, නැව ගොඩට ඇදැ සර්‍වඥයන්වහන්සේ ගොඩට බහා ගත්හැ.

ස්වාමිදරුවන් නැවින් බැසැ ශ්‍රීපාදය ගොඩ ස්පර්‍ශ කළ විටැ මැ, "තමන්වහන්සේගේ සිතින් රාග නැමැති කුණපයක් වත් ද්වේෂ නැමැති කුණපයක් වත් මොහ නැමැති කුණපයක් වත් නො ගෙණැ වැඩියා වූ ස්වාමිදරුවන්ගේ එබඳු වූ අටතුරාසියක් මංගල ලක්‍ෂණයෙන් යුක්ත වූ, කුමාරකාලයෙහි පොවා 'වඳවන්නට යැ'යි ගෙණ ගිය කාලදෙවලයන්ගේ මුදුනෙහි සැතැපී ගියා වූ, ඒ ආශ්චය්‍ය්‍යී දුටුවා වූ ශුද්ධොදන රජ්ජුරුවන්ගේ මුදුනට මුදුන්මල් වූ, ස්වාමිදරුවන්ගේ ගුණයෙහි ප්‍රසන්න වූ කොසලයන් තමන්ගේ මුහුණ තබා සනහා නො විඩා වූ, කිපී දිවැ ගෙණැ ආවා වූ අංගුලිමාලයන් අන්තයෙහි ස්වාමිදරුවන්ගේ ධර්‍මය අසා වැඳ ගෙණැ හොත් කල්හි ඔහුගේ සිතැ පහළ වන්නා වූ ලොකොත්තර ධර්‍ම නැමැති චන්‍ද්‍රොදයයට උදයසන්ධ්‍යාරාගයක් බඳු වූ

1. අදහසින්.

Non-Commercial Distribution

රත්පැහැයෙන් උජ්ජ්වලිත වූ, මරන්නට මෙහෙයූ තන්හි වැඳ ගෙණැ හොත්තා වූ ධනපාලයාගේ මුදුන්හි සිඳුර ගල්වා ඉතිරි කළ සිඳුරමලා දෙකක් බඳු වූ, රාත්‍රියක් මුළුල්ලෙහි උපක්‍රම කොට කිසි උපද්‍රවයක් කොට ගත නො හී අන්තයෙහි වැඳ ගෙණැ හොත්තා වූ ආලවක නැමැති රාජහංසයා විසින් සුඹුනා ලද රක්තපද්මයක් බඳු වූ, කිහිරඟුරාදෑහි ගිනිවළ පළා ගෙණැ නැඟි පියුමෙන් පිළිගන්නා ලද්ද වූ, මෙරට දික් කළ හොත් එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් පමණ මහමෙර තමහට නැමී අවුත් පිළිගන්නා වූ, සියක් තල් පමණ ප්‍රපාතයකට දික් කළ හොත් ඒ කඹුරුසමක් සේ පිරී බෙරඇසක් සේ සම වැ පිළිගන්නා වූ, අනවරතයෙන් වඳනා වූ ශක්‍රයාගේ පරසතුමඳරාමල්දම්හි රෙහෙණුයෙන් නිරන්තරයෙහි රැඳී තිබෙන්නා වූ, බ්‍රහ්මයාගේ මුදුනෙහි පිහිටා එයට 'උත්තමාංගය' යන නම සාර්ථක කළා වූ, සාරාසංඛ්‍යකප්ලක්‍ෂයක් මුළුල්ලෙහි 'අසත්පුරුෂයන් කරා යෙමි'යි දික් නො කළා වූ, සත්පුරුෂයන් කරා එළඹැ නො විඩා වූ, මුළුලොවට මුදුන්මල් වූ, ඒ ශ්‍රීපාදය පහරණ බිමැ කුණපයක් තිබෙන බව සුදුසු නො වන්නේ වේ ද?''යි කියා ගර්ජනා කරන්නාක්හු මෙන් ගම්භීර වූ නාද පවත්වන්නා වූ, සර්‍වඥයන් වහන්සේ වඩුත් මැ විශාලාමහනුවරැ තුන් උපද්‍රව විදිනට දෙවතාවන් ගත් දුනු බඳු වූ ඉන්‍ද්‍රචාපයෙන් ගැවැසී ගත්තා වූ, විශාලාවාසීන්ගේ සිත්හි ශොකය කඩ කඩ කොට කපා හරණට වැසිවලාදෙවියන් ගත්තා වූ කඩු බඳු වූ අනන්ත වූ විජ්ජුල්ලතායෙන් හොබනා වූ, ගොඩෙහි ශ්‍රීපාදය තුබූ විටැ මැ සර්‍වඥයන්ට වැසිවලාදෙවියන් දැමූ කුසුමාඤ්ජලියක් සේ ආකාශමණ්ඩලයෙහි විසිරැ ගිය කොක් පෙළින් යුක්ත වූ, මහාමෙඝයෙක් නභා, තෙමෙනු කැමැත්තන් තෙමා, නො තෙමෙනු කැමැත්තන් නො තෙමා වැසැ, දණක් පමණ උඩුකළවයක් පමණ හිනිමසක් පමණ වතුරු හෙළා සියලු රාජධානියෙහි කුණප තාක් සෝධා ගඞ්ගායෙහි ලා පී යැ.

ඉක්බිති සියලු විශාලාපුරයෙහි භූමිභාගය පරිශුද්ධ වියැ. ඉක්බිති ලිච්ඡවී රජදරුවෝ මෙ මැ සලකුණෙන් තමන්ගේ මනොරථය සිද්ධ වන බව දැනැ. නියත කොට උපන් සොම්නසින් ස්වාමීන් වඩා යන්නාහු, යොදනෙහි යොදනෙහි මහාපූජාවෙන් වාසය කරවමින් මහදන් දී, තුන් දවසෙකින් තමන්ගේ නුවරට වඩා ගියහැ. එසමයෙහි "සියලු භය සන්සිඳුවන්නා වූ රතනසූත්‍රය ලොවට පහළ කරන්නට යැ යි වඩනා වූ ස්වාමිදරුවන්ගේ බුද්ධ විලාසය බලමි''යි සැරැහී දෙදෙව්ලොවැ දේවතාවන් හා සමග ශක්‍රදෙවෙන්‍ද්‍ර ද අවුත් වඩනා පෙරමහැ රැස් වී යැ. ඉක්බිති මහෙශාක්‍යදෙවතාවන් රැස්වත් රැස් වත් චන්‍ද්‍රොදයයට බිඳෙන්නා වූ අන්ධකාරය සේ යක්‍ෂයෝ බිඳී පලන්නට පටන් ගත්හැ.

Non-Commercial Distribution

ඉක්බිති ස්වාමිදරුවෝ සවස්වේලෙහි නුවරදෙරට පැමිණැ, මුළුලොව සනහමින් වැඩැ සිටැ, හංසජාතියෙකි මලැ බැඳී සිටියවුන්ට තමන් නො බැඳී සිටැ දිවි දී තමන්වහන්සේට වූ උපද්‍රව දුරු කළා වූ, රන්වන්කකුළු වැ ඉපැද තමන්වහන්සේට උපද්‍රව කළා වූ කපුටුවා හා සර්පයා හා නළින් ගෙණැ, ගිය ජීවිතය පෙරළා දෙවා මිත්‍රධර්මය රක්‍ෂා කළා වූ, ජුණ්හජාතකයෙහි බොහෝ විශ්වාසයක් තබා පියා උරයෙන් උරය සැටුනුමාත්‍රයට තමන්වහන්සේ අතින් ගම්වර පසෙකැ, මිඩියෝ සියයෙකැ, ගෙරි සත්සියයෙකැ යනාදීන් නොයෙක් උපාකර ලද්ද වූ, තමන් වහන්සේ අස් වැ ඉපැද සත් රජ්ජුරුකෙනෙකුන් සාධා අන්තයෙහි ප්‍රාණ පරිත්‍යාග කොට රාජ්‍යදනයෙන් උපකාර කළා වූ, මෙසේ ජාති ජාතියෙහි පුරුදු වූ ගුණ ඇති, දන් මේ අන්තජාතියේ තමන්වහන්සේට උපස්ථාන කරන්නවුන් කෙරෙහි අග්‍ර වූ, බහුශ්‍රැතයන් කෙරෙහි අග්‍ර වූ, තමන්වහන්සේ වදළ සුවාසූදහසක් ධර්මස්කන්ධ නැමැති භාණ්ඩාගාරය නො නසා රක්‍ෂා කොට සිටියා වූ ධර්මභාණ්ඩාගාරික වූ, තමන්වහන්සේ මරන්නට හළ ධනපාලයා අභිමුඛයෙහි ප්‍රාණය පරිත්‍යාග කොට සිටැ පොළොව පෙරළා පස්සෙහි තබාපියන තුරු පසු නො බටුවා වූ, ස්නේහයෙන් හා පක්‍ෂපාතකමින් යුක්ත වූ අනඳමහතෙරුන් වහන්සේ කැඳවා, මහානුභාව ඇති මහරජක්හු තමා පස්සෙහි සිටි මුඛ්‍යයොධයක්හු අතට තමාගේ ආයුධය දී ඔහු ලවා ශත්‍රුසේනාව බිඳුවන්නා සේ, තමන්වහන්සේ නුවරින් පිටතැ වැඩැ සිටැ තමන්වහන්සේ වදළා වූ සදධර්ම නැමැති ආයුධය ඔබට[1] දී, එබ ලවා මැ මේ තුන් උපද්‍රවය දුරු කරවා ස්ථානොචිත වූ කටයුතු දන්නා ස්වාමිදරුවෝ තමන් වහන්සේත් නො වැඩැ, අග්‍රශ්‍රාවකයන් දෙදෙනාවහන්සේ ඇතුළු වූ සෙසු ක්‍ෂීණාස්‍රවයන්-වහන්සේවරුන්ද කෙරෙන් ද එක් කෙනෙකුනුදු නො යවා, සියලු නිත්‍යපරිවාර පන්සියක් දෙනා වහන්සේ අතුරෙන් ලද ගුණයෙන් හැමදෙනාවහන්සේට අඩු වූ, ගඳකිළිය හැමැදලා හිඳිනාවහන්සේ කෙනෙකුන් ලවා ඒ උපද්‍රවයන් සන්සිඳුවා වදළසේක" යන කීර්තිය කල්පාන්තස්ථායි කරණ පිණිස, "ආනන්දය තෝ මේ රතනසූත්‍රය ඉගෙණැ ගෙණැ, ලිච්ඡවි රාජකුමාරයන් හා සමග මේ විශාලාමහනුවරැ තුන්පවුරුවළල්ල ඇතුළෙහි ඇවිද පිරිත් බණ"යි වදළසේක.

ඒ අසා සකලලොකයට ආනන්දකර වූ ආනන්දමහාස්ථවිරයන්වහන්සේ සර්වඥයන්වහන්සේ විසින් වදළ ඒ රතනසූත්‍රය ඉගෙණැ-එ මැ ස්වාමීන්ගේ ශෛලමය වූ, සතරවරම්මහරජදරුවන් දුන් පාත්‍රයෙන් පැන් හැරැ ගෙණැ

1. ඔහුට.

Non-Commercial Distribution

නුවරදෙරකඩැ සිටි සේක්, එ මැ සර්‍වඥයන්වහන්සේ සුමෙධතාපසකාලයෙහි කළා වූ ප්‍රණිධානයෙහි පටන් රැස් කළා වූ නොයෙක් ගුණ සම්භාරය සිහි කොට "මාගේ ස්වාමිදරුවෝ 'සමතිස්පැරුම් නැමැති මහාසාගරය පිහිනා ගොඩ දක්මි' යන මහාපරාක්‍රමයෙන් දීපඞ්කරපාදමූලයෙහි දී පීනුවෝ සාරාසංඛ්‍යකප්ලක්‍ෂයක් මුළුල්ලෙහි නො හැරැ පීනා, අන්තයෙහි බෝමැඩැ වජ්‍රාසන නැමැති සුපටුන්ගොඩට පැනැ නැඟී සසරසයුරෙහි තෙර පත් වැ, අසාධාරණ වූ පාරමිතාවෙහි කුළු ගත්හැ. අංගපරිත්‍යාග යැ, ජීවිතපරිත්‍යාග යැ යනාදි වූ පංචමහාපරිත්‍යාග කරන්නෝ ඒ ගන්නවුන් හැරැ ගණුත් මාගේ යැ යන ලොභය බලත්, තමන්ගේ 'දීපුව මැනැවැ' යන ලොභය එයට ද වඩා බලවතැ. එයට ද වඩා පංචමහාපරිත්‍යාග කළහැ. ලොකාර්‍ත්ථචර්‍ය්‍යා ආදි වූ ත්‍රිවිධ අර්‍ථචර්‍ය්‍යාවෙන් ශූන්‍ය වූ ජාතියක් බලු වැ ද වටුවැද කවුඩු වැ ද නොලත්හ. මුහුකළා වූ ඵලය අග අත්තෙන් බිමැ හී බිමැ සිටියවුන්ට ප්‍රයොජන සැදුවා සේ පශ්චිමභවයෙහි තුෂිතභවනයෙන් ච්‍යුත වැ මනුෂ්‍යලොකයෙහි ඉපිදැ සියලු සත්ත්‍වයන්ට ප්‍රයෝජනවත් වූහ. සඳ නැහෙනකලැ සියලු ආකාශමණ්ඩලය ආලොක කොට ගෙණැ නැහෙන්නා සේ, තමන් මවුකුසින් බිහි වන කලැ සියලු දසදහසක් සක්වළැ එක පැහැරැ ආලොක කොට ගෙණැ උපන්හ. යශෝධරාවන්වහන්සේ ප්‍රධාන කොට ඇති සතළිස්දහසක් අන්තඃපුර ස්ත්‍රීන් විසින් හෙබියා වූ කිඹුල්වත්පුරය වැනි පුරයක් හැරැ පියා යන්නාහු, මිනිස්වෙස් ගත් යකින්නන් විසින් ගැවැසී ගත්තා වූ යක්‍ෂපුරයක් හැරැපියා යන්නා සේ නැඟී ගියහ. සහවුරුද්දක් මුළුල්ලෙහි මහාවීර්‍ය්‍ය කරන්නෝ කෙළදහසක් ඇතුන් රඳවාලන්නට සුදුසු වූ ඒ සා මහත් කායබලය, තමන්ගේ එක ශරීරය මතු රඳවා ගත නො හෙන පරිද්දෙන්, සියලු කායශක්තිය ගෙවා වීර්‍ය්‍ය කළහ. බොධිමණ්ඩලයෙහි වජ්‍රපර්‍ය්‍යඞ්කයෙහි වැඩැ හිඳැ, මරහු ලුහුබඳවන්නෝ මරහු දුටු ඉතිරියන් දිවන්නා සේ තමන් දුටු මරහු ලුහුබැඳවූහැ. ඉක්බිති සහස්‍රරශ්මීන් යුක්ත වූ සූර්‍ය්‍යයාගේ උදය ලත් යුගන්‍ධරපර්‍වතය සේ, අනන්තාපරිමාණ ගුණයෙන් විශිෂ්ට වූ සර්‍වඥතාඥනය ලදින් මොහාන්‍ධකාර විධ්වංසනය කළහ. නවසත්තාවාසයෙහි දුක් දුරු කරන්නා වූ නවලොකොත්තර ධර්‍මයන් සියලු ලොවට තමන් බෙදැ දෙන පරිද්දෙන් පළමු කොට ලදහ"යි මෙසේ සර්‍වඥයන්වහන්සේගේ අනන්තාපරිමාණ ගුණයන් සිහි කොට, "මෙසේ වූ ගුණ ඇති මහාපුරුෂයානන් වහන්සේගේ ගුණමහිමය[1] එල්බැ ගෙණ යැ මා මේ පිරිත් බණන්නේ යැ"යි නුවරට වැදැ, තුන්පවුරුවළල්ල ඇතුළෙහි රාත්‍රිය මුළුල්ලෙහි පිරිත් බිණූහැ.

1. ගුණමහිමාව.

Non-Commercial Distribution

ඔවුන් පළමුවන ගාථාවෙහි "යං කිඤ්චි" යන පදය සෙල්වූ විටැ මැ යම්කිසි යක්කෙනෙක් නැති වූහැ. යම්කිසි දුඃඛයෙකුත් නැති වී යැ. තුන්වන ගාථායෙහි පටන් රිදීබුබුලු වැනි ඉසිනා පිරිත්පැනින් විසුරුණු ජලබින්දු රොගීන්ගේ ශරීරයෙහි හෙන්නට වනැ. සර්‍වඥයන්වහන්සේ වැනි ලොකස්වාමිකෙනෙකුන් ශාන්ති පිණිස වදළ සූත්‍රයක් වුව, ඉගෙණැ ගෙණැ පිරිවහන්නත් අනඳ මහතෙරුන්වහන්සේ වැනි වියත් කෙනෙකුන් වුව, පැන් ඉස්නා පත්සාළිස්හවුරුද්දක් ස්වාමීන්ගේ ශ්‍රීහස්තයෙන් පිරිමසා අහර වළඳන්නට තිසි වූ පාත්‍රයක්[1] වුව, ස්වාමිදරුවානත් ඒ පිරිත් බැණැ, පැන් ඉසුත් ඉසුත් මියන්නට හොත් රොගීහු, අනුන් වෙහෙසෙන්නට මළවෙස් ගෙණැ හොත්තවුන් ක්‍ෂණක්‍ෂණයෙහි සිඝ්‍ර නැගි සිටිනා සේ, ක්‍ෂණයෙහි නැඟී සිටැ, තෙරුන්වහන්සේ පිරිවරා ගෙණැ වදිමින් "ස්වාමීනි, සියලු සත්ත්‍වයන්ගේ දුක් හරණ ස්වාමිදරුවෝ නුඹ වැඩිද ද? ගැත්තවුන් විඳිනා දුක් ස්වාමිදරුවානත් ඇසට පැණිනි ද? යනාදි වූ මිහිරි බස් බෙණෙමින්, තමන්ගේ දුක් දුරු කළා වූ ඒ සර්‍වඥයන්වහන්සේ සිහි කොට "නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"යි දෙහොත් මුදුනෙහි තබා ගෙණැ වදිමින්, එ මැ විටැ මැ ඇති වූ කායබලයෙන්, එ මැ විටැ මැ ඇති වූ ශරීරපුෂ්ටියෙන්, එ මැ විටැමැ ඇති වූ මුඛශොභාවෙන්, එ මැ ශරීරයෙන් නො මියැ මැ දෙවතා වූවන් සේ පිළී හිස සිසාරමින් අපොළමින් කොක්සන් ගසමින් මහතෙරුන්වහන්සේ සිසාරා ගත්හැ.

"යං කිඤ්චි විත්තං" යන පදයෙහි පටන් ගෙණැ ඉසැලූ දිය බිඳු ඇඟැ හෙත් හෙත්, පළමු පලනා යකුන් හා කැටි වැ නො පලා සාහසික කොට සිටි යක්‍ෂයෝ වෛතරණීගඞ්ගාවෙහි ජල බින්දු ඉසීගිය නරකයේ සත්ත්‍වයන් සේ වෙවුලමින් පස්පස් බලමින් පිට හඹමින් ඔවුනොවුන් ගත නො හී එක හෙළා දිවැ ගත්හ. ඔවුන්ට වාසල්දෙර නො සෑහිත. එවිටැ කේලුමක් සා පමණ තැනින් සැත්තැ අසූදෙනකුන් නැඟී යන පමණ සියුම් අත්බවි නො මැවූහ යි නො සිතමි. එසේ වුව ද, තමන් පලන්නට මහදෙර නො සෑහෙත්, පවුරු බිඳ ගෙණැ, පදනම් බිඳ ගෙණැ, හිස් ලුලු දිග පැලැහ. සියලු භය ද ඔවුන් හා කැටි වැ ගියේ යැ. එසේ දුක් පත් වූ විශාලාමහනුවර අසුරයන් ජය ගෙණැ වැද ගිය දෙවතාවන් විසින් ගැවැසී ගත්තා වූ තව්තිසැහවනය සේ එක පැහැරැ සැදී ගියේ. එවැනි ලොකශාන්තියෙක් නො වේ නම්, ඒ ස්වාමිදරුවානෝ වැඩැහුන් තැතින් ශ්‍රීපාදය නහනදැ ද? "යං කිඤ්චි විත්තං" යනාදි වූ එතෙක් ගාථා බැඳ අනඳමහ තෙරුන්වහන්සේට

1. පාත්‍රයකින්.

Non-Commercial Distribution

උගන්වනදෑ ද? තමන්වහන්සේ වළඳන්නා වූ පාත්‍රය උන් වහන්සේ අතට දී වදරණුදෑ ද? එසේ හෙයින් "ලෝවැස්සන් සුවපත් කරම්හ"යි දුක් ගත්තවුන් මෙතෙක් ශාන්ති නො කරත් අතික් කවුරු කෙරෙද්ද?

මෙසේ උඩ අපොළන දෙවියන් විසින් හා, බිමැ අපොළන මිනිසුන් විසින් හා, කටැ කටැ සාධුකාරයෙන් හා, ආකාශයෙහි දිව්‍යභෙරියෙන් හා භූමියෙන් මනුෂ්‍යභෙරියෙන් හා, ආකාශයෙහි දිව්‍යගීතයෙන් හා භූමියෙහි මනුෂ්‍යගීතයෙන් හා ආකාශයෙහි දිව්‍යනෘත්‍යයෙන් හා, භූමියෙහි මනුෂ්‍යනෘත්‍යයෙන් හා, සියලු අහස්පොළෝ දෙක නිරන්තර වැ ගිය කල්හි, ජයපුරයකට වදනා මහරජක්හු සේ ස්වාමිදරුවෝ ඉන්ද්‍රඛීල පැනැ ගෙණැ ඇතුළට වන්හැ. ඉක්බිති ඖෂධතෙල් ඉසැලූ ක්‍ෂණයෙහි නිල් වූ මුහුද්‍ද දියකඳ මැඬැ ගෙණැ දිවන්නා වූ මහගිනිකඳක් සේ නිල් වූ බුදුරස් මත්තෙහි දිවැ ගත්තා වූ රන්වන්පැහැ මිශ්‍ර වූ රත්පැහැ කඳෙක් සියලු නුවර පුරා ගෙණැ සක්වළ මුවවිට දක්වා දිවන්නට වනැ. පිරිත්පැනට දිවෙමින් සිට යක්හු, පස්සෙහි දිවන්නා වූ ඒ රස් දකිමින් මුහුණින් හිහී දිවෙමින් සක්වළගල පැනැගෙණැ ඈත වැගිරැ ගියහ යි සිතමි. අතරතුරෙන් දිවන්නා වූ නානා ප්‍රකාර වූ රශ්මිජ් වාලායෙන් සියලු නුවර සදමින් ලිච්ඡවිරජ දරුවන් සද නිමැවූ සන්ථාගාරයෙහි මනොඥ වූ සප්තරත්නමය වූ බුද්ධාසනමස්තකයෙහි වැඩැ හුන්සේක. ස්වාමිදරුවන් ආසනයෙහි වැඩැ හිඳින්නා හා මැ ශ්‍රමණබ්‍රාහ්මණ-රාජකුමාරාදි නානාප්‍රකාර වූ පිරිස් බුදුන් පිරිවරා එහි මැ හුන්හ. ශක්‍රදෙවෙන්ද්‍රයා ද තමන්ගේ දෙදෙව්ලොවැ දෙවතාවන් හැරැ ගෙණැ සුදුසු තැනෙක්හි හිඳගත. ඉක්බිති තෙරුන්වහන්සේ සියලුනුවර පිරිත් කොට, රොගයෙන් මිදී තමන්වහන්සේ පිරිවරා ගත් මහජනයා ගෙණැ, අවුත් "ස්වාමීනි, ස්වාමීන්වහන්සේ ඇතුළු වූ රත්නත්‍රයෙහි බලයෙන් ජීවිත ලද්ද වූ ගැත්තෝ ස්වාමීන්වහන්සේ වඳිති"යි ඒ පිරිස් වඳවා, තමන්වහන්සේ ද ශ්‍රීපාදය වැඳ එකත්පස් වැ වැඩැහුන් සේකැ. සර්‍වඥයන්වහන්සේ හුන්නා වූ පර්‍ෂද බලා ස්ථානොචිත ධර්‍මදෙශනාවක් පරීක්‍ෂා කොට වදරා, සම්ප්‍රාප්ත වූ පර්‍ෂදට එ මැ රතනසූත්‍රය දෙසා වදළසේකැ. දෙශනාපර්‍ය්‍යවසානයෙහි සුවාසූ දහසක් ප්‍රාණීහු එක පැහැරැ අමෘතමහානිර්‍වාණයට වන්හ.

මෙසේ නැඟුනැඟු පියවරින් සිතුසිතු සිතින් කළ කළ දෙයින් වන්වන් තන්හි සිටිසිටි තන්හි හුන්හුන් තන්හි සියලු උපද්‍රව පහ කොට සියලු ශාන්ති ඇති තාක් නමා, ලොව්ලොව්තුරා සැපත් දී, සියලු ලොව සනහන්නා වූ මාගේ මැ ලයක් වැනි මාගේ මැ ඇසක් වැනි, මට මැ පිහිට වූ, මට මැ රක්‍ෂාස්ථාන වූ බුදුන් -පෙ- යා යුතු

Non-Commercial Distribution

## 102.

ඉක්බිති මෙසේ ලොකාත්ථියෙහි කුළු ගත් ස්වාමිදරුවානෝ තමන්වහන්සේගේ කරුණාබලයෙන් ඒ විශාලාමහනුවර ඇති වූ තුන් උපද්‍රව සන්හිඳුවා වදරා, පියුම් ඇති තාක් කල් විල්හි කෙළනා රාජහංසයක්හු සේ, කටයුතු වූ ලොකාත්ථි ඇති තාක් කල්හි මැ එක්තැනෙකැ වසන බැවින් 'විශාලාවෙහි කළ මනා කටයුතු මෙ පමණෙකැ'යි නිශ්වය කොට නැවැතැ රජගහා නුවරට වඩනා කැමැති බව ලිච්ඡවිරජදරුවන්ට සැළ කළසේක. ඔවුන් විසින් පූජාවිශෙෂ සැරහූ කල්හි, පන්සියක්දෙනාවහන්සේ පිරිවරා තුන්යොදුන් මහට පිළිපන්සේක.

ඒ ස්වාමීන්ගේ ගමන් නැමැති මහමුහුද කියමි. සාවධාන වැ ඇසියැ යුතු. නිල් වූ මුහුදුදිය පිටැ ඖෂධතෛලයෙන් දල්වාපු ගින්නක් සේ, නිල් වූ බුදුරස්මත්තෙහි දිවැගත්තා වූ රත් පැහැයෙන් මිශ්‍ර වූ රන්වන්පැහැ යැ; ඒ ප්‍රභාප්‍රවාහය අතුරෙහි චතුරු මැඩැ ගෙණැ දිවන්නා වූ ශ්වෙත වූ රශ්මිකලාප යැ; සාගරමද්ධ්‍යයෙන් පැනනැංගා වූ පූර්ණචන්ද්‍රමණ්ඩලයක් සේ ඒ රශ්මිමතුයෙන් පැණෙන්නා වූ ශ්‍රීමුඛයෙකැ; ඒ සදෙලු[1] මැඩිල්ලක් සේ ඒ මුහුණ සිසාරා සිටියා වූ ව්‍යාමප්‍රභාමණ්ඩල යෙකැ; ඒ මුහුදු මැද පිහිටා සිටි සත්රුවන් මහමෙර සෙයින් විස්මය වූ බුද්ධරශ්මි නැමැති මහමුහුදැ පිහිටියා වූ අනවලෝ මුදුන් නැමැති මහමෙර යැ; ඇළලී ගිය මුහුදෙහි ගැලෙන මහනැව් සේ ඒ උද්දම වූ බුද්ධශ්‍රීයෙහි ගැලී ගියා වූ ඇසැතිය වුන්ගේ ඇස් යැ; කෙළසුවහස්වළලු හී කෙළනා වූ සක්මස්කැල සෙයින් පිරිළි හී නටන්නා වූ ශ්වෙතච්ඡත්‍ර යැ; සාගරයෙහි රළ වැළ මැඩැ ගෙණැ දිවන ඇත්මසුන් සේ අභිමුඛයෙහි සම්වැට[2] දිවන අශ්වසෙනාව දෙබෙහෙ කොට ගෙණැ දිවන්නා වූ මතැත් පෙළ යැ; සමුද්‍රය ඇතුළතැ දියරැළි කපා ගෙණැ දිවන්නා වූ මහතල්මසුන් සේ බුදුරස්හි ගැලී ගෙණැ දිවන්නා වූ අනන්තා පරිමාණරථපන්ති යැ; දියෙහි ගැලෙමින් නැහෙමින් කෙළනා වූ මිනිස්මසුන් සේ, පවනින් සැලිසැලී අහස නැඟී බැසැ කෙළනා වූ දදපෙළ යැ; දිය ඇතුළෙහි බමන්නා වූ සමුද්‍රයෙහි වසන නාගරාජයන් සේ මදපවනින් පෙරැළී බස්නා දදපෙළ යැ; දක්ෂිණාවර්තශඞ්ඛශ්‍රී උසුලන්නා වූ ශ්වෙතචාමර යැ; ඇතුළුදියෙහි තුබූ රිදියෙන් මත්තෙහි සුදු වැ පෙණෙන්නා වූ දධිමාල නම් සමුද්‍රය සේ, නිරන්තරයෙන් එක්තැනෙක්හි වැටී හුනුවා වූ ඌර්ණාරෝම ධාතුවෙන් දිවැගත්තා වූ සුදු වූ රශ්මිකලාප යැ; රුවන්රැසින් රැඳී රත් වැ ගියා වූ අග්නිමාලි නම් සමුද්‍රය සේ, රත් වූ

1. සදෙහිලු. 2. සම්‍යට & හම්මැට.

Non-Commercial Distribution

බුදු තුඩින් නික්මැ විදැහී වැනී ගිය රත්රස්කලඹ යැ; පත්ලෙහි තුබූ රශ්මි ඉතිරෙත් රන්වන් වූ හෙමසමුද්‍රය සේ, සිවුරෙන් නො වැසී තුබූ ශ්‍රීශරීරයෙහි රන්වන්තැනින් නික්මැ අහස්හි වැනී ගිය ඝන වූ රන්වන් පැහැපතර යැ; මුහුදට වැද නයින්ගේ හිස් ගෙණැ උඩ නැඟි අහසැ බමන්නා වූ ගුරුළුන් සේ නොයෙක් රිදීයටගෙහි රන්දදපෙළ යැ; මෙසේ වූ ඒ බුදුශ්‍රී නැමැති මහාසාගරය ඒ මුහුදු සේ ලුණුකර නො වැ අමාරසයෙන් එකරස යැ.

මෙසේ මහඇඟි වූ, මෙසේ උදර වූ, මෙසේ අද්භුත වූ, මෙසේ අචින්ත්‍ය වූ, මෙසේ අවාච්‍ය වූ, මෙසේ අසාධාරණ වූ, මෙසේ මනොහර වූ, මෙසේ අසන්නන් කන් හයන්නා වූ, දුටුදුටුවන් ඇස් හයන්නා වූ, ඇසුඇසූවන්ට නිවන් දෙන්නා වූ, විචිත්‍ර විලාසයෙන් පූජා කෙරෙමින් තුන්දවසෙකින් ගංතෙරට වඩා ගියාහැ.

ඉක්බිති ස්වාමිදරුවන් ගඟට වැඩිකල්හි ඒ ගංහි වසන්නා වූ දිව්‍යනාගරාජයෝ "සසරදුක් දැඩි වූයේ මිනිසුන්ට මැ ද? නිවන් මිහිරි වූයේ මිනිසුන්ට මැ ද? බුදුරද[1] ස්වාමිදරු වූයේ මිනිසුන්ට මැ ද? ඒ දහම් අමා වූයේ මිනිසුන්ට මැ ද? ඒ සඟරුවන් දුක් දෙම්නස් නසන්නේ මිනිසුන්ගේ මැ ද? ඒ ස්වාමීන්ගේ රූපශ්‍රී මිහිරි උන් ඇසට මැ ද? ඒ ස්වාමීන්ගේ ශ්‍රීපාදය පහළ පමණින් උපද්‍රව පහ වන්නේ උන්ගේ නුවරට මැ ද? අපි සසරෙහි නො සිටිමෝ ද? එහෙයින් අපි ද අපගේ ශක්ති පමණින් පූජා කරම්හ"යි සැරැහී, එක පැහැරැ ස්වර්ණමය වූ ද, රත්නමය වූ ද, රජතමය වූ ද, නැව් මවා, ඒ නැව්හිස් හංසමුඛ යැ, මකරමුඛ යැ, හස්තිමුඛ යැ, අශ්වමුඛ යැ යනාදි වූ නානාප්‍රකාර වූ මුඛයෙන් සරහා, නැව්පස්සෙහි සත්රුවන්යටගැ පංචවර්ණ වූ දිව්‍යවස්ත්‍ර පතාකා බඳවා, එහි එකි එකී නැවෙහි සත්රුවන්පලඟ පණවා, මහානාගවෙශය හැරැ විචිත්‍ර වූ දිව්‍යරූපයෙන් සැරැහී, හොරුකසහි[2] හිඳ රන්රසුබඳ සත්රුවන්පල්ලෙන් හඩ නහා පදනා නාගමාණවක ශතසහස්‍රයන් විසින් සියලු ගඞ්ගාව එකකොලාහල කෙරෙමින්, නැව්හි නැව්හි වෙන වෙන පූජාවට සිටුවා ගත්තා වූ විශෙෂරූප හා නැටුම් ඇති නාගමාණවිකාවන්ගේ නෘත්‍යගීතවාද්‍යයෙන් ගොඩ සිටියා වූ දෙරටෙහි[3] මනුෂ්‍යයන්ගේ නෙත්සිත් හයමින්, ස්වාමීන්වහන්සේගේ සමීපයට නැව් සියදහස්ගණන් ගෙණැ අවුත් එක පැහැරැ ශ්‍රීපාදය වැඳ ගෙණ හෙවැ 'ස්වාමීනි, මිනිසුන්ගේ දුක් පහකරම්හයි බුදු වූ බව මුත්, නාලොවැ ඇත්තන්ගේ දුක් පහකරන්නේ නැද්ද? මුළුලොවැ පැතිරැ සිටි කරුණාව අප විෂ ඝොර හෙයින්

1. බුදුන්. 2. ඔරුහිසැ. 3. දෙතෙරෙහි.

Non-Commercial Distribution

හැකිලී[1] අප කරා නො වන්නේ ද? 'බුදු වන්නට යැ'යි වඩනා ස්වාමීන් වළඳ හළ පාත්‍රය වන්නේ අප කුලෙහි එකක්හුගේ භවනයට නො වේ ද? ප්‍රථමබොධියෙහි සත්දවසක් වස්නා මහවැස්සෙහි තමාගේ දරණගබ ගඳකිළි කොට වඩා හිඳුවූයේ අප කුලෙහි නයෙක් නො වේ ද? බුදුමඟුලෙහි දහසක් තුඩු මවා ගෙණැ ස්වාමීන්ට ස්තුති කෙළේ අප කුලෙහි ගැත්තෙක් නො වේ ද? එහෙයින් ස්වාමීන්ට අපිත් අවශ්‍යයෙන් ගැත්තම්හ. අපටත් අනුග්‍රහ කොට වදළ මැනැවැ"යි ආරාධනා කළහැ.

මෙසේ නයින් සියලු ගඞ්ගාව පුරා පූජා හැරැ ගෙණැ අවුත් වැඳ ගිය කල්හි, මනුෂ්‍යයන්ගේ හා නාගයන්ගේ පූජා දුටු විමාන දෙවතාවෝ "ඇපිත් අපගේ ස්වාමිදරුවන්ට පූජා නො කරමෝ ද?"යි එක පැහැරැ රුවන්මඩු ධ්වජ පතාකා ආදී වූ පූජා උපකරණ හැරැ ගෙණැ අවුත් ආකාශයෙහි පැණී ගියහැ. ඔවුන් එත් එත් සදිව්‍යලොකයෙහි දෙවතාවෝ එසේ මැ නොයෙක් පූජා හැරැ ගෙණැ අවුත්, අහස්කුස පුරා ගත්හ. උන් එත් එත් බ්‍රහ්මපාරිෂද්‍යයෙහි පටන් ගෙණැ, අකනිෂ්ඨබ්‍රහ්මලොකය දක්වා එක පැහැරැ පූජා හැරැ ගෙණැ අවුත් ආකාශයෙහි පැණී ගියහැ. ඒ දිව්‍යනාගයෝ තමන්ගේ සත්රුවන්නැව්හි යොදුන් පමණ කොට කුඩමත්තෙහි කුඩ නැඟුහ. භූමියෙහි ගසගැ කොළගෙහි ද, පර්‍වතයෙහි ද, ආකාශයෙහි ද, සදිව්‍ය ලොකයෙහි ද, බ්‍රහ්මලොකයෙහි ද යන මෙතෙක් තන්හි සක්වලගල්මුවවිට පහරවා එක පැහැරැ යොදුන් පමණ වූ කුඩ අතුරු සිදුරු නැති වැ වැනී ගියේ ය. කුඩ අතුරෙහි දද යැ. දදඅතුරෙහි පතාකා යැ. පතාකාඅතුරෙහි මල්දම් යැ. මල්දම් අතුරෙහි දිවපහන් යැ. දිවපහන්අතුරෙහි කළුවැල්දුම් යැ. කළුවැල්දුම්අතුරෙහි වත්සුණු යැ. සියලු ආකාශයෙහි ඒ ඒ සියලු දිව්‍යබ්‍රහ්මයන් "අපගේ මඩුවට වඩා එම්හ"යි "අපගේ මඩුවට වඩා එම්හ"යි කියා වෙන වෙන මැ බුදුන් වඩනට සූදුසු කොට සරහාලූ සත්රුවන්මඩු යැ. මඩුවෙන් මඩුවෙහි සත්රුවන් ආසන යැ; සත්රුවන් ආසනයෙන් ආසනයෙහි යොදුන් යොදුන් පමණ කුඩ යැ. බිමැ නටන මනුෂ්‍යස්ත්‍රීන්ට අපහාස කොට දියෙහි නටන නාගමාණවිකාවෝ යැ. ඔවුනට අපහාස කොට ආකාශයෙහි නටන්නා වූ දිව්‍යනාටිකාවෝ යැ. උත්සව වෙස් ගෙණැ, ආකාශයෙහි බුදුගුණ කියකියා නටා බස්නා තරුණ දිව්‍යපුත්‍රයෝ යැ. උතුරුසළු එකස් කොට බහාලා ආකාශයෙහි ඇඳිලි බැඳ ගෙණැ සිටැ, තමන්ගේ මඩුවට වඩනා පිණිස ආරාධනා කරණ දෙළොස්යොදුන් මහාබ්‍රහ්මයෝ යැ. මෙසේ සියලු ලොව පූජාමය වැ ගිය අවස්ථාවෙහි ස්වාමිදරුවෝ සියලු සත්ත්වයන්ගේ මැ අභිප්‍රාය දනැ වදරා 'එකක්හට

1. පැකිල-ථූපවංස.

Non-Commercial Distribution

අනුග්‍රහ කළ හොත්, ඉතිරියවුන්ට මහදෙමිනස් වන්නේ යැ'යි සිතා වදරා සියලු සත්ත්වලොකයාහට අනුග්‍රහය පිණිස, උසමහත හා රූප හා සෘදධිප්‍රාතිහාර්‍ය්‍යාදියෙන් තමන්වහන්සේ හා මැ සම වූ සැරියුත් මහතෙරුන්වහන්සේ ප්‍රධාන කොට ඇත්තා වූ පන්සියයක් පරිවාරයෙන් හෙබියා වූ, නිර්මිතබුදධයන් මවා වදරා, එක් නැවකට වැඩැ පලහෙහි වැඩැ හිඳිනා හා මැ සියලුතැව්හි ද සියලු ආකාශස්ථ වූ මණ්ඩපයන්හි ද සියලු බ්‍රහ්මයන් ගෙණා රුවන් මණ්ඩපයන්හි ද එක පැහැර පන්සියයක් පන්සියයක් පරිවාර ඇති බුදුවරුන් පැණී ගොසින් සියලු ලොව බුද්ධමය වැ පෙණී ගියේ. සියලු ලොව ධර්මමය වැ ගියේ. සියලු ලොව සංඝමය වැ ගියේ. "එක්කෙනෙකුන්ට අනුග්‍රහ කළ හොත් අපි කුමක් කරමෝ ද"යි සිටි සියලු සත්ත්වයා තමන් තමන්ගේ මණ්ඩපයෙහි නිර්මිතබුදුන් පෙණී යන්නා හා මුන්වහන්සේ සැබැ බුදුන්වහන්සේ යැ. මුන්වහන්සේ නිර්මිතබුදුන්වහන්සේ යැ"යි තෝරා ගත නො හී "ස්වාමිදරුවෝ අපගේ මඩුවට මැ වැඩි සේකැ. අපගේ මඩුවට මැ වැඩි සේකැ"යි එක පැහැර සාධුකාර දෙන්නට පටන් ගත්හැ.

මෙසේ නාගලොකයෙහි එක පැහැර බුදධපූජා යැ. මනුෂ්‍ය ලොකයෙහි එක පැහැර බුද්ධපූජා යැ: දිව්‍යලොකයෙහි එක පැහැර බුද්ධපූජා යැ. බඹලොව එක හෙළා බුද්ධපූජා යැ. මෙසේ ස්වාමිදරුවානෝ සියලු ලොව රත්නත්‍රයමය කෙරෙමින්, නාලොවට වැඩැ, නයින්ට අනුග්‍රහ කොට වදරා, නයින්ට ධර්මදෙශනා කොට පෙරළා නැවින් මැ බිම්බිසාර රජ්ජුරුවන් සිටි ගොඩට වැඩි සේක. බිම්බිසාරරජ්ජුරුවෝ ද කර පමණක් දියට බැසැ, සර්‍වඥයන්වහන්සේට පෙර ගමන් කොට ලිච්ඡවි රජදරුවන් කළ පූජාවට දියුණු කොට, පූජාකොට මහපෙරහරින් වෙළුවනමහා-විහාරයට වඩා ගියහ.

ඉක්බිති මේ මහානුභාව දුටු වහන්සේවරුන්ද "බුද්ධානුභාව ඉතා ආශ්චර්‍ය්‍ය නියා යැ"යි කියා කථා කළ කල්හි, ස්වාමිදරුවෝ ලෝවැස්සාට කුසල්හි අනුසස් හහවන පිණිස "මහණෙනි, මා මෙ තෙක් පූජා ලදුයේ අනික් මාගේ බුද්ධානුභාවයෙකින් නො වෙයි. පෙර මා සඞ්ඛ නම් බ්‍රාහ්මණ වැ සුසීම නම් පසේබුදුන් වහන්සේගේ දගබ්මළුයෙහි තණගැටක් උදුරාලූ කුසලින් වෙළුවනයෙහි පටන් ගෙණැ ලිච්ඡවිරජදරුවන්ගේ සන්ථාගාරය දක්වා අටයොදනක් පමණ තැන මැසිපියාපතක් සා කසළෙක් නො වී යැ. අස්වලක් සා කණුවෙක් නො වී යැ. කුරුහුලාකණින් ගෙණැ අවුත් ඒ මළුවෙහි ලාලූ වැල්ලෙහි අනුසසින් අට යොදනක් පමණ තැනැ මහැ මුතුසුණු සේ සුදුවැලි අතුළහ. ඒ දගබට මා මිටින් ගෙණැ අවුත් පුදලූ මල්හි කුසලින් නාගලොකයෙහි පටන් ගෙණැ, අකනිටාබඹලෝ

Non-Commercial Distribution

දක්වා බිමැ පය ඔබා ලූ කලැ දණක් පමණ කළවෙයක් පමණ උකුලක් පමණ එරී[1] යන පමණින් සතිස්ලක්‍ෂදසදහස්තුන්සියපණස් යොදුන් සක්වළගබමුළුල්ලෙහි මල්වැසි වැසපී යැ. මා ඒ මළුවෙහි කෙණ්ඩිකාවෙන් හැර ගෙණැ මිටින් ඉසැලූ පැනැ අනුසසින් මා පය දික් කරන්නා හා මැ විශාලාමහනුවර එතෙක් කුණු සෝධා ශතපටල සහස්‍රපටල නහා ආකාශයෙන් පොකුරුවැසි වැසැපී යැ. මාගේ හිණැ තුබූ කඩපටක් ගෙණැ නහාලූවා වූ, පතාකාවෙහි අනුසසින් සියලු සක්වළගබමුළුල්ලෙහි දිව්‍යමය වූ පතාකා වැනී ගියේ[2] මා ඒ දගබට නහාලූ පත් කුඩයෙහි අනුසසින් නාලොව පටන් ගෙණැ බඹලොව දක්වා යොදුන් පමණ ශ්වෙතච්ඡත්‍රයෙන් සියලු අහස එක හෙළා සැදී ගියේ. මහණෙනි, මෙසේ හෙයින් සත්පුරුෂයන් විසින් 'කුසල් නම් මඳ දෙයැ'යි නො සිතියැ යුතු යැ"යි වදරා කුසලට උත්සාහ වඩවන පිණිස

"මත්තාසුඛපරිච්චාගා - පස්සෙ චෙ විපුලං සුඛං,

චජෙ මත්තාසුඛං ධීරො - සම්පස්සං විපුලං සුඛං"යී

මේ ගාථාව වදරා දේශනා කෙළවර බොහෝදෙනා අමාමහ නිවන්හි ලා වදළසේක. මෙසේ කුසල්හි අනුසස් දක්වා බණ වදරන්නා වූ, සියලු ලොකයා අතින් පූජා ලබන්නා වූ, සියලු සත්ත්වයා සිතට දුක් නො වදනට ලාලූ වජ්‍රප්‍රාකාරයක් වැනි වූ, සිහිකළවුන්ට සියලුසුව එළවන රාජමාර්ගයක් වැනි වූ, මට මැ ස්වාමී වූ, මට මැ මවු වූ, මට මැ පිය වූ, මට මැ ගුරු වූ, මට මැ ශරණ වූ. මේ වේලෙහි පටන් ගෙණැ අමාමහනිවන් දක්නා ජාතිය දක්වා මාගේ සිතට මාගේ කයට දුකක් වැද්ද නො දී අමාවෙහි ගලාපීවා සේ සනහන්නා වූ බුදුන්-පෙ-යා යුතු.

## 103.

මෙහි මාගේ සර්‍වඥයන්වහන්සේ දිව්‍යමනුෂ්‍යයන් එතෙර කළ පරිදි කියත් ඊට සමයයෙක්[3] නො පෙණෙයි. එසේ හෙයින් ස්වාමීදරුවන් දිව්‍යමනුෂ්‍යයන්ට අවවාද කළ තැන් හැර මඩුවකුහට අවවාද කළ පරිදි කියමි. හේ කෙසේ ද? යත්:- එක් සමයෙක්හි මාගේ ස්වාමීන්වහන්සේ මුයෙන් ඉතිරී පිරී ගිය සත්රුවත් නිධානයක් සේ ධර්මයෙන් ඉතිර පිරීගියැ සිත් ඇති බැවින්, බොහෝ කලක් පුරුදු වැ ආවා වූ, සත්ත්වකරුණාසමෘද්ධීන් මස්තකප්‍රාප්ත වූ බැවින්, සත්ත්වයන් හික්මවීමෙහි දක්‍ෂ වූ අනික් එක ද සත්ත්වයක්හු නැති වැ තමන් මැ මුළුලොව හික්මවන්නට පොහොසත් බැවින්, තමන් මුවෙන් නො බිණූ විට මැ මුළුලොව එක පැහැර ගිනිගන්නා බැවින්, තමන් බිණූ තෙප්ලෙන් මුළුලොව සිත් පිණවා සැනහෙන බැවින්, තමන්ගේ එක අත බලා

1. සැරී. 2. පතාකාවෝ පැණී ගියහ. 3. ඒ විස්මයෙක්

Non-Commercial Distribution

මුළුලොව පුලපුලා සිටිනා බැවින්, තමන්වහන්සේගේ එක ශ්‍රීපාදච්ඡායාව මුළුලොව සතප්නා ඡායාවෘක්ෂයක් වැ සිටි බැවින්, තමන්ගේ එක ඉහෙන් සියලු සත්ත්වලොකයට නොවන වැඩක් නැති බැවින්, තමන් වහන්සේ බණ වදරමී' යන උත්සාහය මඳ කළ දවස් මැ සියලු බඹලොව හැල්බඩ හෙළහෙළා දිවැ තමන්ගේ ශ්‍රීපාදමූලයෙහි වැගිරැ බණ වදරන්නට ආරාධනා කොට 'මම 'බණ වදරම්. තෙපි නො බව'යි වදළසඳ සැනැහී යන පරිද්දෙන් හුදකලා වැ මුළුලොවට සද්ධර්‍මයෙන් තැකිව්ලි ලත් හෙයින්, තෘෂ්ණාවෙන් ආතුර වූ ලොවට තමන් ඖත් බෙහෙදක් මැ දිවබෙහෙත් වන හෙයින්, අනන්තාපර්‍ය්‍යන්තසක්වළයන්හි පතළ මුළු පොළොවින් තමන් ශ්‍රීපාදය එබූ තැනක් මැ පූජාවට සුදුසු වන හෙයින්, සියලු සත්ත්වසමූහයාට තමන් වහන්සේ වදළ බස් මැ බස්වන හෙයින්, තෘෂ්ණාවට ගැති වූ මේ සත්ත්වයන් තමන්ගේ බලයෙන් නිදහස් කරණ බැවින්, මේ සත්ත්වයන් තමන්ට කරන්නා වූ නොයෙක් විකාරයෙහි නො කළකිරී දුක් ගන්නා ධෛර්‍ය්‍යය තමන්වහන්සේට මුත් අනික්කෙනෙකුන්ට නැති හෙයින්, බුදු වූ ස්වාමිදරුකෙනෙකුනුදු දෙවරෙකැ නොලබන තරම් අසදිසදන සරහා මෙහෙයූවන්ට ද, තමන්වහන්සේට ද්‍රොහ සිතා නාලාගිරි නම් මතැත්හු මෙහෙයූවන්ට ද, සමසිත් වීමෙහි තමන් මුත් දෙවෙනි සතක්හු මුළුලොව්හි නැති බැවින්, තෘෂ්ණාවට ගැති ව සිටි ලොව නැවැතැ තෘෂ්ණාවට ස්වාමිදරු කොට ලීමෙහි ඇදුරුකම් තමන් මැ දන්නා බැවින්, එක බුදුකෙනෙකුන් උපුලාගත නොහෙන පොළොව 'බුද්දු සදෙනෙක් ඇතැ'යි කී කලත් ගිව්සැ සිටිනා අන්‍ධබාලසත්ත්වයන්ගේ නොවියත්කම් පසිඳ නුවණ දෙන තමන්වහන්සේ මුත් අනික් වියත්කෙනෙකුන් නැති හෙයින්, මහමෙර සා සත්රුවන්දම් පුද හෙළුවන්ට ද, මුදුනට ගල් හෙළුවන්ට ද සම වැ පවත්නා සිතක් ලද තමන් වහන්සේ සේ වූ අනික් කෙනෙකුන් නැති බැවින්, දවසැ දවසැ අලුයම් වේලෙහි මුළු ලොව බලා ධර්‍මදෙශනා අසා අමාමහනිවන් දක්නා පාත්‍රයන්[1] පිරිසිඳ බලා එතැන්හි පැණී දෙශනා කරන්නා වූ ධර්‍මයට යොග්‍යයන් ගණත් තමන් නැමූ[2] ඇහිල්ලට දෙවෙනි ඇහිල්ලක් නම්වාලන්නට සුදුසු සතක්හු තමන්වහන්සේත් සොයා දක්ක නොහෙන බැවින්, තමන්වහන්සේ එක සිතින් ධරාගත් ධර්‍මය මුළුලොවට බෙද දෙත් අඩු වැ නො පෙණෙන පරිද්දෙන් තමන්වහන්සේ සේ ධර්‍මය උගත් කෙනෙකුන් තමන් හැරැ 'ඇත, නැතැ'යි යනු තමන්වහන්සේගේ ලයට මැ හැහෙන බැවින්, "මම බණ කියන්නට නො පොහොසත්මී. මම සතුන් කෙරෙහි කරුණා නැත්තෙමි. මම සියලු සතුන් සිත් ගෙණැ[3]

1. කුලපුත්‍රයන්. 2. වැදඹූ. 3. දන.

Non-Commercial Distribution

බණ කියාගන්නා නැණක් නැත්තෙමි. මම ධර්‍මය නො දන්මි. හික්මැවියැ යුත්තන් නො දන්මි ලොවට ල ඇත්තෙමි නො වෙමි. අනුන්ගේ දුක් දන්නා එකෙකිම් නො වෙමි. අනුන්ට වැඩ කිරීමෙහි නො හසළයෙමි. මෙලෝ පරලෝ දෙක නො දන්මි. එහෙයින් මම කුමක් කෙරෙම් දැ?"යි කියා මුයෙන් නො බැණැ හිඳුත් හැම තමන්ට මුසවා වන බැවින්, ගමින් ගමට නියම් ගමින් නියම්ගමට ජනපදයෙන් ජනපදයට දෙව්ලොවින් දෙව්ලොවට බඹලොවින් බඹලොවට නාලොවින් නාලොවට සැඩොල් කුලෙන් සැඩොල්කුලයට රජකුලයෙන් රජකුලයට තවපැලින් වසුපැලට වසුපැලින් කුඹල්හලට කුඹල්හලින් නයින්ගේ දරණ ගබට දරණගබින් ගඳකිළියට ගඳකිළියෙන් යක්විමනට තමන්ගේ එක නම මැ කියව කියවා, මෙලෝ පරලෝ දක්වමින්, වදළ වදළ බණ සිතට නහමින්, කුසල්හි උත්සාහ වඩමින්, ඇසූඇසූ බණට සතුටු කරවමින්, මරන්නට දුනු ගතුවන් කඩු ගතුවන්, පූජාවට කුඩ ගතුවන්, පා සිවුරු ගතුවන්, හැමඑකතිවන්පුරෙහි ලමින්, තමන්වහන්සේගේ ශාසනයෙහි සංඝභෙදය කළවුන් පොවා, තමන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් ලේ සෙල්වූවන් පොවා, කෙළවරැ "බුදුන් සරණ යෙමි"යි කී කල්හි පසේබුදුබවට කුසල්මුල් දෙමින්, සදෙවක සමාරකසබ්‍රහ්මකලොකය ඇතක්හු මැඩගත්තා වූ හුණලැහැබක් සේ එක පැහැරැ ගිගිරි ගන්වමින් වැඩිතැන යැ, නො වැඩිතැන යැ, හුන්තැන යැ, නො හුන්තැන යැ, උපන්තැන යැ, නො උපන්තැන යැ, හැඳින්නෝ යැ, නො හැඳින්නෝ යැ, සිත් ඇත්තෝ යැ, සිත් නැත්තෝ යැ යන විවෙකයක් නො කොට, හැමැ එක පැහැරැ තමන්ගේ ආශ්චර්‍ය්‍යයට නටවමින් කෙළවමින්, ජෙතවනයෙහි ගඳකිළිය යැ අබඇට ඇතුළ යැ යන හැම තන්හි එකාකාරයෙන් සතර ඉරියව්වට ස්ථාන කෙරෙමින්, විස්මය සහිත බුදුගුණ සියලු සත්ත්වයන්ගේ සිත් පුරා උතුරුවමින්, මිහිරි වූ බුදුරුව සියලුසතුන් ඇස සරහසරහා පුරා උතුරුවමින්, පාත්‍රාපාත්‍රයන් පරීක්‍ෂා කොට වඩනාසේක් චම්පා නම් නුවරැ ගර්‍ගරා නම් පුෂ්කරිණීතීරයෙහි වැඩ හිඳ, චම්පා නම් නුවරැ වසන්නා වූ මනුෂ්‍යයන්ට දහම් දෙසූසේකැ.

මඩුවකු පවා ල ගත් බණක් වුව, ඒ බණ වදරණ ශ්‍රී මම කෙසේ කියම් ද? ස්වාමිදරුවෝ බණ වදරති. අසන්නෝ බණ අසති. මිහිරි බණක් වදරන්නට පටන් ගත්ද වන් ප්‍රෙතයන් කණැ හුනු "කව, බොව" යන හඬක් සේ, ඇතුන්ගේ කණැ හුනු හස්තිකාන්තවීණාධ්වනියක් සේ, කිරි නො ලදින් තලු වියැළී හොත් වස්සා කණැ හුනු මවුදෙනකගේ හඬක් සේ, රුවන්සකට පෙහෙ වැ හොත් සක්විතිරජ්පුරුවන් කණැ හුනු සක්රුවන්හි මිහිරිහඬක් සේ, මාගේ ස්වාමීන්ගේ ශබ්දය කණැ

Non-Commercial Distribution

හුනු සඳෙහි කවුරු නම් සැනහී නො යෙද් ද? කවුරු නම් පිණා නො යෙද් ද? කටු ඇති වැ ද ඇතුන්ට මිහිරි වූ වැටකෙහෙකොළක් සේ, කුළු වැ ද කොටළුවන්ට[1] මිහිරි වූ මිරිස්කොළ සේ, කිසිරසයක් නැති වැ ද මුවන්ට මිහිරි වූ කුකුරුමුවන්පක් සේ, හුරන් සාරා සොයා ඇවිද ලබන තික්ත රස ඇති කලාඳුරු සේ, වස්සන්ට මිහිරි වූ බෙලසුල්කැලිය කොළ සේ. රළු වැ ද රස නැති වැ ද පරෙවියන්ට සිත්කලු වූ හීන්හකුරු සේ, ආස්වාදයට නුසුදුසු වැ ද කොස්ලිහිණියන්ට මිහිරි වූ යගොඳුරක් සේ, තික්තරස වැ ද ගුරු වැ ද කවුඩුවන්ට ප්‍රිය වූ මීතෙල්පාන්පියැල්ලක් සේ, හුනු වැ ද ඔටුකුකුළන්ට ප්‍රිය වූ ගිනිඅඟුරක් සේ, ඔටුවන්ට මිහිරි වූ කටුකොළ සේ, මේ වදරණ ධර්මය යම් දෙෂයක් ඇති වැ කිසි කිසි ගුණයෙකින් සත්ත්වයන්ට ප්‍රිය වී ද? යත්:- එසේ නැත. ඒ ස්වාමිදරුවන් වදළ ඒ ධර්මය සිතක් ඇති කණක් ඇති කා නම් සිත් නො ගන්නී ද? 'මෙ තෙක් කිව, මොහු සිත් ගන්ති. මෙලෙසින් කිව, මොහු සිත් ගන්ති. මේ වෙශයෙන් කිව, මොහු සිත් ගන්ති. මේ බසින් කිව, මොහු සිත් ගන්ති. මේ විලාසයෙන් කිව, මොහු සිත් ගන්ති''යි අසන්නා වූ සියලුසත්ත්වයන්ගේ සිත්හසර[2] බලා වදරණ ධර්මයෙක. මෙසේ ස්වාමිදරුවෝ බණ වදරති. ඒ පොකුණුතෙරෙහි හුන් චම්පානුවරවාසීහු වදරණ බණ සිත් දී කන් දී වැඳ වැඳ පුදපුද සාධුකාර දිදී අසත් ලු.

එසමයෙහි ගඟීරා නම් පුෂ්කරිණීතිරයෙහි මඬුවෙක් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ මිහිරි වූ කටහඬ අසා හොත්තේ. ඒ ස්වාමි තමන්වහන්සේගේ ශබ්දය කණැ හුනු කවරක්හුගේ නම් ලය නො සනහා වදරණ සේක් ද? ඒ මඬු නිශ්චල වැ හොත් ල. ගොපොල්ලෙක් ඔහු හොත්බව නො දන ඔහු පිටැ තමා අතැ තුබූ දඬක් ඔබාලා සිටැ හිස මැඩැ මැරී ල. දඬ ඔබා මැඩැ ගැන්ම ද, හිස කැඩී මැරී යාම ද, හැම නො දත්තේ යැ. බුදුන් වහන්සේගේ කටහඬ අසා හොත් මාත්‍රයෙකින් මියැ තමාගේ මණ්ඩූකආත්මභාවය හැර දිව්‍යආත්මභාවය ලදින් ගොස්, දෙව්ලොවැ උපන. දෙළොස් යොදුන් පමණ රන්විමනෙක් පහළ වී යැ. ඒ විමානයෙහි මොහු බැලුබැලූ දිශාවෙහි නටන ගී කියන බෙර ගහන දිව්‍යාඞ්ගනාවෝ සියදහස්ගණන් වූහ. ඒ මණ්ඩූකදිව්‍යපුත්‍රතෙම තමාගේ ඒ විශෙෂ වූ ශ්‍රී බැලී යැ. තමාගේ රන්කඳක් සේ දිලියෙන ආත්මභාවයත් බැලී යැ. "මම පෙර කවරෙකිම් ද්‍යේ හො!"යි විමසන්නේ ගොපොල්ලා ඔබා ගෙණැ සිටි දඬ යට හොත් තමාගේ මණ්ඩූකශරීරය

---

1. කතුවන්ට  2. සිත්හි රස.

Non-Commercial Distribution

දිට. "මා මෙසේ වූ මඬු ජාතියෙකැ ඉපැද, මෙසේ වූ යහපත් වූ දිව්‍යාත්මභාවයක් ලද්දේ කවර කුශලයක් කොට ද්‍ෙ හො!"යි විමසන්නේ බුදුන් වහන්සේගේ කටහඬ මාත්‍රයක් කණැ වැටී සිදු වූ කුසලින් බව දනැ, ඒ සර්‍වඥයන්වහන්සේ ද, ඒ වැඩැ හුන් ආසනයෙහි මැ වැඩැ හිඳ ඒ වේලාව දක්වා මැ ධර්‍මදෙශනා කොට වදරන්නා මැ දිට. එ මැ ක්‍ෂණයෙහි "මා වැනි හීන වූ මඬුවකුට මෙ වැනි සම්පත් දී වදළ ඒ ස්වාමිදරුවානන්වහන්සේගේ ශ්‍රීපාදය වදිමි"යි කියා තමාගේ මහත් වූ පරිවාර හැරගෙණැ ඒ විමානයෙන් එ මැ මහිමයෙන් අවුත් සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීපාදය වැන්දේ.

සර්‍වඥයන්වහන්සේ ඔහු දක්මින් ඔහු මණ්ඩූකආත්ම භාවයෙන් දිව්‍යආත්මය ලත්නියාව තමන්වහන්සේට ඇතැඹුලු සේ පැණෙතුත්, දිව්‍යපුත්‍රයා ලවා මැ ලෝවැස්සන්ට ඔහු වූ නියාව කියවාලන පිණිස "පෙළහර වූ ශරීරවර්‍ණයෙන් සෘද්ධියෙන් පරිවාර හා එක් වැ අවුත් මා වැන්දේ කවරෙක් දැ?"යි විචාරා වදළසේක. සම්‍යක්සම්බුද්ධයන්-වහන්සේ එසේ වදරන්නා හා මැ මණ්ඩූකදිව්‍යපුත්‍රතෙම කියන්නේ "මම පෙරැ දියෙහි වසන දිය මැ ගොදුරු කොට ඇති මඬුවෙකිමි. නුඹවහන්සේ බණ වදරණ මිහිරි වූ කටහඬ අසා හොත්තා වූ මා හිස එක් ගොපල්ලෙක් තමා අතැ තුබූ දඬක් ඔබා ගෙණැ මිරිකා මරාපී යැ. නුඹවහන්සේගේ ආනුභාව නො දනැ නුඹවහන්සේ බණ වදරණ මිහිරි වූ ශබ්දය ඇසූ මාත්‍රයෙකින් මාගේ සෘද්ධි බලා වදළ මැනැවැ. මාගේ යශස් බලා වදළ මැනැව. මාගේ ආනුභාව බලා වදළ මැනැව. මාගේ ශරීරප්‍රභාව බලා වදළ මැනැව. පෙරැ මා මණ්ඩූකසමයයෙහි මාගේ මණ්ඩූකශරීරයත් තෙල තුබූ නියාවත් බලා වදළ මැනැව. වදළ බණ අසා, දැන් මා ලද මේ දිව්‍යශරීරයත් බලා වදළ මැනැවැ. ස්වාමීනි, මී නියා වූ පෙළහරකෙනෙක් ලොකයෙහි කොයි ඇද්ද? මාගේ තෙල මණ්ඩූකආත්මය බලා කැත ඇති වැ වළහා නො යන්නෝ කවුරු ද? දැන් ලත් මේ ආත්මය බලා සොම්නස් වැ ප්‍රාර්ත්‍ථනා නො කරන්නෝ කවුරු ද? ස්වාමීන්ගේ කටහඬ ඇසූ මාත්‍රයකට මේ නියා වූ සම්පත්තියක් දෙවා වදළසේකැ. මා සේ වූ එකකු ලය මඳක් පහන් කොට ගත් මාත්‍රයෙකින් මේ සා සම්පත්තියක් වන කලැ, ස්වාමීන් වූ නියාව දනැ, ස්වාමීන් වදරණ බණ වූ නියාව දනැ, බොහෝ කලක් සිත පහදවා ගෙණැ, බණ ඇසූ සත්‍වයකුට අමාමහ නිවන් ලැබෙනබව කවර විස්මයෙක් දැ?"යි කී යැ.

සර්‍වඥයන්වහන්සේ එසමයෙහි මණ්ඩූකදිව්‍යපුත්‍රමාහට බණ වදළසේක. මණ්ඩූකදිව්‍යපුත්‍රතෙම සුවාසූදහසක් ප්‍රාණීන් හා සමග

Non-Commercial Distribution

අමාමහනිවන් දිට. මෙසේ තමන්වහන්සේගේ බණ අසා හොත් මඩුවන් පවා මළසඳෙහි දිව්‍යපුත්‍ර කොට, දිව්‍යපුත්‍ර වූ සඳෙහි මැ අමාමහනිවන් දෙන, ලොවට අනුශාසනා කරණ සේ දන්නා බුදුන්-පෙ-යුතු.

## 104.

සියලු ලෝවැස්සන්ගේ මුව නො සෑහෙන ගුණ ඇති සියලු සත්ත්වයන් සංසාරයට පිටිවහල් කොට තැකූ, සියලු ලෝවැස්සන්ගේ සිතැ සියලු උකටලීහරණා වූ, සංසාරදුඃඛයෙහි භය ඇත්තා වූ සියලු සත්ත්වයන්ට 'නො බව'යි කියා අභය දුන්නා වූ රාත්‍රින්දිනයෙහි නුවණැත්තන්ගේ ඇසින් නො තොර වන, සිතින් නො තොර වන, සියලු සත්ත්වයන් තමන්ගේ ශ්‍රීපාදය සිහි කරවා සංසාරයට අහංකාර කරවන, මෙසේ වූ මහතානන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 105.

තව ද, පෙර පන්සියයක් පන්සියයක් වාදස්ථාන දන්නා නිගණ්ඨයකු හා නිගණ්ඨියක හා දෙන්න සියලු ජම්බුද්වීපයෙහි විවාද පිණිස ඇවිදිනාහු විශාලා නම් රාජධානියට වැද, ලිච්ඡවි රජදරුවන් මද්‍යයෙහි විවාද කොට, ඔවුනොවුන් පැරදවියැ නො හී සම සම වූහු ල. පසු වැ ලිච්ඡවිරජදරුවෝ ඔවුනොවුන් දෙපක්‍ෂයේ ඇත්තවුන් සරි සේ දැනැ, දෙදෙනාට වෘත්ති තබා වසනතැන් කරවා දී තමන්ගේ රාජධානියෙහි හිඳුවූ ල. ඔහු දෙදෙන ඔවුනොවුන් හා සංවාස කොට, දරුවන් පසදෙනකු ලදහ. එයින් එක්දුවක් සච්චා නම. එක් දුවක් ලාලා නම. එක් දුවක් පටාචාරා නම. එක් දුවක් ආචාටකා නම. පිත් සච්චක නම්. මොහු පස්දෙන මවුපිය පරම්පරාවෙන් ආ වාදස්ථාන දහස ඉගෙණ සමර්ථ වූහැ. පසු වැ මවුපියෝ දූන් සතරදෙනාහට "දරුවෙනි, අප කුලෙහි දයාද්‍ය දී සරණ කොට දූන් දුන්නෝ[1] නැත. තොප වාදස්ථාන දහස අප අතින් ඉගෙණැ මුදුන් පත් කළ බැවින්, ඉනිබ්බ සියලු ජම්බුද්වීපයෙහි තපස්වී කෙනෙකුන් දිනුවහොත්, උන්ගේ ශාසනයෙහි මහණ වව. ගෘහස්ථකෙනෙකුන් තොපගේ වාද බුන් හොත්, උන්ට අඹු වව"යි කියා සමු දුන්හ.

පසු වැ ඔහු සතරදෙන පරිබ්‍රාජිකා වෙශ ගෙණැ "මේ දඹදිවට සලකුණු වූයේ දඹගස වේ දැ"යි කියා, දඹඅත්තක් ගෙණැ "අප හා වාද කරන්නට සමර්ථ එකෙක් මේ අත්ත මඩවාපියව"යි කියා, වන් වන් ගම්හි ඒ දඹඅත්ත හිඳුවා දඹදිවැ ඇවිදිනාහු ක්‍රමයෙන් සැවැත්නුවරට

1. එක්සැමි කෙනෙකුන්ට දුන්නෝ

Non-Commercial Distribution

වැද, ගම්දෙරැ පෙරැ සේ මැ අතු හිඳුවා "සියලු ජම්බුද්වීපයෙහි අප හා වාද කරන්නට පොහොසත් කෙනෙකුන් ඇත හොත්, මේ අත්ත මඩවාපියන්නට කිව"යි මිනිසුන්ට කියා ගමට වන්හ.

එසමයෙහි මුළු ලොවට නො නස්නා අමා දුන්, කෙලෙස්අරුචි හරණ දහම් නැමැති බෙහෙත් දුන්, කටයුතු නො කටයුතු මංහි නො මුළා කරණ නුවණ නැමැති ඇස් දුන්, දහම් නැමැති දිවි දුන්, සියලු සතුන් ලෙහි කෙලෙස්තැවුලි නිවා ධර්‍මදෙශනා නැමැති හෙල්මැලිලිය බහාලු, සියලු සතුන්ට හිරිඔතප්හි රස දන්වූ, සව්සතුන් රහත්ඵලයෙහි පහරවා හික්මවන, නිවන්හි පහරවා ගොඩ දක්වන, බඹලොව්හි පහරවා අරුචි උපදවන, පඤ්චකාමයන්ගේ සැහවී සිටි තික්තරසය ප්‍රකාශ කළ, කුසල්හි මිහිර මුවෙහි පහරවා ලොවට දක්වූ, ශරීරයෙහි පිළිකුල ලෝවැස්සන් සිත්හි ඇඳ වූ බුදුරජානන්වහන්සේ එ මැ සැවැත් නුවර නිසා දෙව්රම්හි[1] වැඩැ වසනසේකැ.

එසමයෙහි ධර්‍මචක්‍රවර්‍ත්තිස්වාමීන්වහන්සේගේ අගසවු වූ, මහාමේරුවට මිටි වූ චක්‍රවාටපර්‍වතය සේ බුදුන්ගේ නුවණට මතු අඩු වූ නුවණ ඇති, බුදුන්වහන්සේ බණ දෙසමින් වැඩ හිඳ සැතපෙනු කැමැති කල්හි "මෙතෙකින් ඔබ කියව"යි කියා වදළ සමයෙහි, ස්වාමිදරුවන් වදරා සන්ධි කළ තැන් පටන් ඔබ්බට බුදුන් වදළ ධර්‍මයට වෙනසක් නො වන පරිද්දෙන් බණ වදරන්නට පොහොසත් වූ, කපක් දවස් මුළුල්ලෙහි සතරමහාද්වීපයෙහි දියෙහි ගොඩෙහි වට වැස්සෙහි කුඩා මහත් බිඳු මෙතෙකැයි ගණන්නට පොහොසත් වූ, දසදහසක් රුවන්මෙර මුදුනෙහි බඳ සත්රුවන් සක්මන්හි සක්මන් කෙරෙමින් යමාමහපෙළහර කරණ බුදුන් වහන්සේ කරා එළඹැ ප්‍රශ්න විචාරන්නට පොහොසත් වූ, "මාගේ ශ්‍රාවකයන් අතුරෙන් ප්‍රඥසම්පන්නයන් කෙරෙහි මොහු අග්‍ර යැ"යි බුදුන්වහන්සේ විසින් නුවණැත්තන් කෙරෙහි අග තන්හි තබන ලද, අස්සජිමහතෙරුන්වහන්සේ විසින් කියන ලද ගාථාවෙහි ආදි දෙපදය නො මැ නිමවන තුරු අමාමහනිවන් පසක් කළ, ධර්‍මදයාදසූත්‍රය යැ සම්පසාදනියසූත්‍රය යැ යනාදි නොයෙක් සූත්‍රයෙහි ප්‍රසිද්ධ වූ ගුණ ඇති, බුද්ධශාසනයෙහි නඟාලූ ධ්වජයක් වැනි වූ සැරියුත්මහතෙරුන්වහන්සේ සකස් කොට හැඳ පෙරවැ සිහිනුවණින් යෙදී, බැලුබැලූවන් ඇසෙහි අමෘත පරිෂෙක කරන්නාක් බඳු වූ සලෙසපත් ගමනින්, දෙව්රම්හි සිටැ, සැවැත්නුවරට සිඟා වඩනා සේක්[2] මහවතැ තුබූ දඹඅත්ත දැකැ,

1. විශාලාව නිසා මහවනයෙහි
2. මහාවනයෙහි සිට විශාලාවට සිඟා වඩනාසේක්.

Non-Commercial Distribution

“මේ කිමෙක් ද?”යි විචාරා එතැන්හි සිටියවුන් විසින් “ස්වාමීනි, මුළුදඹදිව්හි තමන් හා වාද කරණ කෙනෙකුන් නො දක දජීයෙන් ඇවිදිනා වූ ගැණුපඩිවරහු සතරදෙනෙක් “අප මධ්‍යයෙහි තුඩක් සොලවා ලන්නට පොහොසත් වූ කෙනෙකුන් ඇතහොත්, මේ අත්ත සොලවා පියන්නට කියව’යි කියා මුළු දඹදිවට සලකුණු වූ දඹඅත්ත හිඳුවා, තුමූ ගමට වත්හ” යනු අසා වදරා “මෙපමණෙක් පිළිවන් වේ ද”යි සිතා “එසේ වුව හොත්, තෙල දඹඅත්ත පයින් මැඩැ සුණුවිසුණු කොට පියව”යි වදරා ගම්දරුවන් “ස්වාමීනි, ඔහු බලවත්හ. අපි ඔවුන් හිඳුවූ දඹ අත්ත මැඩැපියන්නට බම්හ”යි කියා දන්වූ කල්හි, තෙරුන් වහන්සේ “අප කී බසින් මඩනා බැවින් මඩුව”යි වදරා දඹ අත්ත මඩවා සුණුවිසුණු කරවා වදළසේක.

ඉක්බිති තෙරුන්වහන්සේගේ බසින් ඒ අත්ත සුණුවිසුණු කළ ගම්දරුවෝ “ස්වාමීනි, උන් අවුත් විචාළ කලැ ‘මේ අත්ත කා මැඩවූහ’යි කියමෝ ද?”යි විචාළහ. ඒ අසා තෙරුන් වහන්සේ “දරුවෙනි, මුළුලෝමුදුන්පත් කළ සර්‍වඥකමින් වියත් කම්හි කුළුගත් ගෞතම-ගොත්‍රයෙහි උපන් ශාක්‍යසිංහයානන් වහන්සේගේ මහලුපුතනුවෝ මැඩවූහයි කියා ලව ඒ ස්වාමීන්ගේ බසහසර දනැ සිටියවුන්ට මුළුලොව්හි බසැතියන්ගේ බස් නොබස් වන බව කියව යි, සිංහනාදයට පිළිරැව් දුන් ගලෙහි හඬට පවා ඇත්කැල බිඳී යන්නා සේ, මාගේ ස්වාමීන්වහන්සේගේ දහමට පිළිරැව් දෙන්නාක් බඳු වූ මාගේ බසින් සියලු වාදි සමූහයන් බිඳෙන බව කියව. මුහුදුදිය වැද පිරී ගිය කලපුවක් සේ මාගේ ස්වාමීන්ගේ සුභාෂිත නැමැති මහාසාගරය ඔද වැඩී මාගේ සිත් නැමැති කලපුව දහමින් පිරී ඉතිරැ ගිය සේ කියව. සියලු ලොව වාදීන්ගේ දළදප් බිඳුනා වියත්කෙනෙකුන් පාමුල්හි වැඩි කෙනෙකැ යි කියව. ඒ බිණියැහෙන්නවුන් කෙරෙහි අග්‍ර වූ ස්වාමිදරුවානන් සියලු වාදීන්ගේ මන් බිඳිනා තන්හි ඔවුන් උත්තරප්‍රත්‍යුත්තර කියන පරිදි අසා පුරුදු පුතනු කෙනෙකැයි කියව. ඒ සද්ධර්‍මවිද්‍යාචාර්‍ය්‍යයන් වහන්සේගේ ධර්‍මවිද්‍යා ශාලායෙහි සියලු ශිෂ්‍යයන්ට වැඩිමහලු ශිෂ්‍යයාන කෙනෙකැයි කියව. ඒ මහවියතානන් දරුවන් හා අනුන් හා වාදයක් වූ තන්හි ජයශ්‍රීයෙන් දරුවන් මුහුණ බලන බව කියව. නො බණන්නට සුදුසු වූ කල්හි ඔවුන් ගන්නා මෞනව්‍රතය ප්‍රතිවාදීන් දකැ සහසුමුබ[1] වූ සඳ ඔවුන්ගේ මෞනව්‍රතය උන් හැරැ ප්‍රතිවාදීන් කරා යනබව කියව. සෙණ හුණු පරණලා පත්

1. සහසාසම්මුඛ.

Non-Commercial Distribution

සේ, ඔවුන්ගේ වාදයෙහි ග්‍රන්පිස්ථාන හුනු තන්හි සියලු වාදීන් සුණු විසුණු වැ යන බව කියව. මුහුද මැද නැව් බිඳියවුන් තමන්ගේ ධනය හැරැ පියා තමනු දූ එහි මැ හී බමන්නා සේ, අභිමාන නැමැති ධන ගෙණැ අපගේ විහාරයට වන් වාදීන් තමන්ගේ අභිමානය හැරැ තමනු දූ අපගේ විහාරයෙහි ගැලෙන බව කියව අර්පී වූ නම් මපියානන් වහන්සේ වැඩ හිඳිනා විහාරයෙහි මා හිඳිනා තැන සලකුණු කියා මා කරා එව"යි කියා, තමන්වහන්සේ සිහා වළඳ විහාරයට වැඩිසේකැ.

පරිබ්‍රාජිකාවෝ නැවැතැ අවුදින් එතන්හි සිදී බිඳී පියා තුබූ දඹඅත්ත දකැ "මේ කුමන විස්මයයෙක් ද? මේ කුමන පෙළහරෙක් ද? පෙරැ මුළු දඹදිවැ ඇවිදිනා කල්හි අප හිඳුවූ දඹ අත්ත සිටි සේ සිටි පරිදි දුරින් මැ බලබලා සැනැහිසැනැහී එම්හ. අද ඒ දඹඅත්තෙහි සුණුවිසුණු වැ ගිය පත් තමහට වූ පරිභවය කියන්නට දිවන්නා සේ සුළඟින් අප ඉදිරියට දිවන්නා බලබලා එම්හ. ඒ අත්ත වූ කලි මිනිසෙක් නො මඩවයි. මතැතෙක් ගහටා පී ද්‍රෝ හො! යි, වියරුහුනුයෙක් සිඳ බිඳ පී ද්‍රෝ හො!යි, මුළු දඹදිවැ නැති වාදි කෙනෙක් අළුතැ සැවැත්නුවර කොයින් ඉපැද ගත්හු ද?"යි සිතසිතා එතනට ගොස් ගම්දරුවන් විචාළාහ. ඔහු එපවත් කීහු:- "ලාරසයෙහි ගලා නහා ගත් සපුමල්දමක් සේ රත්සිවුරක් පෙරෙවි රන්වන්වහන්සේ කෙනෙක් සිටි සිටි දෙරැ දහසින් බැඳි පියැලි හෙළහෙළා වඩනා සේ, තමන්ගේ කරුණා ගෙහි ගෙහි පවත්වමින් ගෙපිළිවෙළින් සිහා වඩනාසේක්, තොප හිඳුවූ දඹඅත්ත මුලට වැඩැ, තොප කී පවත් ඇසූසේක. වැලිත් 'මඩුව'යි අප ලවා සුණුවිසුණු කැරැවූසේක. 'උන් අවුත් විචාළ කලැ 'කා මැඩවූහ යි කියමෝ ද?'යි කී කල්හි, තමන්ගේ ගුණ තබාපියා, තමන්ට ගුරු වූ තිලෝගුරු. බුදුන්වහන්සේගේ මැ ගුණ කියා, 'උන් පුතෙකිමි. උන්ගේ ගැත්තෙකිමි. උන්ගේ මැ සව්වෙකිමි' යන බස මුත් 'මම් මැ සූරීමි' යන බසක් තුඩෙහි නොවැකු සේක. 'එතොත් ඔබ එන්නට කියව'යි තමන් වහන්සේ වසන තැන සලකුණු කියා වැඩිසේක. පොහොසත් වූ නම්, ඔබයව"යි කීහ.

ඔහු එබස් අසා, තමන්ගේ ජයශ්‍රීය බලන පිණිස "මහණෙක් අප හිඳුවූ අතු බිඳ ගියේ ල. අප ඔහුගේ මන් බිඳුනා පරිදි බලන්නට එව"යි බොහෝදෙනා කැඳවා ගෙණැ ගොස් විහාරයට වන්හ. තෙරුන්වහන්සේ ඔවුන් එනබව දැන, සිංහනාද කරණ පිණිස ගුහාවෙන් නික්මැ රක්ගල්තෙලෙහි හුන් කෙසරසිංහයක්හු සේ, තමන්වහන්සේ

Non-Commercial Distribution

හුන් සුලුවායෙන් නික්මැ, විහාරමධ්‍යයෙහි වැඩහුන් සේක. ඔහු සතරදෙන ගොස් දුරැ සිට මැ බලා වැඩහුන් තෙජසට මැ සැක ඇති වැ එළෙඹැ "අප හිඳුවූ අත්ත මැඩවූ ද ඇද්ද?"යි විචාරා, මහතෙරුන්වහන්සේ "එසේ ය. කරවූ ද ඇතැ"යි වදළ කල්හි "අතු මඩනා සේ දන්නා බව දනුම්හ. වාදකරණ සේ දන්නේ ඇද්ද? නැද්ද?"යි කී කල්හි, "වැඩියක් මැ පියානන්වහන්සේ කරා යන බව මුත්, තොප පමණකට දන්මි"යි වදළසේක. පරිබ්‍රාජිකාවෝ "අප විචාළා තෙපි කියවු ද? තොප විචාළා අපි කියමෝ ද?"යි කීහ. එකල්හි මහතෙරුන්වහන්සේ "තොප ගැහැණුන්ගේ නුවණෙක් වේ නම්, වැඩියෙක් නොවන්නේ වේ ද? පළමු අපි මැ තොප විචාළක් කියම්හ"යි වදළ සේක. ඒ අසා පරිබ්‍රාජිකාවෝ සතරදෙන සතර දිශාවෙහි සිටැ ගෙණැ, සතරදිශාවෙන් නැගූ මෙසරාජීසතරෙකින් හෙන මහසෙණසේ වාදස්ථාන දහස පිරුවාපූහ. මහතෙරුන්වහන්සේ ඒ අසා ඉතා බැරි යැයි සිතූසේක් ද? යත්: අනුන් කීවක් බැරි යැයි සිතන පඳුරෙකැ දඩක් නො වන බැවින්, පෙර රහත් නොවන කලැ පවා, මියැ බඹලොවට යන්නා වූ පියානන්වහන්සේ "නත්ථි කිඤ්චි"යි කියා ගිය කල්හි "මාගේ ස්වාමී ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානලාභී වනසේ ය"යි සිතාගන්නට සුදුසු නුවණක් ඇති බැවින් මෙසේ බොධිසත්වයන් සහවා කී බස්හි පවා අථ් දන්නෝ මොවුන් කී බසැ නො පැකිලෙති.

"ගඞ්ගාය වාලුකා ඛීයෙ - උදකං ඛීයෙ මහණ්ණවෙ,
මහියා මත්තිකා ඛීයෙ - ලක්ඛෙන මම බුද්ධියා"යි

තමන් කරණ සිංහනාදයෙහි බල අද නො පැ කොතනට තබත් ද? තමන් පියාණන්වහන්සේ "එතදග්ගං භික්ඛවෙ, මම සාවකානං භික්ඛූනං පඤ්ඤාවන්තානං යදිදං සාරිපුත්තො"යි තමන්ට දුන් තනතුරු තමන් මුහුණ බලා දුන් තනතුරෙකැයි කියවත් ද?

"ලොකනාථං ඨපෙත්වාන - යෙ චඤ්ඤෙ අත්ථි පාණිනො,
පඤ්ඤාය සාරිපුත්තස්ස - කලං නාග්ඝන්ති සොළසිං"යි

කියා, මුළුලොවැ පතළ තමන්ගේ යසසට අද කැලලක් කෙරෙත්ද? එහෙයින් ඔවුන් සතරදෙනා කී දහසක් ප්‍රශ්නා හැම විසඳ ඔබ කියව යි වදළහ. ඔහු මහසායෙහි මලු සලා වී කාපියා මියන්නට වක ගැසූවන් සේ තමන් උගත් වාද දහස නිමවාලා, වක ගසා ගෙණැ සිටැ "වහන්ස, අප දන්නා ද මෙතෙකැ"යි කීහ. මහතෙරුන්වහන්සේ "අපි තොප සතරදෙනා විචාළ දහසක් ප්‍රශ්න හුදකළා වැ කීම්හ. තෙපි සතරදෙන අප හුදකළා වැ විචාළ එක ප්‍රශ්නයක් කියව. එ ද, වැඩියක් නො විචාරම්හ. අපගේ ස්වාමිදරුවාණන්වහන්සේගේ සස්නෙහි පැවිදි වන සාමණේරයන් මහණ වන ද උගන්නා පැනයෙක් ඇත. ඒ කියව"යි

Non-Commercial Distribution

කියා "එකෙක් නම් කිම් ද?"යි විචාළසේක.

පරිබ්‍රාජිකාවෝ අග දැන ගත නො හී, මුල දැනගත නො හී උනුන් මුහුණු බලා, තෙරුන්වහන්සේ පාපිටැ වැඳ ගෙණැ හෙවැ "නුඹවහන්සේ මැඩවූ අත්ත නුඹවහන්සේට ම සුදුසු යැ. ස්වාමීනි, නුඹවහන්සේගේ වියත්කම් නුඹවහත්සේගේ පියානන් වහන්සේගේ සම්මාසම්බුදුබවට මැ සුදුසු යැ. ස්වාමීනි නුඹ වහන්සේ මෙසේ කලැ උන්වහන්සේ කොතරම් දෝ? ස්වාමීනි, ගෘහස්ථයකු අපගේ මත් බුන, අපි ඕහට අඹූ වම්හ පැවිදි කෙනෙකුන් අපගේ මත් බුන, ඔහුගේ සස්නෙහි මහණ වම්හ. මේ අපගේ ආචාරය යැ. එහෙයින් අප මහණ කළ මැනැවැ"යි දන්වා මෙහෙණ සස්නෙහි මහණ වැ නොබෝකලෙකින් රහත් වූහ.

මොවුන්ගේ මල් සච්චකවාදි වූ කලී මොවුන්ට වඩා සිය දහස් ගුණයෙන් වැඩියේ යැ. බුහුනන් දන්නා වාදදහස ද දන්නි. තමා බොහෝ ඇසූපිරූතැන් ඇති හෙයින් සෙසු සමයාන්තර මුළුල්ල ද දන්නි. මහතෙරුන්වහන්සේටත් බසට බස කියා සිටිනා බව මුත් පසු බසිති යි නො සිතමි. 'නුවණින් පිරී බඩ පැළීයෙ'යි කියා යපතෙකින් බඩ වෙළා ගෙණ විශාලායෙහි රාජගුරු වැ වෙසේ. "මුළුලොවැ මැ මම එකවියත්මි"යි කියා තෙමේ මැ තමා තැකී යැ. මහජනයා ඔවුන් එසේ මැ තැකූහ. විශාලවෙහි පිරිස්මැද හිඳ "මා බැණැ නැගි වේලෙහි සැලීවිසැලී නොයන, කිසිල්ලෙන් ඩහ සෙල්වී නොයන සතක්හු නො දකිමි. සිත් ඇති මිනිසුන් තබා ගලකට බැණැ නැහෙම් වීම් නම්, ඒ ගල සොල්වාපියමි"යි කියා බොහෝ සේ ගව් බෙණෙයි. හෙතෙම තමා බුදුන්වහන්සේ හා වාද කරන්නට සිතසිතා ඇවිදිනා හෙයින් "ඒ බුදුන්ගේ මතය වූ නියා මා දත මැනැවැ"යි සිතා, එක්දවසක් විශාලාමහනුවරැ සිඟා වඩනා අස්සජිමහතෙරුන්වහන්සේ දැකැ, උන්වහන්සේ කරා එළෙඹැ, "තොපගේ ගුරු වූ ශ්‍රමණගෞතමයෝ සව්වන් කෙසේ හික්ම වද් ද?"යි විචාළේ යැ. ඒ අසා අස්සජිමහතෙරුන්වහන්සේ "සච්චකය, අපගේ පියාණන්වහන්සේ පඤ්චස්කන්ධය අනිත්‍ය යැ, අනාත්ම යැ කියා, අප හික්මවනසේකැ"යි වදළසේක.

ඒ අසා සච්චකයා අතින් අත පැහැරැ පියා දෙඅතින් කණ වසාගෙණැ "මහණ, නො ඇසියැ යුත්තක් ඇසූම්හ. නො කන් කලුබසක් ඇසූම්හ. සිතට නො මිහිරක් ඇසූම්හ. තොපගේ ගුරුන්ගේ මිථ්‍යාදෘෂ්ටිය ඉතා බැරි ය. ඉදින් යම් දවසක් උන් හා අප හා එකතැනැ හිඳ බිණීමෙක් වූයේ නම්, උන්ගේ මිථ්‍යාදෘෂ්ටිය හරවාපියා සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටුවා හික්මවා ලම්හ"යි කියා, සන්ථාගාරයෙහි රැස් වූ ලිච්ඡවි

Non-Commercial Distribution

රජ්ජුරුවන් කරා ගොස් "අද මිනියා විනොදයක් නො ලබා කුමට හිඳු ද? අද මම ශ්‍රමණගෞතමයන් හා බස් බුඳක්[1] බැණ බලමී සිතමි. ඉදින් ඒ අස්සජිතෙරුන් කී පරිද්දෙන් එ මැ මතයෙහි ඒ ශ්‍රමණගෞතමයෝ සිටියෝ වූ නම්, දික් වූ ලොම් ඇති පිඩාමඑඑවක්හුගේ රෝම අල්ලාගෙණැ ඇතින් ඇතට ඇද කෙළනා බලවත් පුරුෂයක්හු සේ, ඒ ශ්‍රමණගෞතමයන් වාදයෙන් වාදයට ඇද සලා විසලා පියමි. මතැතක්හු විලකට වැද ඒ දිය අලළන්නා සේ, මම ද ශ්‍රමණගෞතමයන් අලළා පියමි. පෙරැ බොහෝ දෙනාට බිණු තුඩ වැඩී තිබී යන දවසෙක. වියත්කමට බැහැවුම් හැරැපියා නොදත් නොදත් දෙය ඉගෙණැ ගන්නට අප කරා අවුත් අවකාශ ඉල්වා ගන්නා නියා බලව. අපගේ බුහුනත්ට උන්ගේ සව්වන් කළ පරිභවයකුදු ඇත. එයිත් පසිඳ ගන්නට සිතන්නේ බොහෝ දවසෙක. මා හා කැටි වැ නික්මෙව"යි කී යැ.

ඒ අසා පන්සියක් ලිච්ඡවිරජදරුවෝ එක පැහැරැ රජ පිරිස් ගෙණැ නික්මුණාහැ. ඇසූඇසූවෝ තාක් "පණ්ඩිතවරුන් දෙදෙනාගේ වාද බලම්හ"යි හැම පස්සෙහි හුනහ. එදවස්හි සියලු වාදිමත්තහස්තීන් මුදුනෙහි වාදවජ්‍රාඞ්කුශ හෙළා තතුණුවන සර්‍වඥහස්ත්‍යාචාර්‍ය්‍යයන් වහන්සේ අලුයම්හි මහාකරුණාසමාපත්තියෙන් නැඟී ලොව බලා වදරණසේක්, තමන්වහන්සේ හා වාද කරණු පිණිස බොහෝ පිරිස් ගෙණැ සච්චකයා එනබව දැකැ වදරා, විශාලාවට වැඩැ ආහාර කෘත්‍යය නිමවා වදරා, විහාරයට වැද මහපිරිස හිඳගන්නට සුදුසු තැන් පරීක්‍ෂා කොට, මහවනයෙහි එක්තරා ගසක් මුලැ වැඩහුන්සේක. එ සමයෙහි සච්චකයා විහාරයට වැද, සක්මන් කරණ වහන්සේවරුන්ද කරා ගොස් "තොපගේ ශ්‍රමණගෞතමයන් දත් නොදත් දෙයක් කියාලන්නට අයිමි. දැන් ඔහු කොයි ද?"යි විචාළේ යැ. ඒ අසා වහන්සේවරුන්ද "දත් නො දත් තැන් උගන්වන්නෝ දැන් දැන් පෙණෙන්නෝ වෙද් දැ"යි කියා, "සච්චකය, දැන් අපගේ ස්වාමී වළඳ මහා වනයට ගොස්, තා පෙරමග බලබලා ද්‍රේ! ගසක් මුලැ වැඩැ හුන්සේක. කඹුරුසම මැඬැලූ කල්හි අඟුරුඅතුරෙන් පැනැ නැඟි ගනිකඳක් සේ ගස අතුපතර අතරතුරෙන් අර නැඟෙන්නේ සවණක්සන බුදුරස් යැ. ඒ සලකුණෙන් ගොස් බුදුන් දකුව"යි වදළසේකැ.

සච්චක තෙමේ මහපිරිස් පිරිවරා වැඩහුන් තැනට ගොස් පිරිස් හා සමග බැසැ හිඳ "ශ්‍රමණගෞතමයෙනි, පණ්ඩිතකම නම් අනුන් දත් නොදත් දෙය කියා මිථ්‍යාදෘෂ්ටිය හරවන බව වේ ද? 'තොප දහම් වරදවා ගෙණැ ඇවිදිති'යි යනු බොහෝ සේ ඇසූ විරීමි. අද තොපගේ

---

1. හුදක්.

Non-Commercial Distribution

සවුකෙනෙකුන් කී බස් අසා ඉතා මැ කම්පා වැ 'සක්විතිරජයක් හැරැ පියා මහණ වූ තැනැත්තන් නිකම් නැසී යන බව නපුරැ''යි තොපට මැ සිතා ආමි. මේ තොපගේ යහපත් රුවට සුදුසු දහමක් ගත[1] හොත්, තොපසේ වැඳ පිදිය යුත්තෝ ඇද් ද? දන් තොප ප්‍රශ්නයක් විචාරන්නට අවකාශයෙක් ලැබේ ද?''යි කී යැ. ඒ අසා ස්වාමිදරුවෝ මඳක් සී වදරා තමන් සියලු ශ්‍රමණබ්‍රාහ්මණ දිව්‍යබ්‍රහ්මාදීන් විචාළ ප්‍රශ්න තාක් නො පැකිලැ කියන නුවණක් බෝමැඩ දී මැ ලත් හෙයින් ''සච්චකය, තට හැඟුනු යමක් විචාර. අපි ඒ ල ගන්නා පරිද්දෙන් මැ කියම්හ''යි වදළසේක. ඒ අසා සච්චක තෙම ''තොපගේ සච්චන් කෙසේ හික්මවා ද?''යි විචාළේ.

ඒ අසා බුදුරජාණන්වහන්සේ ආකාශගඞ්ගාවක් ඇද බහා ලන්නා සේ, සදත්දහතෙලෙහි පස්වණක් පියුම් එක පැහැරැ උදුරා ඉස්නා සේ, සියලු ආකාශයෙහි පතළ තරු කැළ එක පැහැරැ බිමැ හෙළන්නා සේ, දඹදිවට සලකුණු වූ මහදඹගස අල්වා ගෙණැ හුනු හුනු තන්හි රන් පැළ නැහෙන්නා වූ[2] මහදඹ සලා වගුරුවන්නා සේ, දෙවියන්ගේ පරසතුරුක අල්ලා ගෙණැ අමුණු පමණ රෙහෙණු ඇති පරසතුමල් මුළුලොව්හි[3] ඉස්නා සේ, සතර මහාසාගරයෙහි දිය දෙබේ කොට පියා සත් රුවන් මුළුලොවට උකා දමන්නා සේ, නොයෙක් පරිද්දෙන් බණ වදරන්නට පොහොසත් වුව ද, 'සච්චන්ගේ බස් හා තමන්ගේ බස් හා වෙනැ'යි නො කියන පරිද්දෙන් 'අස්සජි මහතෙරුන් කී පරිද්දෙන් මැ කියම්'යි සිතා වදරා ''සච්චකය, මම 'පඤ්චස්කන්‍ධය අනිත්‍ය යැ, අනාත්ම යැ, සියලු සංස්කාර ධර්මයෝ[4] අනිත්‍යයහ, අනාත්මයහ'යි කියා මෙසේ මාගේ සච්චන් හික්මවම්''යි වදළ සේක.

ඒ බස් අසා සච්චකතෙම ''උකුළුපොරට එවැ ගතිමි. එතෙකින් දිනිමි''යි සිතා ''ශ්‍රමණ ගෞතමයෙනි, සියලු බිජුවට වපුරණ බිම තමා නැති කල්හි බිජුවට වපුටැ ගන්නේ කොයි ද? එසේ මැ 'සියලු කුශලාකුශලයන්ට පිහිට වූ පඤ්චස්කන්‍ධය තමා මැ අනාත්මයැ'යි කී කලැ, ඒ නිසා පවත්නා වූ කුශලා කුශල තමා මැ නැත්තා නම් වත්, තොප කියන්නේ කුමන බස් ද? 'ලොව ගලවම්හ'යි කියා ලොව වළැ හෙළන කෙනෙකු ද? නුවණ නැති ලොව 'දහම් උගන්වම්හ'යි නළවා ගෙණැ මේ නියා අදහමක් උගන්වන්නේ කවර නො වියත්කමෙක් ද? තෙපි අහසැ සිත්තම් කරණ කෙනෙකු ද? සුළඟ ගැට ලන කෙනෙකු ද? දියෙන් පත්‍ර හඹන කෙනෙකු ද? වැල්ලෙන් යොත් අඹරණ කෙනෙකු ද? ගින්නෙන් තෙල් මඩනා කෙනෙකු ද? මේ කවර අදහමෙක් ද? තොප ල ගත්තේ? මට කියා බලගැ''යි කී යැ.

---

1. දත. 2. නැහෙන්නා සේ වූ. 3. දෙව්ලොව. 4. ධර්මයන්

Non-Commercial Distribution

ඒ අසා ස්වාමිදරුවෝ "අපි කලි සියලු සංස්කාරධර්මයන් 'අනාත්ම යැ'යි කියම්හ. තෝ 'ආත්ම යැ'යි කියයි දැ?"යි විචාරා වදාළ සේක. ඒ අසා සච්චක බොහෝදෙනා තමා හා එක්කොට ගන්නා පිණිස "කුමක් ද නුඹ කියන්නේ යැ? මම මතු ද? මේ සිටි රජ බමුණු ආදි මහපිරිසනුදු 'මම යැ, මගේ යැ'යි නො කියන කෙනෙක් ඇද්ද? නුඹ මැ විචාරා බලගැ"යි කී යැ. බුදුහු ඒ අසා "සච්චකය, තා හිසැ හෙන සෙනැ බොහෝ දෙනා හිසට කුමට දමයි ද? මේ ආ මහාජනයාගෙන් 'වාද කොට මා ධා සොල්වා පියම්හ'යි ආ කෙනෙකුත් නැත. හැම තාගේ හා මාගේ හා බස් අසන්නට ආවෝ යැ. එ හෙයින් බොහෝදෙනා ඇඟ නො ගස්වා තෝ මැ අප විචාළක් කී ය. 'පඤ්චස්කන්ධය ආත්ම යැ'යි කියයි දැ?"යි විචාරා වදළසේක. සච්චකයා "ශ්‍රමණගෞතමයෙනි, එසේ කියමි"යි කී යැ.

ඉක්බිති බුදුන්වහන්සේ "සච්චකය, අපි තා එකක් විචාරම්හ. නොයෙක් වැඩි සිටි බිම්බිසාර, කොසල යනාදී වූ රජදරුවන් තමන් රටවැස්සන් කෙරෙන් මැරියැ යුත්තන් මරා, සැපත් දියැ යුත්තන්ට සැපත් දෙත් හොත්, උන් කීයෙක් වැටේ ද? නො වැටේ දැ?"යි විචාරා වදළ සේක. සච්චකතෙම "වහන්ස, මණ්ඩලීක රජ්ජුරුවන්ගේ පවා ආඥ තමන් තමන්ගේ විජිතයෙහි වැටෙයි. වැඩි සිටි රජදරුවන්ට වූ කලි විචාරන්නේ කිම් දැ?"යි කී යැ. ඒ අසා බුදුන්වහන්සේ "සච්චකය, ඒ ඒ රජදරුවන් තමන් තමන්ගේ රටවැස්සන් තමන් තමන් සිතු පරිද්දෙන් තබා ගන්නේ තමන් සතු හෙයින් වේ ද? ඉදින් මේ පඤ්චස්කන්ධය තා සතු වී නම්, තා කැමැති පරිද්දෙන් පවතී දැ?"යි වදළසේක. ඒ අසා සච්චකයා ලය ඉපිළැ හී ගියේ. ආදි තමා සතු දැයෙක්හි තමා ආඥ වැටෙ'යි කියාලා දැන් 'නො වැටෙ'යි කීම්නම්, ආදි මා කී බසට පසු වැ මා කියන බස් විරුද්ධ වෙයි. ඉදින් 'මාගේ ශරීරයට මා කීයෙක් වැටෙ'යි කීම්නම්, බුදුහු වැඩැ හිඳැ 'එසේ වුව හොත්, තාගේ රූපය නපුරු කොට කුමකට තබයි ද? අප සේ මැ දෙතිස් මහාපුරුෂලක්‍ෂණ අශීත්‍යනුබ්‍යඤ්ජන කෙතුමාලාබ්‍යාමප්‍රභා ඇති කොට බලගැ'යි වදරණසේක. ඒ සාරාසංඛ්‍යකල්පලක්‍ෂයක් මුන් සේ මැ පාරමිතා පුරා මත්තට කොට ගත හැකි දෙයක් මුත්, දැනට කොට ගත හැකි දෙයක් නො වෙයි. එසේ කිව, එසේ නපුරැ. මෙසේ කිව, මෙසේ නපුරැ. 'මාගේ ශරීරය මා කී පරිද්දෙන් වැටෙ'යි කී විටැ මැ මේ සිසාරා හුන් ලිච්ඡවි රජදරුවෝ මැ "තෝ අප සේ මැ යහපත් වැ ගත හෙයි දැ?"යි මට එක පැහැරැ ගල් ගසති. කුමක් කෙරෙම් දෝ හො! යි, දෙමරින් මැ මට ගැලවුම් නැතැ'යි කර බහා ගත.

Non-Commercial Distribution

සර්වඥයෝ දෙවනවටත් "තා මෙවිටැ මුයෙන් නො බැණ හිඳිනේ කුමට ද? තාගේ රුවට තා කීයෙක් වැටේ ද?"යි විචාරා එවිටැ ද මුයෙන් නො බැණ හිඳිනා හා තුන්වනවිටැ විචාරා වදළ බසට මුයෙන් නො බිණුව හොත්, හිස සත්කඩක් වැ පැළී යෙයි යන කරුණායෙන් තුන්වනවට නො විචාරා 'හැයි, තා මුයෙන් නො බැණැ හිඳිනට කලෙක් ද මෙ යැ?"යි වදළසේක. එසමයෙහි පළමු කොට මැ සහම්පතිබ්‍රහ්මයා කැටි වැ අවුදින් හුන් ශක්‍රයා 'ස්වාමීනි, නුඹවහන්සේගේ දහම්සක යැ. මාගේ අණසක යැ. බණ වදළ මැනැවැ"යි ආරාධනා කොට ගිය හෙයින්, බුදුන්වහන්සේ තුන්වන විටැ විචාළදෙය නො බිණුව හොත්, සච්චකවාදීන් හිස්බොල්ලට කියටියක් කියම් යි, මුළු ලොව්හි භයඞ්කරවස්තු තාක් එක් කොට ලූවාක් වැනි භයඞ්කර රුවක් මවා ගෙණ, ගිනි ගෙණ දිලියෙන යකුළක් ඉසට මානා, අහස්හි සච්චකයාට හා බුදුන්ට මුත් ඉතිරියන්ට නො පෙණී සිටැ ගත. සච්චකයා අහස බැලුයේ ශක්‍රයා මවා ගත් යක්රුව හා හිසට මානා ගත් යකුළ හා දකැ වෙවුලා ගොසින්, හිස සිටැ දෙපත්ල දක්වා කෙළින් සිටි රොමයෙන් බිඳු නමාගත් ඩහයෙන් වියවුල් වැ, "මම් ඉදින් 'යකෙකැ'යි හඩ ගහාපීම් නම්, මේ පිරිස 'තා ගසන්නට ආයේ සෙනංගෙරෙ ද? තට ම පැණෙනබව මුත්, අපට නො පැණේ දැ?යි මා හිසැ ටොකු ඔව්ති. මෙතැන්හි මට බුදුන් මුත් සරණ නැතැ"යි කියා "ආයු බොහෝ වූ ස්වාමීනි, විචාළක් නො කියන්නට පොහොසතිම් ද? විචාළ මැනැවැ. කියම්"යි කී යැ. "තාගේ පඤ්චස්කන්‍ධය තා කීවක් කෙරේ ද? නො කෙරේ දැ?"යි වදළසේක. සච්චකතෙම "මා කීවා නො කෙරෙ"යි කීයැ. එවිට සර්වඥයන්වහන්සේ පඤ්චස්කන්‍ධය සියලුසංස්කාර ධර්‍මයන් මැ අනිත්‍යදුඃඛඅනාත්ම සේ ගිවිස්වා වදළසේකැ.

එවිටැ සර්වඥයන්වහන්සේ "සච්චකය, අගින් මුලින් මැදින් කපාපූ කෙහෙල්කදෙක්හි මෙන් තාගේ බස්හි හරයෙක් නො පැණෙයි. තෝ තෙල ලිච්ඡවිරජදරුවන් මැදයෙහි 'සිත් ඇති කෙනෙකුන් තබා කපකට බැණැ නැහෙම් වීම් නම්, ඒ සොල්වා පියම්. ශ්‍රමණ ගෞතමයන් සර්වාඞ්ගයෙන් ස්වෙද සොල්වා පියම්යි කියා ආයෙහි වේ ද? එසේ කියා ආ තාගේ නලළින් වැගිරෙණ ස්වෙදබිඳු තා පෙරෙව් උතුරුසළුව තෙමා ගෙණැ බිම දක්වා වැගිරෙන්නට වන. අප ශරීරයෙහි ඉදින් සෙල්වුනු ඩහදියෙක් ඇත, නැත,[1] තෝ මැ බලගැ"යි ශ්‍රීහස්තය දික් කොට සිවුර මදක් පහ කොට වදළසේකැ. සිවුර ඇළ කරත් මැ රන්වන් බුදුරස්කඳක් විදුලිය දහස්සුවහස් පරදවමින් ශ්‍රීමුඛය සිසාරා

1. ඇත් නම් හෝ නැත්නම් හෝ

Non-Commercial Distribution

තුන් විටෙකැ පැදකුණු කොට වෙළෙමින් ඇඹරෙමින් බුදුන්ගේ ජයමඟුල් දෙවියන්ට කියන රිස්සෙන්[1] බුදුන් කරා ආ ශක්‍රයා දෙව්ලොවට ගෙණැ යන පඬුරක් සේ අහස්හි හිසෙන්නට වන. සච්චකයා කර බහා ගෙණැ හින.

එසමයෙහි ඒ පිරිස් මැද හුන් බුදුගුණයෙහි සුමුඛ වූ නමින් දුර්මුඛ නම් ලිච්ඡවියෙක් නැඟී සිටැ කර බහා ගෙණැ වක ගසා ගෙණැ සිතිවිලිඅවුලෙහි හුන් සච්චකයා හා, මතැතක්හු කුඹ පළා හෙළලා බලබලා හුන් කෙශරසිංහයක්හු සේ මන් බුන් සච්චකයා බලබලා වැඩැහුන් බුදුන් හා දක "ස්වාමීනි, උපමාවෙක් මා කටට දිවෙයි. ඒ දන්වම්හැ"යි කී යැ. "දුර්මුඛය, කියා බලගැ"යි වදළසේකැ. "ස්වාමීනි, බිලෙකැ[2] හොත් කකුළුවකු බිලයෙන් ඇදලා සෙල්වුසෙල්වූ නළ දඬෙන් ගසා බිඳලූ කලැ ඒ කකුළුවා බිලයට වැද්ද නො හී[3] හොත්තා සේ, අපගේ සච්චකපණ්ඩිතයන් සෙල්වුසෙල්වූ නළ බිඳ වදළසෙයෙක. දන් නුඹවහන්සේ කරා වැද්ද නො හී හුන් ලෙස බලා වදළ මැනැව. 'වාද කරම්හ'යි අප හුන්තැනැ හිඳ පියැ නො දී නහා ගෙණැ ආවාට සුදුස්සක් කළෝ යැ. බුහුනන් සතරදෙනා මුහුණැ ගැහැවුනු දලිත් පිස්සා මැනැවැ. බුන් ඔදත් ඉතා රිසියෙයි. හිසැ සිටැ දෙපත්ලට එකතැනෙකින් ඩාපොදක් සෙල්වුනුතැනෙකුත් නැත. ස්වාමීන්ගේ ශ්‍රීශරීරයෙන් වූ කලී ඩහ සොල්වා සිවුර තෙමාපූ යැ. මෙතෙක් කල් මදක් හැඳින්නම්හ. වූ නියා වූ කලී දත්තේ අද යැ"යි පරිභව බණන්නට වනැ.

ඉක්බිති සච්චකතෙම "මූ බිණූ බසට නො බැණැ හුන්නෙම් නම්, හැමදෙන මැ මට බෙණෙති"යි සිතා, තමා හා බණන දුර්මුඛයා වළකාලා බුදුන්වහන්සේ පැන[4] විචාරා, තමා ල ගන්වා බණ වදළ සඳෙහි, 'ස්වාමීන් හා විවාද කෙරෙමි'යි මා කළ බුහුටිකම් මතැතක්හු දළ අල්වා ගත් තැනැත්තහු කළ බුහුටිකමට ද සොරවිෂසර්පයක්හුගේ කොල් දත් ගිණූ බාලයක්හුගේ බුහුටි කමට ද, දිළියෙනගිනිකඳෙක්හි අත එරවාලූ එකක්හට ද නො අඩු යැ. ඉදින් මෙසේ මෙසේ කළවුන්ට අස්වසෙක් ඇත් නම්, නුඹ හා වාදයට ආවා වූ මටත් අස්වසෙක් ඇත. වාද වන්නා කොට මුදුන්පත් කළම්හ. ඒ තබාපියා මෙතැන් පටන් ගෙණැ දිවිහිමියෙන් උපාසක වූම්හ. අපගෙන් දන් ගත මැනැවැ"යි පවරා මහදන් දින.

මෙසේ 'නුවණින් බඩ පැළී යෙ'යි කියා යපතෙකින් බඩ වෙළාගෙණැ 'තමන් ශ්‍රීශරීරයෙන් ඩහ සොල්වා බණන්නට යැ'යි කියා ආ වාදීන්,

1. පිණිස මෙන්. 2. විලෙක. 3. නො හී නැමැද. 4. බණ

Non-Commercial Distribution

සිංහනාද ඇසූ සාවුන් සේ තතුණුවා හික්මවා තමන් ශ්‍රීපාදමූලයෙහි පෙරළවන සේ දන්නා, බිණියැ හෙන බණ කිය හෙනැ අචින්ත්‍ය වූ වචන ඇති, උපමා නැති වියත්කම් ඇති, සිරිබර වූ මහත්කම් ඇති, ආශ්චර්‍ය්‍යපුරුෂ වූ, බිඳ පියැ නො හැකි දළදප් ඇති, මුළුලොවට එකාචාර්‍ය්‍ය වූ සියලු මිථ්‍යා දෘෂ්ටි බිඳ සද්ධර්‍මය දෙසන්නා වූ, සියලු හිත තාක් ප්‍රකාශ කරන්නා වූ, මෙ වැනි සංසාරදුක් නිවන්නා වූ,[1] මෙසේ හික්ම වියැ යුත්තන් හික්මවන සේ දන්නා වූ ස්වාමිදරුවානෝ ජාති ජාතියෙහි මා ලෙන් නිතොර වෙත්වයි, මම ඔවුන් මැ සරණ යෙමි යි-පෙ-යුතු.

## 106.

තව ද, දහමට සිත් දී, මුළුලොව්හි කරුණා යොද, සියලු දතයුතුයෙහි නුවණින් එකරජ කෙරෙමින්, නිවන්අමාවට වැඩි මිහිරි වැ, ප්‍රයෝජනයෙන් ලයට වැඩි ප්‍රයෝජනවත් වැ, මමත්වයෙන් ජීවිතයට වැඩි මමත්ව කට යුතු වැ, බලයෙන් මර හට වැඩි බලවත් වැ, උපකාරයෙන් මවුපියන්ට වැඩි උපකාරී වැ, මැදහතින් කර්‍මය සේ මැදහත් වැ, සෘද්ධියෙන් මුළුලොව්හි පැතිරෙමින් වැඩහුන් විහාරයට වන් ප්‍රතිවාදීන්, 'අපගේ බසුත් බස් වි ය' යන අභිමානයකව නො යා දෙමින්, යෙළසියක් යොදුන් ගුරුළුරජහු බට හොමුවහුඅත්තක් සෙයින් තමන් ගුණබර නො ගත හෙන මුළුලොව අනවරතයෙන් වෙවුල්වමින්, කැලැති පැන් පහදවන උදකප්‍රසාදමාණික්‍යයක් සේ ක්ලෙශයන් විසින් කළඹනලද මුලුලෝවැසියන් සිත් තමන්වහන්සේ ධර්‍මයෙන් ප්‍රසන්න කෙරෙමින්, ගෝකුණුයෙහි ඇති මඟුල්ගොරදක් සෙයින් මෙවෙනි සසරෙහි පහළ වැද සද්ධර්‍මමඩගලයට පිහිට වැ සිටියාවූ, ගිමට සුහුඹුල් වැ වඩනා වූ කිදිලියක් සේ ලොව නිසා දුක් වුන් වුන් සේ මැ සුහුඹුල් වූ කරුණා ඇති, ගින්නෙහි පැසී මධුර වූ කිරියොදක් සේ සාරාසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි සසර ගින්නෙන් පැසී සර්‍වඥතාඥන නමැති යොද හිදි මිහිරි වූ, සාරාසංඛ්‍ය-කප්ලක්ෂයක් මුළුල්ලෙහි සියලු ලෝවැස්සා[2] තමන් වහන්සේ කරුණා නැමැති කුස* ගෙණැ ඒ බර උසුලා, ඒ සතුන් පිණිස දහමට දෙළදුක් ගත්, තමා ඇකයෙහි හුන්නා වූ පුත්‍රයා කළ මලමූත්‍රයට රුහැණි නො වන පියක්හු සෙයින් වල්මී වැ උපන් තමන්වහන්සේගේ ශරීරයෙහි මලමූත්‍ර කරණ වඳුරාගේ දුෂ්ටකම් ක්ෂමාබලයෙන් සැනැහිසැනැහී සුරතල් කොට හිඳුනා[3] වූ, නැහෙන වේලාව නො වරදවා නැහෙන හිරක් සේ අනුන්ට වැඩ කළ මනා වේලා නො වරදවා වැඩ කරණ, බුරුල්ලෙහි

1. දුක්මුදන්නා වූ. 2. ලෝවැස්සා නිසා. 3. විදුනා. * කුසලැ

Non-Commercial Distribution

තොල්ලෙන් තැළුතැළු සේ කිරි එරවන්නා වූ මවුදෙනක සෙයින් දුර්ජනයන් තමන්ට දුක් දුන් දුන් සේ මැ වඩ වඩා මෙත්සිත් එළ වූ බුදුරජානන්වහන්සේ එක්සමයෙක්හි උක්කට්ඨා නම් නුවර නිසා සුභගවනයෙහි සල්ගසක් මුලැ වැඩ වසනසේක.

එසමයෙහි බක නම් මහාබ්‍රහ්ම "තමාගේ අත්බව ස්ථිර යැ, නො නස්නේ යැ" යන පවිටු වූ දෘෂ්ටියක් ගත. එසමයෙහි සියලු සත්ත්වලොකයෙහි නුවණදල දමා තමන්වහන්සේගේ අනුග්‍රහයෙන් සසරින් නැඟියැ යුතු සත්ත්වයා බලන බුදුරජානන්වහන්සේ ඒ මහාබ්‍රහ්මයාට එබඳු වූ මිථ්‍යාදෘෂ්ටියක් ඇති වූ බව තමන් වහන්සේගේ නුවණින් දන වදරා, චණ්ඩාලයක්හට වුවමනා මැයැ. රජකුහට වුවමනා මැ යැ, රොගයක් දුටු විටැ පිළියම් කරණ මහවෙදක්හු සේ, තිරිසනෙකුට වුව මනා මැ යැ, මහබ්‍රහ්මයාහට වුවමනා මැ යැ, ඇති වූ කෙලෙස්ලෙඩකට තමන්වහන්සේ දහම් පිළියම් කරණ හෙයින් දික් කළ අතක් වක් නොකරණ තුරු වක් කළ අතක් දික් නො කරණ තුරු මකුළු හුයෙක් යටිපිට ද මතුපිට කළුවන් නො වන තුරු, බලවත් පුරුෂයක්හු හෙළාලන ඇසිපිය දෙක ඊර් වැද නො ගන්නා තුරු 'යෙමි'යි සිතා වදළ සිත හා සමඟ මැ බඹලොවැ පහළ වූ සේක.

ඉක්බිති ඒ මහාබ්‍රහ්මතෙම බුදුන් දැකැ "මෙසේ අව මැනැව මෙවැනි නිත්‍ය තැනෙක් නැත. මෙබඳු නො නස්නා තැනෙක් නැත. මේ බඹලොවෙහි ජරාවට පැමිණෙන කෙනෙක් හෝ මියැ යන මහලු වන කෙනෙක් හෝ නැත. මේට වැඩි අනික් සසරින් ගැලවෙන තැනෙක් නැතැ"යි දන්වී යැ. ඒ අසා සර්වඥයන් වහන්සේ "බ්‍රාහ්මණය, තෝ නුනුවණින් පිරී ගිය සිත් ඇති හෙයින් අනිත්‍යයට නිත්‍ය යැ යි යෙයි. අස්ථිර දෙයට මැ ස්ථිර යැ යි යෙයි. මේට වැඩි අනික් නිවණෙක් නැතැයි යෙයි. තා සේ මොහාන්ධකාරයෙහි ගැලී ගියෝ නැත. තා සේ නුනුවණට ගැති වූවෝ නැත. තා සේ සසරදුකට නියැලීගත්තෝ නැත. තා සේ දහමට පිටි පෑවෝ නැත. තා සේ සම්‍යග්දෘෂ්ටියට සතුරු වැ සිටියෝ නැත. තා සේ කරුණා කටයුත්තෝ නැත. මෙ බඳු මිථ්‍යාදෘෂ්ටියක් කුමට ගත්හි දැ"යි වදළසේක.

එකල්හි මාරදිව්‍යපුත්‍ර තෙම "බුදුහු කොයි වැඩැ හුන්ද දෝ හො!යි බලන්නේ බඹලොව වඩනා බුදුන්වහන්සේ දැකැ මොහු බඹලොව වඩිති. ඉතින් ඔබ ගොස් බාධාවක් නැති වැ බණ කිවු නම්, සියලු බඹපිරිස අමාමහනිවන්හි පුරාපියති. එසේ කල්හි මාගේ ආඥ පවත්නා

Non-Commercial Distribution

සසර සිස් වැ යන්නේ යැ. එහෙයින් මා බඹලොවට ගොස් මේ දෙශනාවට බාධා කළ මැනැවැ"යි බඹලොවට ගොස් බලවත් බඹුන් ඇඟැ ආවිෂ්ට වියැ නො හී, පළමු වන බඹතලෙහි එක් බඹක්හු ඇඟැ ආවිෂ්ට වැ ගෙනැ, "මහණ, මේ මහාබ්‍රහ්මයාට නිඳා නො කර මේ තෙම මහාබ්‍රහ්මයෙකැ. හැම බඹුන් මේ මැඩැ පවත්ති. මුහු මැඩැ පවත්නා එක ද බඹෙක් නැත. සියලු දත යුතු තාක් ගෙවා දත. සියලු සත්‍වයන් තමා වසඟ කොට සිටියේ යැ. ලොවට ඊශ්වර යැ. මුළු ලොව මැවූයේ මේ යැ. මහපොළොව යැ, හිමාලයපර්වත යැ, මහමෙරු පර්වත යැ, චක්‍රවාටපර්වත යැ, මහාසමුද්‍ර යැ, සඳමඩල යැ, හිරු මඩල යැ යනාදි සියල්ල උන් සිතූ සිත හා කැටි වැ පහළ වී යැ. "තෝ රජ වා තෝ බමුණුවා. තෝ වෛශ්‍ය වා. තෝ ශුද්‍ර වා. තෝ ගිහිවැසි වා. තෝ මහණ වා" යනාදි සියලු සතුන් මවන්නේ මේ යැ. එහෙයින් සියලු සත්‍වයෝ මොහුගේ දරුවහ. මහණ, පෙරැ තාපසවරහු ද, සියලු ලොව අනිත්‍ය යැ, දුඃඛ ය, අනාත්ම යැ'යි කියා වරදවා ගෙණැ සතර අපායෙහි හුනහැ. මේ මහා බ්‍රහ්මයා කී පරිද්දෙන් 'මේ මැ නිත්‍ය යැ. මේ මැ සුබ යැ. මේ මැ ආත්ම යැ'යි කියා ගත්තාහු මියැ ගොස් මේ බඹලොවැ ඉපැද සුවපත් වූහැ. එහෙයින් තොපට සිතා යැ මා මේ කියන්නේ. වළෙක්හි හුනු එකක්හු එල්ලී ගන්නා දෙයක් නො ලද හොත්, මහවළෙහි නස්නා සේ, තෙපි මේ මහබඹහු කී බස් නො ගත්තාහුවූ නම්, තෙපිත් සසරැ හී නසුව. එහෙයින් එසේ නො නැසී මේ මහාබ්‍රහ්මයා කී බස් ගිවිස්සව" යි කී යැ.

ඒ අසා බුදුන්වහන්සේ "බ්‍රහ්මයෙක් නම් මා කී බසට උත්තරයක් කියැ හේ ද? මේ කුමන නම් බසෙක් දැ"යි පරීක්‍ෂා කොට වදරණසේක්, බඹහු ඇඟ ආවිෂ්ට වැ ගෙණැ දෙඩන්නා වූ මරහු දකැ 'පාපිෂ්ඨ මාරය, මේ බඹහු ඇඟ ආවිෂ්ට වැ ගෙණැ මෙවෙනි විකාරයක් දෙඩවන්නෙහි නො වෙයි ද? 'මා තා නො හඳුනති'යි නො සිත. මා දූන් බුදු වූ කල්හි තබා බුදු වන්නට වජ්‍රාසනයෙහි හුන් දවස් මැ, මා මතු හිඳුවා ලා තාගේ හඬ අසා පලාගිය මහබඹුන් දූන් මා හා සම කොට කුමට බණයි ද? තාගේ ආඥවෙහි වැටෙන්නවුනුත් නො වැටෙන්නවුනුත් තාගේ බස් ගිවිස්නවුනුත්, නො ගිවිස්නවුනුත් තෝ මැ හඳුනන්නේ වෙහි ද? එතෙකින් නො දෙඩවා සිට" යි වදළසේක.

බුදුන් එසේ වදරත් මැ මාරතෙම බුද්ධතෙජසින් කකියා ගොස් යමක් කියවියැ නො හී සිටියේ. ඉක්බිති මහබඹතෙම "මහණ, මම නිත්‍ය දෙයට මැ නිත්‍ය යැ යි කියමි. ස්ථිර දෙයට ම ස්ථිර යැ යි

Non-Commercial Distribution

කියමි. මෙයිට වඩා අතික් නිවණෙක් නැති හෙයින් මැ මේට වැඩි අනික් නිවණෙක නැතැයි කියමි. ඉදින් තෝ මා ගත් දෘෂ්ටිය මැ ගත්තෙහි වී නම් තමා මට දෙවන තන්හි සිටුවා මා යත් එත් හිඳුත් සිටුත් හොවුත් තා මට ඡායාවක් සේ නො හැර පවත්නා පරිද්දෙන් තබා, තා මට ඇතුළත් කෙරෙමි. එසේ නො කෙළෙහි වී නම්, තා මාගේ ආනුභාවයෙන් බිම ඇපිළි කොට පියමි" යි කී යැ. එ බස් ඇසූ සර්වඥයන්වහන්සේ මේ මහාබ්‍රහ්මතෙම ඉතා අභිමාන ඇත්තේ යැ. තමාගේ යසසින් 'මෙතන මාගේ ශරීරයෙහි ගැසී යන්නට සුදුසු එක ද සත්ත්වයක්හු ඇතැ'යි නො සිතමි. මෙතැන්හි මොහුගේ මානය බිඳ පියා පසු ව බණ කිව මැනැවැ" යි සිතා වදරා 'මහාබ්‍රහ්මය, තාගේ ගති මම දනිමි. තාගේ ද්‍යුති ද දනිමි. තාගේ ඍද්ධි වූ නියාව ද දනිමි. තාගේ මහත වූ නියාව ද දනිමි. මා තා නො හඳුනතියි සිතයි දැ?" යි වදළසේක.

ඒ අසා මහාබ්‍රහ්මතෙම "තොප මා හඳුනන පරිදි කෙසේ දැ?"යි කී යැ. "මහාබ්‍රහ්මය, හිර සඳ දෙදෙනාගේ ආලොකය පවත්නා තැන් එක් සක්වළෙක් නම් වෙයි. එසේ වූ සක්වළ දහසෙක් තා වසඟ වැ පවත්නේ යැ. මම ඒ තා වසඟ වැ පවත්නා වූ දහසක් සක්වළැ හීන සත්වයෝ මෙතෙකැයි කියාත් දන්මි. උත්තම සත්වයෝ මෙතෙකැයි කියාත් දන්මි. මෙ තෙක් සත්හු රාගී යැ යි කියා ද, මෙතෙක් සත්හු ද්වෙෂී යැ යි කියා ද, මෙතෙක් සත්හු මොහී යැ යි කියා ද, මෙ තෙක් සත්හු ශ්‍රද්ධාචරිතයෝ යැ යි කියා ද, මෙ තෙක් සත්හු බුද්ධිචරිතයෝ යැ යි කියා ද, මෙ තෙක් සත්හු විතර්කචරිතයෝ යැ යි කියා ද, මෙ තෙක් සත්හු උපදිමින් සිටියෝ යැ යි කියා ද, මෙ තෙක් සත්හු මියෙමින් සිටියෝ යැ යි කියා ද, දන්මි. තා ඉතා මහත්මි යි සිතන බව මුත් දහසක් සක්වලින් වැඩියෙක්හි තාගේ ආඥව නො පවත්ති. මේ ලොකයෙහි තට වැඩි මහත් වූ දෙදහසක් සක්වළෙහි ආඥව පවත්වන මහා බ්‍රහ්මයෝ අනන්ත ය හැ. උන්ට වැඩි තුන් දහසක් සක්වළෙහි ආඥව පවත්වන මහාබ්‍රහ්මයෝ අනන්ත ය හැ. උන්ට ද වැඩි සාර දහසක් සක්වළෙහි ආඥ පවත්වන මහාබ්‍රහ්මයෝ අනන්ත ය හැ. උන්ට ද වැඩි පන්දහසක් සක්වළෙහි ආඥව පවත්වන මහා බ්‍රහ්මයෝ අනන්ත ය හැ. උන්ට ද වැඩි දස දහසක් සක්වළෙහි ආඥව පවත්වන මහාබ්‍රහ්මයෝ අනන්ත ය හැ. උන්ට ද වැඩි ලක්‍ෂයක් සක්වළෙහි ආඥව පවත්වන මහාබ්‍රහ්මයෝ අනන්තය හැ. තෝ ඒ බ්‍රහ්මයන්ගේ ප්‍රමාණය බැලූ කලැ සතරරියන් ගැබෙක්හි ආඥව පවත්වන එකක්හු වැන්නෙහි. තෝ ජාතියෙන් ජාතියට මියැ මියැ ආ තැන් නො දන්නි. මම වූ කලී මේ හැම නුවණින් පිරිසිඳ දන්මි. එසේ හෙයින් තාගේ හා මාගේ හා ප්‍රමාණය

Non-Commercial Distribution

බැලූ කලැ තෝ හබබිජුවටක් වැන්නෙහි. මම චක්‍රවාටපර්වතය වැන්නෙමි. තෝ පැන් ගෙණැ සිටි ගෝකුරයක් වැන්නෙහි. මම සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇති සාගරය වැන්නෙමි. තෝ මල් ගෙණැ සිටි පිලගසක් වැන්නෙහි මම සහමල්පලු වැ සැදී සිටි දෙවියන්ගේ පරසතුරුක වැන්නෙමි. තො ගැඩැවිලුන් තුඩැ වැද ගත් පස්සුහක් වැන්නෙහි. මම දෙලක්‍ෂ සතළිස් දහසක් යොදුන් බොල ඇති මහපොළොව වැන්නෙමි. තෝ හිදිකටුමල සිදුරෙන් යන ජලබින්දුවක් වැන්නෙහි. මම පඤ්චමහාගඞ්ගාවෙන් එක පැහැර යන ජලස්කන්ධයක් වැන්නෙමි. තෝ හීතණ පත අග වැද ගත් පිනිබිඳක් වැන්නෙහි. මම කෙළලක්‍ෂයක් සක්වළැ එක පැහැර වස්නට නගාලූ. මහමෙඝයේ ජලස්කන්ධය වැන්නෙමි තෝ ගුල්ලන් කෑ හබඇටසිදුරක් වැන්නෙහි. මම අනන්තා පර්යන්තප්‍රමාණ ඇති ආකාශය වැන්නෙමි. එහෙයින් තා හා මා හා නො සමයම්හ''යි වදළසේක.

ඒ අසා බකබ්‍රහ්මතෙම ''ශ්‍රමණ ගෞතමයෝ පෙරැ මා කළ පින්කමුදු දන්මියි කියති. මාගේ ආයුවෙහි පමණ ද, මා උපන් තැනුදු දනිමි යි වදරති. මේ මා විචාරා බැලුව මැනැවැ''යි සිතා ''ශ්‍රමණ ගෞතමයෙනි, තෙපි මා පෙරැ කළ පින්කමුදු මාගේ ආයු දු, මා ඉපද ආ තෙනුදු හැම දන්මි යි කියව. ඒ මට කියා බලව''යි ආරාධනා කෙළේ යැ. ඒ අසා බුදුන්වහන්සේ ''මෙ විටැ මා මොහු ල ගෙණැ බණ කියා මොහුගේ මිථ්‍යාදෘෂ්ටිය හරවා මෝහට වන සසරදුක් ගෙවා මාගේ පාදපද්මයෙහි මොහු ලවා බමරවිලස් දක්වා මා ආ ගමන් සාර්ත්‍ථක කෙරෙමි''යි සිතා වදරා ජවනිකාවක් ඇදපියා චිත්‍රපටයක් පානා සේ, වලාකැළයක් ඇල කොට පියා සඳහිරුමඬුලු දක්වන්නා සේ, මහාසාගරයෙහි ජලස්කන්ධය දෙබේ කොට පියා යට තුබූ සත් රුවන් දක්වන්නාසේ, පූර්වජාතිය මුවා කොට ගෙණැ සිටි මොහය දුරු කොට ඔහු ගිය ජාතියෙහි කළ කුසල් වදරන්නට පටන්ගත්හු. හේ කෙසේ ද? යත්:-

''බ්‍රහ්මය, තෝ පෙරැ කුලගෙයෙකැ ඉපිද කාමයෙහි ආදීනව දැකැ 'ජරාමරණින් මිදී ගිය මැනැවැ'යි සිතා තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වැ ධ්‍යාන උපදවා අභිඥලාභි වැ එක් ගඟක් අසැ පන්සලක් කොට ධ්‍යානසමාපත්තියෙන් දවස් යවා වෙසෙයි. එ සමයෙහි වෙළඳුන් පන්සියයක් ගැල්වලැ බඩු පුරා ගෙණැ මහ මරුකතරට වන්හ. ඒ වෙළෙඳහු එ කතරැ හුණුවැල්ලෙහි දවල්හි ඇක්මැ යා නො හැකි හෙයින් රැ රැ ගමන් යෙති. ඊ පළමුවන ගැළ අග්වියෙහි යන ගොන්නු යෙමින් සිටැ ආ මඟ බලා නැමුනා හැ. සෙසු ගැල් ගෙණ යන ගොනුන් නැමුනු ගැල හා එක් වැ මැ ගියහ. ඒ වෙළෙඳෙහු ගැල්

Non-Commercial Distribution

නැවතිබව රැ දෙවරු නො දනැ හිර නැඟි කලැ දත්හ. ඒ දවස් ඒ වෙළෙඳුන් ඒ කතර ඉක්මැ ගෙණැ යන දවස යැ. දිය හා දර හා නැති වැ ගියේ. මිනිස්සු තාක් 'මෙ විටැ අප දිවි නට'යි[1] සිතා ගොන් ගැල් සකැ බැඳ පියා ගැල් සෙවනෙහි වැදහොත්හ. තෝ එ වේලෙහි පන්සලින් නික්මැ පන්සල්දෙරැ හිඳ ගඟ බලන්නෙහි ඒ ගඟ මහවතුරෙන් පිරී ගෙණැ නිල්මිණිකඳක් සේ එන්නා දැකැ 'මේ ලොකයෙහි මේ නියා මිහිරි පැන් ඇති වැ, නො ලදින් නස්නා සත්ත්වයෝ ඇද්දෝ හෝ!" යි සිතා බැලුයෙහි, මරුකතර ගැල් සෙවනැ වැද හොත් වෙළෙඳුන් පන්සියය දැකැ, 'මේ සත්ත්වයෝ නො නසිත්ව'යි 'මේ ගඟින් මහත් දියකඳක් නැඟී ගෙණ ගොස් මරුකතරැ පැන් නො ලදින් හොත් වෙළෙඳුන් කරා යේව'යි අධිෂ්ඨාන කෙළෙහි. එ මැ ක්‍ෂණයෙහි කපාලූ ඇළෙකින් යන පැනක් සේ දිය කඳක් ඒ වෙළෙඳුන් හොත් තැනට ගියේ. මිනිස්සු පැන් දැකැ ඉතා සොම්නස් වැ සුවසේ නහා පැන් බී ගොන් පැන් පොවා ගෙණැ සුව සේ තමන් කැමැති තැනට ගියෝ" යි.

මෙ සේ මහාබ්‍රහ්මයා පූර්‍වයෙහි ගිමැ නස්නා මිනිසුන්ට පැන් දුන් නියාව වදරා 'බ්‍රහ්මය, මේ තා පූර්‍වයෙහි කළ කුසල් ඊයේ දුටු දෙයක් සේ දනිමි" යි වදරා නැවැතැ බ්‍රහ්මයා පූර්‍වයෙහි කළ අනික් පින්කමක් දක්වා වදරණ සේක් "බ්‍රහ්මය, තෝ අන් ජාතියෙකැ උපන්නෙහි, එ මැ ලෙස මැ කාමයෙහි ආදීනව දැකැ පැවිදි වැ ගෙණැ ගඟක් අසැ පන්සලක් කොට ගෙණැ වලැ වූ ගමක් නිසා වෙසෙයි. එකල්හි සොරහු ගම් පැහැරැ නොයෙක් රුවන් හැරැ ගෙණැ ගෙරින් හැරැ ගෙණැ එ ගමැ මිනිසුන් ලවා ගෙණැ යති. එ ගමැ බල්ලොත් ගෙරිත් මිනිස්සුත් මහහඬින් හඬති. තෝ ඒ හඬ අසා 'කුමක් දෝ හො!'යි බලන්නෙහි මිනිසුන්ට භයක් උපන්බව දනැ, 'මා බලබලා සිටියැ දී, මේ සත්ත්වයෝ නො නසිත්ව'යි කියා ධ්‍යාන සමාපත්තියට සමවැද ධ්‍යානයෙන් නැඟී සොරුන් එන පෙර මඟ මහාසේනාවක් මැවීහි. ඒ සොරු බෙර ගස්වා ගෙණැ එන සේනාව දැකැ 'රජ ආවනැ'යි සිතා තමන් ගත් දෙය හැරැ පියා පලා ගියහ. තෝ එසමයෙහි "යමෙක් යම් වස්තුවක් ගත්තේ වී නම්, ඒ ඕහට මැ වේව"යි කියා අධිෂ්ඨාන කෙළෙහි. තා එසේ අධිෂ්ඨාන කරන්නා හා මැ ඒ එසේ මැ වී යැ. ඒ ගම්වැස්සන්ට එකලැ බොහෝ ශාන්ති වි යැ. ඒ තා පූර්‍ව ජාතියෙහි කළ කුසල් මා අත්ලේ හිරි සේ ප්‍රසන්න කොට දන්මි"යි වදරා, නැවැතැ ඒ මහාබ්‍රහ්මයා පූර්‍ව ජාතියෙහි කළ අනික් පින්කමක් දක්වා වදරණ සේක්-

---

1. නැතැයි.

Non-Commercial Distribution

“බ්‍රහ්මය, තෝ අනික් ජාතියෙකත් උපන්නෙහි, එමැ ලෙස මැ පඤ්චකාමයෙහි ආදීනව දකැ පැවිදි වැ ගඟක් අසැ පන්සලක් කොට ගෙණැ වෙසෙයි. එ කල්හි උඩුගඟැ එක් ගමෙකැ වසන කුලයෙකැ මිනිස්සු යැ, යටගඟැ කුලයෙකැ වසන මිනිස්සු යැ යන මොහු එක් වැ මිත්‍රකම් කොට ගෙණැ නැව් හගුළු බැඳ ගෙණැ බොහෝ කනබොන දෑ සුවඳ මල් නැවකට නඟා ගෙණැ දියපිටින් එති. එන මිනිස්සු කමින් බොමින් නටමින් ගී කියමින් දිව්විමනෙකින් යන්නා සේ සොම්නස් වැ යෙති. ඒ ගඟැ වසන මහානාගරාජයෙක් රැහැණි වැ ‘මා මෙහි ඇතැයි යන සිතක් මැ නැත්තාහ. දන් මුන් හැම මුහුදුබත් කළ මැනැවැ’යි මහා ආත්මභාවයක් මවා ගෙණැ ඒ ගඟ දිය දෙබේ කොට පළා පියා පැනැ නැඟී පෙණ කොට ගෙණැ මහත් කොට සුස්මමින් සිටියේ යැ. ඒ මිනිස්සු භයඞ්කර වූ ඒ නාගරාජයා දකැ මහත් භය ඇති වැ මහහඬින් හඬා නැංගා හැ. තෝ එවේලෙහි පන්සලැ හුන්නෙහි ඒ හඬ අසා ‘මේ මිනිස්සු ගී කියමින් නටමින් සොම්නස් වැ එති දන් වනාහි මහහඬින් හැඬූ ය. මේ කුමක් දෝ හෝ!”යි සිතන්නෙහි ඒ නාගරාජයා දක ‘මා දුටු කල්හි මේ සත්වයෝ නො නසිත්ව’යි කියා ධ්‍යානසමාපත්තියට සමවැද එයින් නැඟී ගුරුළුවෙසක් මවා ගෙණැ තමා නාගරාජයාට දක්වීහි. නාගරාජයා භයපත් වැ පෙණ හකුලුවා ගෙණැ දියෙහි ගැලී ගියේ යැ. මිනිසුන්ට බොහෝ ශාන්ති වී යැ බ්‍රහ්මය, මෙසේ තා පූර්වයෙහි කළ කුසල් මට ඇතැමුලු සේ යහපත් වැ පැණෙ”යි වදළසේක. මෙසේ ඒ බ්‍රහ්මයාගේ බකජාති ආදි වූ නොයෙක් ජාතියෙහි කළ දෙය සර්වඥයන්වහන්සේ වදළසේක.

මෙසේ බුදුන් වදරන්නා හා මැ, ඒ බ්‍රහ්මතෙම තමා පූර්වයෙහි කළ කුසල් තාක් අභිමුඛයෙහි තබා ලූ පහන් කැටපතෙකැ පෙණෙන රුවක් සේ ඉතා පහන් කොට මැ දිට. එ සමයෙහි ඒ බ්‍රහ්මතෙම තමා සේ මැ වූ බඹුන් සියදහසකට ද තමහට වැඩියා වූ බ්‍රහ්මයන් සියදහසකට ද උගහට වූ සර්වඥයන් වහන්සේගේ බුද්ධි විලාසය දකැ “ස්වාමීනි, මම මුක්තාහාරයෙකැයි සිතා සර්පයකු ගන්නා සේ නුඹවහන්සේ නො හැදිනැ නුඹ වහන්සේට නුසුදුසු බස් බිණිමි. නුඹ මාගේ ස්වරූප මතු දන්නා ද නො වන ද යැ. සියලු දත යුතු දෙයින් නුඹ වහන්සේගේ නුවණට නො හමු වස්තුවෙක් නම් නැත. එහෙයින් නුඹවහන්සේ නො පිපි සපුකැකුළු මැද දල් වූ කපුරු පහනක් සේ මේ මහබඹුන් මැද සියලු බ්‍රහ්මයන්ගේ ශරීරප්‍රභා නුඹවහන්සේගේ ශරීර ප්‍රභාවෙන් මැඩැ දිලියෙන සේකැ”යි කී යැ. ඉක්බිති සුභාෂිත ස්වාමී වූ ධර්මස්වාමී වූ ලොකස්වාමී

Non-Commercial Distribution

වූ මාගේ ස්වාමීන්වහන්සේ ඔහුගේ මිථ්‍යාදෘෂ්ටි බිඳිනා පිණිස "පයෙවිං බො අහං බ්‍රහ්මෙ" යනාදීන් නානා නයින් විචිත්‍ර වූ ධර්‍ම දෙශනා එළවා ඔහුගේ "මේ බ්‍රහ්ම සම්පත්තිය ස්ථිර යැ. මට ජරාමරණ නැත. මේ මැ නිර්‍වාණ යැ"යි ගත්තා වූ මිථ්‍යාදෘෂ්ටිය බිඳ වදළසේක.

ඉක්බිති ඒ බ්‍රහ්මතෙම "බසිනුත් රුවිනුත් මුන් හා සම වැ ගත නො හැක්කැ ඍද්ධියෙන් වැඩියක් ඇත හොත්, කොට බලම්හ"යි සිතා "මම අන්තර්ධාන වෙමි"යි කී යැ. සර්‍වඥයන් වහන්සේ "අප මධ්‍යයෙහි තෝ අන්තර්ධාන වන්නට අසමර්‍ත්‍ථ යෙහි යැ"යි වදරා, ඔහු සියුම් වැ "අන්තර්ධාන නොවන පරිද්දෙන් අධිෂ්ඨාන කොට වදළසේකැ. ඒ මහාබ්‍රහ්මතෙම "අන්තර්ධාන වෙමි"යි සිතා ඒ විමන්හි හැලෙයි. කප්රුක්හි හැලෙයි. බුදුන්ගේ ආනුභාවයෙන් අඳුරෙහි පහනක් අල්වා ගෙණැ හැලෙන එකක්හු සේ වන්වන් තන්හි සියලු බ්‍රහ්මයන්ට පැණෙයි. සිටි බ්‍රහ්ම සේනාව මුළුල්ල "හැලී ගිය ලෙස් ඉතා මැ යහපතැ. අඹල, තෙල කප්රුක් මුලැ හැලී හුන්නා වූ යැ. අඹල, තෙල විමානයෙහි හුන්නා වූ යැ"යි පරිහාස කරන්නට වන්හ. ඉක්බිති ඒ බ්‍රහ්ම තෙම අභිමාන ශූන්‍ය වැ තෙජස ද ශූන්‍ය වැ සිටියේ ය.

ඉක්බිති සර්‍වඥයන්වහන්සේ "මහාබ්‍රහ්මය, තා හැලුනු පරිදි සියලු බ්‍රහ්මයෝ මැ දුටුවෝ නො වෙද් ද? තාගේ අන්තර්ධාන වීමට මේ සියලු බ්‍රහ්මයෝ දෙස්සු නො වෙද් ද? ඉනිබ්බ තා හැලී ගිය පරිදි තට මැ හැඟුනු බැවින් තොයිත් තාගේ මේ සියලු බ්‍රහ්මයෝත් කැටි වැ හැම දෙන අප හැලී ගිය කලැ සොයා ගන්ව"යි වදරා වැඩැහුන් ආසනයෙන් කෙසඟක් සා තැනකුදු ඔබට නො වැඩැ හුන් ආසනයෙහි මැ වැඩැ හිඳ අන්තර්ධාන වූ සේක. සියලු බඹහු ද මහාබ්‍රහ්ම ද බුදුන් සොයන්නාහු, තමන්ගේ ඇස තමන් දක ගත නො හෙන්නා සේ, අන්තර්ධාන වූ ස්වාමිදරුවානන් දකැ ගත නො හුනහ. ස්වාමිදරුවෝ එසේ අන්තර්ධාන වැ වැඩැ හිඳ බණ වදරන්ට පටන් ගත්සේක. ඒ බණ අසා දසදහසක් මහබඹහු අමාමහනිවන් දුටහ. සියලු බ්‍රහ්මයෝ තාක් එක පැහැරැ බුද්ධානුභාවයට සතුටු වැ "මෙබඳු වූ ආශ්චර්‍ය්‍යයක් මෙ බඳු වූ පෙළහරක් මෙ බඳු වූ මහාපුරුෂ කෙනෙකුන් පෙරැ අපි නුදුටු විරුම්හ"යි මහත් කොට ගුගුළහ. ඒ මහාබ්‍රහ්ම ද ස්වාමිදරුවානන්ගේ ශ්‍රීපාදය මුදුනෙහි තබා ගෙණැ වැඳ "ස්වාමීනි, මහාකරුණාවට නිධාන වූ බුදුරජාණන්වහන්ස, ගැත්ත වූ අඥනයෙන් ගත් මිථ්‍යාදෘෂ්ටි බිඳ මෙ සේ වූ සම්‍යග්දෘෂ්ටියෙහි මා පිහිටුවා ගළවා වදළ සේ ඉතා යහපතැ"යි යනාදීන් ස්වාමිදරුවානන්ට ප්‍රශංසා කෙළේ ය.

Non-Commercial Distribution

මෙසේ මහාබ්‍රහ්මයන්ගේ පවා මන් බිඳ, දෘෂ්ටි බිඳ, තමන්වහන්සේට කුලගැති කොට, තමන්වහන්සේගේ මධුර වූ දහම් ලෙහි පුරා, සසර දුකින් මුදා නිවා සනහා අමාමහ නිවන්හි ලන්නා වූ මහාකරුණා ඇති, මහාඍද්ධි ඇති, මහා නුවණ අති, මහානුභාව ඇති මහාතෙජස් ඇති, මහාවික්‍රම ඇති මහාකීර්ති ඇති, සව්නෝ ගෙවා දත්, සරණ වන්නවුන්ට සුව දෙන සේ දන්නා බුදුන් -පෙ- යා යුතු.

## 107.

'මේ ධර්‍මය මේ ජාතියෙහි සුව එළව යි, මේ ධර්‍මය පර ජාතියෙහි සුව එළව''යි වදළ කල්හි "ඒ එසේ නො වේ''යි කියන්නට මුළු ලොව ගොළු වන හෙයින් මුළු ලොව බඳදිවි වන හෙයින්, තමන්වහන්සේ "මේ ධර්‍මය අනවරතයෙන් සෙවනය කටයුතු යැ''යි වදළ කල්හි "මේ ධර්‍මය සෙවනය කට යුතු නො වේ''යි කියන්නට මුළු ලොව යන්ත්‍රරූප සේ වත්, තමන්වහන්සේ "මේ ධර්‍මය සෙවනය නො කට යුතු යැ''යි වදාළ කල්හි "මේ ධර්‍මය සේවනය කටයුතු යැයි කියන්නට මුළු ලොව සෙලෙහි කළ රූ සේ වත්, තමන්වහන්සේ "හීන යැ''යි වදළ ධර්‍මය "හීන නො වේ''යි කියන්නට මුළු සත්ලොව අරූතෙලෙහි සතුන් සේ බස් නැති වත්, තමන්වහන්සේ "උත්තම යැ''යි වදළ ධර්‍මය "හීන යැ''යි කියන්නට මුළු ලොව අසංඥතලයෙහි සතුන් සේ දිවි සෙලවියැ නො හෙත්, ලොවට හිතාහිත යුක්තායුක්ත සෙවනීය අසෙවනීය සියලු ධර්‍මයන් සුදුසු පරිද්දෙන් අනුශාසනා කරන්නට මාගේ ස්වාමීන් තබා අනික් සත්ත්‍වයක්හු අසමර්‍ත්‍ථ හෙයින් මෙලොවින් පරලොවින් වන අර්‍ත්‍ථයෙන් සුදුසු පරිද්දෙන් සියලු සත්‍වයන්ට අවවාද කරණ සේ දන්නා වූ බුදුන් -පෙ- යා යුතු.

## 108.

තව ද, ප්‍රඥසම්පන්න වූ සාර්‍ත්‍ථවාහයක්හු තමා අනු වැ පවත්නවුන් සොරුන් ඇති කතරින් එතෙර කරවන්නා සේ, චණ්ඩයක්‍ෂයන් ඇති කාන්තාරයෙන් එතෙර කරවන්නා සේ, දුර්භික්‍ෂකාන්තාරයෙන් එතෙර කරවන්නා සේ, පැන් නැති කාන්තාරයෙන් එතෙර කරවන්නා සේ, මාගේ ස්වාමිදරුවෝ සියලු සත්‍වයන් ජාතිකාන්තාරයෙන් එතෙර කරවන්නාහ. ජරාකාන්තාරයෙන් එතෙර කරවන්නාහ. මරණකාන්තාරයෙන් එතෙර කරවන්නාහ. ව්‍යාධිකාන්තාරයෙන් එතෙර කරවන්නාහ. අමෘතමහානිර්‍වාණ නැමැති නිරුපද්‍රව වූ භූමියෙක්හි ඇර සිටු වන්නාහ. එසේ හෙයින් සත්ත්‍වයන් උපද්‍රව භූමියෙන් ගෙණැ ගොස් නිරුපද්‍රව-භූමියෙහි සිටුවන්නා වූ සාර්‍ත්‍ථවාහකයකු සේ මුළු ලෝ වැස්සන් උපද්‍රවභූමියෙන් ගෙණැ ගොස් නිරුපද්‍රවභූමියෙහි සිටුවන්නා වූ බුදුන් -පෙ- යා යුතු.

Non-Commercial Distribution

## 109.

එකුන්පණස් යොදුන් සඳමඬුලු හා සමපණස්යොදුන් හිරු මඬුලු හා තමා අතැ ඇඟිලිහස්සෙන් වසා ගන්නා බව රාහු ග්‍රහයා ගේ මහත්කම යැ, එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් පමණ මහමෙර කෙළනා කුමාරයා උඩට නැඟූ පන්දුවක් සේ ආකාශයට නඟා සුණුවිසුණු කරණ බව යුගාන්තවාතයෙහි බලවත්කම යැ, උදයපර්වතයෙහි පටන් ගෙණැ අස්තපර්වතය දක්වා මැද ඒ සා මහත් අවකාශය ගෙවා තමන් යන බව හිරසඳදෙදෙනාගේ ගමන්හි දක්‍ෂබව යැ, සුවාසූදහසක් යොදුන් පමණ මහාසාගරයෙහි ජලස්කන්ධය ගිනි ගෙණැ දිලියෙන යකබලෙක්හි හෙළාලූ පිනි බිඳක් සේ වියලාපියනබව යුගාන්තයෙහි හිරුගේ තෙජසෙකැ, තමන්ගේ බුද්ධියෙන් සියලු ඥෙයමණ්ඩලය නිරවශෙෂ කොට ගෙවා දන්නාබව මාගේ සර්‍වඥයන්වහන්සේගේ වියත්කම නිමා මැ යැ. එසේ වූ සර්‍වඥයන්වහන්සේගේ -පෙ- යුතු.

## 110.

ලොකයෙහි සූක්‍ෂම වූ පරමාණු, මහාපර්වත බලන්නා සේ, තමන්වහන්සේගේ බුද්ධියෙන් පිරිසිඳ බලා වදරණසේක. ප්‍රතීත්‍යසමුත්පාදය වැනි නො දත හැකි ධර්‍මයක් ප්‍රසන්න වූ ඉන්ද්‍රියයන් ඇතියක්හු චිත්‍රපටියෙහි ඇඳි සිත්තමැ රුවක් විභාග කොට බලන්නා සේ අනායාසයෙන් බලා වදරණසේක. පස්රුවැලයක් කරැ බැඳි බලවත් කුමාරයක්හු[1] සේ සංස්කාර, විකාර ලක්‍ෂණ, නිර්‍වාණ, ප්‍රඥප්ති යැ යන පඤ්චවිධඥෙයමණ්ඩලය තමන්වහන්සේගේ ඥනයෙහි එකදෙශයෙකැ පවත්වා වදරණ සේක. මෙසේ මහපෙළහර ගුණ ඇති හිමියානන් -පෙ- යුතු.

## 111.

දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් පමණ බොල ඇති මහපස් පොළොව උසුලා රඳවන බව දියපොළොවට මැ එක් බලයෙකැ. සාරලක්‍ෂඅසූදහසක් යොදුන් පමණ මහදියපොළොව නෙළුම් පතෙකැ හුනු දියබිඳක් සේ නො දත්වන් වැ හම්වන බව[2] නව ලක්‍ෂ සැටදහසක් යොදුන් පමණ බොල ඇති වාපොළොවැ මැ එක් වැරසැරකමෙකැ. අනන්තාපර්‍යන්ත වූ සියලු ඥෙයමණ්ඩලය සර්‍වාකාරයෙන් උසුලාගන්නා බව මාගේ ස්වාමීන්ගේ මැ නුවණැ එක්පෙළහරෙකැ. එසේ වූ පෙළහර ඇති මාගේ ස්වාමිදරුවාණන් වහන්සේගේ -පෙ- යුතු.

---

1. බාලකුමාරයක්හු 2. නො දන්වත් මැ හමන බව

Non-Commercial Distribution

## 112.

සුවාසූදහසක් යොදුන් මහමුහුදුපත්ලට බැසැ, අසුරපුරයට වැද ගෙණැ, ත්‍රිකූටපර්වතය පෙරළා බලා, සක්වළගල වටින් පිටින් පෙරළා බලා නාගලොකයෙහි වැද දවැටී[1] අජටාකාශයට වැද නහමා බලා, සදෙව්ලොව ප්‍රත්‍යක්‍ෂ කොට, හිරසඳ වටින් පිටින් පිරිමැද, බඹලෝ තාක් ගැණැ ගෙණැ සමනා, සියලු ලෝවැස්සන් මැ ඊ ස්වරූප දන්නා පිණිස සකස් කොට ලියාලූ ධර්‍ම නමැති ලේකම තමන්වහන්සේගේ ඥානයෙන් විමසා ලියාලූ වියතානන් වහන්සේගේ සරණ යෙමියි බුත්සරණ යා යුතු.

## 113.

පිපී සිටි පියුම්වනයකට වැද මුවරඳ කඳ ගෙණැ තමා පළමු වැ සුවඳ වී පිටත් වස්තූනුත් සුවඳ කොට හමා බස්නා වසන්ත කාලයෙහි මන්‍දමාරුතයක් සේ, චතුස්සත්‍ය තුමූ දන සෙසු සත්ත්වයනුත් දන්වූ බුදුන් -පෙ- යා යුතු.

## 114.

නැවත, සර්‍වඥයන්වහන්සේගේ චතුස්සත්‍යය සේ වූ දත නො හැකි දෙයක් පටාචාරවන්ගේ සිත පුරා[2] ගන්වා වදළ සේක. ඒ පටාචාරාව වූ නියාව කෙසේ ද? යත්:- සැවැත්නුවර සතළිස් කෙළක් ධන ඇති සිටුහුගේ පටාචාරා නම් එක් දුවක් ඇත. ඕ තොමෝ 'සඳමඩුලු වැනි මුහුණු ඇත්තී යැ දික් වූ ඇස් ඇත්තී යැ. කොඳකැකුළු වැනි දත් ඇත්තී යැ. රන්වන් වූ ශරීර ඇත්තී යැ. මනා වැ වට වූ පයොධර ඇත්තී යැ' යනාදීන් වර්‍ණනා කරත් හොත්, කියා ගෙවාගත නො හැකි රූ ඇත්තී යැ. අළුත් වූ යෞවන ඇත්තී යැ. මහත් වූ ඓශ්වර්‍ය්‍ය ඇත්තී යැ. දෙමව්පියෝ ඈ "යමක්හු කෙරෙහි සැලසී නො නට මැනැවැ"යි ප්‍රාසාදයෙහි මතුමහල්තෙලෙහි ලා රක්‍ෂා කරති. එසමයෙහි තමාගේ ගෙවැසි එකක්හු හා[3] සංවාසයක් ඇති වැ ගත. සිංහධෙනුව කැණහිලුන් හා සංවාස කරත්, බොධිසත්වයන්ට අඹු වැ කොටුන් ඉසින් උසුලත්, කොසොල් රජ්ජුරුවන් වැනි කෙනෙකුන් හැරැ බල්ලන් හා සංවාස කරත්, ගැණුන්ගේ නුගුණ කවුරු කියා නිමවා ගණිද් ද? පසු වැ ඇගේ මවුපියෝ "තමන් හා සමාන පුරුෂයකුට දෙම්හ"යි කියා දෙන දවස් හිමි කළහ. ඕ එබස් අසා තමා හා ගුණවත් වූ ගැත්තවු කැඳවා "ස්වාමීනි, මා අනික් පුරුෂයකුට විවාහ කොට දෙත් ල. 'මා තොප හැරැපියා අනික් සුදුසු පුරුෂයකු කෙරෙහි හිඳිති'

---

1. දවැටි, දවිටි, දවිටි. 2. පවා. 3. ලා.

Non-Commercial Distribution

යනු කිමෙක් ද? තොප නො දකැ අනිකකු මුහුණ බලා මෙ ඇස කෙසේ අස්වසම් ද? මේ ජීවිතයෙහි පළමු අගහස්රසය අනුභව කෙළේ තොප කෙරෙනැ. මුහුද ආසන්නයෙහි සිටියත්, පිපාසා ඇති වූ කල්හි ලිඳට මැ පැනට දිවන්නා සේ, මා යන කුලයෙහි මහාධන ඇත ද, මාගේ සිත ඔබ නො ගොස් තොප කරා මැ දිවෙයි. මා ජීවත් වන්නා කැමැත්තවු නම්, බැහැරට සොරා හැර ගෙණැ නැඟි යව. නැත හොත්, මාගේ ජීවිතය හෝ මරුට බිලි කරව''යි කිව.

එබස් අසා පුරුෂතෙම "මේ මාගේ ජීවිතය තී සතු වේ ද? කුල නො විචාරා මේ නියා ඓශ්වර්‍ය්‍ය නො විචාරා රකවල් නො විචාරා මවුපියන් නො විචාරා නැවැතැ මා වූ නියාව නො විචාරා තෙපි මා හා විශ්වාසයට පටන් ගතුව. එසේ වූ තොප මම් කෙසේ හැර පියම් ද? මම සෙට පහන් වූ කලැ නුවරදෙර අසවල්තැන සිටිමි. තෙපි යම් උපායෙකින් එතනට නැඟී එව''යි කියා අනික්ද උදසන ගොස් සලකුණු කී තැන සිටියේ ඕ කිලිටිකඩක් හැඳගෙණැ හිසකේ විදලා ශරීරයෙහි කුඩු ගල්වා ගෙණැ කළයක් හැර ගෙණැ මිඩියක හා එක් වැ එතනට ගියා. ඒ පුරුෂයා ඇ හැර ගෙණැ දුරට ගොස් එක් ගමෙකැ වසන්නේ දරපලා ගෙණැ ඇර ඇ රක්‍ෂා කෙරෙයි. ඕ සියඅතින් පැන්කළ ආදි ගෙණමින් පහරිමින් පිසිමින් දවස් යවයි. මෙසේ වසන කල්හි කල් යාමෙකින් ගර්භිණී වුව. ඕ තොමෝ තමාගේ ගර්භය මුහුකුරත් මුහුකුරත්, සැමියා කැඳවාලා "ස්වාමීනි, තොප පිණිස මා එකළා වැ විඳිනා දුක් අනික් පුරුෂයක්හුගේ ගෙහි විඳිනා සම්පත්තියට වඩා වඩිතී සිතමි. මා දෙම්හයි කී කුලගෙය තොප පිණිස හරණෙම්, නයින් හොත් තුඹසක් සේ සිතා හළිමි. ගැබියත් දූන් මුහුකුරා ගත. එකළා වැ වදනපොහොදනබව ඉතා උගහට. ඒ බව දන්නවා ද? මවුපියෝ නම් දරුවන් කෙරෙහි ඉතා ස්නෙහ ඇත්තාහ. මාගේ මවුපියන්ගේ ගෙහි දී වදනපොහොදන පරිද්දෙන් මා ඔබ ගෙණැ යව''යි කිව. එබස් අසා, ඒ "කුමක් ද තොප කියන්නේ? මා නියා සාපරාධ එකකු දුටු කලැ තොපගේ මවුපියෝ මට කුමක් නො කෙරෙද්ද? මම නො යා හෙමි''යි කී යැ. ඌ එසේ කී කල්හි, ඕ නැවැතැ නැවැත කියා ඌ නො ගිවිස්නා කල්හි, එක්දවසක් ඔහු වලට යාදී ඉක්බිති ගෙයි ඇත්තන් කැඳවා "මාගේ සමනෝ අවුත් මා විචාළෝ නම්, මා මාගේ නෑයන්ගේ ගෙට මැ ගියබව කියා ලව''යි කියා ගෙයි දෙර බැඳ නික්මුනා. හේ පසුව අවුත් ගෙයි පිහිදෙර හැර තමාගේ ප්‍රිය වූ කාන්තාව නො දක, ඉක්බිතිගෙයි ඇත්තන් විචාරා, ඇ ගියබව අසා, නවත්වමියි හඹා ගෙණැ ගොස් දකැ නවතා ගත නො හින. ඒ ක්‍ෂණයෙහි වදන්නට කම්ජවාතය

Non-Commercial Distribution

පහළ. හෝ එක් වැදි දොරකඩකට වැදැ ස්වාමීනි, මට කම්ජවාත සෙල්විනැ"යි කියාබිමැ හී පෙරළී මහ දුකින් දරු කෙනෙකුන් ලැබැ "වදන පිණිස මම නැයන්ගේ ගෙට යන්නට සිතීමි, යන කටයුත්ත නිමිත. ස්වාමීනි, ඉනිබ්බ ඔබ ගෙට මැ යෙමි"යි නැවැතැ සැමියා හා එක් වැ ගෙට අවුත් පෙරසේ මැ වෙසෙමින් කල් යාමෙකින් නැවැතැ ගර්භිණී වුව.

ඒ ගර්භය මුහුකුරත් මුහුකුරත් පෙර සේ මැ සැමියාට ආරාධනා කොට ඔහු නො ගිවිස්නා කල්හි, ඌ බැහැර යාදී පළමු උපන් කුමාරයා අතින් අල්වා ගෙණැ පෙර සේ මැ නැයන්ගේ ගෙට නික්මුනා. ඒ අවුත් පෙර සේ මැ විචාරා දිවැ ගොස් දක වළකා ගත නො හී ඈ හා කැටි වැ මැ නික්මින. එ සමයෙහි මෙඝයෙක් නගා ගෙණැ සියලු ආකාශය හැසවමින් ලොව[1] මුළුල්ල එකාන්ධකාර කොට ගෙණැ මහාඝොෂයෙන් සියලු දිගන්තර එකඝොෂ කෙරෙමින් මහත් වූ ධාරා බහාලා වස්නට වන. ඈට විලිත් පහරන්නට වන. ඕතොමෝ "මට වැසි නැති තැනක් බලව"යි කිව. ඒ ඈත මැත බලා තුඹසක් මත්තෙහි කැළයක් දකැ වැයක් හැර ගෙණැ ඒ කපන්නට වන. ඒ තුඹසැ හොත් සර්පයෙක් ඔහු කා මරා පී යැ. ඒ එතැන්හි මැ හින. ඒ වේලෙහි මහත් වූ දුක් ගෙණැ ඔහු එන පෙරමඟ බලබලා මළ තෙනැත්තවූ නො එන හෙයින් නො දකැ මැ දරුවන් වදපුව. දරුවෝ දෙදෙන වැසි හෙයින් හඬති. ඕ පුතුන් දෙන්නා බඩ යටැ ලා ගෙණැ සතරඅත බිමැ ඇනැ ඔබා ගෙණ සිට මුළුරැ යැවුව. සියලු ශරීරය තෙමී ලෙහෙ සිඳී ගොස් සුදු වැ ගියේ. පහන් වැ ගියකල්හි මස් ගඩුවක් වැනි රැ වැදූ පුතු වඩා ගෙණැ අනික් පුතු ඇඟිල්ල අල්වා ගෙණැ "වර, පවැත්ත, තාගේ පියානන් සොයා යෙමි"යි ගොසින් සොයන්නී ඌ මියැ හොත්තහු දකැ ලය පැළී යන පමණ මහා ශොක ඇති වැ "මූ කෙරෙහි ගත් ස්නේහයෙන් සතළිස්කෙළක් පමණ ධන ඇති කුලගෙයක් හැර පියා ආමි. මොහු කෙරෙත් වියෝ කොට පියන්නට සිතූ මාගේ දෙමවුපියන් මුහුණ පොවා යක්‍ෂරාක්‍ෂසයන්ගේ මුහුණක් සේ නො දක්නට සිතීමි. ඈත් මිනියක් දුටත් මිනිසා සාවා පසුපස්සෙහි දිවන්නාසේ එසේ ධන ඇති කුලගෙය හැර පියා මුන් පස්සෙහි මේ සා කතරක් ගෙවා ගෙණැ ආමි. ඔහු හා එකමුණුවර පුතුන් දෙන්නකුන් ලදිමි. මේ දන් මා හැර පියා ගියේ යැ. මා ඉතා පින් නැති නියා යැ. මා හුදකලා නියා යැ. මා සේ වූ පුරුදු එකකට නො කියා නැඟී යන්නට මූ

1. දව රැ.

Non-Commercial Distribution

ලයත් ඉතා දැඩි සේ යැ. මේ වලා දෙවතාවන් මාගේ හුදකලාකම් නොබැලූ නියා යැ'යි කියා හඬමින්, වලපමින්, වැනෙමින්, පිදෙමින්, යෙමින්[1] අචිරවතී නම් ගඞ්ගාවෙහි තෙරට අව.

ඒ ගඟ ඊ වට වැස්සෙන් දණ පමණ තනමතු පමණ දිය පිරී සිටි සේ දැකැ, වැඩිමාලුපුත්‍රයා මෑත තෙරැ සිටිය දී, අළුතැ වැදූ පුතු වඩා ගෙණැ, එතෙරට ගොස්, කොළඅතු අතුටැ ලා එහි හොවා, 'අනිකා කරා යෙමි'යි[2] නික්මැ කුඩා පුත්සුහු හැරැ පියා යන්නට නො පොහොසත් වැ ක්‍ෂණක්‍ෂණයෙහි පෙරැළි පෙරැළී බලබලා වැඩිමාලුපුතු සිටි තැනට නො යා හුන. ඒ ක්‍ෂණයෙහි උකුස්සෙක් ඒ හොත් කුමාරයා දක 'මස්කැටියෙකැ'යි යන සිතින් අවුත් බට. ඒ උකුස්සා වළකන පිණිස අත ඔසොවා ගෙණැ අත සලාපියා හඬ ලූව. ඒ උකුසු දුරැ සිටැ අඬ ගහතුදු, නො වැළකැ මැ 'මස්කැටියෙකැ'යි ගෙණ ගියේ අනික් තෙරැ සිටි පිත් ඈ අත සලාපියා හඬ ගැහූ හඬ අසමින් "මාගේ මෑනියෝ ගඟ මැද සිට මට අත්සන් කොට හඬ ගහති"යි දිවැ ගෙණැ අවුත් දියෙහි හී ගඟ වතුරෙන් නැඟී ගියේ.

තකා ආ සමනෝ කොයි ද? පළමු කොට ලත් වැඩිමාලු පුතනුවෝ කොයි ද? ඊයේ ඊ වැදූ පුතනුවෝ කොයි ද? මෙසේ තුන්ගින්නෙන් තැවිතැවී මහහඬින් හඬමින් වලපමින් බමන්නී සැවැත්නුවරැ සිටැ එන එකකු දැකැ "තෙපි කොයි හිඳු දැ"යි විචාළා. හෙතෙම "මා වසන්නේ සැවැත්නුවර යැ"යි කී යැ. ඒ අසා ඕ "සැවැත්නුවරැ අසෝ වීථියේ හිඳිනා අසවල් සිටුකුලෙහි ඇත්තෝ ඇද්ද? නැද්ද?'යි විචාළා යැ. ඒ කියන්නේ "ඊයේ ඊ වට මහවැස්සෙන් උන්ගේ ගෙය කඩා ගෙණ හී දෙපුතු මවුත් පියාණෝත් එක් වැ මළහ. උන් දවන සොහොනැ ගින්නෙන් නැඟෙන දුම්කඳු බලව"යි කී යැ.

එක ලයකට සැමියාගේ මළ ශොකය මැ පමණැ. වෙන වෙන දරුවන්ගේ ශොකය මැ පමණැ. වෙන වෙනමැ මවුපියන්ගේ ශොකය මැ පමණැ. වෙන වෙන මැ කුසෙහි හොත්තන්ගේ ශොකය මැ පමණැ. මේ හැම ශොක ඇගේ එක ලයට මැ වන. "මාගේ පුත්තු දෙන්න ගඟැ මළහ. මහැ මාගේ සමනෝ මළහ. මවුපියන් හා කුසෙහි හොත්තෝ එක සොහොනැ දමින්[3] සිටියහැ"යි මෙසේ මහහඬින් හඬමින් වලපමින් වියරු හී හිණැ කඩ ඉරා කරැ ලා ගෙණැ බමයි. මිනිස්සු 'ඈ වියරු හිතියකැ'යි කසළින් පසින් හිස ගසා කැටකැබලිති බහාලා මරන්නට

1. හෙමින්. 2. සොයා එමි. 3. දවමින්,

Non-Commercial Distribution

වන්හ. එ සමයෙහි සියලු ලෝවැසියන්ගේ සියලු දුක් නිවූ මහාමෛත්‍රී ඇති මාගේ ස්වාමිදරුවානන්වහන්සේ ජේතවනවිහාරයෙහි මහබුද්ධ පර්‍ෂද්මධ්‍යයෙහි දහම් නැමැති අමාමහවැස්ස වස්වා ධර්‍මරස සත්ත්වයන්ගේ ලය හා කන් හා පුරපුරා වක්කෙරෙමින් වැඩහුන් සේක්, ඈ හඬමින් වැනෙමින් පිදෙමින් එන තැනැත්තිය දැක "විනය දන්නා ථෙරීන්වහන්සේ කෙරෙහි අගතැනට පැමිණෙන පිණිස පදුමුත්තර නම් බුදුන්ගේ පාදමූලයෙහි මාගේ ශාසනයට පැතූ ම දූ මාගේ විහාරය බලා එයි. එන සේ යහපත් මැ යැ. මා මුත් ඈට අනික් කවර සරණෙක් ඇද් ද?"යි කියා විහාරයට මැ එන්නට අධිෂ්ඨාන කොට වදළසේකැ. ඕ ඒ විසින්[1] බුදුපිරිස් හුන්තැනට එන්නට වන.

බුදුපිරිසැ ඇත්තෝ "මෝ එන්නී වියරු හුනු එකකැ. මොබ ඉය[2] නො දෙව"යි කීහු. ඒ අසා කිරි ඉල්වා හඬා ගෙණැ සෙලු වැ දිවන දුවක දුටු මවක සේ සිතා "ඈ ඉය දෙව. නො වළකව"යි වදළසේක. ඕතොමෝ බුද්ධානුභාවයෙන් සිහි ලදින් හිරිඔතප් පිහිටුවා කෙළිල්ලෙන් බැසැ හුන. ඒ බුදුපිරිසැ හුන් එකෙක් තමාගේ උතුරුසළුව දමා ලීයැ. ඕ ඒ හැඳ ගෙණැ මාගේ ස්වාමිදරුවානන්වහන්සේගේ සියලු ලොව මැඩැ ගෙණැ දිවන සවණක් ඝන බුදුරස් නමැති මහවිලැ ගැලිගැලී බුදුන්ගේ ශ්‍රීපාදය වැඳ "ස්වාමීනි, මට පිහිට වැ වදළ මැනැවැ"යි කිව. මුව වැ පවා ගර්භිණීමුවදෙන 'මා රැකැ ගණුව'යි කී කල්හි, ජීවිතයෙහි ආශා හැරැ දම්ගෙඩියෙහි හිස තබා ගෙණැ හෙවැ ඒ මුවදෙනගේ දුක් නිවන්නවුන්, රහත් වැ නිමීල වන්නා වූ ඒ දියතියන් 'මා අස් වසා වදළ මැනැවැ'යි කී කල්හි, බුදු වැ සිටැ අස්වසන බව කවර විස්මයෙක් ද? එහෙයින් ලොවුතුරාබුදුහු වදරණසේක් "ලොකයෙහි ශොක ඇත්තවුන්ගේ ශොක නැති කොට පියන, උපාය ඉඳුරා දන්නවුන් හැදිනැ, පටාචාරාව, නැඟී ආ සේ ඉතා යහපත. මා කෙරෙහි නො ලත් පිහිටෙක් අනික් කොයින් වේ ද? මා සරණ නො වුව, අනික් කවර සරණෙක් ඇද්ද? මේ දුඃඛය මා මුත්, අනික් නිවා ලියැ හෙන්නෝ කවුරු ද? මාගේ කරුණා නම්, බුද්ධි නම්, තී වැන්නවුන් පිණිස වේ ද? තෝ එක් පුතක්හු උකුස්සකු ගෙණැගියැයි යෙයි. එකක්හු දියෙන් ගෙණැ ගියයි යෙයි. සැමියා මහැ මළයි යෙයි. මවුන් පියන් කුසෙහි හොත්තන් එක සොහොන්හි දතී යෙයි. තීගේ මේ දරුවෝ යැ, සැමියෝ යැ යනාදීන් කෙරෙන් එකිඑකී දෙනා පිණිස මැ තී අනන්තජාතියෙහි ඇඬූ කඳුළු එක් කොට ලුව හොත් සුවාසූදහසක් යොදුන් ගැඹුරු මහාසාගරයට වඩා බෙහෙව"යි වදළසේක.

1. වෙසින්. 2. එව.

Non-Commercial Distribution

එසේ වදරන්නා හා මැ සවැනි හිර පහළ වූ කල්හි මුහුදු දිය කඳ වියැලෙන්නා සේ, ඇගේ ශොක නැමැති මහමුහුද වියලෙන්නට වන. සර්‍වඥයන්වහන්සේ ඒ බව දැන ඈ නැවැතැ කැඳවා "පටාචාරාව, තී හඬන දරුවෝත්, තී හඬන සැමියෝත්, තී හඬන නැයෝත් තී හා කැටි වැ පරලොව යෙද් ද? ඉදින් ඔහු යෙත් නම්, තෝ ඔවුන් සොයා කුමකට නො යෙයි ද? එසේ හෙයින් නුවණැත්තෝ දරුවන් තබා සැමියන් තබා සියලු නැයන් තබා තමා යන නිවන්මඟ මැ සකස් කෙරෙති"යි වදළ සේක. ඒ වදළ බණ අසා පටාචාරාතොමෝ මහපොළොව පමණ කෙලෙස්කඳ දවා සෝවාන් වැ ශ්‍රීපාදය වැඳ ගෙණැ හෙවැ "සතුන් ලෙහි දුක් නිවන්නන් අතුරෙන් තුඹ සේ වූවන් නුදුටු විරීමි. උපන් මඟුලෙහි අවීචියෙහි ගිනි නිවූ පරිද්දට අද මේ මා ලෙහි ගිනි නිවූපරිදි අඩු යැ යි නො සිතමි. ස්වාමීනි, අද තුඹ වහන්සේ වසන මේ විහාරයට නො ආයෙමි නම්, 'වියරු හිනියකැයි දුටුදුටුවන් ගසන ගල්පහර කා මැ අදීර වැ මෙළෙම් වෙමි. ස්වාමීනි, එසේ වූ දුකක් පිරුණු ලෙහි මේ සා වූ නිවන්සුවයක් පුරා ලන වියත්කම් කා අතින් උගත්දෑ ද? ස්වාමීනි, මට ආදීවූ දුක් සියලු සත්ත්වයන්ට නො වේවයි. ස්වාමීනි, දැන් මට වූ මේ සුව සියලු ශොකී සතුන්ට මැ වාසනා වේවයි. ස්වාමීනි, එක් දෙබසෙකින් මැ නිවණැ ඇර සිටුවා පියන බණ කීම තුඹ තුඩ මුත් අනුන් තුඩ නො හසළ වනැ. ස්වාමීනි, අද මේ ධර්‍මාසනයෙහි මා පෙරමඟ බලා මැ වැඩහුන්දෑ වන. ස්වාමීනි, මෙ තැන් පටන් මිඩියෙමි. දරුයෙමි. නිවිනිමි. සැනහිනිමි. ස්වාමීනි, පැවිදි වැ ගණිමි"යි කිව.

ඒ අසා සර්‍වඥයන්වහන්සේ ඈ මහණ කරවා වදළ සෙයෙකැ. ඕ එක්දවසක් පතුල්පහණින් පතුල් සෝධන්නී පළමු වක්කළ පැන් මඳක් ගොස් වියැලී ගියා දුට. දෙවෙනි වැ වක්කළ පැන් ඉනුත් ඔබ්බට ගොස් වියැලි ගියා දුට. තුන්වැනි වැ වක්කළ පැන් ඉනුත් ඔබ්බට ගොස් වියැලී ගියා දුට. ඒ අරමුනෙන් මැ "තමා පළමු වක්කළ පැන් දුරට නො ගොස් වියැලී ගියා සේ මේ ලොකයෙහි කිසි සත්ත්වකෙනෙක් පළමුවයස මැ මියැ යෙති. දෙවෙනි වැ වක්කළ පැන් එයින් ඔබ්බට ගොස් වියැ ගියා සේ, සමහර සත්ත්ව කෙනෙක් මධ්‍යමවයස දක්වා ගොස් ලා මියැ යෙති. තුන්වැනි වැ වක්කළ පැන් ඉනුත් ඔබ්බට ගොස් වියැලී ගියා සේ, සමහර කෙනෙක් මාලුවයසට ගොස් ලා මියැ යෙති"යි මෙසේ සත්ත්වයන්ගේ තුන්වයස නියත කළාහ. එවේලෙහි සර්‍වඥයන් වහන්සේ ඔවුන් පැන්අරමුණෙන් තුන්වයස පිරිසිඳිනා පරිදි ජේතවනවිහාරයෙහි ගඳකිළියෙහි වැඩැ හිඳ

Non-Commercial Distribution

මැ දක වදර, සමීපයෙහි වැඩහුන්නා සේ බුද්ධරශ්මි හැරැ බුද්ධශරීරය දක්වා වදරණසේක් "සියලු සංස්කාරධර්මයන් අනිත්‍යනියාව නො බලා අවුරුදු සියයක් ජීවත් වීමට වඩා සියලු සංස්කාරධර්මයන් අනිත්‍ය නියාව බලා එකදවසකුත් ජීවත් වනබව උතුමැ"යි වදළසේක.

මෙසේ සර්‍වඥයන්වහන්සේ බණ වදළ කල්හි ඕ[1] පිළිසිඹියා පත් රහත් වුව.[2] මෙසේ පටාචාරාවන් වැනි වියරු හී යන පමණ ශොක ඇති, එසේ නො නිවුනු, එසේ නො සැනැහුනු ඔවුන්ගේ ලෙහි අනික් කට යුත්තක් වදනට අවකාශ නො දී සිටි ඒ සා ශොක නැමැති මහමුහුද සිඳ පියා, ඒ ලෙහි පවා දහම්රස ගන්වන පමණ වියත්කම් ඇති ඒ වියතානන් ඒ මහතානන් සරණ -පෙ- යායුතු.

## 115 & 116.

තව ද, වශවර්තිමාරයා තමාගේ මහත් වූ මාරසේනාව කැටි වැ අවුත් බැසැ සිටැ ගෙණැ "තා හුන්නා වූ වජ්‍රාසනය තා සතුබවට දෙස් කියවාලව"යි කී කල්හි "වජ්‍රාසනය මා සතුබවට මේ පොළොව දෙසැ"යි ශ්‍රීහස්තය පැලූ මාත්‍රයෙකින් සිතක් කටක් නැති මහපොළොව ලවා දෙස් කියවාලන පමණ මහාභාග්‍ය ඇති ඒ මහතානන්වහන්සේ සරණ -පෙ- යා යුතු.

දෙව්දත්මහතෙරුන් මහාවෛරයෙන් තමන්වහන්සේගේ මුදුනට ගල් පෙරළූ කල්හි සිත්පෙවෙත් නැති මහගල්දෙකක් පොළොව බිඳ ගෙණැ නැඟී ඒ හෙන ගල පිළිගන්නා පමණ මහාභාග්‍ය ඇති සර්‍වඥයන්වහන්සේ -පෙ- යුතු.

## 117 & 118.

උපස්ථානයක් කරන්නවුන් නැති මහවලැ පාරිලිය නම් ඇතු අවුදින් අනඳමහතෙරුන්වහන්සේ කරණ උපස්ථාන හා සම කොට කරණ උපස්ථාන විඳුනා පමණ මහාභාග්‍ය ඇති බුදුන් -පෙ- යුතු.

"විඳ මරාපියම්හ"යි දුනු ඇද ගත්තවුන් සිතියමැ ඇඳි දුනු වායන් සේ අතපය නො සොල්වා වැද සිටිනා පමණ කරණ මහාභාග්‍ය ඇති බුදුන් -පෙ- යායුතු.

## 119 & 120.

ලෞකිකලොකොත්තර සුව තාක් තමන් කෙරෙන් බැහැර නො කොට විඳුනා පමණ මහපින් ඇති බුදුන් -පෙ- යුතු.

---

1. ඔහු. 2. වූහ.

Non-Commercial Distribution

මහවැසි වස්නා කල්හි ගඳකිළියක් සම්භව නුවූ කල්හි මුචලින්ද නම් නාගරාජයාගේ පෙණගබ නැමැති රිදීසෙවෙනි ඇති ඔහුගේ දරණවැල නැමැති ඉතා සුදු වූ ගඳකිළිය ඇතුළෙහි වැඩ හිඳිනා පමණ මහාභාග්‍ය ඇති බුදුන් -පෙ- යුතු.

## 121.

සැරියුත්මහතෙරුන්වහන්සේ වැනි ජ්‍යෙෂ්ඨපුත්‍රයන් ලද්ද වූ අනඳමහතෙරුන්වහන්සේ වැනි උපස්ථාන කරන්නවුන් ලද්ද වූ, සද්ධර්ම වැනි ගුරුන් ලද්ද වූ, සර්වඥතාඥනයක් වැනි ඥනයක් ලද්ද වූ, බුද්ධත්වයක් වැනි තනතුරක් ලද්ද වූ, සප්තබොද්ධ්‍යඞ්ගයන් වැනි සත්රුවන් ලද්ද වූ, නිවණක් වැනි ක්‍ෂෙමපුරයක් ලද්ද වූ, මධ්‍යමප්‍රතිපත්ති වැනි නිවණට යන මහවතක් ලද්ද වූ, වජ්‍රාසනයක් වැනි ආසනයක් ලද්ද වූ, ශක්‍රයා වැනි සක් පිඹිනා එකකු ලද්ද වූ, මහාබ්‍රහ්මයා වැනි කුඩ ගන්නා එකකු ලද්ද වූ, බෝමැඩ වැනි අචල වූ භූමියක් ලද්ද වූ, ශ්‍රීමහාබෝධියක් වැනි සැතපෙන ගසක් ලද්ද වූ, ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්‍ෂණ වැනි ලක්‍ෂණ ලද්ද වූ, අශීත්‍යනුව්‍යඤ්ජන වැනි ව්‍යඤ්ජන ලද්ද වූ, දශබල වැනි බලයක් ලද්ද වූ, සමතැස, බුදුඇස, නුවණැස, මසැස, දිවඇස යන මෙ වැනි පස් ඇසක් ලද්ද වූ, අභිධර්ම වැනි දත යුත්තක් දන්නා වූ, නිරොධසමාපත්ති වැනි සමාපත්තියකට සමවදනා වූ, සවාසනක්ලෙශයන් වැනි දුරු කට යුත්තන් දුරු කළා වූ, ශීලය වැනි ආභරණයක් ලද්ද වූ, ජේතවනවිහාරය වෙළුවනවිහාරය වැනි විහාර ලද්ද වූ, විශාඛාවන් වැනි උපාසිකාවන් ලද්ද වූ, අනේපිඩුමහසිටානන් වැනි උපාසකයන් ලද්ද වූ, දෙව්දත්මහතෙරුන් කෙරෙහි පවා මෛත්‍රී පතුරුවන පමණ සිතක් ලද්ද වූ, බුදුන් එක ඉඩෙකැ මුත් නො ලබන අසදෘශමහාදනයක් වැනි දනයක් ලද්ද වූ, ධනපාලයා වැනි සිල් රක්නා ඇතුන් ලද්ද වූ, සැරියුත්මහතෙරුන්වහන්සේ වැනි සෙනෙවිරදුන් ලද්ද වූ, අනඳමහතෙරුන් වහන්සේ වැනි ධර්ම භාණ්ඩාගාර බලන්නවුන් ලද්ද වූ, මේ සා මහත් වූ භාග්‍ය ඇති සර්වඥයන්වහන්සේ -පෙ- යා යුතු.

## 122.

ලොභ යැ, ද්වෙෂ යැ, මොහ යැ, විපරීතමනස්කාර යැ, අහිරික යැ, අනොත්තප්ප යැ, කොප යැ, උපනාහ යැ, මක්ඛ යැ, පලාස යැ, ඊර්ෂ්‍යා යැ, මාත්සර්‍ය්‍ය යැ, මායා යැ, සාඨෙය්‍ය යැ, ථම්භ යැ, සාරම්භ යැ, මාන යැ, අතිමාන යැ, මද යැ, ප්‍රමාද යැ, තෘෂ්ණා යැ, අවිද්‍යා යැ, තුන් අකුශලමූල යැ, තුන් දුශ්චරිත යැ, ෂඩ්විධ වූ ක්ලෙශයෝ යැ, තුන් මල යැ, සංඥ යැ, විතර්ක යැ, ප්‍රපඤ්ච යැ, චතුර්විධ විපර්‍ය්‍යාස යැ, ආසව යැ, ග්‍රන්ථ යැ, ඔඝ යැ, යොග යැ, සතර අගති යැ, තෘෂ්ණා

Non-Commercial Distribution

යැ, උපාදන යැ, පඤ්ච චෙතොඛිල යැ, පඤ්චවිනිබන්ධ යැ, පඤ්චනීවරණ යැ, අභිනන්‍ද යැ, ෂඩ්විධ වූ විවාදමූල යැ, ෂඩ්විධ වූ තෘෂ්ණාකාය යැ, සප්තානුශය යැ, අට්ඨමිච්ඡත්ත යැ, නවතෘෂ්ණාමූල යැ, දශඅකුශලකර්‍මපථ යැ, ද්වාෂෂ්ටිමිථ්‍යාදෘෂ්ටි යැ, අෂ්ටශතතෘෂ්ණාවිචරිත ය යන මේ ආදි වූ ක්ලෙශයන් ද, පඤ්චමාරයන් ද තමන්ට නැවැතැ පෙරළී නො සිටිනා පරිද්දෙන් බින්ද වූ මහාබල ඇති සර්‍වඥයන් වහන්සේ -පෙ- යුතු.

## 123.

තමන්ගේ සිතට ඉසුරු වූ ලොකොත්තරධර්‍මයක් වැනි ධර්‍මයක් ඇත්තා වූ, දෙතෙර මැඩැ ගෙණැ යන ගඟ වතුරක් සේ සියලු තුන්ලොව මැඩැ ගෙණැ යන සත්‍ය වූ ගුණයෙන් ලද්ද වූ කීර්තිඝොෂ ඇති, ලෝවැස්සන්ගේ ඇස් නැමැති නාටකයනට රඟමඬලක් වැනි වූ, ඇස් නැමැති රහසොඬුන්ගේ ආපානභූමියක් වැනි වූ, සියලු සෞන්‍දර්‍ය්‍යයට එකනිධානයක් වැනි වූ, සියලු විලාසයට එක ආකරයක් වැනි වූ රූපශ්‍රී ඇති, සියලු තුන්ලොවට ගුරුතැනැ සිටියා වූ සර්‍වඥයන් -පෙ- යුතු.

## 124

තව ද, "මහමුහුදට වන් ගංහෝදහස්හි දිය 'මේ, මේ ගඟින් ආ පැනැ', 'මේ, මේ ගඟින් ආ පැනැ"යි තෝරන්නා සේ, එක් වැ මිශ්‍ර වැ පියා තුබූ සියලු ධර්‍මයන් කෙරෙන් 'මෙතෙක් දෙන කුශලධර්‍මයෝ යැ. මෙ තෙක් දෙන අකුශලධර්‍මයෝ යැ. මෙ තෙක් දෙන අව්‍යාකෘතධර්‍මයෝ යැ'යි තේරුවා වූ, චතුරඞ්ග සමන්තාගත වූ මහාඝනාන්‍ධකාරයෙහි පරමාණු අසිඳුනා සේ අවිද්‍යා නැමැති අන්‍ධකාරයෙන් වසා පියා තුබූ ලොව්හි 'මේ ස්කන්‍ධ යැ, මේ ධාතු යැ, මේ ආයතන යැ, මේ සත්‍ය යැ, මේ ඉන්‍ද්‍රිය යැ, මේ ප්‍රතීත්‍යසමුත්පාද යැ'යි මෙසේ විභාග කොට අත්ලෙහි හිරි සේ අනායාසයෙන් දන්නා වූ බුදුන් -පෙ- යුතු.

## 125 & 126

දිව්‍යවිහාර යැ, බ්‍රහ්මවිහාර යැ, ආර්‍ය්‍යවිහාර යැ, කායවිවෙක යැ, චිත්තවිවෙක යැ, උපධිවිවේක යැ, ශූන්‍යවිමොක්‍ෂ යැ, අනිමිත්ත විමොක්‍ෂ යැ, අප්‍රණිහිතවිමොක්‍ෂ යැ යනාදි වශයෙන් ද, සෙසු ලෞකික ලොකොත්තර වශයෙන් ද සිටියා වූ ධර්‍මයන් නිරවශෙෂයෙන් තමන්ගේ ඥනයෙන් සෙවනය කළා වූ බුදුන් -පෙ- යුතු.

තවද සංසාරයෙහි ගමන් නැසූ බුදුන් -පෙ- යුතු.

Non-Commercial Distribution

**127.**

තව ද, මහමුහුද ගැලුනු හොරුකුසකට වන් පැනක් සේ, මා කී ගුණ යම්තම් දෙයෙකැ. බුදුන්ගේ තුබූ ගුණ මහාසාගරයෙහි ඉතිරි දිය සේ බෙහෙව. මා කී බුදුගුණ හබඇටක් සේ මඳ. තුබූ බුදුගුණ මහමෙර සේ මහතැ. මා වැන්නවුන් තබා දෙවිකෙනෙකුන් බ්‍රහ්මකෙනෙකුන් මාරකෙනෙකුන් ශක්‍රකෙනෙකුන් ශ්‍රමණ කෙනෙකුන් බ්‍රාහ්මණකෙනෙකුන් ශ්‍රාවකකෙනෙකුන් පසේබුදු කෙනෙකුන් තමන් සේ වූ ලොව්තුරාබුදු-කෙනෙකුනුත් කපක් මුළුල්ලෙහි කියත් හොත් ලක්‍ෂයකුත් කෝටියකුත් සමහරකුත් කියා ගෙවා ගත නොහැකි අනන්ත වූ බුදුගුණ ඇති බුදුන් -පෙ- යුතු.

**128.**

තව ද, සත්දවසක් රහ බී මදයෙන් මත් වැ නෘත්‍යගීතවාද්‍ය බලබලා හිඳ වළඟ සිහින් වන පිණිස සත්දවසක් නිරාහාර වැ නටන්නට පටන් ගත් තමන්ගේ ජීවිතයක් වැනි අඹුව රුජාවක් පැහැර මළසඳෙහි ඇ කෙරෙහි කළ ශොකයෙන් වියරු හී තමන් වහන්සේ වැඩ හුන් තැනට හඬා වැද ගිය සන්තති මහාඅමාත්‍යයන් තමන් වදළ එකගාථාවෙන් ලෙහි ගත් ශොක නිවා සිටි පියෙහි සිටුවා මැ රහත් කළ, තව ද, තමන් සිත්හි ක්ලෙශයන් තුනී වැ ගිය හෙයින් නොරහත් වැ ද, "අපි රහතුම්" යි සිතා "අප රහත්බව කියම්හ"යි තමන්වහන්සේ කරා ආ පන්සියක් දෙනා වහන්සේ රහත් නොවන බව දන වදරා "මොවුන් නො රහත්බව මොවුන් ලවා මැ කියවමි"යි අමුසොහොනකට යවා වදරා, ඒ වහන්සේවරුන්ද අමුසොහොන්හි දමාපූ ගැණු මිනියෙහි කළ රාගයෙන් තමන්වහන්සේවරුන්ද නොරහත්බව දනැ "අප මේ කෙලෙස්අසුචිවලෙහි මැ සිට යැ ගැලවුනුම්හයි සිතුයේ යැ"යි දෙම්නස් පත් වූ සඳෙහි, වැඩ හුන් ජේතවනමහා විහාරයෙහි වැඩැ හිඳ ශ්‍රී ශරීරයෙන් රශ්මි විහිද උන් අභිමුඛයෙහි හුන්නා සේ පෙණී ගොස් සතරපදයෙන් යුත් ගාථාවක් වදළ සඳෙහි මැ ඒ පන්සියයක් දෙනාවහන්සේ රහත් කොට අමා මහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

**129.**

තව ද, "මම රූ ඇත්තෙමි"යි අභිමාන ඇති රූපනන්‍ද නම් මෙහෙණින්නන්වහන්සේ "මා බුදුන්වහන්සේ කරා බණ අසන්නට ගිය හොත්, සිවුවණක් පිරිස්මධ්‍යයෙහි බුදුන්වහන්සේ මාගේ රූපයෙහි ආදීනව වදළ හොත්, නපුරැ"යි සිතා බොහෝ කලක් බණ අසන්නට නො අවුත්, එක්දවසක් තමන්වහන්සේගේ ගුණ අසා "රූපයෙහි ආදීනව වදරණසේක් වී නම්, එක්දවසක් වදරණ්‍ද යැ. එක්දවසකට දිරිය කොටත්

Non-Commercial Distribution

බුදුන්ගේ බණ අසා පියමී" තමන්වහන්සේ කරා ආ කෙණෙහි ඒ මෙහෙණින්නන් වහන්සේට වඩා ශතසහස්‍රගුණයෙන් වැඩියා වූ රූප ඇති එක් කුමාරිකාවක මවා, ඒ මෙහෙණින්නන්වහන්සේ "ලොකයෙහි රූ ඇත්තෙමී සිතුයෙම් මම් මැ යැ. මේ රූපය මට වඩා යහපතැ"යි බලබලා හින්ද දී මැ ක්‍රමක්‍රමයෙන් ඒ රුව ජරාවට පමුණුවා ඉඳුනිල් මිණිරස්කලඹක් සේ තුබූ හිසකෙස් යෞවනය දවූ සොහොන්හි හස් කොට ලූ හළුරැසක් සේ සුදු කොට, නිල් මහනෙල්මල්පෙතිදෙකක් සේ තුබූ ලවැදූ[1] මුවපොල්ලකුගේ දෙඇස් බඳු දැසැ ඇසපියෙහි[2] රොම වගුරුවා, නුවන්හි මඬ ගන්වා, අඩසඳ දෙකක් සේ සම වැ තුබූ කපොලය[3] රැළි හෙළා වළ වදවා, පිපී සිටි පියුමක් සේ රත් වැ මනහර වැ තුබූ තුඬෙහි දත් වගුරුවා දෙකොලින්[4] කෙළ වගුරුවා, නවයෞවනයට අභිෂෙකමඞ්ගලයෙහි සරසා තුබූ පුන්කලස දෙකක් වැනි දෙතනය ජරාව එත් එත්, බා හැකිළෙන්නා සේ[5] හකුළුවා රෙදිකඩ දෙකක් සේ එල්වා, ඉඳුරා සිටි රන්පිළිමයක් සේ වූ ශරීරය ජරා භාරය උසුලා ගත නො හී වක ගැසී ගියා සේ වක ගස්වා, ඒ බලත් බලත්, "මෙවෙනි රුවට මීතියා ජරාවක් වන කල්හි අප අපට කියන්නේ කිම් ද?"යි රුමද සිඳී ගොසින් හුන් සමයෙහි තමන්වහන්සේ වදළ එකගාථාවෙන් ඒ මෙහෙණින්නන් වහන්සේ අමාමහනිවන්හි ලූ, සතුන් හික්මවන සේ දන්නා බුදුන් -පෙ- යුතු.

## 130.

තව ද, තමන්වහන්සේගේ සස්නෙහි මහණ වූ පන්සියක් වහන්සේවරුන්ද තිස්ස නම් තෙරුන්වහන්සේගේ උපදෙශයෙන් "නිවන් සාධම්හ"යි උත්සාහ කොට නිවන් අත්පත් කට නො හී "අප කුසල් නැති සේ යැ. අප ජාතිදුක්හි හුනු සේ යැ. අප ජරාදුක්හි හුනු සේ යැ. අප මරණදුක්හි හුනු සේ යැ. අප සතරඅපායෙන් නො මිදුනු සේ යැ. මේතියා ස්වාමිදරුවාන කෙනෙකුන් ලොවට කරුණා කරණ සමයෙහි නොගැලවී කවරද ගැලවෙමෝ ද?"යි සිතා තමන්වහන්සේ කරා ආ සඳ, එසේ නිවන් නො ලැබ ගත හී හඬහඬා ආ වහන්සේවරුන්දට බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අහරක් නො ලදින් හඬා ආ ප්‍රෙතයන් කටැ චතුමධුර නමන්නා සේ, සතරපදයෙන් යුක්ත වූ එක ගාථාවක් ඔවුන් කණැ වකා හුනස්නෙහි මැ හිඳුවා රහත් කොට අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

---

1. ලම ද [දුටුදේ ඇසැ අසිපියෙහි]
2. මුවපොල්ලකු සේ දෙ ඇසක් සේ
3. කපොල යැ.
4. දෙකොළෙන්.
5. ජරාවට එක්සිත්ව හැකිළෙන්නා සේ.

Non-Commercial Distribution

## 131 & 132

තව ද, තමන්වහන්සේ කෙරෙන් කමටහන් ගත්තා වූ බොහෝ වහන්සේවරුන්ද, උගත් කමටහනින් ගුණවිශෙෂයක් උපදවා ගත නො හී, තව ද, "මේ කමටහන් සකස් කොට ඉගෙණැ ගණුම්හ"යි වැඩැ හුන් විහාරයට අවුදින් වන් විටැ මැ වස්නට පටන් ගත් වැසිදියෙහි දියබුබුලු බිඳිබිඳී නැති වන්නා දකැ "මේ සතුන්ගේ ආත්මභාවයත් මෙසේ මැ අස්පිර යැ"යි සිතූ කෙණෙහි මැ, වැඩැ හුන් ගඳකිළියෙහි හිඳ මැ රස් විහිදූ ඔවුන් අභිමුඛයෙහි හුන්නා සේ පෙණී වදළ එක ගාථාවෙන් ඒ තෙක් මහණුන්වහන්සේ අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

තව ද, එරකපත්තනාගරාජයා ගේ සමාගමයෙහි වදළ එක-ගාථාවෙන් සුවාසූදහසක් ප්‍රාණීන් අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

## 133.

තව ද, තමන්වහන්සේ වසන ජේතවනවිහාරට නුදුරු තන්හි උපස්ථානශාලාවෙහි උන් පන්සියයක් දෙනාවහන්සේ "ලොවැ සුව නම් කිම් දේ? හො"යි ඔවුනොවුන් හා බැණැ, සමහරුන් "සිතට ආවක් සිතා, තුඩට ආවක් බැණැ, 'කරම්හ'යි සිතුවක් කොට, කී යම් නපුරු බසකටත් කළ යම් නො කට යුත්තකටත් ගැත්තවුන් නළවන්නට කරණ කයිවාරු[1] අසා රජ කරණ බව සුව යැ"යි කී කල්හි, සමහරුන් "කැමැති ආහාරයක් කා යෙහෙන් නිදනබව සුව යැ"යි යනාදීන් "සසර දුක් සුව යැ"යි යන බස් තමන්වහන්සේ දිවකණින් අසා "මා සේ වූ බුදුකෙනෙකුන් වසන විහාරයට නුදුරු[2] තන්හි හිඳ මේ මහණුන් "සසරදුක් සුව යැ'යි ගන්නාබව ඉතා නො කට යුත්තෙකැ"යි සිතා මහාකරුණායෙන් එතනට වැඩ "මහණෙනි, කවර කථායෙකින් හුන්නා ද?"යි විචාරා "රජ කිරීම සුව යැ. ආහාර අනුභව කොට නිදීම සුව යැ" යනාදීන් මෙබඳු මෙබඳු කථායෙන් හුනුම්හ"යි කී කල්හි "මහණෙනි, මේ සුව නම් නො වෙයි. මේ හැම තොප කී සුව සතර අපායෙහි දුඃඛයට කාරණ යැ. 'සුව නම් මේ යැ'යි මා අතින් අසව"යි වදරා "ලොකයෙහි සුව නම් බුදුන් උපදනාබව යැ. දෙවැනි වැ ඔවුන්ගේ බණ අසනබව යැ" යනාදීන් අමාමහනිවණට කාරණ වූ සුව වදරත් වදරත් ඒ පන්සියයක් මහණුන්වහන්සේවරුන්ද හුන් තැනැ මැ හිඳ රහත් වැ අමාමහ නිවන් වදනට කාරණ වූ බුදුන් -පෙ- යුතු.

1. කෙවරු. 2. නොදුරු.

Non-Commercial Distribution

## 134.

තව ද, බරණැස්නුවර වඩනා මහැ එක්තරා දෙවොලෙක්හි බොහෝ සඟුරුවන් පිරිවරා අනුපම වූ බුද්ධවිලාශයෙන් දිලිහිදිලිහී වැඩැ හිඳැ ඇළයෙහි වැඩැ සිටි අනඳමහතෙරුන්වහන්සේ කැඳවා "ආනන්‍දය, තෙල බමුණා මෙතනට කැඳවා ලව"යි කියා එතැන්හි සී සානා බමුණකු කැඳවා වදරා, ඔහු අවුත් තමන්වහන්සේ නො වැඳ ඒ බිමැ වැදැලා සිටි කල්හි "තා කළ සේ යහපතැ"යි වදරා, තමන්වහන්සේ පිරිවරා වැඩැ හුන් වහන්සේවරුන්ද "බමුණා බිම වැඳ ලූවාට යහපතැයි වදළේ කුමකට දෝ හො?"යි විචාළ කල්හි "මහණෙනි, මේ බමුණා වැන්දේ ලාමකතැනෙක් නො වෙයි. මා සේ මැ සවාසනසවික්ලෙශයන් නසා බුදු වූ කසුබු සම්මාසම්බුදුන්ගේ දතු පිහිටිවූ යොදනක් පමණ උස රන් දගබ මෙතැනැ යැ"යි වදරා, බොහෝදෙනාගේ සැක දුරු කරණ පිණිස ශ්‍රීහස්තය බිමට දිගු කොට "දගබ පැන නැගේව"යි අධිෂ්ඨාන කළ සඳෙහි මැ, තමන්වහන්සේ වදළ බසට දෙස් කියන්නට නැහෙන්නා සේ දගබ පැනැ නැඟී ආකාශයෙහි ඍද්ධියෙන් සිටි සමයෙහි ඒ දගබ පැලා "පූජා කට යුත්තන්ට පූජා කිරීමෙහි කුසල් මෙතැකැයි කියා ගෙවා ගත නො හැක්කැ" යනාදීන් බණ වදරා ඒ බමුණා හා සමග සුවාසූදහසක් ප්‍රාණීන් අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

## 135.

තව ද, පඤ්චශාලා නම් බමුණුගම සිහා වැඩැ, මරහු ඒ ගම ඇත්තවුන් ඇඟ ආවිෂ්ට වැ ගෙණැ සිහා වැඩි තමන් වහන්සේට අහර ඇවිස්සැ[1] නුදුන් කල්හි, පෙරළී වඩනා සමයෙහි "දියකෙළි කෙළනටයැ"යි කියා පන්සියයක් කුමාරිකාවන් අවුදින් තමන්වහන්සේ දැකැ එකත්පස් වැ සිටි සමයෙහි මරහු අවුදින් "හැයි, අහරක් ලද්දේ ඇද්ද?"යි විචාළ කලැ, ඔහු හැඳිනැ "හැයි! පාපිෂ්ඨය, තෝ අප අහරක් ලබන පරිද්දෙන් කෙළෙහි ද?"යි විචාරා වදරා, මරහු "ආදි ගමට වන් කලැ ගම ඇත්තවුන් ලවා උසුළු පැවීමි. මෙවිටැ නළවා[2] ගමැ ලා ගෙණැ නොයෙක් විප්‍රකාර කරවමි"යි සිතා "වහන්ස, මෙවිටැ වූ කලි බත් දෙවමි. ගමට වඩනේ යැ"යි කී කල්හි ඔහු සිතැ ඇත්ත දැන "පාපිෂ්ඨය, අද අපට අහරින් ප්‍රයොජන නැතැයි, කිසි ආහාරයක් නො කා ද, මහාබ්‍රහ්මයන් ධ්‍යානසුවයෙන් දවස් යවන්නා සේ, අද අපි නිවන් අරමුණු කොට පවත්නා වූ ප්‍රීති සුඛයෙන් මැ දවස් යවම්හ"යි වදළ බණින් එතනට ආ පන්සියයක් කුමාරිකාවන් අමාමහනිවන්හි ලා ලූ බුදුන් -පෙ- යුතු.

---

1. විස්විය. 2. නළවාලා ගෙන

Non-Commercial Distribution

## 136.

තව ද, තමන්වහන්සේ වෙදියපර්වතයෙහි ඉන්‍ද්‍රශාල නම් ගුහාවෙහි වැඩැ වසන කල්හි පඤ්චපූර්විනිමිත්ත දකැ දෙව්ලොවින් සැවැ තමා නරකයෙහි හෙන සේ දක "අනික් මට සරණෙක් නැත. දුක්පතුන්ට ශරණ වූ තිලෝගුරු සම්මාසම්බුදුන්වහන්සේ කරා යෙමි"යි දෙදෙව්ලොවැ දෙවතාවන් පිරිවරා අවුත් බුදුන් කෙරෙහි කළ ගෞරවයෙන් මරණභයින් භයපත් වැ යුහු වැ ගොස් වැද නො ගොසින්, පඤ්චශිඛයා යවා අවකාශ ඉල්වා "එන්ට කියව"යි වදළ කල්හි, දෙදෙව්ලොවැ දෙවතාවන් හා සමග එකහැඳපලක් සා ලෙනට වැද, එහි සැරැසී සිටැ, ශක්‍රයා විචාළ ප්‍රශ්න වදරා, වැඳ ගෙණ හොත්තවුන් මැ මළසඳ, අතීතයෙහි ඔහු විසින් පස්වරු පිදූ මලෙකැ පැතිත්තක් ඉසැලූ කුශලයක් එකෙණෙහි ආවර්ජනා කොට "ආයු බොහෝ ව"යි වදළ බස් මාත්‍රයෙකින් ඕහට තුන්කෙළසැට ලක්‍ෂයක් හවුරුද්දට ආයු දී, එතැන්හි වදළ බණින් ශක්‍රයා හා සමග තුදුස්කෙළක් ප්‍රාණීන්ට අමාමහනිවන් දුන් බුදුන් - පෙ- යුතු.

## 137.

තව ද, තමන්වහන්සේ බොහෝසඟුරුවන් පිරිවරා සාකෙත නම් නුවර පිඩු සිඟා වන් සමයෙහි, ඒ නුවරැ බමුණා තමන් වහන්සේ දකැ පාපිටැ හී හඬා ගෙණැ "හැයි පුතඬ, මෙතෙක්ද මා හැරැ කොයි ගියෝ ද? ගෙට වරෝ යැ"යි තමාගේ ගෙට වඩා ගොස් ආසනයෙහි හිඳුවා "තී පුතනුවන් බල!"යි තමා අඹුබැමිණිය කැඳවූ කල්හි, ඈත් අවුදින් එසේ මැ හඬා ගෙණ හී තමාගේ දූන් පුතුන් කැඳවා "තොපගේ කුසෙහි හොත්තවුන් වඳුව"යි තමන්වහන්සේ වැඳවූ කලැ, එය ද ගිවිසැ වැඩැ හිඳ බණ වදරා බමුණා හා බැමිණිය හා අනාගාමි කොට, ධම් සභාවෙහි වැඩැහුන් සඟුරුවන් "අපගේ ස්වාමිදරුවන් සුද්ධොදන රජ් ජුරුවන් නිසා මහාමායාදෙවීන් කුසින් උපන්බව මුළුලොව දනුත්, මේ බමුණා හා බැමිණිය හා 'පුතැ'යි කියන කලැ වැඩැ හිඳිතේ කුමක් පිණිස දෝ හෝ?"යි කථා කළ කලැ "මහණෙනි, එසේ නො කියව. මේ බමුණු බැමිණි දෙදෙනකු 'පුතු'යි කීයේ තමන්ගේ පුතුන්ට මැ යැ. මොහු දෙදෙනා පන්සියක් ජාතීයෙහිමැ මා වැදූ මවුපියෝ යැ. පන්සියක් ජාතියෙහි කුඩාමවුපියෝ යැ. පන්සියක් ජාතියෙහි මහලු මවුපියෝ යැ. එහෙයින් එක්දහස් පන්සියක් ජාතියෙහි මම මොවුන් අත්ලෙහි වැඩි පුත්මි"යි බණ වදරා ඒ දෙදෙනා කාලාන්තරයෙකින් රහත් වැ මළ කල්හි ඔවුන්ගේ කුරාල[1] පසුපස්සේ සොහොන් බිමට වැඩැ ආසන්නයෙහි

1. කුරලා.

Non-Commercial Distribution

ශාලායෙක්හි වැඩැ සිටැ එතැනට රැස් වූ මහාජනයා “ස්වාමීනි, තුඹගේ මවුපියන් මළ ශෝක නො කරණ සේක් නු?”යි කී කල්හි එතන්හි වැඩැ සිටැ සියලු සංස්කාර ධර්‍මයන් අනිත්‍යබව හඟවා වදළ බණින් සුවාසූදහසක් ප්‍රාණීන් අමාමහ නිවන්හි ලා ලූ බුදුන් -පෙ- යුතු.

## 138.

තව ද, තමන්වහන්සේ ගිජ්ඣකූටපර්‍වතයෙහි වසන සමයෙහි රජගහනුවරැ සිටක්හුගේ මිඩියක කුඩුකැවුමක් පලහා හිණැ තබා ගෙණැ අතරමඟැ දී කන්නට ගෙනැ යන සමයෙහි, තමන් වහන්සේ අනඳමහතෙරුන්වහන්සේ හා සමග එ මැ මඟට වැඩැ, තමන්වහන්සේ දුටු ඒ මිඩිය “පෙරැ බුදුන්වහන්සේ දුටු කලෙකැ මා අතැ කිසිවක් සම්භව නො වෙයි. අද බුදුන්වහන්සේත් දිටිමි. මා අතත් මේ කුඩුකැවුම තුබුයේ වේ. මේ පිළිගත යහපතැ”යි තමන්වහන්සේ සිටි තැනට එළැඹි සමයෙහි “මම තිලෝගුරු සර්‍වඥයෙමි. ශක්‍රදෙවෙන්‍ද්‍රයා පවා මාගේ සව්වන්ගේ පාත්‍රයෙහි දිව අහරපිළිගන්වා ගත නො හී වෙහෙසෙයි. මිඩිය එකුරුත්තෙන්[1] ගෙණා කුඩුකැවුම මාගේ පාත්‍රයෙන් පිළිගණිම් ද?”යි නො සිතා වදරා “මා දීපඞ්කරපාදමූලයෙහි අතට පත් නිවන් හැරැ සසරට වැද හිස් කපා දුන්නේ, ඇස් උපුටා දුන්නේ, තෙලියත්හි පෙළී ලේ දුන්නේ, කියතින් ලියා මස් දුන්නේ, අඹුදරුවන් දුන්නේ, සාරාසංඛ්‍යකප්ලක්‍ෂයක් මුළුල්ලෙහි මහදුක් ගත්තේ මැ පිණිස වේ ද?”යි සිතා අනඳමහ තෙරුන්වහන්සේ අතින් පාත්‍රය හැරැ ගෙණැ කැවුම් පිළිගෙණැ වදළසේකැ. “මට අනුග්‍රහ පිණිස පිළිගත්බව මුත් මෙ නපුරු අහර වළඳන සේක් ද?”යි ඈ සිතූ සඳෙහි ඇගේ සැක දුරු කොට එතැන්හි දී මැ වළඳ බණ වදරා තමන්වහන්සේ වැළඳූ කුඩට ඈ ලවා අමාමහනිවන් වැළැඳවූ බුදුන් -පෙ- යුතු.

## 139.

තව ද, අතුල නම් උපාසකයක්හු පන්සියයක් උපාසකයන් පිරිවරා රෙවතමහතෙරුන්වහන්සේ කරා බණ අසන්නට ගොස් ඔබ භාවනායෙහි වැඩැ හිඳ නො බිණූහෙයින් “මේ වහන්සේ මුයෙන් නො බණනද යැ”යි රැහැණි වැ, සැරියුත්මහතෙරුන් වහන්සේ කරා ගොසින් ඔබ බොහෝ කොට විජම්බණ කී හෙයින් “මේ වහන්සේ බොහෝ කොට බණ වදරණද යැ”යි නො සතුටුවැ අනඳමහතෙරුන්වහන්සේ කරා ගොසින් “ඔබ මඳ කොට බණ කීව”යි නො සතුටු වැ, තමන්වහන්සේ කරා ගිය සමයෙහි ඔවුන් සිත් ගෙණැ වදළ බණින් සිටිපියෙහි මැ ඒ උපාසකවරුන් පන්සියක්දෙනාට හා අතුල නම් උපාසකයන්ට හා අමාමහ නිවන් දුන් අනුන් සිත් ගෙණැ බණ කියන සේ දන්නා බුදුන් -පෙ- යුතු.

Non-Commercial Distribution

1. එකුරැත්තේන්

## 140.

තව ද, එක්සමයෙක්හි තමන්වහන්සේ සැවැත්නුවරැ උතුරු දෙරගම්හි සිහා වැඩැ සඟුරුවන් පිරිවරා අතරමඟැ වඩිමින් සිටැ බිළී බහන වැද්දකු තමන්වහන්සේ දැකැ බිළිය සහවා සිටි සමයෙහි එතැන්හි වැඩැ සිටැ තමන්වහන්සේගේ පරිවාර භික්‍ෂූන් වහන්සේ "තෙපි කිනම්මු ද?"යි විචාරා වදරා, ඒ වහන්සේ වරුන්ද "අපගේ නම් දැනැ දැනැ අප විචාරා වදරන්නේ කිසි කාරණයක් පිණිස යැ"යි තමන්වහන්සේවරුන්දගේ නම් වෙන වෙන මැ කී කල්හි බිළීවැද්ද කැඳවා "තෝ කිනම්හි ද?"යි විචාරා වදරා 'මම ආරිය නම්'යි කී කල්හි "ප්‍රාණවධ කරන්නෝ ආරිය නම් නො වෙති. යමෙක් ප්‍රාණවධයෙන් දුරු වී නම්, ආරිය නම් වන්නේ ඒ යැ"යි වදළ බණින් බිළීවැද්ද සෝවාන් කොට අමාමහනිවන් දක්වූ බුදුන් -පෙ- යුතු.

## 141 & 142

තව ද, එක්සමයෙක්හි තමන්වහන්සේ ජනපදචාරිකාවෙහි වැඩැ නැවැතැ සැවැත්නුවරට වැඩි සමයෙහි පන්සියක්දෙනා වහන්සේවරුන් එක්තැනක්හි හිඳ "අසවල්ගමට යන මහ සුව යැ. අසවල්ගමට යන මඟැ සුව යැ"යි කියා කථා කරණ සමයෙහි තමන්වහන්සේ එතනට වැඩ "මහණෙනි, ගමින් ගමට යන්නා වූ මහ නො වෙයි සුව. මේ ලොකයෙහි සුව නම් නිවන්පුරයට වදනා මහ යැ"යි වදළ බණින් ඒ පන්සියක් දෙනා වහන්සේ සියලු කෙලෙසුන් ගෙවා රහත් කොට අමාමහනිවන්හි ලා ලූ බුදුන් -පෙ- යුතු.

තව ද, තමන්වහන්සේ අතින් කමටහන් ගෙණැ වලට ගොස් ගුණයක් නො ලදින් නැවැතැ තමන්වහන්සේ කරා ආ පන්සියක් දෙනාවහන්සේ දැකැ ඔබගේ අදහස් බලා

"සබ්බෙ සංඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති,
අථ නිබ්බින්දතී දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා"යි

කියා වදළ සතරපදගාථාවෙන් ඔවුන් පන්සියක් දෙනාවහන්සේ රහත් කොට අමාමහනිවන් දක්වූ බුදුන් -පෙ- යුතු.

## 143 & 144

තව ද, තමන්වහන්සේගේ අගසවු වූ සැරියුත්මහතෙරුන් වහන්සේ තමන්වහන්සේ කෙරෙහි මහණ වූ එකකුහට සාරමසක් මුළුල්ලෙහි කමටහන් කියා අමාමහනිවන් දක්වා ගත නො හී, තමන්වහන්සේ කරා ගෙණැ ගොසින් එපවත් දැන්වූ කල්හි "තා සාරමසක් මුළුල්ලෙහි

Non-Commercial Distribution

ගෙණැ වෙහෙසුනු තැනැත්තහු අද මේ තිස්පැය ඇතුළත මා රහත් කරණ නියා බලව"යි වදරා ඕහට පියුමක් මවා දී, ඔහු ඒ පියුම බලබලා සතරවන ධ්‍යාන ඉපදවූ කල්හි, නැවැතැ ඒ පියුම තමන්වහන්සේගේ අධිෂ්ඨානබලයෙන් මලා ගිය කල්හි, මලා ගිය පියුම දුටු ඒ වහන්සේ "අනිත්‍යය, දුඃඛ යැ, අනාත්ම යැ"යි සිතූ කල්හි තමන්වහන්සේ එතනට වහල් වැ වදළ එක ගාථායෙන් ඒ වහන්සේ රහත් කළ බුදුන් -පෙ- යූතු.

තව ද, කොසොල්රජ්ජුරුවන්ගේ අග්‍රපුරෝහිත වූ අග්ගිදත්ත නම් බ්‍රාහ්මණයා තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වැ තමාගේ තාපසයන්ට "පර්වත ශරණ යව. වන ශරණ යව"යි යනාදි අධර්මයට උපදෙශ කරණ සමයෙහි කරුණායෙන් එතනට වැඩ වදළ ගාථා තුණින් ඒ තාපසයන් දහසක් දෙනා සිවුපිළිසිඹියා පත් රහත් කළ බුදුන් -පෙ- යූතු.

## 145.

තව ද, සුමෙධතාපසකාලයෙහි අත්පත් නිවන් හැර දීපඞ්කර සම්‍යක්සම්බුද්ධයන්වහන්සේගේ ශ්‍රීපාදයෙහි විවරණ පතුල් ලදින්, බුදුන්වහන්සේ ප්‍රධාන කොට ඇත්තා වූ සියලුලොව තමන්වහන්සේගේ ගුණයෙහි පැහැද, තමන්වහන්සේට පූජා කළ මල්ඇතිරිය මත්තෙහි වැඩ හිඳ, බුදුබව සාධා දෙන්නා වූ ධර්මයන් සොයා, දානපාරමිතා යැ, ශීලපාරමිතා යැ, නෛෂ්ක්‍රම්‍ය පාරමිතා යැ, ප්‍රඥාපාරමිතා යැ, වීර්‍ය්‍ය-පාරමිතා යැ, ක්‍ෂාන්තිපාරමිතා යැ, සත්‍යපාරමිතා යැ, අධිෂ්ඨානපාරමිතා යැ, මෛත්‍රීපාරමිතා යැ, උපෙක්‍ෂාපාරමිතා යැ යන දශවිධපාරමිතාවන් දැකැ වදරා, ඔවුන් මැ ශරීරයට හානියක් කොට ද නො නැසූ තන්හි උපපාරමිතාව හා, ජීවිතයට හානියක් කොට ද නො නසා පිරූ තන්හි පරමාර්ත්‍ථපාරමිතාව හා යි මෙසේ සමතිස්පැරුම් දැකැ වදරා, තව ද, අඞ්ගපරිත්‍යාගාදි වූ පඤ්චමහාපරිත්‍යාග හා, නැයන්ට වැඩ කිරීම් ආදි වූ තුන් අර්ත්‍ථචය්‍ය්‍යාව හා දැකැ වදරා, එතැන් පටන් සාරාසංඛ්‍යකල්පලක්‍ෂයක් මුළුල්ලෙහි හිස ගිනි ගත් එකක්හු ඒ ගිනි නිවන්නට කරණ යත්නයක් සේ, මහවතුරෙහි හුනු එකක්හු ඒ වතුරෙන් පිහිනා ගොඩ දක්නට කරණ යත්නයක් සේ, සතුරන් අතැ හුනු එකක්හු ඔවුන් අතින් ගැලැවී ගන්නට කරණ යත්නයක් සේ, ගිනිවළෙක්හි හුනු එකක්හු ඒ වළින් පැනැ නැගෙන්නට කරණ යත්නයක් සේ, මහාඋත්සාහයෙන් මහා පරාක්‍රමයෙන් 'අඹුවෝ යැ'යි නො සිතා, 'දරුවෝ යැ'යි නො සිතා, 'රාජ්‍ය යැ'යි නො සිතා, 'ඇස යැ'යි නො සිතා, 'මස් යැ'යි නො සිතා, 'හිස යැ'යි නො සිතා, 'ලෙහෙ යැ'යි නො

Non-Commercial Distribution

සිතා, 'ජීවිත යැ'යි නො සිතා, 'මුළුලොව මෙ සසරදුකින් කවරද ගලවම් දෝ? හො!'යි යන සිතින් එකදවසක් කරණ යත්නයක් සේ, එකපැයක් කරණ යත්නයක් සේ මහායත්න කොට, වෙසතුරු අත්බවට පැමිණැ, සත් ඉඩෙක්හි මහපොළොව කම්පා කොට මහදන් දී, එයින් සැවැ තුසීපුරයෙහි ඉපැද එහි සත්පණස් කෙළ සැටලක්‍ෂයක් හවුරුදු දිව්‍යශ්‍රී අනුභව කොට, අන්තයෙහි දස දහසක් සක්වළැ දිව්‍යබ්‍රහ්මයන් අවුදින් "කාලො'යං තෙ මහා වීර" යනාදීන් ආරාධනා කළ කල්හි පඤ්චමහාවිලොකනය කොට බුදු වන බව දනැ වදරා, චිත්‍රකූටපර්‍වතයෙන් අවුත් රත්පියුම් ගබකට වදනා රාජහංසයක්හු සේ මහාමායාදේවින්-වහන්සේගේ කුසැ පිළිසිඳ ගෙණැ දසමසක් මුළුල්ලෙහි රන්කරඬුවෙක්හි බහාලූ දරහමැණිකක් සේ එකුස්හි වැස, ලුම්බිනීවනයෙහි දී ප්‍රසව වැ, එකුන්තිස්හවුරුද්දක් පඤ්චකාමසුව අනුභව කොට, බ්‍රහ්මයන් එළවූ ජරාරුවෙක, ව්‍යාධිරුවෙකැ යනාදි සතර පූර්‍වනිමිත්ත දකැ වදරා පඤ්චකාමයෙහි ආදීනව හා මහණ වීමෙහි අනුසස් හා දකැ වදරා, රාහුලකුමාරයන් වැනි පුත්‍රුවනක් උපන් දවස් ඒ පුරුදු වූ කුමාරයන්ගේ මොළොක් වූ සිහිල් වූ ශරීරයෙහි පහස් තමන්වහන්සේගේ ළයට හෙල්මැලිකලඹ නො කොට, ඡන්න නම් අමාත්‍යයා හා කැටි වැ කන්‍ථක නම් අශ්වයා නැඟී තුන් රාජ්‍යයක් ඉක්මැ අනොමානදීතීරයෙහි මහණ වැ, සහවුරුද්දක් මහාවීර්‍ය්‍ය කොට, ඒ වීර්‍ය්‍යයෙන් නිවන් සාධා ගත නො හී, ඖදරික ආහාර අනුභව කිරීමෙන් ශරීරයෙහි බල ගන්වා වෙසක්මසැ මැදි පොහෝදවස් සුජාතාවන් දුන් කිරිපිඬු පිළිගෙණැ නෙරඤ්ජරා නදීතීරයෙහි දී වළඳ, සල්වෙනෙහි දිවාවිහාර කොට, සවස්වේලෙහි මහබෝමැඩ වජ්‍රාසනයට නැඟී, සියලු දිව්‍යබ්‍රහ්මයන් නොයෙක් පූජා ගෙණැ පිරිවරා ගත් සමයෙහි එ දෙව්පිරිස ලුහුබඳවා ගෙණැ දිවූ සොර වූ මාරසෙනාව කෙශරසිංහරාජයක්හු දුටු කැණහිල් බලු රැසක් සේ ලුහුබඳවා, පළමුවන යමැ පූර්‍වෙනිවාසානුස්මෘතිඥාන ලදින්, මධ්‍යමයාමයෙහි දිවඇස් ශුද්ධ කොට, පශ්චිමයාමයෙහි දෙළොස් අඞ්ගයකින් යුක්ත වූ ප්‍රතීත්‍යසමුත්පාදය මහමතෙකින් මහාසාගරය අලළන්නා සේ ආදියෙහි සිටැ අන්තයට, අන්තයෙහි සිටැ ආදියට, මැද සිටැ දෙකෙළවරට අලළා වැද විමසා, සෝවාන් මඟ ලදින් සෝවාන්ඵල ලදින්, සකෘදගාමි මඟ ලදින් සකෘදගාමි ඵල ලදින්, අනාගාමිමඟ ලදින් අනාගාමිඵල ලදින්, රහත්මඟ ලදින්, රහත්ඵල ලබන විටැ මැ එකොළොස්දහස්පන්සියයක් ගඞ්ගා වැද පිරීගිය මහමුහුදක් සේ අනන්තා-පර්‍ය්‍යන්ත සියලු බුදු ගුණෙන් පිරී ඉතිරැ ගොස් "අනෙකජාතිසංසාරං" යනාදීන් උදන් අනා වදරා තමන්වහන්සේ වැඩහුන් වජ්‍රාසනය බලා වදරා-

Non-Commercial Distribution

"මෙ පලඟ පිණිස සහවොටුනු හිස් මා අතැ කඩුවෙන් මා මැ කපා දුන් කල් ගණන් නැත. පස්පෑ දිස්නා ඇස් උපුටා දුන් කල් ගණන් මම නො දන්මි. ලය පළාපියා හදවත දී ලා වැටී හී ඒ සතුටින් වැහෙන සතුටුකඳුළෙන් නුවන් තෙත් කොට සුව මරණ[1] මළ ජාති මෙතෙකැයි නො දන්මි. ජාලිකුමාරයන් වැනි පුත්රුවන් කෘෂ්ණාජිනාවන් වැනි දූරුවන් මද්‍රිදේවීන් වැනි අඹුරුවන් යාවකයන්ට දීලා, තමාගේ සතුරන් බැඳ ගෙණැ අවුත් චණ්ඩාලයන්ට ගැති කොට දී පියා[2] සතුටු වැ හිඳිනා සේ සිටි, ජාති ගණක් හොත්, මා පිරිනිවන් පානා තුරු එ මැ ගැණැ නිමවා ගත නො හැක්කැ. එහෙයින් මෙ තෙක් දුක් ගෙණැ මා ලත් පලඟ නො හරිමි" යි-

සත්දවසක් මුළුල්ලෙහි එහි මැ වැඩැ හිඳ නිවන්සුව අනුභව කොට සමහර දෙව්කෙනෙකුන් "තව ස්වාමිදරුවන් බෝමැඩැ මැ වැඩැ හිඳිනේ කළ මනා කටයුත්තක් ඇති හෙයින් වනැ යි සිතූ කල්හි, තමන් සියලු කටයුතු නිමවූබව හඟවා ආකාශයට පැනැ නැඟී 'බුදුකෙනෙකුන් මුත් අනික් දෙවියකු මරකු බඹකු කොට ගත නො හැකි යමාමහපෙළහර කෙරෙමි'යි සිතා වදරා, සියලු ශරීරයෙහි නවානූදහසක් රෝමකූපයන් මුළුල්ලෙන් හා සියලු හිසකෙහෙයෙන් ඇඟින් නහඹතල්කඳක් සා ගිනිකඳක්, නාඹ තල්කඳක් සා දියකඳක්, ගිනිකඳ හුනු තැනින් දියකඳ, දියකඳ හුනු තැනින් ගිනිකඳක් ද හෙළමින්, දෙඇසින් දෙබැමයෙන් දෙනාසාපුටයෙන් දෙකන්සොරොව්වෙන් දෙදසරුවෙන් දෙතන පුඩුයෙන් ශ්‍රීහස්තදෙකැ දසඇඟිල්ලෙන් ශ්‍රීපාදදෙකැ දසඇඟිල්ලෙන් එකි එකී තැනින් ගිනිකඳ එකි එකී තැනින් දියකඳහෙළමින් යමාමහපෙළහර දක්වා දෙවියන්ගේ සැක දුරු කොට,

"වශවර්තිමාරයා දිවැ ගෙණැ ආ කලැ සියලු දෙවියන් බඹුන් බිඳී යාදී මා හැර නො ගියා වූ මේ බොධිවෘක්ෂයට දෙවියන්ගේ පරසතුගස සලා අසුරයන්ගේ පළලුගස සලා අනන්ත මල් පුදත් පොහොසත්මි. මහාසමුද්‍රයෙහි දියකඳ බිඳ පියා සත්රුවන් උකා ගෙණැ මුළුපොළොවැ අතුටැ පුදත් පොහොසත්මි. එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් මහමෙර පුලුන්පෙදක් සේ පෙරළා පියා යටින් සත්රුවන්වැලි හැර ගෙණැ මේ රුක්මුල පටන් ගෙණැ සක්වළගළ දක්වා අතුටැ ලත් පොහොසත්මි. මේ හැම මෙයට සුදුසු පූජා නම් නො වෙයි. මට සර්වඥතාඥාන නැමැති ඇස් සාධා දුන් මේ බොධිරුකට මාගේ ඇසින් මැ පූජා කෙරෙමි"යි-

---

1. සුවමරණින්-ථූපවංස 2. ත්‍යාග දී සී පියා

Non-Commercial Distribution

සත්දවසක් මුළුල්ලෙහි දෙඇස නො පියා එයින් නික්මෙන පස්වණක් පැහැයෙන් බොධිපූජා කොට, නැවත රුවන්සක්මන මවා එහි සක්මන් කොට සත්දවසක් යවා, සතරවන සතියෙහි දෙවියන් මැවූ රුවන්ගෙහි වැඩැ හිඳ අභිධර්මපිටකය නානානය වශයෙන් පරීක්ෂා කොට, පස්වන සතියෙහි අජපාලනිග්‍රොධමූලයෙහි අමාමහනිවන්රස වළඳමින් වැඩහිඳ, තමන්ගේ පිය මරහට වූ පරිභව පහ කරණු පිණිස වෙන වෙන සසියක් රූ මවා ගෙණැ ආවා වූ මාරස්ත්‍රීන් තුන්දෙනා මැවූ ඇසක් ඇත්තවුන් කණක් ඇත්තවුන් සිතක් ඇත්තවුන් නො බලා නො අසා නො සිතා හිඳ පියැ නො හැකි ඒ සියලු ලීලායෙන් යුක්ත වූ ඒ රූ "අසූචි වළෙක්හි කුහුල්[1] දෙන පණුවන්ගේ රූ කොටත් නො සිතා වදරා සවනසතියෙහි මුචලින්‍දයට වැඩැ සත්දවසක් බැඳ ගෙණැ වස්නා වැස්සෙහි රිදීඋළුයෙන් බැඳි ගෙඩිගෙයෙක්හි වැඩැ හිඳිනා සේ මුචලින්‍ද නම් නාගරාජයාගේ දරණගැබැ වැඩැ හිඳ එයින් නික්මැ කිරිපලුගසැ මුලැ නවනීලමෙසකුටයක් යට දිලියෙන පුන්සඳක් සේ සතියක් වැඩැ හිඳ මෙසේ සත්සතිය යවා, බුදු වූ දවසට එකුන්පණස් වැනි දවස් ශක්‍රයා ගෙණා නාලියද්‍දැවුටු වළඳ, තපස්සු භල්ලුක දෙදෙනා දුන් මිහිපිඩු, සතරවරම්මහරජ්දරුවන් එළවූ මුංවන්ගල්පාත්‍ර සතර තමන් වහන්සේගේ අධිෂ්ඨානයෙන් එක් කොට, එයින් පිළිගෙණැ වළඳ, ඒ දෙදෙනා බුත්සරණ දහම්සරණ ගන්වා, ඔවුන් නිත්‍යයෙන් පූජා කරණ පිණිස තමන්වහන්සේගෙන් කෙශ ධාතු දී, එයින් නික්මැ අජපාලනිග්‍රොධමූලයෙහි වැඩැ හිඳ "මා දත් ධර්මය සියුම් වුව, ලෝවැස්සන් ඉතා ජඩ[2] වුව, ඔවුන්ට මේ ධර්මය දෙසුව හොත්, ඔහු කෙසේ දනැ ගත හෙත් ද"යි සිතා වදරා දෙශනාවෙහි මන්‍දෝත්සාහ වූ කල්හි දසදහසක් සක්වළැ දිව්‍යබ්‍රහ්මයන් හා කැටි වැ අවුත් ශ්‍රීපාදය වැඳ ගෙණැ හෙවැ සහම්පතිමහාබ්‍රහ්මයා "බණ වදළ මැනැවැ"යි කළ ආරාධනා ගිවිසැ "කාට ආදි කොට බණ කියම් දේ හො?"යි සිතා වදරා ආලාරකාලාම උද්දකරාමපුත්‍රයන් දෙදෙනා මළ බව දනැ "මට බොහෝ උපස්ථාන කළ පස්වග මහණහු දන් බරණැස ඉසිපතනවිහාරයෙහි වෙසෙති. ඔවුන් කරා ගොස් ධම්සක් පවත්වම්"යි සිතා වදරා, ඇසළමසැ මැදි පොහෝදවස් පාසිවුරු ගෙණැ අටළොස් යොදුන් මහ ගෙවා වඩනාසේක් අතරමහැ උපක නම් ආජීවකයා තමන්වහන්සේගේ රූපය දකැ-

"ස්වාමීනි, තෙපි සඳුට වඩා සෞම්‍ය කෙනෙකු ව. හිරුට වඩා තේජස් ඇති කෙනෙකු ව. මුහුදට වඩා ගැඹුරු කෙනෙකු ව. මහමෙරට වඩා අචල කෙනෙකු ව. සියලු රුවන්හි සියලු මල්හි සියලු තරුවෙහි

1. කුලුල්. කුඹුල් & ගුගුල්-සමහර 2. චණ්ඩ.

Non-Commercial Distribution

සියලු විදුලියෙහි සියලු දෙව්දුන්නෙහි සියලු සන්ධ්‍යාවලායෙහි සියලු සරත්[1] වලාවෙහි පැහැ තාක් එක් කොට අලළා පියා වරපල බලා[2] මහදඹගසින් දඹපක් හුනු හුනු තැනින් නැඟි රන්පැළයෙන් රන් හැරැ ගෙණැ ඒ හා එක් කොට අලළා හඹා දිව්දළින් ඔප ලා මැවූ පිළිමයක් ඇත් නමුදු, තොපගේ රුව බැලූ කලැ ඇසට අරුචි එළවයි. එයට වඩා සියදහස් ගුණෙන් තෙපි මැ යහපත් මැ යැ. තොපගේ ගුරු කවුරු දැ?"යි විචාළ කල්හි සී පියා-

"ආජීවකය, මහමෙරට වඩා උස් ගලෙක් නැත. මහාසාගරයට ගැඹුරු ලිඳෙක් නැත. මහපොළොවට මහත් සුඹසෙක් නැත. ආකාශයට මහත් කෙසිසිදුරෙක් නැත. සිංහයන්ට වැඩි දපී වැඩි කැණහිල්ලු නැත. ගන්ධහස්තීන් හා ස්පර්ධා කරණ ගම්හුරෝ නැත. සඳමඬුලු හා සපර්ධා කරණ කද්‍යෝපැණියෝ නැත. මේ මුළුලොව්හි මා හා සම එක ද සත්ත්වයෙක් නැත. මරහු ලුහුබැඳවීමි. සියලු කෙලෙසුන් ඇත්පයට වන් කිහිඹිකැලයක් සේ ගහටාපීමි. සියලු බුදුගුණ තාක් මා සිත්හි පුරා ගතිමි. හළ මනා දැ හළිමි. ගත මනා දැ ගතිමි. දැන් මහාබ්‍රහ්මයාගේ ආරාධනාවෙන් බාරාණසියට ධම්සක් පවත්වන්නට යෙමි"යි-

වදරා, එද මැ බරණැස්නුවරට අවුත් ඉසිපතනවිහාරයට වැඩැ, දුරින් වඩනා තමන්වහන්සේ දුටු පස්වගමහණුන් තමන් වහන්සේ බුදු වූ බව් නො දනැ "ශ්‍රමණගෞතමයෝ සහවුරුද්දක් මහාවීයඹී කොට බුදු වැ ගත නො හී අප කරා එති. උන් නො වඳුම්හ. නැඟී නො සිටුම්හ. පෙරගමන් නො කරම්හ. රජ කුලෙහි උපන් තැනැත්තන් බැවින් හිඳිතොත් හිඳිනා දෙයක් ලම්හ"යි සිතූ කල්හි උන් සිතූ සිත් දැනැ වදරා "මුන්ගේ මන් බිඳිනට අනික් කුමක් තකම් ද? හැම කල්හි මැ මා අනුන්ගේ දළදප් බිඳ ආයේ මෛත්‍රීබලයෙන් වේ දැ?"යි සියලු සත්ත්වයන් කෙරෙහි කරන්නා වූ මෛත්‍රී ඒ පස්දෙනා කෙරෙහි කරත් කරත් හුන් තැනැ හිඳ පියැ නො හී වදිමින්, පෙරගමන් කෙරෙමින්, පාසිවුරු ගන්මින්, ශ්‍රීපාදය සෝධා වඩා හිඳුවා "බුදුන් හා බණන්නේ මෙ ලෙස යැ"යි නොදන්නා හෙයින් සමසමයන් හා බණන ලෙස තමන්වහන්සේ හා බිණූ කල්හි "මෙවිටැ මා බුදු වූබව හඟවමි"යි සිතා වදරා "මහණෙනි, සමසමයන් හා බණන ලෙස තිලෝගුරු බුදුන් හා නො බණව"යි වදරා යුගඳුරු මුදුනට මුහුදු රළපෙල මැඬැගෙණැ පැනැ නැඟි සමපණස් යොදුන් හිරුමඬල සේ සියලු බුදුන් ධම්සක් පවත්වන තැන්හි පැණී ගිය ධර්මාසනයට පැනැ නැඟි දසදහසක්

1. රන්. 2. පියවර පතුල බලා-ථූපවංස.

Non-Commercial Distribution

සක්වළැ මහමෙර නටවමින්, සත්කුලපව්වන් හිසින් හිස් අන්වමින්, සතිස්ලක්‍ෂදසදහස් තුන්සියපණස්යොදුන් වට ඇති සක්වළගල හුඉද්දක් සේ සිසාරවමින්, බර ලූ සමක් සේ මහ මුහුද රළ නැති කොට නිශ්චල කෙරෙමින්, ගල් පළා ගෙණැ නැඟෙන පියුමෙන් පොළොව පළා ගෙණැ නැඟෙන පියුමෙන්, ගස්වල කඳ පළා ගෙණැ නැඟෙන පියුමෙන් සියලු අහස වසා බුද්ධශ්‍රී බලන්නට කර නමා ගත්තා සේ කෙමි බිම් බල්වා අහස වසා සැදී ගිය පියුම්වියනින්, වැසි නැති වැ මැ බිම් පළා ගෙණැ නැඟෙන නාඹතල්කඳ සා දියකදින්, කැමැත්තවුන් තෙමා නො කැමැත්තවුන් නො තෙමා වස්නා පොකුරුවැස්සෙන් පිළිවෙළින් තුබූ දසදහසක් සක්වළැ දසදහසක් සඳමඩලෙන් දස දහසක් හිරුමඩලෙන්, දෙව්දුන් ලක්‍ෂගණන් කෝටිගණන් හිස තබා ගෙණැ අවුත් වැද ගිය මඟුල්කලස සමූහයෙන්, මහමුහුදට වැද මුතු උකා ගෙණැ දෙවියන් ඇඳපී සොළොස්මඟලායෙන් දෙවියන් ඉස්නා පරසතුමලින් නයින් ගසන කඩුපුල්මලින් අසුරයන් ගසන පළලුමලින් මුළුලොව සදමින් රන්තොරණින් රිදීතොරණින් රුවන්තොරණින් පිළීතොරණින් රන්ඇගෑයෙන් රුවන්ඇගෑයෙන් රිදීඇගෑයෙන් මුළුලොව අගනිටාබඹලොව දක්වා වසමින්, මුළුසක්වළ බිම ගල්ගස්සිදුරෙහි අතුමත්තෙහි පත්මත්තෙහි හිදිකටුමලක් ඔබා ලන තැන සැටක් සැත්තැවක් අසූවක් පමණ දෙවතාවන් හිවී ගැවසී සිටැ ගත් කල්හි, දසදහසක් සක්වළැ මහබඹුන් නහාලූ කුඩ මධ්‍යයෙහි දෙවියන් සලන වල්විදුනා මධ්‍යයෙහි මිණිතල්වැට මධ්‍යයෙහි දිලියෙමින් හිඳ, දසදහසක් සක්වළැ දසදහසක් ශක්‍රයන් දසදහසක් දකුණුසක් පිඹැ පියාසක් පිටට කොට හෙළාලා විසිදහසක් අත් ඔසොවා ගෙණැ "ඔ! හෝ! අරගල නො කොට බණ අසව"යි පිරිස් සන්සිඳුවා ලූ සමයෙහි දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් මහ පොළොව නහා ගත් සාධුකාර හා කැටි වැ එකවට මැ-

"ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා යො වා 'යං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්‍ථසංහිතො; යො වා 'යං අත්ත කිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්‍ථසංහිතො. එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති" යනාදීන් නහාගත් මඟුල්බණින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ වහන්සේ හා අටළොස් කෙළක් මහබඹුන් අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

Non-Commercial Distribution

## 146 & 147

පස්වනදවස් අනාත්මලක්‍ෂණසූත්‍රය දෙශනා කොට වදරා පස්වග-මහණුන් වහන්සේ රහත් කොට අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

ඉක්බිති යසකුලපුත්‍රයන් ප්‍රධාන කොට ඇත්තා වූ පස්පණස් දෙනකුන් තමන් ගැසූ දහම් නැමැති මහවතින් අමාමහනිවන් පුරෙහි ලා ලූ බුදුන් පෙ- යුතු.

## 148 & 151

ඉක්බිති කප්පැටියවනලැහැබ්හි වැඩැ හිඳ භද්‍රවර්ගීයෙහි තිස්දෙනා නිවන්රසඅමා පොවාලූ බුදුන් -පෙ- යුතු.

ඉක්බිති ගයාශීර්‍ෂයෙහි පිටිපහණපිටැ[1] මහදඹපකක් පළා ගෙනැ පැනැ නැඟි රන්දළුවක් සේ වැඩැ හිඳ "චක්ඛුං භික්ඛවෙ ආදිත්තං" යනාදීන් වදළ ආදීප්තපර්‍ය්‍යාය සූත්‍රයෙන් උරුවෙලකාශ්‍යපයන් ප්‍රධාන කොට ඇත්තා වූ දහසක් ජටිලයන් අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

තව ද, බිම්බිසාරරජ්ජුරුවන්ට කළ ප්‍රතිඥව මුදන පිණිස රජගහානුවරට වැඩැ ලට්ඨිවනයෙහි වැඩැ හිඳ වදළ බණින් බිම්බිසාරරජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති එක්ලක්‍ෂදසදහසක් දෙනා අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

පාෂාණචෛත්‍යයෙහි වැඩැ හිඳ පාරායණසූත්‍රය දෙසා වදරා ඒ මහුලෙහි තුදුස්කෙළක් ප්‍රාණීන් සසරදුකින් මුද අමාමහනිවන් නැමැති විජයපුරයෙහි ලූ බුදුන් -පෙ- යුතු.

## 152 & 153

තීර්ථකයන්ගේ මන් බිඳිනා පිණිස දසදහසක් සක්වළැ දසදහසක් මෙර පන්තීන් තබා ලා ඊ මත්තෙහි රුවන්සක්මන මවා ඊ පිටට පැනැ නැඟී යමකප්‍රාතිහාර්‍ය්‍ය කෙරෙමින් සතර රියන් සක්මනෙක්හි සක්මන් කරන්නා සේ අහස්හි වඩිමින් මුළුලොව විස්මයෙන් නටවමින් සාධුකාර දෙවමින් අපොළවමින් දෙවියන් බඹුන් වැඳ පෙරළවමින් යුගාන්තයෙහි ගිනි ගෙණැ දිලී පැනැ නැඟී එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් සත්රුවන් මෙර සේ මුළුලොව ඇස් තමන් කරා හයවමින් වදළ බණින් විසිකෙළක් සතුන් සසරගිනිවළින් නහා අමාමහනිවන් මහවිලැ ගලා සනහා ලූ බුදුන් -පෙ- යුතු.

තව ද, යමාමහපෙළහර කොට තුන්පියවරෙකින් තව්තිසැ භවනයට වැඩැ දිග සැටයොදුන් පළල පණස්යොදුන් උස පසළොස්යොදුන් පාණ්ඩුකම්බලශෛලාසනයෙහි කුඩා පුටුවෙකැ හිඳිනා ධර්මකථික

1. මිණිපහණපිට.

Non-Commercial Distribution

කෙනෙකුන්වහන්සේ සේ තමන්ගේ මහලට පිපී වැනීගිය සියක්යොදුන් පරසතුරුකට පිට දී වැඩැ හිඳ මෑණියන් වහන්සේ ප්‍රධාන කොට ඇති දසදහසක් සක්වළැ දිව්‍යබ්‍රහ්මයන්ට "කුසලා ධම්මා; අකුසලා ධම්මා; අබ්‍යාකතා ධම්මා" යනාදීන් වදළ අභිධම්දෙශනාවෙන් අසූකෙළක් දෙව්බඹුන් සසරමලින් ගලවා අමාමහනිවන්පුරෙහි ලා නිවා සනහා ලූ බුදුන් -පෙ- යුතු.

## 154.

එසේ බණ දෙසා අන්තයෙහි අවීචියෙහි පටන් ගෙණැ භවාග්‍රය දක්වා ලොව මුළුල්ල සතරරියන් ගබඩාවක් සේ කිහිඹි කුහුඹුවන් ආදි වූ සියලු සතුන්ට පැණෙන පරිද්දෙන් අධිෂ්ඨාන කොට දෙදිශාවෙහි දෙහිණින් නොයෙක් පූජා කෙරෙමින් බස්නා දිව්‍ය බ්‍රහ්මයන් මධ්‍යයෙහි මැද රුවන්හිණින් බස්මින් වදළ බණින් තිස්කෙළක් සතුන් සියලු දුකින් ගලවා අමාමහනිවන්හි ලා නිදුක් නිරොගිසුවපත් කළ ගෞතමගොත්‍රයෙහි උපන් සියලු ලොව සැනැහූ අමාපිඩක් වැනි බුදුන් -පෙ- යුතු.

## 155.

තව ද, තුන්බුද්ධාන්තරයක් මුළුල්ලෙහි බත්පැන් නො ලදින් සොටුසෙම්මාත්‍රයක් නො ලදින් දුක්පත් වූ ප්‍රෙතයන්ට පින් පෙත් දී බිම්සරරජ්ජුරුවන්ගේ ගෙහි වැඩැ හිඳ තිරොකුඩ්ඩ සූත්‍රය වදළ දවස්හි ද, සුමනමාලාකාරසමාගමයෙහි බණ වදළ දවස්හි ද, ඛදිරඞ්ගාරජාතක සමාගමයෙහි බණ වදළ දවස්හි ද, ජම්බූකාජීවකසමාගමයෙහි බණ වදළ දවස්හි ද, ආනන්‍දසෙඨි සමාගමයෙහි බණ වදළ දවස්හි ද, වෙන වෙන මැ සුවාසූදහසක් සුවාසූදහසක් ප්‍රාණීන් අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

## 156-157.

පන්සියක් රාජකුමාරවරුන් රහත් කොට ලා මහාවනයෙහි වැඩැ හිඳ කැටි වූ දිව්‍යබ්‍රහ්මයන්ට මහාසමයසූත්‍රය දෙසා වදළ දවස් ද, දෙළොස්අවුරුද්දක් මුළුල්ලෙහි පොළෝතෙලේ සිට බඹලොව දක්වා සියලු සතුන් විසඳ ගත නුහුනු මඞ්ගලප්‍රශ්නය විසඳ මහාමඞ්ගලසූත්‍රය දෙසා වදළ දවස් ද, තමන්වහන්සේගේ පුත් වූ රාහුලකුමාරයන්වහන්සේට අවවාද කරණ පිණිස අම්බලට්ඨිකාවට වැඩැ රාහුලොවාදසූත්‍රය දෙසා වදළ දවස් ද, සමචිත්තපරියායසූත්‍රය දෙසා වදළ දවස් ද යි මේ සතරතන්හි සියයෙකැ දහසෙකැ ලක්‍ෂයෙකැ කොටියෙකැ ප්‍රකොටියෙකැ යනාදි හිමක් නැති වැ අසංඛ්‍ය අසංඛ්‍ය බැගින් අනන්තාපරිමාණ සත්ත්වයන් නිවන්මහපුරෙහි ලූ බුදුන් -පෙ- යුතු.

Non-Commercial Distribution

තව ද, රජගහනුවර වීථිමධ්‍යයෙහි ධනපාල නම් ඇතු කුඹ මත්තෙහි අත තබා ගෙණැ වදළ බණින් දසදහසක් සත්ත්වයන් අමාමහනිවන්හි ලූ බුදුන් -පෙ- යුතු.

## 158.

තව ද, අනන්තාපරිමාණසක්වළැ ක්‍ෂත්‍රියහ, බ්‍රාහ්මණයහ, උපාසකයහ, උපාසිකායහ, දෙවතායහ, අසුරයහ, නාගයහ, සුපණ්ණියහ, යක්‍ෂයහ, රාක්‍ෂසයහ යනාදි වූ සියලු සත්ත්වයන් දහස් සුවහස් තුඩු මවා ගෙණැ අනික්බසක් නො කියා කපක් මුළුල්ලට ආයු ඇති වැ ගෙණැ තමන්ගේ ශරීරයෙන් එක් අවයවයක් අල්ලා ගෙණැ එහි රූප කියත්, එතෙක් තුඩින් එතෙක්කල් එතෙක් දෙනා කී රූපයෙන් තමන්ගේ ශරීරයෙහි හිදිකටුවක් ඔබා ලන තන්හි දු රූප නො ගෙවන පරිද්දෙන් මහත් වූ රූප ඇති බුදුන් -පෙ- යුතු.

## 159.

තව ද, වඩනට පටන්ගත් වේලෙහි බලා සිටි සිටි සියලු සතුන් "ස්වාමිදරුවානන් වඩනා නියා මැ රිසියෙයි. අපගේ ඇස නිවා මැ බලා පියන පරිද්දෙන් කල් යවා මැ වඩනාදැව"යි කියා විඳ විඳ බලන පරිද්දෙන් යහපත් වූ ගමන් ඇති, වැඩැ සිටි විටැ දුටු දුටුවන් ඇසට රසායනයක් වැනි "මේ හිමියානන් වහන්සේ වැඩැ සිටින්නේ මැ රිසියෙයි. අපගේ ඇස දරිද්‍රාය හැර බලාපියන පරිද්දෙන් බොහෝ කලැක් මැ වැඩැ සිටිනාදැව"යි පතපතා බලන පරිද්දෙන් හොබනා වූ වැඩැ සිටීම් ඇති, වැඩැ හුන් තන්හි දුටු දුටුවන් "කපක් දවස් මෙසේ වැඩැ හිඳුත් යහපතැ"යි කියන පරිද්දෙන් සිත්කලු වූ වැඩැ හිඳීම් ඇති, සිංහශය්‍යාවෙහි වැඩැ හොත් වේලෙහි දුටුවන් "අප ජීවිතාන්තය දක්වා මේ වැඩැ හොත් ලෙස මැ බලා නිමවා ගත නො හෙම්හ" යන පරිද්දෙන් වැඩැ හොත් ලෙසින් මැ රිසියෙන්නා වූ; බණන විටැ එ මැ රිසියෙන්නා වූ, මුයෙන් නො බැණැ හුන් කලැ එය මැ කළාක් වැනි වූ කළ කළ දෙයක් මැ ලොවට ආදර්‍ශ කරන්නා වූ, බිණූ බිණූවක් මැ ලොවට බණ කරන්නා වූ, "උන්වහන්සේ කීයෙකැ, උන්වහන්සේ කළ දෙයෙකැ"යි කී කල්හි මුළුලොවැ නැවැතැ "මේ කිමෙක් දෝ හො"යි විචාරන්නට එක ද සත්ත්වයක්හු නැත්තා වූ, 'ගින්නෙහි හෙව'යි වදළ හොත්, 'මේ ගලින් වැටෙව'යි වදළ හොත්, 'මෙලෙසින් වන වැඩක් දැකැ යැ, මේ වදළේ යැ'යි සිතා නො විචාරා මැ කට යුතු වූ, ලොවට හිතයක් හැර නො පවත්නා තුඩු ඇති, සත්ත්වකරුණාව හැර නො පවත්නා සිත් ඇති, සමසිත්කමට ලඇතිකමට වියත්කමට කරුණා ඇතිකමට පොහොසත්කමට ගැඹුරුකමට නොපමාකමට හිරිඔතප්වැටිලියට

Non-Commercial Distribution

හිතොපදෙශයට රූපයට මෛත්‍රියට පිරිවහලට ශීලයට සමාධියට ප්‍රඥවට විමුක්තියට විමුක්තිඥනදශීනයට වඳනට පුදනට මෙනෙහි කරන්නට සේවාකම් කරන්නට මෙහෙ කරන්නට දෛවයෙන් තමුන් මුත් අනික්කෙනකුන් නැති බුදුන් -පෙ- යුතු.

## 160. 161 & 162

තව ද, ඇස ලුලු දිශාවට සියලු සැපත් දෙන්නා වූ, එබු එබූ පත්ලෙහි ලෝවැඩ නිධාන කරන්නා වූ, උපනුපන් සිතැ දහමින්, වන්වන් තන්හි විස්මයෙන්, හුන්හුන් තන්හි, අනුශාසනාවෙන් ඉරියවුහි සිත්කලුබවට[1] බැහැවි සිටි බුදුන් -පෙ- යුතු.

තමන්ගේ විහාරයට වන්නවුන් සතරඅපායට නො වැද්දැ දෙන්නා වූ, තමන්ගේ රූ දුටුවවුන් සසරදුක් නො දක්කැ දෙන්නා වූ, තමන්ගේ බස් ඇසූවවුන් "තුලු ගණුව! බඳුව" යනාදි වූ නොමිහිරිබසක් නො ඇසියැ දෙන්නා වූ, දහමට බැහැවී ගිය බුදුන් -පෙ- යුතු.

තවද, සඳුන්කදෙහි පවා බොර සැසැ හරිති. නෙළුම්මල්හි පවා පිටපෙති හරිති. ගන්ධශාලියෙහි පවා තෝකුඩු හරිති. මීයෙහි පවා හිටි හරිති. මෙසේ සියලු ලොව්හි සමහරක් ගත යුතු යැ. සමහරක් නො ගත යුතු යැ. හැමලෙසින් මැ පරීක්‍ෂා කරත් හැරපියැ යුත්තක් නැති වැ හැමලෙසින් මැ වැන්ද යුතු වූ, හැමලෙසින් මැ පිදියැ යුතු වූ බුදුන් -පෙ- යුතු.

## 163 & 164

ගිමින් තැවී අනුතත්විලට වන් එකක්හු 'මෙතැන්හි පැන් ම්[2] වන. මෙතැන්හි පැන් සිහිලැ'යි නො කියා, වන්වන් තන්හි මැ ගැලුනු ගැලුනු තන්හි මැ සිහිලින් සැනැහෙන්නා සේ, සසරදුක් මහහිමින් තැවී වන්නවුන් වන්වන්තැනින් මැ සනහා ලන්නා වූ සම්මාසම්බුදු අනුතත්විල සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

"සර්වඥයහ. සුගතයහ. බුද්ධයහ. ධර්මරාජයහ. තථාගතයහ. සමන්තභද්‍රයහ. භගවත්හ. මාරවිජයීහ. ජිනයහ. ශාක්‍යසිංහයහ. දශබලධරයහ. අර්හත්ය. සම්‍යක්සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලොකවිදූහ. අනුත්තරයහ. පුරුෂදම්‍ය සාරථීහ. දිව්‍යමනුෂ්‍යයන්ට අනුශාසකයහ. අද්වයවාදීහ. විනායකයහ. දශබලයහ. මුනීන්ද්‍රයහ. ලොකෙශ්වරයහ. ෂඩභිඥයහ. ප්‍රඥසාගරයහ. මෙරුසාරයහ" යනාදීන් වර්ණනා කරත් නො නිමින්නා වූ ගුණ ඇති බුදුන් -පෙ- යුතු.

---

1. ඉරියව්වෙහි ඉරියව්වෙහි සත්කලු වූ 2. නිවී.

Non-Commercial Distribution

## 165.

තමන් දුටුවන් "පින්පිඩක් දුටුම්හ. රූපයෙහි සාරයක් දුටුම්හ. ගුණබඳක් දුටුම්හ. කරුණායෙන් මැවී ගිය රූපයක් දුටුම්හ. නුවණ මුහුකුරා ගිය රුවක් දුටුම්හ. සමතිස්පැරුමන් එක් වැ මැ අඩුවැඩි බලා කොට තිමවූ සිත්තමක් දුටුම්හ. ලොවට ඇති වූ ඇසක් දුටුම්හ. මුළුලොවට පෙළහර පුරා ලූ නිධානයක් දුටුම්හ. විස්මය පිරුණු කුලගෙයක් දුටුම්හ. ලයට සැනසිල්ලක් දුටුම්හ. නිවණට දෙරක් දුටුම්හ. ස්වර්ගයට හිණක් දුටුම්හ. අපායට හකුලක් දුටුම්හ. ගුණයෙහි ඔදක් දුටුම්හ. මිහිරෙහි නිමාවක් දුටුම්හ. වියත්කම්හි මුල් බට තැනක් දුටුම්හ. පෙර ඇසූ ගුණයට සුදුස්සක් දුටුම්හ. අවීචියෙහි පටන් ගෙණැ භවාග්‍රය දක්වා මුළු ලොවැ සතුන් "**ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා**" යි එක පැහැරැ හඬ ගහාලූ කීර්තිඝොෂාවට සුදුස්සක් දුටුම්හ, ඇස් ලදුයෙහි සිත් ලදුයෙහි විද්‍යා ලදුයෙහි ජාති ලද්දෙහි ඵල ලදුම්හ." යන පරිද්දෙන් මුළුලොව එක පැහැර නටවා පූ බුදුන් -පෙ- යුතු.

## 166-167

තමන් දකැ ගිය කෙනෙකුන් පරසක්වළැ හුන ද, දල්වූ දල්වූ ඇසෙහි පැණී යන්නා වූ, සිත්හි සිත්හි ඇඳී යන්නා වූ සිත්හි සිත්හි බැඳී යන්නා වූ, සිත්හි සිත්හි සැරහී යන්නා වූ, සිත්හි සිත්හි ගැලී යන්නා වූ, සිත්හි සිත්හි හිඳී යන්නා වූ, සිත්හි සිත්හි පැහැසී යන්නා වූ, සිත්හි සිත්හි ඇලී යන්නා වූ, සිත හා නො වෙන් වැ යන්නා වූ, සිත හා අත්වැල් නො හරණා වූ, සිතට වැද පිටත නො වන්නා වූ බුදුන් -පෙ- යුතු.

සඳහිරුදෙදෙනා හා සියලු තරු අහස හැරැ අනික් තැනෙක්හි නො පෙණෙන්නා සේ[1], තිමිතිමිංගල තිමිරපිංගලආනන්‍දඅධ්‍යාරොහාදි මහාමත්ස්‍යයන් මහාසමුද්‍රය හැරැ අනික් තැනෙක්හි නො පෙණෙන්නා සේ,මෙරුයුගන්‍ධරඊශධරකරවිකසුදර්‍ශන නෙමින්‍ධරවිනතක අශ්වකර්‍ණ-හිමාලයචක්‍රවාටපර්වතය යන සියලු පර්වතයන් මහපොළොවැ මුත් අනික් තැනෙක්හි නො පිහිටන්නා සේ, පරසතු මදරා ආදි වූ දිවරුක් දෙව්ලොවෙහි මුත් අනික් තැනෙක්හි නොවන්නා සේ, යෙළසියක්යොදුන් ගරුඩරාජයන් හිඹුල්රුක් හැරැ අනික් තැනෙක්හි නො ලග්නා සේ, මහනිධාන මහපොළොවැ මුත් අනික් තැනෙක්හි නො තබන්නා සේ,

1. නොයන්නාවූ.

Non-Commercial Distribution

අනික් තැනෙක්හි නො පැනී ශිඛාග්‍රයෙහි සිටැ ශ්‍රීපාදය දක්වා තන්හි තන්හි සැරැහී සිටි දෙතිස්මහාපුරුෂලක්‍ෂණයෙන්, පිපී වැනී ගිය මලින් හොබනා පරසතුරුක සේ, සත්විසිමහනකත් උද ලද ආකාශය සේ, සත්රුවන් ඉතිරැ ගිය මහමුහුද සේ, බබලන රූ ඇති බුදුන් -පෙ- යුතු.

**168.**

හේ කෙසේ යැ? යත්:- සෙසුසතුන් බිමැ පය ඕනා කලැ ආදි කොට අක්පත්ල හෝ බිමැ එබෙයි. විළුම හෝ බිමැ එබෙයි. දෙඇළයෙන් එක්ඇළයක් හෝ බිමැ එබෙයි. පත්ල මැද හෝ සිදුරු ඇති වෙයි. පත්ල ඔසොවා ගන්නා කල්හිදු එසේ මැ එක්ප්‍රදෙශයෙක් නැහෙයි. මෙසේ නො වැ ස්වර්‍ණ පාදුකාදෙකක් සේ සමයෙහි එබී සමයෙහි නැහෙන්නා වූ, සතුරු මිතුරුමැදහතුන් කෙරෙහි සම වැ එබෙන ඔවුන්ගේ සිතට සලකුණු වූ, මනා වැ පිහිටන්නා වූ ශ්‍රීපාද ඇති බැවින් පළමුවන මහාපුරුෂලක්‍ෂණයෙන් යුක්ත වූ බුදුන් -පෙ- යුතු.

**169.**

තව ද, සදෙවසමාරසබ්‍රහ්මලොක එකහෙළා සිටැ පවත්වම්හයි සිතා ද පවත්වා ගත නො හැක්කා වූ ධර්‍මචක්‍රය පවත්වන බවට ලාලූ සලකුණක් වැනි දසදහසක් දැවියෙන් යුක්ත වූ නිම්වළල්ලෙන් යුක්ත වූ, සිසාරා සිටැ බලනුවන්ට පතුල්මැද තේරිතේරී පැණෙන නාභි ඇති, වට රෙඛා ඇති, නාභිමුඛය සිසාරා සිටි වට ඇති, මැදින් පැණෙන වට රෙඛා ඇති දුරට මැ පෙණෙන්නා වූ දැවි හා දැවියෙහි වට රෙඛා හා නිම්වළලු හා නෙමිමාණික්‍ය ඇති සක්ලකුණෙන් හොබනා වූ; තව ද, ඒ සක්ලකුණු සිසාරා සිටි ස්වස්තික යැ, සිරිවස යැ, නන්‍ද්‍යාවර්‍ත යැ, සෞවස්තික යැ, අවතංසක යැ, වර්‍ධමානක යැ, භද්‍රපීඨ යැ, ප්‍රාසාද යැ, තොරණ යැ, ශ්වෙතච්ඡත්‍ර යැ, මහුල්කඩුව යැ, මිණි තල්වැට යැ, මොනරපිල්කලඹ යැ, චාමර යැ නලල්පට යැ, මිණිරුවනැ, දසමන්මල්දම යැ, නීලොත්පල යැ, රක්තොත්පල යැ, රක්තපද්ම යැ, ශ්වෙතපද්ම යැ, පූර්‍ණකලස යැ, පූර්‍ණපාත්‍ර යැ, සප්තසාගර යැ, චක්‍රවාටපර්‍වත යැ, හිමාලයපර්‍වත යැ, මහාමෙරු පර්‍වත යැ, හිරුමඬුලු යැ, සඳමඬුලු යැ, දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතරමහාද්වීප යැ, පිරිස්සහිත වූ සත්රුවනින් හෙබි චක්‍රවර්ති යැ, දක්‍ෂිණාවර්‍ත වූ ධවලසංඛ යැ, ස්වර්‍ණමත්ස්‍ය යුගල යැ, චක්‍රායුධය පඤ්චමහාගඞ්ගා යැ, සප්තකුලපර්‍වත යැ, සදත්දහ තළා යැ, ගරුඩරාජ යැ, ශිශුමාර යැ, ධ්වජ යැ, පතාක යැ, රන් සිවිගේ යැ, ස්වර්‍ණවාලව්‍යජන යැ, කෛලාශපර්‍වත යැ, සිංහරාජ යැ, ව්‍යාඝ්‍රරාජ යැ, වලාහකඅශ්වරාජ යැ, උපොසථහස්තිරාජ යැ, වාසුකි නාගරාජ යැ, හංසරාජ යැ,

Non-Commercial Distribution

වෘෂභරාජ යැ, ඓරාවණ නම් හස්ති රාජ යැ, ස්වර්ණමණිමකරමත්ස්‍ය යැ, සත්රුවන්මහනෞකාව යැ, වසු පස්සෙහි ලූ දෙන්නු යැ, කින්නරී යැ, කිම්පුරුෂ යැ, කුරවී කෙවිල්ලෝ යැ, මයූරරාජ යැ, ක්‍රෞඤ්චරාජ යැ, චක්‍රවාකරාජ යැ, ජීවඤ්ජීවක නම් පක්ෂිරාජ යැ, සදිව්‍යලොක යැ, සොළොස්බඹ තල යැ යන මෙතෙක් ලක්‍ෂණ තාක් යටපත්ලෙහි පැණෙන හෙයින් මුළුලොව තමන් සරණ වන්බව හඟවන්නාක් වැනි වූ ශක්‍රයා හිස තබා සැතපෙන බිස්සක් වැනි වූ, සෝධා හළ පැන් මහබඹහට අභිෂෙකජල කළා වූ ශ්‍රීපාද ඇතිබැවින් දෙවන මහාපුරුෂලක්‍ෂණයෙන් හෙබැවී සිටියා වූ බුදුන් -පෙ- යුතු.

## 170-171

සෙස්සවුන්ගේ පතුල් දික් වැ විළුමෙහි සිහින්කකුල් පිහිටයි. එසේ නො වැ පත්ල සම සතරකොටසක් කළ කල්හි දෙකොටසක් පතුල වෙයි. තුන්වන කොටස සිහින්කකුල් වෙයි. සතරවන කොටස වට කොට තුබූ රත්පලස්පිඩක් සේ යහපත් වූ විළුම් වෙයි. එසේ යහපත් වූ විළුම් ඇතිබැවින් තුන්වන මහාපුරුෂ ලක්‍ෂණයෙන් යුක්ත වූ බුදුන් -පෙ- යුතු.

සෙසු හැම සත්ත්වයන් ඇතැම් ඇඟිල්ලෙක් දික් වෙයි. ඇතැම් ඇඟිල්ලෙක් ලුහුඬු වෙයි. එසේ නො වැ මුලින් දළ වැ අගින් සිහින් වැ නියඝ්‍රාසතෛලයෙන් හනා වට කළ සිරියෙල් වැටියක් සේ හොබනා වූ දික් වූ ඇඟිලි ඇති බැවින් සතරවන මහාපුරුෂලක්‍ෂණයෙන් යුක්ත වූ බුදුන් -පෙ- යුතු.

## 172.

තව ද, සෙස්සවුන්ගේ අතුල්පතුල් දැඩි වැ තිබෙයි. සර්‍වඥයන් වහන්සේ ගේ අතුල්පතුල් වනාහි පහන් වූ ගිතෙල හනා තුබූ සියක් වට පෙළු පුළුන් සේ මොළොක් වෙයි. රජ වැ තමන්ගේ රාජ්‍යය ගන්ට එන සතුරුරජහට කඩුව ගෙණැ රළු නො කළ, තෙමිය කුමාර වැ සසරට බා සොළොස්හවුරුද්දක් බිමැ නො ඔබා මොළොක් වැ තුබූ, ඒ අතුල්පතුල්හි මෙළෙක දත් පානාක් බඳු වැ මොළොක් වැ තුබූ ඒ අතුල්පතුල්හි මොළොක කවරෙක් කියානිමවන්නේ ද? එසේ මොලොක් වූ එ මැ විට මැ උපන් කුමාරයක්හුගේ අතුල්පතුල් සේ හැමකල මැ තරුණ වැ තිබෙන්නා වූ අතුල්පතුල් ඇති බැවින් පස්වන -පෙ- යුතු.

Non-Commercial Distribution

## 173.

මෙ ලොවැ සමහරකෙනෙකුන්ගේ පෙණඅත් හෝ වෙයි. පෙණපා හෝ වෙයි සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීහස්තයෙහි සතර ඇඟිල්ල දෙවදත්ත යැ, ධනපාල යැ, අංගුලිමාල යැ, රාහුල යැ යන මේ සතරදෙනා කෙරෙහි ඔවුන්වහන්සේගේ සිත සම වැ තිබෙන්නා සේ සම වැ තිබෙන්නේ යැ. ශ්‍රීපාදයෙහි ඇඟිලි පස පඤ්චබුද්ධකෘත්‍යය සම වැ තිබෙන්නා සේ සම වැ තිබෙන්නේ යැ. ඒ ශ්‍රීහස්තයෙහි හා ඒ ශ්‍රීපාදයෙහි ඇඟිලි දක්‍ෂ වූ වඩුවකු සම කොට ගා යොද තබාලූ දල්කවුළුවක් සේ තිබෙන්නේ යැ. මෙසේ යුග්ම වූ[1] හස්තපාද ඇති බැවින් සවන -පෙ- යුතු.

## 174-175

අනුන්ගේ බොලට පිටිපස වෙයි. එසේ හෙයින් ඔවුන්ගේ පා ඇණපට සේ දැඩි වෙයි. කැමැති ලෙස නො පෙරළෙයි. යන කලට පත්ල නො පෙණෙයි. සර්‍වඥයන්වහන්සේගේ බොලට උඩ[2] නැඟී සිටියේ යැ. වඩනා කල්හි පෙකෙණියෙන් මත්ත යන නැවැ නො සැලී සිටි රන්පිළිමයක් සේ නිශ්චල වෙයි. පෙකෙණියෙන් පාත චලිත වන්නේයි. යන ඇතුන්ගේ පත්ල පිටිපස්සෙහි සිටියවුන්ට පැණෙන්නා සේ වඩනා කල්හි සර්‍වඥයන් වහන්සේගේ යට පත්ල සතරදිගැ සිටියවුන්ට මැ පැණෙයි. මෙසේ මත්තට නැඟී පිහිටියා වූ බොලට ඇති හෙයින් සත්වන -පෙ- යුතු.

හාත්පස සම වැ පිරී සිටි මසින් වැසී වට වූ හැල්ගොබක් සේ ක්‍රමයෙන් පිරිහුන් එණිමෘගයන්ගේ ජඞ්ඝා ඇති වන බැවින් අටවන -පෙ- යුතු.

## 176. 177. 178

තව ද, සෙස්සෝ කුදු හෝ වෙති. කුරු හෝ වෙති. එහි කුදුන්ගේ පෙකෙණියෙන් මත්ත පිරිහුන් නො වෙයි. කුරුන්ගේ පෙකෙණියෙන් පාත පිරිහුන් නො වෙයි. එසේ හෙයින් ඔවුන් නො නැමී සිටැ තමන් අතින් තමන් දෙදණ පිරිමැදියැ නො හෙති. සර්‍වඥයන්වහන්සේගේ වූ කලී පූර්‍වකායයත් අධඃකායයත් දෙක මැ පිරී සම වැ තිබෙන්නේ ය. එසේ හෙයින් ඉඳුරා සිටැ නො නැමී දෙ අතින් දෙදණ පිරිමැද වදරණසේක. මෙසේ නවවන -පෙ- යුතු.

තව ද, සෙස්සවුන්ගේ පුරුෂව්‍යඤ්ජනය පිළියෙන් නො වැසුවහොත් පෙණී තිබෙන්නේ යැ. එසේ නො වැ සර්‍වඥයන් වහන්සේ සසරපමණින්

---

1. සූක්‍ෂම. 2. උසැ.

Non-Commercial Distribution

පවට බා හැකිලැ විසූපරිද්දට සලකුණුවැ කොෂ ගර්භය ඇතුළෙහි සැඟවී සිටිනා පුරුෂව්‍යඤ්ජන ඇති බැවින් දසවන -පෙ- යුතු.

තව ද, තමන්වහන්සේගේ ශරීරයෙහි තලඇටක් සා පමණ තැනින් නැගි රශ්මියෙන් සියලු සක්වළ අඳුරු දුරු කොට පියන පමණ රන්වන් පැහැ ඇති සේක. ඔප් නැඟු පිළිමයක් සේ පහන් වූ සිවිපැහැ ඇති සේක. ගිරා වැ මොනර වැ මුව වැ උපන්කලැ පවා ඔප් නැඟු රන්පිඩැල්ලෙකැ පැහැ සේ රන්වන්වූ, බුදු වැ සිටැ රන්වන් වනබව කවර විස්මයෙක් ද? එසේ හෙයින් මේ එකොළොස්වන -පෙ- යුතු.

## 179-180

තව ද, බුදුන්ගේ ශරීරය ඉතා සියුම් වූ ඡවි ඇත්තේ යැ. එසේ සියුම් වූ ඡවි ඇති හෙයින් ඔවුන් වහන්සේගේ සිත ක්ලෙශයන් නො ඇලෙන්නා සේ, ඔවුන්වහන්සේගේ ශරීරයෙහි ධූලියෙක් දල්ලෙක් නො ඇලෙන්නේ ය. එසේ හෙයින් සියුම් වූ ඡවි ඇති වන බැවින් මෙසේ දෙළොස්වන-පෙ- යුතු.

සෙස්සවුන්ගේ එකිඑකී රොමකූපයෙහි රොම දෙක තුණ වන්නේ යැ. සර්වඥයන් වහන්සේගේ වූ කලී එකිඑකී රොමකූපයෙහි එකිඑකී රොමය මුත් දෙක තුණ නො වන්නේ යැ. එක තැනෙක දෙබසක් නො කියන, එක ලෙහි විෂම වූ දෙසිතක් නැති, සතුරන් මිතුරන් එක ඇසින් බලන, ඒ සර්වඥයන්වහන්සේගේ එක රොමකූපයෙහි එක රොමය වනබව යුක්ත මැ වන්නේ යැ, එසේ හෙයින් මෙසේ වූ තෙළෙස්වන -පෙ- යුතු.

## 181.

තව ද, සර්වඥයන්වහන්සේගේ ශරීරයෙහි රොමයෝ අඳුන් සේ ඉතා නිල් වූ ප්‍රභා ඇත්තාහ. දකුණට සිසැරී සිටිනාහ. ඒ සර්වඥයන්වහන්සේ සසර පමණින් යාචකයන් දුටුකල්හි කර නො බහා උඩුමුව වැ සිටින පරිදි පානා සේ, ඒ රොමයෝ උඩට නැඟී සිටිනාහ. එසේ හෙයින් මෙසේ තුදුස්වන -පෙ- යුතු.

## 182.

සෙසු සත්ත්වයෝ කරින් හෝ වක් වෙති. උකුළෙන් හෝ වක් වෙති. දණින් හෝ වක් වෙති. එක් ඇළයකින් හෝ වක් වෙති. සමහර කෙනෙක් නකත් ගණන්නා සේ උඩ බලති. සමහර කෙනෙක් ලේමස් මඳ බැවින් හුළං සේ වෙවුලන ශරීර ඇත්තාහ. සර්වඥයන්වහන්සේගේ ශරීරය වූ කලී එසේ නො වැ දෙවියන්ගේ නුවර සදලු මහරන්තොරණක්

Non-Commercial Distribution

සේ නො වක් වැ නො හැද වැ, ඒ සර්‍වඥයන්වහන්සේගේ ඍජු වූ ඒ සිත සේ, ඍජු වැ තිබෙන හෙයින් මේ පසළොස්වන -පෙ- යුතු.

## 183.

තව ද, සෙස්සන්ගේ අත්පිට හා පාපිට නහරවැල් පෙණෙයි. දෙදසරුවෙහි ඇට පෙණෙයි. එසේ හෙයින් සත්ත්වයෝ මනුෂ්‍ය ප්‍රෙතයන් සේ පැණෙති. සර්‍වඥයන්වහන්සේගේ වූ කලී දෙඅත් පිට යැ, දෙපාපිට යැ, දසරුව මත්තෙහි යැ, පිටිකර යැ, යන මේ සත්තැනැ මාංසය ඉතා සම වැ පිරී හිඳී තිබෙන්නේ යැ. එසේ හෙයින් මෙ කී සත්තැනැ මැ නහර ඇට ඉපිල නො තිබෙන්නේ යැ. මෙ සේ මෙ සොළොස්වන -පෙ- යුතු.

## 184-185

තව ද, සර්‍වඥයන්වහන්සේගේ ශරීරය පූර්‍වකායය හා අධඃකායය හා සිංහයකුගේ පූර්‍වකායය සේ පිරී හිඳී තිබෙන්නේ යැ. සිංහයාගේ වූ කලී පූර්‍වකාය මැ පිරී හිඳී තිබෙන බව මුත් අධඃකායය පිරී හිඳී නො තිබෙන්නේ යැ. සම්‍යක් සම්බුද්ධයන්වහන්සේගේ පූර්‍වකායය හා අධඃකායය හා දෙක මැ සිංහයාගේ පිරී හිඳී තිබෙන පූර්‍වකායය සේ පිරී හිඳී තිබෙන්නේ යැ. එසේ හෙයින් මේ සතළොස්වන -පෙ- යුතු.

සෙස්සවුන්ගේ පිටමැද වළ වෙයි. පිට දෙභාගය වෙනවෙන පෙණෙයි. සර්‍වඥයන්වහන්සේගේ පිට වූ කලී එසේ නො වැ මාංශපටලයෙන් කඳට පහරවා සම වැ නැඟී රන්පෝරුවක් සේ පිට සම කොට ගෙණැ ගියේ. වෛත්‍රයෂ්ටිකපිජාතකයෙහි එතෙක් වඳුරන් මැඩැ සම කළ පිට විපාකයෙන් දූන් මෙපිට මෙසේ සම වන බව කවර විස්මයෙක් ද? එසේ හෙයින් මේ අටළොස්වන -පෙ- යුතු.

## 186-187

තව ද, සෙස්සන්ගේ බඹය අඩු වැ ශරීරය හෝ දික් වන්නේ යැ. නැවැතැ බඹය හෝ දික් වැ ශරීරය ලුහුඬු වන්නේ යැ. ඒ සර්‍වඥයන්වහන්සේගේ බඹයෙහි දිගත් ශරීරයෙහි දිගත් දෙක මැ සම වූ පමණ ඇති වන්නේ යැ. ඒ සර්‍වඥයන් වහන්සේ වදළ දෙය හා වන විපාක හා දෙක සම වැ පවත්නා සේ බඹයෙහි පමණත් ශරීරයෙහි පමණත් අඩුවැඩි නැති වැ සම වැ පවත්නා හෙයින් මේ දසනවවන -පෙ- යුතු.

තව ද, ඇතැම් කෙනකුන්ගේ, කොකුන්ගේ කර සේ, දික් වූ කර ඇති වන්නේ යැ. සමහර කෙනකුන්ගේ වක් වූ පළල් වූ කර ඇති

Non-Commercial Distribution

වන්නේ යැ. බණන කලැ නහරවැල් පෙණෙන්නේ යැ. සර්‍වඥයන්-වහන්සේගේ කර වූ කලී රන් කලසෙකැ කරක් සේ ඉතා වටමට වැ තිබෙන්නේ යැ. බසක් බැණැ වදරණ වේලෙහි නහර නො පෙණෙන්නේ යැ. සතුරු මිතුරු දෙපක්‍ෂයෙහි මැ සමවට වූ සිත් ඇති ඒ සර්‍වඥයන් වහන්සේගේ සමවට වූ කර ඇති වනබව ඉතා සුදුසු මැ යැ. එසේ හෙයින් මේ විසිවන -පෙ- යුතු.

## 188.

තව ද, සෙස්සන් රසනහර උඩ බලා නො තිබෙන්නේ යැ. බුදුන්ගේ වූ කලී සත්සියක් රසනහර උඩගු වැ ඇතුළෙහි පිහිටා තිබෙන්නේ යැ. එසේ හෙයින් තලඇටක් පමණ ආහාරය කුදු දිවිඅගැ තබා වදළ හොත් සර්‍වාඞ්ගයෙහි මැ රස පැතිරැ යන්නේ යැ. තමන්වහන්සේගේ ශරීරය තෙලියතෙහි ලා පෙළා ලෙහෙ දී සත්ත්‍වයන්ගේ ශරීරය පිණවූ සර්‍වඥයන්වහන්සේගේ මේ රසනහර මෙලෙස උඩුමුව වැ තිබෙන බව ආශ්චර්‍ය්‍යයෙක් නො වන්නේ යැ. මෙසේ හෙයින් එක්විසිවන -පෙ- යුතු.

## 189 & 190

තව ද, සර්‍වඥයන්වහන්සේගේ දෙහනුව සිංහයක්හුගේ යටහනුව මෙන් පිරී තිබෙන්නේ යැ. සිංහයාගේ උඩහනුව නො පිරී තිබෙන්නේ යැ. සර්‍වඥයන්වහන්සේගේ දෙහනුව මැ සිංහයාගේ පිරී තිබෙන යටහනුව සේ පිරී තිබෙන්නේ යැ. සසර පමණින් හිරි ඔතප් යන මේ දෙදෙනා තමන්ගේ සන්තානයෙහි පුරා වැඩූ සර්‍වඥයන්වහන්සේගේ දෙහනුව පිරී තිබෙන බව යෙදේ මැ යැ. එසේ හෙයින් දෙවිසිවන -පෙ- යුතු.

තව ද, සෙස්සන්ගේ මුඛයෙහි දත් දෙතිසක් වන්නේ යැ. සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීමුඛයෙහි උඩහනුවෙහි විසිදතක් හා යටහනුවෙහි විසිදතක් හා මෙසේ සතළිස් දතෙක් වන්නේ යැ. තමන්වහන්සේ සදත් වැ උපන්කල්හි දළ කපකපා, සංඛපාල නාග වැ උපන් කල්හි දළ බිඳුවබිඳුවා හැරැ දුන්, දන් බුදු වූ කලැ එතෙකින් හළුයේ වැටී හිනැයි[1] තුබූ දත් හෙයින් ඒ දත යහපත බසට සිතට විෂය නො වන්නේ යැ. එසේ හෙයින් මේ තෙවිසිවන -පෙ- යුතු.

## 191, 192 & 193

සෙස්සන් දත් අඩුවැඩි වන්නේ යැ. සර්‍වඥයන්වහන්සේගේ දත් වූ කලී සම වැ තිබෙන්නේ යැ. ශ්වෙතහස්තිජාතකයෙහි යාචකයන්හට

---

1. හළුසේ වැටී හිනැ තුබූ.

Non-Commercial Distribution

අඩුවැඩි නො කොට සම කොට කපා දුන් දත් සම වන බව කවර විස්මයෙක් ද? මෙසේ සූවිසිවන -පෙ- යුතු.

තව ද, සෙස්සන්ගේ දත් සිදුරු ඇති වැ තිබෙන්නේ යැ. ඒ සර්‍වඥයන්වහන්සේගේ දත් වූ කලී සසර පමණින් උන් වහන්සේගේ ගුණයෙහි සිදුරු නැත්තා සේ සිදුරු නැති වැ තිබෙන්නේ යැ. එසේ හෙයින් මේ පස්විසිවන -පෙ- යුතු.

තව ද, සර්‍වඥයන්වහන්සේගේ සතරදළදවහන්සේ ඔවුන් වහන්සේගේ පරිශුද්ධ වූ සතර සම්පජඤ්ඤය සේ ඉතා පරිශුද්ධ වැ තිබෙන්නේ යැ. එසේ හෙයින් මේ සවිසිවන -පෙ- යුතු.

## 194

තව ද, සෙස්සන්ගේ දිව් පටු වැ ලුහුඩු වැ තිබෙයි. සර්‍වඥයන් වහන්සේගේ දිව මොළොක් වැ දික් වැ පළල් වැ යහපත් පැහැ ඇති වැ තිබෙන්නේ යැ. බුදුහු ඒ ලක්‍ෂණය නිශ්චය කරණ පිණිස තමන්වහන්සේගේ ලක්‍ෂණ පරීක්‍ෂා කරන්නට ආවන්ගේ සැක හරණ පිණිස මොළොක් වන බැවින් දිව කෙළින් හිද්දක්[1] සේ වටා ගෙණැ දෙනාසිකාච්ඡිද්‍රය පිරිමදිති. දික් වන බැවින් දෙකන්සිදුර පිරිමදිති. දික් වැ පළල් වන බැවින් කෙශාන්තය දක්වා සියලු නලළ ඒ දිවින් වසාගණිති. මෙසේ වූ බුදුහු දිව මොළොක්පරිදි දික්පරිදි පළල්පරිදි තමන් කෙරෙහි සැක ඇත්තවුන්ට ප්‍රකාශ කෙරෙමින් ඔවුන්ගේ සැක හරිති. මෙසේ ලක්‍ෂණ තුණින් සම්පන්න වූ මෙතෙක් දහම්බිජුවට අතුරණ පිණිස විදහුවාක් බඳු වැ දික් වූ පළල් වූ මොළොක් වූ දිව් ඇති බැවින් මේ සත්විසිවන බුදුන් -පෙ- යුතු.

## 195.

තව ද, සෙස්සෝ බිඳී සිඳී තිබෙන ස්වර ඇත්තාහ. සමහරු කාකස්වර ඇති වන්නාහ. සර්‍වඥයන්වහන්සේගේ ස්වරය වූ කලි බ්‍රහ්මයාගේ ස්වරය සේ ඉතා මනොඥ යැ. පිත්සෙම්ආදීන් විසින් බාධාවක් නැති වැ නාභියෙහි පටන් ගෙණැ ශුද්ධ වැ නැඟෙන්නේ යැ. නැවැතැ පුරවිකෙවිල්ලන්ගේ හඬක් සේ මධුර වන්නේ යැ. ඒ පුරවිකෙවිල්ලන් හැඬූකල්හි ගොචර කන්නා වූ නොයෙක් සිවුපාවෝ තමන් මුඛයෙන් ගත් තණ කබල කාත්[2] නො පියා හෙළාත් නො පියා ඒ හඬ අසා සිටිති. නොයෙක් චණ්ඩසත්ත්වයෝ මුවන් ලුහුබැඳ ගෙණැ යෙමින් සිට ඒ හඬ ඇසූ කලැ නගා ගත් පය බහ නො තබා සිටැ

1. හිදක්　　2. තාක්

Non-Commercial Distribution

අසති. ඒ හඬ, චණ්ඩසත්ත්වයන් කෙරෙහි ගත් භයින් පලන, මුවෝ මරණභය හැරැ පියා සිටැ අසති. අහසින් යන පක්ෂීහු තමන් යන ගමන් හැරැ පියා ආකාශයෙහි පියා පහරා ගෙණැ සිටැ අසති. දියෙහි වැදූ හෝනා මස්සු තමන්ගේ කන්පත් වරල් පත් නො සොල්වා හෙවැ අසති. මෙසේ මධුර වූ පුරවි කෙවිල්ලන්ගේ ශබ්දයට සියක් දියුණා දහසක් දියුණා සර්‍වඥයන් වහන්සේගේ ස්වරය මැ මධුර යැ. පූජකබ්‍රාහ්මණයාට ගැති කොට දෙන පිණිස වල වැදූ ගිය දරුවන්ට හඬ ගැහූ, තව ද, සියලු සත්ත්වයන්ට ප්‍රිය වූ තෙපුල් කී ඒ සර්‍වඥයන්වහන්සේගේ ශබ්දය මෙලෙස මධුර වනබව පෙළහරෙක් නො වන්නේ යැ. එසේ හෙයින් මේ අටවිසිවන බුදුන් -පෙ- යුතු.

## 196.

තව ද, ඒ සර්‍වඥයන්වහන්සේගේ ඇස් නිල් වුව මනා තන්හි නිල් වෙයි. රන්වන් වුව මනා තැන රන්වණැ. රත් වුව මනා තැන රත යැ. සුදු වුව මනා තැන සුදු යැ. කළු වුව මනා තැන කළු යැ. දියමෙරලියමල්, කිණිහිරිමල්, බඳුවදමල්, හෙලසමන්මල්[1] කසමල් තැනැ තැනැ තබා පුදූලූ යහපත් වූ මලසුන්සහළක් සේ මේ පස්පැහැයෙන් හොබනේ යැ. සසර පමණින් යාචකයන්ගේ පෙරමහ බලබලා දල්වා ගෙණැ හිඳ නො වහළ, ධර්‍මපාල කුමාර වැ ක්ෂාන්තිවාදීතාපස වැ ඒ සා මහත් කර්‍මකටුල් කරන්නවුන් මහත් වූ මෛත්‍රියෙන් බැලූ ඇස්සහළෙහි යහපත කියන්නා තබා කවරෙක් නම් සිතිනුත් සිතන්නට පොහොසත් වන්නේ ද? මෙසේ පස්පැ දිස්නා පෙළහර වූ ඇස් ඇති බැවින් මේ විසිනවවන බුදුන් -පෙ- යුතු.

## 197.

තව ද, බුදුන්ගේ ඇස්ගුළ[2] එවිගස උපන් රතුවස්සකුගේ ඇස්ගුළක් සේ මනොඥ වන්නේ යැ. සෙස්සන්ගේ ඇස්ගුළ පිටත නෙරී හෝ තිබෙන්නේ යැ. ඇතුළට වැදූ පියා හෝ තිබෙන්නේ යැ. සර්‍වඥයන්-වහන්සේගේ ඇස්ගුළ වූ කලි දෙවැ මැදූ තබාලූ ඉන්ද්‍රනීලමිණිගුළු දෙකක් සේ මොළොක් වැ සිනිඳු වැ නිල් වැ සියුම් වැ තිබෙන්නේ යැ. දෙඇස දුන් එකජාතියෙහි මිනිස් ඇස් ඉක්මුනු ඇස් ලත්සේක. එසේ වූ මැ ඇස් අනන්ත වූ මැ තරු පරයා දුන්සේක. ඒ පිණින් ඒ ඇස් මෙසේ පෙළහරවීම කවර නම් ආශ්චර්‍යයෙක් ද? එසේ හෙයින් මේ තිස්වන බුදුන් -පෙ- යුතු.

---

1. හෙලසුන්මල්. 2. ඇස්සහළ & ඇස්යුගල.

Non-Commercial Distribution

## 198.

තව ද, සර්වඥයන්වහන්සේගේ දෙබැම අතුරෙහි උන් වහන්සේගේ රූප නැමැති සාගරයෙහි දරණ වටා හොත් හැලිනාගරාජයක්හු බඳු වූ, නලල් නැමැති රන්මෙරගල්භිත්තියෙහි පූර්ණචන්ද්‍රමණ්ඩලයක් බඳු වූ ඒ රූප නැමැති උත්තරසාගරයෙහි දක්ෂිණාවර්ත සකක් බඳු වූ, (රූප නැමැති උත්තරසාගරයෙහි)* තුඩු නැමැති පියුම් ඇති, ඇස් නැමැති මහනෙල්මල් ඇති, බැම නැමැති බමරවැල ඇති, මුහුණු නැමැති විලැ රාජ හංසයකු බඳු වැ සුදු වූ, පුළුන් සේ මොළොක් වූ ඌර්ණරෝම ධාතුවක් ඇති. රෝමය කෙළවර අල්වා ගෙණැ අදනාලද්දහු අතින් සමහරෙක්හි පමණ දිග වන්නා වූ අත හැරපූකල්හි දක්ෂිණාවර්ත වැ සිසැරී උඩු බලා සිටි අග් ඇති වැ තිබෙන්නා වූ, රන් පෝරුවක් මැද තුබූ රිදීබුබුළක් සේ ඒ රන්වන් වූ නලල් මැද තුබූ ඌර්ණරෝමධාතු ඇති වන බැවින් මේ එක්තිස්වන බුදුන් -පෙ- යුතු.

## 199.

තව ද, සර්වඥයන්වහන්සේගේ දකුණුකන්සිළින් මස් පටලයෙක් සියලු නලළ ගෙණැ වම්කන්සිළ පැහැර රජකු නලළැ බඳ රන් පටක් සේ දිලිහිදිලිහී තිබෙයි. අනන්තජාතියෙහි බුදු-පසේබුදු-මහරහතුන් දුටු කල්හි වැඳ බිමැ ගහා නො විඩා වූ නළල මෙසේ වන බව ඉතා සුදුසු මැ යැ. නොහොත් බුදුන් වහන්සේගේ සිරස පිරිහුන් දියබුබුළක් සේ සම වැ වට වැ තිබෙන්නේ යැ. අනෙකජාතියෙහි මැණික්වොටුනු තබා පියා ආරාධනා කළවුන්ට ගැතිමෙහෙ කරණ සමයෙහි දර දිය ඇද දුක් වූන් හිස දූන් මෙසේ වනබව කවර විස්මයෙක් ද? මෙසේ හෙයින් දෙතිස් වන බුදුන් -පෙ- යුතු.

## 200.

තව ද පිරී තිබෙන්නා වූ ඇහිලි ඇතිබව යැ, තව ද, ක්‍රමයෙන් සිහින් වැ ගිය ඇහිලි ඇතිබව යැ, තව ද, වට වූ ඇහිලි ඇතිබව යැ, තව ද, රත් වැ තිබෙන්නා වූ නිය ඇතිබව යැ, තව ද, උස් වැ තිබෙන්නා වූ නිය ඇතිබව යැ, තව ද සිනිඳු වූ නිය ඇතිබව යැ, තව ද, සැඟවී තිබෙන්නා වූ බොලට ඇති බව යැ, තව ද, වළගොඩ නැති වැ සම වැ තිබෙන්නා වූ ශ්‍රීපාද ඇතිබව යැ, තව ද, හස්තිරාජයකුට බඳු වූ ගමන් ඇතිබව යැ, තව ද, හංසරාජයකුට බඳු වූ ගමන් ඇතිබව යැ, තව ද, සිංහ රාජයකුට බඳු වූ ගමන් ඇතිබව යැ, තව ද, වෘෂභරාජයකුට බඳු වූ ගමන් ඇතිබව යැ, තව ද, දක්ෂිණාවර්ත වූ ගමන් ඇතිබව යැ, තව ද, හාත්පසින් හොබනා වූ දණමඩුලු ඇතිබව යැ, තව ද, පරිපූර්ණ වැ තිබෙන්නා වූ පුරුෂව්‍යඤ්ජන ඇතිබව යැ, තව

Non-Commercial Distribution

ද, සිදුරු නැත්තා වූ පෙකෙණි ඇතිබව යැ, තව ද, ගැඹුරු වැ තිබෙන්නා වූ පෙකෙණි ඇතිබව යැ, තව ද, දකුණුදිශාවට ඇඹැරී තිබෙන්නා වූ පෙකෙණි ඇතිබව යැ, තව ද, හස්ති රාජයක්හුගේ අතක් වැනි වූ අත් හා කළවා ඇතිබව යැ, තව ද, වෙන වෙන තේරී මනා වැ තිබෙන්නා වූ ශරීරාවයව ඇතිබව යැ, තව ද, ක්‍රමයෙන් පිරී යහපත් වැ තිබෙන්නා වූ ශරීරාවයව ඇතිබව යැ, තව ද, මටසිලුටු වැ තිබෙන්නා වූ ශරීර ඇතිබව යැ, තව ද, උස් නො වැ මිටි නො වැ තිබෙන්නා වූ ශරීර ඇතිබව යැ, නොහැකිළ තිබෙන්නා වූ ශරීර ඇති බව යැ, තව ද, තලකළුවක් මාත්‍ර කැලලක් නැත්තා වූ ශරීර ඇතිබව යැ, තවද, ක්‍රමයෙන් යහපත් වැ තිබෙන්නා වූ ශරීර ඇතිබව යැ, තව ද, විශුද්ධ වූ ශරීර ඇතිබව යැ, තව ද, කෙළදහසක් පමණ ඇතුන්ට බල ඇතිබව යැ, තව ද, උස් වැ තිබෙන්නා වූ නාසා ඇතිබව යැ, තව ද, රත් වැ තිබෙන්නා වූ විදුරුමස් ඇතිබව යැ, තව ද, කොඳකැකුළු සේ ඉතා සුදු වැ තිබෙන්නා වූ දත් ඇතිබව යැ, තව ද, ඉතා සිනිඳු වැ තිබෙන්නා වූ දත් ඇතිබව යැ, තව ද, විශුද්ධ වැ තිබෙන්නා වූ ඉන්ද්‍රියයන් ඇතිබව යැ, තව ද, වට වැ තිබෙන්නා වූ සතර දළද වහන්සේ ඇති බව යැ, තව ද, රත් වැ තිබෙන්නා වූ ශ්‍රී මුඛ ඇතිබව යැ, තවද හුදක් වට නො වැ මඳක් දික් වැ තිබෙන්නා වූ මුහුණු ඇතිබව යැ, තව ද, ඉතා සිනිඳු වූ ගැඹුරු වූ අතුල්රේඛා ඇතිබව යැ, තව ද, දික් වැ තිබෙන්නාවූ රේඛා ඇතිබව යැ, තව ද, නොහැද වැ තිබෙන්නා වූ රේඛා ඇතිබව යැ, තව ද, සරත්කල්හි හිරුමඬුල්ලක් බඳු වූ ශරීරප්‍රභා ඇතිබව යැ, තව ද, දික් වූ මනා වූ පිරී තිබෙන්නා වූ හනු ඇතිබව යැ, තව ද, දික් වැ පළල් වැ තිබෙන්නාවූ ඇස් ඇතිබව යැ, තව ද, පස් පැහැ දිස්නා ඇස් ඇතිබව යැ, තව ද, මඳක් අගින් නැමුනා වූ ඇස්පිය ඇතිබව යැ, තව ද, මොළොක් වූ තුනී වූ රත් වූ දිව් ඇතිබව යැ, තව ද, දික් වූ මනා වූ කන් ඇතිබව යැ, තව ද, ගැට නැත්තා වූ සිරස් ඇතිබව යැ, තව ද, උස් නො වැ සමප්‍රමාණ වැ හැසී තිබෙන්නා වූ සිරස් ඇති බව යැ, තව ද, ඡත්‍රයක් වැනි මනොඥ සිරස් ඇතිබව යැ, තව ද, දික් වූ පළල් වූ නලල්හි ශොභා ඇතිබව යැ, තව ද, මනා වූ සටහනින් යුක්ත වූ බැම ඇතිබව යැ, තව ද, සිලුටු වූ බැම ඇතිබව යැ, තව ද, අනුලොම් වැ තිබෙන්නා වූ බැම ඇතිබව යැ, තව ද, මහත් වැ තිබෙන්නා වූ බැම ඇතිබව යැ, තව ද, දික් වැ තිබෙන්නා වූ බැම ඇතිබව යැ, තව ද, සියුමැලි වැ තිබෙන්නා වූ ශරීර ඇති බව යැ, තව ද, ඉතා මැ සෞම්‍ය වූ ගාත්‍ර ඇති බව යැ, තව ද, ඉතා මැ බබලන්නා වූ ශරීර ඇතිබව යැ, තව ද, ඉතා මැ නිර්මල වූ ශරීර ඇතිබව යැ, තව ද, කෝමල වූ ශරීර ඇතිබව යැ, තව ද, සිනිඳු වූ ශරීර ඇතිබව යැ, තව ද, ස්වභාවයෙන්

Non-Commercial Distribution

සුවඳ වූ ශරීර ඇතිබව යැ, තව ද, සම වූ ලොමයෙන් යුක්ත වූ ශරීර ඇතිබව යැ, තව ද කොමල වූ ලොම් ඇතිබව යැ, තව ද, දකුණට සිසැරී තිබෙන්නාවූ ලොම් ඇතිබව යැ, තව ද, අඳුනට බඳු වූ, පැහැයෙන් යුක්ත වූ ලොම් ඇතිබව යැ, තව ද, සිනිඳු ලොම් ඇතිබව යැ, තව ද, ඉතා සියුම් වූ නහා ලන බහා ලන, ශ්වාස ඇතිබව යැ, තව ද, සුවඳ වැ තිබෙන්නා වූ ශ්‍රීමුඛ ඇති බව යැ, තව ද, ස්වභාවයෙන් සුවඳ වැ තිබෙන්නා වූ සිරස් ඇතිබව යැ, තව ද ඉතා නිල් වූ කෙශධාතු ඇති බව යැ, තව ද, දක්ෂිණාවර්ත වැ තිබෙන්නා වූ කෙශධාතු ඇති බව යැ, තව ද, මනා වූ සටහනින් යුක්ත වූ මටසිලුටු වැ තිබෙන්නා වූ කෙශධාතු ඇතිබව යැ, තවද, අවුල් නොවන්නා වූ කෙශධාතු ඇතිබව යැ, තව ද, සම වූ කෙශධාතු ඇතිබව යැ, තව ද, කොමල වැ තිබෙන්නා වූ කෙශධාතු ඇතිබව යැ, තව ද, කෙතුමාලාවෙන් හොබනා වූ සිරස් ඇතිබව යැ යන මෙසේ වූ අසූ අනුබ්‍යඤ්ජනයෙන් හොබනා වූ ශරීර ඇති බුදුන්-පෙ-යුතු.

## 201.

තව ද, 'මසැස යැ, දිවඇස යැ, නුවණැස යැ, බුදුඇස යැ, සමතැස යැ'යි සර්වඥයන්වහන්සේගේ පස් ඇසෙක් වන්නේ යැ, එහි 'මසැස' නම් කවරේ ද? යත්:- යම්තැනෙක්හි ඇසැ රොම පිහිටියේ ද, එතැන්හි දියමෙරලියමලැ පැහැ සේ වූ ඉතානිල් වූ පැහැ යැ, ඒ ඉක්බිති කිණිහිරිමලැ පැහැ බඳු වූ රන්වන්පැහැ යැ, ඒ ඉක්බිති වැ රතිඳුගොව්වකු ඇඟ පැහැ බඳු වූ සිනිඳු වූ රත්පැහැ යැ, මධ්‍යයෙහි රුක්පෙනෙලඇටෙකැ පැහැ බඳු වූ සිනිඳු වූ කළුපැහැ යැ, ඒ සිසාරා තරුවෙහි පැහැ බඳු වූ සුදුපැහැ යැ යන මෙ පස්පැ දිස්නා වූ, තව ද, වර්ෂාකාලයෙහි කළුවර සමයෙහි මධ්‍යමරාත්‍රියෙහි මහාඅටවිවල්මැදැ සිටියත් යොදුන් පමණ බොල් වූ මහාවිදුරුගල් පවා විදැ ගෙණැ එපිටැ තුබූ සියුම් වස්තූන් දක්නා වූ ඇස'මසැස' නම් වෙයි. මෙසේ වූ පෙළහර වූ මසැස් ඇති බුදුන්-පෙ-යුතු.

## 202.

තව ද, 'දිවඇස්' නම් කවරේ ද? යත්:- අනන්තලොකධාතුයෙහි උපන් සත්ත්වයන් කෙරෙන් "මේ සත්ත්වතෙමේ හීන යැ. මේ සත්ව තෙමේ උත්තම යැ. මේ සත්ත්වතෙමේ මනා වූ වර්ණ ඇත්තේ යැ. මේ සත්ත්වතෙමේ නපුරු වූ වර්ණ ඇත්තේ යැ. මේ සත්ව කයින් කරණ පව් ඇත්තේ යැ. මේ සත්ත්ව බසින් කරණ පව් ඇත්තේ යැ. මේ සත්ත්ව සිතින් කරණ පව් ඇත්තේ යැ. මේ සත්ත්ව ආයර්‍යයන්ට අනදර බණන්නේ යැ. මේ සත්ව මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ යැ. එහෙයින්

Non-Commercial Distribution

මියැ නරකයෙහි උපනැ. මේ සත්ත්වතෙමේ කයින් බසින් සිතින් පුරණලද පින් ඇත්තේ යැ. ආයඹීයන්ට ආදර කරන්නේ යැ. සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටියේ යැ. ස්වර්‍ගීයට ගියේ යැ. අපායට ගියේ ය"යි දන්නා ඇස 'දිවඇස' නම් වෙයි. එසේ වූ දිව ඇස් ඇති බුදුන්-පෙ-යුතු.

## 203 204 & 205

තව ද, අතීතානාගතවර්තමාන යැ යන තුන් කල්හි වන්නා වූ සියලු ධර්‍මයන් සර්වාකාරයෙන් දන්නා වූ ඇස 'නුවණැස' නම් වෙයි. මෙසේ වූ නුවණැස් ඇති බුදුන්-පෙ-යුතු.

තව ද, ලොකයෙහි "මේ සත්ත්ව මඳ වූ රාග ඇත්තේ යැ. මේ සත්ත්ව මඳ වූ ද්වේෂ ඇත්තේ ය. මේ සත්ත්ව මඳ වූ මොහ ඇත්තේයැ" යනාදීන් සත්ත්වයන් විභාග කොට දන්නා වූ ඇස 'බුදුඇස' නම් වෙයි. එසේ වූ බුදුඇස් ඇති බුදුන්-පෙ-යුතු.

තව ද, මේ ලෝකයෙහි දැක්ක යුතු යම් මැ[1] දෙයක් ඇතැඹුලු සේ දක්නා වූ ඇස 'සමතැස' නම් වෙයි. එ ඇසින් නො දක්නා දෙයෙක් මේ සියලු අනන්තලොකධාතුවෙහි නැත් මැ යැ. මෙසේ වූ සමතැස් ඇති බුදුන්-පෙ-යුතු.

## 206.

තව ද, සර්‍වඥයන්වහන්සේ නම් දසබලයක් ඇතිසේක. ඒ දසබල නම් කවරැ? යත්:- ඇතුන් දසදෙනෙකුගේ බල හා සමාන වූ බුදුන්ගේ කායබල 'දශබල' නම් වේ මැ යැ. දස තැනෙක්හි නො සැලී සිටිනා වූ නුවණබල දසය 'දශබල' නම් මේ මැ යැ. එහි සර්‍වඥයන්වහන්සේ ඇතුන් දසදෙනෙකුගේ බල හා සමාන වූ කායබලය දසයක් ඇතිනියා කෙසේ ද? යත්:- කාලාවක යැ, ගඞ්ගෙය්‍ය යැ. පණ්ඩර යැ, තම්බ ය, පිඞ්ගල යැ, ගන්ධ යැ, මඞ්ගල යැ, හෙම යැ, උපොසථ යැ, ඡද්දන්ත යැ යි කියා මෙසේ ඇතුන්ගේ දසකුලයෙක් වන්නේ යැ. මේ දක්වන ලද දස ඇත්කුලයෙහි ආදී වූ කාලාවක නම් කුලයෙහි එක් ඇතෙක් ඉතා බලසම්පන්න වූ මධ්‍යමපුරුෂයන් දසදෙනෙකුට බල ඇත්තේය. දෙවනු වැ කියනලද ගඞ්ගෙය්‍යකුලයෙහි එක් ඇතෙක් පළමු කොට කියනලද කාලාවකකුලයෙහි ඇතුන් දස දෙනෙකුට බල ඇත්තේ යැ. තුන්වනු වැ කී පණ්ඩරකුලයෙහි එක් ඇතෙක් දෙවනු වැ කී ගඞ්ගෙය්‍යකුලයෙහි ඇතුන් දස දෙනෙකුට බල ඇත්තේ යැ. සතරවනු වැ කී තාම්‍රකුලයෙහ්

1. දුටු මනා යම් මැ දැක්ක යුතු දෙයක්

Non-Commercial Distribution

එක් ඇතෙක් තුන්වනුවැ කී පණ්ඩරකුලයෙහි ඇතුන් දස දෙනෙකුට බල ඇත්තේ යැ. පස්වනු වැ කී පිඞ්ගලකුලයෙහි එක් ඇතෙක් සතරවනු වැ කී තාම්‍රකුලයෙහි ඇතුන් දසදෙනෙකුට බල ඇත්තේ යැ. සවනු වැ කී ගන්ධකුලයෙහි එක් ඇතෙක් පස්වනු වැ කී පිඞ්ගලකුලයෙහි ඇතුන් දස දෙනෙකුට බල ඇත්තේයැ. සත්වනු වැ කී මඞ්ගලකුලයෙහි එක් ඇතෙක් සවනු වැ කී ගන්ධකුලයෙහි ඇතුන් දසදෙනෙකුට බල ඇත්තේය. අටවනු වැ කී හෙමකුලයෙහි එක් ඇතෙක් සත්වනු වැ කී මඞ්ගලකුලයෙහි ඇතුන් දසදෙනෙකුට බල ඇත්තේය. නවවනු වැ කී උපොසථකුලයෙහි එක් ඇතෙක් අටවනු වැ කී හෙමකුලයෙහි ඇතුන් දසදෙනෙකුට බල ඇත්තේ යැ. දසවනු වැ කී ඡද්දන්තකුලයෙහි එක් ඇතෙක් නවවනු වැ කී උපොසථ කුලයෙහි ඇතුන් දසදෙනෙකුට බල ඇත්තේ යැ. සර්‍වඥයන් වහන්සේ ඡද්දාන්තකුලයෙහි ඇතුන් දසදෙනෙකුට බල ඇති සේක. ඒ සර්‍වඥයන්වහන්සේ, අපගේ නිකම්ඇතුන්ගේ ගණනින් බලත් හොත්, ඇතුන් කෙළදහසකට බල ඇතිසෙයෙකැ. පුරුෂයන්ගේ ගණනින් දසකෙළදහසක් පුරෂයන්ට බල ඇති සේක. මෙසේ කායබල ඇත්තා වූ බුදුන්-පෙ-යුතු.

## 207.

තව ද, බුදුන් බුදු වැ පන්සාළිස් හවුරුද්දක් මුළුල්ලෙහි දෙව්ලොවින් බඹලොවට, බඹලොවින් මිනිස්ලොවට, මිනිස් ලොවින් නාලොවට, 'රැයැ'යි නොසිතා, 'දහවලැ'යි නොසිතා, 'දුර යැ' යි නො සිතා, 'සොරු යැ'යි නො සිතා, 'යක්කු යැ'යි නො සිතා, 'සොරවිෂ වූ නයි යැ'යි නො සිතා, 'මදන්ධ වූ මත්ත හස්තීහු යැ'යි නො සිතා 'බ්‍රහ්මයා යැ'යි සරුවක් නො කොට, 'චණ්ඩාලයෝ යැ'යි නින්දවක් නො කොට තමන්වහන්සේ දෙසා වදළ සද්ධර්‍මයෙන්, දක්වා වදළ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන් ගැලවෙන්නට සුදුසු සත්‍වයන් ඇති ඇති තැනට වැදැ, පැන් ඇති ඇති තන්හි එන සඳපිළිබිඹක් සේ, පියුම් ඇති ඇති තැනට වදනා රාජහංස යක්හු සේ, හැල් ඇති ඇති තැනට වදනා මතැතක්හු සේ, වසත් කලට හඬ ගත් මත්කොවුල්රජක්හු සේ, මහමේකලට කෙකා නඟන රන්මොනරරජක්හු සේ, ගොදුරුබිම බලා පනින්නට සිංහනාද කරණ කෙශරසිංහයක්හු සේ, එතැනින් එතැනට වදිමින්, වන්වන්තන්හි බණ වදරමින් මුළුලොව සනහා, "මා හුදකළා වැ සියලු සත්‍වලොකයෙහි විසිර එකවිටැ නාලොවැ මිනිස්ලොවැ දෙව්ලොවැ බඹලොවැ පැණී යන්ට උගහටැ. මෙවිටැ මාගේ සියලුශරීරයෙහි ඇට තාක් විසුරුවා තලඇටක් සා වැ පැණුනුතැනට මහමෙර සා වැඩ සාධා මුළුලොව විසිර සියලු සත්‍වයන්ට හිත කළ මැනැවැ" යන අදහසින් මෙන්, පිරිනිවන් පෑ පස්වාදහසක් මුළුල්ලෙහි තමන්වහන්සේගේ ධාතු වැදැ

Non-Commercial Distribution

පිදූවන්ට දිව්‍යසම්පත්ති නිර්වාණසම්පත්ති සාධා දෙමින්, වැඩැහිඳැ බුදුවූ රුක්හි මළපරණලාපත් වන් වන් තැනට සම්පත් එළවමින්, විපත් දුරු කෙරෙමින්, මුළුලොවට එකඇස් වූ, මුළු ලොවට එකපහන් වූ, මුළුලොවට එකහදවත වූ, මුළුලොවට එක ඇදුරුවූ, මුළුලොවට එක බෙහෙත් වූ, මුළුලොවට එක කප්රුක් වූ, මුළුලොවට එක චින්තාමණී වූ, මුළුලොවට එක මහානිධාන වූ, මුළුලොවට එකරක්‍ෂාස්ථාන වූ, මුළුලොවට එකාභරණ වූ, මුළුලොවට එකඅමා වූ බුදුන්-පෙ-යුතු.

## 208.

තව ද, තමන්වහන්සේ සියලු ධර්මස්වරූප පරීක්ෂා කොට වදරණවෙලෙහි "සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටි සත්ත්වයා සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැයි බලත් මුත් අනික් ලෙසක බලන්නට කාරණ නැතැ"යි දන්නා වූ, තවද "තමන්ගේ දහම් අසා පළමු මගින් නිවන් දුටු සත්ත්වයා මවුන් මැරීම, පියන් මැරීම, රහතුන් මැරීම, සංඝභෙද කිරීම, බුදුන් ශරීරයෙන් ලෙහෙ සෙල්වීම යන මේ පඤ්චානන්තර්‍ය්‍යකර්ම කරන්නට කාරණ නැතැ"යි දන්නා වූ, "එක්කලෙක්හි බුදුන් දෙදෙනෙකු උපන හොත්, දෙනැවෙක්හි බර එකනැවෙක්හි නභාලූ කල්හි නැව ගැලෙන්නා සේ, එකබුදුකෙනෙකුන් මැ හම්වන්නා වූ ලොවට බුදුන් දෙදෙනෙකු උපන හොත්, එකළාලොවැ[1] බුදුන් දෙදෙනාගේ ආනුභාව මුළුලෝ උසුලාගත නොහෙනහෙයින් එක්කලෙක්හි බුදුන් දෙදෙනෙකු උපදින්ට කාරණ නැතැ"යි දන්නා වූ, මෙසේ මැ සක්විත්තන් දෙදෙනක්හු එක්කලෙක්හි උපදනට කාරණ නැතැයි දන්නා වූ, තව ද "බුදුකෙනෙකුන් හා සක්විති කෙනෙකුන් හා දෙදෙනකු එක්කලෙක්හි සිටින්නට කාරණා නැතැ"යි දන්නා වූ, "කයින් බසින් සිතින් අකුසල් පිරූ සත්ත්වයාට අතීතානාගතවර්තමාන යැ යන තුන්කල්හි මැ ඉෂ්ටයක් වූ තැන් නැතැයි දන්නා වූ, කයින් බසින් සිතින් සුචරිත පිරූ සත්ත්වයාහට හැමකල්හි මැ අනිෂ්ටයක් වන්නට කාරණ නැතැ"යි දන්නා වූ, "ගැහැණි වැ සිටැ බුදු වන්නට, සක්විති වන්නට, ශක්‍ර වන්නට, මාර වන්නට, බ්‍රහ්ම වන්නට, කාරණ නැතැ"යි දන්නා වූ, මෙලෙසින් මැ සියලු ධර්මසමූහය පරීක්ෂා කොට "මේ මෙසේ වන්නට කාරණ ඇත: මේ මෙසේ වන්නට කාරණ නැතැ"යි සියලු තත්ත්වය පිරිසිඳැ දැනැ යමකට 'කාරණ ඇතැ'යි වදළෝ ද, එයට කාරණ ඇතිහෙයින් හා, යමකට 'කාරණ නැතැ'යි වදළෝ ද, එයට කාරණ නැතිහෙයින් හා මහමෙර සේ, අකම්ප්‍ය වූ, සක්වළගල සේ ස්ථිර වැ පිහිටියා වූ, මේ පළමුවන ඥානබලයෙන් යුක්ත වූ, බුදුන්-පෙ-යුතු.

1. එලොව

Non-Commercial Distribution

## 209.

තව ද, සිතා වදළ හොත් තමන්වහන්සේ වැඩැ වසන්නා වූ ජේතවන වෙළුවන ලට්ඨිවන අම්බපාලීවන[1] අඤ්ජවන සීතවන ගොසිඞ්ග-සාලවන මහාවනාදි වූ එක්තරා එක්තැනෙක්හි පැන්වූ උතුම් බුද්ධාසනයෙහි වැඩැ හිඳැ පූර්‍වපශ්චිම උත්තර දක්‍ෂිණ යන සතරදික්හි එක්සක්වළෙක්හි තලපොළෝ තෙලෙහි පටන් අකනිට්ඨාබඹලොව දක්වා පුරාලා එක් දිශාවෙක්හි මැ එක්සක්වළකට තලඇටක් බැගින් හෙළා ගෙණැ යත්, තලඇට ගෙවී සක්වළ නොගෙවන්නා වූ අනන්තාපරියන්ත සක්වළැ කිහිඹිකුහුඹුවන් කෙරෙහි පටන් ගෙණැ මහබඹුන් දක්වා සිතා වදළ හොත්, අවීචියෙහි සතුන් කෙරෙහි පටන් ගෙණැ අකණිට්ඨාබඹලොවැ මහබඹුන් දක්වා එක හෙළා උන් උන් ඉදිරියෙහි වැඩැහුන්නා සේ පෙණී ගොස්, බැලුබැලූවන්ගේ දෙරැ දෙරැ පැණෙන සොළොස්කලාවෙකින් පිරිහුන් නවබඟැ සඳමඬලක් සේ ඒ ඒ සතුන්ගේ ඇස් හා සිත් හා සනහා එසේ අනන්තාපරියන්තසක්වළැ සියලු මිනිසුන්ට උන්උන්ගේ රාජ්‍යයෙහි රජ කරණ රජදරුවන් සේ පෙණීගොස් "මේ මේ අකුසලින් දුරු වැ කුසල් කරව"යි අවවාද දී වදරා, ඒ අවවාද ඇසූ මිනිසුන් "අපගේ රජ්ජුරුවන් වදළ අවවාද යැ"යි ගිව්සැ ඒ අකුසලින් දුරු වැ කුසල් කොට, එ කුසලින් මතුමතු මේ මඟුල් සක්වළැ ඉපැදැ, බුදුහමුවෙහි බණ අසා අමාමහනිවන් දක්නා පරිද්දෙන් කරණසෙයෙකැ. මෙසේහෙයින් සක්වළ තමා මැ ගණන් නැතිනියා කෙසේ ද? ඒ ඒ සක්වළැ සතර සතර මහාද්වීපයෙහි ඒ ඒ රාජධානියෙහි රජ කරණ රජදරුවන් අනන්ත නියා කෙසේ ද? ඒ ඒ රජදරුවන්ගේ වෙන වෙන රැවු වූ නියා කෙසේද? වෙන වෙන බස් වූ නියා කෙසේ ද? එකතැන මැ හුනස්නෙහි වැඩැ හිඳැ අනන්තාපරිමාණ සක්වළැ මිනිස්නට තමන් වහන්සේගේ බුදුවෙස නො හැරැ මැ උන් උන්ගේ රජ දරුවන්ගේ නොයෙක්වෙසින් පැණී ගොස් උන් උන් බණන බසින් හැහෙන පරිද්දෙන් එක මගධබසින් බණ වදරා තමන් වහන්සේ නො උපන් සක්වළැ සතුන් පොවා තමන්වහන්සේ දුටු අමාමහනිවන් දක්වන්නට උත්සාහ කොට වදරණ සේක. එසේ වූ අනන්ත වූ සෘද්ධි ඇති ස්වාමිදරුවානෝ අතීතඅනාගත වර්‍තමාන යැ යන තුන්කල්හි, 'කල යහපත් වුව හොත්, කුශල විපාක මුත් අකුශල විපාක නො දෙ'යි දැනැ වදරණසේක. 'කල නපුරු වුවහොත් අකුශල විපාක මුත් කුශලවිපාක නො දෙ'යි දැනැ වදරණසේක. 'දෙව්ලොව බඹලොව ආදිවූ යහපත් ගතියෙහි කුශලවිපාක මුත් අකුශල විපාක නො දෙ'යි දැනැ වදරණ සේක. 'නරකාදි වූ නපුරු ගතියෙහි

1. අම්බඵලවන

Non-Commercial Distribution

අකුශලවිපාක මුත් කුශලවිපාක නැතැ'යි දැනැ වදරණ සේක. 'ශරීරාකාර යහපත් රූපසම්පන්න වැ උපන් තැනැත්තහු අනුන්ට ගැති වැ උපනත් ඔහු ලවා ඒ ස්වාමිදරුවන් නුසුදුසු මෙහෙ නො කරවා කම්මුතු මෙහෙයෙහි යොද වඩනාසෙයින්[1] යහපත් වැ උපන් තැනැත්තහුට අකුශලවිපාකය ශරීරසම්පත්තියෙන් ඉදුරා නොදෙයි දැනැ වදරණසේක. 'රජකුලෙහි උපන් එකකදු වුව හොත්, අත්පා කොර[2] වැ ඇස් කණ වැ විරූප වැ උපන හොත්, මෙසේ වූ තැනැත්තහු රාජ්‍යයට නො ගණුම්හයි හරණහෙයින් නපුරු වූ ශරීර ඇති තැනැත්තහුට කුශලවිපාක ඉදුරා නො දෙ'යි දැන වදරණසේක. තව ද 'නපුරු වූ ආචාරසමාචාර ඇති තුඩින් බිණිය යුත්තක්[3] නො බණන, කයින් කට යුත්තක් නො කරණ, සිතින් සිතියැ යුත්තක් නො සිතන්නාහට අකුශලවිපාක මුත් කුශලවිපාක නො දෙ'යි දැනැ වදරණසේක. අනවරතයෙන් කයින් කළ මනා කට යුත්තක් මැ කොට තුඩින් බිණුව මනා බසක් මැ බැණැ සිතින් සිතියැ යුත්තක් මැ සිතන්නාහට 'අනවරතයෙන් ඉෂ්ට වූ කුශලවිපාක මැ දෙ'යි දැනැ වදරණසේක. මෙසේ තුන්කල්හි සියලු කර්‍මයන් විපාක දෙනපරිදි හා නො දෙනපරිදි දැනැ වදරණ හෙයින් දෙවන ඥනබලයෙන් යුක්ත වූ සියුම් නුවණ ඇති, සීනෙන් සිහිකළවුන් පවා අමාමහනිවන්හි ඇරැ[4] සිටුවන්නා වූ බුදුන්-පෙ-යුතු.

## 210.

තව ද, හිරු සේ සත්ත්වයන් නො තවා තෙජස්වී වූ, සඳහු සේ කලඩකයක් නැති වැ සෞම්‍ය වූ, පියුමක් සේ නො හැකිළී ශ්‍රීකර වූ, මතැතක්හු සේ හයඩකර නො වැ ලොව පිණවන, ගින්නක් සේ නො දවා ප්‍රයෝජනවත් වූ, රුවනක් සේ නො දැඩි වැ බබලන්නා වූ, මවුපියන් සේ නො වැ[5] ල ඇති, ඇසක් සේ ශරීරයෙහි නො වැ මහ පානා, ජීවිතයක් සේ තමාගේ යත්නයෙන් නො රැකී ප්‍රිය වූ, ඖෂධයක් සේ ඇරුචි නො උපදවා හිත වූ, සිංහරාජයක්හු සේ අනුන් නො නසන ශෞර්‍ය්‍ය ඇති, මුළුලොව හම්වන නුවණ ඇති, සව්සතුන්ට සෑහෙන කරුණා ඇති, රුවට තරම් ගුණ ඇති, ගුණයට තරම් රූ ඇති, දහමට බැහැවුනු, නිවණට සැරැහුනු, මරහු හික්මවන තේජස් ඇති, නිරැහි ගිනි නිවන සිහිල්කම් ඇති, රහත්මඟ දෙන ඇදුරුකම් ඇති, සසරදුකට මම යැයි පිටිවහල්[6] වැ සිටිනා බලවත්කම් ඇති, මම යැ, අන්නු යැ'යි විභාගයක් නො කරණ සිතක් ලද බුදුරජාණන්වහන්සේ මේ නිරැ යන මඟ යැ: මේ තිරිසන්යෝනියට යන මඟයැ: මේ ප්‍රෙතලොකයට පමුණුවන

1. හෙයින් 2. කොරො 3. බිණුව මනා බසක්
4. හැර 5. නො මළ 6. වහල්

Non-Commercial Distribution

මහ යැ; මේ මිනිසත් බවට පමුණුවන මහ යැ. මේ දෙව්ලොවට පමුණුවන මහ යැ. මේ නිවනට පමුණුවන මහ යැයි යමක් වදාළසේක්ද, ඒ අතීත අනාගත වර්තමාන යැ යන තුන්කල්හි මැ එසේ මැ වනබව මුත් අනෙක්ලෙසකට පෙරළියක් නොවන හෙයින් සියලු තැනට යන පිළිවෙත් දන්නා බැවින් තුන්වන ඥනබලයෙන් යුක්ත වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 211.

තව ද, අනුන්ගේ දුකින් දුක් පත් වූ, අනුන්ගේ සුවයෙන් සුවපත් වූ, අනුන්ට සිතා නිවණක් හළ, කරුණායෙන් සසරක් වැනි තැනට නො බා වන්, ඇසක් වැනි අවයවයක් උදුරා දන් දුන්, හදවතක් වැනි නො සිතියැ හැකි තෙනක් පළා මස් දන් දුන්, දරුවන් වැනි රැක්කැ යුත්තවුන් ගැතිකොට දී ලයවැහැවූ අඹුවන් වැනි සැළැවිය යුත්තවුන් ඉල්ලූවන් අතැ තබා දන් දුන්, 'රජ යැ'යි නො සිතා වල් වන්, 'ධන යැ'යි නො සිතා යාචකයන්ගේ දෙරැ දෙරැ ඉසි, 'මහාත්මයෙමි'යි නො සිතා කීවන්ට ගැති වූ, 'හිස යැ'යි නො සිතා කපා දන් දුන්, 'මසැ'යි නො සිතා ලියා දුන්, 'ලෙහෙ යැ'යි නො සිතා පෙළා දුන්, බුදුරු ගෙණැ සිටි මාගේ මැණියන්වහන්සේ රූපස්කන්ධ යැ, වේදනාස්කන්ධ යැ, සංඥස්කන්ධ යැ, සංස්කාරස්කන්ධ යැ, විඥනස්කන්ධ යැ යන පඤ්චස්කන්ධයන්ගේ ද, චක්ඛායතන යැ, සොතායතන යැ, ඝාණායතන යැ, ජිව්හායතන යැ, කායායතන යැ, මනායතන යැ, රූපායතන යැ, සද්දයතන යැ, ගන්ධායතනය, රසායතන යැ, ඵොට්ඨබ්බායතන යැ, ධම්මායතන යැ යන දෙළොස් ආයතනයන්ගේ ද, චක්ඛුධාතු, සොතධාතු, ඝාණධාතු, ජිව්හාධාතු, කායධාතු, මනොධාතු, රූපධාතු, සද්දධාතු, ගන්ධධාතු, රසධාතු, ඵොට්ඨබ්බධාතු, ධම්මධාතු, චක්ඛුවිඤ්ඤණධාතු, සොත-විඤ්ඤණධාතු, ඝාණවිඤ්ඤණ-ධාතු, ජිව්හාවිඤ්ඤාණධාතු, කාය විඤ්ඤණධාතු, මනොවිඤ්ඤණධාතු යැ යන අටළොස් ධාතුන්ගෙන්ද වෙනස තමන් නුවණින් පිරිසිඳ කිරි හා දී හා එක් වූ තන්හි මේ 'කිරි යැ, මේ දි යැ'යි තෝරන්නා සේ වෙන වෙන දැනැ වදරණසේක. එසේවූ සතරවන ඥනබලයෙන් යුක්ත වූ බුදුන් සරණ යෙමියි බුත්සරණ යායුතු.

## 212.

තවද, ගම්දෙරෙහි බඳ මිහිවදයක් සේ, මහමහැ තුබූ පින් පැන්මඩුවක් සේ, සතරමංසන්ධියෙහි කැණි පොකුණක් සේ, සියලු සත්ත්වයන්ට නො වළහා සිහිල් පවත්වන සඳමඬලක් සේ, සියලු සතුන්ට එක හෙළා

අඳුරු දුරු කරණ හිරුමඬලක් සේ "මුළුලොව[1] මුන් සතුවහ, මුන් නොසතුවහ' යන හිමක් නැති වැ මඩුවන් කෙරෙහි පටන් මහබඹුන් දක්වා එක හෙළා ල ඇති, දිවි පියා වැන්දැ යුතු, දිවි පියා පිදියැ යුතු, සිහි කළ සිහි කළ සිතට දුකක් නො වැද්දැ දෙන, තමන් වඳනට නැඟු දෑත නිවන් හිමින් අනුන් වඳනට නො නැංගැ දෙන, තමන් වසන විහාරයට නැඟු පය, 'අනුන්ට සේවාකම් කරන්නට යම්හ'යි නො නැගියැ දෙන, සවිතෝ ගෙවා දැන්මෙන් වියත්කම්හි මතුපත්වූ බුදුරජාණන්-වහන්සේ තුන්කල්හිම "හීන වූ අදහස් ඇති සත්ත්වයෝ හීන වූ අදහස් ඇති සත්ත්වයන් හා මැ එක්වන සුල්ලහ. උතුම් වූ අදහස් ඇති සත්ත්වයෝ උතුම් වූ අදහස් ඇති සත්ත්වයන් හා මැ එක් වන සුල්ලහ"යි දැනැ වදරණසේක. මෙසේ අශුචි හා අශුචි එක් වන්නා සේ, සුගන්ධද්‍රව්‍ය සුගන්ධද්‍රව්‍ය හා එක්වන්නා සේ, "සත්ත්වයෝ තමන් තමන් හා සමසම අදහස් ඇති සත්ත්වයන් හා එක් වෙති" යි දැනැ වදරණ හෙයින් මෙබඳු වූ පස්වන ඥනබලයෙන් යුක්ත වූ බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු.

## 213.

තව ද, එක් සමයෙක්හි තමන්වහන්සේගේ බුද්ධ කෘත්‍ය මස්තකප්‍රාප්ත වූ සේ දැනැ මරහට ආයුස්සංස්කාරය හැර අතීසාරයෙන් ලෙඩ වූ කල්හි තමන්වහන්සේ ගිලන් වූ බව දැනැ "මෙතැන්හි මාගේ ස්වාමීන්ට අත්පාමෙහෙ නො කෙළෙම් නම්, මාගේ ජීවිතයෙහි හා මාගේ ශරීරයෙහි හා ලාභ[2] කවර දවසෙකැ ලැබෙම් දැ?"යි වහා දෙව්ලොවින් බැසැ ශක්‍රයා අවුත් ශ්‍රීපාදය වැඳැ සිටිකල්හි "හැයි, දෙවෙන්‍ද්‍රය, ආයේ කුමක් පිණිසදැ?" යි විචාරා වදරා "ස්වාමීනි, නුඹවහන්සේ ගිලන්බව දැනැ අත්පාමෙහෙ කරන්නට ආමි"යි දැන්වූ කල්හි "දෙවෙන්‍ද්‍රය, මිනිස්ලොව්හි පිළිකුල් දුගීන්ධය සෙසු දෙවතාවන්ට පොවා සියක් යොදුන්හි පටන් කොට ගෙලෙහි බැඳැ ලූ ගරවිල්කුණක් සේ මැ වැටහෙයි. දෙදෙව්ලොවැ දෙවතාවන්ට අධිපති වූ තට වූ කලී කියන්නට මැ කිම්ද? අප ලෙඩ වූවා අතීසාරයක් වුව, එ ද ඉතා පිළිකුල් රොගයක් වුව, අපට මෙහෙ කරණ සඬසයා මැ ඇත. තෝ දෙව්ලොවට මැ නැඟී යා"යි වදළ සේක. එ අසා ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම දෙඅතින් දෙකණ පියා[3] ගෙණැ "ස්වාමීන් ගැත්තවුට එසේ නො වදළ මැනව. ස්වාමීන් වදළ මිනිස් ලොවැ දුගීන්ධ ඇසෙන්නේ සියක් යොදනට වේ ද? ස්වාමිදරුවන්ගේ ගුණසුවඳ වූ කලී සුවාසූදහසක් යොදනෙන් මත්තෙහි සිට මැ ඇසීම්. ඒ සුවඳින් මැ එ ම දුගීන්ධ යට වැ ගියේ යැ. කෙළෙහි ගුණ දනිම් නම්, නුඹ වැඳැ ගෙණැ

1. මුළුලොවට. 2. එල හර 3. වසා

Non-Commercial Distribution

හෙවැ මිය ගොස් නුඹ 'දිගා ව'යි වදළ පමණින් දිවසැපත් නිවන්සැපත් ලද, මෙයට මැ ජාතිය මුළුල්ලෙහි අනඳමහතෙරුන්-වහන්සේ කම සේ කොට මෙහෙකරත් සුදුස්සෙමි වෙමි ද? පරසිත් දන්නා ස්වාමිදරුවන් මධ්‍යයෙහි දන්වන බස් වුව, මා ඇතුළුසිත ස්වාමීන්ගේ ශ්‍රී බුද්ධියෙන් මැ බලා වදළ මැනැව. මා හිස බඳ සිත්කලු වූ වර්ණයෙන් සම්පන්න වූ සියක් යොදනෙහි එක හෙළා සුවඳ පවත්වන පණස් යොදනෙක්හි එක හෙළා වර්ණ පවත්වන පරසතුමල්දමට වඩා මා හිසැ පලන් මේ සත්රුවනින් උජ්ජ්වල වූ දිවවොටුන්නට වඩා මා හිසින් අදනා ස්වාමීන්ගේ ශරීරමලයෙන් පිරුණු මේ භාජනය මැ මට ප්‍රිය යැ"යි කියා එාසු වන තෙක් ශක්‍රයා කරණ මෙහෙ ලත් ස්වාමිදරුවානෝ පරසත්වයන්ගේ පරපුද්ගලයන්ගේ 'ලොකය නිත්‍ය යැ'යි කියා ද 'ලොකය අනිත්‍ය යැ'යි කියා ද, 'අන්තයක් ඇත්තේ යැ'යි කියා ද, 'අන්තයක් නැත්තේ යැ'යි කියා ද, 'හෙ මැ ජීව යැ'යි කියා ද, 'හෙ මැ ශරීර යැ'යි කියා ද, 'ජීවය අනිකෙකැ'යි කියා ද, 'ශරීරය අනිකෙකැ'යි කියා ද, 'සත්ත්වතෙම් මරණින් මත්තේ වෙ'යි කියා ද, 'සත්ත්වතෙමේ මරණින් මත්තෙහි නො වෙ'යි කියා ද, 'සත්ත්වතෙමේ මරණින් මත්තෙහි වන්නේද වෙයි, නො වන්නේද වෙ'යි කියා ද ගන්නා ශාශ්වතදෘෂ්ටි උච්ඡෙද-දෘෂ්ටිසංඛ්‍යාත වූ ආශය දන්නා නුවණ ද: 'මේ අන්තද්වය දුරු කළානට සියලු ධර්මයෝ ප්‍රතීත්‍යසමුත්පන්නය'යි උපදනා වූ 'අනුලොමික-ක්‍ෂාන්තිය'යි ද 'යථාභූතඥනය'යි ද කියනලද ආශය දන්නා නුවණ ද, කාමරාගානුශය යැ, ප්‍රතිඝානුශය යැ, මානානුශය යැ, විචිකිච්ඡානුශය යැ, භවරාගානුශය යැ, අවිද්‍යානුශය යැ යි කියන ලද අනුශය දන්නා නුවණ ද: පුණ්‍යාභිසංස්කාරය, අපුණ්‍යාභිසංස්කාරය, අනෙඤ්ජාභි-සංස්කාරය යනාදි වූ චරිත දන්නා නුවණ ද: සත්ත්වයන්ගේ හීනාධිමුක්ති යැ, ප්‍රණීතාධිමුක්ති යැ යනාදී වූ අධිමුක්ති දන්නා නුවණ ද: ප්‍රඥචක්‍ෂුසැ හුනු ලොභ යැ, ද්වේෂ යැ, මොහ යැ, මාන යැ, දෘෂ්ටි යැ, විචිකිච්ඡා යැ, ස්ත්‍යාන යැ, ඖද්ධත්‍ය යැ, පාපයෙහි ලජ්ජානැති බව යැ, පාපයෙහි භය නැති බව යැයි කියන ලද දශ ක්ලේශයන් විසින් මහාරජස්ක වූ සත්ත්වයන් දන්නා වූ නුවණ ද; මෙ මැ ක්ලේශයන් අනාසෙවිත අභාවිත අබහුලීකෘත හෙයින් අල්පරජස්ක වූ සත්ත්වයන් දන්නා නුවණ ද: අනාසෙවිත අභාවිත අබහුලීකෘත අනුත්සදකෘත වූ ශ්‍රද්ධාදි වූ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෘදු වූ ඉන්ද්‍රියයන් ඇති සත්ත්වයන් දන්නා නුවණ ද: ආසෙවිත භාවිත බහුලීකෘත උත්සදකෘත ශ්‍රද්ධාදී වූ පඤ්චෙන්ද්‍රියයන් විසින් තීක්ෂ්ණෙන්ද්‍රිය වූ සත්ත්වයන් දන්නා නුවණ ද: පාපයෙහි ආශය ඇති පාපානුශය වූ පාපචරිත වූ පාපයෙහි අධිමුක්ති

Non-Commercial Distribution

ඇති මහාරජස්ක වූ මෘදු වූ ඉන්ද්‍රියයන් ඇති නපුරු වූ ආකාර ඇති සත්ත්වයනුදු චතුස්සත්‍යාවබොධය කට නො හැකි සත්ත්වයනුදු කළ්‍යාණයෙහි ආශය ඇති කල්‍යාණචරිත වූ කල්‍යාණාධිමුක්ති වූ අල්පරජස්ක වූ තීක්ෂ්ණ වූ ඉන්ද්‍රියයන් ඇති යහපත් වූ ආකාර ඇති මනා කොට චතුස්සත්‍යාවබොධය කට හැකි සත්ත්වයනුදු දන්නා නුවණ ද: පඤ්චානන්තර්‍ය්‍යකර්‍මාවරණයෙන්ද මිථ්‍යාදෘෂ්ටිසංඛ්‍යාත වූ ක්ලේශා-වරණයෙන් ද අහෙතුක ප්‍රතිසන්ධිසංඛ්‍යාත වූ විපාකාවරණයෙන් ද සමන්විත වූ ශ්‍රද්ධා නැති කුශලච්ඡන්ද නැති නීවරණබහුල වූ අභව්‍ය සත්ත්වයන් දන්නා නුවණ ද: උක්තප්‍රකාර වූ කර්‍මාවරණ ක්ලේශාවරණ විපාකාවරණයෙන් දුරු වූ ශ්‍රද්ධාසම්පන්න වූ කුශලච්ඡන්ද ඇති පඤ්චනීවරණයන් නැති භව්‍යසත්ත්වයන් දන්නා නුවණ ද යන සවන ඥනබලයෙන් යුක්ත වූ සේක. එසේ වූ ස්වාමිදරුවානන්-පෙ- යුතු.

## 214.

තව ද, මාගේ ස්වාමිදරුවානන් සම්පූර්‍ණ වූ චන්ද්‍රමණ්ඩලයෙකැයි සිතම්. උන් වදළ සද්‍ධර්‍මය ඒ චන්ද්‍රමණ්ඩලයෙන් බට සිහිල් වූ සඳපහනෙකැයි සිතම්. ඒ ස්වාමිදරුවානන්ගේ පුත් වූ සඟුරුවන් එ සඳරැස් හිමෙන් සැදැහැ නැමැති ජලධාරා වහන සඳකත්මිණි පහණ සමූහයෙකැයි සිතම්.

තව ද, මාගේ ස්වාමිදරුවානන්වහන්සේ උදයපර්‍වතශිඛරයෙන් නැඟී මනොඥ වූ ලහිරුමඬලෙකැයි සිතම්. උන් වදළ සද්ධර්මය ඒ ලහිරුමඬලින් බට රශ්මිසමූහයකැ යි සිතම්. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය එ රශ්මි හිමෙන් පිපී වැනීගිය පියුම් කැලෙයකැයි සිතම්.

තව ද, සර්‍වඥයන්වහන්සේ කලට මද හී සිටි බලන්නවුන් ඇසට ඉතා මනොඥ වූ ගන්‍ධගජෙන්ද්‍රයෙකැයි සිතම්. උන් වදළ සද්ධර්‍මය සුවඳ වූ මදධාරා යැ යි සිතම්. ඒ සර්‍වඥධර්‍මචක්‍රවර්ති ස්වාමිදරුවානන් වහන්සේගේ පුත් වූ සඟුරුවන් ඒ මදධාරා බී මත් වූ භ්‍රමරසමූහයෙකැයි සිතම්.

තව ද, ස්වාමිදරුවානන්වහන්සේ පිපී නිමා ගිය රන් පියුමෙකැයි සිතම්. උන්වහන්සේ වදළ සද්ධර්‍මය ඒ පියුමැ ඇති වූ මධුර වූ මධු බින්දුසන්‍දොහයෙකැයි සිතම්. ඒ ස්වාමිදරුවානන්වහන්සෙගේ පුත් වූ සංඝරත්නය ඒ මිහිරි මී බීමෙන් මත් වූ රාජහංසසමූහයෙකැයි සිතම්.

Non-Commercial Distribution

තව ද, ලොවුතුරා සම්මාසම්බුදුරජානන් වහන්සේ භාස්වර[1] සිංහරාජයෙකැයි සිතම්. උන් වදළා වූ සද්ධර්මය අසම්භීත කෙසර සිංහනාදයෙකැයි සිතම්. ඒ ස්වාමිදරුවානන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ක්ලේශ නැමැති ක්‍ෂුද්‍රසත්වයන්ගේ හසර නො මැති සිංහාධිෂ්ඨිත වූ වනප්‍රස්ථයෙකැයි සිතම්.

තව ද, සද්ධර්මරාජ වූ ස්වාමිදරුවානන්වහන්සේ මහාහිමාලය පර්වත යැයි සිතම්. උන්වහන්සේ වදාළ සද්ධර්මය ඒ පර්වත පාදයෙන් බට ගඟුල්හැල්ලෙකැයි සිතම්. උන්වහන්සේට පුත් වූ සංඝරත්නය ඒ ගඟුල්හැල්ලෙහි අනවරතයෙන් නහා සැනැහෙන හස්තිසමූහයෙකැයි සිතම්.

තව ද, මාගේ ස්වාමිදරුවානන්වහන්සේ ප්‍රබුද්ධ වූ වසන්ත කාලයෙහි වහාවනයෙකැයි සිතම්. උන්වහන්සේ වදළ සද්ධර්මය ඒ වනයෙහි මල්කැන් සමූහයෙකැයි සිතම්. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ඒ මල්කැන්හි හැසිරෙණ බමරකැලයෙකැයි සිතම්.

තව ද, ඒ ලොව්තුරා සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ රත්නාකරයෙකැයි සිතම්. උන්වහන්සේ වදල සද්ධර්මය මහඇඟි සත්රුවන් කැලයෙකැයි සිතම්. ඒ බුදුරජානන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ඒ සත්රුවන් ඉකැවූ රාජසමූහයෙකැයි සිතම්.

තව ද, ඒ ස්වාමිදරුවානන්වහන්සේ මලයස්ථලයෙහි වූ සඳුන් රුකෙකැයි සිතම්. උන්වහන්සේ වදළ සද්ධර්මය එහි පිහිටි අසාධාරණ වූ ශෛත්‍යගුණ යැයි සිතම්. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය එහි සිහිලස විඳිනා පිණිස වැදැ වැළැඳ ගෙණැහොත් භුජඞගරාජසමූහයෙකැයි සිතම්.

තව ද, ස්වාමිදරුවානන්වහන්සේ ල ඇති මවකැයි* සිතම්. උන්වහන්සේ වදළ සද්ධර්මය කිරිබරතනයෙකැයි සිතම්. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ඒ කිරිබරින් ජීවත් වන පුත් රුවනෙකැයි සිතම්.

තව ද, ඒ ස්වාමිදරුවානන්වහන්සේ සියල්ලන් විසින් මැ අනුභව කටයුතු වූ කප්රුකෙකැයි සිතම්. උන්වහන්සේ වදළ සද්ධර්මය ඒ ආරාධනාවෙන් ලබන්නා වූ කැමැති කැමැති මහඇඟි වූ ධන යැයි සිතම්. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ඒ ධන ලැබීමෙන් සතුටු වූ දරිද්‍ර සමූහයෙකැයි සිතම්.

---

1. භාස්කර
* මවෙකැයි

Non-Commercial Distribution

තව ද, ඒ ස්වාමිදරුවානන්වහන්සේ සදත්විල්තෙරෙහි සිටි නුගරුකෙකැයි සිතමි. උන්වහන්සේ වදාළ සද්ධර්මය සිහිල් සෙවෙනකැයි[1] සිතමි. උන්වහන්සේට පුත්වූ සංඝරත්නය ඒ සෙවෙනැ සැතැපුනු ගිමින් නැවීගිය ඇත්කැලයෙකැයි[2] සිතමි.

තව ද, බුදුරජානන්වහන්සේ මහාමෙඝයෙකැයි සිතමි. උන්වහන්සේ වදාළ සද්ධර්මය මෙඝගර්ජන යැයි සිතමි. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ඒ ඇසීමෙන් සොම්නසින් මත් වැ බමන මයුරසමූහයෙකැයි සිතමි.

තව ද, බුදුරජානන්වහන්සේ කාන්තාරයෙහි වූ මහපින්පැන් සැළෙකැයි[3] සිතමි. උන්වහන්සේ වදාළ සද්ධර්මය සිහිල් වූ සුවඳ වූ මධුර වූ සලිලයෙකැයි සිතමි. ඒ ස්වාමිදරුවානන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය සුව සේ බී පිපාසා නිවා ගත් මැහීරුසෙකැයි සිතමි.

තව ද, මාගේ ස්වාමිදරුවානන්වහන්සේ මහවෛද්‍යාන කෙනෙකැයි සිතමි. උන්වහන්සේ වදාළ සද්ධර්මය ආයුර්වේදමන්ත්‍රයෙකැයි සිතමි. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ඒ ආයුර්වේදමන්ත්‍රයෙන් ස්වස්ථ වූ ආතුරසමූහයෙකැයි සිතමි.

තව ද, සද්ධර්මරාජ වූ ස්වාමීන්වහන්සේ ත්‍රිකූටපර්වත යැයි සිතමි. උන්වහන්සේ වදාළ සද්ධර්මය එහි පිහිටි රුවන්මෙරෙකැයි සිතමි. උන් පුත් වූ සුපිළිපන් සංඝරත්නය එහි පිහිටා සුව සේ වසන දෙවතාසමූහයෙකැයි සිතමි.

තව ද, ඒ ස්වාමිදරුවානන්වහන්සේ නායක වූ වෘෂභ රාජයෙකැයි සිතමි. ඔවුන් වදාළ සද්ධර්මය ඔහු ගිය ක්‍ෂෙම මාර්ගයෙකැයි සිතමි. ඔවුන්ගේ දරු වූ සංඝරත්නය ඒ මාර්ගයෙන් සුව සේ හසර ලත් ගොව්‍රජයෙකැයි සිතමි.

තව ද, ඒ ස්වාමිදරුවානන්වහන්සේ නිවාතස්ථානයෙකැ මනා වැ දිලියෙන ප්‍රදීපස්කන්ධයෙකැයි සිතමි. උන්වහන්සේ වදාළ සද්ධර්මය මොහ නැමැති අන්ධකාරය බිඳිනා ප්‍රදීපාලොකයෙකැයි සිතමි. උන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය ඒ ආලෝකයෙන් මාර්ගාමාර්ග දුටු ඇසැත්තවු යැයි සිතමි.

තව ද, ස්වාමිදරුවානන් වහන්සේ හස්ත්‍යාචාර්යකෙනෙකැයි සිතමි. උන්වහන්සේ වදාළ සද්ධර්මය ශික්‍ෂාතන්ත්‍රයෙකැයි සිතමි. ඔවුන්වහන්සේගේ පුත් වූ සංඝරත්නය එහි කී ක්‍රමයෙන් මැ ශික්‍ෂා ලදින් විනීත වූ භද්‍රහස්තිසමූහයෙකැයි සිතමි.

---

1. සිහිල්වනයෙකැයි 2. සදත්කැළසමූහයෙකැයි 3. හලෙකැයි

Non-Commercial Distribution

මෙසේ තමන්වහන්සේ යැ, තමන්වහන්සේ වදළ ධර්මරත්න යැ, තමන්වහන්සේගේ පුත් වූ සංඝරත්න යැ යන මේ රත්නත්‍රයයෙන් මැ ලොවට ශාන්ති එළවන සර්වඥයන්වහන්සේ ප්‍රථමධ්‍යානාදී වූ ධ්‍යානධර්මයන් දන්නා නුවණ යැ, අෂ්ටවිමොක්ෂ ධර්මයන් දන්නා වූ නුවණ යැ, සවිතර්ක සවිචාරසමාධි යැ, අවිතර්ක විචාරමාත්‍රසමාධි යැ, අවිතර්කඅවිචාරසමාධි යැ යන ත්‍රිවිධසමාධීන් දන්නා නුවණ යැ, නිරොධසමාපත්ති හා සමග රූපාරූප අෂ්ටසමාපත්ති දන්නා නුවණ යැ, හානභාගි වූ සංක්ලේශයන් දන්නා නුවණ යැ, විශේෂභාගි වූ ව්‍යවදනධර්මයන් දන්නා නුවණ යැ, ඒ ඒ සමාපත්තීන් ව්‍යුත්‍ථානව්‍යවදනකරධර්මයන් 'මොහු ව්‍යුත්‍ථානයහ. මොහු ව්‍යවදනකරයහ'යි දන්නා නුවණ යැ යන මේ සත්වන ඥනබලයෙන් යුක්ත වූ සේක. එසේ වූ-පෙ-යුතු.

## 215 216 & 217

තව ද, "එකම්පි ජාතිං ද්වෙපි ජාතියො" යනාදීන් අතීතා පරිමිතකාලයෙහි ස්කන්‍ධසන්තානයෙහි පවත්නා නුවණ යැ යන අටවන ඥනබලයෙන් යුක්ත වූ බුදුන්-පෙ-යුතු.

තව ද, මේ සත්‍වයෝ කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් යුක්ත වැ පණ්ඩිතජනයන් කී පරිද්දෙන් සම්‍යක්ප්‍රතිපත්තියෙහි නො පැවැතැ මිථ්‍යාදෘෂ්ටි ගෙණැ මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන කළ හෙයින් මරණින් මත්තෙහි අපායෙහි උපදනාහ'යි දන්නා නුවණ යැ, තව ද, මේ සත්ත්වයෝ කායසුචරිතයෙන් වාක්සුචරිතයෙන් මනඃසුචරිතයෙන් යුක්ත වැ නුවණැත්තවුන්ට පරිභව නො බණනු කොට උන් කී පරිද්දෙන් මනා වූ ප්‍රතිපත්ති කොට සම්‍යග්දෘෂ්ටික වැ සම්‍යග්දෘෂ්ටිසමාදන කළ හෙයින් මරණින් මත්තෙහි සුගතියෙහි උපදනාහ'යි දන්නා නුවණ යැ, තව ද, මෙසේ මියන සත්ත්වයන් ද, උපදනා සත්ත්වයන් ද, හීනසත්ත්වයන් ද, ප්‍රණීතසත්ත්වයන් ද, සුවර්ණසත්ත්වයන් ද, දුර්වර්ණ සත්ත්වයන් ද, සුගතියෙහි හා අපායෙහි තමන් තමන් කළ කර්ම වූ පරිද්දෙන් සුව විඳිනා දුක් විඳිනා සත්ත්වයන් ද විශුද්ධ වූ මනුෂ්‍යයන් ඉක්මුනා වූ දිවඇසින් දන්නා නුවණ යැ යන මේ නවවන ඥනබලයෙන් යුක්ත වූ බුදුන්-පෙ-යුතු.

තව ද, 'තථාගතතෙමේ ආස්‍රවක්ෂය කළ හෙයින් අනාස්‍රව වූ චෙතොවිමුක්තිප්‍රඥවිමුක්තිසංඛ්‍යාත වූ නිර්වාණාලම්බන වූ ඵල සමාපත්ති සමවැද වාසය කෙරේ'යි දන්නා නුවණ යැ යන මේ දසවන ඥනබලයෙන් යුක්ත වූ බුදුන්-පෙ-යුතු.

Non-Commercial Distribution

### 218 & 219

තව ද, "තොපගේ ස්වාමිදරුවෝ කවුරු දැ"යි විචාළකල්හි "ශාක්‍යසිංහ වූ සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ යැ, මාගේ ගුරු යැ'යි කීකල්හි "ඌ[1] කුමක් දන්නා ගුරු කෙනෙක් දැ?"යි නො කිය "ඉතා යහපතැ. ගුරුන් ලද්දේ නම් ලොකයෙහි තෙපි මැ යැ"යි ඉතා සතුටු සොම්නස් වැ ලෝවැස්සන් ප්‍රශංසා කරණ තුන් ලොවට එකගුරු වූ, තව ද, ගෙ පිරුණු නෑයන් හැරැ, කොටාර පිරුණු ධන හැරැ, සසරෙහි කළ හයින් තමන් කරා වැදැ මහණ වූ කුලදරුවන්, සතුන් වඩාලා රජමුළුතැන්හි අරක්කැමියන්ට කර අඹරන්නට පාවා දෙන්නා සේ, නරකයෙහි යමපලුන් අතට කපන්නට පළන්නට පාවා දෙන තීර්ත්‍ථකගුරුන් ලද්දේ පවා "සසරට පිටුවහල් ලදුම්හ"යි කියා සතුටු වෙති. "ඇපි වූ කලි බසැ අර්ත්‍ථයක් නොදන්නා වූ මඩුවන්නට පවා තමන් වදරණ බස්මාත්‍රයක් ඇසූපමණින් මැ අමාමහනිවන් දක්වන ස්වාමිදරුවානන්කෙනෙකුන් ලදුම්හ"යි ලෝවැස්සන් විසින් අනවරතයෙන් ප්‍රශංසා කරණ බුදුන්-පෙ-යුතු.

තව ද, 'මවු යැ'යි සිතා යකින්නක් තනය වැදැ ගත් බාල කුමාරයන් සේ 'අපට මෙහි තුබූ ප්‍රතිපත්තියෙකැ' යන සංඥවෙන් ලෝවැස්සෝ මිථ්‍යාදෘෂ්ටි ගත්හ. ඒ මිථ්‍යාදෘෂ්ටියට උපදෙශ දෙන ගුරුන් පොවා පාමුල්හි හිඳැ 'ගුරුන් ලදුම්හ'යි තියැලෙති. මම වූ කලි සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි මනා කොට ගසාගත් සක්හෙලි වූ සුව සේ යා හැකි මනා වූ ප්‍රතිපත්ති නමැති මහින් තමන් ආශ්‍රය කළවුන් අමාමහනිවන්පුරෙහි ලන තුන්ලොවට එකශරණ වූ ධම්චක්‍රවර්ති වූ බුදුන් සරණ යෙමියි-පෙ-යුතු.

### 220, 221 & 222

ඉසුරන් මඳුලු කා දැමූ කොස්වහලු කා රැකෙන ගවයන් සේ, මාගේ බුදුන් වහන්සේගේ සස්නෙහි ශ්‍රාවකයන් ප්‍රතිපත්ති වළඳ හළ වසලු වැනි ලඝු වූ ප්‍රතිපත්ති පිරූ ගිහිවැසි උපාසකයෝ පවා අනාගාමි මහ දක්වා ලැබෙති. එබඳු වූ මනා වූ ප්‍රතිපත්ති පානා වූ බුදුන්-පෙ-යුතු.

ඉසුරන්ගේ ගෙහි වැඩි[2] ගිරවුන් මිහිරිමිනිස්බස් ඉගෙණැ බණන්නා සේ, තමන්වහන්සේගේ ශාසනයට වන් මේ අප මිනිස් තිරිසනුන් ලවා ධම්විනය වැනි සුභාෂිතයක් බණවන බුදුන්-පෙ-යුතු.

---

1. උන් 2. වැසි

Non-Commercial Distribution

තව ද, සෙසු 'බුදුම්හ'යි කියන්නවුන්ගේ ශාසනෙයහි වන් සත්ත්වයෝ සෙසු සුව තබා තමන් වරදවා ගත් ධර්මය හෙතු කොට ගෙණැ අටමහානරකයෙන් ගැලවී ගත නො හෙති. මම වූ කලි නිල්මහනෙල්පිටපෙති 'බෙරවාපෙති යැ'යි හැර යට සිටි යහපත් මුවරඳ ඇති සුවඳපෙති පලඳවන්නක්හු සේ, තමන් සරණ ගියවුන්ට දෙව්බඹසැපත් බෙරවාපෙති කොට හැර සොපධි ශෙෂ නිරුපධිශෙෂ නිවන්සුවදින් යුක්ත වූ ආර්‍ය්‍යදහම් නැමැති සුවඳපෙති පළඳවන බුදුන් සරණ යෙමි යි-පෙ-යුතු.

## 223 & 224

ඇවිළෙන ගිනිකඳ නිවන්නට ඔත් තෙල්ධාරාවක් සේ, සසර ගිනි නිවන්නට තෘෂණාදෘෂ්ටි නැමැති තෙල් ඕනවුන් පවා ස්වගුරු කොට ගත්තා වූ සත්ත්වයෝ පවා "ගුරුහු නම් අප ලද ගුරුහු යැ"යි බැහැවෙති. මම වූ කලි වනයෙහි ඉපැදැ එ මැ වනය[1] සහමුලින් දැවූ ලැව් ගින්නක් සේ, සසරෙහි මැ වැසැ, එම සසර සහමුලින් දැවූ සර්‍වඥ වියතානන් වැනි ගුරුන් ලදිමි. අනික් කුමක් කියම් ද? නිවන්පුරයෙහි වළදෙර දිටිමියි[2] සියලු ලෝවැස්සන් විසින් වෙන වෙන තුටුපහටු වැ උන් සරණ ගිය දවස් තමා සසරින් මිදී නිවන්හි සිටියා කොට සිතා නොයෙක් ලෙසින් වැඳැ පුදනලද, ඒ නිවන් දෙන්නා වූ බුදුන්-පෙ-යුතු.

## 225 & 226

තව ද, සමහර සත්ත්වයෝ නොදත්දෙයත් "දතුම්හ"යි සඟවා ලොව සිත් ගන්නා පිණිස නොඑක් සැල්වැල් දෙඩන ක්ලේශ විකාර ඇත්තවුන් පවා "ගුරුහ"යි වැඳ පුද වෙහෙසෙති.[3] 'තමන් ලයට වන් නවලොවුතුරු දහම්එකගාථාපදයකිනිදු අනන්තාපර්‍ය්‍යන්තඋද්ඝටිත ඥවිනෙයයන් සිතට නහා දෙසා ලන සියලු ලොවට එකාචාර්‍ය්‍ය වූ බුදුරජානන් ගුරු කොට ලදිමි'යි සියලු දිව්‍යබ්‍රහ්මාදී වූ සත්ත්වයන් වෙන වෙන මැ විඳැ විඳැ මත් වැ ස්තුති කරන්නා වූ බුදුන්-පෙ-යුතු.

තව ද, කොසඹෙහි බඳත් මී මිහිරි වෙයි. කුරුඳුගසැ සෙවන ද සිහිල් වෙයි. මෙසේ කිසිලෙසකිනුත් වස්තුන්ගේ ගත යුතු බවෙක් ඇති වෙයි. ගිනි ගත් අසුචිවළක් සේ නොසකස් වූ නො සිහිල් වූ දෙසැටදෘෂ්ටියට භාජන වූ තීර්ත්‍ථිකශාස්තෘන් ගුරු තැනට තකා ලෝවැස්සෝ වෙහෙසෙති. ඇපි වූ කලි සියලු අර්ත්‍ථ සිද්ධ කරණ හදසටයක් දෙඅතින් හැර මුදුනෙහි තැබුම්හ. කැමැති කැමැති වස්තු දෙන කප්රුකක් වැලැඳැ ගතුම්හ. ලොකාචාර්‍ය්‍ය වූ අනාචාර්‍ය්‍ය වූ අද්වෛතවාදී වූ බුදුරජානන්

---

1. හැම වනය.　　2. හළදෙර සිටි.　　3. වෙසෙති.

Non-Commercial Distribution

වැනි ගුරු කෙනෙකුන් සුව සේ ලදුම්හයි සියලු අනන්ත සත්ත්වයන් සතුටු සොම්නස් වැ වැඳැ පුද ස්තුති කරණ තිලෝගුරු බුදුරජානන්-පෙ-යුතු.

## 227 & 228

තව ද, ඇඟ ගැවුනුගැවුනන් ශරීරයෙහි වැදැගන්නා[1] කුෂ්ඨ රෝග ඇත්තක්හු එ වසා පිළී පෙරෙ වැ නො හහවා ගම් වදනා සේ, පැහැසුනුපැහැසුනුවන් කෙලෙසන මිථ්‍යාදෘෂ්ටි වැනි සංක්‍රාන්ති කුෂ්ඨයක් "ධර්‍ම යැ" යන නමින් වසාලා ලොව පරිවර්‍තනය කරණ තීර්‍ත්‍ථකගුරුන් ලද්ද වූ ඒ සත්ත්‍වයෝ පවා "සරණක් ලදුම්හ"යි සතුටු වන්නාහ. ඇපි වූකලී "තමන් වදළ සුවාසූදහසක් ධර්‍මස්කන්‍ධයෙහි එකි එකී පිළි මැ එකි එකී අකුරු මැ නිවන්රසයෙන් එකරස කොට වදරණ අසාධාරණ වූ බුදුකෙනෙකුන් ලදුම්හ"යි සියලු දෙව්බඹුන් කරණ ප්‍රශංසා ඝොෂයෙන් සියලු ලොව එකඝොෂ කරවූ බුදුන්-පෙ-යුතු.

තව ද, අඥානසත්ත්‍වයෝ වසපක් ගත් කිම්ඵලවෘක්‍ෂය ආශ්‍රය කොට තමන් ලද්ද වූ ලාභ කොට සිතති. 'ඇපි වූකලි ආදී දළුව ලූ දවස් පටන් කොට මල් ගන්නා පලු ගන්නා ඵල ගන්නා අවස්ථා දක්වා නිවන්රසයෙන් මිහිරි ඵල ගන්නා බුදු අමාරුකක් ආශ්‍රය කළම්හ'යි සියලු සත්‍වයන් විසින් මුදුනෙන් පුදනු ලබන-පෙ-යුතු.

## 229 & 230

තව ද, තීර්‍ත්‍ථකශාස්තෘහු, කසල්ලෙන් බස්නා ද මැ තමන්ගේ පැටවුන් අසුචිබලුකුණු ආදි ඇති නොසකස්තෙනට ගෙණැ වදනා කවුඩුවන් සේ, තමතමන්ගේ ශාසනයට වන්නවුන් ආදියෙහි සිටැ මැ අධර්‍ම අශුචිකුණපයෙහි හසර කරවති. ඇපි වූකලී ආදියෙහි සිටැ මැ තමන්ගේ පැටවුන් පියුම්විලට මැ ගෙණැ වදනා රාජහංසයකු සේ, ආදියෙහි පටන් ගෙණම තමන්ගේ ශ්‍රාවකයන් සද්ධර්‍මයෙහි මැ හසර කරවන බුදුරජානකෙනෙකුන් ලදුම්හයි සියලු ලෝවැස්සන් සතුටුකඳුළු ගන්වන්නා වූ බුදුන්-පෙ-යුතු.

තව ද, විෂශරයෙන් පහර කැවෝ 'මේ මෙතැනට පිළියමැ'යි කිව, අසුචි වළඳත් ඒ විෂයට ප්‍රතිකාර කෙරෙති. කැරැ එසේ ලද්ද වූ ජීවිතය කෙතෙක් කල් පවත්වත් ද? මම වූ කලී කෙලෙස් නැමැති විෂශරයෙහි

---

1. වදතී යන

Non-Commercial Distribution

පහර කැ ලොවට සද්ධර්‍ම නැමැති අමාරස වළඳවන මිහිරි වූ පවිත්‍ර වූ පිළියම් දන්නා තිලෝගුරු බුදුරජානන් ලදිමි. ඒ රස වැළැඳුවෝ නැවැතැ සසරට නො වැදැ ස්ථිර වූ අමාමහනිවන්සුව අනුභව කෙරෙති. එසේ වූ ස්වාමිදරුවානන් මා ලද්දේ යැ යි සියලු සත්ත්වයන් වෙන වෙන ප්‍රශංසා කරණ-පෙ-යුතු.

## 231 & 232

තව ද, ඇසට මිහිරි කණට මිහිරි සිතට මිහිරි ඥෙයමණ්ඩලය පමණින් නුවණ පමණ ලද සියලු ලොව තමන්ට ගොචර කොට තුමූ අනුන්ට ගොචර නො වැ අනන්තාපරියන්තගුණ ඇතිබවට සැලැසී සිටි බුදුරජාණන්-පෙ-යුතු.

තව ද, තමා මදනුවණ ඇතිහෙයින් කී දෙයෙහි තත්ත්වය නො හැහෙතුදු, "ඒ ස්වාමිදරුවානන් වදළ දෙයෙක් අනික් ලෙසෙකැ නො පෙරෙළෙ"යි කියා කළ හැදැහිලි පමණෙකින් මැ දෙව්සැපත් නිවන්සැපත් එළවන, ගිය ජාතියක් පෙරළී නොඑන්නා සේ හළ කෙලෙසුන් පෙරළී තමන් සිතට නො එන, තමන් නුවණින් දත යුතු වැ සිටි බැවින් සියලු ධර්‍මයන්ට ඥෙය යන ව්‍යවහාර කර වූ අද්වෙතවාදී වූ අවන්ධ්‍යවාදී වූ අමෘතවාදී වූ අතුල්‍යවාදි වූ ධර්‍මවාදි වූ විනයවාදි වූ හිතවාදි වූ යුක්තවාදි වූ මුක්තිවාදි වූ ශාන්තිවාදි වූ බුදුන්-පෙ-යුතු.

## 233.

මිහිරට මිහිරි වූ, සිහිලසට සිහිල් වූ, ආචාර්‍ය්‍යයන්ට ආචාර්‍ය්‍ය වූ, වියතුන්ට වියත් වූ, මහතුන්ට මහත් වූ, පිදිය යුත්තන්ට පිදිය යුතු වූ, ග්‍රාහ්‍යයන්ට ග්‍රාහ්‍ය වූ, භාවනීයයන්ට භාවනීය වූ, දර්‍ශනීයයන්ට දර්‍ශනීය වූ, මාර්‍ගණීයයන්ට මාර්‍ගණීය වූ, කමනීයයන්ට කමනීය වූ, ඍනවනීයයන්ට ඍනවනීය වූ, සෙව්‍යයන්ට සෙව්‍ය වූ, භව්‍යයන්ට භව්‍ය වූ, අනුශාසකයන්ට අනුශාසක වූ, චක්ෂුෂ්මතුන්ට චක්ෂුෂ්මත් වූ, අග්‍රාම්‍යයන්ට අග්‍රාම්‍ය වූ, කුලවතුන්ට කුලවත් වූ, මහඇඟියන්ට මහඇඟි වූ වාදීන්ට වාදි වූ, වාග්මීන්ට වාග්මී වූ, ගමකයන්ට ගමක වූ, ශාන්තයන්ට ශාන්ත වූ, දන්තයන්ට දන්ත වූ, ලොකඥයන්ට ලොකඥ වූ, මාර්‍ගඥයන්ට මාර්‍ගඥ වූ, පරමවෛයක්ත්‍ය[1] පාරගත වූ බුදුන්-පෙ-යුතු.

---

1. වෛදුෂ්‍ය. වෛධ්‍යත්‍ය වෛසක්‍ය

Non-Commercial Distribution

## † 234, 235 & 236

* බොහෝ කලක් පුරුදු වැ ද නො වැළැකැ ආ තමන් ස්නෙහයක්[1] සේ, නිවන් දක්නා කැමැත්තවුන් විසින් නො හැරපියැ යුතු වූ ස්නෙහ කට යුතු වූ සුවිසි අසංඛ්‍යයක් සත්‍වයන් තමන් නිවන්හි ලුව ද සත්‍වයන් විසින් අඩුවක් නො පෙණෙන ලොවක් සේ, සියලු සත්‍වලෝකයා තමන්ගේ ගුණ පොහොනා[2] පමණින් කිව ද, විචිත්‍ර වූ තමන්ගේ ගුණයෙහි අඩුවක් නොපෙණෙන පරිද්දෙන් මිහිරි ගුණ රැස් කළ බුදුන්-පෙ-යුතු.

* අව්වෙන් තැවී විරී මිහිරි සිහිල් ගං වැ ගිය හිමපටලයක් සේ, සසරපමණින් කෙළෙහි ගුණ නො දන්නා ලෝවැස්සන් තමන් නොඑක් දුකින් තැවුතැවූ සේ මැ තමන් ළය මොළොක් කොට කරුණාගඟ පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

* රදවුන් පයින් මැඩි මැඩි සේ මැ පිළියෙහි කසට නැහෙන්නා සේ, වදුරු වැ කෙළෙහි ගුණ නො දන්නා තැනැත්තහු තමන් පිට මැඩි මැඩි සේ මැ තමන් සිත්හි කසට හළ මහාකරුණා ඇති මහතානන්-පෙ-යුතු.

## 237-240

* ගලින් තැළු තැනැත්තහුට ඇතුළෙහි මිහිරිපක්කඩ දෙන රසසම්පන්න පොල්පකක් සේ, තමන් හිස් තැළු දුර්ජනයන්ට මිහිරි කරුණා එළවූ බුදුන්-පෙ-යුතු.

* මතින් ඇලැළු ඇලැළු සේ මිහිරි වූ තෙල් නැහෙන දිහියක් සේ දුර්ජනයන් ඇලැළු ඇලැළු සේ මැ ස්නෙහ එළවන බුදුන්-පෙ-යුතු.

* පයින් මැඩි මැඩී සේ මැ ටොඹු[3] ලා දළ වන කෙහෙල් දළුවක් සේ, ලෝවැස්සන් ගහට කළ කළ සේ මැ තමන්ගේ කරුණාව දළ කළා වූ බුදුන්-පෙ-යුතු.

* ගින්නෙහි තැවු තැවූ සේ මොළොක් වන යකඩයක් සේ ලෝවැස්සන් දුක් දී තැවු තැවූ සේ මැ ළය මොළොක් මැ කළ බුදුන්-පෙ-යුතු.

---

* මේ ලක්ෂණෙන් යුත් හැම වැකී 'තවද' යන්නෙන් ආරම්භ වේ

† මෙහි සමහර පොත්හි 234 වන අංශය වශයෙන් යට දැක්වූ 41 අංශය පැණේ

1. ආත්ම ස්නේහයක්
2. නොපොහොනා
3. තුඹු

Non-Commercial Distribution

## 241-245

* ගිම්සමයෙහි දළු ලන කිඳිලුහුනක් සේ, සංසාරව්‍යසනයෙහි තමන්ගේ කරුණාව නො මලවා දළු ලැවූ බුදුන්-පෙ-යුතු.

* ගණිකාචාරකර්මයෙහි නිරුපද්‍රව වූ තමාගේ වල හැරැ පියා ඇතින්න පස්සෙහි උපද්‍රවසහිත වූ ගමට වන් කාමුක වූ ඇතකු පරිද්දෙන් දීපඞ්කරපාදමූලයෙහි ලද නිවන් හැරපියා කරුණාව පසුපස්සෙහි භයඞ්කර වූ සසරට වන් බුදුන්-පෙ-යුතු.

* පැළු පැළු සේ කපුරු පැණෙන කපුරුගසක් සේ වෙත්‍රයෂ්ටිකපි ජාතකයෙහි තමන් පිට පැළු පැළු සේ අනුග්‍රහ මැ දැක්වූ බුදුන්-පෙ-යුතු.

* ලියත් ලියත්[1] රුහළුවෙහි හෙන[2] ඇත්දළක් සේ, තමන් ඇඟ මස් ලියලියා බුදුහළුයේ හුනු බුදුන්-පෙ-යුතු.

* මනා වූ බිම්හි ලිං කැතිකැති සේ මිහිරිදිය දක්නා සේ, සැතින් කැපුකැපූ සේ පැළුපැළු සේ, මෛත්‍රීකරුණාරස දක්වන බුදුන්-පෙ-යුතු.

## 246-250

* ගිනිවර කළකළ සේ පැහැයෙන් බබලන මැණිකක් සේ, සසර ගින්නෙහි තැවුනුතැවුනු සේ මැ අධික වූ තේජස් ලදින් බැබලුනු බුදුන්-පෙ-යුතු.

* හිරුවිමනැ ඇතුළෙහි වැසැ 'ගිමැයි' නො තැවෙන හිරු දෙවියා සේ, සසරැ වැසැ සසරගිමින් නො තැවුනු බුදුන්-පෙ-යුතු.

* මුහුද කෙසේ මහත් වුව ද, පිපාසිත වැ මිහිරිපැනක් කැමැත්තවුන් මුහුදුකෙළ ලිඳට මැ දිවන්නා සේ, සත්ත්වලොකය කෙසේ මහත් වුව ද, දහම කැමැත්තවුන් තමා කරා මැ දිවැවූ බුදුන්-පෙ-යුතු.

* කිරට අවුළු වූ ශර්කරාවක් සේ, තමන්ගේ දෙශනාවිලාසයට තමන්ගේ රූපය අවුළු කළ බුදුන්-පෙ-යුතු.

* දෙවොලෙහි තමන් පිදූ බත තමන් නො කන්නා සේ, ලොවැස්සන්ට තමන් පුදපූ කාය ජීවිතය දෙකින් තමන්ට ප්‍රයෝජනයක් නො කළා වූ බුදුන්-පෙ-යුතු.

---

1. ලියපත් ලියපත්. 2. රුළක එන.

Non-Commercial Distribution

## 251-255

* මහවතුරු ගෙණැ මහගං වන ද නො වන ද, අඩුවැඩි නො පැ එකාකාරයෙන් සිටි මුහුදක් සේ ලාභාලාභයෙහි එකාකාර ව පිරී[1] සිටි බුදුන්-පෙ-යුතු.

* නොයෙක් මලින් ගත් රෙහෙණු මිහියෙන් එකරස කළ බමරතුඩක් සේ, සසරැ වෙන වෙන තමන් ගත් සමතිස්පැරුම් එක සර්‍වඥතාරසයෙන් මිහිරි කළ බුදුන්-පෙ-යුතු.

* අඤ්ජනකුලයෙහි කළුඇතුන් අතුරෙහි ධවල වැ ආශ්චර්‍ය්‍ය වූ ශ්වෙතහස්තිරාජයක්හු සේ, හැම පාපධර්‍මයෙන් කිලුටු ලොකයෙහි කෙවල වැ ශුද්ධ වැ මහඇඟි වැ සිටි බුදුන්-පෙ-යුතු.

* මුහුදු වැදැ පැන් පූ තිමිංගලයන් ඒ සා මහත් වුව ද මුතුබෙල්ලන් පූ පැන් මැ මුතු වන්නා සේ, මේ ලොකයෙහි දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍යයන් ආදි සත්ත්වයන් කෙසේ පැලැඟි වුව ද තමන්ගේ වටු සන්තානයෙහි හුනු ගුණ මැ බොධිපාක්‍ෂිකධර්‍මයන් කළ බුදුන්-පෙ-යුතු.

* නයින්ට සිහිලස දී උන්ගේ වසදුස්මෙන් තමා මලන සඳුන් රුකක් සේ, ලෝවැස්සන්ට සුව දී එලෝවැස්සන් දෙන කම්කටොලෙන් තමන් දුක්පත් වන බුදුන්-පෙ-යුතු.

## 256-259

* රජහට කුඩ ලන තැනැත්තහු තමා අවු කකා එ රජුහට අවු ගිය ගිය තෙනට කුඩය නමන්නා සේ, නොයෙක් සසරදුකින් තමන්ගේ ශරීරය වියැලෙතුදු ලෝවැස්සන්ට දුක් එන මහට මැ කරුණාව නැමූ බුදුන්-පෙ-යුතු.

* බුරුල්ලෙහි මිටිපහර ලද ලද සේ මැ කිරි එරවූ දෙනක සේ, ලෝවැස්සන් අතින් ගහට වුන් වුන් සේ මැ එ ලෝවැස්සන්ට සුව එළවූ බුදුන්-පෙ-යුතු.

* නො පල ගත් මහරුක් සුව සේ සිටියැ දී අනුන්ට ප්‍රයෝජනවත් ව පල ගත් හෙයින් සිඳී බිඳී පොලුපහර ලබන පල ගත් රුකක් සේ, කරුණා නො ගත්තවුන් යෙහෙන් විසියැ දී සත්ත්වකරුණා ගෙණැ තමන් සිඳුනු බිඳුනු මහාකරුණා ඇති බුදුන්-පෙ-යුතු.

* තමාගේ පාමුලෙහි අඳුරු නො නසා තමා නැඟූ සියලු ගෙහි අඳුරු නසන මහත් වූ පහනක් සේ, තමන්ගේ ව්‍යසන නො නසා අනුන්ගේ දුක් පහ කරණ බුදුන්-පෙ-යුතු.

---

1. නිවී පිරී

Non-Commercial Distribution

## 260.

*මුව වැ රන්වන් වන, ඇත් වැ ධවලවණී වන, බලු වැ ධාර්මික වන්නා වූ, කවුඩු වැ අභය දෙන්නා වූ, මස් වැ වැසි වස්වන්නා වූ, වටු වැ ලැව්ගිනි නිවන්නා වූ, ගිරා වැ මවුපියන්ට කරණ උපස්ථානයෙහි නො පමා වන්නා වූ, මොනර වැ පසේබුදු කරන්නා වූ, සිරලෙහෙණ වැ මහමුහුදැ දිය ඉස්නට සිතන්නා වූ, රජ වැ දිවි හැර සබවස රක්නා වූ, පිනිබිඳුහු ගත් අනිත්‍යතාව දැකැ රජය හැරැ වල් වදනා වූ, විෂඝොර වූ නාග වැ මහත් වූ මෛත්‍රී පවත්වන්නා වූ, කුමාර වැ පැන කීමෙන් සියලු දඹදිව දනන්නා වූ, කුණාල වැ කාමගුණයෙහි ආදීනව දෙසන්නා වූ, තෙමිය[1] කුමාර වැ තුන්ජාතියක් සිහිකොට රාජ්‍යය කිරීමෙහි දෙෂ දක්නා වූ, සොළොස්හැවිරිදි කුමාර වැ මහමුහුදු පිහිනන්නා වූ, අත්පා කැපුව ද මෛත්‍රී පතුරුවන්නා වූ, රජය හැරැගෙණැ වළෙහි කැනැ හිඳුවාපූවන් කෙරෙහි මෙත්සිත් පතුරුවන්නා වූ, සා වැ තමන්ගේ මස් දන් දෙන පිණිස ගින්නට වදනා වූ, වඳුරු වැ "මම යැ මාගේ යැ" යන මිනිසුන්ගේ බස් අසා කණ පියාගෙණැ නින්ද කරණ පිරිස් ලද්ද වූ, විෂ පෙවූ හීයෙන් පහර කා හෙතුදු මවුපියන්ගේ දිශාවට හිස් ලා හෙන්නා වූ, ගිරා වැ වැදැ හිඳැ මළ රුකු නො හරණා පමණ කෙළෙහි ගුණ දන්නා වූ, හුරුතුඩින් බණ දෙසන්නා වූ, වහලක් නැති මුහුදැ හී මණිමෙබලාව වැනි දසීන් ලද්ද වූ, තුන්ලොවට එක ගුරු වූ, ඒ මහතානන් ඒ වියතානන් ඒ හිමියානන්-පෙ-යුතු.

## 261-265

* තමා සිදී ද සසරපමණින් සියලු ලොවට උපද්‍රව වැද්දැ නොදී රකවල් වැ සිටි බුදුන්-පෙ-යුතු.

* ලෙඩතෙනැත්තවුට ශාන්ති පිණිස යක්හට දුන් කුකුළු බිල්ලක් සේ, රාගද්වේෂාදිපාපධම් නමැති රෝගයෙන් වලදනාලද සත්‍වයන්ට ශාන්ති පිණිස සසරට තමන් බිලී කොට දුන් බුදුන්-පෙ-යුතු.

* පාරමිතා නො පිරේ නම්, ශක්‍ර වැ හිඳිනා වූ පණ්ඩුකම්බල සිලාසනයෙහි දු නො තැවී නො හිඳිනා වූ, පාරමිතාවට වහලක් දුට හොත් මඤ්චපත්‍යකබල දු සුවතලයහන් කොට සිතන්නා වූ බුදුන්-පෙ-යුතු.

* ගින්නෙහි හී දෙෂ දැ දැ සේ ශුද්ධියෙහි හුණු රත්රණක් සේ, සසරෙහි හී ආත්මස්නේහය ද ගොසින් පරමාත්‍ථයෙන් ශුද්ධියෙහි හුනු බුදුන්-පෙ-යුතු.

---

1. තෙමේ

Non-Commercial Distribution

* සොළොස් පණ්ණතිකායෙහි පැහැ ඉක්මැ ඇණමාත්තුවෙන් වැඩී සිටි මහදඹපියෙසින් නැඟි රණක් සේ, සියලු ලොව්හි දිව්‍යබ්‍රහ්මාදීන් තමන් නැහැස්මට අඩු ඇණ කොට සියලු ලොවට අධික වූ වැඩි ඇණ පැ සිටි බුදුන්-පෙ-යුතු.

**266-270**

* ඒ සා මහත් වූ බල ඇති වැ ද, පිටැ හුන් තෙනැත්තහු පයට යැතෙන[1] ඇතක්හු සේ, ඒ සා මහත් වැ ද දුගීන් ඉඟි දැනැ ඔවුන්ගේ ගිහි වූ පරිද්දෙන් යැතෙන්නා වූ බුදුන්-පෙ-යුතු.

* මඳ නො කොට අධික නො කොට පමණ දැන සුණු කෑ කල්හි යහපත් වැ යෙදෙන බුලතක් සේ, නො මඳ නො බොහෝ කොට තමන් ලෙහි වැසවූ[2] කෙලෙසින් යෙදී මනහර වූ-පෙ-යුතු.

* යුද්ධභූමියෙහි මිනියට නො නැමී සතරපයින් බිම්හි දී දළින් අහස්හි දී මරණ ඇත්හු උපද්‍රවයක් නැති වැ ජය ලබන්නා සේ, කෙලෙසුන් කරා නො නැමී ස්වභාවයෙන් සිටැ ක්ලේශයන් සතර සෘද්ධි නැමැති සතරපයින් ගහටා සමථවිදර්‍ශනා නැමැති දෙදළින් ඇනැ මුල් සිඳැ නැති කොට ජය ගත් බුදුන්-පෙ-යුතු.

* තමා පිහිටා ගත් දුන්නට[3] පිටි පෑ දිවූ හීයක් සේ, තමන් උපන් සසරට පිටි පෑ දිවූ බුදුන්-පෙ-යුතු.

* බත් පැසෙන පමණක් ගිනි ඇවිළී තිවෙන ජොතිපාෂාණයක් සේ, බොධිපාක්ෂිකධර්‍මයන් පැසෙන තුරු මැ සිත්හි කෙලෙස් ගිනි ඇවිළු බුදුන්-පෙ-යුතු.

**271-275**

* ගිරාහු තැවී හඬන හඬ ද මිහිරි නො හරණා සේ, තමන් ක්ලේශයෙන් තැවී නො එක් ජාතියෙහි තමන් ඇඩූ හඬ දහමින් මිහිරි කළ බුදුන්-පෙ-යුතු.

* පොහොසත් රජහු හළ සැප ජනයන් මුදුනෙන් පිළිගන්නා සේ, බුදු වන පිණිස තමන් හළ සළු බඹුන් මුදුනෙහි පිළිගැන් වූ බුදුන්-පෙ-යුතු.

* පිසඹුරු පිහිරා මහනෙල්මලට වදනා සුවඳ කැමැත්තන් සේ, දෙව්බඹුන් පිහිරා ගුණ තකා තමන් කරා සියලු ලොව වදනා පරිද්දෙන් ධර්‍ම නැමැති සුවඳ ගත් බුදුන්-පෙ-යුතු.

1. ඇතෙන. 2. ලෙහි මැ සව් 3. දුන්න.

Non-Commercial Distribution

* පැන් වක්කොට තුබූ බත් පිළිහිති නො වන්නා සේ, සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් තමන්ගේ සිත කරුණා නැමැති දියෙහි ගලා තබා නො පිළිහිති කළ බුදුන්-පෙ-යුතු.

* මුදෙහි ඉපැදැ ලුණුකර නො වූ මුහුදුමසක් සේ, මෙවෙනි සසරෙහි වැස ද සියලු සත්‍වයන්ට විරස නො වූ බුදුන්-පෙ-යුතු.

## 276-280

* කපුරු රක්නා පිණිස අඟුරුත් එකවිතැ ලන්නා සේ, තමන්ගේ ලෙහි බොධිසත්‍වගුණ රක්නා පිණිස ක්ලේශයනුදු එ මැ ලෙහි ලා සසර පමණින් ආවා වූ බුදුන්-පෙ-යුතු.

* උස් වූ කෙත්වතැ වට පැතින්[1] යට කෙත්වත් රැකෙන්නා සේ, ලොවට උස් වූ තමන්ගේ කරුණාවෙන් සියලුලොව තෙමූ බුදුන්-පෙ-යුතු.

* ද ගත් කුඹුරෙහි තිරිහැල්ලක් සේ, තමන් පිරිනිවන් පැව ද තමන්ගේ ධාතුන් නැමැති තිරිහැල් ලෝවැස්සන්ට තබාලා ගිය බුදුන්-පෙ-යුතු.

* ගෙරිපුවර බඳ බඳ සේ සුහුඹුල් වන කෙත්වතක් සේ, ලෝවැස්සන් දැමූ කෙළසෙම් ආදීන් තමන් ලෙහි ගුණ සුහුඹුල් කළ බුදුන්-පෙ-යුතු.

* ආලම්බනයෙහි ආයුපමණින් උපදනා වීථිසිත්පරම්පරාවක් සේ, ලෝවැස්සන්ට හිතපමණින් පවත්නා සද්ධර්මප්‍රවාහ ඇති බුදුන්-පෙ-යුතු.

* හිරු සිටි දිගට පිළිලොම් වැ පැහැයෙන[2] දියවරක් සේ, ක්ලේශයන්ට ප්‍රතිලොම වැ පැහැයෙන සිත් ඇති බුදුන්-පෙ-යුතු.

## 281-285

* සිත්තරහු සිතැ රසයෙන් මනහර වන සිත්තම්රුවක් සේ, තමන් සිතෙහි වන් කරුණාරසයෙන් තමන්ගේ ගුණ බුදුමනහරින් මනහර කළ බුදුන්-පෙ-යුතු.

* සිත අනු වන කාය[3] ප්‍රවෘත්තියක් සේ, ලෝවැස්සන් සිත අනු වූ[4] පැවතුම් ඇත්තා වූ බුදුන්-පෙ-යුතු.

1. කෙත්වත වට පැ පැතින්. 2. පැසෙන.
3. කායඝී. 4. අනුවා.

Non-Commercial Distribution

* එකගඟැ පැන් මුහුදට වන ලුණුකර වෙයි. විලට වන මිහිරි වැ සිටී. එසෙයින් ම සෙසු සතුන් ලයට වන් එ මැ ගුණ අනුන්ට හිතයක් කට නොහෙනබැවින් අනුභව නො කට යුතු වියැ. සර්‍වඥයන්ගේ ලයට වන් එ මැ ගුණ සියලු ලෝවැස්සන් විසින් අනුභව කටයුතු වි යැ. මෙසේ මිහිරිගුණ ඇති බුදුන්-පෙ-යුතු.

* ලොකයෙහි එකකට නො හඩු වැ මිහිරි වූ, සියලු ලොවට නො කුඩා වැ මහත්වූ, බසින් නිවන්රස ඕනා සුභාෂිත දන්නා වූ, දුටුදුටු ඇස අමාරස නමන්නා වූ මනහරබව ඇති, සිතුසිතුලෙහි ශතපාකතෛල ගල්වන ගුණ ඇති, උපන් උපන් සිතෙකැ[1] කරුණාවෙන් නො කරණ මහාකාරුණික වූ, ජාතිජාතියෙහි තමන් සිතට මැ බැහැවී ආ පරිශුද්ධ වූ බුදුන්-පෙ-යුතු.

* මිහිඅඹරුකෙහි හුන් තැනැත්තහු බිමැ සිටැ තමාට ගල් ගැසූවන්ට තමා හුන් ගසින් මීඅඹපක් ගසන්නා සේ, තමන්ට නිඳු බිණූවන්ට මිහිරි වූ සදහම්බස් බණනා බුදුන්-පෙ-යුතු.

## 286-290

* රස නැති දඬෙන් ගැසුවද වීණාව මධුර වූ ශබ්ද පවත්වන්නා[2] සේ, අනුන් තමන්ට යම් දණ්ඩයක් කළ ද සදහම් මුසු මිහිරිබස් මැ කියන බුදුන්-පෙ-යුතු.

* මීහඟෙහි නැඟ ද දුනුකේමල් රජදරුවන් හිසින් පලඳනා සේ මිනිස්ලොවැ මිනිස්කුසින් උපන ද තමන්ගේ ශ්‍රීපාදය දෙව්බඹුන් මුදුනෙහි පලඳවන ගුණසුවඳින් සියලුලොව එක සුවඳ කළ බුදුන්-පෙ-යුතු.

* යහපත් ගොයම් හොග වන පිණිස කුඹුරෙහි පුවර ලන ගොවිතැනැ දක්‍ෂ එකක්හු සේ, සර්‍වඥතා නැමැති හොගය[3] පිණිස සාරාසංඛ්‍යකල්පලක්‍ෂයක් මුළුල්ලෙහි තමන්ගේ සිත් නැමැති කෙත්වතැ ක්ලෙශ නැමැති පුවර බැඳි බුදුන්-පෙ-යුතු.

* බිලයට වැදැ වජ්‍රලෙපයෙහි නො හැලී[4] ගත්තා වූ ඖෂධ පහණබලයෙන් රස ඇති භූමියට වන් පරීක්ෂා ඇති යොගියක්හු සේ, සසර නැමැති බිලයට වැදැ අවිද්‍යා නැමැති විදුරුලායෙහි නො හැලී තමන් නුවණ නැමැති ඖෂධපහණින් බෝමඩ නැමැති සිද්ධස්ථානයට ආවා වූ බුදුන්-පෙ-යුතු.

1. සිතෙන්. 2. පවත්නා 3. සර්‍වඥ නැමැති ගොයම්. 4. ගැලී

Non-Commercial Distribution

* ලෙඩ වූ කිරි බොන බාලපුතක්හු නීරෝග වන පිණිස බෙහෙත් බත් කෑ මවක[1] සේ, ක්ලෙශ නැමැති ලෙඩ ගත් සත්ත්වයන්ට ශාන්ති පිණිස සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි දුෂ්කර ක්‍රියා නැමැති බෙහෙත් වැළඳූ බුදුන්-පෙ-යුතු.

## 291-295

* ගල් වැද සිහිල්පැන් ප්‍රසව කරණ සඳකත්පහණක් සේ, සිංහාදි වූ චණ්ඩසත්ත්ව වැ ඉපැදත් දහම්රස මැ ලොවට නැමූ බුදුන්-පෙ-යුතු.

* තමා ඇකයෙහි හුන් බාලපුතක්හු කළ[2] මලමුත්‍රයෙහි රැහැණි නො වූ සිනෙහැති පියක්හු සේ, වල්මී වැ පවා තමන්ගේ ශරීරයට නැඟී මලමුත්‍රවර්ෂ කරණ වඳුරාට පුත්‍රස්නෙහ ඉපැදවූ බුදුන්-පෙ-යුතු.

* රොගිහට හිත පිණිස ගින්නෙහි පැසෙන බෙහෙදක් සේ, ලෝවැස්සන්ට හිත පිණිස නරකයට වැදැ පැසී සත්ත්වයන්ගේ දුක් හළ බුදුන්-පෙ-යුතු.

* උස්තැන හැරැපියා මිටිමිටිතෙන තෙමා ගෙණ බස්නා සිහිල් ගඟවතුරක් සේ, සසර පමණින් සුවපතුන් හැරැ දුක්පතුන් තමන්ගේ කරුණා නැමැති සිහිල්පැනින් තෙමූ බුදුන්-පෙ-යුතු.

* ඇවිළි ඇවිළි සඳැ උඩු බල්වා මැ නැඟී ඇවිළෙන ගින්නක් සේ, උපන් උපන් ජාතියෙහි අනුන්ට වැඩෙහි මැ උන්මුඛ වැ දිලියෙන බුදුන්-පෙ-යුතු.

## 296-300

* අරමුණක් නැති වැ චිත්තයාගේ ඉපැද්මක් නැත්තා සේ, අනුන්ට වැඩක් නැතියෙක්හි ඉපැදුමක් නැති බුදුන්-පෙ-යුතු.

* ඇතුළත්හි රසය වියලි වියලි සේ, සැහැල්හු වැ නො ගැලී දියෙහි ඉපිලැ අනුන් හැම්වූ ලබුපකක් සේ, ආත්මස්නෙහය වියලි වියලි සේ ලසු වැ ලෝවැස්සන් දුක් නැමැති සළාවැටුමෙහි ගැලියැ නො දී හැම්වූ බුදුන්-පෙ-යුතු.

* කවර වැති ගින්නෙකැ තැවුව ද ද අඩු නොවන ජාතිරත්නයක් සේ, ලෝවැස්සන්ගේ කෙසේ දැඩි කොපගින්නෙකැ ද තමන්ගේ මෛත්‍රී දවා අඩු නො කළ බුදුන්-පෙ-යුතු.

---

1. කැම වන 2. සේ කළ මුත්‍රයෙහි

Non-Commercial Distribution

* පෙඳ මහත් මහත් වූ සේ මහත්ව වැඩෙන කණක් සේ, ලෝවැස්සන්ගේ කෙළෙහි ගුණ නොදැන්ම මහත් මහත් වූ සේ මැ තමන්ගේ කරුණාව මහත් කොට වැඩූ බුදුන්-පෙ-යුතු.

* මුහුදින් ගත් ලුණුකරපැන් වලාකුස්හි ගබ් ගෙණැ මිහිරි වූවාසේ, ලොවට වැදැ තමන් ගත් ක්ලෙශයනුදු තම ළයට වන් ගුණයෙන් ලොවට මිහිරි කළ බුදුන්-පෙ-යුතු.

## 301-305

* නයින් තුඩැ හුනුකල්හි විෂ වැ යන එ මැ මුහුදැ පැන් මුතු බෙල්ලන්ගේ කුසයට වන්කල්හි මුතුරුවන් වන්නා සේ, අනුන් ගත් කල්හි ලෝවැස්සන්ට විෂ වන ක්ලෙශවිකාර තමන් ගත් කල්හි සියලු ලොවට දහම් කළ බුදුන්-පෙ-යුතු.

* තෙනෙහි කිරි ගත් කල්හි මැ පුත්හට ලාභ වී යැ යි සමාධි ඇති වන මව සේ, තමන් ලෙහි දහම්රස ගණුත් මාගේ දරු වූ සියලු ලොව සිත් ගන්මියි නොතමන්[1] පිණිස සතුටු වූ බුදුන්-පෙ-යුතු.

* රාජකුමාරයා පිරිමසන කිරිමවක තමා පුතු හඬතුදු රාජ කුමාරයාහට මැ තනයෙහි කිරි රැකැ තබන්නා සේ, තමන්ගේ ශරීරය කෙසේ දුක්පත් වුව ද ලෝවැස්සන් පිණිස තමන්ගේ කරුණාව රැකැ තුබූ බුදුන්-පෙ-යුතු.

* අහසැ එක්තන්හි සිටැ[2] ද දෙරැ දෙරැ පැණෙන පූර්ණචන්‍ද්‍ර මණ්ඩලය සේ. එක්තැනැ වැසැ ද සියලු පාත්‍රයන්ට සම්මුඛ වැ සම්මුඛ වැ පැණෙන බුදුන්-පෙ-යුතු.

* ගංහෝදහස් ගණන් වැදැ තෘප්ත නො වූ මහාසාගරය සේ, එ පමණ පරහිතයෙහි ආසාව දවසැ දවසැ අනවරතයෙන් වතුරු ගෙණැ ද නොපිරුණු උදර වූ සිත් ඇති බුදුන්-පෙ-යුතු.

## 306-310

* හටගත් දියට පිට පා වැඩෙන නෙළුම්පතක් සේ, තමන් ලෙන් උපන් කරුණාව තමන්ට පිටි පාවා[3] වැඩූ බුදුන්-පෙ-යුතු.

* කන සමයෙහි ප්‍රණීත නො වැ පසු වැ පැන් බොන සමයෙහි මිහිරි පෑ ඇඹුලු සේ, පුරණසමයෙහි රළු වැ මිහිරි නො වැ නිවන් විඳිනා සමයෙහි මිහිරි පෑ ප්‍රතිපත්ති පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

---

1. නොතනි. 2. සිටිය. 3. පෑවා

Non-Commercial Distribution

* බැලූ බැලූ කලැ සියලුතුන්ලොව සටහන් වැ පැණෙන සක්විති මිණිරුවන ධැරූ වෙපුල්ලපර්වතය සේ, සියලු ඥෙය මණ්ඩලය පැණෙන්නා වූ සර්වඥ මහනුවණ නැමැති මැණික ධැරූ බුදුන්-පෙ-යුතු.

* නොසිහිල්පැනක් නොපාන චන්‍ද්‍රකාන්තමාණික්‍යයක් සේ, නොමිහිරි දහම්රසයක් මැ නො පවත්වන බුදුන්-පෙ-යුතු.

* ඇතුන් නො තතනවා නො පවත්නා කෙශරසිංහනාදයක් සේ, ඇසූ තීර්ථිකයන්ගේ මත් නොබිඳෙන ධර්මදෙශනාවක් මැ නො පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

## 311-315

* වස්සා ගෙණැ ගිය දිවිදෙන හොත් මහනෙරට ස්නෙහයෙන් නො බා වන් මව්දෙනක සේ, තමන්ගේ විනෙයජන නැමැති දරුවන් ගත් තෘෂ්ණා නැමැති දිවිදෙන හොත් සසර නැමැති නෙරට ස්නෙහයෙන් වන් බුදුන්-පෙ-යුතු.

* බලුමස් විකපන්නා වූ[1] චණ්ඩාලග්‍රාමයක් සේ, අධර්ම විකපන[2] ලොවට සද්ධර්මය වැනි පවිත්‍රදෙයක් විකපත් කළ බුදුන්-පෙ-යුතු.

* ගවරවළෙක්හි සමාධියෙන් දිය කෙළනා පණුකැළයක් සේ, පඤ්චකාමයෙහි වැදැ කෙළනා සත්ත්වයන්ට 'මේ හීනයන්ට සුදුසු දෙයෙකැ' යනාදීන් කියා එහි සත්ත්වයන් කළකිරුම් ඉපදැවූ බුදුන්-පෙ-යුතු.

* මිනීකුණෙහි ඉව ලත් කැණහිල්බල්ලන්ට වූ සොම්නසක් සේ, ලොකයෙහි මාගමුන්ගේ ඉවයට සතුටු සොම්නස් වැ ඇවිදිනා සත්ත්වයන්ට එහි ආදීනව මෙසේ යැයි කියා එළවා පෑ බුදුන්-පෙ-යුතු.

* සියලුලෙසින් මැ දෙව්බඹුන් ආදි සියලුසත්වයන් තමන්ගේ බුද්ධි රූපය[3] ආදී වූ සියලු මිහිරට කෙළ ගල්වන මෙසේ අසාධාරණ වූ ගුණවිශෙෂ ඇති බුදුන්-පෙ-යුතු.

## 316-320

* "මේ සර්වඥයන්ගේ ගුණ නොසිතන අසංඥතලයෙහි බඹුන් ලද ආත්ම ආත්ම නො වෙයි. මේ යහපත් වූ රූපය නො බලන මේ මිහිරි[4] බස් නො අසන අරූපිබ්‍රහ්මයන්ට මහාඅලාභය වූයේ ය. මේ මහල්සක්වළැ හසු නොවූ කෙනෙක් වැරැද්දහ. මේ ශාසන ප්‍රතිපත්තියෙහි රස නොදත්

---

1. විකපත් වූ. 2. විකන. 3. බුද්ධිරූපය. 4. රූපය මේ මිහිරි.

Non-Commercial Distribution

කෙනෙක් සිස් වන්නාහ. මේ පතුල් තඹර නොවැදී හිසකේ උත්තමාඞ්ග නම් නො වෙයි. මේ නමස්කාරයට නො සැලූ දිව් ගුණ නොකී දිව් නොදිවැ" යනු සියලු දෙව්බඹුන් තුඩැ තුඩැ පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

* "මේ සර්‍වඥයෝ මා පිණිස මැ වැඩි සේක. මේ ස්වාමි දරුවානෝ මා පිණිස මැ එළඹිසේක. මේ මහාපුරුෂයානෝ මා පිණිස මැ බණ වදළ සේක. මේ හිමියාණෝ මා මැ කුළුණුසින් බලා වදළසේක. මා කෙරෙහි මැ මෛත්‍රිය ඇති සේකැ" යනාදීන් අනන්තලොකධාතුවෙහි චණ්ඩාලයන් කෙරෙහි පටන් මහාබ්‍රහ්මයන් දක්වා සියලු සත්ත්වයන් ලවා වෙනවෙන මැ සිතවන මහාකරුණා ඇති සද්ධම්චක්‍රවර්ති වූ බුදුන්-පෙ-යුතු.

* ඇතින්නන් හා ඇත්පැටවුන් හා ඇත්පැටියන් හා ඇතුන් හා ඇත්පොව්වන් හා හැරගෙණැ යූථපති වූ මහඇත්රජහු වන් කෙත්වතක් සේ, තමන් අයිති වූ හෙරණු යැ, හෙරණී යැ, මහණු යැ, මෙහෙණී යැ යන පරිවාර හා එක් වැ සියලු සසර මැඩැ අළෙහිව් කළ බුදුන්-පෙ-යුතු.

* කුඩා කැටපතෙක්හි හුනු මහාපර්‍වතයෙක්හි සේයක් සේ, එසේ ඉතා මහත් වූ පලඟ ඇති වැ ද හැකිළී ලොකයෙහි පැණෙන බුදුන්-පෙ-යුතු.

*රාගද්වේෂමොහ වැනි අනන්තජාතියෙහි පුරුදු වැ ආ තුන් යාළුවන්[1] උනුන් නො ගෙණැ බිඳී පියා හී පලන පරිද්දෙන් එක සිත් වැ තර කොට බල දුන් බුදුන්-පෙ-යුතු.

## 321-325

* තමන් වැළැඳූලෙසින් මැ නිවන්රස දෙන, ළයට වන් මිහිරින් මැ දහම් දෙන, දුටුපරිද්දෙන් මැ සසර ආදීනව පානා, නැවැත නූපදනා පරිද්දෙන් කෙලෙසුන් නැසූ, නැවැතැ පුහුණු නොවන පරිද්දෙන් සසර හළ බුදුන්-පෙ-යුතු.

"මම ගැලවී ලොව ගලවමියි කළ ප්‍රතිඥවට, ලොවට පැවැත්වූ ආචාර්‍ය්‍යකමට, ලද නැකිව්ලියට, වූ සරණට, වන් පලහට, හළ ක්ලේශයන්ට, හැරපී සක්විතිකමට, කෘතාධිකාරකමට, ලෝ මුදුන් වූ වියත්කමට, ලොවට හැකි යැ යුතු වූ ලයට, පෙර දීපංකරපාදමූලයෙහි හළ නිවණට, දැන් බෝමැඩැ දී ලද නිවණට, හළ කිඹුල්වත්පුරයට, යශොධරාවන්ට නොකියා රාහුල කුමාරයන් නො සනහා නික්මුනුපරිද්දට, දෙවියන් වැදි වැදමට, බඹුන් බඳ ඇදිලියට, මිථ්‍යාදෘෂ්ටීන් තමන්ට බා හැකූළුනු[2]

1. සතුරන් 2. බැහුවුනු & හැළුණු

Non-Commercial Distribution

පරිද්දට, සම්‍යග්දෘෂ්ටිය පැලැඹුනුපරිද්දට, සසර ගත් හැකිළීමට, මරහු පෑ පිටට, පියන් වැඩි වැදමට, නයින් දුන් දරණයට, වඳුරන් කළ උපාසකකමට, ඇත් කළ උපස්ථානයට, රජදරුවන් සිඹි පයට, බකමුහුණන් කළ ප්‍රසාදයට, මඩුවන් කණැ හුනු ශබ්දයට, පාත්‍රයන් කළ පිණට, සුදුස්සක් මුත් නුසුදුස්සක් නො කළහ" යනු තුඩැතියන් තුඩැ සිතැතියන් සිතැ නිරන්තරයෙන් වටා සියලු සත්වලොකයාගේ සැක හරවා සරණ ගැන්වූ බුදුන්-පෙ-යුතු.

* සියලු උඩුමහල් තාක් හැම්වූ එකසත්මහප්‍රාසාදයෙහි ටැඹක් සේ, සියලුලොවට එක පිහිට වැ හම්වාගෙණැ සිටි බුදුන්-පෙ-යුතු.

* ඇතු සිත් වන් පරිද්දෙන් නො පවත්වා තමාගේ සිත් වූ පරිද්දෙන් ඇතු පවත්වන ආරොහකයකු සේ, තුමූ සංසාරයට අනු වැ නො පැවැතැ සංසාරය තමන් සිත් වූ පරිද්දෙන් පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

* මුහුදැ දිය ගැලීමට නො හසු වැ බොහෝ ජනයන්ට ආධාර වූ දිවයින්බිමක් සේ, ක්ලේශ නැමැති මුහුදුගැල්මට හසු නො වැ සියලුලොවට පිහිට වූ බුදුන්-පෙ-යුතු.

## 326-330

* සාරාසංඛ්‍යකප්ලක්‍ෂයක් කල් පමණ 'සෙට යැ'යි සිතූ දිග බැලුම් ඇති, සමතිස්පැරුම් වැනි දෙයක් පවා පිරියැ හැකි කොටැ සිතූ මහාවීර්‍ය්‍ය ඇති, නිවන්රස වැනි දෙයක් හැරැපියැ යුත්තක් කොට සිතූ[1] නිරාලයබව ඇති, සියලු ලොවකුදු ගලවම්හයි සිතූ[1] උදර සිත් ඇති බුදුන්-පෙ-යුතු.

* ලොව පිණිස නො පමා වූ, නොතමන් පිණිස බුදු වූ, විනෙයයන් පිණිස දෙශනා කරණ, 'සුව යැ'යි දෙව්ලොවැ නො වසන, 'නො සකසැ'යි වසුපැල් නො ගරහන, 'මහතැ'යි බඹලොව නො සොයන, 'හක යැ'යි හබ බිජුවට නො හරණ, 'බොහෝ යැ'යි අසදෘශදනය නොපතන බුදුන්-පෙ-යුතු.

* තමන් මිසැ ලොවට අනික් ඇසක් නැතියා වැ[2], තමන් මිසැ අනික් ලොවට මිත්‍රයන් නැතියා වැ, තමන් මිසැ නිවණට මඟපානන් නැතියා වැ, තමන් මිසැ ලඇත්තන් නැතියා වැ, තමන් මිසැ ධාර්මිකයන් නැතියා වැ, තමන් මිසැ වහලක් නැතියා වැ, තමන් මිසැ අනොලොඹුවක්[3] නැතියා වැ, තුන් ලොවට සරණ වූ බුදුන්-පෙ-යුතු.

---

1. සිතන 2. අනික් නැතියා 3. අතලොඹුවක්

Non-Commercial Distribution

* සත්ත්වයන් සිත් නො දැනැ දෙශනා නො කරණ, කල් නො දැනැ දෙශනා නො කරණ, දෙශනා නො දැනැ දෙශනා නො කරණ, පාත්‍රයන් නො හැඳිනැ දෙශනා නො කරණ, තුමූ නො දැනැ දෙශනා නො කරණ, සිත් නො දී දෙශනා නො කරණ, පමණ නො දැනැ දෙශනා නො කරණ, ළය නො ගන්වා දෙශනා නො කරණ, විහාරයෙහි මතු දෙශනා නො කරණ, එකක්හට මැ දෙශනා නො කරණ, දසදහසක් සක්වළට මතු දෙශනා නො කරණ, බොහෝ කොට මැ දෙශනා නො කරණ, මදින්[1] මැ දෙශනා නො කරණ, ගැඹුරෙන් මැ දෙශනා නො කරණ, උත්තාන කොට මැ දෙශනා නො කරණ, සව්ාකාරයෙන් මනොඥ කොට මැ දෙශනා නො කරණ බුදුන්-පෙ-යුතු.

* ඇතුන් පැන් පූ තොටින් බල්ලනුදු පැන් පූ කල්හි නිඳ නො කට යුතු වූ මැ මහාගංගාවක් සේ, බඹුන්ට දහම් කී තුඩින් චණ්ඩාලයන්ට දහම් කියතුදු නිඳ නොලද්ද වූ බුදුන්-පෙ-යුතු.

## 331-335

* පිපාසායෙන් මුහුදු වන් තෙනැත්තහු පළමු ගත් පැන් කටින් මැ 'ලුණුකර යැ'යි මුහුණු හකුළුවා ගෙණැ වළක්නා සේ, නුවණැති තෙනැත්තහු නිවන් ගත් ආශාවෙන් සියලු පිටත් මතයට වැදැ පළමු නුවණ එබූ කල්හි මැ එසේ නැතිපරිදි සිතා වැළැකෙනු කොට සියලු ලොකයෙහි සත්ත්වයන් වදුත් ද විඳැගණුත් ද පිළිපදුත් ද, මිහිරෙහි නිමාවක් නො පෑ සිටි දහම් එළවූ බුදුන්-පෙ-යුතු.

* රන්පිළිමයෙක්හි ඔප් ලනු පිණිස තැකූ බලුදළක් සේ, සමතිස්-පැරුම්හි ඔප් ලන පිණිස ක්ලේශයන් තැකූ බුදුන්-පෙ-යුතු.

* දෙතිස්කුණුකොටසට ඇතුළත් හිසකෙහෙ පවා මුදුනෙහි තුබූ පමණින් නිඳ නො කට යුතු වන්නා සේ, තමන්ගේ ශාසනයෙහි නො පිරිහී සිටි පමණින් චණ්ඩාලයන් පවා ආදර ලබන පරිද්දෙන් කළ බුදුන්-පෙ-යුතු.

* සියල්ල ලුණුකර වූ මහමුහුදැ මැදැ අන්තරීප දියක්[2] සේ, වන් වන් තන්හි අධම් මැ ගත් ලොකයෙහි තමන්ගේ එකලෙහි මැ මිහිරි ධම් ගැන්වූ බුදුන්-පෙ-යුතු.

* ගන්ධහස්තිරාජයක්හුගේ ශරීරය මහත් වුව ද මහඇගි වූ මුතු තිබෙන කුම්භප්‍රදේශයක් සේ මෙසේ මහත් වූ මේ ලොව්හි ද තමන් හා එක් වූ තෙනෙක්හි මැ මහඇගි වූ ගුණ ගැන්වූ බුදුන්-පෙ-යුතු.

---

1. මැදින් 2. මහමුහුද මැ අන්තරාවියක්.

Non-Commercial Distribution

## 336-340

* මහමෙර එක් උත්තෙකැ ලාලා අනික් උත්තෙහි ලූ හබඛිජු වටක් සේ තමන් හා සියලුලොව හා එකතැනෙක්හි කිරත් හොත් තමන් මෙර සේ බර වැ සියලුලොව හබඛිජුවට සේ සැහැල්හු කොට පානා බුදුන්-පෙ-යුතු.

* මහමුහුදැ ලුණුකරදියෙහි වැ ද මිහිරිරස ගත් කකුළුරසයක් සේ, විරස වූ ලොව්හි ඉපැදැ තමන්ගේ ලෙහි පැවැති ධර්‍මය මිහිරි කළ බුදුන්-පෙ-යුතු.

*කදුරුගසින් හුන ද සෙවන වනාහි සිහිල් වන්නා සේ, ඝොර වූ සංසාරයෙන් වැටුන ද සියලුලොවට සිහිල් එළවූ බුදුන්-පෙ-යුතු.

* ශෛලජාතියෙහි ඇතුළු වැ දැඩි වූ සඳකත්පහණින් හුන ද ජලය වනාහි ද්‍රව වැ මොළොක් වන සෙයින්, කරුණා නැති රළු ලොවින් වැටී ද කරුණාරසයෙන් අදද වූ බුදුන්-පෙ-යුතු.

* වැසි හා එක්වැ හුන ද සෙණ වනාහි දැඩි මැ වන්නා සේ, තමන් හා එක් වැ වැසැ ද ලෝවැස්සන් ක්‍රූරගුණයෙන් වැටෙන කල්හි ද වූ සිහිල්වැසි සේ සිහිලස මැ එළ වූ බුදුන්-පෙ-යුතු.

## 341-345

*ඇසට වන් කල්හි කඳුළු වහන දුමින් තුබූ අඳුන් ඇසට[1] පහයින් මැ වන්නා සේ, සත්ත්වයන්ගේ හැඬීමට කාරණ වූ ලොවින් ඉපදැ ද ලොවට පහයින් වැ සිටි බුදුන්-පෙ-යුතු.

*කවුඩුකසල්ලෙහි බිජුවට හා එක්බිජුවට වැ පිලවුන් හා එක් පිලා වැ වැඩිය ද ඒ කවුඩුහඬ නො වැ මිහිරිහඬ ගත් කොවුලු පැටවක්හු සේ, ලෝවැස්සන් හා එක් වැ වැඩී ලෝවැස්සන්ගේ අධර්‍මහඬට වෙන් වූ මිහිරි වූ දහම්හඬ ගත් බුදුන්-පෙ-යුතු.

*උපසග්ගයට පැණෙන රූ දුටු ඇතින්නක සේ, දහම්රුව දුටු මිථ්‍යා දෘෂ්ටීන්[2] තාක් තැති ගැන්වූ බුදුපන්-පෙ-යුතු.

*වතුරෙහි පිහිනන තෙනැත්තහු එ මැ දියවහලින් යන්නා සේ, ක්ලෙශයන්ගේ වහලින් මැ සංසාරයෙහි වැසැ එ මැ ක්ලේශයන් පිහිනා මහඇහි වූ නිවන් නැමැති තොට දුටු බුදුන්-පෙ-යුතු.

* විළි වසන්නට තැකූ පිළියට වැඩි අනික් ආභරණයක් තැන්තා සේ, ලොවට දුක් නැති කරණ පිණිස තැකූ බුද්ධත්වය සියලු ලොවට එකාභරණ කළ බුදුන්-පෙ-යුතු.

---

1. අනුන් ඇසට. 2. සේ මිථ්‍යා

Non-Commercial Distribution

## 346-355

* රජදරුවන්ට ඉදි කළ භොජනයෙහි පළමු කොට අගු බැලූ මහවෙදක්හු සේ, ලෝවැස්සන් පිණිස සැපයු[1] නිවන්හි පළමු අගු බැලූ බුදුන්-පෙ-යුතු.

* පුත්‍රයා සිතූ දෙයට දෙළදුක් වුන් මවක සේ, ලෝවැස්සන් ආසා කළ නිවන් පිණිස දෙළදුක් වුන් මහාකාරුණික වූ බුදුන්-පෙ-යුතු.

* වැසිකළු ඇති මහරැහි විදුලියක් පැණුනුවිටැ මැ පැණුනු මහක් සේ, මේ මොහයෙන් එකාන්ධකාර වූ සසරෙහි තමන් හමු වූ සමයෙහි මැ නිවන්මග අලු කරණ බුදුන්-පෙ-යුතු.

* මහඇගි වූ රන්මල්හි[2] වූ මියුරුසුවඳක් සේ, තමන්ගේ එ වැනි මහඇගි රූපශ්‍රීයෙහි සර්‍වඥවියත්කම් වැනි මහඇගි ගුණයක් ගැන්වූ බුදුන්-පෙ-යුතු.

* නෙපාලද්වාරයෙන් මැ පහළ වන කස්තුරුබඩුවක් සේ, තමන්ගේ එකමුවෙන් මැ මහඇගි වූ දහම්බඩු පිටත් කළ ධර්‍ම රාජ වූ බුදුන්-පෙ-යුතු.

* තික්තරස වූ කොසොඹකදෙහි බඳ ද මිහිවද මිහිරි වන්නා සේ, මේ විරස වූ සංසාරයෙහි බැඳී ද ලොවට මිහිරි වූ බුදුන්-පෙ-යුතු.

* පහයිනක් නැතිවැ හොබනා ශරත්කාලයෙහි සඳමඬලක් සේ, කිසි පහයිනක් නැති වැ තමන්ගේ බුදුරුව සියලු ලොවට මිහිරි කළ බුදුන්-පෙ-යුතු.

* එලාවසානයෙහි[3] නැති වන ඔෂධි[4] රුකක් සේ, බුද්ධකෘත්‍ය නිමිසදෙහි මැ ලොවට නිමාම් වන බුදුන්-පෙ-යුතු.

* යකඩගොදුරු දිරවූ කොස්ලිහිණියක සේ, ලෝවැස්සන්ට වැඩ පිණිස තමන් වැළඳූ ක්ලේශයන් සුව සේ දිර වූ බුදුන්-පෙ-යුතු.

* ඇත්හට සොඩින් ඉකැවූ පැන් පිය හැකි වන්නා සේ, ලොවට තමන් ගත් දහම් සෙවියැ යුතු වූ වස්තු කළ බුදුන්-පෙ-යුතු.

## 356-360

* අස්හුගේ ආසනය සුව වීම රජහුගේ ඉසිලීමට හෙතු වන්නා සේ, තමන්ගේ කරුණාවෙහි වතුරශ්‍ර[5] වීම සියලු ලොව උසුලන්නට තැකූ බුදුන්-පෙ-යුතු.

---

1. සැපවූ. 2. මල්නී 3. එලාවසානයෙන්
4.ඖෂධ 5. පුරස්සර

Non-Commercial Distribution

* රදවූ අතින් තැළුම් ලදින් සුවපහස් ලද්ද වූ වස්ත්‍රයක් සේ, ලෝවැස්සන් අතින් ගහට ලත්ලත් සේ මැ ලොවට සුව එළවන්නා වූ බුදුන්-පෙ-යුතු.

* ගිනි ලූ සෙහෙන්හි ලස ද වැ ගත් පැළපතක්සේ, සත්‍වයන් පිණිස දැඩි වූ සසරට වැදැ නො එක් උපද්‍රවයෙන් පැලැහුනු තමන්ගේ සිත්හි සර්‍වඥගුණ ලසඳ කළ බුදුන්-පෙ-යුතු.

* ගෙරිකුණෙහි වුව ද ගොරද මහුල්පහයින් වන්නා සේ, සසරෙහි වැ ද ලොවට මහුල්පහයින් වූ බුදුන්-පෙ-යුතු.

* මස් මිහිරි වැ සරපහර කැ මුවරජක්හු සේ, වානර ජාතියෙහි ද කරුණාගුණෙන් මිහිරි වැ හිස්හි ගලින් තැළුම් කැ බුදුන්-පෙ-යුතු.

## 361-365

* මුහුණෙහි ගුණඅයුණු නො වරදවා පානා නිර්‍මල වූ කැටපතක් සේ, කුසල්අකුසල්දහම් දෙක්හි ගුණඅයුණු ලොවැස්සන්ට නො වරදවා පානා බුදුන්-පෙ-යුතු.

* ගන්‍ධහස්තිරාජයක්හුගේ කුසට වන් දෙය සුවදින් මුහුකුරු වන්නා සේ, තමන්ගේ සිතට වන් වන් දෙය දහම්බවට පමුණුවා මුහුකුරුවන බුදුන්-පෙ-යුතු.

* හිරුගේ දැඩි වූ රශ්මියට පිපී ගිය පියුමක් සේ, ලොවැස්සන්ගේ දැඩිකම් විදැ සර්‍වඥතාඥනවිකාශයෙන් පිපී මිහිරි වූ බුදුන්-පෙ-යුතු.

* රන්කෙවුන්න හා එක් වැ බැඳි අනුභවවස්තු වූ මිණි රුවනක් සේ, කරුණාව හා එක් වැ බැඳී ලෝවැස්සන් විසින් අනුභව කට යුතු වූ බුදුන්-පෙ-යුතු.

* ගින්නෙහි දවා නිමි ඇණෙහි හෙළු රත්රණක් සේ, සංසාරයෙහි සමතිස්පැරුම් පිණිස නොයෙක් ව්‍යසනයෙන් ද පෙර බුදුගුණ හා සමඇණ වූ බුදුන්-පෙ-යුතු.

## 366-370

* තිකුළුපව්වෙහි පිහිට ලත් මහමෙරක් සේ සසර පමණින් අලොභ යැ, අද්වේෂ යැ, අමොහ යැ යන තුන් ධර්‍මයෙහි තර පිහිට ලද්ද වූ කුසල් සිත් ඇති බුදුන්-පෙ-යුතු.

* ඇතුළුදියෙහි තුබූ රුවනින් පැහැලද් මුහුදුපිටක්සේ තමන්ගේ ඇතුළෙහි ගුණෙන් පැහැලත් බුදුන්-පෙ-යුතු.

Non-Commercial Distribution

* නුවරට රැකවරණවැ පළමු සතුරන්ගේ උපද්‍රව විදිනා[1] මහපවුරුවළල්ලක්සේ, සසරට රැකවරණ වැ ජාතිජාතියෙහි නොයෙක් උපද්‍රව වුන්[2] බුදුන්-පෙ-යුතු.

* මීරස මැඩ බඳුන්හි වක්කළ අත්ලක් සේ, තමන් නිවන් පුරයට වන ද තමන් වැකුනු ලොකයෙහි මිහිරි රස තබාගිය බුදුන්-පෙ-යුතු.

* ගිනිකබල් පහළ බිමක් සේ, තමන් නිරුපධිශෙෂනිවණින් පිරිනිවිය ද තමන්ගේ තෙජස් ගත් ලොකයෙහි ක්ලේශයන් පියක් එබියැ නුදුන් බුදුන්-පෙ-යුතු.

## 371-375

* ක්‍ෂයරොග ඇති තෙනැත්තහුට දුන් කෙහෙල්සළුවක් සේ, කුසල්දහම්හි ක්‍ෂයරොග ගත් ලොවට බෙහෙත්වැ මිහිරි වූ ධර්‍මය දුන් බුදුන්-පෙ-යුතු.

* සඳහුට ගෙවීම් වැඩීම් ඇත ද, එකාකාර වැ සිටි හිරු[3] මඬලක් සේ, ලාභාලාභ දෙක්හි ලෝවැස්සන්ගේ උන්නති අවනති දෙක ඇති වතුදු එකාකාරයෙන් සිටි බුදුන්-පෙ-යුතු.

* රාත්‍රියට හමු වැ දිලියෙන රැරහරුකක් සේ, තමන්ට සුදුසු බුද්ධොත්පාදකාලය ලදින් දිලීගිය බුදුන්-පෙ-යුතු.

* සිස් වූ ආකාශයෙහි වාතබලයෙන් පිහිට ලත් මහා වලාකුළක් සේ, මෙ දහම් නැති වැ ආධාර නැත්තා වූ සසරෙහි කරුණාබලයෙන් පිහිට ලත් බුදුන්-පෙ-යුතු.

* ඉතා කුඩා වූ නුගඇටෙහි පහළ වැ ඇටින් ඉතිරැ[4] වඩා ගෙණැ ගොස් ඉතාමහත් වූ පමණ ලදින් සිටි මහනුගරුකක් සේ, මෙලොවැ පහළ වැ ලොවට ඉතිරි වැ මහත් වූ පලහ ලදින් වැඩී සිටි බුදුන්-පෙ-යුතු.

## 376-380

* කළු වූ වර්ණ ඇති මහදඹහිස් පළා නැගි රන්දළුවක් සේ, අකුශලධර්‍මයෙන් කෘෂ්ණ වූ ලොකයෙහි ඉපැද[5] ද්විගුණයෙන් අතිශයින් බබලන බුදුන්-පෙ-යුතු.

* එකවිලැ මඩුමැඩියන් හා එක් වැ උපන් මහනෙල් මලක් සේ, තමන් හා එකලොවැ උපන් දෙව්බඹුන් මඩුමැඩි කොට සියලු ලෝවැස්සන්ගේ මුදුනෙන් පැලැන්දැ යුතු වැ ආදර ලත් බුදුන්-පෙ-යුතු.

* ආකරබිම්හි රුවනුත් වැලිත් ඇත ද රුවනින් මැ නම් ලත් රත්නාකරයක් සේ, තමන් උපන් සමයෙහි උපන් දෙව්බඹ ආදීන් බොහෝ

1. දිනා 2. බිඹුන් 3. සඳ 4. ඉතිරිව 5. ලොකයෙහි

Non-Commercial Distribution

වුව ද එකලට තමන්ගේ ගුණයෙන් 'බුද්ධොත්පාද යැ' යන නම් ඇති කළ බුදුන්-පෙ-යුතු.

* කැණහිලුන් එකවල්හි හඬතුදු සිංහයන්ගේ හඬට මැ තැති ගන්නා ඇත්කැළ සේ, දෙවියන් බඹුන් ඇතුළු වූ ලෝවැස්සන් එකලොවැ බණතුදු තමන්ගේ මැ දහම්බසින් කෙලෙසුන් තැතැනවූ බුදුන්-පෙ-යුතු.

* සිටි සඳුන් රුක බලත් කැපූ සඳුන්රුක දඬු පොලුපෙල්ලෙන් බෙදී නොඑක් දෙශයෙහි සුවඳ පවත්වා විකපන්නා[1] සේ, තමන් පිරිනිවන් නො පැ අවස්ථා බලත් පිරිනිවී අවස්ථායෙහි ශරීර ධාතු විසුරුවා සියලු සත්ත්වලොකයෙහි ගුණසුවඳින් විකපත් වූ බුදුන්-පෙ-යුතු.

## 381-385

* කවුඩු වැ බලු වැ කැණවිල් වැ කළ චරිත බුදු වැ කියතුදු තිඳ නො කට යුතු වූ ජාති හීන වුව ද මහඇඟි වූ චරිත ඇති බුදුන්-පෙ-යුතු.

* නොයෙක් රුවනැ, ගල්කැට යැ, වැලි යැ, මඩ යැ යන මේ නො ගරහා උසුලන මුහුදුකුසක් සේ, දෙවි යැ බඹ යැ දනව යැ යක්ෂ යැ රාක්ෂස යැ ශක්‍ර යැ ප්‍රෙත යැ මනුෂ්‍ය යැ කිහිඹි යැ කුහුඹු යැ පැණි යැ පණු යැ යන මේ ආදී වූ සියලු සතුන් තමන්ගේ එක කරුණාවෙන් වෙනසක් නො කොට ඉසිලූ බුදුන්-පෙ-යුතු.

* ඇතු බැහැර ගියකල්හි ඇත්හල්හි වැදැ සැතැපුනු මැහි තැනැත්තහු ඇතු ඇත්හලට[2] වදුත් මැ පලන මහ නො දැකැ දිවන්නා සේ, තමන්ගේ දහම් නොවන්කල්හි පැලැඹීගත්තාවූ අදහම් තමන්ගේ දහම් ලොවට වදුත් මැ හිස් ලු ලූ දිගට භය පත්කොට ලුහුබැඳැවූ බුදුන්-පෙ-යුතු.

* මුවරඳරොන් ඔත් දවස් පටන් කොට පියා ගහා බැඳ තිමවන තැන දක්වා සියලුකල්හි මැ මිහිරි වූ මිහිවදයක් සේ, දීපඞ්කර පාදමූලයෙහි 'බුදු වෙමි' යි තුඩ එබූ ද පටන් කොට බුදු වැ තිමෙන දවස් දක්වා සියලුලොවට මිහිරි වූ බුදුන්-පෙ-යුතු.

* හිමාලයපර්වතපාදමූලයෙහි පටන් කොට මුහුදු වදනා තුරු මැ බට බට තැන්හි මැ[3] මිහිරි වූ භාගීරථීගංගායෙහි පැනක් සේ, දීපඞ්කරපාදමූලයෙන් බට ද පටන් කොට නිවන් පුර වදනා තැන් දක්වා වන් වන් තොටින් මැ මිහිරි වූ චරිත නැමැති අමෘතගංගාව පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

---

1. විකන්නා-බොහෝ        2. ඇල්හලට
3. තැන්

Non-Commercial Distribution

## 386-390

* තමාගේ පැහැයෙන් මුහුදු රැඳූ මහමෙරක් සේ, තමන්ගේ ගුණයෙන් මුළුලෝ සැදූ බුදුන්-පෙ-යුතු.

* තමා පහළ දවස් පටන් ගෙණ කල්පාන්තය දක්වා දක්ෂිණායන උත්තරායනවීථි දෙක නො හැර පවත්නා හිරුමඬලක් සේ, දීපඞ්කරපාදමූලයෙහි පටන් ධාතුපරිනිර්වාණය දක්වා කරුණා ප්‍රඥ දෙ වීථිය නො හැර පැවැති බුදුන්-පෙ-යුතු.

'බුද්ධ' යන තමන්ගේ නමැ දැකුර තුඩැ වැකූ සත්‍වයාගේ පාමුලට සියලුලොව නැම්වූ[1] බුදුන්-පෙ-යුතු.

'තමන් වැන්නහ' යන සිතින් ගලින් දඬෙ කළ රුවටත් පොවා පූජා කළවුන් නිවන්පුරයෙහි ලන බුදුන්-පෙ-යුතු.

තමන්ගේ එක සිරිපා වැන්දවුන්ට සතර අපායෙහි දුක් දුරුකරන්නා වූ බුදුන්-පෙ-යුතු.

## 391-395

තමන්ගේ ශ්‍රීමුඛයෙන් සොල්වාලූ එකගාථාපදයෙකින් ස්වර්ගලොකය බ්‍රහ්මලොකය අමෘතමහානිර්වාණය යන මෙතෙක් තැනට එකවිටැ මහ පැ[2] ලන සේ දන්නා වූ බුදුන්-පෙ-යුතු.

හිසට ගල් පෙරළාත් මරන්නට දුනුවාවන් මෙහෙයාත් මරන්නට නාලාගිරිහු මෙහෙයාත් ශ්‍රීශරීරයෙන් ලෙහෙ සොල්වාත් අන්තයෙහි තමන්ගේ නම තුඩැ වැකූ[3] පමණෙකින් දෙව්දත් මහතෙරුන්ට පවා පසේබුදුතන් දෙන බුදුන්-පෙ-යුතු.

* හිමාලයෙහි මහවිල්හි පියුමෙන් වගුළ රොන් පියුම්පත්හි හී පින්නෙන් තෙමී හිරුරසින් පැසී ඝන වැ 'පොකුරුමී' නම් වන්නා සේ, තමන් සිත් නැමැති පොකුරුපත්හි හුනුවා වූ බොධි පාක්ෂිකධර්‍ම නැමැති පියුම්රොන් තමන්ගේ කරුණා නැමැති ජලයෙන් තෙමා ලෝවැස්සන් කරන්නා වූ නොයෙක් ගහට නැමැති හිරුරසින් පැසවා සර්‍වඥමහවියත්කමින් ඝන කොට නිවන්රසයෙන් මිහිරිරස ගන්වා ඒ දහම් නැමැති පොකුරුමී විනෙයජන නැමැති බමරුන් සිත් සේ පෙවූ බුදුන්-පෙ-යුතු.

* සසරදුකට නිසි පිළියම් කියන, නිවණට නිසි ප්‍රතිපත්ති කියන, කුසල්අකුසලට නිසි විපාක කියන, වරදට නිසි ආපත්ති කියන, ආසයඅනුසය දෙකට නිසි දහම් කියන, තමන්ගේ කාය චිත්තප්‍රයොගය

1. නම් වූ 2. පා 3. වැකුණු

Non-Commercial Distribution

හා හැනෙන බස් කියන, නොවළහා අනුන්ගේ ගුණ කියන, 'කරව'යි කට යුත්තක් මැ කියන, 'නො කරව'යි නො කට යුත්තක් මැ කියන, 'දහමැ'යි නොදහම් නොකියන, කුසල් හා පව් නොමුසු කරණ, පව් හා කුසල් නොමුසු කරණ, 'හරුව'යි හැරපියැ යුත්තක් මැ කියන, 'ගණුව'යි ගත යුත්තක් මැ කියන බුදුන්-පෙ-යුතු.

* "තොප ප්‍රශ්නයක් විචාරම්හ"යි කියා ආවා වූ දෙවියන් බඹුන් මරුන් සහිත වූ ලොවට "තා කැමැත්තක් විචාර ඇපි ඒ කියම්හ" යන බස මුත්, ශක්‍රයා විචාරත් "විමසා කියම්හ," බ්‍රහ්මයා විචාරත් "පිළිවන් දෙ හෝ! නොපිළිවන් දෙ හෝ!" යන බස් නො ගත් බුදුන්-පෙ-යුතු.

## 396-400

* හුරු වැ මරණට බා වෙවුලන මලනුවන්ට කියන්නට පටන් ගත් බණ දෙළොස්යොදුන් බරණැසැ ඇත්තවුන් එක ගබඩාවෙක්හි හිඳැ අසන බණ සේ අස්වා ඒ හුරුතුඩින් කී බණ සැටවා දහසක් මුළුල්ලෙහි බුදුතුඩින් කී බණක් සේ සියලු දඹදිව්හි පවත් කළ බුදුන්-පෙ-යුතු.

* එකුන්තිස්හැවිරිදි පමණ ළදවයසෙහි එ වැනි මනහර රුවෙකැ, ගෙදෙර පිරුණු සතළිස්දහසක් නළුවන් රැසෙකැ, පස්පොළෝ පමණින් ගැලී පිහිටි යොදුන්පමණ තුන්ගවුපමණ දෙගවුපමණ ගවුපමණ මුවවිටිපළල් ඇති අක්‍ෂයනිධාන සතරෙකැ, තුෂිතපුරය වැනි තැනක් හැර උපදනට සුදුසු කිඹුල්වත් පුරයෙකැ, හරසර නැති වැ අලුයම්හි දැමූ කෙළපිඩක් සේ නො තකා ඒ සම්පත්තියට බා සත්වකරුණාවෙන් අසකු නැඟී පිට හඹහඹා දිවූ බුදුන්-පෙ-යුතු.

* මහභිනික්මන් නික්මෙන වේලෙහි වශවර්තිමාරයා අහසැ සිටැගෙණැ "මෙයින් සත්වන දවස් තොපට සක්[1] රුවන් පහළ වෙයි. තෙපි මේ ගමනින් වැළැක්කා නම්, සක්[2] රුවනින් හෙබැවී දහසකට වැඩි දරුවන් ඇති වැ සාගරය කෙළවර කොට ඇති මහපොළොව අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් දැනැ සතර මහාසෘද්ධි ඇති වැ සතිස් යොදනෙක්හි හිවී ගැවැසී සිටි මහපිරිස් පිරිවරින් නො අඩු වැ මේ සියලු සක්වළ සඳ රජ කරව. දිව් ඇවැමෙන් දෙව්ලොවට ද යව. තොපගේ ද ඇට දගබ් කොට පිදුවෝ ද දෙව්ලොවයෙති. ස්වාමීනි, වළකුව, වළකුව"යි කියතුදු "පාපිය, තා කියන්නේ කිමෙක් ද? මා පිරූ සමතිස්පැරුම් බුදුබැවින් නො ගෙවා මෙ වැනි ලෞකිකසම්පත්ති පමණෙකින් ඒට නිඳු කෙරෙම් දැ?"යි කුස ගෙණ අසු නො වරදවා අභිමුඛයට මැ අසු විළිමින්[3] ඇනැ මෙහෙයූ බුදුන්-පෙ-යුතු.

---

1. සත් 2. අසු 3. විළුමෙන්

Non-Commercial Distribution

* මහත්බැවින් ලොකොත්තර වූ වියත්බැවින් සවිඳ වූ වචනයෙන් ධාර්මික වූ බුදුන්-පෙ-යුතු.

* ලැහැලි නැඟු කපුරුරුකක් සේ, තමන්ගේ තුෂ්ණීම්භාවය බිඳැ සදහම් ප්‍රකාශ කරණ බුදුන්-පෙ-යුතු.

## 401-405

* සුවඳකෙසුරු ගත් කොකුම්රුක්හි මලක් සේ, සුභාෂිත නැමැති කෙසුරෙන් සියලු තුන්ලොව්හි සුවඳ උතුරුවන බුදුන්-පෙ-යුතු.

ඇතුළුදියෙන් මත්තට පැනැ නැගි මහඇගි රන්පියුමක් සේ සියලුතුන්ලොව ඉක්මැ වැඩී මුදුන් පත් වූ බුදුන්-පෙ-යුතු.

* මතැතුන්ගේ[1] කුඹු හිරණ භාස්වර[2] සිංහරාජයක්හු සේ, ලොකයෙහි නො එක් තීර්ථිකයන් තැති ගැන්වූ බුදුන්-පෙ-යුතු.

* සත්රුවන් උතුළු[3] මුහුදුකුසක් සේ මහඇගි බුද්ධශ්‍රී දවසැ දවසැ උතුරුවන බුදුන්-පෙ-යුතු.

* බොහෝ තරුකැළ පහළ වූ ශරත්කාලයෙහි අහසක් සේ, ද්වාත්‍රිංශත්මහාපුරුෂලක්ෂණයෙන් හොබනා වූ ශ්‍රීශරීරය ලෝවැස්සන්ගේ ඇස්මිදුලෙහි පහළ කෙරෙමින් සියලු තුන්ලොව ලොමුදහ ගන්වන බුදුන්-පෙ-යුතු.

## 406-410

* නීරාජනාමඞගලයට සද සිටිනා රජඇතක්හු හෙයින් බුදු මඟුලට දවසැ දවසැ සැරැහී සිටි බුදුන්-පෙ-යුතු.

* රන්කෙවුන්නෙහි බඳ ජාතිරඞගමාණික්‍යයක් සේ, මහඇගි ධර්මාසනය තමන්ගේ ශ්‍රී ශරීරයෙහි රශ්මිශ්‍රීසමාගමයෙන් බබලවන බුදුන්-පෙ-යුතු.

* මතැතක්හු[4] ඇනි සල්අත්තක් සේ, තමන්ගේ නො එක් විස්මයෙන් සියලු සත්වලොකය චලිත කරවන බුදුන්-පෙ-යුතු.

* සෙණ ගුගුළ හඬින් භය පත් වැ පලන ඇත්වටු[5] කැළයක් සේ නොඑක් වාද කරන්නවුන් තමන්ගේ හඬ ඇසූ පමණෙකින් පතැ පතැ හෙළා ලුහුබැඳැවූ බුදුන්-පෙ-යුතු.

* තමා පහළ වන කල්හි ඒ ඒ ද්වීපයෙහි නො වැරැදැ පහළ වන හිරුදෙවියා සේ, ඒ ඒ විනෙයයන් කෙරෙහි නො වැරැදැ පැණෙන බුදුන්-පෙ-යුතු.

---

1. මදැතුන්ගේ 2. භාස්කර 3. උතුළ
4. මතැතය. 5. ඇත්පොව්

Non-Commercial Distribution

## 411-415

* ගුරුළුරජක්හුගේ පියායෙහි පවතින් සැලීගිය ලියක් සේ සියලු සත්වලොකය තමන්ගේ මහඇඟි වූ ගුණයෙන් වෙවුල්වන බුදුන්-පෙ-යුතු.

* සියලු සත්ත්වයන්ට 'අභය'යි බෙර ලැවූ රජකඳවුරක් සේ, තමන්ගේ ශාන්තිඝොෂයෙන්[1] ලොව උත්සව ශාන්තිකර ධර්මඝොෂයෙන් ඇසූඇසූවන් ඉතා අධික වූ සතුටුසොමිනසින් කරණ ස්තුති ඝොෂයෙන් සියලු ලොව උත්සවකෙළි කෙළැවූ බුදුන්-පෙ-යුතු.

පරසතුකැකුළු දුටු දෙවියන් සේ, තමන් දුටු සියලු ලෝවැස්සන් අධික වූ සොම්නසට පමුණුවන බුදුන්-පෙ-යුතු.

* තන්වැසි[2] වූ රජකුලයෙක්හි වැසි බාලයතුදු කරණ කටයුතු බැහැර සෙනාපතීන්ට ද බැරි වන්නා සේ, තමන්ගේ ශාසනයෙහි හෙරණුන් පුරණ පිළිවෙත් බ්‍රහ්මයන්ට ද උගහට කළ බුදුන්-පෙ-යුතු.

* සුව ලදුවන්ගේ කට යුත්තෙහි ආයාස නො විඳැ නොසුව ලදුවන්ට සැරැහී තමා මැ ආයාස ගන්නා නුවණ වැඩි රජක්හු සේ, ශ්‍රාවකවිනෙය සුව ලදුන් හැරැ බුද්ධවිනෙය සුව ලදුන් පිණිස සැරැහි දුක් විඳිනා බුදුන්-පෙ-යුතු.

## 416-420

* අනවරතයෙන් බණ අසන පිණිස එළඹෙන දිව්‍යබ්‍රහ්ම නැමැති පහන් රුකින් මැ තමන් වසන වෙහෙරෙහි අඳුරු නැති කරණ බුදුන්-පෙ-යුතු.

* ඥානයෙන් වැඩියවුන්ට තනතුරු දී මඳනුවණ ඇත්තවුන්ට උපදෙශ දී වඩනා නුවණැති මහරජක්හු සේ, පාත්‍රයන්ට අමාමහ නිවන් දී නොමූ කළ නුවණ ඇත්තවුන්ට මතු නිවණ[3] පිණිස කමටහන් දෙන බුදුන්-පෙ-යුතු.

* පරදෙශයෙහි සතුරුවිජයට ගිය යුද්ධනායකයාගේ කටයුත්ත සිහි කොට කොට 'මේ කර. මේ කර'යි ඔහු කළ මනා කට යුතු කියා හුන්තන්හි හුන් රජක්හු සේ, බැහැරැ නො එක්තන්හි ක්ලේශයන් දනන පිණිස කමටහන් ගත් මහණුන් සිහි කොට කොට නිවණට උපදෙශ දෙන බුදුන්-පෙ-යුතු.

* ධෛර්‍ය්‍යයෙන් වීර්‍ය්‍යයෙන් කරුණායෙන් ප්‍රඥයෙන් පුරුෂාකාරයෙන් තදින් මොළොකින් මදින් බෙහෙවින් සතුටු කරවමින් භය පත් කරවමින් කට යුතු වූ සියලු ලෝවැඩ සිටුම්[4] නැති වැ මතු පැමිණවූ බුදුන්-පෙ-යුතු.

1. සොෂාවෙන් 2. තමන් වැසි 3.නුවණ 4. සිටි

Non-Commercial Distribution

* කල් නො වරදවා තමා දවසැ කළ මනා කට යුතු නො සිටුවා[1] කරණ නොපමා රජක්හු සේ, තමන් විසින් කට යුතු වූ පස් බුදුකිස දවසැ දවසැ අවිච්ඡින්න කොට පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

## 421-425

* බාලපුතක්හු කටු හැර මස් කවන ල ඇති මවක සේ, තමන්ගේ පුත් වූ සියලු ලෝවැස්සන් මිථ්‍යාදෘෂ්ටි හැර සම්‍යග්දෘෂ්ටි අනුභව කරවන[2] බුදුන්-පෙ-යුතු.

* ඇත්ගොදුරු සා ගොදුරු වුව සම වූ හඬින් මැ හඩා ගන්නා සිංහරාජයක්හු සේ, බ්‍රහ්මයාට ද චණ්ඩා දූන්ට ද එක විලාසයෙන් මැ බණ දෙසන බුදුන්-පෙ-යුතු.

* ශක්‍රදෙවෙන්‍ද්‍රයා හිසැ පරසතුමඳරාමල්දමින් තමන්ගේ මල මූත්‍ර තුබූ භාජනය අදනා පිණිස සුඹුළු බැඳැවූ බුදුන්-පෙ-යුතු.

* තමාගේ සතරමුහුණෙහි සතරපැහැයෙන් මුහුදට සතර වණක් පැහැ දුන් රුවන්මෙරක් සේ, තමන් දත්තා වූ චතුස්සත්‍යයයෙන් සියලු ලොවට චතුස්සත්‍යාවබොධ දුන්[3] බුදුන්-පෙ-යුතු.

* ගිමින් තැවී වළල් දුටු විල්හි මෙඝනාදය ඇසූ මස්කැළයක් සේ, ධර්මසභායෙහි තමන්ගේ මිහිරිබණ අසන සිව්වණක් පිරිසට ඉතාමහත් සොම්නසක් උපදවන බුදුන්-පෙ-යුතු.

## 426-430

* මවු මුහුණ බලබලා සතුටින් සිසී කිරි බොන පුතක්හු සේ, තමන් ශ්‍රීමුඛය බලබලා සතුටුසොම්නසින් බණ අසන සිව්වණක් බණපිරිස් ඇති බුදුන්-පෙ-යුතු.

* පහළ වූ සක්රුවන්හි මණිකිංකිණිඝොෂ ඇසූ සක්විත්තන් සේ, තමන්ගේ මධුර වූ සද්ධර්මය ඇසූ දෙව්බඹුන් ආදි වූ සියලු සත්ත්වයන්ට සන්තොෂ එළවන බුදුන්-පෙ-යුතු.

* කවුඩු වැ ගුරුළුන්ට වැඩි, බලු වැ සිංහයන්ට වැඩි, චණ්ඩාල වැ බ්‍රහ්මයන්ට වැඩි, වැලිකෙළියෙහි සිටැ මුළුලොව්හි වියතුන්ට වැඩි, වඳුරු වැ රජුන්ට වැඩි බුදුන්-පෙ-යුතු.

* දැවාණ හා එක් වැ තුබූ බඳුවදමල තමා රත්පැහැගුණයෙන් ඒ දැවාණ රඳන්නා සේ, තමන් වැනි මේ සියලු ලොව තමන්ගේ ගුණයෙන් ගුණානුරාග ගැන්වූ බුදුන්-පෙ-යුතු.

---

1. සිඳුවා 2. දෘෂ්ටි කරවන 3. කරවන්නාවූ

Non-Commercial Distribution

සසරපමණින් ආවා වූ යාචකයන්ට 'හිඳව' යන, යහපතුන්ට 'මම'යැ යන, උගහටපැනයට 'දන්මි' යන, බණ යැ යි කිව 'කියමි' යන, මවුන් පියන් ගුරුන් ආදීන් වුව 'වඳිමි. පුදමි' යන පරාර්‍ථයෙහි වුව 'මම යැ' යන, ධර්‍මයට 'මම යැ' යන, දහමට 'පිහිටයෙමි'යි යන, සබවසට 'දිවි දෙමි' යන, බොරුවට 'වෙවුලමි' යන, සාධූන් දකිම්ව'යි යන, 'අසාධූන් හා එක් වැ නො පැසෙම්ව'යි[1] යන 'හිතොපදෙශය දෙමි'යි කිව 'සාධු, පිළිගන්මි'යි යන, අත් පා ආදී කපන්නන්ට 'ක්‍ෂමා කෙරෙමි'යි යන, හිස් සිඳිනවුන්ට 'දීගායු වේව'යි යන, 'පඤ්චකාම යැ'යි කිව 'නින්‍දා කෙරෙමි'යි යන 'සංස්කාරධර්‍මයැ'යි කිව 'අනිත්‍ය යැ, දුඃඛ යැ, අනාත්ම යැ'යි යන, 'දුකැ'යි කිව එ මම් විඳිමියි යන, 'සුව යැ'යි කිව 'ඒ අනුන් විඳුවමි'යි යන, 'නිවණැ'යි කිව 'ලොවැස්සන් විඳුවා විඳිමි'යි යන, 'ගිහිගෙය'යි කිව 'නො වෙසෙමි' යන, 'පැවිදිබව යැ'යි කිව 'සාධු යැ, යහපතැ'යි යන, සාතුඩින් 'මා ඇහමස් කා'යි කී යන, මත්ස්‍ය වැ උපන් තුඩින් 'මා අනුන්ගේ ප්‍රාණ නො නැසූ සැබැවින්[2] වැසි වසීව'යි යන, වටු වැ 'මාගේ සබවස බලයෙන් මේ ගිනි නිවේව'යි යන, මොනරතුඩින් 'බුදුහු මා රකිත්ව'යි යන, ගිරාතුඩින් 'මවුන් පියන් රකිමි' යන, ඇත් තුඩින් 'මාගේ අන්‍ධ වූ මෑණියන් හැර මම ගොදුරු නො කමි' යන, වඳුරුතුඩින් 'මා ආශ්‍රය කළවුන්ට සුව දින්මි. එහෙයින් වධබන්‍ධනය මා නො තව'යි[3] යන, කවුඩුබලුතුඩින් 'මෙහි දහම් පිරූ කල්හි ස්වර්‍ගීය සිද්ධ වේ'යි යන, හුරුතුඩින් 'දහම්විල් බැසැ රාගරජස් දෙවැ සිල්විලෙවුන් ගණුව'යි යන, මේආදි වූ බසක් මුත් අනන්තජාතියෙහි මැ මේ වන් බසින් පිටත් බසක් නො කියන බුදුන්-පෙ-යුතු.

## 431-435

* බත් වළඳ අනුමෙවුනිබණ වදරණ ඇසිල්ලෙහි දික්සහි මැඳුම්සහි පමණ බොහෝ බස් අවිච්ඡේදයෙන් පවත්වන්නවුත් තමන් පන්සාළිස් හවුරුද්දක් පමණ කල් පැවැත්වූ දහම්රැසින් අමාමහනිවණට හේතු නො වැ සසරදුකට ප්‍රතිපක්‍ෂ නො වැ එක පිල්ලකුත් නො පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

* අනන්තාපර්‍ය්‍යන්තජාතියෙහි සතුරන්ගේ ද ගුණයක් දුට සතුටු වැ වර්‍ණනා කිරීම්හිදු මවුපියන්ගේ ද නොගුණයක් දුට 'මේ නපුරැ'යි ගර්‍හා කිරීම්හිදු නොහැකිළියා වූ තුඩු ඇති බුදුන්-පෙ-යුතු.

---

1. වෙසෙම්වයි　2. නැසූ බැවින්　3. කරවයි

Non-Commercial Distribution

* උපන්කෙණෙහි සත්පියවරක් ගොස් දසදිග බලා 'මම මේ ලොවට අග්‍ර වෙමි'යි කීකල්හි ඒඇසූ දෙව්බඹුන් ආදි වූ සියලු ලොව්හි කොඳුරා නැඟුනු එක ද සත්ත්වයකුත් නැති බුදුන්-පෙ-යුතු.

* තමන්ගේ තුඩින් බසක් ලෝවැස්සන් අස්වාපියන පිණිස දසදහසක් සක්වළැ ශක්‍රයන් හා බ්‍රහ්මයන් හා තමන් පාව්ටැ හී ආරාධනා කරණ පරිද්දෙන් මහඇගි වූ බස් ඇති බුදුන්-පෙ-යුතු.

* තමන්ගේ බසින් එකගාථාපදයෙක්හි ආඥරෙබා පමණක් කෙළ ලක්‍ෂයක් පමණ සක්වළැ දෙවියන් බඹුන් නො පිතියැ දුන් බුදුන්-පෙ-යුතු.

## 436-440

*'මම ධාර්මිකයෙමි' යන, 'මම සාධුයෙමි' යන, 'මම වියත්මි' යන, 'මම තිලෝගුරුමි' යන, 'මම කල්‍යාණමිත්‍රයෙමි' යන, 'සියලු සත්ත්වයන් තිවන්හි ලත් මම් මැ යැ' යන, 'දෙව්බඹසැපත් නම් මාගේ ප්‍රතිපත්තිඵලයෙහි පිටපොතු යැ' යන, 'සතුරුමිතුරන් කෙරෙහි මම් මැ එක්සිත්මි' යන, 'සියලු ඥෙයමණ්ඩලයට මාගේ මැ නුවණ වැටෙ'යි යන, 'සියලු සත්ත්වයන් රක්නට මා එක තැනැත්තහුගේ කරුණාව මැ පමණැ'යි යන, 'සුවිසි අසංඛ්‍යයක් සත්ත්වයන්ට නිවන්පුරය පවුත්, මා කී මහ මිසැ අනික් මඟෙක් නැතැ'යි යන, 'ලොකයෙහි මා වැන්නවුන් මුත්, මා කළ ශාන්ති ලොකයෙහි අනික් කරන්නෝ නැතැ'යි යන, නො බොරුබස් කියන, 'දසදහසක් සක්වළ මට ජන්මක්‍ෂෙත්‍ර යැ'යි යන, 'කෙළ ලක්‍ෂයක් සක්වළ මට ආඥක්‍ෂෙත්‍රයැ'යි යන, 'අනන්තාපරිමාණ සක්වළ මට විෂයක්‍ෂෙත්‍ර යැ'යි යන, 'කී සේ මැ යහපතැ'යි කියවා බණ කියන, 'කළ සේ මැ සුදුසු යැ'යි කියවා කටයුතු කරණ, එකදහම්හි දෙබස් නොවන, එකවස්තුවෙහි ඇති තත්ත්ව මුත් දෙලෙසක් නො දන්නා වූ, දත් වස්තුව බැණැ[1] හිම් කරන්නට සියලුලොව එක ද සත්ත්වයක්හු නො දන්නා වූ, ක්ලේශය යන නමක් ලද්දවුන් සවාසන වැ නටුවන් කෙරෙහි සැලසූ,[2] සියලු ලෝවැස්සන් ලද්ද වූ ජීවිතඵලය ප්‍රසාදයෙන් තමන් දිශායෙහි දැල්වූ එකඇසවරකට සරහන, භවාග්‍රයෙහි වූ ද සාධූන් හා එක්සිත් වූ, එකවිහාරයෙහි ද අසත්පුරුෂයන් හා වෙන් සිත් වූ, 'මරහු පැරැද්ද[3] යන මෙබස් ලොකයෙහි එක තමන් කෙරෙහි කියවූ, සසර උඩුහුරු දෙන අනුශාසනාවක් නො කරන්නා වූ, 'මම ආචාර්‍ය්‍යයෙමි' යන බස එක සතකුත් නො හැර කියන්නා වූ,[4] 'බුදු යැ' යන මේ නම්හි එක ඇහිල්ල මැ, නැමි වූ[5] නොබොරු තිවන් තමන් එක නමින් ලොවට දුන්, නො එක් තීර්ථිකශාසනයෙහි නිවණට ප්‍රතිපත්ති පිරුවන් යන මහ[6]

1. බැඳ 2. සමඵල 3. පැරදවූ 4. කියන්නා වූ
5. නැම්ම වූ 6. මම

Non-Commercial Distribution

තමන් කී පරිද්දෙන් ප්‍රතිපත්ති පිරූවන් නො යා දෙන්නා වූ, 'ඇපි බුදුම්හ'යි පැලඹුනු තුඩින් වණවවණවා[1] 'ශ්‍රාවකයම්හ'යි කියවූ, තමන් එකතුඩින් මැ ආ බස් ලොවට දහම් කළා වූ, තෘෂ්ණාවට ද හිමිකම් පැවැත් වූ, ධර්මදෙශනා කොට තත්පර වූ,[2] දහමින් මැ නම් නැඟි, ප්‍රතිපත්තියෙහි මැ 'කරව' යන, දහම්හි 'බණව' යන, තමන්ගේ ශාසනයට මැ 'එව' යන, නිවණට මැ යව, යන,[3] තමන් නොහමුයෙහි දෙසැටදෘෂ්ටි ගත්තවුන් තමන්ගේ දහම්හි ගැහු දැල්ල පිසැ හළුවා වූ, අධර්ම එවැ නො සලසා නිරවද[4] දහම් මැ ලොවට වික්කා වූ, ආදිකල්පයෙහි පටන් ගෙණැ සියලු ලොකයෙහි නිර්වාණමාර්ග යැ යි ප්‍රසිද්ධ වූ සෘග් යජුස් සාමන් අථර්වන් යන සතර වෙදය වැනි දෙයක් පවා නිමන්මඟ නො වෙයි කියා දිව නො හනුළුවා කියා ලොව සිත් ගත්තා වූ, අනාත්මලක්‍ෂණය හඟවා 'මම මම නො වෙ'යි යන බසන් පවා පස්වාදහසක් මුළුල්ලෙහි සතුන් මුවෙහි වැකූ, 'ඔ හෝ! මම මෙතැනැ සිටියෙමි'යි කීකල්හි 'මෙ පය ඔවුන් සිටි තැනට දික කළ සේ නපුරැ'යි කියා හයා ගන්නා පයක් ලෝවැස්සන් මුදුනට නොදික් කරන්නා වූ බුදුන්-පෙ-යුතු.

## 441-444

* දෙවියන් වෙහෙරවැසි කළා වූ, දිව්‍යස්ත්‍රීන් දෙව්මිඩි කළා වූ, බඹුන් මහුල්ගැති කළා වූ, රජුන් වෙහෙරදරු කළා වූ, නයින් දරණගබ ගඳකිළි කළා වූ, මතැතුන් උපස්ථායක කළා වූ, වඳුරන් උපාසක කළා වූ, බකමුහුණන් පසේබුදුතැනට හෙතු ලද්දවුන් කළා වූ, මඬුවන් බණපිරිසැ ඇතුළත් කළා වූ, තමන්ගේ ශ්‍රීපාදමූලයට 'මූ මූ අවු යැ. මූ මූ නො අවු යැ'යි නො කියවා මිහි බඳ බඳ තැනට දිවන බමරුන් සේ, දිව්‍ය බ්‍රහ්මයන් ආදි වූ සියලු සත්ත්වයන් තමන් පාවිටට මැ දිවැවූ බුදුන්-පෙ-යුතු.

* නගනවෙශවැ[5] 'බුදුම්හ'යි කියන්නවුන් බුදුබවට කළ නිගා හැරැවූ බුදුන්-පෙ-යුතු.

* 'මහගම්කුණු නිවන්මඟ යැ. තාපය නම් මොක්‍ෂයට ප්‍රතිපත්ති යැ'යි නො මඟහි ලෝවැස්සන් බඳ 'මඟ යැ' යන ආදරය තිඳුවට පැමිණි වූ බුදුන්-පෙ-යුතු.

* 'කම් නැත. කම්පල නැත. මවු නැත. පියෝ නැත. ශ්‍රමණ-බ්‍රාහ්මණයෝ නැත' යන සොසොපු[6] දහම් පවා දහමෙකැයි ගත් මුග්ධ වූ ලොකයෙහි දුකට කාරණ යැ යි හරවා[7] මැ දහමට පාත්‍ර කළ බුදුන්-පෙ-යුතු.

1. වන්දවන්දවා 2. තවද තවර වූ 3. නිවණට යවන
4. නිර්වාදීය 5. පැ 6. සොපු 7. ද තමන් ගැඹුරු වූ

Non-Commercial Distribution

## 445.

* 'කරුණාවට ප්‍රඥවට ප්‍රතිපක්ෂ දෙයක් මොහු යැ කොළෝ යැ'යි නො කියවූ, සමහර කටයුතු දෙයක් නො කොට තබා නො පිරිනිවී, නිවටුන් ආයර්‍යයන් යැයි වැඳැපෙරළෙන ලොවැස්සන් අෂ්ටායර්‍යපුද්ගල-සඞ්ඝරත්නය මැ වදන පරිද්දෙන් බුද්ධශාසනය හෙබවූ, සබාමිහිරින් මිහිරි වූ, සමන්තාත්වක්ෂුසින් චක්ෂුස් ඇති, විජ්මින් බසැති, නො බිණුව මනා තැනැ මැ තුෂ්ණිම්භාවය ඇති, බිණුව මනා තැනැ මැ වාග්මී වූ, කිය යුතු පමණින් මැ මනා කොට බණන, දැමිය යුත්තන් පමණින් මැ කරුණා ඇති, ඥෙය පමණින් වියත්, ලොව පමණින් මහත්, වැඩපමණින් හැසිරෙණ, උත්පත්තියෙන් රජ වූ, නිෂ්පත්තියෙන් බුදු වූ, මහතින් තිලෝගුරු වූ, දැන්මෙන් අනාචායර්‍ය වූ, උපමා නැතිබැවින් හුදෙකළා වූ, හැමකල්හි මැ නොවන හෙයින් දුලීභ වූ, මහත් වූ ශීලස්කන්ධාදි ගුණයන් සෙවූ හෙයින් මහෙසි වූ, බාහිත වූ පාප ඇතිහෙයින් බ්‍රාහ්මණ වූ, සංහිඳු වූ පාප ඇති හෙයින් ශ්‍රමණ වූ, රාගාදික්ලෙශ මල නැතිහෙයින් සකස් වූ, තමන්ට වැඩට බැහැර වූ, අනුන්ට වැඩට සුහුඹුල් වූ, කිසි නොගුණයක් නැතිහෙයින් නුගුණයට දුගී වූ, ගුණයෙන් ධනී වූ, ධර්‍මචක්‍රයෙන් චක්‍රවර්ති වූ, සසරට සතුරු වූ අදහමට විෂ වැළඳ වූ, දහම් පිරිමසන මවු වූ, කරුණාව පසුපස්සෙහි හැසිරෙණ, ඥනයට අනු වූ, කට හැකි කටයුත්තෙහි උපෙක්ෂාවක් නැති, තමන්ගේ කට යුත්තෙහි පිටිවහලක් නො තකන, සියලු ලෝවැස්සන්ගේ සුචරිතයට පිටිවහල් වැ සිටිනා, කුශලාකුශලකර්‍මයන් සේ මැදහත්, ජීවිතය සේ නො හැරියැ හැකි, නිවන් සේ පැතිය යුතු. තමන් බිණුබිණුදෙය ලොවට දහම් කරණ, කළ කළ දෙය පිළිවෙත් කරණ, සිතූ සිතූ සේ මැ සිතට ප්‍රියවූ, වැදැ විමසුවිමසූ සේ මැ සාරයක් මුත් අසාරයක් නො පැණෙන, රුවින්[1] බැලියැ හැකි බසින් ඇසියැ හැකි, ගුණයෙන් වින්දැ හැකි, දිවියෙනුදු[2] පිදියැ යුතු, ගිනි වැදත් කී දෙයකට යුතු වූ, 'ඔවුන් කීයේ යැ'යි කීකල්හි 'ඒ එසේ මැ යැ'යි ගිවිස්සැ යුතු වූ. නො බුදු වැ නො දත හැකි වූ, බුදු වත් වර්‍ණනා කොට නිමවියැ නො හැක්කාවූ, දුක් හා එක්වැ සිතට නො වදනා වූ, රාග හා එක් වැ භාවනා නො කට[3] හැක්කා වූ නො පිණෙකින් නො ලැබෙන්නා වූ. බුදුන්-පෙ-යුතු.

## 446-450

* ආදිකල්පයෙහි කුඩු හා තෝ හා නැති සහල් ගත් හැල් කරල් සේ, බොරු නැති වූ කලඞ්ක නැති වූ ශුද්ධ වූ දහම් ලොවට දවසැ දවසැ පැවැත්වූ බුදුන්-පෙ-යුතු.

---

1. බැවින් 2. දිවියෙ නමුදු 3. කොට

Non-Commercial Distribution

* හුදුබුදු වූ වියතුන් කළ දැයක් මුත් ඉන් පිටත දැයක් කළහයි නො කියවූ බුදුන්-පෙ-යුතු.

* මල් පිපි පරසතුරුකක් සේ තමන් උපන් ලොව සුවපත් කළ, මහාසායෙහි මහවැව් පුරා වට වැස්සක් සේ තමන් උපන් ලොව දහම්වැස්සෙන් සුභික්ෂ කළ, කෙවුන්නෙහි බඳ රුවනක් සේ තමන් උපන්ලොව සනාථ කළ, මිහිබඳ ගසක් සේ තමන් උපන් ලොව මිහිරි කළ, භද්‍රජාති ඇතුන් සිටි කාලිඞග වනයක් සේ තමන් උපන් ලොව මහඇහි කළ, මහඇහිමුතු දෙන මුතුමුවදෙර මුහුදක් සේ තමන් උපන් ලොව ධර්මරත්නාකර කළ, ගොකුණෙහි සිටි ගොරදක් සේ තමන් උපන් ලොව මඞගල්‍ය කළ, සඳුන් කපුරු උපදනා දඩුවනබෙහෙදක් සේ තමන් උපන් ලොව මිල වැඩි[1] කළ, මහානිධානයක් එබූ ප්‍රදෙශයක් සේ වැඩැසිටි තැන කොතන ද්‍රේ හොයි ලෝවැස්සන් ලවා විමසවන, විදශීනාවෙහි එලසිතක් සේ සාරපරම්පරායෙහි කෙළවර සිටියා වූ බුදුන්-පෙ-යුතු.

* මුහුදැ බමා සුව සේ පටුන් වැදැ ගල් හෙළා සිටි මහනැවක් සේ, සාරාසඞඛ්‍යකප්ලක්ෂයක් සසරමුහුදෙහි බමා නිවන් නැමැති සුපටුන් දැකැ සොපධිශෙෂ නිවන්තොටෙහි කෙළවර අත්බව් නැමැති බරු හෙළා සිටි බුදුන්-පෙ-යුතු.

* ජයකඳවුරට වදනා රජහු සරහන පිරිසක් සේ, නිවන්පුර නැමැති ජයකඳවුරු වදනට සිට සුවිසිඅසඞඛ්‍යයක් ක්ෂීණාශ්‍රව පිරිස් සැරහු බුදුන්-පෙ-යුතු.

## 451-455

* අදනා ගෙරිවගය පසුපස්සෙහි යන රුවන්බඩුගැලක් සේ, කරුණා ප්‍රඥවගයෙහි හී එ අනුව වැ දහම් නැමැති සත්රුවන් බඩු අදනා බුදුන්-පෙ-යුතු.

* තමන් තමන් ගේ වීථියෙහි යන නකත්තරුවන් කරා, එළඹෙන චන්‍ද්‍රයා සේ, ඒ ඒ තන්හි හැසිරෙණ විනෙයජනයන් කරා දවසැ දවසැ එළඹෙන බුදුන්-පෙ-යුතු.

* සතර මහාද්වීපයට උතුරුදිග නො හැරැ ස්ථාන නියම ලද මහමෙර සේ, රූපප්‍රමාණරූපප්‍රසන්න, ඝොෂප්‍රමාණඝොෂප්‍රසන්න, රූක්ෂප්‍රමාණරූක්ෂප්‍රසන්න, ධර්මප්‍රමාණධර්මප්‍රසන්නවන චතුඃප්‍රමාණ සත්ත්වයන්ට එකාකාරප්‍රසාදස්ථාන වැ සිටි බුදුන්-පෙ-යුතු.

1. ලොව වැඩි

Non-Commercial Distribution

* මුල්හි පටන් ගෙණ අන්තයෙහි පහරවා සර්වස්ථානයෙහි මැ ප්‍රණීතඵල ගන්නා පනසද්‍රැමයක් සේ, තමන්ගේ මූලප්‍රණිධියෙහි පටන් ගෙණැ ධාතුපරිනිර්වාණය දක්වා සියලු සත්ත්වයන්ට පරම මධුර වූ ස්වර්ගාපවර්ගඵල දෙන බුදුන්-පෙ-යුතු.

* පළහගු එපමණ වැ පතන පිනීම් ඇත්හු කෙ සා[1] වැ ද පිනිය නො හෙන්නා සේ, තමන් බලු වැ කවුඩු වැ ඉපැදැ කරණ ලොකාර්ථ සේ, සෙසුසතුන් මහබඹ වැ ද නො කට[2] හෙන පරිද්දෙන් විචිත්‍ර වූ චරිත කරණ බුදුන්-පෙ-යුතු.

## 456-460

* මනුෂ්‍යකුමාරයන් වයසට පැමිණැ නො යන ගමන් බාල වස්සා උපන්ද මැ යන්නා සේ, සෙසු සියලු සතුන් කිසිවැඩිමහලු වයසට පැමිණැ ද නො පැවැත්විය හෙන ක්‍ෂමාව මෛත්‍රිය පරාක්‍රමය යන මේ ආදී ගුණ තමන් උපන් දවස මැ පැවැත්වියැ හෙන බුදුන්-පෙ-යුතු.

ගිනි ආදියෙහි ශුද්ධාෂ්ටකය ඇත ද, අධික වූ අංශකය ගෙණැ ගිනිආදි වූ බැවහාර කරන්නා සේ, තමන් සිටි ලොව්හි ශක්‍ර බ්‍රහ්මාදීන් ඇත ද, තමන්ගේ අධිකබව හෙතු කොට ගෙණ 'මහාසත්ත්වය' යන නම් ලද බුදුන්-පෙ-යුතු.

* කිණිහිරිමල් කෙ සා මහත් වුව ද සුවඳ කැමැත්තවුන් හිසට කුඩා වූ අම්ගෙන්ද සිහින්ගෙන්ද ආදි වූ මල් පලඳනා සේ, තමන් වන් ලොකයෙහි දෙවිබඹුන් කෙසේ පැලැහි වුව ද ගුණ කැමැත්තවුන්ගේ සිතට වටු වැ ඉපැදැ ද තමන් මැ නැහිබව මුත් එ දෙවිබඹුන් නො නැංගැ දුන් බුදුන්-පෙ-යුතු.

ආදියෙහි පටන් තණයෙහි මැ පුරුදු වූ ඇත්හු ක්‍රමප්‍රතිපත්තියෙන් මධුර වූ හොජනයෙහි මැ පුරුදු කරවන හස්තිවෛද්‍යකු සේ, බොහෝ කලක් අධර්මයෙහි මැ පුරුදු වූ ලෝවැස්සන්ට තමන්ගේ ප්‍රතිපත්තියෙන් මධුර වූ ධර්මය පුරුදු කළා වූ බුදුන්-පෙ-යුතු.

මහදියවතුරෙහි මව නහා දුන් පයෙහි එල්බැ සැතැපී සිටිනා ඇත්පැටවකු සේ, සසර දුක් නැමැති වතුරෙහි තමන් වැඩූ කරුණාවට ලෝවැස්සන් නහා ගෙණ සැතැප්පූ බුදුන්-පෙ-යුතු.

---

1. කෙසේ 2. කොට

Non-Commercial Distribution

## 461-465

* මලලවිද්‍යා උගත් පමණින් සම්දරුමල්ලයා හා මල්ලව ගන්නා බමුරන් සේ, පාරමිතා පුරන්නට සසරෙහි සිටුවන ගුණයෙන් ක්ලේශයන් ගුණධම් හා උනුන් ගැන්වූ බුදුන්-පෙ-යුතු.

* සිතියම්හි අඳනා රූ භයඞ්කර නො වැ විමානයෙහි ශොභාවට කාරණ වන්නා සේ, තමන් ගත්තා වූ ක්ලේශයන් භයඞ්කර බවට නො පමුණුවා පාරමිතාවන්ට කාරණ කළ බුදුන්-පෙ-යුතු.

* රූ නැත්තවුන් නටන නැටුමක් සේ, ගුණනැති බැවින් නො මිහිරි පැලඹුමක් නො ගත් බුදුන්-පෙ-යුතු.

* අසා පරණ වැ නොමිහිරි වූ ගීයක් සේ, කියා පරණ වැ නොමිහිරි වූ බණක් නො කියන, දැක 'පරණ යැ'යි මුහුණ ඇළ කරණ අමධුර වූ විලාසයක් නැති බුදුන්-පෙ-යුතු.

නොයෙක් දෙශයෙහි අක්‍ෂරභෙදය වෙන් වුව ද සංස්කෘත වූ ශබ්දාර්ථය වූ කලී අභින්න වන්නා සේ, සසරපමණින් ජාති භෙදයෙන් තමන් වෙන් වුව ද තමන්ගේ කරුණාප්‍රඥා දෙක එකාකාරයට යවා සකසා තුබූ බුදුන්-පෙ-යුතු.

## 466-470

* පිටැ මිනිසුන් නැති ශික්‍ෂිතඇත්හු මදවෙශයෙන්[1] නියඞ්ත්‍රණ වැ කලක් බමා ආරොහකයා පිටට පිනූ කල්හි ඕහට අනුවැ කටයුත්තෙහි පවත්නා සේ, සංසාරයෙහි[2] කිසි කලක් කාමාවෙශයෙන් නියඞ්ත්‍රණ වැ කිසිකාරණයෙකින් නිර්වෙදය තමන් සිතට නැඟිකල්හි ඒ නිර්වේදය අනුවැ කර්තව්‍යයෙහි පවත්නා බුදුන්-පෙ-යුතු.

* ලොකයෙහි මිථ්‍යාදෘෂ්ටිගුරුන් මිථ්‍යාදෘෂ්ටි නැමැති උන්මාද ඖෂධය වළඳවා ලෝවැස්සන් අනවස්ථිත කොට වියරු හෙළා "දියලනු කඩා මහලුපැවිදි වූහ. මැඩිපිනුම් පනින්නට[3] උන් තරම් කෙනෙක් නැත. බලුබිරුම් අනික්තෙනෙකැ නැත. ගොන් ගමනට ඔහු මැ සුරුහ. වසුගොම කැවුමෙහි එසේ සුරුහු නැතැ"යි කියවා 'සර්වඥයම්හ'යි ලොවට මෙසේ කෂ්ට වූ ප්‍රතිපත්ති පානා කල්හි "ඔහු සර්වඥයෝ මැ යැ. ඔවුන් පැයේ නිර්වාණමාර්ගයෙක් මැ යැ"යි වරදවා ගෙණැ සතරඅපායෙන් ගැලවී ගත නො හෙන ලොකයෙහි තමන්ගේ ශාසනයෙහි කසාවත් පොරෝණට

1. මනා දොෂයෙන් මදවෙගයෙන්
2. සංස්කාරයෙහි
3. පිහිනුම් පිහිනන්නට

Non-Commercial Distribution

කරණ පළමු ගැරහුමෙහි මැ සමහර සච්චන් හිස එබූ කරඅගහි මැ සිවුපිළිසිඹියාපත් රහත් කරවන බුදුන්-පෙ-යුතු.

* 'මනාවූ ප්‍රතිපත්ති පවුම්හ'යි කියා මවුන් පියන් ගේ මිදුලෙහි වැඩිමහලුදරුවන් අපගතවස්ත්‍ර කොට ඇවිදුවාපියන මිථ්‍යාදෘෂ්ටිගුරුන් පවා 'සර්‍වඥය'යි සිතා ගෙණැ නස්නා ලෝවැස්සන්ට මනා වූ ප්‍රතිපත්ති පැ අමාමහනිවන්හි ලන සේ දන්නා[1] බුදුන්-පෙ-යුතු.

* පුත්‍රයා කෙරෙහි කළ ස්නෙහයෙන් ප්‍රසවවෙදනාවෙහි සරු නැති මවක සේ, සත්ත්වයන් කෙරෙහි කළ ස්නෙහයෙන් තමන් ගන්නා දුකෙහි සරු නො කළ බුදුන්-පෙ-යුතු.

* කුස පිරෙණ පිණිස මුවෙහි ආහාරය තබන්නා සේ, ලෝවැස්සන් සමෘද්ධ කරණ පිණිස තමන් ලෙහි ගුණදහම් පිරූ බුදුන්-පෙ-යුතු.

## 471-475

* දර පමණින් ඇවිළි ගිනක් සේ, ක්ලේශයන් පමණින් මැ පවත්නා ප්‍රභාණධම් ඇති සක්වළගල් ඇතුළත්හි නො පිටත් ව බමන හිරසඳ ආලොකයක් සේ, සත්ත්වසීමාවෙන් නො පිටත් වැ පවත්නා ඥානාලොක ඇති; වියැලිවියැලි සේ සුදුපැහැ ගත් තල් පතක් සේ, තෘෂ්ණාවගේ වියැලීමෙන් ගත්තා වූ ශුද්ධ බව ඇති ඇත්හුගේ පයට ගැටෙන කුහුඹුවන් සේ, තමන්ගේ පාමුල්හි ගැහැටෙන්නා වූ තීර්ථකයන් ඇති බුදුන්-පෙ-යුතු.

* හිමාලය පර්‍වතයෙන් බට නොයෙක් ගං ඒ හිමාලයපර්‍වතයට පිටි පැ මුහුදට යොමු වැ යන්නා සේ, කුලගෙන් නික්මැ එකුල ගෙට පිටි පැ දහමට යොමු වූ සිත් ඇති වියත් වූ මහණපිරිවර ඇති බුදුන්-පෙ-යුතු.

* දියෙහි ගැලුව ද වෛගන්‍ධයක් ඇති නොවන කසට කැවූ සම් සේ, සසරෙහි ඇවිදැ ද විකාරයක් නොගත් ගුණෙන් කසට කැවූ සිත්ඇති බුදුන්-පෙ-යුතු.

* සඳහිරුහසරක් සේ, සියලු ලොව මැඩැ ගෙණැ මස්තක ප්‍රාප්ත වැ පවත්නා වූ ගුණප්‍රවෘත්ති ඇති බුදුන්-පෙ-යුතු.

* සඳ සිටි නකතින් දවසට නකත් ලැබෙන්නා සේ, තමන් සිටි ගුණෙන් ලොවට ගුණ දෙන බුදුන්-පෙ-යුතු.

## 476-480

* පැන් පහයන මැණික ගැවුනු කල්හි කැලැති දිය පහන් වන්නා සේ, තමන්ගේ දහම්හි[2] ලෝවැස්සන්ගේ සිත් ක්ලේශයන්ගෙන් වූ කිලුටු හැර පහන් කරවන බුදුන්-පෙ-යුතු.

---

1. ලන 2. දහම්හි

Non-Commercial Distribution

* පහන් වී යැ යි කී කල්හි හිරු නැඟි බව නො කීවත් අනුමාන කට යුතු වන්නා සේ, 'දහමැ'යි කී තැනෙක්හි තමන් පහළ වන බව නො කීවත් හඟවන්නා වූ. බුදුන්-පෙ-යුතු.

* ඒ ඒ විඳුනා සත්ත්වයන්ගේ පිණින් නිෂ්පන්න වූ සක්වළ වෙසතුරක් සේ, ඒ ඒ අවයව බලා විඳැ තිවෙන සත්ත්වයන්ගේ පිණින් ඇති වූ රූපකායසන්නිවෙශ ඇති බුදුන්-පෙ-යුතු.

* සක්රුවන් පහළ වූ රජගෙදෙරක් සේ, තමන්වහන්සේගේ දෙරැ ඉතා අධික වූ විස්මය සොම්නස් උපදවන බුදුන්-පෙ-යුතු.

* බද්ධ වූ අන්ධකාරයෙහි පළමු හිරුමුහුණු දුටු ආදි කල්පයෙහි සත්වයන් ගත් ශූරභාවයක් සේ, මොහයෙන් ඇඳිරි ගත් ලොවට පහළ වූ තමන් මුහුණු දුටුවන් ප්‍රතිපත්තියෙහි වැරසැර ගැන්වූ බුදුන්-පෙ-යුතු.

**481**

* කරුණාවට ගේ වූ, දහමට ළ ඇති, අසන්නන් කන්හි අමා නමන මධුරධර්මදෙශනා ඇති, බැලුබැලුවන් ඇස් නිවන මනහර රූ ඇති, සිතන්නන් සිත් නිවන මනහර ගුණ ඇති, දෙව්බඹුන් මුදුනෙහි කෙළනා පාපියුම් ඇති, ලොකස්වාමි වූ, ශාක්‍යසිංහ වූ, පරදුඃඛදුඃඛිත වූ, අනුශාසක වූ, අද්වයවාදි වූ, ධර්මරාජ වූ, සමන්තභද්‍ර වූ, ෂඩභිඥ වූ, ළයට සැනහිලි වූ, සසරට ප්‍රතිපක්‍ෂ වූ, නිවණට දෙර හළුවා වූ, ස්වර්ගයට හිණිපෙතිපෙළ වූ, අපායට හකුල් හෙළුෑ, වියත්කමින් අගතැන්පත් වූ, මුළුසක්වළැ සතුන් දැල්වූ දැල්වූ ඇස්හි පැණියන්නා වූ, සිතුසිතු සිත්හි ඇඳී යන්නාවූ, බැඳී යන්නා වූ, ඇවිළැ යන්නා වූ, ඇස ලූ ලූ දිසාවට සියලු සැපත් දීලන්නා වූ ඒ ස්වාමිදරුවානන්වහන්සේ විසින් අතීතකාලයෙහි කළ දනමය[1] පුණ්‍යක්‍රියායෙන් යුක්ත විශ්වන්තර-ජාතකකථාව ගෙණැ ඇරැ[2] දක්වම්. තමහට සිනෙහැති නිවන්පුර වදනා කැමැති සත්පුරුෂයන් විසින් සාවධාන වැ කන් නමා ඇසිය යුතුය.

හේ කෙසේ ද යත්:- පෙරැ දඹදිව සිවිරට ජයතුරා නම් නුවරෙක් වී යැ. එ පුර සම්පත්ති නැමැති මහමුහුදමැද බිඳෙන රළ පෙළ සේ නිරන්තරයෙන් දිවන්නා වූ පනන්නා වූ අශ්වයන් ගේ හෙෂාරවයෙන් එකකොලාහල යැ. එසේ මැ නානාප්‍රකාර වූ වර්ණකම්බල අතුළා වූ නොයෙක් රථයෙහි චක්‍රනාදයෙන් හා හස්තිනාදයෙන් හා සඞ්ඛනාදයෙන් එකනාද යැ. සන්තුෂ්ට වූ ස්ත්‍රීපුරුෂයන්ගේ නානාප්‍රකාර වූ මඞ්ගලයෙහි හා නෘත්‍යගීතවාද ප්‍රසඞ්ගයෙහි ගසනලද මිහිඟුබෙරෙහි ගම්භීරධීර-නාදයෙන් ශ්‍රවණ රමණීය යැ. ප්‍රවීණවීණාකාරයන්ගේ වීණාස්වරයෙන්

1. කාලයෙහි දනමය 2. හැර

Non-Commercial Distribution

සාඩම්බර යැ. නානාප්‍රකාරවෙශ හා භූෂණයෙන් යුක්ත වූ සම්පත්තීන් අනූන වූ යෞවනයෙන් උද්දම වූ රූපයෙන් මනොහර වූ කුලයෙන් අනින්දිත වූ විද්‍යයෙන් පරිශුද්ධ වූ සැරහුම්හි තන්වැසි වූ කෙළියෙහි විදග්ධ වූ අන්තරඞ්ගබහිරඞ්ගකායර්‍යයෙහි ප්‍රමාදයක් නැත්තා වූ ගැණුන් හා පිරිමින් විසින් ගැවසීගත්තේ යැ. මෙසේ සියලු සම්පත්තීන් සමෘද්ධ වූ ඒ ජයතුරා නම් නුවරැ රජ කරණ සඤ්ජය නම් රජෙක් වී යැ. එරජ්[1] මහාකුලීනහෙයින් හා දෛවය සත්‍යය යන මෙයින් හා අභිමතකාරිය සාධා ගැන්මෙහි දක්‍ෂහෙයින් හා කීවා කරණ අමාත්‍යයන් ඇති වැ දශරාජධර්ම්යෙන් රජ කරණ සමයෙහි, ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ තමාගේ පුරස්ත්‍රීන් කෙරෙන් එක් ස්ත්‍රියක කැඳවා කියන්නේ "පෘථිවියෙහි යම්වස්තුවක් තිට ප්‍රිය ද, එයට දසවරයක් ගණු" යි කී යැ.

ඒ ස්ත්‍රී කියන්නී "දෙව්රජ, තට නමස්කාර වේවයි. පොළොවැ සිටි වෘක්‍ෂයක් පහ කරණ මහපවනක් සෙයින් තොපගේ මේ දිව්‍යපුරයෙන් මා පහ කරණුවට[2] මා විසින් කවර පවෙක් කරණ ලද්දේ දැ?"යි කිව. සක්දෙව්රජ කියන්නේ "තී විසින් අවි කරණ ලද්දේ නො වෙයි. මට අප්‍රිය ද නො වෙයි. තීගේ පින් ද ආයු ද පිරිහිත. එසේ හෙයින් කීම්. තී කෙරෙන් වියෝ වීමෙක් වෙයි. මාගෙන් දසවරයක් ගණු"යි කී යැ.

"සියලු දෙවියන්ට ප්‍රධාන වූ සක්දෙව්රජ, මට වර දෙනු කැමැත්තෙහි වී නම්, තට වැඩෙක් වේවයි. තා කියන සේ සිවිරට සඳමහරජහුගේ නිවෙස්හි වසන්නෙම් එක්හැවිරිදි මුව පෙල්ලන්ගේ[3] දිගුනිල්පැහැයෙන් යුක්ත වූ ඇස් බඳු වූ තුන් වයස මැ අතිනීල වූ ඇස් ඇති වෙම්වයි. අතිනීල දෙව්දුනු මෙන් බැමලිය ඇති වෙම්වයි. ඵුසතිදෙවිය යන නමෙක් වේවයි. සියලු රජුන් විසින් පූජිත වන්නා වූ යශස්කීර්තීන් පිරිවර ඇති, සියලු යාචකයන්ගේ අධ්‍යාශයට යොග්‍ය වූ, නො මසුරු වූ, ඇස් ඉල්වූ කල නො දෙමියි නො කියන, උතුම් වස්තු දෙනු වූ, ගුණෙන් යුක්ත, රූපයෙන් යශසින් ප්‍රිය වූ පුතකු ලැබෙම්වයි. මා ගර්භිණී වූ කලැ සම කොට ගහා යෙදූ දුනුමිටක් සෙයින් මාගේ මධ්‍යමාංගය නොඋස් නොමහත් වෙවයි. දෙව්රජ, මාගේ පයෝධරයෝ දෙදෙන නො හී උඩ බලා සිටිත්වයි. මා හිසැ නර නො නැඟේවයි. වෙරැ දැලි නො හිඳේවයි රාජාපරාධ කළ වධ්‍යයකුත්[4] වුව මරණින් ගලවමී සිතුකලැ මාගේ ස්වාමි හරිත්වයි. මයූරයන් කොස්ලිහිණියන් රැව් දෙනලද, උත්තමස්ත්‍රීන් විසින් ගැවසී ගත්, කුරුන් කුදුන් ළදරුවන් හා කුඩසලා බලතුන් හා අරක්කැමියන් හා කිලිහන් හා විසින්

1. හෙතෙම 2. කරුණු 3. පොල්ලන්ගේ 4. වධයකුත්

Non-Commercial Distribution

වණනලද, සත්රුවනින් විසිතුරු ද්වාර කවුළුයෙන් හෙබි, පසඟතුරුරැ වින් යුතු, රාජමන්දිර ඇති, නොයෙක් මධුරාන්නපාන[1] කව බොව යන ජනයන් ඇති මෙ කී ගුණෙන් සමෘද්ධ වූ සිවිරට සඳමහරජුට අගමෙහෙසුන් වෙම්ව"යි කියා මේ දසවරය ගත.

එසඳ සක්දෙව්රජ කියන්නේ 'සර්වාඞගයෙන් හොබනා වූ ඵුසතිදෙවිය, මා විසින් දුන්නා වූ දසවරය ගෙණ සඳමහරජුගේ සමීපයෙහි වස'යි[2] දෙව්රජ සමු දුනි. ඉක්බිති ඒ දිව්‍යස්ත්‍රී දෙව්ලොවින් මියැ අවුත් මදුරටැ ක්‍ෂත්‍රියකුලයෙහි උපන. "හෝතොමෝ සඳමඬුලු වැනි මුහුණු ඇත්තී යැ. කොඳකැකුළු වැනි දත් ඇත්තී යැ. රන්වන් වූ ශරීර ඇත්තී යැ. මනා වැ වට වූ පයොධර ඇත්තී ය" යනාදීන් වර්ණනා කරත් කියා ගෙවා ගත නොහැකි රූ ඇත්තී ය. අළුත් වූ යෞවන ඇත්තී යැ. මහත් වූ ඓශ්වර්‍ය්‍ය ඇත්තී යැ. සාරාසංඛ්‍යකප්ලක්‍ෂයකින් මත්තෙහි බුදුන්ට මවු වෙම්යි පතා ආ, මතු මහාමායාදේවී වන, එයින් ගොස් මාතෘදිව්‍යපුත්‍ර වන, ඊ සිට තිවන්පුර වදනා වූ ඔවුන්ගේ ගුණ කවුරු කියා නිමවා ගණිද් ද? මෙසේ දෙවඟනක මෙන් විය පැමිණැ වසන කල්හි සඳමහරජානෝ බිසොවුන්ගේ රූප ශොභා අසා මහපෙරහරින් ගෙන්වා තමන්ට අගමෙහෙසුන් කළහ.

මෙසේ දෙදෙනා සුවයෙන් වැසැ රජ කරණ සමයෙහි පිරූ පාරමිතා ඇති ලොවට ඇසක් වැනි වූ මතු බුදු වන මහතානෝ සියලු ලෝවැසියන් සසරින් මුදනු සඳහා දෙව්ලොවින් සැවැ අවුත් ඵුසතිදෙවින් බඩැ පිළිසිඳ ගත්හ. ඔවුන් පිළිසිඳ ගත් කෙණෙහි මැ සැටදහසක් පමණ කුමාරයෝ ඒ ඒ ඇමැතියන්ගේ ගෙහි පිළිසිඳ ගත්හ. මහබෝසතානන් මවුකුසැ පිළිසිඳ ගණුත් මැ දේවීන්ට මේ නියා දෙළෙක් උපනි: දවසැ සලක්‍ෂයක් ධන වියදම් කොට ස දන්හලක් කරවා දිළිඳු යාචකයන්ට දන් දෙන දෙළෙක් උපන. සහ වැ ද පවා තමන් කරා ආ යාචකයන්ට ගිනිමැදට පැනැ ඇහමස් පලහා දන් දෙන්නා වූ, සිව්රජ වැ තමන් කරා ඇස් ඉල්ලා ආ ශක්‍රබ්‍රාහ්මණයාට නිලුපුල්මල්සඟළක් බඳු වූ තමන්ගේ දෑස ලෝවැසියන් හඬවහඬවා සිය අතින් උපුටා දන් දෙන්නා වූ, මහතානන්[3] දසපාරමිතා මුදුන්පත් වැ සිටැ මවු කුසැ පිළිසිඳැ ගත්විට[4] මීනියා දෙළක් උපදිති යනු කවර ආශ්චර්‍ය්‍යයෙක් ද? ඒ හිමියානන් මවුකුසැ පිළිසිඳ ගත් දවස පටන් ගෙණැ දඹදිවැ නොයෙක් රජයෙහි රජදරුවන් එවන රන්රුවන් ආදි නොයෙක් පඬුරෙන් අතුරු නැති වී යැ.

සඳමහරජානන්[5] බිසොවුන්ට උපන් දෙළ අසා නුවරැ සදන්හල් කරවා බිසොවුන්ට උපන් දෙළ නිවා යාචකයන් සිත් නිවා දන් දෙන

1. මධුරපාන 2. ස්වමීපයෙහි වයි 3. මහතාණෝ
4. ගත්තවුන් 5. රජාණෝ

Non-Commercial Distribution

කල්හි, ක්‍රමයෙන් දසමස් පිරුණු සඳැ, බිසොවුන් නුවර පැදකුණු කරණ සිතෙක් උපන. එසඳ සඳමහරජානෝ එපවත් අසා ඇමැත්තන් කැඳවා නුවර සදවන්නාහු කළුවැලි පියා සුදුවැල්ලෙන් තවරා දෙර දෙර කෙහෙල්තොරණින් රන්තොරණින් රිදීතොරණින් සත්රුවන් තොරණින් පිළී තොරණින් සද කේල්තැඹිලි ධ්වජපතාකායෙන් සද තැනැ තැනැ පූර්ණකලස තිරිකුඩම් තබා වැටැ වැටැ පහන් නංවා මෙසේ සියලුනුවර දෙව් නුවරක් මෙන් සද මනහර කොට රථයක් සදවා බිසොවුන් එහි හිඳුවා මහත් වූ ශ්‍රීන් මහත් වූ පෙරහරින් රාජ වීථියට බටහ.

එවිට මැ රන්කරඬු රිදීකරඬු රන්පැන රිදීපැන ගෙණැ, සඳට පළමු වැ ගමන් ගත් තරුකැල සේ, මෙහෙතන්[1] පිරිවරා ගත්හ. එසේ මැ දෙපැසැ සිටැ සලන සුදුචාමර රන්තල්වැට රිදීතල්වැටින් වසන්තයා සියවෙසින් ආ යැයි[2] සිතම්. සරසුන් විසින් ගත් සුදු සේසතින් එද එපුරය ඡත්‍රමය වැ ගියේ යැ යි සිතම්. කිරි මුහුද ඔද වැඩී දුවන රළපෙළ සේ එපුර වෙහි දිවන අස්පතරින් පර්වතොපම වූ හසත්‍ය- ලඞකාරයෙන් සැදුනු ඇත්කැලයෙන් හා රන්රිදීමය වූ පස්වණක් පැහැයෙන් දිලියෙන ධ්වජපතාකාවෙන් විසිතුරු වූ ඇතුන් අදනා අසුන් එළුවන් ගොනුන් අදනා මනහර රථපෙළින් හා සත්රුවන්මය පිල්කබ[3] පෙළින් හා ධ්වජපතාකා පෙළින් හා රන්රිදීකැටපත් පෙළින් හා සත්රුවන් කලස පෙළින් හා ඒ නුවර බලනුවන්ට අමෘතාඤ්ජනයක් වැන්නැයි සිතම්. ඒ ඒ සත්රුවන්මඩුවෙහි සිටැ නටන මනහරයොවුන්පත් ස්ත්‍රීන් නටනවා නහන අතින් දිව්‍යශ්‍රී කැඳවතී සිතම්. රකවල් බලමින් ඒ ඒ දෙස දුවන කුරුකුදු පෙළින් සහවාසිනපුංසකයන් විසින් පිරිවරණ ලද දසමෙහෙතැනුන් විසින් මනහර යැ. බලතුන් ගසන බලත්හඬින් හා ඒ ඒ තැනැ මඩුලු බැඳ ගසන හෙරිතූර්‍යනාදයෙන් හා අසුන්ගේ හෙෂාරවයෙන් හා ඇතුන්ගේ[4] කුඤ්චනාදයෙන් හා එකනිර්ඝොෂ යැ.

මෙසේ. මහත් පෙරහරින් නුවර පැදකුණු කෙරෙමින් ව්‍යාපාර[5] වීථියට වත්සඳැ විළි පහරණට පටන් ගත. එපවත් ඇසූ සඳමහරජාණන් විසින් එකෙණෙහි මැ විසිතුරු මඩුවක් කරවා වට තිර බඳවා රකවල් ලැවූ කල්හි ලොවට ඇසක් බඳු වූ යාචකයන්ට ධනරාශියක් බඳු වූ පිරුපාරමිතා ඇති ඒ හිමියානෝ මවකුසින් උපදමින් මැ මැනියන්ට "අම්ම, දන් දෙන්නට සුදුසු දෙයෙක් ඇද්දැ"යි කියා අත දික් කළහ. මෙසේ ඒ ත්‍රිභුවනශෙඛර වූ වෙසතුරුකුමාරයන් තී තෙපුල් කවර නම් සතකුගේ කණට අමා නො වේ ද? කවර නම් සතෙක් සතුරු වේ ද?

---

1. තැනත් 2.ආසි 3. පිල්කඩ
4. අසුන්ගේ 5. වැපැර

Non-Commercial Distribution

කාට නම් අප්‍රිය වේ ද? එබස් ඇසූ මැණියෝ දහසින් බඳ පියැල්ලක් මහතානන් දික් කළ අතැ තුබුහ. ඒ දහස ගෙණැ කිරිමවුන්ට දන් දුන්හ. ඒ ආශ්චර්‍ය්‍යපුරුෂ වූ මහතානන් උපන් ද මැ ඔවුන්ගේ කුශල බලයෙන් කෛලාසකූටය සේ ද රිදීපර්‍වතයක් සේ ද ඉතා ධවල වූ පණ්ඩර නම් මඟුලැත්පොව්වකු දෙවියෝ තමන්ගේ ආනුභාවයෙන් ඇත්හල්හි ලා ගියහ. බොධිසත්‍වයන්ගේ පියමහරජානෝ පුතනුවන්ට නම් තබන්නාහු, චතුර්වේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා, ව්‍යාපාරවීථියෙහි උපන් හෙයින් "වෙස්සන්තර කුමාරයෝ යැ"යි නම් තබා මෙ බඳු වූ උත්තම පුරුෂයක්හු හුදෙකළා වැ[1] ඉපැදීම නො වන්නේ යැයි ඇමැත්තන් කැඳවා සියලු නුවර පරීක්‍ෂා කරවා උපන්ද උපන් කුමාරයන් සැටදහසක් දෙනා ගෙන්වා පුතනුවන්ට පිරිවර කොට ලක්‍ෂණසම්පන්න කිරිමවුන් තෝරා ගෙණැ උන්ට මහාවිභව තබා දුන්හ.

මෙසේ සැටදහසක් කුමරුවන් පිරිවරා කෙළනා බෝසතානෝ[2] නකත්තරු මැද බබලන පුන්සඳ මෙන් කුමාරාභරණයෙන් සැදී රාජ්[3] ශ්‍රීන් දිලිහිදිලිහී වඩනා කල්හි තමන් එක් හැවිරිදි වයස තමන් පැලඳවූ ලක්‍ෂයක් වටනා ආභරණ කිරිමවුන්ට දන් දුන්හ. පියමහරජානෝ ඒ පලඳනා දන් දුන්බව අසා සතුටු වැ මාහැඟි පලඳනා යවා පලඳවති. බොධිසත්ත්‍වයෝ තමන් පැලැඳවූ පලඳනා, අවුත් දන් ගන්නා සිඟන්නන් නැත්තෙන්, නවවරෙකැ මැ කිරිමවුන්ට මැ දන් දුන්හ. තුමූ වයසින් ලඳ බොලඳ එක්හැවිරිද්දේ යැ. තව මුවෙන් නොහළකිරි යැ. මෙ ම නියා දනාධ්‍යාශයයක් මුළු ලොවැ කවුරු කෙරෙද් ද? මෙසේ වූ අද්භූතයක් දුටුවිරුවෝ ඇද් ද? මෙ වැනි ආශ්චර්‍ය්‍යයක් ඇසූ විරුවෝ ඇද් ද? මෙසේ විස්මය වූ දනසම්භාර ඇති ඒ මහතානන් හා එක් වෙම්වයි. ඒ උතුමා උපන් උපන් තන්හි මැ උපදමෝවයි. මෙ වැනි අදහසෙක් සියලු සත්ත්‍වයනට වාසනා වෙවයි.

මෙසේ දන්කෙළි මැ කෙළි කොට දන් දී අට හැවිරිදි වයස් වූ කලැ විසිතුරු වූ ප්‍රාසාදයෙහි පණවන ලද ශ්‍රියහන්මස්තකයෙහි පලක් බැඳැ වැඩැ හිඳැ සිතන්නාහු "මා[4] ඉපැදැ දනක්‍රියායෙහි සුව නො විඳ දවස් ගණනෙක් නිකම් මැ[5] ගියේ යැ. හේ දැන් අට හවුරුද්දෙකැ. තව ද දවස් මෙසේ මැ යේ දේ හොයි. මෙසේ මහ වතුරක් මෙන් මා දෙන රන්රුවන් ආදී දනප්‍රවාහය කැටකැබැලිති සේ මා සිත් නො පිණවයි. ඉදින් යාචකයෝ අවුත් සිටැ 'මහරජ, තාගේ ඇස් උදුරා දෙ'යි කිවු නම්, දිගුපුළුල් නිල් නුවන් දෙක තල්ලොඳ දෙකක් සේ උදුරා අතැ තබා ලම්. ඉදින් මාගේ හෘදයමාංසය ඉල්වූ නම්, තියුණු වූ ශස්ත්‍රයෙන් ළය

1. හුදකලා 2. බෝසතානන් 3. රාජ්‍යය 4. මම 5. නික්ම

Non-Commercial Distribution

පළාපියා හදවත දන් දෙමි. යමෙක් ලේ ඉල්ලී නම්, තෙලියත්හි ලා පෙළාපියා මාගේ ශරීරයෙහි ලේ දෙමි මැ යැ. යමෙක් මස් ඉල්ලී නම්, මඟුල්කඩුවෙන් ලියලියා පැස් පුරා මස් දන් දෙමි මැ යැ. යමෙක් අවුත් සිටැ 'මට ගැතිමෙහෙ කර'යි කී නම් මුළු රට මැ[1] මා මුන්ට ගැතිබව දන්ව'යි අස්වා කියා ගැති වෙමි මැ යැ"යි (සිතන්ට වන්හ)

මෙසේ සිතත් සිතත් දෙලක්‍ෂ සතළිස් දහසක් ඝනකඩ බොල් මහපොළොව අනෙකගජිනා කෙරෙමින් අත්බමරක් සේ සතුටු වැ නටන්නට වන. එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් උස ඇති මහාමෙරුපර්වතය ද ඒ මහතානන්ගේ දනවෙතනාබලයෙන් තමාගේ ද කුළුඅත් ඔසොවා වඩිමින් නටන්නට වන. ඒ මහතානන්ගේ මහත් වූ අධ්‍යාශය බලවයි කියන්නාක් මෙන් සප්තකුල පර්වතයෝ කුල්මතින් නටමින් ඔවුනොවුන් ඇඟ ගැසෙන්නට වන්හ. සුවාසූදහසක් යොදුන් ගැඹුරු මහමුහුද තමාගේ රළ නැමැති අතින් සත්රුවන් ඉසැ ඉසැ මහත් සොම්නසින් මෙන්[2] නටන්නට වන. මේ ආශ්චර්‍ය්‍යය දුටුවා වූ මිනිසුන් පටන් ගෙණැ මහබඹුන් දක්වා සියලු ලොව එක පැහැර රඟමඬලක් මෙන් කෙළිනට වන්හ.

මෙසේ මහපොළොව ගුගුරුවා දන් දෙන බෝසතානෝ සඳුන්රුකැ අතු අගැ ලෙලෙන කළුවැල්ලියක් සේ තමන්ගේ රූපශ්‍රී ප්‍රඥලතායෙන් හොබවමින්* ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදිවයසට පැමිණැ සූසැට ශිල්පයෙහි හා අෂ්ටාදශවිද්‍යාස්ථානයෙහි නිපුණ වූහ. එසමයෙහි පියමහරජානෝ පුතනුවන්ගේ රූපශ්‍රී යශස්කීර්ති බලාපියා ප්‍රීතිසාගරයාගේ උත්පාතවෙගයෙන් 'මාගේ පුතනුවන්ගේ රාජවිභ්‍රම මා ඇස් හමුයෙහි මැ දැකැ මාගේ නුවන්දරිද්‍රාය[3] හළ මැනැවැ'යි සිතා චෙතියරට රජ්ජුරුවන්ගේ දූ වූ සියලු ස්ත්‍රීන්ගේ රූප එකතැනකට කැටි කොට මවාලූ රූපයක් බඳු වූ සියලු රූපශ්‍රීන් දිලිසෙන ඒ මද්‍රිදේවින් ගෙන්වා මඟුල් කොට මහබෝසතානන්ට අගමෙහෙසුන් කොට පාවා දී චොටුනු පලඳවා රාජ්‍යය පවා දුන්හ. පියමහරජානෝ පුතුවන්ගේ රාජ්‍යශ්‍රී බලබලා සතුටු වැ වසන්නාහ.

මහාබොධිසත්වයෝ ද සතරසංග්‍රහවතින් දශරාජධර්මයෙන් වියෝ නො වැ ධර්මරාජ්‍යය කොට සතතයෙන් මවුපිය දෙදෙනා වැඳැ පුද උපස්ථාන කොට සියලු යාචකයන්ට ස දත්හල් කරවා අනෙකප්‍රකාරයෙන් දන් දී රාජ්‍යශ්‍රීන් දිලියෙමින් වසන්නාහු පුතනුකෙනකුන් හා දියනිකෙනකුන්

1. මුළු රටට 2. නටන්නියක මෙන්
3. හමුයෙහි ම මාගේ නුවන් දරිද * හොබමින්

Non-Commercial Distribution

ලදින් චතුර්වේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා ගෙණැ පුතනුවන්ට 'ජාලියකුමාරයෝ ය'යි නම් තබා දියනියන්ට 'කෘෂ්ණජිනා ය'යි නම් තබා මෙසේ සුවයෙන් රජය කරන්නාහ. චෙතියැරට රජු හා ජයතුරා- නුවර[1] රජු හා රටවැස්සන් හා මෙසේ සතුටු වැ දෙනුවර වැස්සන්[2] නො වෙනස් වැ වසන සමයෙහි කලිඟුරටැ වැසි නැති වැ දුර්භික්‍ෂභය වී යැ. කලිඟුරටැ රජ්ජුරුවෝ ඇමැත්තන් කැඳවා කියන්නාහු "වැසි නැත. කුමක් කරමෝ දැ?"යි කීහ. ඇමැත්තෝ සිතන්නාහු "කැමැතිදෙයක් දන් දෙන්නෝ වෙස්සන්තර රජ්ජුරුවෝ යැ. උන්ගේ දෙවියන් දුන් සර්ව්වශ්වෙතමය වූ පණ්ඩර[3] නම් වැසි වස්වන මහානුභාව ඇති හැලි ඇතෙක් ඇත. ඔහු ගෙණාව හොත් අපගේ රට වැසි වැසැ දුර්භික්‍ෂභය සන්සිඳේ"යි කීහ.[4] එසඳ රජ්ජුරුවෝ වෙදත්‍රයෙහි[5] නිපුණ බමුණන් අටදෙනෙකුන් ගෙන්වා ගෙණැ කියන්නාහු "බමුණෙනි, වෙස්සන්තර මහරජ්ජුරුවන්ගේ වැසි වස්වන හැලි ඇතෙක් ඇත. එ ඇතු ඉල්ලාගෙණැ එව"යි කීහ.

බමුණෝ ද රජු අතින් සමු ගෙණැ නොබෝදවසින් ගොස් සිව්රට වන්හ. බුද්ධාඞ්කුර වූ ඒ වෙසතුරුමහරජානෝ එදවස් පොහෝද දන් දෙන්නට සතර දෙර සතර දන්හල් විචාරන්නට යන්නාහු සුවඳපැනින් නහා සළු හැඳැ ගඳවිලෙවුන් ගෙණැ සුසැට ආභරණයෙන් සැදි දෙවෙන්ද්‍රවිලාසයෙන් සිට ඇතු ගෙණෙවයි කීහ. ඇතු ගෙණෙන්නාහු සතරපය සතර ලක්‍ෂයක් වටනා පලඳනායෙන් සද යට බඩ ලක්‍ෂයක් වටනා පලසෙකින් වසා පිට රන්දැල් මුතුදැල් කිංකිණිජාල මිණිරසුදම්පෙළ මෙ ආදී සත් රුවනින් ඇතු සද එළවූහ. රන්හිණින් ඇතු කඳට පැනැනැඟී දළපුඩුසේසත් හිසට කරවා සත්රුවන් සෙමර සල්වා රජ යුවරජ ඇමැතිමඩුලු පිරිවරා සිවුරඟසෙනඟ පිරිවරා දෙවෙන්ද්‍රයා සෙයින් පූර්ව්වදිශාවෙහි දන්හලට යන රජ්ජුරුවන් බමුණෝ දැකැ දනට රැස් වූ සිඟන්නන් බොහෝදෙනා විසින් දකිනට උගහට යයි දකුණුදිගැ[6] දන්හලට යන මඟැ උස්ගොඩෙක සිටියාහ. රජ දකුණුදිගැ වාසල්සමීපයෙහි සිටි බමුණන් අටදෙනා දැකැ උන් සිටි දිශාවට ඇතු නැමී යැ[7]. බමුණෝ අටදෙන අත් නහා "ජයතු භවාන් මහාරාජ" යනාදීන් ආශීර්ව්වාද කළහ. වෙසතුරුමහරජ තෙම "මේ බමුණෝ මනා මැ දෙයක් ඉල්ලතී" ඇතු ආසන්ක කොට මෙහෙයා සිටැ "බමුණෙනි, තෙපි කැමැති දනක් ගන්ව"යි කී යැ[8] ඉක්බිති බමුණෝ කියන්නාහු "සියලු සත්ත්වයන්හට මවුපියන් බඳු වූ රජ්ජුරුවෙනි, තෙල ඇතු අපට දන් දෙව"යි කීහ.

---

1. රජ කරණ කලිඟි චෙතියරට ජයතුරානුවර
2. රදෙව්නුවර වැස්සන් හා 3. පඩැය 4. කීය
5. වෙදශාස්ත්‍රයෙහි 6. බමුණෝ අටදෙන 7. නැමූහ 8. කීහ

Non-Commercial Distribution

එබස් අසා රජ්ජුරුවෝ[1] මේ බමුණෝ මා ශරීරයෙන් භාගයක් නො ඉල්ලූහ. ඇස් උපුටා දෙවයි නො කීහ. ඇඟින් මස් කපා දෙවයි නො කීහ[2] ඇතු ඉල්වතී මදක් දෙමිනස් වැ යහපත තොප කැමැති ඇතු තොපට දන් දෙමියි සතුටු වැ ඇතු සදවන්නාහු[3] ලක්‍ෂයක් වටිනා රන්පලසෙකින් පිට සැදවූහ.[4] ලක්‍ෂයක් වටනා මුතැදැල යැ, ලක්‍ෂයක් වටනා මිණිරදුදම්පෙළ යැ, ලක්‍ෂයක් වටනා රන්දැල යැ, ලක්‍ෂයක් වටනා මැණික්දැල යැ, දෙඇළයෙහි බහා ලන දෙලක්‍ෂ වටනා දෙමිණි යැ, දෙලක්‍ෂ[5] වටනා කණ්ණාභරණ යැ, වටංසක නම් තුන්ලක්‍ෂයක් වටනා රන්මල් තුණ යැ, කුඹ සැදූ ආභරණ ලක්‍ෂයෙකැ, ශුණ්ඩයේ වට සොවැත්ත ලක්‍ෂ වටනේ යැ. දෙදළ සැදූ ආභරණ දෙලක්‍ෂයෙකැ, සතරපය සැදූ පලඳනා සතර ලක්‍ෂයෙකැ, වාලධියෙහි සැදූ පලඳනා ලක්‍ෂයෙකැ, යට බඩ සැදූ රන්පලස ලක්‍ෂයෙකැ, ගෙලෙහි මුතුදැල් ලක්‍ෂයෙකැ, කුඹැ එබූ මැණික හා මුදුනේ මැණික හා කණ්ඨයෙහි මැණික හා පිට මැණික හා මේ සතර මැණික් අනඝි යැ. ඇත්කටු අකුසු දෙක අනඝි යැ. (මෙසේ විසිතුරු කොට ඇතු සද තවද ඇතු ලවන් කවන රන්කටාරය ලක්‍ෂයක් වටනේ යැ. ඇතු පිටට නඟින රන්හිණ ලක්‍ෂයක් වටනේ යැ. මේ ආදී අනඝි පලඳනා හැර. සූවිසි ලක්‍ෂයක් පලඳනාවෙන් ඇතු සද ඇත්වෙදුන් ඇත්රැටියන් ඇතුළු වැ පන්සියයක් කුලවාසීන් ද ඇතු නාවනු කවනු පොවනු ඕහට සියලු කළ මනා මෙහෙයට පරිවාරජනයන් ද දී බමුණන්ට ප්‍රසාද දී සිත් ගෙණැ රුවන් කෙන්ඩියෙන් අතැ පැන් එවැ[6] ඇතු බමුණන්ට දන් දුන්හ. ඒ මහතානන් ඇතු දන් දෙත් මැ මහ මෙර නැමී නමස්කාර කෙළේ. මහපොළොව සතුටු වැ ගුගුළේ.

ඉක්බිති බමුණෝ ඇතුනැඟී රාජවීථියට බටහ. නගරවාසීහු කැටි වැ කියන්නාහු "තෙපි නො බා අපගේ දිව්‍ය ඇතු ගෙණැ යවු නැ?"යි[7] කීහ. එබස් අසා බමුණෝ කියන්නාහු "වෙස්සන්තර රජ්ජුරුවන්ගෙන් මේ ඇතු දන් ලදුම්හ. තොප කෙරේ වළකමෝ දැ?"යි තුඩු වැඩී බැණැ ඇතු නැඟී ගියහ.

එසඳ රජ බමුණු වෙළෙඳ ගොවි ආදිහු ද අධිකාර සෙනෙවිරත් ඇපා මාපා පක්‍ෂප්‍රධාන මහාමණ්ඩලිකයෝ ද මුළු මුළු වැ ගෙණැ රැස්රැස් වැ ගෙණැ තතනමින්[8] පුපුරමින් දත් කමින් සියලු මුළුනුවර හැලැළැ ගොස් කිපී වෙස්සන්තරමහරජානන්ගේ පියානන් සඳමහරජානන් කරා ගොස් හඬා හී "ස්වාමීනි, අප දන්වන්නක් ඇසුව මැනැව. සූවිසි ලක්‍ෂයක් වටනා ආභරණයෙන් සැදුනා වූ සියලු ඇත්ලකුණෙන් බබලන්නා වූ සර්වාඞ්ගයෙන්

---

1. රජතෙම 2. කිය 3. සදන්නාහු 4. සඳ 5. ලක්‍ෂ
* පෙවා 6. හෙව 7. ගෙණෙයි 8. තතනවමින්

Non-Commercial Distribution

ධවල වූ වැසි වස්වාපියන පමණ මහත් වූ ආනුභාව ඇති දෙවියන් විසින් දුන්නා වූ මනුෂ්‍යලොකයට දුලභි වූ හස්තිශ්‍රීයෙන්[1] දිලියෙන අපගේ ඇත්රුවන තොප පුතනුවෝ බමුණන්ට දන් දුන්නෝ[2] වෙද් ද? ස්වාමීනි, තමන් සදෑවස්මර හී දන් දෙන පසු සෙසු ඇතුන් දිය නො හැකි ද? අසුන් දිය නො හැකි ද? නොයෙක් රත්රුවන් දිය නො හැකි ද? මේ නියා ලොවට වැඩකර වූ මේ ඇතු[3] දන් දෙන්නේ කුමකට ද? රටින් සයින් එකක් වළඳ දැහැමින් සෙමෙන්[4] රාජ්‍යය කොට අප රක්‍ෂා කෙරෙතී සිතූ නියා යහපත් නියා යැ''යි කීහ. එසේ කියන්නා වූ[5] නගරවාසීන් දැකැ සඳමහරජානෝ "නගරවාසීන්ගේ රුහැණ බලවතැ. කළ මනා කිම් දෝ හො?"යි සිතා "බාල විසින් නො කළ මනා දෑ කළවුන්ට තොප කී දඬුවමක් කරවන්නෙම් වේ දැ"යි කීහ. එසඳ නගරවාසීහු සන්හිඳී කියන්නාහු "වෙස්සන්තරරජ්ජුරුවන් දහගෙහි ලත් නො පිළිවනැ. දිවි ගණුත් නො පිළිවනැ. අපගේ රට මැ හිඳ අප නැසූ තැනැත්තන් රටින් දුරු කොට වඞකගිරි පර්‍වතයට යවනු මැනැව. අද මැ යවනු මැනැවැ"යි කීහ.

සඳමහරජානෝ සිතන්නාහු "දැන් මුන්ට මිහිරි කොට කියා පසු වැ යවාපියා දුටුවක් දකුම්හ"යි සිතා මහාජනයන්ට කියන්නාහු "අද දවසැ රඳ අඹුදරුවන්ට සමු දී සෙට යන පරිද්දෙන් සිතුව"යි කීහ. එබස් ඇසූ නගරවාසීහු වැඳැ "ස්වාමීනි, නුඹ වහන්සේට හැඟුනක් කළ මැනැවැ"යි කීහ. එසඳ සඳමහරජානෝ මහාශොකී වැ "නගරවාසීන් කිපුනුබැව් මපුතුන්ට කියව"යි කත්තා[6] නම් ඇමැත්තා යැවූහ. ඇමැති ගොස් ඒ වෙසතුරු මහරජානන් දිව්‍යවිමානයක් මෙන් සැදුනු ප්‍රාසාදයෙහි රාජකුමාරයන් පිරිවරා ඇතු දන් දුන් සතුටු සොම්නසින් පිණපිණා ශරත් කාලයෙහි නැඟි පූර්‍ණචන්‍ද්‍රමණ්ඩලයක් සෙයින් වැඩහුන්නවුන් දැකැ වැඳ[7] පියරජ්ජුරුවන් කියා එවූ හසුන් භය ඇති වැ නො කියැ හී ශ්‍රීපාදය වැඳැ නැඟී නො සිටියේ යැ. බොධිසත්‍වයෝ අත අල්වා නහා සිටුවා "කියග"යි වදළහ. ඇමැති කියන්නේ "ස්වාමීනි, ඇතු දන් දුන්හ"යි නගරවාසී කිපී බොහෝදෙන (රැස් වැ) නුඹවහන්සේගේ පියමහරජානන්වහන්සේ ළහට පැමිණැ නුඹවහන්සේ මේ නුවරින් සෙට වඞකගිරිපර්‍වතයට යවන්නට සම්මත කළහ"යි කී යැ.[8]

---

1. ශ්‍රියායෙන්　2. දුන්නේ　3. ඇතුන්　4. සෙමින්
5. නියා යයි කියන්නා වූ
6. කත්තා (අන්තන්හි 'ඛත්ත'යි පෙණේ)
7. හුන් ඒ වෙසතුරු හිමියානන් දැක ගිය ඇමැති
8. කීහ

Non-Commercial Distribution

ඇමැත්තාගේ බස් අසා වෙසතුරුමහරජානෝ සීපියා වදරන්නාහු "මා අතින් ඇස් ඉල්ලා එත් මැනැ මැ යැ. මස් ඉල්ලා එත් මැනැ මැ යැ. ලේ ඉල්ලා එත් මැනැ මැ ය. ඇඟින් අඩියක් ඉල්ලුව මැනැ මැ යැ. මාගේ ශරීරය වෙන් වෙන් කොට දෙන්නෙම් බාහිරවස්තුව වූ ඇතු දන් දුන්නයි මට වරද කොට සිවිරට වාසී රුහැණි වූ නම්, හේ මට මැනැවැ"යි සිතා, "මාගේ ශරීරය වෙන් වෙන් කොට මසත් මැනැ මැ යැ. සත් කඩක්[1] කොට කපත් මැනැ මැ යැ. මා දෙන දන් නො නවත්වමි.[2] දුක් බොහෝ වූ ගැලවෙන්ට දුෂ්කර[3] වූ සංසාරයෙහි උපන්නවුන්ට දනඵල සුව නැත් නම්, අතික් තෙසු සුවයෙක් නම් නැත. පින් නො කළ හැක්කැයි නගරවාසීහු කිපුනාහු නම් වනවාසයට යන බව ඉතා මැනැවැ. නගරවාසී කීවා කරම්හ. උන් කීවා මුදුන් පත් වේවයි ඔහු බොහෝ කලක් ජීවත් වෙත්වයි. අසිල්ලකුත් මා පිණිස සියලු ජනයා කළකිරුමෙක් නොවේව"යි වදරා "කත්තා නම් ඇමැත්ත, බල, එකක් මපියානන් වහන්සේට කියමි. නුවරවාසීන් කැමැත හොත්, සෙට සතසතු මහදන් දීපියා අනික්ද වලට නැඟී යනු කැමැත්තෙමි. එපවත් මපියානන් වහන්සේට කියව"යි වදරා කත්තා නම් ඇමැත්තා යවා තමන් හසර සිටි සෙනෙවිරදුන් කැඳවා "දස්දැස්සන් ඇතුන් අසුන් රථ සත්සියසත්සිය බැගින් කැටි කරව"යි නියොග කොට හුනස්නෙන් නැඟී සිංහවිලාසයෙන් මද්‍රිදේවීන්ගේ බිසෝගෙට ගොස් ශ්‍රීයහන් මස්තකයෙහි වැඩැහිඳැ, බිසවුන් කැඳවත් මැ අවුත් ශ්‍රීපාදය වැඳැනැඟී සිටැ රන්ලියක් සෙයින් සිටි මද්‍රි දේවීන්ට කියන්නාහු "බිසෝනි, තොපගේ දෙමවුපියන්ගෙන් ගෙණා නොයෙක් රන්රුවන් රක්‍ෂා කොට තබව"යි කීහ.

බිසවු කියන්නාහු "ස්වාමීනි, නුඹවහන්සේ පෙරැ දන් දෙන්ට කියත් මුත්, නහා තබන්නට නොකියන සේක. දැන් කුමක් සඳහා මෙසේ වදළදැ දැ?"යි සැක කොට පිළිවිස්සාහ.[4] වෙස්සන්තර රජ්ජුරුවෝ කියන්නාහු "සොඳුර, නහා තැබීම නම් දන් දීම යැ. දන් නො දෙන්නාහු විලිකුන්පකැ වැදැගත් දිමියන් වැන්නහ. තුමූ නො ද කති. අනුන් නො ද කැ දෙති. එසේ වූයේ පරලොවට වස්තු නහා නො තබන්නා නම් වෙයි. එසේ හෙයින් නහා තබවයි කීයේ නම් දන් දෙන සඳහා යැ. මනා තපස්වීන් අනාථයන් නැමැති කෙත්වතැ ධන නැමැති බිජුවට වපුටැ බොහෝ කරන්නට කීයෙම් වේ දැ"යි කීහ. බිසවු කියන්නාහු "නුඹවහන්සේ මා හැම වේලෙහි මැ දන් දීමෙහි සිත් ඇතිබව දනුත්, මට අමුතු වැ මෙබස් කියන්නට කාරණ කිම්දැ"යි කීහ.

---

1. පත්කඩ 2. දන් නවත්වම් 3. දුළීභ 4. පිළිවිසියෙන්

Non-Commercial Distribution

එසඳ වෙසතුරුමහරජානෝ සිතූ ඇත්ත කියන්නාහු "සොඳුර, අපගේ ඇතු දන් දුන්නෙන් නගරවාසී කිපී අප මෙරටැ නො හින්ද දී වඞ්කගිරිවනයට යවන්නට[1] සම්මත කොළෝ ල. එසේහෙයින් ඇපි වනයට යම්හ. අප වලට ගියයි දළසෝදුකින් නො තැවී සුව සේ ජීවත් වව. දරුවන් දෙබිහින්නන් කෙරෙහි බියපත් වව. සොඳුර, තොප දිවි රැක්මෙහි සිහි ඇති වව. අප ගිය කලැ තොප රක්‍ෂා කරණ ස්වාමිකෙනෙකුන් ඇත, උන්ට කීකරු වැ අත්පාමෙහෙ කරව. තවද, දරුවන් කෙරෙහි බියපත් වව"යි කීහ.

කාමරතියට අනඞ්ගයා බඳු වූ, ශ්‍රීයට[2] විෂ්ණු බඳු වූ, සරස්වතියට බ්‍රහ්මයා බඳු වූ, රූපශ්‍රීන් දිලියෙන, මද්‍රිදේවීන්ට ස්වාමි වූ වෙසතුරුරජුන් මෙසේ කියත් මැ බිසවුන් ලෙහි පැනැ නැඟි ශොකගින්නෙන් තැවෙමින් කඳුළු පිසැ පිසැ[3] මඳසුළඟින් වැනෙන්නා වූ රන්ලියක් සෙයින් වැනෙමින් පිදෙමින් ලය අල්වා ගෙණ "මෙ නම් කුමන බසෙක් ද? ස්වාමිදරුවානෙනි, මෙසේ වූ නො ඇසිය යුත්තෙක් මා කණත් හිනි ද? නුඹවහන්සේ හා වියෝ වැ වන ජීවත් වීමට වඩා නුඹ හා කැටි වැ මියැ යාම මැ උත්තම යැ මීනියා රාජ්‍යශ්‍රී කැටි වැ බෙද වළඳ නුඹ කෙරෙන් අගමෙහෙසුන්ශ්‍රී[4] ලදින් දැන් නුඹ වලට යා දී, අප[5] මෙනුවරැ හිඳිනන් කෙරේ දැ?යි. මාගේ දෙදරුවන් වඩාගෙණැ නුඹට පළමු කොට මා යන බව නො දන්නාදැ ද? ස්වාමීනි"යි කියමින් තමන් ලෙහි ඇවිළැගත් ශොකගින්න මහතානන් කැටි වැ යෙමී යන සිත් නැමැති දිය එවැ නිවා සිතන්නාහු "දන් නැමැති සත්‍යක්‍රියාව දෙෂ යැ"යි කී නගරවාසීන් සිත් ගන්නට නො පිළිවනැ. "නුඹවහන්සේ වනාන්තරයට මැ[6] වඩනේ මැනැවැ"යි කියා බිසවු වන වණීනා කියන්නාහු "රජ්ජුරුවෙනි, මල් පිපී වැනී ගිය රමණී වනමැද හඩා වැගිරෙණ හැලිකිඳුරු හා මුළු බැඳ සිටිනා මුව දෙනුන් මැදැ මහරැවි දෙන වෙහෙල්මුවන් දක්නා වූ අපට රාජ්‍යශ්‍රී සඳහන් නො වෙයි. සෙබඩුන් මැද බැහැවුම්[7] නැටුම් ගත් මොනරුන් දකුත් රජය සිහි නො වෙයි. ඇතිනිමුළු පෙර දැරි කොට සනහසනහා යන මදැතුන් හා නොයෙක් මල්පල්ලෙන් ගැවසී ගත් හෝවැල්ලේ සිටැ ලැහැන් බැඳ කෙළනා මස්කැලන් හා නොයෙක් වනමල් පැලැඳ මඩුලු බැඳැ ලියගී නහන ලියකින්නරාවන් මැද නැටුම් ගත් කින්නරපුරුෂයන් දකුත් රජය සිහි නො වෙයි. පිපී සිටිනා සපුපුවඟනාපනාසල් සලල අගරු දෙව්දුරුනඳුන්සඳුන් ආදි නොයෙක් රුක්රජුන් දක්නා වූ අපට කවර නම් රාජ්‍යශ්‍රියක් සිහි වේ ද? වනමල්

1. යන්නට　2. ශ්‍රීයාවට　3. ඉ ඉස　4. අග මෙහෙසුන්　5. ඇපී
6. වනාන්තරම　7. බැහැවුන්

Non-Commercial Distribution

පැලැඳ ගෙණැ රුක්සෙවනින් රුක්සෙවනට ගොස් කෙළනා දරු-දෙබිහින්නන්[1] දකුත් අතික් කවර දුකෙක් සිහි වේ ද? ස්වාමීනි, යම්හ. නුඹවහන්සේ පන්සල්හි වඩා හිඳුවා වනමුල් වනඵලාඵල කඩා ගෙණ ඊම මට භාර ය''යි කීහ.

එසඳ ඵුසතීදේවී ද යෙහෙළනියන් බස් අසා පුතනුවන් කෙරෙහි කළ ශොකයෙන් හඬමින් කියන්නාහු ''සෙලින් හී මියෙම් මැ යැ. දිව ඇදැ කා මියෙම් මැ යැ. සිරිගි කා මියෙම් මැ යැ. ගිනි වැදැ මියෙම් මැ යැ. මාගේ මඳ වරදකුත් නැති පුතනුවන් වනාන්තර යවත් නො හැම්මෙමි. නගරවාසීන්ගේ කියමන් ගෙණ මපුතනුවන් වනාන්තර යවා නම්. මී සැලු කලැ මැස්සන් පලන්නා සේ තොපගේ රජය නස්නේ වේ දැයි; තොපගේ පුතනුවන් නො වැළකූ නම්, මා දිවි නො තබමි''යි (කියමින් හැඬූහ. එසේ) හඬන බිසොවුන් දැකැ සඳමහරජ්ජුරුවෝ ද ශොක පත් ව නගරවාසීන්ගේ ක්‍රොධය බලවත්බව දැනැ ''මපුතනුවන් වනාන්තරයට දැන් යවමි. තෙපි රැහැණි නො වව. නොබෝ දවසෙකින් මාගේ පුතනුවන් වනාන්තර යැවූ නගරවාසීන් ලවා මැ ගෙන්වා ගණිමි''යි කියා ශොක සන්සිඳවූහ.

වෙස්සන්තර රජ්ජුරුවන් දුක් පත් වූවා දැකැ ''මම මෙදුක් නො බලමි''යි කියන්නකු මෙන් හිර සැහවින.[2] මෙසේ එද රාත්‍රිය යවා අල්ලේ දවස් ඇමැත්තෝ අවුත් වැදැ සිටැ ''ස්වාමීනි, සත්සතු මහදන් සරහනලදැ''යි දැන්වූහ. එබස් ඇසූ මහබෝසතානෝ සිරුරුකිස නිමවා මෙහෙ නිමවා රජගෙයි රැකවල් හරවා යාචකයන් රජම්දුලැ රැස් කරවා දන සම්භාර කැටි කොට ඇතුන් සත්සියක් අසුන් සත්සියක් කෙල්ලන් සත්සියක් කොල්ලන් සත්සියක් දැයි මෙසේ එකී එකී දෙයින් සත්සියක් සත්සියක් බැගින් දන් දී රුවන් තුබූ ගබඩාවල දෙර හරවා ''තොප කැමැති වස්තු ගණුව''යි නියොග කළහ.

යාචකයෝ ද සුපිපි පියුමකට බට[3] බමරකැලයක් සේ රන් රිදී මුතු මැණික් තෝඩු ශෘඞබලා[4] තිසර රුවන්මුදු රුවන්වලලු මේ[5] ආදී වස්තු කැමැති සේ උකහන්නට වන්හ. සමහරු පටකඩ පට්ටෝලි දේවාහ පීඩාම් සළුපිළී මේ ආදී පිළීසඹඩම් ගෙණැයන්නෝ සියදහස් ගණින. මෙසේ මහතානන් සතසතු මහදන් දුන්කෙණෙහි මහපොළොව ගුගුරා නැංගේ. මහාමෙරු පර්වතය සතුටු වැ නටන්නාක් මෙන් සැලෙන්නට වන. සප්ත කුලපර්වතයෝ ද හුයාපීවෙයගබඩ සේ නැමී වැඳුම් ගත්හැ. ඉක්බිති මද්‍රිදේවී ද තමන්ගේ පලඳනා පෙරහර පාදාංගුලි පාදකටක

1. දෙබීහින්න 2. හිරසඳ සැහවිය 3. වදනා 4. සඞබලා 5. දම්

Non-Commercial Distribution

පස්රු පෙරහර එක්වැටි පාමුදු රත්මරවැඩි පාඩගම් හිණ කෙස්වැළ සිරිවළලු දෙපට විදු අඟුල් දසරු බාහු මුතුවැල ගලමුතු මැණික්මාලා දකත් පසෙවිකත් දසඅභා තිලක මිණිදම් තිල්මාත්‍රා කබවොටුනු මේ ආදී පලඳනා ධනධාන්‍ය සියලු යාචකයන්ට දන් දුන්හ.

මෙසේ එදවස් දන් දෙන්නෙන් නො යා හී අල්ලෙ දවස් වෙස්සන්තරරජ්පුරුවෝ අඹුදරුවන් කැඳවා ගෙණ පියානන් මෑනියන් වැඳ සමු ගෙණ සිටියාහ. බොධිසත්වයන් මෑණියෝ මද්‍රිදෙවීන් දැක දුක්පත් වැ කියන්නාහු "යෙහෙළතියෙනි, දන් දුන් දෙෂයට මපුතුන් යා දෙව. තෙපි නො යව. වනාන්තරයෙහි දුක් ඉතා බෙහෙව. ජාලිකුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා තොප[1] හා ගියකලැ මහාවැසන යැ. දරුවන් රක්‍ෂා කිරීම නම් අපමණ[2] ඉතා දුකැ"යි කීහ. මද්‍රිදෙවී කියන්නාහු "මාගේ ස්වාමීන් හා වල් වසන්නේ ගමැ වසන්නාට වැඩි සුව යැ. කැටි වැ ගමන් යන කලැ ගෙහි හුන්නා වැනි යැ"යි කීහ.

බොධිසත්වයෝ මද්‍රිදෙවීන් මුහුණ බලා කියන්නාහු "සොඳුර, වලැ වසන කලැ මහත් බිය ඇත. ඒ හිමාලයෙහි 'දරපිඹුරෝ' යැ යන සත් කෙනෙක් තමන් දරණින් යොදුන් දෙයොදුන් වල් පවා වටා ගෙණ තමන් මුඛයට පත් සිංහයන් ද ව්‍යාඝ්‍රයන් ද ඇතුන් ද අල්ලාගෙණ ගැලපියති. සොඳුර, ඒ වලැ ගල්පිටැ හිඳැ සිංහනාද කරණ සිංහයන්ගේ හඬින් කන් පැළී යන්නා වැන්නැ. ව්‍යාඝ්‍රයන්ගේ හඬින් ලය පැළී යන්නා වැන්නැ. ඒ වෙනෙහි යක්‍ෂරාක්‍ෂසප්‍රෙතයන් විසින් ද භය ඇත. ඇට දක්වා විදැ ලේ බොන මදුරුවෝ ද ඉතා බෙහෙව. ඇතුන් පවා ගසා ගෙණ යන ඇත්ගිජුලිහිණියෝ ද ඉතා බෙහෙව. අස්සනෙක දුට ද ගැලවී නො යා දෙන වලසුන් විසින් ගහන යැ. බොහෝ බැණ කීම් ද? ඒ වෙනෙහි ස්ත්‍රීන් වසන්නට බැරි යැයි කීහ. එයට[3] මද්‍රිදෙවී කියන්නාහු "ස්වාමීනි, වදළ හැම දුක් ගෙණ වෙසෙමි"යි කීහ.

එසඳැ බොධිසත්වයෝ කියන්නාහු "බාලදරුවන් කැටපහණ නො ඇවිදුවා සුවයහනැ හොත්තවුන්[4] ගල්පහණපිටැ නො හොවා ධවලචාමරයෙහි පවන් විදියවුන්[5] අවුමුසු දැඩිසුළඟ ඇඟ නො ගස්වා රසභොජනයෙන් බත් කැවන් වනමුත් වනඵල නො කවා මපියානන්[6] කෙරෙහි හිඳුවා එව"යි කීහ.[7] (එබසට) "ස්වාමීනි, මම නුඹවහන්සේ නො දැක නො හැම්මෙමි.[8] දරුවෝ මා නො දැක නො හැම්මෙතී" (මද්‍රිදේවී) කීහ.

---

1. තොපි 2. යම් පමණ 3. කීහෙයින් 4.. හෝනාවුන්
5. පවනින් විදිනාවුන් 6. දරුවානන් මපියානන්
7. කී යෙන් 8. නො වෙම්

Non-Commercial Distribution

මෙසේ දෙමහල්ලන් කථා කරණු ඇසූ ඵුසතිදෙවී පුතනුවන් වෙනෙහි ගන්නා දුක් සිතමින් යෙහෙළතියන් හා දෙදරුවන් ගන්නා ව්‍යසන සිතමින් මහහඩින් හඬා පෙරළෙන්නට වන්හ. සොළොස්දහසක් පුරාංගනාවෝ ද නගරවාසීහු ද ප්‍රචණ්ඩ වාතයෙන් එක පැහැර පොළොව වැගිර ගිය සල්වනයක් මෙන් එක පැහැර හඬා වැගිර ගියහ. එකෙණෙහි ඇමැතියෝ මනහර කොට රථයක් සාද වඩනා කල් දැන්වූහ. එසඳ මද්‍රිදේවී සමුනන්ට පළමු කොට දියනියන් වඩා ගෙණැ පුතනුවන් ඇඟිල්ල අල්ලා ගෙණැ ගොස් රථයට පැනැ නැංගහ. පසු වැ මහබෝසතානෝ දෙමවුපියන් වැඳැ සමු ගෙණැ පුරස්ත්‍රීන්ට සමු දී සියලු ජනයාහට අවවාද කෙරෙමින් ක්‍ෂමා කෙරෙමින් තමන් කළපින් අනුමෝ කරවමින් මහාජනයා හඬ හඬා සිටිය දී රථයට පැනැ නැඟී රථය පැදැගෙණැ රාජවීථියෙහි යන්නාහු ආ ආවන්ට පින් දී "තෙපි හැමදෙන මැ දනාදී පින් කරවු. සියලු සංස්කාරධර්‍මයන් අනිත්‍ය සේ දුඃඛ අනාත්ම සේ සිතවු. සම්පත් නම් අලපතැ නෙළුම්පතැ ඔත්[1] දිය සේ අස්ථිරබව සිහි කරවු. මරණ තමා කරා එන බව සිහි කරවු. ඔවුනොවුන් හා විවාද නො කොට ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරවු. අප කළ බිණු දෙයක් ඇත, ක්‍ෂමා කරව"යි මෙසේ ප්‍රියතෙපුලෙන් අවවාද කොට නුවර වැස්සන්ට සමු දී වදරා නුවරින් පිටැත් වැ උතුරුදිග් බලා ගමන් ගත්හ.

මෙසේ වඩනා වූ බුද්ධඞ්කුර මහතානන් 'නුවර පෙරළී බලමි' සිතූ ක්‍ෂණයෙහි මැ මහපොළොව පෙරළී මුහුණ නුවර දිශාවට නමා තිබී යැ. එසඳ බෝසතානන්[2] තමන් දෙමව්පියන්ගේ ප්‍රාසාදදි පුරසම්පත් බලා සතුටු වැ මෙසේ වඩනා කල්හි ඵුසතිදෙවී සිතන්නාහු "මපුතනුවෝ වොටුනුමාලාදි රාජාභරණ ධනධාන්‍ය සොළොස්වරෙකැ දන් දී දැන් මද්‍රිදෙවින් හා දෙදෙන හුදෙකළා වැ[3] වනාන්තර යන්නාහ. ඒ යන ගමන් දන් දෙත්ව"යි[4] ධනධාන්‍ය වස්ත්‍රාභරණයෙන් දහසක් ගැල් පුරා යැවූහ. මැනියන් එවූ වස්තු බලා සතුටු වැ "මද්‍රිදේවීනි, රථය සිඟන්නන් කරා පදුව"යි කියා රථය පදවා ඒ වස්තු සිඟන්නන්ට දන් දෙවා වනාන්තරයට නික්මුනාහ.

එසඳ බමුණෝ දෙදෙනෙක්[5] "වෙස්සන්තරරජ්ජුරුවෝ ඉච්ඡා දන් දෙත් ල" යන හඬ අසා නුවර වැදැ පිළිවිසැ[6] වංකගිරියට ගිය බව අසා රැහැණි වැ අත සලාපියා 'යන කලැ ගෙණැ ගිය දෙයෙක් ඇද්දැ'යි

---

1. හොත් 2. බෝසතානෝ 3. හුන්කල
4. යන තම පුතුන් දන් දෙන්ට යයි 5. සතරදෙනෙක්-ජාතික
6. පිළිස්වා

Non-Commercial Distribution

විචාරා 'රථය මිසැ අනික් දෙයෙක් නැතැ'යි යනු අසා දිවෙමින් ගොස් ඇස්සනෙහි වඩනා බෝසතුන් දැක "පිණැති රජ්ජුරුවෙනි, සිටුව, සිටුව"යි හඬ ලූහ. බොධිසත්වයෝ ඒ අසා රථය නැවතුහ. බමුණෝ ගොස් වැඳැ සිටැ ආශීර්වාද කොට සිටියාහ. බොධිසත්වයෝ "කුමට අවු නැ?"යි විචාළහ. බමුණෝ දෙදෙන කියන්නාහු "අපි පින් මඳ හෙයින් දන් ගන්නට පසු වැ ගියම්හ. තෙල අශ්වයන් දෙදෙනා දුන මැනැවැ"යි කීහ. බොධිසත්වයෝ සතුටු වැ මිද්‍රිදෙවීන් හා දරුවන් හා බිමැ සිටුවා සෙඣව අශ්වයන් දෙදෙනා බමුණන්ට දන් දුන්හ. බමුණෝ බොධිසත්වයන්ට ආ වඩා අසුන් ගෙණැ ගියහ. දෙවතාවෝ සතුටු වැ මල්වැසි වැස්වූහ.

ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම දිව්‍යපුත්‍රයන් සතරදෙනකු කැඳවා කියන්නේ "වෙස්සන්තරරජ්ජුරුවෝ තපසට යන්නෝ මහැ දී අශ්වයන් බමුණන්ට දන් දී පයින් වඩිති. තෙපි ගොස් ඒ රථය අදුව"යි නියොග කෙළේ යැ. දිව්‍යපුත්‍රයන්[1] සතරදෙනා රොහිත නම් අශ්වවෙශ මවා ගෙණැ රථයෙහි යෙදී රථය[2] අදනා කල්හි අනික් බමුණෙක් පෙ‍ර සේ මැ අවුදින් කියන්නේ "වෙස්සන්තරරජ්ජුරුවෙනි, සිටුව"යි හඬ ලී ය. ඒ හඬ අසා මහතානෝ රථය නැවැත්තුහ. බමුණු අවුත් කියන්නේ "රජ්ජුරුවෙනි, ඉතා වෘද්ධයෙමි. රොගීමි. ගමනැ මිරිකිනිමි. තෙල රථය දෙව"යි ආශිර්වාද කෙළේ යැ. බෝධිසත්වයෝ සතුටු වැ අඹුදරුවන් රථයෙන් බහා බමුණාට රථය දුන්හ. "බිසවු පයින් නො යා හෙති. දරුවෝ දුක් වෙති" නො සිතා ඒ මහතානන් රථය (දන් දෙත් මැ රථය) අදිමින්[3] සිටි දෙවියෝ අන්තර්ධාන වූහ. මිද්‍රිදේවි දරුවන් දෙබිහින්නන් අත් අල්ලා ගෙණැ වනාන්තරයට නික්මුනාහ. බෝධිසත්වයෝ "ජාලියකුමාරයන් මම වඩමි. කෘෂ්ණජිනාවන් තෙපි වඩව"යි කියා දෙදෙන දරු දෙදෙනා වඩා ගෙණැ කටුපහණ ගල්බොරලු මඩිමින් හුණුවැල්ලේ සෙවන වදිමින් දෙළන් හැලි වැදැ නහමින් ලියමඩුයෙහි[4] වැදැ සැතැපෙමින් ඔවුනොවුන් හා කෙළිමින් යෙමින් තමන් දුන් දන් සිහි කෙරෙමින් සතුටු වැ වඩනාහ.[5] ඒ සතරදෙනා දුටුදුටුවන් විසින් ඔවුන්ගේ සියුමැලිකම් දැකැ "යන්නේ කොයිදැ"යි විචාරා "වංකගිරිපර්වතයට යැ"යි යනු අසා කම්පා වැ කඳුළුමුසු මුහුණින් යුක්ත වැ හඬන්නවුන්ට අවවාද කෙරෙමින් වඩනා කල්හි, මහතැ පකාපැකි දැකැ දරුවෝ ඊට ඇවිටිලි[6] ගෙණැ හඬති. බොධිසත්වයන්ගේ ආනුභාවයෙන් අඹදඹඵල්* කෙහෙල් ගිවුළුකටුඑරමිණිය මේ ආදි වෘක්ෂ තෙමේ ම නැමී ඵලාඵල දරුවන් අත තබයි.[7]

---

1. දිව්‍යපුත්‍රයෝ 2. දෙවියන් රථය 3. මහතාණන් රථය රදමින්
4. මඑයෙහි 5. වඩිනා 6. ඉර ඇවිටි 7. තිබෙයි

Non-Commercial Distribution

මෙසේ බෝසතානෝ දරුවන් කැමැති කැමැති දෑ දෙමින් පොකුණුවිල් තෙරැ සැතැපෙමින් වැඩැ දෙවතානුභාවයෙන් මහ වැළහෙත් මැ ගොස් මද්‍රිදේවීන්ගේ දෙමව්පියන්ගේ වෙතියරට ජයතුරානුවරැ තිස්යොදුන් මහ ගෙවා පස්වරු ශාලාවට වන්හ. මද්‍රිදේවී ශාලාව හැමැදැ බොධිසත්ත්වයන් හෝනා ආසන පණවා වඩා හිඳුවා පත්ලෙහි ධූලි[1] පිසැ පියා දරුවන් දෙදෙනා අසැ හොවා නගරවාසීන්ට පැණුන මැනැවැ යි සිතා දුරු වැ "බොධිසත්ත්වයෝ තමන්ගේ නුවර ආ හෙයින් අප හැරැ ගියෝ[2] දෝ හො යි සිතත් නම්, හෙතු නො වේ"යි සිතා බොධිසත්ත්වයන්ට පැණිපැණී සිටියාහ. එසේ සිටියා වූ බිසොවුන් යනු එන්නෝ දැකැ වැඳැ නගරවාසීන්ට කීහ. නගරවාසීහු[3] රැස් වැ සිටැ වෙතියරජ්ජුරුවන්ට දැන්වූහ.

වෙතියරජු ඇතුළු සැටදහසක් රජ්ජුරුවෝ අවුත් බොධිසත්ත්වයන් පාපිට හඬා හුනහ[4]. හඬා නැවැතැ සිටැ කියන්නාහු "දෙවයෙනි, කිමෙක් ද? තොපට ලෙඩදුක් නැද් ද? තොප පියානන් සඳමහරජ්ජුරුවන්ට දුක් මඳ ද? නුවරවාසීන්ට පීඩා නැද් ද? මෙ නම් කුමන විස්මයක් ද? කවර නම් විපත්තියෙක් ද? මීතියා අනාථගමනෙක් තොපටත් වී ද? දේවයෙනි, තොප නැඟී ආ වාහන කොයි ද? ඇත්අස්රථසේනාව කොයි දැ?"යි විචාළහ. බොධිසත්ත්වයෝ කියන්නාහු "මාගේ දෙමව්පියන්ටත් නුවරවාසීන්ටත් ලෙඩ දුක් නැත. බල එකෙක් මත්තඃ කෛලාසකූටය සේ ධවල වූ සුවිසිලක්‍ෂයක් අගනා පලඳනායෙන් හොබනා වූ පරිවාර සහිත පණ්ඩර නම් හැලි අතු කලිඟුරට වැසි බමුණන්ට දන් දුන්හ යි සිවිරට ඇත්තෝ මපියානන්ට ද කිපී 'මා එරටින් ගිය මැනැවැ'යි කීහ. එසේ හෙයින් ආමී" කීහ. රජ්ජුරුවෝ අසා "ආ සේ ඉතා මැනැවැ"යි සතුටු වැ 'සිවිරට ඇත්තන් ආරාධනා කොට ගෙණැ යන තුරු අපගේ රට රජ කළ මැනැවැ'යි වෙතිය රජ්ජුරුවන් හා සැටදහසක් රජදරුවෝ ආරාධනා කළහ. බෝසතානෝ කියන්නාහු "රාජ්‍යය නො කරමි. තොපගේ රට මා රාජ්‍යය කරත්, 'අප නෙරපූ රජ්ජුරුවන් තුමූ නවතා ගෙණැ රාජ්‍යය කරවතී' තොප කෙරේ වෛර බැඳැ උනුන් හා යුද්ධ කොට දෙරට ඇත්තෝ විරොධ වෙති. එසේ නො කෙරෙමි. වඞ්කගිරි පර්වතයට තපසට යනබව මැනැවැ. වලැ විසීමට සුදුසු තැනක් කියව"යි කීහ. 'විචාරා කියම්හ. රජගෙට වැඩිය මැනැවැ'යි කීහ. බෝසතානෝ 'රජගෙට නො යම්හ'යි කීහ. මෙසේ කියා ඇතුළුනුවරට නො වඩනෙන්, එ මැ ශාලාව දිව්‍යවිමානයක් සේ සද සැටදහසක් රජ්ජුරුවෝ ශාලාව සිසාරා රැකවල් ගත්හ. බොධිසත්ත්වයන් සුවඳපැනින් නහවා සළු පෙරළා සළු හඳවා රසභොජන වළඳවා සතුටු කළහ. බෝසතානෝ එදවස් රැ

1. ධූව්ලි 2. ගියේ 3. නගරවාසීන් 4. හුන්න

Non-Commercial Distribution

එහි ලැග[1] පාන් වූ කල්හි වඞ්කගිරි පර්වතයට යම්හයි කීහ. එසඳ රජ්ජුරුවෝ කියන්නාහු "නුඹවහන්සේ වඩනා කලැ පෙර ගමන් පසු කරන්නට එන්නෝ බොහෝදෙන යැ. මහවල් කප්පා[2] මං හෙළි කරණතෙක් වැඩැහුන මැනැවැ"යි වළකා සත්දවසක් එහි මැ රඳවා ගත්හ. මං[3] හෙළි කළ කලැ 'වඞ්කගිරිපර්වතයට යම්හ'යි බොධිසත්ත්වයෝ නික්මුනාහ.

චෙතියරජ්ජුරුවන් හා සැටදහසක් රජදරුවෝ සම්වැට ගෙණැ සුලුවනයැ පසළොස්යොදනක් ගෙවා ගොස් මහවනය පසළොස්යොදනක් තැන් ඉදිරියෙහි තබා මහවනය සමීපයෙහි[4] සෙනාපතියකු රැකවල් ලවා සිටැ දකුණත ඔසොවා මඟ කියන්නාහු 'ස්වාමීනි, මෙතැනැ සිටැ ඉදුරා දකුණුදික් බලා ගියකලැ නහාසිටවූ නිල්වලාකුළක් සේ තෙල පැණෙන්නේ එලාඑලයෙන් විපුල වූ විපුල නම් පර්වතය යැ. එ පර්වත ප්‍රාන්තයෙහි සිටැ බැලූ කලැ නොයෙක් සුගන්ධයෙන් සම්බන්ධ ගන්ධමාදනපර්වතය යැ. ස්වාමීනි, ඒ පර්වතය වටා නඳුන් සඳුන් කළුවැල් කිණිහිරි සපු දුනුකේ නා පනා ආදි නොයෙක් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිත යැ. ඊ සැතැපී තොපා අඹුදරුවන් එලාඑල කවා ගෙණැ ගිරිඋඵලෙන් බට සිහිල් පැන් බී ශරීරක්ලාන්තිය නිමවා ඉන් ඔබ්බට වැඩිකලැ මනා තොට පතර[5] ඇති නොයෙක් මස්ලැහැනුන් විසින් ගැවැසීගත් මහ ගඟෙක් ඇත. ඊ දෙතෙර රිදීපටක් හයා ලූවා සේ මනා වූ වැලි තලායෙහි සිහිල් සුළඟ ඇඟ ගස්වා සැතැපී ගෙණැ ඉන් ඔබ්බට වැඩිකලැ ඉන්ද්‍රනීලමණිපර්වතයක් සේ බබලන මහත් නුගගසෙක් ඇත. ශර්කරා පරයන මධුරරස ඇති නුගපක්* අනුභව කොට ඒ නුගගස මුලැ සැතැපී ගෙණැ එයින් ඔබ්බට වැඩිකලැ[6] සතුරඟුල් උස ඇති රතිඳුගොව්වන් සහිත නිල් වූ මහත් හීතණවන යැ. ස්වාමීනි, ඒ ගෙවා වැඩි කලැ පස්පැහැයෙකින් හින්න වර්ණ ඇති පියුමෙන් හා ඇඹුල උපුල හෙල්මැල්ලෙන් ගැවසී ගත් නිල්වූ දියතලාවෙකින් ඉඳුනිල්මිණිඅතළ පැරයූ මී බී උදම් බමරගණා විසින් උදම් වූ හංසශ්‍රෙණීන් විසින් විරාජමාන වූ සිවුරැස් පොකුණෙක් ඇත. ඒ පොකුණට දකුණුදිගැ එලාඑලයෙන් අවඩකවූ වඞ්කගිරි පර්වතයැ. එගල්පයතැ පන්සල් කොට ගෙණැ ධ්‍යාන සුවයෙන් දවස් යවමින් අඹුදරුවන් හා සමඟ වැ වාසය කළ මැනැවැ"යි මඟ කියා සැටදහසක් පමණ රජදරුවෝ වැඳැ සමු ගත්හ. එ දවස් මැ ශක්‍රදෙවෙන්ද්‍රතෙම තමාගේ දහසක් නුවණැස් බහාලා මනුෂ්‍යලොකය බලන්නේ අප මහබෝසතානන් සතසතු මහදන් දී

1. වළඳවා රැ ලැග 2. කප්පවා 3. සත්දවසක් එහි හිඳ මං
4. සමීපයෙහි 5. කොටපතර 6. යන්නා *නුගපත්

Non-Commercial Distribution

වඞ්කගිරිපර්වතයට තපස් කරන්නට නික්මුනු බැව් දැනැ විශ්වකර්ම-දිව්‍යපුත්‍රයා කැඳවා කියන්නේ “වෙස්සන්තර රජ්ජුරුවෝ ද මද්‍රිදේවී ද තපස් කරන්නට වඞ්කගිරිපර්වතයට යෙති. තොප ඒට ගොස් පන්සල් දෙකක් හා සක්මන්මළු දෙකක් හා කෙහෙල්වනයක් හා ඵලවෘක්‍ෂයන් හා අඳුන්දිවිසම් රිටිසුඹුළු තිදඬු කෙණ්ඩි සැරයටි පැස් පුළුලු මල්කරු යහුල් මේ ආදී නිමවා “තපස් කරන්නවුන්ට කැප යැ”යි භිත්තියේ අකුරු ලියා පන්සලට තිස්ගව්වක් මානයෙහි වගුත් වලසුන් සිංහයන් අවලක්‍ෂණ යක්ඛප්‍රෙතයන් ලුහුබැඳැ එ”යි කියා නියොග කෙළේ. එසේහෙයින්[1] විශ්වකර්මදිව්‍යපුත්‍ර සියල්ල මැ නිර්මිත කොට දෙව්ලෝ ගියේ.

බොධිසත්‍වයෝ සිවිරට වාසීන් කී තාක් සලකුණෙන් ගොස් සැතැපී හිඳිමින් සිටිමින් සතරැස්පොකුණට ගොස් පොකුණෙහි විස්තර බලා “තෙපි මෙතැනැ සිටුවයි මද්‍රිදේවීන් පොකුණු තෙරැ සිටුවා දකුණුදිගැ හසරක් දැකැ ඒ හසරින් ගොස් විශ්වකර්මයා මැවූ පන්සල් දැකැ සිතන්නාහු ශක්‍රයා අප ආබව දත් වනැ”යි සිතා තමන් වහන්සේ අතැ තුබූ රන්කඩුව ද දුන්න ද තබාපියා පන්සල ඇතුළට වැදැ භිත්තියෙහි ලියා තුබූ අකුරු දැකැ කියවා බලා කැප වූ බව දැනැ එහි හිඳැ ජටා බැඳැ හන්සළු ගලවා හැරැ වල්කලා හැඳැ අඳුන්දිවිසම් පෙරෙවැ පාත්‍රයක් ගෙණ සැරයටියක් අතින් ගෙණ සක්මන්මළුයේ සක්මන් කෙරෙමින් සිටියහ.

මද්‍රිදෙවි බොධිසත්‍වයන් ලස් වූයෙන් සතරැස්පොකුණෙන් නික්මැ බොධිසත්‍වයන් ගිය හසරින් අවුත් තපොවිලාසයෙන් සිටියා වූ සමුනන් දැකැ ලය පැළී යන පමණ ශොකයෙන් හඬාගෙණැ බිමැ හී “ස්වාමීනි, පෙරැ සිවිරට ආදි වූ ජම්බුද්වීපයෙහි මිනිසුන් විසින් ‘මූ සඳමහරජ්ජුරුවන් පුතනුවෝ වෙස්සන්තරරජ්ජුරුවෝ යැ’යි කටැ කටැ නුඹගේ රූපශ්‍රී කියනු ඇසීමි. මාගේ සියැසින් මැ නුඹගේ රාජ්‍යශ්‍රී දිටිමි.[1] ස්වාමීනි, දැන් මී නියා තපස් වෙශයක් දිටිමි.[2] පෙරැ නුඹ ‘රජ්ජුරුවහ’යි ප්‍රසිද්ධ වැ දැන් ‘තපස්වී යැ’ යන නම් වී ය. පෙරැ මිණිකොඩොලෙන් බබලන සහවොටුනු පලන් තෙල හිස දැන් දළමඩුල්ලට පවා සුදුසු වී වනැ පෙරැ දළමුත්හර දහන්හු එකාවැල පලන් තෙල උරය දැන් මුවසම්[3] ලන්නට සුදුසු වී වනැ. පෙරැ කසීසළු හත් තෙල උකුළ දැන් නිය සහිත අඳුන්දිවිසමට සුදුසු වී වන. මේ නියා වෙසක් මා දක්නට මාගේ දැස තුබූ නියා යැ. මෙසේ වූ දෙයෙක් නුඹටත් වී වනැ. මේ නියා විලාසයක් දුටු මා ලය හැම්මෙන නියා යැ”යි හඬා වැලපැ ශොකය සන්සිඳුවා ගෙණ “මාගේ සමුනන් ගත් තවුස්වෙස් මාත් ගත

1. එසෙයින් 2. දුටිමි 3. මුවසන්

Non-Commercial Distribution

මැනැවැ"යි සිතා ජාලියකුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා කැඳවාගෙණැ අනික් පන්සලට වැදැ තමන් හත් සළු ගලවා හැර අඳුන් දිවිසම් රිටි සුඹුළු ආදි වල්කලා හැඳැ පෙරෙවැ හිසැ ජටා බැඳැ ජාලියකුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා දරුවන් දෙදෙනා අඳුන්දිවිසම්රිටි සුඹුළු හඳවා හිසැ ජටාමඩුලු බැඳ තුන්පුතුමවූ බෝසතානන් කරා අවුත් වැදැ නැඟී සිටැ කියන්නාහු "ස්වාමීනි, නුඹ අතින් මා ගන්නා වරයෙක් ඇතැ"යි[1] වර ඉල්ලන්නාහු "මම වනමුල් වනඵලාඵල ගෙණෙන්නට යෙමි. පෙරවරු නුඹවහන්සේ දරුවන් දෙදෙනා රක්‍ෂා කළ මැනැවැ"යි කිවු යැ.

බෝසතානෝ යහපතැයි කියා උන්ට වර දී කියන්නාහු "මයිදු තොප වෙතින්[2] ගන්නා වරෙයකඃ වේලෙහි මුත් නොවේ ලෙහි මාගේ පන්සලට නො වදුවයි කීහ. ඔවුන් වෙතින්[2] වර ලදින් වසනකල්හි මද්‍රිදෙවී වනමුල් වලඵලආදි වූ ඵලාඵල ගෙණ ඇර[3] බෝසතානන් වළඳවා අත්පාමෙහෙ කොට සත්මසක් විසූහ. බොධිසත්‍වයෝ දත් ගන්නා සිහන්නන් නැත්තෙන් දුක්පත් වූහ. පරහට සුව දෙන්නට උපන් මහතානෝ වන මුල් වනඵල ඇත ද, දත් මැ මුත් සෙසු සුවයක් සුව කොට නො ගත්හ.

මෙසේ වසන සමයෙහි කලිඟුරට වසන ජූජක නම් බමුණෙක් අටලොස්හැවිරිදි වයසැ සිටැ සිහන්නේ වෘද්ධ අවස්ථාව දක්වා සිඟා සියක් කළන් මසුරන් උපයා අනාථ එක් බමුණකු කෙරේ තබාලා ගියේ. කල් යාමෙකින් බමුණු අවුත් "මගේ රන් දෙව"යි කී යැ.[4] ඒ කියන්නේ "මා[5] අනාථ විසින් රන් විකුට[6] කැමි. තාගේ රණට මෙ මාගේ දුව, අමිත්තතාපා නම් බැමිණි, තට අඹු කොට දෙමි. ඈ ගෙණැ යා"යි කී යැ.[7] එ බමුණු තමාට අනික් ලැබෙන දෙයක්[8] නැත්තෙන් බැමිණිය ගෙණැ දුනුවිටු[9] නම් ගමට කැඳවා ගෙණැ ගොස් තමාට අඹු කෙළේ. අමිත්තතාපා නම් බැමිණි සැමියාහට සුව සේ මෙහෙ කොට සිත් සේ වෙසෙයි. මේ බලා එ ගමැ ළදරුබමුණෝ තමන් තමන්ගේ අඹුවන්ට රැහැණි වැ කියන්නාහු "වෘද්ධබමුණාට මෙවෙනි ස්ත්‍රියක් ඌ සිත් සේ මෙහෙ කොට වෙසෙයි. තෙපි අපට කවර මෙහෙකරවු[10] දැ"යි කියා තම තමන්ගේ අඹුවන්ට ගහට කෙරෙති. එක් දවසක් අමිත්තතාපා නම් බැමිණිය තොටැ දී දැකැ එගමැ සෙසු බැමිණියෝ කියන්නාහු "පව්කිළිය, තෝ දත්හුනු නර මහල්ලකුට මෙහෙ කෙරෙයි ද? මේ කඩදත් මහල්ලාට තී දුන් තිගේ දෙමවුපියෝ තිට සතුරු[11] වන්හ. තී

1. වරයෙකැයි 2. විසින් 3. හැර 4. කියා 5. මාගේ
6. විකොට 7. කියා 8. වදයෙක් 9. දුන්නිමිත්ත
10. කරා 11. සතුරො

Non-Commercial Distribution

උන්ට අප්‍රිය වන නියා යැ.[1] තෝ පින් නො කළ පැවැත්තියක බන්දෙහි.[2] තී ගිය ජාතියෙහි කවුඩුවන්ට පිඬු දුන්කලැ තී ලූ බත් කැයේ මහලු කවුඩුවකු[3] වනැ. එසේ හෙයින් (වද) තී මේ නරමහල්ලාට අඹු වූයේ? යෙහෙළි, මෙසේ වූ ජරහම් මහල්ලා හා එක් වැ පඤ්චකාම විෂයෙහි කවර නම් ඇල්මෙක්[4]ද? ඔහු කඩදත් දල්වා ගෙණැයෙන වේලෙහි තිට කවර නම් සමාධියෙක්ද? කිඹුල්පිටක් සේ කොරසැඩි වූ උගේ ශරීරයෙහි ගැවී කවර ආස්වාදයෙක්ද[5]? "සොඳුර, තීගේ මොළොක් වූ ශරීරය මිරිකා එ බමුණු කණාටුවාට[6] මෙහෙ කොට දුක් නො ගෙණැ තී සේ වූ අභිරූප වූ ලදරු සැමියකු සොයා ගණැ" යි කීහ.

එසේ තමාට පරිභව බණන්නා වූ ගැහැණුන් බලා හඬා වැලැපැ මියුඩුහුරු[7] ලා තමා පැනට ගෙණැ ගිය කළය ගල් කැටෙකැ පැහැර බිඳපියා අත පෙරෙවැ ගෙණැ බමුණුමහල්ලාට තතනමින් දත් කමින් සාප කොට ද බෙණෙමින් ගෙට ගොස් "බමුණු මහල්ල, තා සේ වූ කෙළතොල්ලන් කෙරෙහි උන් විපාක අද ලදිමි. යාපත් සරණෙකැ මා ආයේ! අද මෙගමැ සම්දැරියන්[8] එක් වැ ගෙණ මා හිසැ බොල්කෙළ ඕනා සේ, මට උන් නො කී පරිභවයෙක් නැත. තා කෙරෙහි හිඳැ මෙ සේ වූ බස් අසන්නාට වඩා කර වැල් ලා ගෙණැ මිය යැම යහපතැ. සිරිහි කා මියැ යැම යහපතැ"යි කිව.

එ අසා බමුණුමහලු දත් වැගිර ගියත් අඹුසොඩහෙයින් මැ කී බසට කම්පිත[9]වැ "සොඳුර, තොප රැහැණි නො වව, දරත් මම් මැ ගෙණෙමි. දියත් මම් මැ ගෙණෙමි. සෙසු කළ මනා යම් මැ මෙහෙයක් ඇත, මම් මැ කෙරෙමි. අද පටන් තෙපි මෙහෙ නො කරව"යි කී යැ.[10] බැමිණි එ අසා "සැබව, සැමියන් අතින් මෙහෙ ගන්නා කුලයෙකැ මා උපන්නා නැත. එම්බල, තට උපායක් කියමි. මහායශස් ඇති ගුණෙන් සම්පන්න වූ වෙස්සන්තර නම් මහරජානෝ[11] ඉච්ඡාදන් දෙති. උන්ගෙන් වස්තු ගෙණැ අනාථයෝ[12] සුව විදින්නාහ[13]. දැන් ඒ උත්තමයා වඞකගිරිපර්වතයෙහි තපස් කෙරෙයි. තෝ ඔබ ගොස් මට මෙහෙ කරණ වහලක් ගෙණෙයි නම් හිඳිමි. නැත, මාගේ දෙමාපියන්ගේ ගමට නැඟී ගොස් අනික් මා සේ මැ ළදරු වූ දැසි[14]දසුන් විසින් සම්පන්න වූ පුරුෂයකු කෙරේ හිඳිමි. තා බලබලා සිටියැ දී ඌ හා මා කෙළනා කලැ, මහල්ල, තා සිතට සුවයෙක් නැත්තේ වේදැ"යි කිව.

1. තෝ උන්ට අප්‍රියයෙහි වන 2. කළ නැනැත්තියක් බව නොහිතූ
3. කවුඩුවෙක් 4. සමෘද්ධයෙක 5. අස්වසෙක් 6. කනාවටුවාට
7. මියුඩුරුහුරු 8. සක් දැරියෝ 9. කම්පා 10. කියා
11. රජානන් 12. අනාථයන් 13. විදින්නේය 14. දැස්

Non-Commercial Distribution

එබස් අසන්නා මැ බමුණා ළය ඉපිළ හිත. ලපිරුණ ශොකයෙන් මහත් කොට මියුඩුහුරු[1]ලා කියන්නේ "සොඳුර, මම ශක්ති නැත්තෙමි. වෘද්ධයෙමි. වඞ්කගිරිපර්වතය ඉතා දුර යැ. නො යා හෙමි. ගෙහි කළ මනා මෙහෙ මම් මැ කෙරෙමි. තෙපි ඊට අසමාධි නො වව"යි කී යැ.[2] එ අසා බැමිණි කියන්නී "තෝ[3] සංග්‍රාමභූමියට නො වැදැ මැ පැරැදි එකකු වැන්නෙහි. ජඩ වූ තඹවිටි මැළිය, මට කන්නළවු නො පිරුවා ගොස් රජ්ජුරුවන් අතින් කෙල්ලක කොල්ලකු ගෙණව"යි කියා බමුණා වෙර ලේ කයි. ඌ හින්දැ සිටියැ නො දී ඇත මැත ගැසෙමින් හවමින්[4] වෙහෙසයි.

බමුණු අඹුව කරණ ගහටයෙන් ඇ කෙරෙහි කළ හයින් "යහපත, ගොස් වහල් ගෙණෙමි"යි ගිවිසැ වලින් දර ඇරැ[5] ගෙණැ ගෙ පුරාලා දිය ඇරැ[6] වලන් පුරාලා ගෙය සිසාරා වැට කොට ඇට බත්බුලත් තබාලා ගමනට සැරහී සිටැ, අඹුව තුන් විටෙකැ සිසාරා පැදකුණු කොට වැදැ සතර තැනෙකැ බැසැ හෙවැ වැදැ ඇ කෙරෙහි කළ හයින් හැකිලැ හැකිලැ සිපැ ගෙණැ තිකට ගෙණැ සනහා[7] ඇට කියන්නේ "සොඳුර, මම ලස් නො වැ මැ එමි. තෙපි බය පත් වව"යි සමු ගෙණ වහන් සහළක් පය ලා කුඩමහල්ලක් අතින් ගෙණ කෙංඩියකින් පැන් හා මහට ගත් උපකරණපය්‍ය කරට නහා ගෙණ අඹු ලදැරි[8] කතුන් පෙරළී සිටැ බලබලා වදිමින් වඞ්කගිරිපර්වතයට යන මහට ගොස් මහැ දී සිතා පියා "සිවිරට වැදැ නො දිටිම් නම්, පසු වැ වඞ්කගිරිපර්වතයට යෙමි"යි කියා සිවිරට ගොස් වැදැ "වෙස්සන්තරයෝ කොයි දැ?" කියා විචාළේ.

නගරවාසී එ අසා කිපී "තව ද දන් ගැන්මෙහි නො නවතු[9]ද? අපගේ ස්වාමීන් රටින් යන පරිද්දෙන් කළව. තව ද, කුමට පිළිවිස්හි[4] දැ?"යි කිපී කැටපහණ ගෙණ ලුහුබැඳැ ගත්හ. බමුණු ද හෙමින් පිරිහෙමින් තොල් බොල් සිඳැගෙණැ දණඋතුලේ ලා ගෙණැ දිවන්නේ උතුරුදික් බලා මැ ගමන් ගත. ඔහු මහ නො හඳුනතුදු දෙවතාවෝ බෝසතුන්ගේ දනපාරමිතාව පුරණු සඳහා වංකගිරිවපර්වතයට මහ පැහ. බමුණු ක්‍රමයෙන් වනාන්තරයට ගොස් හිරු මුදුන් වේලෙහි චෙතියපුත්‍ර නම් සේනාපතිහු සිටි රකවලට ගියේ. ඒ සෙනාපතිහුගේ කීන බල්ලෝ බමුණා දැකැ සිසාරා ගත්හ.

බමුණු හය ඇති වැ මහත් කොට සසලා පියා තජීණ පය්‍ය ද කුඩය ද සැරයටිය ද කෙංඩිය ද වහන්පතුල් ද හෙළා පියා හිසකේ

---

1. මියුඩුරුහුරු 2. කියා 3. තොප 4. හඬමින්
5. හැර 6. සනා 7. දැරි 8. නැවතු
9. පිළිවිස්සා

Non-Commercial Distribution

උදුරාගෙණැ දිවැගෙණැ ගොස් ගසකට පැන නැඟී ගස පිට හිඳැ හඬන්නේ මෙසේ කියා හඬයි: "පඤ්චමහාගඞ්ගාවන්ට මහාසාගරය බඳු වූ, වැසිලිහිණියන්ට මහාමෙඝයක් බඳු වූ, පිපාසිතයන්ට මහගඟක් බඳු වූ, රොගීන්ට දිවබෙහෙදක් බඳු වූ, ඝන වූ අඳුරුපතරට ප්‍රදීපයක් බඳු වූ, යාචකයන්ට කප්රුකක් බඳු වූ, සිතූ සිතූ දෙයක් දෙන චින්තාමණිකාෘයක් බඳු වූ, මැඟීන්ට සිහිල්සෙවනක් බඳු වූ, හැම සත්ත්වයන්ට පින්පැන් මඩුවක් බඳු වූ, ඉල්ලූ දෙයක් නැතැයි නො කියන්නා වූ, මහතැ පඤ්චපදුමයෙන් සැදුනු පොකුණක් බඳු වූ, සියලු සතුන්ට සම සිත් වූ වෙස්සන්තර රජ්ජුරුවෝ කොයිදැ"යි හඬ ලී යැ. චෙතියපුත්‍ර නම් සෙනාපති බමුණාගේ හඬ අසා අවුත් බමුණා දැකැ කියන්නේ "තමන් රජය හැරැ පියා දැන් හිමවතට තපසට නැඟී ආ රජ්ජුරුවන් සොයා ආයේ බිසොවුන් වත් දරුවන් දෙන්නා (වත්) ඉල්ලා ද්‍යේ!යැ"යි කිපී පිටතොල දත්[1] කමින් සිටි සරමින් "දැන් දැන් තා දිවි ගණිමි"යි දුන්න හයා විෂ පෙවූ කණුහීය මුඩයේ[2] ලා ගෙණැ "සොර, දැන් දැන් තගේ හෘදයමාංසය ලේ වම්වවම්වා කඩාගෙණැ පත්‍රසකුණයන්ට බිලි දෙමි. දුෂ්ට බමුණ, තාගේ බඩවැල් හැරැ ගෙණැ තුත්මංසලැ පණක් සේ සිසාරා තාගේ පඤ්චමධුරමාංසයෙන් හා තාගේ ග්‍රීවායෙහි ලෙහෙයෙන් දෙවියන්ට බිලි දෙමි. තා සල්වසල්වා දැන් දැන් තා ඇඟ මස් කපකපා තෙල බල්ලන් කවමි. වහා තෙල ගසින් බැසැ පිය"යි කී යැ.[3]

බමුණු මරණභයින් භය පත් වූයේ අනික් වදනා තැනක් නැත්තේ මහහඬින් හඬා 'බොරුවක් කියා මා මොහු අතින් ගැලවුන මැනැවැ'යි සිතා කියන්නේ "මා එසේ මැරියැ නො හැක්කැ. මම දූතයෙක්මි. මඳ වරදකුත් නැත්තෙමි. මා දිවි නො ගන්ව. මඳ ඇසිල්ලක් මාගේ බස් අසව. සඳමහරජ්ජුරුවන් හා සිවිරට වැස්සන් හා සැදැහැයෙන් වෙස්සන්තර රජ්ජුරුවන් ගෙණෙයි කී හෙයින්, එක්වන් බිසවුන් වලප්නා හෙයින්, මවුපිය දෙදෙනාගේ ශොක බලවත් හෙයින්, වඞ්කපර්වතයට ගොස් වෙස්සන්තරරජ්ජුරුවන්ගේ ස්වරූප දන්නා සඳහා නගරවාසීන් හා රජ්ජුරුවන් හා කීහෙයින් ආමී" කී යැ.

ඒ අසා සෙනාපති සතුටු වැ යමයන් සේ වටා ගත් කීන බල්ලන් ගසැ බඳැ ජූජකබමුණා ගසින් බහාගෙණැ පැලැහු[4] මස් හා අළ මී හා මියුරු ආහාර කවා ගමනශ්‍රමදහ නිවා සතප්වා ගෙණ බමුණා නික්මුනු කලැ මහට මීලබුවක් පුරා දී මස් පිඩියක් ද දී පසු ගමන් කොට දකුණත ඔසොවා බෝසතානන් වසන දිශාවට මහ කියන්නේ "බමුණ,

1. දතින් 2. තුඩයේ 3. කියා 4. පැලවූ

Non-Commercial Distribution

තෙල දියවලාකඩක් සේ දුරින් පැණෙන්නේ ගඳමඳන්[1] පව්ව යැ. එගල්පයත[2] කිරි කුඹුක් නුග ඇසැටු කෙළිඳ ගිවුළු බෙලි අඹ දඹ බක්මී එල්කෙහෙල් කටුළුරම්ණිය නළුන් සඳුන් සපු දුනුකේ නා පනා මේ ආදී මල් පල්ලෙන් සැදුනේ යැ. හැලි ගසා දිවන මනහර ගංහෝ ආදියෙන් සැදුම් ලද්දේ යැ. මල්පල්ලෙන් ගැවසීගත් ලියකිඳුරන්ට ගේ වූ සිත්කලු වූ ගල්තෙල්ලෙන් රමණී යැ. ඒ වනයෙන් නො එක් එලාඑල කමින් හඩා වැගිරෙණ නොඑක් හැලි සියයෙන් නහමින් පැන් බොමින් ගිය කලැ ඔබ්බෙහි පොකුණෙක් පසැවපදුමයෙන් සැදුනේ යැ. නෙළුම්පත්පිට වගුළ මල්රෙහෙණු වැල්මී ශකීරා සෙයින් කමින් ගොස් මහැ ලැගැ රාකෂසයන් විසින් ගහන වූ වනාන්තරයෙහි විපුලපර්වතයෙහි අච්චුත නම් තපස්වීන් වසන පන්සලට වැදැ සැතැපී උන් අතින් මහ පිළිවිස්වා ගණැ"යි කියා සුලුවනය විස්තර කොට මහ කියා නැවැත්තේ.

බමුණු ඌ කී පරිද්දෙන් මැ ගොස් විපුල නම් පර්වතය සමීපයෙහි[3] පන්සලට වැද තපස්වීන් දැකැ සුවදුක් පිළිවිස්නේ[4] "කරුණු මඳ ද? මැසිමදුරුවන් විසින් දුක් නැද්ද? දිවියන් වඟුන් වලසුන් සිංහයන් විසින් උපද්‍රව නැද්ද? එලාඑල ලැබේ දැ?"යි කියා විචාරා සිටියේ. තපස්වී කියන්නාහු "තා කී තාක් දෙයින් දුක් නැත. එලාඑල ලැබෙ"යි කියා ඔහුගේ ගමන් ශ්‍රමදහ නිවා එලාඑල දෙවා, සැතපී හුන් කල්හි, කියන්නාහු "බමුණ, කුමක් සඳහා අයි දැ?"යි විචාළහ. බමුණු කියන්නේ "වෙස්සන්තර රජ්ජුරුවන් කරා ආමි"යි කී යැ. තපස්වී කියන්නාහු "රාජ්‍යය හැරැ තපස් කොට වල අවුත් හුන්නන් කරා වස්තු ඇත්තෙන් අයි දැ?"යි කීහ.

බමුණු කියන්නේ "තාපසයෙනි, වස්තු සඳහා ආයෙම් නො වෙමි. ඒ වෙසතුරුරජුන් බාලකලැ අකුරු කරවීමි. දැන් මා නො දක්නේ සත්මස යැ. බලාපියන සඳහා ආමි" කී යැ. මෙසේ කියා එහි ලගැ පහන් වූ කලැ තපස්වී තමන් බොරු නො දන්නෙන් මූ කී බස් සබා ද්දේ හො යි සිතා මහ පානාහු "බමුණ,[5] මෙසේ ගියකලැ දකුණත හසරින් ගොස් වංකපර්වතය ආසන්නට ගිය කලැ චතුරස්සර පොකුණෙක් ඇත. එවිල පස්පියුමෙන් සැදුනේ යැ. එපොකුණ සිසාරා අඹ දඹ කීන කුඹුකින් සජ්ජිත යැ. නිල්මහමේ නැගි කළුවලාකඩක් බබලන්නා වැන්න. ඒ ඒ තැන සුළඟින් පැහැරැ කඳු බැඳී තිබෙන මල් රැසැ. බමරුන් පියාපහරින් නිති වැගිරෙණ මල්මුවරඳ යැ. මල් කෙසරු කඩ පුරා කා මත් වැ කුල්නා කෙවිල්ලෝ ඇති. ඒ ඒ පර්වතශිඛරයෙහි ලියගී නහා

---

1. ගඳමහන් 2. පයැත 3. ස්වමීපයෙහි
4. පිළිස්වන්නේ 5. බමුණු

Non-Commercial Distribution

නටන ලියකිඳුරෝ ඇති. ඒ ඒ දෙළනැ ලියමඬුයෙහි රිසි සේ කෙළනා විද්‍යාධරයෝ යැ. බමුණ, රත්ගිරිකුළුමුදුනෙහි මුළු බැඳ නටන මොනරකැළ යැ. තොල් ලෙහි තොලු තබා ඔවුනොවුන් සනහසනහා යන නො එක් මුවරැළ යැ. බමුණ, ඒ දෙළනැ විලික්සැ[1] තිබෙන ඇත්දළ පමණ පක් ඇති කෙහෙල්කැන ය. මහදියකළ සා පක් ඇති කොස්වන යැ. විලික්සී හිස වැගිරෙණ මීඅඹකැනැ. පුවක්කඳ සා මහත් දඬුඇති උක්වනය යැ. බමුණ, තෝ මේ වනයට වැදැ තා කැමැති කැමැති එලාඵල අනුභව කෙරෙමින් සැතැපෙමින් වංකපර්වතය සමීපයට ගොස් පන්සලට වැදැ වෙස්සන්තර රජ්ජුරුවන් දකැ"යි කීහැ.

බමුණු ඒ අසා සතුටු වැ තුන්විටක් කොට සෘෂින් වැඳැ සමු ගෙණැ කී සලකුණෙන් ගොස් සතරැස් පොකුණ ද වනය ද දැකැ ඒ වනයෙහි එක් ගිරිගුහාවක්[2] දැක සිතන්නේ "මෙවේලෙහි වෙසතුරුරජ්ජුරුවන් හුන් තැනට ගියෙම් නම්, වනමුල් වනඵල ගෙණැ ඇර වේලාවට වළඳති. ස්ත්‍රීහු නම් දනවාරණයහ. දනට බාධා කරන්නාහුය"යි සිතා "මේ ගුහාවෙහි අද ලැගැ ගෙණැ සෙට උදසන මද්‍රිදේවීන් එලාඵල සොයා යා දී ගොස් දරුවන් දන් ගන්මී" සිතා ඒ ගුහායෙහි ලැගගත. එදවස් මැ මද්‍රිදේවීන් පාන් වන වේලෙහි නපුරු ස්වප්නයක් දැක භයපත් වැ හිඳ[3] "මේ මුළු පොළොවැ වෙස්සන්තරරජ්ජුරුවන් සමාන ස්වප්න දන්නාහු නැතැ"යි සිතා බොධිසත්‍වයන්ගේ පන්සල්මළුයෙහි පියවරසන් කොට සිටි කල්හි බොධිසත්‍වයෝ "දෙර සිටියෝ කවුරුදැ?"යි විචාළාහ.

මද්‍රිදේවි "ස්වාමීනි, මම යැ"යි කීහ."දේවීනි, නොවේලෙහි මා කරා තොප නො එන්ට වර ලද්දෙම්"යි කී ය. දේවී කියන්නාහු "ස්වාමීනි, අන්‍යතර[4] සිතෙකින් ආයෙම් නො වෙමි. මා දුටු ස්වප්නයක් කියන්නට ආමි" කීහ. බෝසතානෝ 'කියව'යි වදළහ. මද්‍රිදේවී කියන්නාහු "ස්වාමීනි, එක් කළුමිනිසෙක් එක්රතක් හැඳැගෙණැ රතක් කර ලා ගෙණැ දෙකණැ රත්මල් පැලැඳැගෙණැ කඩුවක් හිස සිසාරමින් මා කරා අවුත් මට නො එක් අඩුවැඩි බැණැ පියා මා හිස ජටාව අල්වා ගෙණැ ඇදැ බිම හෙළාගෙණැ මා හඬවහඬවා මා දැසත් උදුරා ගත් නම. ස්වාමීනි, මගේ දැතත් කපාගෙණැ හදවත උදුරා ගෙණැ ලේ පරහපරහා ඇර ගෙණැ ගියේ නමැ"යි කීහ.

බෝසතානෝ සීනය අසා සිතන්නාහු "මාගේ සත්මසක් පිරිහී ගිය දනපාරමිතාවෝ පරිපූර්ණ වෙතී" සතුටු වැ "දරුවන් දෙන්නා ගෙණැයන්නට වනයට බමුණෙක් ආ වනැ"යි සිතා බිසවුන්ට කියන්නාහු

1. විලික්සව 2. ගුහාවක් 3. භයානකව හිඳ සිතන්නේ
4. අන්‍ය

Non-Commercial Distribution

"දේවීනි, පෙර[1] මියුරුආහාර කා සුවයහන්හි හෝනා වූ තොපට දැන් වලැ එලාඵල වළඳ සුව යහන් නො ලදින් දඩුමැස්සෙහි හෝනෙන් පෙණෙන සිහිනය යැ"යි කියා සන්හිඳුවා බැණ යැවූදැ යැ.

පහන් වූ කල්හි මද්‍රිදේවී මළුව හැමැදැ දැහැටිපැන් තබා පන්සල් හැමැදැ මල් පුද දරුවන් දෙදෙනා කැඳවා මුහුණ තබා සිඹැ පියා "දරුවෙනි, මා රෑ දුටු ස්වප්නය නපුරැ. තලබිජුවක්[2] සා යහපතෙක් නැත. තොප පියානන් ඇළයෙන් බැහැරට නො යව. කෙළනාතැනැ බියපත් වව"යි දරුවන්ට ඔවා දී බෝසතානන් කරා ගොස් වැඳැ "ස්වාමීනි, මේ වනවලැ මට නැයෝ නම් සියෝ නම් නුඹ හා මාගේ දරුවෝ දෙබිහින්න මැ ය. ස්වාමීනි, මම වලට පලවැළ සොයා යෙමි. මා එන තෙක් නුඹගේ දරුවන් දෙදෙනා කෙරෙහි බියපත් වුව මැනැව. නුඹවහන්සේත් සිහි ඇති වැ වැඩැහුන මැනැව. ස්වාමීනි, මා යනබව මුත් මාගේ ළය නුඹ බව දැනැ වදළ මැනැවැ"යි කියා දරුවන් පාවාදී මල්කරුව හා පෙට්ටිය හා ඇරගෙණැ වනමුල් වනඵල සොයා යන්නාහු හඬමින් වලපමින් "මේ වලැ දෙවියෙනි, මාගේ දරුවන් කෙරෙහි බියපත්වව. මා කම්කිළියගේ එකළාකම් බලව"යි දෙවියන් යදිමින් ගියහ.

බොධිසත්වයෝ බිසොවුන් වලට යා දී සක්මන් මළු කෙළෙවරැ බමුණා එන පෙරමග බලබලා වැඩැහුන්හ. දරුවෝ දෙදෙන බොධිසත්වයන් පෙරට වැලි කෙළැ කෙළැ හුන්නාහ. ඉක්බිති බමුණු ද "මද්‍රිදේවීන් වනමුල්වනඵලයට මේ යන වේලා යැ. උන් වලැ සිට නො එනතුරු දරුවන් ගොස් ඉල්වා ගණිමි"යි සිතා පන්සලට ගියේ. බොධිසත්වයන් බමුණා එන්නාහු දුර දී මැ දැකැ "සත්මසක් අප නුදුන් දනපාරමිතාවන් ඇති කරන්නට එන කල්‍යාණමිත්‍රයෙකැ. සුලුවනය තිස්යොදනක් මහවනය තිස්යොදනක් තැන් තිකම් නො එයි. දරුවන් ඉල්ලා එන වනැ"යි සතුටු වූ නියාව දරුවන් කෙරෙහි කළ ප්‍රෙමයට වඩා සිටියේ යැ. බෝසතානෝ ලොකු කුමාරයන් කැඳවා කියන්නාහු "පෙරැ මහට ගොස් බමුණා අතැ කෙඬිපිරිකර ගෙණැ කැඳවා ගෙණැ එ"යි යැවූහ. ජාලියකුමාරයෝ සතුටු වැ ගොස් කෙඬිපිරිකරට අත දික් කළහ.

බමුණු සිතන්නේ "වෙස්සන්තරයන් මට දන් දෙන දරුවෝ මූ යැ"යි සිතා දැන් මා මොළොක් වුව හොත්, මතු මට මෙහෙ නො කෙරෙති සිතා "දැන් මැ මුන් භය ගන්වා උරණ වුව මැනැවැ"යි සිතා කුමාරයන්ට උරණ වී යැ. ජාලියකුමාරයෝ භය ගෙණැ පලා අවුත්

1. පෙර තොප　　2. තලබින්දුවක්

Non-Commercial Distribution

බොධිසත්ත්වයන් කරා වන්හ. උන් පසු පස්සේ බමුණු දුව අවුත් බොධිසත්ත්වයන් දැකැ ස්තුති කොට සිටැ කියන්නේ "ශ්‍රීමත්නි[1], තොප ශරීරයට කරුණු නැද්ද? මැසි මදුරුවන් විසින් ව්‍යාඝ්‍රසිංහයන් විසින් යක්‍ෂප්‍රෙතයන් විසින් දුක් නැද්ද? වනමුල් වනඵල ලැබේද? තපසට අන්තරාය නැද්ද? දනට බාධා නැද්ද දැ"යි කී යැ. ඒ අසා බොධිසත්ත්වයෝ කියන්නාහු "තා කී මෙතෙක් දෙයින් මැ දුක් නැත. තපසට අන්තරාය නැත. දනට බාධා නැත. පින්වත, තාගේ ගමන් ශ්‍රමදහ නිවා තිලින්-අඹදඹඑල්කෙහෙල් කටුඑරම්ණිය මීයේ රස වන්නැ. -ඒ ඵලාඵල කා පැන් බී සැතපී හිඳුව"යි වදළහ.

බමුණා ද එසේ හෙයින් මැ කා බී සැතපී හුන් කල්හි බෝසතාණෝ කියන්නාහු "තා ආ කාරිය කිමෙක්දැ"යි පුළුවුත්හ. බමුණු කියන්නේ "මහාපුරුෂය, සතර මහාගංගායෙහි පැන් යම් කෙනෙක් බොද් ද, ඒ පැන් උණු නොවන්නා සේ, සියලු යාචකයන්ගේ සිත් මනදෙළ පුරණ උත්තමය, අනික් වැඩ කටයුත්තකට ආයෙම් නො වෙමි. තොපගේ දරුවන් දෙදෙනා මතු ඉල්ලා ආමි" කී යැ. මෙ කපැ බුදු වන්නා වූ මුළුලොවට වැඩක්මැ සිතන්නා වූ ඒ මහතානන්වහන්සේ බමුණා කී බස් අසා දෙදරුවන් මුහුණ හා බමුණා මුහුණ හා බලාපියා වලට ගිය බිසවුන් සිහි කොට ලා සිත උපන් දළසෝගිනි "බමුණාට දන්දෙමි" යන සිත් නමැති විලැ ධාරාභිෂෙකජලයෙන් නිවා වදරා දන් දීමෙහි මැ එක්සිත් වූ සේක.

එසේ නො සිතුව හොත් බෝමඩ පිට දී වජ්‍රාසනයෙහි වැඩැ හිඳැ මරසෙනඟ ප්‍රලය කොට කෙසේ නම් බුදු වන සේක් ද? මෙම සසර අවුලෙහි බැඳුනු සත්ත්වයෝ කා මුහුණ බලත් ද? මෙ මැ සත්ත්වයා නිවන්පුරයට ගෙණැ යන්නෝ[2] කවුරු ද? එද දරුවන් දන් දීමෙහි පසු බට හොත් බුදු වූ ඒ මහතානන් කරා මෙහෙයූ නාලාගිරි නම් පරුෂ ඇත් ශ්‍රීපාදය කුමට වැඳැගෙණැ හොවී ද? තව ද, සොර වූ මරහු වැනිවූ ආලවක නම් යක්‍ෂයා මන් බිඳ[3] කුමට ශ්‍රීපාදය පුදු ද? එද දන් දීමෙහි මසුරු වුව, මිනීමරු වූ අංගුලිමාලයා දැන් තමන් සස්නෙහි කුමට කුලගැති වේ ද? එද 'දරුවන් නො දෙමි' සිතුව දැන් දෙවදත්තයා හිසට පෙරළු ගල් එත නො දී පොළොවින් ගල් දෙකෙක් නැඟී කුමට පිළිගනී ද? තව ද, මහමෙර සත්දරණපටෙකින් වෙළා ගෙණැ තමන්වහන්සේට කිපී විෂතෙජසින් දිලියෙන්නා වූ නන්දොපනන්දයා දැන් කෙසේ නම් හික්මවනසේක් ද? එද දරුවන් සිනෙහැති වැ බමුණාට දන් නොදෙමි කිව හොත්, බ්‍රහ්මතෙජසින් දිලියෙන්නා වූ සහම්පති මහාබ්‍රහ්මයා

1. ශ්‍රීවන්තය 2. යන්නේය 3. බිඳී

Non-Commercial Distribution

දැන් ඒ ස්වාමිදරුවන්ගේ සිරසට තමන්ගේ ධවලච ඡත්‍රය ධරා කුමට සරස්මේතැන්හි[1] සිටී ද? එද දරුවන් දන් නො දෙමියි එ දරුණු බමුණා යැව්ව හොත් දෙදෙව්ලොවැ දෙවියන්ට අධිපති වූ ශක්‍රදෙවෙන්‍ද්‍රයා දැන් තමාගේ එක්සියවිසිරියන් ජයතුරාසක්රුවන තමා තුඩ පොපියන්නේ[2] පිඹී ද? එද 'ඒ ලඳබොලඳ දරුවන් නො දෙමී' සිතුව, දැන් පස්වාදහසක් මුළුල්ලෙහි නිවන්පුරයෙහි දෙර ඇරැ තබා තමන් පිරිනිවීය ද, ශ්‍රීශරීරයෙන් දඟිය ඇට ද, වැළැඳූ පාත්‍රය ද, තමන් වදළ දහම් ද, වැඳැ පිදූ සියලු මිනිස් දෙව් බඹුන් කෙසේ නම් නිවන්හි පිහිටුවන සේක් ද?

මෙසේ එ බමුණු දරුවන් ඉල්වා ආම් කී බස් අසා බෝසතානෝ තමන්ට රාජ්‍යයෙන් වොටුනු පලඳුවයි කී බසක් සෙයින් සතුටු වැ කියන්නාහු "බමුණ, තෝ මට පරලොවින් අමුත්තෙහි. තා සේ මට මිත්‍රයෝ නැත. සෙසු යාචකයෝ ඉල්වත් නම්, ඇතකු හෝ ඉල්වති. අසකු හෝ ඉල්වති. රන්රුවන් හෝ ඉල්වති. මෙවෙනි මහවලෙකැ අවුත් අනිකක් නො ඉල්වා අපගේ දරුවන් ඉල්වූබව ඉතා යහපතැ. ඒට මරුවැලක් සිහිනෙනුත් නො කියම්හ. දරුවන් වන්නා තට සමසිතින් පාවා දෙම්හ. බල එකක් කියමි: බමුණ, මේ ලඳ බොලඳ කුමාරයෝ කිසි දුකක් නොදුටුවිරුහ. දැන් මැ දරුවන් දෙබිහින්නන් ගෙණැ ගියෙහි නම්, මේ දරුබිලිඳු සාවිඩා වෙති. එසේ හෙයින් බිසොවුන් වල් ගොසින් අවුදින් දරුවන් දෙදෙනා නහවා මල් පලඳවා වනමුල්වනඑල කවා දරුවන් ඇදවැලඳැ සිපැගෙණැ ලඳබොලඳ සුරතල් බස් අස අසා ඇය ලය නිවී සැනසුනු කලැ, අද රැ ලැගැ පහන් වූ කලැ, දරුවන් දෙදෙනා ගෙණැ යව. තව ද මේ දරුවන්ගේ එකළා මෑණියෝ දරුවන් අපට පාවාදීලා වලට ගියෝ යැ. එලාඑල ගෙණැ අවුදින් දරුවන් දෙදෙනා නුදුටුවෝ නම්, උන් ළය පැළී යෙති සිතමි. මාගේ ඉෂ්ටමිත්‍ර වූ බමුණ, තට ගැතිවන මේ දරුවෝ දෙදෙන ඉතා මැ සියුමැලි රජකුමරුවෝ යැ. ගැති මෙහෙයෙහි නො හසළ විරුහ. තඳින් මොළොකින් මෙහෙ උගන්වා ගෙණැ ගැති මෙහෙකම් ගෙණැ අද මෙවෙලාවට හැම්මේ"යි වදළහ.

එබස් ඇසූ බමුණු තෙම රජ්පුරුවෙනි, ස්ත්‍රීහු නම් දනයට බාධා කරණ සුල්ලහ. ශුභකර්මාන්ත නො දනිති. මම මී ලගිනට නො පොහොසත්මි. දරුවන් දෙව් නම්, මට කල් නො යවා දෙව.[3] නො දෙව් නම්, මම ආ සේ නැඟී යෙමි. තෙල තන්වැසිකම්, හිමි, තෙපි කෙසේ උගතුදැයි බිණී යැ.

බෝසතානෝ එබස් අසා "බමුණ, දරුවන් දෙමියි කියාලා නැවැත නො දෙමි යි බොරුවක් නො කියමි. දනට පසුබස්නා එකෙකිම් නො

1. තැන් 2. පොපියන්නෝය 3. දෙවව

Non-Commercial Distribution

වෙමි. බිසොවුන් එනතුරු නො හැම්මෙයි නම්, මේ සියුමැලි දරුවන් මහ නළවනළවා සතප්වමින් අස්වසමින් කැඳවාගෙණැ දරුවන්ගේ මුතුන් මිත්තන්ගේ රටට ගෙණැ ගොස් සඳමහරජානන්ට මෙපවත් කී කලැ මපියානන්වහන්සේ අප කෙරෙහි කළ ස්නේහයෙන් මුනුබුරන් දුටු සතුටෙන් ඔවුන් මිහිරිබස් අසමින් තට කෙලිකොල්ලන් හා බොහෝ වස්තු දෙති'' කීහ. බමුණු එබස් අසා ඉස සලමින් "යහපතැ, මා දිවිගන්නට සිතු නියා හිම්, තෙපි මේ උපාය කොයින් උගතු ද? මුනුබුරන් දුටු සඳමහරජ්පුරුවෝ මට කියැටියක් කෙරෙති. බමුණ, තෝ අප දරුවන් ගැති කොට ගෙණෙයි[1]දැ? යි කියමින් මා කන්නාසා කපා මදිවී ගණිති. වහල් තබා තමා දිවි රැක ගණුත් යහපතැ. දරුවන් දෙවු නම්, දෙව. නො දෙව් නම්, නො දෙව. තෙල බස් අප රකුත් හොත්, නො කියව''යි කී ය.[2]

දරුවෝ දෙදෙන[3] බමුණා කියන බස් ද පියරජු හිඳැ 'ගැති කොට දෙම්'යි කියන බස් ද අසමින් භයපත් වැ සිටැ ගත නො හී, දිවියා දැකැ මරණභයින් දිවන මුවපැටවුන් දෙදෙනෙකු සේ, ඉගිලෙමින් 'බමුණා ලුහුබැඳැ එතී' පසු බලමින් දිවන්නාහු පන්සල්පිටිපසට වැදැ, භයින් එතැනැ ද සිටැ ගත නො හී, වන ලැහැබකට වැදැ සැඟවුනාහ. බැලුබැලූ දිශාවෙන් බමුණා දිවෙන්නා සේ පෙණෙන්නෙන් එතැන ද භයින් සිටැ ගත නො හී, "අනේ, නහඬ[4] කුම් කරමෝදැ?''යි කියමින් වෙවුලමින් හඬා ගෙණැ දිවන්නාහු සතරැස්පොකුණට වැදැ 'ඈපි ඔවුනොවුන් නො පාම්හ'යි දෙදෙන බැණැ ගෙණැ උනුන් අත එළී ගෙණැ පොකුණෙහි කර පමණක් දියට බැසැ නෙළුම්පත් හිස ලා ගෙණැ සැඟැවී සිටැ කන් දී සොල්මන් අසඅසා, "අද අමඩි 'දුටු සිහින නපුරැ'යි කිවු යැ. බැහැරට නො යන්ට කිවු යැ. බිය පත් වවයි කියා පියානන්ට[5] අප බලන්නට පාවා දී ගියෝ යැ. අමඩ, අප හා සිහි කරව. අමඩි අප වැලි කෙළිතී සිතද් දෝ හෝ! මෙවෙනි දුකක් වූබව නො දනිද් දෝ හෝ! අප හා පුරුදු දෙවියනි, තෙපි දිවැ ගොස් අප දෙදෙනා රැකැ අමඩින්ට කියා වහා ඇරැගෙණැ එව. ඈපි උන් දැකැ පියා පාවිට හී හඬාපියා උන්දැ කීවක් කරම්හ''යි මෙසේ බැගෑපත් හඬින් හඬා වෙවුලමින් කර පමණක් දියෙහි සැඟැවී සිටියහ.

බොධිසත්වයෝ දරුවන් සැඟවුනු බව නො දැනැ බමුණාට දන් දෙන්නට යැයි දරුවන් කැඳවූහ. දරුවන් නොබිණු හෙයින් බමුණු සිට

---

1. ගෙණායි 2. කියා 3.දෙදෙනෙකුසේ ඉගිලෙමින්
4. නහාය 5. අමඩින්ට

Non-Commercial Distribution

කියන්නේ "විශ්වන්තරයෙනි, තොප සේ වූ බොරුවෝ මෙමුළුරටැ නැත. තෙපි හිඟි ලාලා දරුවන් සඟවාපියා නොදත් වැනි වැ හිඳැ දරුවන් කැඳවවු ද? මෙසේ තන්වැසිදත් දෙන තොප සේ වූ කෙනෙකුන් නුදුටු විරීමි"යි බිණී යැ. ඉක්බිති බොධිසත්‍වයෝ "බොරු කීහ" යන බසට ලජ්ජා වැ හිඳැ කියන්නාහු "බමුණ, මා දන්සොඬ හෙයින් දැඩි වන්නා, මැණියන්දැ[1] නැතිවන්නා, තාගේ රළුකම් සිතා හයපත් වැ පැලැ[2] වන්හ. තෝ මඳක් හැම්මෙයි" කියමින් නැඟී සිටැ පන්සල්පිටිපසට ගොස් වල්ලැහැබට වැදැ එහි නො දැක, දරුවන්ගේ පියලකුණින්[3] ගොස් පොකුණට ගියබව දැනැ, මේ කප බුදු වැ මුළු ලොවට ශාන්ති එළවන එ මහතානෝ ලය වහවා ගෙණැ හඬ ගසන්නාහු "මපුතනුවෙනි, ජාලියකුමාරයෙනි" හඬ ලූහ. බුදු වන ජාතියෙහි රහල් කුමරු වන මහපිණැති වූ එ රජ කුමර තෙම පියානන් හඬ ගැ එක එ හඬ අසමින් මැ "බමුණු මදිවි ගණීවයි. මා ගැති කෙරේවයි. මපියානන් වහන්සේ ලූ හඬ අසඅසා නො සිටිමි"යි සිතා "එම්, අපච්වැ"යි කියමින් දෙඅතින් නෙළුඹුපත් පිහිරා ගෙණැ පොකුණෙන් නැඟී අවුදු පියානන් දකුණුපය වැලැඳැ ගෙණැ හඬන්නට වන්හ. බොධිසත්‍වයෝ පුතනුවන්ගේ හඬ අසා[4] ල කම්පා වැ නැවැතැ සිත් සන්හිඳුවාගෙණැ කියන්නාහු "පුත, තොපගේ නැහනියෝ කොයි දැ?"යි විචාළහ. ජාලිය කුමාරයෝ පළමු මැ "නො කියම්හ"යි දෙන්නා බැණගත් හෙයින් "මපියානන්වහන්ස, මරහයින් පලන මෘගජාතීහු උනුන්ට කියාලා පලද් ද? අපට ද වූ දැ එබන්දක් මැ යැ"යි කීහ.

බොධිසත්‍වයෝ එ අසා "මාගේ දියනියෙනි, කෘෂ්ණජිනාවෙනි" හඬ ලූහ. මතු බුදු වූ කලැ තමන් සස්නෙහි "උපුල්වන් මහාථෙරී යැ"යි ප්‍රසිද්ධ වන ඒ මහපිණැති දියනියෝ පියානන් හඬ ලූ හඬ අසා "බමුණා මා දිවි ගණීවයි. මපියානන්වහන්සේ ලූ හඬ අසා සිටිම් දැ"යි හිස ලූ නෙළුම්පත් හැරැපියා දෙව්දුවක නැංගාක් මෙන් අවුදු බොධිසත්‍වයන් වම්පය වැලැඳැ ගෙණැ හඬන්නට වන්හ.

දරුවන් දෙදෙනා හඬා වගුළ කඳුළු බොධිසත්‍වයන්ගේ නෙළුම් පියුම් වැනි දෙපත්ලේ වැගිරෙයි. බෝසතානන් දරුවන්ගේ දුක් බලා හඬන්නා වූ කඳුළු රන්පිටාටු වැනි දරුවන් පිට වැගිරෙයි. මෙසේ හඬා වැලැපැ සිතන්නාහු "මා හැඬූ සෙයින් බුදුබව නො සැධෙයි. දරුවන් දන් දෙමි"යි සිතා හඬමින් හොත් දෙදරුවන් වඩා ලෙහි හොවාගෙණැ සිඹැ සනහාපියා "මනහර වූ මාගේ දරුවෙනි, මා දන්සොඬබව නො දනු ද? මේ සංසාර නැමැති සාගරයට තොප පසුරක් කොට ගෙණැ

1. මැතියන්ගේ　　2. පලා　　3. පියෙන් පියෙන්　　4. දැක

Non-Commercial Distribution

ගොඩ දක්මි. මම ගොඩ දැකැ තොප ඇතුළු වූ සියලු දෙව්බඹම්නිසුන් ගොඩ දක්වම්"යි කියා, දෙදෙනා වටනා මිල නියම කොට ලා, පන්සලට කැඳවා ගෙණැ අවුත් කෙණ්ඩිකායෙන් බමුණා අතැ පැන් එවැ[1] "සිත්කලු වූ මේ දරුවන් දන් දුන් පිණින් ලොවුතුරා සම්මා සම්බොධියට පැමිණෙම්ව"යි කියා දරුවන් අත් බමුණා අත පිටැ තබා දන් දුන්හ.

මෙසේ දරුවන් දන් දෙත් මැ, ල කකියවා හඩන පක්ෂපාත මිඩියක සේ, මහපොළොව හඬන්නට වන. මෙරුමන්දරාදි පර්වතයෝද, දරුවන් දුන් ශොකයෙන් හඬා වැනෙන්නා සේ, සැලෙන්නට වන්හ. දෙවියෝ සතුටු වැ මල්වැසි වස්වමින් සාධුකාර දෙන්නට වන්හ.

මෙසේ දරුවන් දන් ගෙණැ නික්මැ යමින් සිටි බමුණු සෙලෙකින් බස්නේ පැකිලැ මුණින් වැටී හින. බමුණා නැඟී නො සිටිනා තෙක් දරුවෝ දෙදෙන දිවැ ගෙණැ අවුත් පන්සලට වැදැ බොධිසත්වයන් දෙපත්ලෙහි වැටී හී හඬහඬා කියන්නාහු "ස්වාමීනි, අම්මා නපුරු සිහින දැකැ නුඹවහන්සේට අප පාවා දී එකළා වැ වල් යන්නවුන් කී බසට නුඹ මැ දෙස් නොවේ ද? අපැච්ච, දැන් එ සිහි නැද් ද? අප නුදුටු අමඩින්ගේ ළ කෙසේ නම් තිබී යේ ද? අමඩින් ආ කලැ උන් වැදැ ගෙණැ හඬා පියා අපගේ දුක් පැපියන තුරු අප රැක ගන්න. නුඹ හැර පියා කොයි ගොස් හැලී යමෝ ද? මඳක් හැම්මෙන්නට දන්වම්. මේ අවලක්ෂණ බමුණාට අප නො දී අනිකක්හට දෙන්නේ. ඌ හිසකේ තඹවණැ. ඇස් පිහැ. වමරැසි යැ.[2] බුන්නාසා යැ. කන් රොඹු යැ. පිටින් වකැ. බඩින් උසැ. බඩ මහතැ. පා බකල යැ නිය පිරිති යැ. මෙසේ අවලක්ෂණ වූ යකුට අප නො දෙන්නේ. නො වැළැකැ දන් දෙන බැවින් මා දෙන්නේ. මා නැගැතියෝ ඉතා සියුමැලියෝ යැ. තමන් මොළකැටි සෙයින් මිඩි මෙහෙ නො කට[3] හෙති. මා නහට වැඩිමාලු විසින් මම දුක් ගතහෙමි. උන් කරණ මෙහෙ ද මම් මැ කෙරෙමි. කෘෂ්ණජිනාව මිඩි වූ කලැ සිවිමහරජවංසයට පරිභව යැ. ම නඟුන් රැක මැ ඌට ගැති කොට දුන මැනැවැ. අමඩින්ට මා දුන් බව කියා මා නැහනියන් පැලා බැණැ අස්වසා අමඩින් රැක පියන්නැ"යි[4] කියා හැඬූහ. බොධිසත්වයෝ මෙතෙක් දැ කියතුත් නො බැණැ මැ හුන්නාහ.

ජාලියකුමාරයෝ කියන්නාහු "මපියානන්වහන්ස, මා මෙතෙක් දැ කියතුත් නොබණනදැ යැ. නුඹවහන්සේ ළය ගල කෙළේද? යපතෙකින් මැසූයේ ද? මේ කුමන නම් දැඩිකමෙක් ද්‍ෙ හෝ නුඹ මියෙන් නො බැණැ හිඳිනට කුමන වරදක් කෙළෙම් දැ"යි කියා හැඬූහ.[5] මෙසේ

1. හෙව 2. සියමමරැසිය 3. නොකොට 4. රැකපියම්හයි
5. කියා

Non-Commercial Distribution

හඩමින් සිටිතැනට නිෂ්කරුණ වූ[1] එබමුණු රෞද්‍ර තමා හුනු තැනින් සෙමෙන් නැඟී සිටැ, දෙදණ වැලි පිසැ පිසැ ලේ හුනු තැන් බලමින් දෙවැළමිට නලළ ලේ පිසමින් පිටිතොල් කමින්, වැලක් දතින් කඩා හිපලක් හැරැ ගෙණැ යමයකු සේ අවුත් වැදැ ගියේ. දරුවෝ ඌ දැකැ භයපත් වැ වෙවුලන්නට වන්හ. මෙසේ සිටි දරුවන් හසු කරණ කලැ ජාලියකුමාරයන් ගත දී නැහැනියෝ අසු නො වෙති. නැහැනියන් හසු වුව, ජාලියකුමාරයෝ හසු නොවෙති, හසු කොට ගත නො හී රැහැණි ව බොධිසත්ත්වයන් බලබලා හින්ද දී දෙබිහින්නන් හසු කොට ගෙණැ වැලෙකින් බඳින්නේ කුමාරයන් දකුණත හා එ ලඳ කුමරිය වමත හා දැත එක් කොට බැඳැ ගෙණැ හිපලින් මරමරා කර අල්වා දමමින් යමපල්ලකු සේ ගෙණැ යන්නට වන. නැහැනියන් පිටැ හිපල ගැසුව බැනෝ තමන් ලවා ගණිති.

රාහු විසින් ගිලුව ද නො වැළැකැ යන හිරසඳ සෙයින් යෙමින් යෙමින් සිට දරුවන් පෙරැළී පියානන් බලමින් පියුම් පෙති වැනි අත්සුහින් වඳිමින් “අප පිටින් වැගිරෙණ ලෙහෙ බලන්නේ. අතැ බැඳි තැනැ හළු බලන්නේ. මියෙන් නො බැණැ හිඳිනේ මෙ යකු අප මරා කා පියන තුරු ද? අමඩින්ට අප වැදැ සමු ගත්බව කියන්න. අප සුවපත් බව ද නැවැතැ දැක්මක් නොවනබව ද කියන්නැ”යි මෙසේ කියා හඩමින් යෙමින් සිටි සඳැ බොධිසත්ත්වයෝ දරුවන් දෙදෙනාගේ දුක් බලා ල කකියවා “අනේ බමුණකු ල දැඩිනියා යැ. මා ඇස්හමුවෙහි මෙ සේ දැඩි වැ මරන්නේ ඔබ්බෙහි කුමක් නම් නො කෙරේ ද? එනකලැ අප දෙදෙනා ඔරින් ආ දරුවෝ දැන් කටු බොරලුයෙ කෙසේ නම් යෙත් දෝ හෝ? සයින් විඩා වූ දරුවන් කවුරු නහවා කිරි පොවද් දෝ හෝ? පතුල් ඉදිමුනු දරුවන් කවුරු සතපා වඩා ගණිද් දෝ හෝ? සුළංහැල් කා වෙවුලන දරුවන් කවුරු සනහා නළවා ලද් දෝ හෝ? මෑනියන් තන මැදැ සැතැපුනු දරුවෝ අද රැ කොතැනෙකැ හෙවැ නිදත් දෝ හෝ? දරුසනායෙන් ම පාවිටැ හී හඩා පෙරළෙන බිසවුන් කෙසේ නම් කියා අස්වසම් දෝ හෝ”යි මෙසේ මහත් වූ ශොකයෙන් සිතන්නාහු “බමුණා බැඳැ හොවා පියා[2] දරුවන් ගෙණව[3] මැනැවැ”යි සිතා නැවැතැ සිතන්නාහු “මනා කොට දත් දී තපස් කරන්නාහු සිත් කළකිරුවද් ද? පෙරැ බුදු වූ උත්තමයෝ ද පළමු කොට දසපැරුම, දසඋපපැරුමැ, දස පරමත්පැරුම යන සමතිස් පැරුම් පුරා පඤ්චමහාපරිත්‍යාග කොට බුදු වූහ. මම ද එසේ මැ බුදු වෙමි”යි මහත් වූ ප්‍රඥ උපයා “මා සිතු සේ ඉතා නපුරැ. බුදුබවට හෙතු වූ

1. නිෂ්කරුණා වූ　　2. බමුණායවාපියා　　3. ගෙණෙව

Non-Commercial Distribution

පාරමිතා නැමැති සාගරය පිහිනා ගොඩ දක්නා සඳහා පොකුණෙකැ දියෙහි ගැලුනු සෙයින් මා සිත් වියවුල් කෙරෙමිදැ?''යි සිතා එයින් දුරු කොට "මුළුලොව සතකුට නො පිළිවන් වූ මීනියා දරුවන් දන් දින්මි. එකාන්තයෙන් මේ දනය බුදුබවට හෙතු වේව''යි සිතසිතා සතුටු වැ ගස්සෙවනෙකැ වඩැ හුන්හ.

දරුවන් දෙදෙනා[1] යෙමින් සිටැ තමන් කෙළැ ඇවිදි වෘක්ෂසෙවනලු බලා කෙළිවලන් බලා ගල්ගුහා බලා මැටියෙන් ඇඹූ ඇතුන් අසුන් රථ ගොන් පෙතැල්ලන් ගිරවුන් වනමෘගයන් සතරැස් පොකුණු දැක "මනහර වූ මල් පිපෙන වෘක්ෂයෙනි, තොප හා පුරුදු වැ තොප මුල්හි වැලි කෙළැ අදින් වියෝ වූ දෙබිහින්න තොප වැඳැ සමු ගණුම්හ. පැහැයෙනුදුල වැලිතලාවෙනි, අප දිය මනහර ගඟුල්හැල්ලෙනි, තොප අතින් සමු ගෙණැ ගැතිමෙහෙයට යම්හ. මිහිරිහඬ නඟන පුරවිකෙවිල්ලෙනි, අත්තල ගසා අප ඉදිරියෙහි නටා බස්නා ලියකින්නරාවෙනි, අපගේ අමඩින්ට අප දෙන්නා වැඳැ සමු ගත්බව කියව අනේ! වනදෙවියෙනි, අප හා පුරුද්දෙනි, අමඩින්ට අප අතුල් පතුල් ඉදිමැ නො යා හෙන බව කියව. අප විඳිනා සුව කියා අමඩින් එතොත් වහා මෙ මහ හොස්සේ හඬා දිවන්නට කියව''යි මෙසේ හඬමින් වැලැපෙමින් "කැටු වැ කෙළනා වන මෘගයෙනි, කෙළිවලඳිනි, සතරැස් පොකුණෙනි, අදින් තොප කෙරෙන් වියෝ වූම්හ''යි කියා සමු දෙමින් යෙමින් සිටි සඳැ, අකුරුබොරලු මිශ්‍ර වූ මහැ ගොස් දරුවන් මිරිකුනු සේ බලා මහැ දෙපාර්ශවයෙහි පිහිගත් වෘක්ෂ වලප්නා වැනි යැ. වනවෘක්ෂයෙහි බමරරව, පිපෙන මල්මුව විවෘත කොට, මද්‍රිදේවීන් දරුවන් ගියබව කියන්නා වැන්න. එවනයෙහි පක්ෂි මෘගයෝ දෙබිහින්නන් කෙරෙන් වියෝ වූ ශොකයෙන් මහහඬින් හැඬූහ.

ඉක්බිති වලට ගිය මද්‍රිදේවි සිතන්නාහු "රෑ මම නපුරු ස්වප්න දිටිමි. මා දරුවෝ වහන්සේ කෙරෙන් පන්සලින් පිට වූ දෝ හෝ?''යි ල කකියවමින් වනඵල ගෙණෙන සඳ "අතැ යහුල වැටී හෙයි. පෙට්ටිය වැටී හෙයි. දෙහෙතිල්ල[2] වැටී හෙයි. දකුණැස මස් සැලින. මා දෙපය වෙවුලයි. හෘදය කකියයි. එන කලැ සුහුණු වැළැකී යැ. මේ පර්වතයේ දෙවතාවෙනි, මට කිමෙක් වේ දෝ හෝ? මෙවෙනි නපුරු සිහින පැණෙන්නේ කිමෙක් දෝ හෝ?''යි සිතමින් පන්සලට එමින් සිටියාහ. එ සඳැ ශක්‍රදෙවෙන්ද්‍ර දිව්‍යපුත්‍රයන් දෙදෙනෙකුන් කැඳවා කියන්නේ "බෝධිසත්වයෝ දරුවන් දන් දෙමින් සිටියහ. එතැනට බිසවු ගියෝ නම් නපුරැ. තෙපි ගොස් සිංහ ව්‍යාඝ්‍ර වලස්වෙස් මවා ගෙණැ මහ

1. දරුවෝ දෙදෙන 2. දැවටිල්ල

Non-Commercial Distribution

අවුරා වැදහොව"යි සම්මත කෙළේ. දෙවියෝ එසේ මැ වෙස් මවා ගෙණැ මහ අවුරා වැදහොත්හ. බිසවු එන්නාහු මහැ හොත් භයංකර රූ දැකැ කියන්නාහු "මම යම් දවසෙකැ මේ මහැ එන කලැ මෙසේ වූ සතුන් නුදුටුවිරිමි. මම දක්නේ මුවන් මොනරුන් වැලිකුකුළන්[1] වඳුරන් ඈ සතුන් මුත්, මෙසේ වූ සත්කෙනෙකුන් නුදුටුවිරිමි. මේ වනෙහි වෘක්ෂදෙවතාවෙනි, පර්වතශිඛරයෙහි දෙවියෙනි, මොවුන් යවව. රාමයන්ට සීතාවන් සේ මාගේ ස්වාමීන්ට පතිව්‍රතා වීම් නම්, වහන්ස, කුඩාවරිනි, මහින් ඇළ වැ යව"යි මහත් කොට හඬා ද නොයන හෙයින්, අතික් යන මහක් නැත්තෙන් "පෙරමහට දරුවෝ අවු නම්, නපුරැ. මම මේ මහැ හොත් සතුන් විසින් නො යා හෙමි"යි ල කකියවා "තුමූ මැ නැඟී යෙත් දෝ හෝ?" යි සිතා සිට කියන්නාහු "දරුවෙනි, තොප මැ නැසිය කොට වනාන්තර ආ විශ්වන්තර රජ්ජුරුවන් අඹු වෙමි. තොපගේ මවුමි. තොප මුත් මාගේ නෑයෝ නැත. මා නුදුටු දරුවෝ නො හැම්මෙති. රෑ නොවනතුරු මා නැඟී යා දෙව"යි කීහ.

එසේ කීව ද නොයන හෙයින් වැලැපැ මහත් කොට හඬා අත්පොළසන් දී "තොපට කුමන වරදක් කෙළෙමි ද? මහ දෙව"යි කීහ. පතිව්‍රතාවන් එසේ කියත්මැ මෘගජාතීහු භය ඇති වැ නිද පුබුද්දන් සේ පිටට හැඹී හිර බටබව දැන නො පැණී නැඟී ගියහ.

ඉක්බිති මද්‍රිදේවී වනමුල් වනඵල ගෙණෙමින් "මා දරුවන් මහ මෙතැනැ දකිම් දෝ හෝ? මෙ තැනැ දකිම් දෝ හෝ?"යි සිතසිතා මහැ නො දැකැ ඔබ්බට ගොස් මා දරුවන්ට කිමෙක් වී දෝ හෝ?යි කියමින් "මිහිරිබස් මා කණැ නො හෙයි. ලසඳක් වැනි මුහුණ නුදුටුයෙමි. පෙර කෙළනා වූ වෘක්ෂ මූලයන්හි නො දක්මි. ජාලියකුමාරයෝ පෙර මහට අවුදු "අම්ම, පකාපැකි ඇත් ද? නැද්ද?"යි හිණ බලති. කෘෂ්ණජිනාවෝ අවුදු තනය ගණිති. මේ නුගරුක වැලි කැටි කොට කෙළනා තැනැ"යි හඬමින් ගොස් පන්සලට වැදැ තෙනෙහි කිරි ඉස්මින්[2] සියලඟ වෙවුල්වමින් මුව වියළී ල කකියවා "වහන්සේ කෙරේ නැත් නු? කොතැනැ නිදි ගැන්නුදැ දෝ හෝ! යම් රුක්මුලෙකැ හෙවැ නිදද් දෝ හෝ! ඇත්ගිජුලිහිණියෝ ගෙණැ ගියෝ දෝ හෝ! මුතුන් මිත්තන්ගේ රටින් අවුදු ගෙණැ ගියෝ දෝ හෝ! යක්බූ ප්‍රෙතයෝ ගෙණැ ගියෝ දෝ හෝ! ළඳ බොලඳ මියුරු බස් කවරවිටෙකැ අස්වත් දේ[3] හෝ! බොලඳ සිනාවක් හා ඇසියැ හෙම් දෝ හෝ? 'ඇපැච්ච, අමඬැ'යි යන බසක් හා ඇසියැ හෙම් දෝ හෝ! ලසඳක් වැනි මුහුණක් දැකැ පියැ හෙම් දෝ හෝ"යි කියා හඬා වැලැපැ

1. ගන්නි　　2. රැස්මින්　　3. අසත්

Non-Commercial Distribution

බොධිසත්ත්වයන් විචාරන්නාහු "ස්වාමීනි, දරුවන් හිඟන්නන්ට දන් දුන් දැ?"යි විචාළහ.

බෝසතානන් මියෙන් නො බැණ හිඳිනෙන් කියන්නාහු "වහන්ස, මා දරුවන් නො දක්නා ශොක තබා තුඹවහන්සේ නො බණනා ශොක මැ මට ඉතා බෙහෙවැ"යි හැඬූහ. මෙසේ හඬතුදු එක බසකුත් නො කියා වැඩැහුන්හ. ඉක්බිති බිසවු කියන්නාහු "වහන්ස, පෙරෆ ගිනිදරපැන් ඇති කොට හිඳිනාදැ යැ. අද මියෙන් නො බැණැ මැ හුන්දැ යැ. මා එන තුරු දරුවන් රකිමියි මට වර දුන්දැ වේ ද? දරුසනායෙන්[1] මා හඬා විචාරතුදු නො බැණැ මැ වැඩැ හිඳිනාදැ නු? මා දරුවන් කැඳවා එලාඑල වැළඳුව මැනව. නුඹ නො බණනදැ නම් නුඹ කෙරෙන් මාගේ ප්‍රාණය දුරු කෙරෙමි"යි කීහ.

එසඳ බෝධිසත්ත්වයෝ සිතන්නාහු "මොවුන් දරුවන්ට ස්නේහ ඉතා බෙහෙව. දැන් මා දරුවන් දුන්බව කීම් නම්, ලය පැළී මළහොත් නපුරු"යි සිතා කාලක්‍ෂෙප කොට කියන්නාහු "තෙපි වනමුල්වනඵලයට[2] එවේලේ ගොස් මෙවේලේ සඳපහනැ ආව. අද මැ දරුවන්ට සනා බෝ වී ද? තෙපි පඤ්චකල්‍යාණයෙන් යුක්ත වූ රූපසම්පන්නය ව. මේ වලැ මලදරුවෝ ද ඍෂිවරයෝ ද තපස් වී ද ඇත. මේ වනයෙහි මා අසපුයෙහි වනබව් තෙපි මතු දන්ව"යි වදළහ.

එබස් අසා මද්‍රිදේවී "මා ලස් වූවයි නො බණනදැ වනැ"යි සිතා කියන්නාහු "ස්වාමීනි, මම වේලේ මැ ආමි. මෙවෙනෙහි සතුන් මහත් කොට හැඬූ හඬ අසා 'මා දරුවන්ට කිම හො?'යි ළය කකියවා එමින් සිටිසඳැ වලස්වගසිංහයෝ තුන්දෙනෙක් මා එන නො දී මඟ අවුරා හොත්හ. එයින් ලස් වීමි"යි කීහ. මෙසේ කියතුදු නො බණනා විසින් ල කකියවා වෙවුලමින් හඬාගෙණැ පන්සල්පිටිපසට ගොස් හඬ ගහන්නාහු "මාගේ ලයක් වැනි ජාලියකුමාරයෙනි, සිවුමැලි වූ කෘෂ්ණජිනාවෙනි"යි මහත් කොට හඬ ගහා "තොප නහන්නට වලින් කසා ගෙණාමි. මාගේ කනකමය, ලය වැනි කුමාරයෙනි, මා කම්කිළිය කරා නො එවු දැ?"යි හඬ ලා මෙවන් බසක් නො ලදින් "මාගේ දරුවන්ට නැස්මෙක් වී වනැ"යි නිසැක කොට සිතා රාත්‍රියෙහි මහත් ශොක දුකින් හඬා ඇවිදිනාහු 'මා දරුවන් කෙළනා පොකුණු යැ'යි පොකුණු බලා 'මා දරුවන් හා එක් වැ කෙළනා මුවපොල්ලෝ යැ'යි මුවන් බලා 'මා දරුවන් කෙළනා රුක්මුලැ'යි රුක්මුල් බලා නො දැකැ, මහත් කොට හැඬූහ. එ හඬ අසා වල පක්‍ෂිමෘගජාතීහු මහ හඬින් හඬා නැංගහ.

---

1. සන්නව  2. අසත්

Non-Commercial Distribution

ඉන් ඔබ්බට ගොසින් 'මාගේ දරුවන්ට නටන මොනරු යැ'යි මොනරුන් බලමින් 'මා පැවැත්තිය ලද දියනියන් බස් වැනි (බස් ඇති) පුරවිකෙවිල්ලෝ යැ'යි පුරවිකෙවිල්ලන් බලමින් 'මාගේ දියනියන්ගේ ඇස් වැනි යහපත් වූ ඇස් ඇති මෘගාංගනාවෝ යැ'යි රළ හී යන මුවන් හා මුවදෙනුන් බලමින් 'මා දරුවන් හා එක් ්‍ෑ ඇවිදින්නවුන් දක්මි. මාගේ දරුවන් නො දක්මි'යි බිසවු මහහඬින් හඬා ගී සීසන්න නැති වැ මඳ විගසෙකින් සීසන්න ලදින් 'මා දියනියන් කෙළනා කෙළි වලදැ'යි කෙළිවලන් බලමින් 'මපුතනුවන් කෙළනා මැටියෙන් කළ හස්ත්‍යශ්වයෝ යැ'යි ඇතුන් අසුන් බලමින්, 'මා දියනියන් කෙළනා මැටිගිරවු යැ'යි ගිරවුන් බලමින් හලාහල වැ බඩ අත් සපා හඬා ගෙණැ බිමැ හී නොයෙක්වාරයෙහි හඬා හී රාත්‍රියෙහි ගල වට වංකපර්වතයෙහි පසළොස් ගව්වක් මානය සඳපහනැ තුන් විටක් වට කොට ඇවිද්ද යැ. බිසවුන් දරුවන් සොයා යා දී බෝසතානෝ ඇසිපිය නො බහා නිදිවියෝ වැ හුන්නාහ. පහන් වැ හිරු අබස් පාමින් සිටි වේලෙහි බෝසතානන් පාපිට බළලකු ගත් කිකිළියක සෙයින් වෙවුලා හඬා සීසන්න නැති වැ හොත්තාහ.

බොධිසත්වයෝ මද්‍රිදේවීන් හොත් විලස් දැකැ ළය කකියවා මේ වෙනෙහි මා නෑ කෙනෙක් නැත. තොප නෑ කෙනෙක් නැත. තෙපි මේ වනාන්තරයෙහි මළා දැයි කිය කියා සිතු කැළැඹී මහාශොක පත් වැ ජාතිවිශෙෂයෙන් ශොක දුරු කොට නෙළුම්පොකුණට ගොස් දිය ගෙණඇර සත්මසක් රැකි බ්‍රහ්මචර්‍ය්‍යයෙහි ඇලුම් නො කොට මද්‍රිදේවීන් ඔර හොවා ගෙණැ නෙළුම්පියුමක් වැනි අත්ලෙන් ලය අත ගගා මුහුණැ දිය ඉස අතින් ලෙහි දිය ගහා පිටැ පිසැ පියා සිතන්නාහු සිවිරටැ හෙවැ මළා නම්, වෙතියරට හෙවැ මළා නම්, මහරජපෙරහරින් දවන්නාහ. මා හුදකළා වුව, මේ වෙනෙහි කුම් කෙරෙම් ද්‍යේ හෝ?යි මෙසේ මහත් වූ ශොකයෙන් තැවි තැවී හුන්හ. එකල්හි බිසවු කල් යාමෙකින් සීසන්න ලදින් කියන්නාහු වහන්ස, මා දරුවෝ කොයි දැයි කීහ.

එසඳ බොධිසත්වයෝ කියන්නාහු "දේවීනි, ඉතා මැ වෘද්ධ වූ මහලු බමුණෙක් තිස්යොදනක් තැන් ගෙවා දන් පිණිස ආයේ යැ. ඔහුට දරුවන් දන් දින්මි"යි වදළහ. එවේලෙහි මහාපොළොව හඬා ගුගුළේ. සියලු දෙවියෝ සාධුකාර දුන්හ. මහාමෙරුපර්වතය ද සප්තකුල පර්වතයෝ ද රැව්පිළිරැව් දී නටන්නට වන්හ. "දේවීනි, දනපාරමිතාවට යම් සිතක් නො සිතා පින් අනුමෝ ව" යි කීහ. බිසවු කියන්නාහු "ස්වාමීනි, මෙසේ නො කියා, මා හඬා ඇවිද්ද දී නො බිණු දැ නු"යි කියමින් දෙහොත් මුදුනෙහි තබා ගෙණ "සාධු! සාධු! පින් අනුමෝ

Non-Commercial Distribution

වීමි'යි කියා අනුමෝ වැ ගෙණැ කියන්නාහු "ස්වාමීනි, දරුවන්ට වැඩි දසයෙන් සියෙන් දහසින් ලක්‍ෂයෙන් බුදුබව වේද උත්තම යැ"යි කියා සතුටු වැ බිසවු සිත් සන්සිඳුවා ගෙණැ කියන්නාහු "ස්වාමීනි, මට මතු පින්කම් දෙනදැ ද? මුළුතුන්ලොවැ සියලු සතුන්ට ද පින්කම් දුන මැනැවැ"යි පින් දෙවා, සිත් ප්‍රසන්න කොට දනපාරමිතා මුදුන් පත් කළහ. සියලු දෙවියෝ සතුටු වැ සාධුකාර දී පින් ගෙණැ මල්වැසි වැස්වූහ.

ඉක්බිති ශක්‍රදෙවෙන්‍ද්‍රයා සිතන්නේ "බොධිසත්වයෝ තමන්ගේ දරුවන් දෙදෙනා බමුණාට දන් දුන්හ. බිසවුන් යමෙකුහට දුන හොත්, නපුරැ"යි සිතා දිව්‍යශරීරය හැරපියා මහලු බ්‍රාහ්මණ වෙශයක් මවා ගෙණැ සැරයටියෙකැ එල්බැ ගෙණැ අවුදු "ගමනින් මිරිකුනෙමි. රජ්ජුරුවෙනි, කොයි හුන්නාදැ"යි කිය කියා ලඟ වැ ගොස් බෝසතානන් දැකැ කියන්නේ "කරුණු මඳ ද? වනමුල් වනඵල ලැබේ ද? වෙනෙහි සතුන් විසින් උපද්‍රව නැද් දැ?"යි කියා පුළුවුත. බොධිසත්වයෝ කියන්නාහු "තා කී මෙ හැමයෙන් මැ ගහට නැත. තා ආ කාය්‍ය්‍යය කිමෙක්දැ?"යි විචාළහ. බමුණු කියන්නේ "රජ්ජුරුවෙනි, ඉතා වෘද්ධයෙමි. ගමනින් මිරිකිනිමි. තොප අතින් රන් රිදී මුතු මැණික් ඉල්වා නො ආයෙමි. මාගේ ගෙහි මෙහෙ කරණ වහලක් නැත්තෙමි. බිසවුන් මට මෙහෙ කරන්නට පාවා දෙව"යි කී යැ.

බෝසතානෝ 'කළ මනා කිම් දෝ හෝ'යි සිතා බිසවුන් මුහුණ බැලූහ. බිසවු බොධිසත්වයන් සිතැ අභිප්‍රාය දැන කියන්නාහු "ස්වාමීනි, මවුපියෝ ස්ත්‍රීන්ට දෙස් වැස්සහ. නැයෝ නම් තමාගේ ස්වාමී යැ. පින් සඳහා දන් දෙත් මනා මැ යැ. වස්තු සඳහා විකුණත් මනා මැ යැ. සැමියන්ට ඉන් වන දෙෂයෙක් නැත. නුඹවහන්සේ අභිමතයක් කළ මැනැවැ"යි කීහ. එසේ කියත් මැ බෝසතානෝ සතුටු වැ අතැ පැන් එවැ නෙළුම්පියුමක් වැනි වූ බිසවුන් අත ගෙණැ "එකාන්තයෙන් සම්‍යක්සම්බොධියට පැමිණැ සියලු ලෝවැස්සන් නිවන්පුරයෙහි පිහිටුවා ලියැ හෙම්ව"යි පතා ගෙණැ බමුණාට දන් දුන්හ.

මෙසේ බිසොවුන් දන් දෙත් මැ මහපොළොව සතුටු වැ ගුගුළේ. සප්තකුලපර්වතයෝ ද සතුටු වැ නටන්නට වන්හ. සදෙව්ලොව දෙවියෝ සාධුකාර දුන්හ. බමුණු කියන්නේ "රජ්ජුරුවෙනි, තොප දන් දුන් බැවින් බිසවු මා සන්තකයෝ යැ. තොප සන්තක දෙයක් මුත් අනුන් සතු දෙයක් දන් දියැ නො හැක්කේ වේ ද? මා එනතුරු බිසවුන් තොපට පාවා දින්මි. තෙපි මුන්ට සුදුස්ස ව. තොපට මූ සුදුස්සහ"යි කියා බිසොවුන් බෝසතානන්ට පාවාදී තමා ශක්‍රදෙවෙන්‍ද්‍ර බව හඟවා

Non-Commercial Distribution

ශක්‍රවිලාසයෙන් සිට කියන්නේ "රජ්ජුරුවෙනි, තොප දරුවන් දන් දුන් විට දෙලක්‍ෂසතළිස්දහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළොව මහහඬින් හඬා ගුගුළේ. එක්ලක්‍ෂඅටසැටදහසක් යොදුන් උස ඇති මහාමේරුපර්වතය ද සප්තකුලපර්වතයෝ ද සතුටු වැ නැටූහ. තලාටුබුමාටු-දේවතාවෝ ද සදෙව්ලොව දෙවියෝ ද සොළොස් බඹතලෙහි දෙවියෝ ද සාධුකාර දුන්හ. තොපට ඒකාන්තයෙන් බුද්ධත්‍වය සිද්ධ වෙයි. තොපගේ දරුවන් දෙදෙනා මුතුන් මිත්තන් කරා බමුණු ගෙණ ගියේ යැ. අන් සත්දවසෙකින් තොප කරා එති. මාගෙන් අට[1] වරයක් ගණුව"යි කී යැ.

බොධිසත්‍වයෝ ද අට[2] වරයක් ගන්නාහු "දෙවේන්‍ද්‍රය, එසේ වී නම්, මම රාජ්‍යයෙහි පදස්ථ වෙම්වයි, දශරාජධර්මයෙන් වියෝ නො වන පුතකු ලබම්වයි. සියලු සත්‍වයන්ට උනු නො වන කරුණා ඇති වෙම්වයි. දන් දී කුසී නො වෙම්වයි. මිථ්‍යාදිට්ඨි ගත්තවුන් සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටුවම්යි. කෙළවර නිවන් දකිම්ව"යි කියා වර ගත්හ.* මේ අට වර දී ශක්‍රදෙවේන්‍ද්‍ර තෙමේ දෙව්ලොවට ගියේ.

ජූජක නම් බමුණු දරුවන් දෙබිහිත්ත ගෙණැ යන්නේ හිරු අස්තයට යන වේලෙහි දෙවියන්ගේ ආනුභාවයෙන් එ මැ දවස් සැටයොදුන් තැන් ගොස් අඳුරු වූ කල්හි දරුවන් ගෙණැ රුක්මූලකට වැදැ දරුවන් දෙදෙනා බන් වන මැ ගසමුලැ හොවා පියා වගුන් වලසුන්ගේ භයින් තෙමේ ගසටනැඟී ගසපිටැහෙවැ නිදි යැ. දෙවතාවෝ දෙදෙනෙක් අවුදින් මවුපියන් දෙදෙනා සෙයින් දරුවන් බැඳුමෙන් උනා සුවඳ දියෙන් නහවා පලඳනා පලඳවා බත් කවා මල්යහන්හි හොවා බඩ දී ගෙණැ නිදි ගන්වා පහන් වූ කලැ පළමු බැඳිවන මැ හොවා නො පැණී නැඟී ගියහ. බමුණු පිබිදැ පහන් වූ බව දැනැ ගසින් බැසැපියා දරුවන් ගෙණැ තමාගේ රටට ගෙණැ යෙමියි සිතා යන්නේ දෙවියන්ගේ ආනුභාවයෙන් සිවිරටට මැ ගෙණැ ගියේ.

එ මැ දවස සඳමහරජානෝ ස්වප්නයක් දක්නාහු මිනිසකු අවුත් රත්මල් දෙකක් තමන් අතට දුන්නා දැකැ පිබිදැ පියා චතුර්වේදයෙහි නිපුණයන් ගෙන්වාගෙණැ තමන් දුටු ස්වප්නය විචාළහ. බමුණෝ කියන්නාහු 'ස්වාමීනි, තොප සිත් පිණවන දරුවෝ දෙදෙනෙක් එන වන්හ'යි කීහ. මෙසේ බැණැ හුන් තැනට "ජාලියකුමාරයන් හා

---

1. දස 2. වෙම්හයි

* මෙහි දක්වන ලද විස්තරය ජාතක අටුවාව හා අසම ව ද න්‍යූන ව ද පෙණේ.

Non-Commercial Distribution

කෘෂ්ණජිනාවත් හා ගෙණැ බමුණෙක් ආ යැ" යනු අසා බමුණා ගෙන්වාගෙණැ දරුවන් දෙදෙනා දැකැ සතුටු වැ "බමුණ, මේ දරුවන් දෙදෙනා කොයි සිටැ ගෙණෙයි දැ?"යි කීහ. බමුණා 'බොරුවක් කියා ගැලවුන මැනැවැ'යි සිතා 'අනික් රජකු නම් කියමි' සිතූ සඳැ දෙවතාවෝ එ නො කියැ දී "විශ්වන්තර රජ්ජුරුවෝ යැ මට මුන් දුන්නෝ යැ"යි කියවූහ.

ඉක්බිති බමුණා 'මෙ කවර රටෙක් දෝ හො'යි සිතා සඳමහරජානන්ගේ රටබව දැන "එතෙකින් මා දිවි නැතැයි, කුම් කෙරෙම් දෝ හො?"යි සිතා වෙවුලන්නට වන. සඳමහරජ්ජුරුවෝ පුතනුවන් වෙනෙහි හිඳැ දරුවන් දන් දුන්බව සිතා මහත් කොට හඬා කඳුළු පිසැ දරුවන් දන් දුන්බව නගරවාසීන්ට කීහ.

නගරවාසී අසා කියන්නාහු "ස්වාමීනි, ඒ උත්තමයා ළය ගල කෙළේ දෝ හෝ! බමුණුමහල්ලකුට මෙවෙනි දරුවන් දීපියා එ ළය කෙසේ වැහැවූ දෝ හෝ! ඔවුන් ඇලිඇතු දන් දුන් සේ නපුරැයි රැහැණි වැ වංකපර්වතයට යැවුම් හ. දැන් මෙවෙනි මනහර වූ දරුවන් දන් දුන්හ. මෙවෙනි සිතක් ඇති ඒ උත්තමයාගේ ගුණ නො දැන නොගුණ කළම්හ. පෙරැ අප කළ නුගුණ පහ කොට ගොස් ගෙණෙම්හ"යි කීහ.

නුවර වාසීන් බස් අසා ජාලියකුමාරයෝ කියන්නාහු "අප දන් දෙන ස්වාමි බමුණා කෙරෙහි කළ කරුණායෙන් දුන්දැ යැ. මපියානන්වහන්සේ දැඩි යැ යි කුමට කියා දැ?"යි කීහ.එබස් අසා නුවරවාසීන් සතුටු සොම්නස් වැ "ස්වාමිදරුවෙනි, තොප පියානන්-වහන්සේගේ නුගුණ නො කීම්හ. ඒ උත්තමයා යමකු විසින් නො කොට ගත හැකි තොප නියා දරුවන් දන් දුන් සේ ඉතා බැරි යැ යි ඔවුන්ට ස්තුති කළ බව මුත් නුගුණයකට නො කීම්හ. ස්වාමීනි, ඒ ක්‍ෂමා කරව"යි කියා සිටි සඳැ සඳමහරජානෝ ඇසින් කඳුළු ගෙණැ කියන්නාහු "මා පුතුන්ගේ මනහර වූ දරුවෙනි, සිවුමැලි මාගේ මුනුබුරෙනි, මෙසේ අවුත් මා කළවෙහි හිඳුව"යි කීහ. ජාලියකුමාරයෝ මුත්තනුවන්ගේ බස් අසා, කියන්නාහු "බමුණන්ගේ ගැත්තොත් රජදරුවන් ඔරැහිඳිද් ද? මෙසේ සිටුම්හ"යි කීහ. එසඳ නගරවාසීහු මහා ශොක පත් වූහ.

රජ්ජුරුවෝ ද වැලැපැ හිඳැ කියන්නාහු "ජාලියකුමාරයෙනි, තොප දෙන කලැ තොපගේ පියානෝ කෙතෙක් මිල කොට දුන්නු දැ"යි කීහ. ජාලියකුමාරයෝ කියන්නාහු "මට දසක් දෙන්නට කීදැ යැ. මා නැඟනියන්ට මිල දන් භාරයේ වස්තු දෙන්නට කීදැ යැ"යි කීහ.

Non-Commercial Distribution

සඳමහරජානෝ කුමාරයන්ගේ මිහිරි තෙපුල් අසා සතුටු වැ ජාලියකුමාරයන්ට දහසක් දී කෘෂ්ණජිනාවන්ට උන් භාරයේ රන් හා දසදසින් හා බොහෝ වස්තු බමුණාට දී දෙබිහින්නන් ගලවා ගෙණැ ඉස් සෝධා නහවා බත් කවා ජාලියකුමාරයන් දකුණුකළවෙහි හිඳුවා කෘෂ්ණජිනාවන් වම්කළවෙහි හිඳුවාගෙණැ සතුටු වැ සිඹැ සනහා කියන්නාහු "ඒ උත්තමයා දන් දුන් ශ්‍රීමත් කුමාරයන් හා ශ්‍රීමත් නැහතියක හා මා කරා නැඟී ආබව සිව්රට වාසීන්ගේ හා මාගේ හා දෛව යැ"යි කියා සතුටු වැ හිඳැ බමුණා ද ඉස් සෝධා නහවා තමන් කන පරිද්දෙන් රස භොජනයෙන් බත් කැවූහ.

බමුණු තමා නො කැවිරු ආහාරය බොහෝ කොට කා දිරවා ගත නො හී රෑ මියැ ගියේ. ඔහු නො එක් පෙරහරින් දවා "බමුණාගේ නැකෙනෙක් ඇති නම් මේ වස්තු ගණිත්ව"යි නුවර බෙර පියෙව් කරවා නැකෙනෙකුන් නො දැකැ එ වස්තු භාණ්ඩාගාරයට මැ ගෙණැ කියන්නාහු "ජාලියකුමාරයානෙනි, තොපගේ මැනියන් හා පියානෝ සුවයෙන් වෙසෙද්දැ?"යි පුළුවුත්හ. කුමාරයෝ කියන්නාහු "මුත්තනුවන් වහන්ස, අප ආ මේ අතුරෙහි අමඩින් යමක්හට දන් නුදුන්හයි නො සිතම්. මපියානන්වහන්සේ නුඹ කෙරෙන් වියෝ වූ දුකින් හා තපස් කිරීමෙන් හා වහළ දැ යැ අමඩි අවු පැරැ මලාගිය නෙළුම් මලක් සේ මලානික වැ ගිය දැ යැ"යි කීහ එ ළඳබොළඳ බස් අසමින් රජ්ජුරුවන් හා නුවර වැස්සෝ මහත් වූ ශොකයට පැමිණියාහ.

ඉක්බිති ජාලියකුමාරයෝ කියන්නාහු "සියලු සත්ත්වයන් තමන් තමන්ගේ දරුවන්ට ප්‍රෙම ඇතැයි යෙති. නුඹවහන්සේ දරුවන්ට ප්‍රෙම මඳදැ වනැ"යි කීහ. "සැබව, කුඩෙනි: කිසි වරදක් නැති මපුතනුවන් නුවර වාසීන්ගේ බස් ගෙණැ නෙරපීම්"යි හඬා වැලැපැ අමාත්‍යයන් කැඳවා කියන්නාහු වංකගිරිපර්වතයට යන්නට සැරහෙව. සත්දවසෙකින් ගමනැ"යි කියා නුවර බෙර ලැවූහ. යෝධයෝ පන්දහසක් දෙන රත්පිළී සුදුපිළී ආදී නොයෙක් පිළී හැඳ පලඳනායෙන් සැදී පඤ්චායුධ ගෙණැ සැරහී නො එක් ඇතුන් අසුන් පිට හිඳුනා සිවුරඟ සෙනඟ පිරිවරා මහත් වූ යශශ්‍රීන් දිලියෙමින් නික්මුනාහ. අමාත්‍යයෝ මඟ සදන්නාහු කළු වැලි පියා සුදුවැල්ලෙන් තවරා කෙහෙල් තැඹිලි පුන්කලස ධජපතාකායෙන් මඟ සරසා ක්‍රමයෙන් චෙතියරටට ගෙණැ ගොස් වත්හ. චෙතියරජ්ජුරුවෝ දැකැ සතුටු වැ උපස්ථාන කොට සැටදහසක් රජදරුවන් ගෙණැ සඳමහරජානන් හා එක් වැ නික්මුනාහ. ජාලියකුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා දෙදෙනා ඇත්පිටට නඟා ගෙණැ මහත් වූ රාජශ්‍රීන් දිලිසෙමින්, දරුවන් පළමු කොට තුමූ පසු වැ ගෙණැ ගොස් වංකගිරිපර්වතයට ආසන්න වූහ.

Non-Commercial Distribution

ඉක්බිති බොධිසත්වයෝ භෙරිසංඛනාද හා තූය්‍යඝොෂ හා ඇතුන්ගේ කුඤ්චනාද හා අසුන්ගේ හෙෂාරව හා රථනාද හා මෙසේ මහත් ඝොෂ අසමින් කියන්නාහු දේවීනි, මපියානන් වහන්සේ මහලු විසින් අප මෙහි වසන බව දැනැ අප කරා එන සතුරු කෙනෙක් දෝ හෝ! වංකපර්වතයට නැඟී පරීක්ෂා කරවයි කීහ. දේවී පර්වතයට නැඟී මහත් වූ ඝොෂ අසා "ස්වාමීනි, නුඹට කවර සතුරු කෙනෙක් ඇද්ද? නුඹගේ පියවර මැඩැ පියන සතුරු කෙනෙක් ඇද්ද? ස්වාමීනි, ඒ දවස් ශක්‍රදෙවෙන්ද්‍රයා කියන්නේ අපගේ දරුවන් දෙදෙන මුතුන් මිත්තන් කරා ගොස් වන්හයි කී යැ. අන් සත් දවසෙකින් නුඹ වහන්සේ කරා එති කීයේ වේද? නුඹ පියානන් වහන්සේ එන ගමනක් වන්නැ"යි කියා දෙදෙන අවුත් පන්සලැ හුන්නාහ.

සඳමහරජ්ජුරුවෝ තන්හි තන්හි ඇතුන් අසුන් විහිදුවා වංකපර්වතය ආසන්නයට ගොස් තමන් ඇඹෙනියන් වුසති දේවීන්ට කියන්නාහු "දේවිනී, දරුවන් හා අප හා එකවිටැ දක්නා කලැ ශොක බොහෝ වෙයි. මා ගොස් පළමු උන් දැකැ ශොක සන්හිඳවූ කල්හි තෙපි එව"යි කියා දහසක් රථ පොළොවැ රඳවා තුමූ ගොස් බෝසතානන් පන්සලැ කෙසරසිංහයකු සේ වැඩහුන්නන් දුටහ. බෝසතානෝ පියානන් දැකැ හුනස්නෙන් නැඟී පෙරගමන් කොට බැසැ හෙවැ වැඳැ හිඳිනා ආසන පණවා වඩා හිඳුවූහ. මද්‍රිදේවී ද මයිලනුවන් දැකැ බැසැ හෙවැ වැඳැ සිටැ ස්වාමීනි, මා දරුවන් ගෙණැ ගිය බමුණා කොහි දී හුනු දැයි කීහ. සඳමහරජානන් යෙහෙළනියෙනි, මාගේ රටැ දී දැකැ බමුණාට රන් දී ගලවා ගතුම්හයි කියත් මැ බිසවුන්ට මහත් සොම්නස් උපන.

ඉක්බිති බොධිසත්වයන්ගේ මෑණියෝ මහත් පෙරහරින් පන්සල් වන්හ. බොධිසත්වයෝ ද මද්‍රිදේවී ද වැඳැ ආසන පන්වා දී හුන්හ. එකල්හි ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා ඇත් පිටට නංවා ගෙනැ දෙදෙනා පෙරටු කොටලා චෙතිය රජ්ජුරුවන් ඇතුළු වූ සැටදහසක් රජදරුවන් පන් දහසක් මහායොධයන් හා මහසෙනඟ හා පිටත් ව ගෙණ භෙරිසංඛ නාදයෙන් එනු දැකැ මද්‍රිදේවී හඬා පෙරමහට ගියහ. මෑණියන් දැකැ දෙබිහින්න ඇත්පිටින් බැසැ මෑණියන් දෙපත්ලෙහි හිස් තබා ගෙණැ හඬන්නට වන්හ. බිසවුන් තෙනෙන් කිරිධාරා විහිද දෙබිහින්නන් හිස් තෙමා ගියේ යැ. දෙබිහින්නන් නහා සිටුවා සිපගෙණැ මහත් වූ ශොකයෙන් හඬා හුනහ.

ඒ අසා සඳමහරජ්ජුරුවෝ ද ඇඹෙනියෝ ද මහහඬින් හඬා හුන්හ. චෙතියරජ්ජුරුවන් ඇතුළු වූ සැටදහසක් රජදරුවෝ ද මහහඬින් හඬා

Non-Commercial Distribution

හුනහ. ඒ දැකැ පන්දහසක් යොධයන් හා මහසෙනඟ එක හෙළා මහපවනින් වැගිර ගිය සල්වනයක් සේ මහහඬින් හඬා හුනහ. ඒ වෙසතුරු මහරජානන්ගේ හා අඹුදරුවන්ගේ හා දුක්පත් කම් සිතා හඬන ජනයා සීසන්න නැති වැ හොත් සඳ ශක්‍රදෙවෙන්‍ද්‍රයා අවුත් ඔවුන් හැම සීසන්න නැති ව හොත් සේ බලා පොකුරුවැසි වැස්වී යැ. ඒ වැස්සෙහි තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නො තෙමෙනු කැමැති කෙනෙක් නො තෙමෙති.

මෙසේ පොකුරුවැස්සෙහි තෙමී සියලු ජනයා සීසන්න ලදින් විස්මයට පැමිණැ කියන්නාහු ස්වාමීනි, නුඹගේ ගුණ නො දැනැ නුවරින් නහාපූම්හ. ඒට ක්‍ෂමා කොට අපගේ නුවරට අවුත් වොටුනු පැලැඳ අප රක්‍ෂා කළ මැනැවැයි කීහ. එ අසා "බොධිසත්‍වයෝ රටවැස්සෙනි, තව ද මා වොටුනු පලඳවන්නට තෙපි අදහස් නො කරවු" යයි කියා නො ගිවිස්සාහ. එසඳ නගරවාසීහු සඳමහ රජ්ජුරුවන්ට කියන්නාහු "ස්වාමීනි, අප කිව ද නො ගිවිස්නාදැ යැ. නුඹවහන්සේ වදළ මැනැවැ"යි ආරාධනා කළාහ. සඳමහරජානෝ බොධිසත්ත්වයන්ට කියන්නාහු "පෙර ද මා කියමින් ගෙණැ මේ වලට ආවා වද? දැනුදු මා කියමන් ගෙණැ වොටුනු පැලැඳ රාජ්‍යය කරව. ගුරුන් කීවක් කරණ බව සත්පුරුෂ පුතුන්ට සුදුසු වේ ද?"යි කීහ. බොධිසත්ත්වයෝ "දෙමවුපියන්ගේ බස් මැඩපීම් මට සුදුසු නොවන්නේ වේදැ"යි සිතා වල්කලා හැර නහා සළු හැඳැ සූසැට ආභරණයෙන් සැදී වොටුනු පැලැඳ දෙවෙන්‍ද්‍රවිලාසයෙන් සිටියහ.

සියලුජනයා මහත් වූ සන්තොෂයෙන් මද්‍රිදේවී ද හිස් සෝධා නහවා දිව්‍යාංගනාවක මෙන් සරසා වොටුනු පැලැඳැවූහ. එසඳැ වෙනෙහි වල් හා පර්‍වතයෝ මහත් සොෂා පැවැත්වූහ. අමාත්‍යයෝ හෙරිසංඛතූර්‍ය්‍යනාදයෙන් එකකොලාහල කෙරෙමින් පණ්ඩර නම් හැලි ඇතු සඳ ගෙණාහ. බෝසතානෝ ඇතු දැකැ රැහැණි වැ සිතන්නාහු "මපියානන් වහන්සේ මා දන් දුන් ඇතු ගෙන්වා ගත්දැ වනැ"යි ලජ්ජා ඇති වූහ. ඒ බව දත් නගරවාසීහු ස්වාමීනි කාලිංගයේ රජ්ජුරුවෝ තමන්ගේ රටැ වැසි වැසැ බත්බුලත් සුභික්‍ෂ වූයෙන් තුමූ මැ ඇතු එවාපූ යැ. ඇතු පිටට නැඟී වදළ මැනැවැයි කීහ. බොධිසත්ත්වයෝ ඇතු පිටට පැනනැඟී වංකපර්‍වතයෙහි තපස් කළ සත්මසින් නුවරට නික්මැ කීප දවසක් මගැ ලැගැ දෙව්නුවරක් මෙන් සැදූ නුවරට වන්හ.

සියලු නුවර වාසීහු සතුටු වැ කෙළිමින් නටමින් පිළී හිසැ සිසාරමින් නොඑක් කුහුලින් රජගෙට වඩා ගියහ. බොධිසත්‍වයෝ ද ශ්‍රී සම්පත්

Non-Commercial Distribution

අනුභව කරන්නාහු ස දන්හල් කරවා දන් දෙමින් සියලු ජනයා කුසල්හි පිහිටුවා දශරාජධර්මයෙන් රාජ්‍යය කොට ජීවිතයාගේ කෙළවර සහ පිරිවරින් ගොස් තුසීපුරයෙහි උපන්හ. මෙසේ දෙව්ලොව ගිය ඒ මහතානන් සරණ යෙමියි බුත්සරණ යා යුතු.

විද්‍යාචක්‍රවර්තීන් විසින් කළ අමෘතාවහ නම්
බුද්ධචරිතය නිමි.

---

*Non-Commercial Distribution*

# නාමානුක්‍රමණිකාව

(මෙහි අඞ්කවලින් ඒ ඒ නාම යෙදී තිබෙන පිටු දැක්වේ.)


අකනිට්ඨබ්‍රහ්මලෝ 24,40,76,241
අකනිෂ්ඨබ්‍රහ්මලොක 172
අග්ගිදත්ත 216
අග්නිමාලිසමුද්‍ර 170
අංගුලිමාල 60,61,73,164,229,310
අඟු 117
අඟුල්මල් 2
අචිරවතී 47,203
අචෙලකාශ්‍යප 88
අච්චුත 307
අජපාලනිග්‍රොධ 111,219
අජාතශත්‍රු 64
අජිතථෙර 73
අජිත කෙසකම්බල 88,156
අඤ්ජනකූටපර්වතය 149
අඤ්ඤාකොණ්ඩඤ්ඤ 66,111,221
අතුල උපාසක 214
අධ්‍යාරොහ 226
අනඳ 60,66,77,82,96,127,206,214,245
අනවතප්ත 44, 56
අනාත්මලක්ෂණ සූත්‍ර 112, 222
අනාථපිණ්ඩික 81,102
අනුතත්විල් 225
අනුමානසූත්‍ර 84
අනුරුද්ධ 60,67,107
අනේපිඩු 87,207
අනොතත්ත 44
අනොමානදී 33,217
අන්ධවන 241
අපරගොයාන 50,54
අභ්‍යන්තර අඹගස 49
අභිධර්මපිටක 107
අමිත්තතාපා 303
අම්බපාලී වන 241
අම්බලට්ඨිකා 223
අරති 22
අරමණ 4
අවීචි 26,53,59,62,77,99,241
අශ්වකර්ණ 43,44
අශ්වමුඛ 46
අසදිසද 175
අසදෘශමහාදන 124,207
අසිපත්‍රවන 157
අසුචිනිරය 33,157
අසුර 9,75
අසුරපුර 53,200
අසූමහසවු 78
අස්තපර්වත 122
අස්සජි 73,111,180,186
අහිවාතකරොග 152
ආකාශගඞ්ගා 47,77,104,157
ආදිත්තපරියාසුත්ත 124
ආදිපතපර්‍ය්‍යායසූත්‍ර 222
ආනන්ද 66,82,212
ආනන්ද මත්ස්‍ය 59,226
ආනන්ද සිටු 223
ආභස්සර 55,56,59
ආරිය 215
ආලකමන්ද 157
ආලවක 2,4,127,310
ආලවකසූත්‍ර 149
ආවට්ටගඞ්ගා 47
ආවාටකා 179
ආසාවතී 52
ඇසළමස 111
ඉන්ද්‍රශාලගුහා 213
ඉසිපතනාරාම 66,111,219
ඊශධර 43
උක්කට්ඨා 191
උතුරුකුරුදිව් 50,54,117


Non-Commercial Distribution

උතුරුදෙරගම් 215
උතුරුසයුරු 37
උතුරුසළනැකැත් 111
උදයතෙර 74
උදයපර්වත 122,199
උද්දකරාමපුත්‍ර 219
උපක 219
උපවාණතෙර 73
උපසීව තෙර 73
උපාලි තෙර 71
උපුල්වන් 102,124,313
උපොසථ (ඇත්කුල) 239
උම්මග්ගගඞ්ගා 47
උරුවේලකාශ්‍යප 2,71,114,222
උරුවේලා 114
එරකපත්තනාගරාජ 211
ඓරාවණහස්ති 51,77,100,109
ඔසුපත්නිරය 33,257
කකුදකාත්‍යායන 88,156
කඞ්ඛාරෙවත 68
කණ්හැදසහජාතක 103
කත්තා 293
කපථක 130,217
කප්පතෙථර 73
කරවීක පර්වත 43,44
කණ්මුණ්ඩවිල 44
කලාබුරජ 36
කාලිඞ්ගදෙස 325
කලිඟුරට 291
කසීරට 16
කසුප් බුදු 140
කසුබු 134,212
කාකදෙශී 4
කාමාවචරදෙව 55
කාම්බෝජ 4
කාලකුටපර්වත 45
කාලකුටවිෂ 114
කාලගඞ්ගා 47
කාලදෙවල 164
කාලපර්වත 19,61,134
කාලසූත්‍රනරකය 33
කාලාවක හස්ති 79
කාලිඞ්ගවන 281
කාලුදායීතෙර 71
කාශ්‍යප 114
කිම්බිලතෙර 73
කිඹුල්වත් 3,159,264,273
කිරිපලුගස 219
කිහිරඟුරුද 9,165
කුක්කුලනරක 158
කුටිකණ්ණසොණ 69
කුණාලවිල 44
කුණ්ඩධානතෙර 69
කුද්දලපණ්ඩිත 10
කුමාරකාශ්‍යප 70
කුරුරට 12,134
කුශජාතක 134
කුසරජ 61,134
කුසිනාරා 36,41
කෘෂ්ණජිනා 23,218,291,297,314,317
කෙලෙස්ගල් 134
කේසරසිංහ 64
කෛලාසකුට 17,45
කොසොල් 124,200,216
කෝසල 60,95,164,187
ක්ෂාන්තිවාදී 20,234
ක්ෂීරසාගරය 70,78
ඛදිරවනියරෙවත 68
ගඞ්ගානදී 47
ගඩඹ 96
ගණ්ඩම්බ 97
ගඩඹ 96
ගද්‍රභයක්ෂ 127
ගන්ධ (හස්තිකුල) 239
ගන්ධමාදන 45
ගදමදන් 307
ගයාකාශ්‍යප 73,114
ගයාශීර්ෂ 124,222
ගරුඩ 53
ගම්භීරා පොකුණ 176

Non-Commercial Distribution

ගර්හිතපාෂාණ 12
ගවම්පතිතෙර 73
ගිජ්ඣකූටපර්වත 64,214
ගිරිමෙඛලා 35,74
ගුරුළු 12
ගුරුළුවිමන 34
ගොවිකුල 57
ගොසිඞ්ගසාලවන 241
ගෞතම 85
ගෞතමගොත්‍ර 81,101,223
ඝරණීඋපාසිකා 101
චක්‍රවර්තිමාණික්‍යය 41
චක්‍රවාට 180
චන්‍ද්‍රපාර්ශවපර්වත 48
චන්‍ද්‍රාදේවී 13
චම්පානුවර 176
චම්පෙය්‍යනාගරාජ 16
චිඤ්චාමාණවිකා 23
චිත්‍රකූටපර්වතය 41,45,217
චිත්‍රලතාවන 51
චීරාසාමණේරී 102
චුන්දසාමණේර 102
චුල්ලකාලපර්වත 48
චුල්ලතණ්හා සඞ්ඛයසුත්ත 84
චුල්ලපන්ථකථෙර 8,68
චෙතියරට 290,300
චෙතියපුත්‍ර 305
ඡත්තමාණවක 7
ඡද්දන්ත (හස්තිකුල) 239
ඡද්දන්තවිල 44,48
ජන්න අමාත්‍ය 217
ජතුකණ්ණිස්ථවිර 73
ජම්බුකාජීවක 223
ජම්බුද්වීප 50,88,102,119,179,302
ජම්බුනදී 49
ජයතුරානුවර 285,300,311
ජම්බොනද 49
ජාලියකුමාර 20,218,299,314,318
ජාලීකුමාර 297
ජින 4
ජුණ්හජාතක 166
ජූජක 21,234,303,306
ජේතවන 64,81,125,204,205
තපස්සු වෙළෙඳ 219
තව්තිසා දෙව්ලෝ 24
තව්තිසා භවන 107
තව්තිසැදෙව්ලෝ 24,50,56,82
තාපනරක 33
තාම්‍ර (හස්තිකුල) 238
තිම්මතස්‍ය 70
තිම්ඩගල 70,81,226
තිම්රපිඩගල 286
තියග්ගල (ලා) 46
තිරෝකුඩ්ඩසූත්‍ර 223
තිෂ්‍යමෛත්‍රෙය 73
තිස්ස (මහතෙර) 210
තුෂිත 167
තුසිතපුර 133
තුසීපුර 158,217
තෘෂ්ණා 22
තේමිය (කුමාර) 19,228,257
තෙසකුණජාතක 15
තොදෙය්‍යථෙර 73
ත්‍රිකූට පර්වත 200
දකුණුසක 41
දධිමාලි සමුද්‍ර 170
දබ්බථෙර 70
දඹගස 49
දඹදිව 34,49,53,134,179,285
දසබල 238
දනවරාක්ෂස 53
දිව්‍යලොක 109
දීපඞ්කර 35,159,214,216,255,264,271
දුනුවිටු (දුනුවිටු?) 303
දුර්මුඛ (ලිච්ඡවි) 189
දෙමළ 4
දෙව්දත් 2,23,24,124,272
දෙව්දත් 64,65,206,207
දෙව්රම 180
දෙව්ලොව 34

Non-Commercial Distribution

දෙවදත්ත 229,310
දෙවධර්මජාතක 140
ධනඤ්ජය 134
ධනපාල 165,207,229
ධම්සක් පවතුන්සුත් 41,111
ධර්මදායාදසූත්‍ර 180
ධර්මපාල කුමාර 13,144,234
ධෘතරාෂ්ට්‍ර 41,117
ධෝතකථෙර 73
ලක්කවාර 5
නදීකාශ්‍යප 73,114
නන්ද 85
නන්දකථෙර 72
නන්ද කුමාර 61
නන්දථෙර 72,73
නන්දනවන 52,151
නන්දමූලකපර්වත 45
නන්ද (පොකුණ) 51,118,158
නන්දෝපනන්ද නාග 82,90,103,128,310
නඳුන් උයන 25
නාගලොක 200
නාගිතථෙර 73
නාලකථෙර 73
නාලාගිරි 2,65,78,272,310
නාලොව 34
නිගණ්ඨනාතපුත්‍ර 88,156
නෙපාල 268
නේමින්ධර පර්වත 43,44
නෙරඤ්ජරානදී 217
නෙවසඤ්ඤානාසඤ්ඤායතන 59
පඤ්චශාලා 212
පඤ්චශිඛ 109,213
පඤ්චායුධ කුමර 62
පටාචාරා 179,200,204
පණ්ඩර 238,291,300
පදුමුත්තර 204
පරනිර්මිතවශවර්ති 59
පරසතුරුක 37,52
පරිත්තාභ 55
පස්වගමහණු 111,219
පාංශුපිශාච 94
පාකල (උණ රොගය) 69
පාණ්ඩුකම්බලශෛලාසන 52,84,106,222
පාරායණසූත්‍ර 222
පාරිලීයක ඇත් 74
පාෂාණචෛත්‍ය 222,206
පිඩගල (ඇත්කුල) 239
පිඬගියථෙර 74
පිණ්ඩොලභාරද්වාජ 67,89,92
පිලින්දිවච්ඡථෙර 70
පිලියක් රජ 20
පුක්කුසාති 125
පූරණකාශ්‍යප 88,99,156
පුණ්ණ තෙර 73
පුණ්ණක තෙර 73
පුණ්ණජ තෙර 73
පූර්ණභද්‍ර 19,61,134
පූර්වවිදෙහ 50,54
පොකුරුවැසි 221
පොරිසාද 16,62,143
පොසාලථෙර 74
ප්‍රතාපනරක 33
ප්‍රභාවතී 134
ඵරුසකවන 51
ඵුසතීදෙවී 286,298
බකබ්‍රහ්ම 128,194
බක්කුලථෙර 71
බමුණුකුල 57
බඹලොව 34
බඹරු 4
බරණැස 10,111,212,219,273
බරණැස් රජ 9,10
බහලගඞ්ගා 47
බාරාණසී 66
බාහියථෙර 70
බිම්බිසාර 93,114,161,173,187
බිම්සර 161
භූමාටුදේවතා 56
බෙලුවපණ්ඩුවීණා 109
බෝම්මැඩ 207


Non-Commercial Distribution

බ්‍රහ්මපාරිෂද 33,172
බ්‍රහ්මලොක 109
භගුථෙර 73
භද්දියථෙර 67,72,111
භද්‍රායුධථෙර 74
භද්‍රවර්ගී 113,222
භල්ලුක 219
භවාග්‍ර 104
භාගීරථී 271
භාරද්වාජ 92
භූරිදත්තනාගරාජ 16
මක්ඛලී ගොසාල 88,156
මඛාදෙවරාජ 8
මගධ 4
මඞ්ගල (ඇත්කුල) 239
මඤ්ජූසක 45
මණිචොර ජාතක 11
මණිමෙඛලා 61
මණ්ඩුකදිව්‍යපුත්‍ර 178
මදුරට 287
මද්‍රිදෙවි 21,218,290,297,316
මන්දරපර්වත 20,314
මන්දකිනීවිල 44
මන්ත්‍රාණීපුත්‍රපූර්ණ 68
මර 153,212
මලය 114,247
මලයූර 5
මහකසයින් 68
මහදඹරුක 102,119
මහබඹ 12
මහමෙර 43,70,82,102,108,199,269
මහසුප්තෙර 7
මහාකප්පින 72
මහාකාලපර්වත 48
මහාකාලනාගරාජ 115
මහාකොට්ඨිතථෙර 70
මහාගොසිඞ්ගසූත්‍ර 84
මහාචුන්ද 73
මහාජනක 15
මහානාමථෙර 72,111
මහාපද්ම 142
මහපන්ථක 68
මහාප්‍රතාපරාජ 13
මහාබොධි 66
මහාබ්‍රහ්ම 109,207
මහාමඞ්ගලසූත්‍ර 223
මහාමන්ධාතුරජ 16,142
මහාමායා 63,213,287
මහාමෙරු 83,180
මහාරෞරව 33
මහාලිච්ඡවි රජ 161
මහාවන 223,241
මහාවශවර්තිමාර 35
මහාශ්‍රමණ 116
මහාසමයසූත්‍ර 223
මහී (නදිය) 47
මහෞෂධපණ්ඩිත 20,140
මාතලි 109
මාර 135,191
මාරතජ්ජනීයසුත්ත 84
මාරස්ත්‍රී 219
මිනිස්ලොව 34
මිහිකත 63
මුගලන්තෙර 6,60,85,103,107
මුචලින්ද 114,115,207
මෙත්තගුථෙර 73
මෙර 85,108,165
මෙඝියථෙර 73
මේරු පර්වත 20,226,314
මොඝරාජථෙර 72
යමුනා 47
යසථෙර 73,112
යසොජථෙර 73
යසොධරා 3,33,264
යුගන්ධරපර්වත 43,77,106
යුගඳුර 220
යුගාන්තවාත 114
යොන් 4
රගා 22
රජගහනුවර 75,88,114,214

Non-Commercial Distribution

රජතපාර්ශවපර්වත 48
රට්ඨපාල ථෙර 69,83
රට්ඨපාල සිටුපුත් 142
රත්නමෙරු 69
රථකාරවිල 44
රහල් 313
රාධථෙර 72
රාහුඅසුර 62
රාහුග්‍රහ 199
රාහුල 3,24,33,61,124,217,229,264
රාහුලොවාද සූත්‍ර 223
රුවන්ගේ 219
රුවන්මෙර 104
රුවන්සක්මන 219
රූපනන්ද 209
රෙවතථෙර 7,214
රෝහිත 299
රෞරවනරක 33
ලක්දිව 34
ලකුණ්ටක භද්දිය 67
ලට්ඨිවන 222,241
ලාලා 179
ලිච්ඡවි 161,173,184
ලුම්බිනී 119,217
ලොහොකුඹුනරකය 33,157
ලෝඇදිරිනරක 133
ලොකධාතු 54
ලොකන්තරිකනරක 54,158
වක්කලිථෙර 69
වඞ්කගිරි 21,293,295,305
වඞ්ගීසථෙර 70
වජ්‍රාසන 111
වප්පථෙර 72,111
වරම්රජ 117
වශවර්තිමාර 128,206,273
වසවත්මර 21
වාතවලාහකදිව්‍යපුත්‍ර 98
වැදෑරජ 10
වැසිවලාදෙවි 165
විජම් 107
විජයත්රථ 51
විජයොත් පහය 51
විජයොත්තරශඞ්ඛ 159
විධුර පණ්ඩිත 19,61,134
විනතකපර්වත 43
වින්ධ්‍යපර්වත 122
විපත්තිකර මෙඝ 57
විපුල පර්වත 301,307
විමලථෙර 73
විරූපාක්‍ෂ 117
විරූළහක 117
විවතිස්ථායි 55,58
විශාඛා 207
විශාලානුවර 149,174
විශ්වකර්ම 134,302
විශ්වන්තරජාතක 285
වෘෂභමුඛ 46
වෙසතුර 159,217,291
වෙසමුණු රජ 49
වෙස්සන්තර 20,291,308
වෙතරණී 157
වෙත්‍රයෂ්ටි කපිජාතක 231
වෙදිය පර්වත 213
වෙදෙහරජ 20
වෙපුල්ලපර්වත 263
වෙහප්ඵල 55,58
වෙළුවන විහාර 65,161,207
වෛජයන්ත ප්‍රාසාද 83
වෛජයන්ත රථ 109
වෛශ්‍රවණ 117,125,138
ශක්‍ර 9,67,75,96,98,110,117,142, 151, 188,207,213,316
ශක්‍රබ්‍රහ්ම 21
ශඞ්ඛපාලනාග 16
ශඞ්ඛබ්‍රාහ්මණ 15
ශාක්‍යකුල 24,38
ශාක්‍යකුල සිංහ 110
ශොණභද්‍රස්ථවිර 69
ශ්‍රමණගෞතම 65,95,184,220
ශ්‍රීමහාබෝධි 56,207

Non-Commercial Distribution

ශ්වෙතහස්තිජාතක 232
ෂඩ්දන්ත 48,64
සංජීවනරක 33
සංවතීස්ථායි 55
සකස්පුර 108
සක්දෙව් රජ 4
සක්වළගල 102
සක්විති රජ 103
සඞ්ඛපාලනාග 232
සඞ්ඝාතනරක 33,158
සච්චක 2,179,184
සච්චා 179
සඤ්ජය රජ 286
සඤ්ජයබෙල්ලට්ඨිපුත්ත 156
සතර වරම් 53,166,219
සදත් ඇතා 41,232
සදත් කුල 79
සදත්දහතල 186
සදත්විල 17
සන්තති ඇමති 209
සන්තුසිත 24,110,142
සඳමහරජ 286
සභියථෙර 73
සමචිත්තපරියාය සූත්‍රය 223
සමන්තභද්‍ර 110
සම්පත්තිකරමෙස 57
සම්පසාදනීය සූත්‍ර 180
සම්භවකුමාර 15,141
සරබුනදී 47
සවුමහරජය 56
සහම්පති බ්‍රහ්ම 24,111,188,219,310
සහවාසි 5
සාකෙතනුවර 213
සාගතථෙර 72
සාතාගිරි 131
සාමපණ්ඩිත 20
සැතිමණොවිද්‍ද 124
සැරියුත් 7,110,180,207
සැවැත් 108,127,180,200
සිංහප්‍රතාපවිල 44
සිංහමුඛ 46
සිනේරු 53
සින්ධුදෙශ 149
සිලෙසලොම යක්‍ෂ 62
සිවිරජ 16
සිවිරට 285
සිළුමිණිසෑ 24
සීතවන 241
සීතා 317
සීදන්තසාගර 44
සීවලී 69
සුජාතා 11,217
සුතසොමරජ 16,62,143
සුදම්දෙවසභ 52,53
සුදර්ශනපර්වත 43
සුදෙවුන් 3,33
සුද්ධොදන 148,213
සුධර්මදෙව්සභය 53
සුධර්මා 53
සුනාපරන්තජනපද 73
සුප්පාරක 16
සුභකිණ්හක 55,57
සුභගවන 191
සුභූතිථෙර 68
සූමුඛ 78
සුමෙධතාපස 35,216
සුමෙරු 44
සුයාම 24,110,142
සුලු අනේපිඬුසිටු 102,107
සුසීම 173
සූචිරොමයකා 2
සූයඝීදිව්‍යපුත්‍ර 98
සූයඝීපාර්ශව පර්වත 48
සෙලථෙර 73
සොණ සිටු පුත් 142
සොභිතථෙර 71
ස්වර්ණපාර්ශව 48
ස්වර්ණමයූර 61
හතනකත 112
හත්ථාළවක 148

Non-Commercial Distribution

හස්තිමුඛ 46
හළුනරකය 33
හාරිතබ්‍රහ්මයා 75
හිමාලය 17,35,44,47,53,102,127,130,272
හෙම (ඇත්කුලය) 239
හෙමකථෙර 73
හෙමවත 131

*Non-Commercial Distribution*